මෙම පොතෙහි අඩංගු කරුණු අන්තර්ජාලය තුළ
භාවිතයට පහසු යුනිකෝඩ් අකුරු ක්‍රමයට සකසා
http://pitaka.lk වෙබ් අඩවියේ ඇතුළත් කර ඇත.

# මජ්ඣිම නිකාය

# 3

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය අධිනීතිඥ**
**ඒ. පී. ද සොයිසා මහතා**
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

# අනුශාසක මණ්ඩලය

පෑලියගොඩ විද්‍යාලංකාර පරිවෙණාධිපති ගරු කිරිවත්තුඩුවේ පඤ්ඤාසාර නායක මාහිමියන්වහන්සේ

මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙනේ B.A., PH.D. උපාධිධාරී පණ්ඩිත ගරු දෙහිගස්පේ පඤ්ඤාසාර නායක ස්ථවිරයන් වහන්සේ

කළුතර පුලිනතලාරාමාධිපති ගරු බේරුවල ශ්‍රීසුමංගල ශ්‍රීනිවාසාභිධාන මහානායක මාහිමියන්වහන්සේ

වැලිතර මහාකප්පිණ මුදලින්දාරාමස්ථ රාජපක්ෂ පරිවෙණාධිපති ගරු රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන්වහන්සේ

බළන්ගොඩ ශ්‍රී ධර්මානන්ද පරිවෙණාධිපති ගරු ආනන්ද මෛත්‍රෙය ස්ථවිරයන්වහන්සේ

බෙල්ලන ධර්මපාල පරිවෙණාධිපති පණ්ඩිත බෙල්ලන ඤාණවිමල ස්ථවිරයන්වහන්සේ

රන්දොඹේ මහාචෛතිය පරිවෙණාධිපති ගරු වලගෙදර පණ්ඩිත සොමාලොක නායක ස්ථවිරයන්වහන්සේ

අඹගහපිටියේ සුගත ශාසනොදය පරිවෙණාධිපති අහුංගල්ලේ පණ්ඩිත විමලකිත්ති නායක ස්ථවිරයන් වහන්සේ

අම්බලන්ගොඩ අග්ගාරාමාධිපති අග්ග මහා පණ්ඩිත ගරු පොල්වත්තේ බුද්ධදත්ත මහා ස්ථවිරයන්වහන්සේ

ගාල්ලේ ගල්වඩුගොඩ විද්‍යාරාජ පරිවෙණාධිපති පණ්ඩිත සුමංගල නායක ස්ථවිරයන්වහන්සේ

බම්බලපිටියේ වජිරාරාමවාසී ගරු නාරද මහා ස්ථවිරයන්වහන්සේ

මාදම්පේ සුනන්දොදය පරිවෙණාධිපති ගල්පොත්තාවෙල ශ්‍රී පඤ්ඤානන්ද ප්‍රධාන නායක ස්ථවිරයන්වහන්සේ

රන්දොඹේ සංඝරාජ විහාරස්ථ ශික්ෂාලංකාර පරිවෙණාධිපති බලපිටියේ පණ්ඩිත විසුද්ධාලොක ස්ථවිරයන්වහන්සේ

මරදානේ ශ්‍රීලංකා විද්‍යාලයාධිපති ගරු බද්දේගම පණ්ඩිත විමලවංශ ස්ථවිරයන්වහන්සේ

පණ්ඩිත එච්. නන්දසාර මහතා

ආචාර්ය්‍ය ආය්‍ය්‍යරත්න වේරුකාන මහතා

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පටුන



# මජ්ඣිම නිකාය

# 3

ධර්මවිනය උගත් පණ්ඩිත
**මහාස්ථවිරයන් වහන්සේලාගේ**
ආධාර ඇතුව

**ආචාර්ය්‍ය අධිනීතිඥ**
## ඒ. පී. ද සොයිසා මහතා
**විසින්**
**සිංහලට පරිවර්තනය කරන ලදී.**

**සීමාසහිත**
**ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ප්‍රථම මුද්‍රණය - 1954
දෙවැනි මුද්‍රණය - 2012

**ත්‍රිපිටකය**

**මජ්ඣිම නිකාය 3**

© කුමාරි ජයවර්ධන

ISBN 978-955-

පිටුවැසුම සැකසුම :
පාලිත සේනානායක

අක්ෂර සංයෝජනය:
නෙල්කා අබේවික්‍රම

ප්‍රකාශනය:
සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම
661,665,675, පී. ද ඇස්. කුලරත්න මාවත, කොළඹ 10.

මුද්‍රණය:
චතුර මුද්‍රණාලය
69, කුමාරදාස පෙදෙස, වැල්ලම්පිටිය.

------------

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# ත්‍රිපිටක සිංහල පරිවර්තනය

බුදුරජාණන් වහන්සේ දෙසූ ධර්මය මුලින්ම සඳහන් වූයේ මාගධී භාෂාවෙන් හෙවත් පසුකලක 'පාළි' නමින් හැඳින්වුණ භාෂාවෙනි. ප්‍රථම ද්විතීය හා තෘතීය ධර්ම සංගායනාවලින් සංගෘහීත වූයේත් ශ්‍රී ලංකාවේදී ග්‍රන්ථාරූඪ වූයේත් මෙම පාළි ත්‍රිපිටකයමය. පසුකාලවලදී එම ත්‍රිපිටකයට අට්ඨකථා හා ටීකා ඉතා වැඩි කොටසක් ලියවුණේ එම පාළි භාෂාවෙන් මය, ශ්‍රී ලංකාවේ දී මය. සිංහල භික්ෂූන් වහන්සේලාගේ ප්‍රමුඛත්වයෙනි. මේ නිසා මූලික ලෙස බුදුදහම හදාළ හැකිව පැවැතුණේ පාළි භාෂාවෙන් මය. සන්න සහ පිටපොත් වශයෙන් සමහර පාළි පොත්වල කොටස් සිංහල භාෂාවට නගා ලියා තිබුණ නමුත් සම්පූර්ණ පරිවර්තනයක් සිදුවී නොතිබිණ. ජාතකට්ඨ කථාව හා විනය පොත්වල කොටස් බොහෝ දුරට සිංහල භාෂාවට පරිවර්තිතව පැවැතිණ. ශ්‍රී ලංකාවේ මුද්‍රණ ශිල්පය පටන්ගැනුනේ මේ තත්ත්වය මතය. වටිනා ඥාණ සම්භාරයක් ඇතුළත්වන සිංහල ජාතිය සන්තකයැයි කිව හැකි බෞද්ධ සාහිත්‍යය සිංහල පාඨකයන්ට කියවා තේරුම් ගත හැකි තත්ත්වයේ වැඩ පිළිවෙළක අවශ්‍යතාව බෙහෙවින් දැනෙන්නට විය.

මේ අවස්ථාවේ නොයෙක් විෂයයන් කෙරෙහි මනස යොමු කළ පඬිවරයෙක් මෙදෙසට යොමු විය. එනම් ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාය. නීතිය, දර්ශනය, විවිධ භාෂා ආදිය ප්‍රගුණ කොට දේශපාලනයට පිවිසි ඒ මහතා දකුණු කොළඹ ආසනයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරුණේය. එක්වරකින්ම එම මග අත්හල එතුමා යොමුවූයේ ධර්ම ශාස්ත්‍රීය කටයුතු වෙතටය. එහි ඵලයක් වූයේ පාළි බෞද්ධ සාහිත්‍යය සිංහල භාෂාවට පරිවර්තනය කිරීමය.

සිංහලයන් සතුව පැවැතුණද ඉතා සුළු පිරිසකට තේරුම් ගත හැකිව තුබූ පාළි ත්‍රිපිටකය හා ඒ සඳහා ලියැවුණ අට්ඨකතා ද ඒවා සඳහා ලියැවුණ ටීකා ග්‍රන්ථද ගත් කල විශාල පොත් සමූහයකි. එම පොත් සමූහය තනිවම සිංහල භාෂාවට නැගීමට කෙනෙකු සිතීම පවා ආශ්චර්යකි. එම අසිරිමත් කාර්යයට සිතත් අතත්

යොමු කළ වීරයා වූයේ ආචාර්ය ඒ. පී. ද සොයිසා ශ්‍රීමතාය. එවකට ශ්‍රී ලංකාවේ ටික දෙනෙකුට ලැබිය හැකිව තුබූ එංගලන්තයට ගොස් පශ්චාත් උපාධියක් ලැබීමට වරම් ලත් එතුමා ශ්‍රී ලංකාවට පැමිණ පිය තැබූ නීති වෘත්තිය මෙන්ම දෙවන වරට යොමු වූ දේශපාලනය ද සිත් නොගත් නිසාදෝ ඒවා වෙනුවට ග්‍රන්ථ රචනයට බැස්සේ තමාගේම තෝරාගැනීමක් ලෙසය.

විසිවන සියවසේ මැද භාගය වනවිට එංගලන්තයේ පාළි පොත් සමාගම පාළි ත්‍රිපිටකයෙන් බොහෝ කොටසක් ඉංග්‍රීසි භාෂාවට පෙරළා මුද්‍රණය කර තිබිණ. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණ බවක් ලබා සිටි ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතා බෞද්ධ සාහිත්‍ය ග්‍රන්ථ සිංහලට නැගීමේදී ඉංග්‍රීසි පරිවර්තන උපයෝගී කරගන්ට ඇත. ඒ සමග එවකට ශ්‍රී ලංකාවේ සිටි ධර්මවිනයධර මහතෙරවරුන්ගේ උපදෙස් ද ලබා ගත් බව එතුමාම පවසා ඇත. මුද්‍රණ පහසුකම් අඩුවෙන් පැවැති එම කාලයේ නිරවුල්ව ස්වකීය ග්‍රන්ථ ප්‍රකාශනය කිරීමට සිතූ එතුමා ධර්මසමය නමින් මුද්‍රණාලයක් ද පටන්ගත්තේය. පාළි ත්‍රිපිටක ග්‍රන්ථවල සිංහල පරිවර්තනයේ සමහර තැන් වියතුන්ගේ විවේචනයටද භාජනද විය.

පාළි භාෂාවෙන් සඳහන් වී ඇති කරුණු පැහැදිලි කිරීමේදී අට්ඨකතාවල පවා මතභේද සහිත තැන් දක්නට ඇත. මේ සෑම ආගමකම දක්නා දෙයකි. බුදුසසුනද වෙන වෙන නිකායවලට බෙදුනේ බුද්ධ දේශනාවන් විවිධව තේරුම් කිරීම නිසාය. විශේෂයෙන් සූත්‍ර පිටකයේ ඇතුළත් වෙන ගැඹුරු අදහස් වෙනත් භාෂාවකින් පැවැසීම සුළුපටු කාර්යයක් නොවේ. ඒ ගැන සලකන විට ආචාර්ය ඒ. පී. ද සොයිසා මහතාට ලොකු සම්මානයක් හිමිය. අඩසියවසකින් පැරැණි වූ එම ග්‍රන්ථ මේ වන විට වෙළඳපොලේ දක්නට නැති බව සලකා ආචාර්ය ඒ. පී. ද සොයිසා සූරීන් පළ කළ සිංහල ත්‍රිපිටකය නැවත මුද්‍රණය කිරීමෙන් එම අඩුව පිරවීමට සිරිසුමන ගොඩගේ සිරිමතාණන් ගත් පියවර ප්‍රශංසනීයය. ඇතැම් පොත් සොයා ගැනීමත් දුෂ්කරය. අපහසුකම් නොසලකා ගත් මෙම පියවර නොපමාව නිම කිරීමට එතුමාට හැකිවේවායි මම ප්‍රාර්ථනා කරමි.

**බෙල්ලන ඥාණවිමල මහානායක ස්ථවිර**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

# පෙරවදන

බෞද්ධ ග්‍රන්ථ අතර මුදුන්මල්කඩ ත්‍රිපිටකයයි. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය මුළුමනින්ම ග්‍රන්ථාරූඪ කර ඇති ත්‍රිපිටකය පළ වී ඇත්තේ පාළි භාෂාවෙනි. එනිසාම වැඩිදෙනෙකුට ත්‍රිපිටකය කියවා අවබෝධ කර ගැනීම බලවත් ගැටලුවක් විය. 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් සංස්කරණය කරන ලද ත්‍රිපිටකය බොහෝවිට උගතුන්ට පමණක් සීමා විය. පසුකාලයේ බොහෝ වියතුන් ත්‍රිපිටකය සිංහලට නැගුවද එම පරිවර්තන ද එතරම් ලිහිල් බසින් පළ නොවිනි.

මෙරට විසූ ප්‍රකට බුද්ධිමතකු මෙන්ම සිංහල, පාළි හා ඉංග්‍රීසි භාෂාත්‍රයෙහි මනා ප්‍රවීණත්වයක් ලද විද්වතකු ද වූ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එවක මෙරට විසූ ධර්ම විනය උගත් පණ්ඩිත මහස්ථවිරයන් වහන්සේලාගේ ආධාර ඇතිව ත්‍රිපිටකය සරල බසින් සිංහලට නැගුවේ එබැවිනි. ත්‍රිපිටකයේ දැනට පළ වී ඇති සිංහල පරිවර්තන අතුරෙන් කියවා පහසුවෙන් අවබෝධ කරගත හැකි, කාටත් වැටහෙන බසින් ලියැවුණ පොත් පෙළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ මෙම පොත් පෙළ බව අපගේ වැටහීමයි. ත්‍රිපිටකය මෙතරම් සරල සිංහලෙන් ලියැවුණ වෙනත් ග්‍රන්ථ මාලාවක් බිහිවී නැත. එබැවින් බොහෝ දෙනා අපෙන් කළ ඉල්ලීම් ද සලකා බලා ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව නැවත මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීමට අප අදහස් කළේ බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය සරල සිංහලෙන් කියවා අවබෝධ කරගනු රිසි පාඨකයන් වෙනුවෙනි.

මෙම බැරෑරුම් කටයුත්තේදී අප මුහුණ දුන් බලවත් ගැටලුව වූයේ පනහ දශකයේ මුල් භාගයේ කාණ්ඩ 48 කින් පළවූ එම සම්පූර්ණ ග්‍රන්ථ මාලාව සොයා ගන්නේ කෙසේද යන්නයි. ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා එම පොත් පෙළ සංස්කරණය

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

කරන සමයෙහි එම කාර්යය සඳහා ඒ මහතාට මග පෙන්වූ මහතෙරුන් වහන්සේලා අතුරෙන් අද ජීවතුන් අතර වැඩසිටින එකම භික්ෂූන් වහන්සේ වන කොල්ලුපිටියේ වාලුකාරාමාධිපති අතිපූජ්‍ය බෙල්ලන ඤාණවිමල මහනායක ස්වාමිපාදයාණන් වහන්සේගේ මග පෙන්වීම මෙහිදී අපට විශාල ශක්තියක් විය.

ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතා සංස්කරණය කළ ත්‍රිපිටකය සරල සිංහල පොත් පෙළ අප වෙත ලබාදීමට කටයුතු කළ විද්‍යෝදය පරිවෙණාධිපති බලන්ගොඩ සෝභිත නාහිමිපාණන් වහන්සේටත්, දොඩන්දූව පූජ්‍ය පණ්ඩිත ගංතලාවේ ගුණානන්ද නායක ස්ථවිරයන් වහන්සේටත්, පූජ්‍ය විද්‍යානිධි අම්බලන්ගොඩ සුමේධානන්ද ස්ථවිරයන් වහන්සේටත්, අරිසෙන් අහුබුදු මහත්මියටත්, ශ්‍රීනාත් ගනේවත්ත මහතාටත්, පාර්ලිමේන්තු මන්ත්‍රී මිලින්ද මොරගොඩ මහතාට සහ එස්. අයි. ගමගේ මහතාටත් අපගේ කෘතගුණපූර්වක ස්තුතිය හිමිවේ.

මෙම ග්‍රන්ථ මාලාව යළි මුද්‍රණය කිරීමට අනුමැතිය පළ කළ ආචාර්ය අධිනීතිඥ ඒ. පී. ද සොයිසා මහතාගේ දියණිය වන ආචාර්ය කුමාරි ජයවර්ධන මහත්මියටත්, පරිගණක අක්ෂර සංයෝජනය කළ නෙල්කා අබේවික්‍රම මහත්මියටත්, මුද්‍රණ සම්බන්ධීකරණයෙන් දායක වුණු පාලිත සේනානායක මහතාටත්, සෝදුපත් කියැවූ මිල්ටන් මද්දුමගේ මහතාටත් අපගේ ස්තුතිය හිමිවිය යුතුය.

**සිරිසුමන ගොඩගේ**

2012 ඔක්තෝබර්.

පටුනේ සඳහන් එක් එක් පරිච්ඡේද වලට පිවිසීම සඳහා ඒ නම් මත **click** කරන්න, නැතිනම් වම් පස **bookmarks** තීරුව භාවිතා කරන්න.

# පටුන


| නො. | | පිට |
|---|---|---|
| 16 | ලටුකිකොපම සූත්‍රය | 929 |
| 17 | චාතුම සූත්‍රය | 941 |
| 18 | නලකපාන සූත්‍රය | 949 |
| 19 | ගුලිස්සානි සූත්‍රය | 960 |
| 20 | කීටාගිරි සූත්‍රය | 966 |
| 21 | තේවිජ්ජ වච්ඡගොත්ත සූත්‍රය | 978 |
| 22 | අග්ගි වච්ඡගොත්ත සූත්‍රය | 982 |
| 23 | මහා වච්ඡගොත්ත සූත්‍රය | 994 |
| 24 | දීඝනඛ සූත්‍රය | 1006 |
| 25 | මාගන්දිය සූත්‍රය | 1013 |
| 26 | සන්දක සූත්‍රය | 1032 |
| 27 | මහාසකුලුදායි සූත්‍රය | 1058 |
| 28 | සමණමණ්ඩික සූත්‍රය | 1094 |
| 29 | චූලසකුළුදායී සූත්‍රය | 1103 |
| 30 | වේඛණස සූත්‍රය | 1125 |
| 31 | ඝටීකාර සූත්‍රය | 1132 |
| 32 | රට්ඨපාල සූත්‍රය | 1146 |
| 33 | මඛාදේව සූත්‍රය | 1174 |
| 34 | මාධූර සූත්‍රය | 1189 |
| 35 | බොධිරාජකුමාර සූත්‍රය | 1206 |
| 36 | අංගුලිමාල සූත්‍රය | 1237 |
| 37 | පියජාතික සූත්‍රය | 1248 |
| 38 | බාහිතික සූත්‍රය | 1259 |
| 39 | ධම්මචේතිය සූත්‍රය | 1268 |
| 40 | කණ්ණකත්ථල සූත්‍රය | 1279 |

41 බ්‍රහ්මායු සූත්‍රය 1289
42 සේල සූත්‍රය 1308
43 අස්සලායන සූත්‍රය 1317
44 ඝෝටමුඛ සූත්‍රය 1335
45 චංකී සූත්‍රය 1353
46 එසුකාරි සූත්‍රය 1375
47 ධානඤ්ජානි සූත්‍රය 1389
48 වාසෙට්ඨ සූත්‍රය 1404

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

# සංඥාපනය

සිංහල ත්‍රිපිටක ධර්ම පොත් පෙළේ හයවෙනිවූ මේ පොතට මජ්ඣිම නිකායෙන් සූත්‍ර තිස් තුනක් පිළිවෙළට අන්තර්ගත කළෙමි. මහ සඟි පහ අතුරෙන් මජ්ඣිම නිකාය එක සඟියකි. සඟියේ සූත්‍ර මධ්‍යම ප්‍රමාණවූ බැවින් ඊට මජ්ඣිම නිකාය යන නාමය යෙදේ. එහි ඇති සූත්‍ර එකසිය පනස් දෙක මූල පණ්ණාසකය, මජ්ඣිම පණ්ණාසකය, උපරි පණ්ණාසකයයි පණ්ණාසක තුනකට බෙදා තිබේ.

මේ පොත් ලියා ප්‍රසිද්ධ කිරීමට නොයෙක් පළාත්වල සංඝයා වහන්සේලා දුන් ආධාරය මහත් උපකාරයක් විය.

මේ පොත් පෙළ කියවීමට නොයෙක් තරාතිරම් වල පින්වතුන් දක්වන උනන්දුව ප්‍රීතියට කරුණක් වේ. සමහර පාඨශාලා ශිෂ්‍යයන් විසින්ද මේ පොත් පිළිවෙළට කියවීමට පටන් ගෙන තිබේ.

බොහෝ වැඩ කටයුතුවල යෙදී සිටින කාලයක, තමන්ට වැඩි සනීපයක්ද නැතුව සිටින නමුත් ඒ හිරිහැර ගැන කිසිසේත් නොසලකා ශාසන ආලයෙන් ආචාර්ය ආයඝිරත්න වේරරුකාන මහත්මයා මේ ව්‍යාපාරයට කරගෙන යන උපකාර මහත් බව නැවතත් දන්වමු.

මේ පොත සඳහා සියලු ආකාරයෙන් අපට ආයඝිරත්න වේරරුකාන මහත්මයාගෙන් ආධාර ලැබුණා පමණක් නොව රන්දොඹේ ශ්‍රී සුධර්මාලංකාර ප්‍රධාන අධිකරණ නායක ස්ථවිරයන් වහන්සේද, බලපිටියේ පණ්ඩිත විසුද්ධාලොක ස්ථවිරයන් වහන්සේද, පින්කන්දේ පණ්ඩිත පඤ්ඤාවාස ස්ථවිරයන් වහන්සේද ආධාර කළෝය.

මේ පොත් ලිවීමට නොයෙක් උපදෙස් සහිත ලියුම් එවා තිබෙන උගත් භික්ෂූන් වහන්සේලාටත් බෞද්ධ උපාසක පින්වතුන්ටත් සාමාජිකයින් වශයෙන් පොත් ගැනීමට බැඳී සිටින පින්වතුන්ටත් අපේ ගෞරව ස්තුතිය පිරිනමමු.

මීට,

**ඒ. පී. ද සොයිසා**

24-2-54
474, ගාලුපාර,
කොල්ලුපිටිය.

# සූත්‍ර ගැන දැනගත යුතු කරුණු ස්වල්පයක්

**බණවර** - 'අකුරු' අටක් එක පදයක් වේ. පද සතරක් ග්‍රන්ථයක් වේ. එනම් අකුරු තිස්දෙකක් ග්‍රන්ථයක් වේ. අකුරු 32 කින් යුත් ග්‍රන්ථ දෙසිය පණහක් බණ වරෙක් වේ. එබැවින් බණ වරක අකුරු අටදහසක් ඇත්තේය.

**නිදානය** - ඒ ඒ සූත්‍රවල උත්පත්ති ස්ථානයයි - සැවැත් නුවර, රජගහ නුවර ආදි ස්ථානයි.

**පුද්ගල තෙම** - ඒ ඒ සූත්‍ර ධර්මයන් දේශනා කිරීමට කාරණ වූ පුද්ගලයායි.

**උද්දේශය** - තේරුම්කර සිහිකරවන කරුණ - හෝ සූත්‍රයේ මාතෘකාව.

**නිර්දේශය** - විස්තර සහිත තේරුම් කිරීම.

**සූත්‍රනාමය** - සූත්‍රනාම නොයෙක් ආකාරයෙන් යෙදී තිබෙන බව පෙනේ - (1) මාතෘකාව අනුව යෙදෙන නාම - මහාසතිපට්ඨාන සූත්‍රය,

(2) දෙශනා කරනු ලැබූ පුද්ගලයා අනුව දෙන නාම - සිගාලෝවාද සූත්‍රය.

(3) සිදුවූ කරුණක් අනුව දෙන නාමය - මහාපරිනිබ්බාණ සූත්‍රය.

(4) බුදුරජාණන් වහන්සේ විසින් අනුමත කරන නාමය අනුව ලැබෙන නාමය - සීහනාද සූත්‍රය

(5) බුදුරජාණන් වහන්සේගෙන් අසන ලද ප්‍රශ්නවලට උත්තර වශයෙන් දෙශනා කරන ලද සූත්‍ර - සක්කපඤ්හ සූත්‍රය.

(6) ඒ ඒ කරුණු මාතෘකා කරගෙන විස්තර කර දීමට දෙශනා කරනලද සූත්‍රවලට දී තිබෙන නාම - සාමඤ්ඤඵල සූත්‍රය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්.  http://pitaka.lk

# මජ්ඣිම නිකාය

## (මජ්ඣිම පණ්ණාසකය.)

## 16. ලටුකිකොපම සූත්‍රය.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ අංගුත්තරාප නම් ජනපදයෙහි අංගුත්තරාප වැසියන්ගේ මහගමක්වූ ආපණ නම් ගමෙහි වාසය කළහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි සිවුරු හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙණ ආපණ නම් ගමට වැඩියහ. ආපණ නම් ගමෙහි පිඩු පිණිස හැසිර සවස් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැළකුණේ එක්තරා වනලැහැබක් යම් තැනකද දවල් කාලයෙහි විසීම සඳහා එහි වැඩියහ. ඒ වනලැහැබට පැමිණ, එක්තරා රුකක් මුල දවල් වාසය පිණිස හුන්නේය. ආයුෂ්මත් උදායි ස්ථවිර තෙමේද සිවුරු හැඳ පොරවා පා සිවුරු ගෙණ පෙරවරු කාලයෙහි ආපණයෙහි පිඬුපිණිස පිවිසියේය. ආපණයෙහි පිඬු පිණිස හැසිර සවස් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැලකී ඒ වනලැහැබ යම් තැනකද එහි දවල් වාසය පිණිස ගියේය. ඒ වනලැහැබට පැමිණ, එක් රුකක් මුල දවල් වාසය පිණිස හුන්නේය.

2. ඉක්බිති විවෙකව තනිව සිටියාවූ ආයුෂ්මත් උදායි ස්ථවිරයන්ට මෙබඳු අදහසක් ඇතිවිය. භාග්‍යවතුන්වහන්සේ ඒකාන්තයෙන් අපගේ බොහෝ දුක් දුරු කරන්නෙක. භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් අපගේ බොහෝ සැප රැස්කරන්නෙක. භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් අපගේ බොහෝ අකුසලධර්මයන් දුරුකරන්නෙක. භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් අපගේ බොහෝ කුසලධර්මයන් රැස්කරන්නෙක' (යන අදහසයි.) ඉක්බිති ආයුෂ්මත් උදායි ස්ථවිර තෙමේ සවස්

කාලයෙහි ඵලසමාපත්තියෙන් නැගිට, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එහි පැමිණියේය. එහි පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන් ආයුෂ්මත් උදායි ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීය.

3. "ස්වාමීනි, මෙහි විවේකව තනිව වාසය කළ මට මෙබඳු අදහසක් ඇතිවිය. භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් අපගේ බොහෝ දුක් දුරු කරන්නෙක. භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් අපගේ බොහෝ සැප රැස්කරන්නෙක. භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් අපගේ බොහෝ අකුසල ධර්මයන් දුරු කරන්නෙක. භාග්‍යවතුන් වහන්සේ ඒකාන්තයෙන් අපගේ බොහෝ කුසලධර්මයන් රැස් කරන්නෙක (කියායි.) ස්වාමීනි, අපි පෙර හවසද, උදයද, දවල්ද නොකල්හිද අනුභව කෙළෙමු. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ, යම් හෙයකින් භික්ෂූන් කැඳවා 'මහණෙනි, එසේ නම් තොපි මේ දවල් නොකල්හි භෝජනය අත්හරිව් (යන නියමය කළ) කාලයක් වීද, ස්වාමීනි, ඒ අවස්ථාවෙහි මගේ හිත වෙනස්විය. දොම්නසක්ද ඇතිවිය. කෙසේද, අපට සැදැහැවත් ගෘහපතියෝ දවල් නොකල්හි යම් ප්‍රණීත කන දෙයක් හෝ අනුභව කරණ දෙයක් හෝ දෙත්ද, එයද අපට භාග්‍යවතුන් වහන්සේ ඉවත් කරන්නට කියත්. සුගතයන් වහන්සේ එය අපට දුරුකරන්ට කියත්' යනුවෙනි. ස්වාමීනි, ඒ අපි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි (ඇති) ප්‍රේමයද ගෞරවයද ලජ්ජාවද, භයද, සලකමින් මෙසේ ඒ දවල් නොකල්හි භෝජනය දුරුකෙළෙමු. ස්වාමීනි, ඒ අපි සවසද, උදේද අනුභව කෙළෙමු. ස්වාමීනි, භාග්‍යවතුන්වහන්සේ, යම් හේතුවකින් භික්ෂූන් කැඳවා 'මහණෙනි, එසේ නම් තොපි රාත්‍රි නොකල්හි භෝජනයද අත්හරිව්' (යන නිමය කළ) කාලයක් වීද ස්වාමීනි, ඒ අවස්ථාවෙහිද මගේ හිත වෙනස් විය. දොම්නස්ද ඇති විය. කෙසේද, 'අපට උදේ රාත්‍රි ආහාර වේල් දෙකින් ආහාර වේලක් ඉතා ප්‍රණීත වීද, එයද භාග්‍යවතුන් වහන්සේ අපට ඉවත් කරන්ට කියත්. සුගතයන් වහන්සේ එයද දුරුකරන්ට කියත්' (යනුවෙනි). ස්වාමීනි, පෙර එක් පුරුෂයෙකුට දවල් මස්

මාලු ආදියක් ලැබී මෙසේ කීය. 'එසේ නම් මෙය තබව්. සවස සියලුදෙන එකතුව අනුභව කරමු' කියායි. ස්වාමීනි, යම්කිසි මනාව පිළියෙල කළ කෑම ජාති වෙත්නම් ඒ සියල්ල රාත්‍රියෙහිම අනුභව කරත්, දවල් අනුභව කරන්නේ ස්වල්පයකි. ස්වාමීනි, ඒ අපි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි ප්‍රේමයද, ගෞරවයද, ලජ්ජාවද, භයද සලකමින් මෙසේ ඒ රාත්‍රි නොකල්හි භෝජනය අත්හැරියෙමු.

4. "ස්වාමීනි, පෙර භික්ෂූහු රෑ අඳුරු කලුවරෙහි පිඬු පිණිස හැසිරෙන්නාහු ගම්දොර ගවර වලෙහිද වැටෙත්. ඉඳුල් දිය දමන වලෙහිද වැටෙත්. කටුවැටටද නගිත්. ලැගහුන් දෙන පිටද නගිත්. සොරකම් කළ හෝ නොකළ හොරු හා එකතු වෙත්. ස්ත්‍රීහුද අසද්ධර්මය සඳහා කැඳවත්. ස්වාමීනි, මම පෙර රෑ අඳුරු කලුවරෙහි පිඬු පිණිස හැසුරුනෙමි. (එකල) බඳුනක් සෝදන එක් ස්ත්‍රියක් විදුලි එළියෙන් මා දැක්කාය. මා දැක බියවී 'මා නැසුණේය. අමනුෂ්‍යයෙක්! අමනුෂ්‍යයෙක්! (කියා) කෑගැසීය. එසේ කෑගැසූ කල්හි, ස්වාමීනි මම ඒ ස්ත්‍රියට මෙසේ කීයෙමි. 'නැගණිය, මම අමනුෂ්‍යයෙක් නොවෙමි. පිඬු පිණිස වැඩ සිටි භික්ෂුවකි'. 'භික්ෂුවගේ පියා මැරුණේද? මව මළාද? භික්ෂූන් වහන්ස, රෑ අඳුරෙහි කුස නිසා පිඬු පිණිස හැසිරෙනවාට වඩා තියුණු ගෙරිකපන කැත්තෙන් කුස කපා දැමීම හොඳයයි' කීය. ස්වාමීනි, එය සිහිවෙන මට මෙබඳු සිතක් වෙයි. 'භාග්‍යවතුන් වහන්සේ අපගේ බොහෝ දුක් දුරුකරන්නෙක. භාග්‍යවතුන් වහන්සේ අපගේ බොහෝ සැප රැස්කරන්නෙක, භාග්‍යවතුන් වහන්සේ අපගේ බොහෝ අකුශලධර්මයන් දුරුකරන්නෙක. භාග්‍යවතුන් වහන්සේ අපගේ බොහෝ කුශලධර්මයන් රැස් කරන්නෙක, (කියායි.)

5. "උදායීය, එය එසේමය. මා විසින් මෙය දුරුකරව්යයි කියනු ලබන කල්හි ඇතැම් හිස් පුරුෂයෙක් 'මේ ශ්‍රමණ තෙමේ මේ සුලුදේ ගැන කුඩාදේ ගැන කියන්නේ කුමටද, සොයන්නේ කුමට දැයි' කියත්. ඔවුහු එයද අත්නොහරිත්. උදායීය, ශික්ෂාව කැමති (සිල්වත්) යම් භික්ෂූහු වෙත්ද ඔවුන් කෙරෙහි නොසතුට

උපදවත්. ඒ හිස් පුරුෂයන්ට එය බලවත් බැඳුමක්, දැඩි බැඳුමක්, ස්ථිර බැඳුමක් බෙල්ලේ එල්ලූ මහ ලීයක් මෙන් වෙයි.

6. "උදායීය, යම්සේ හුළං කිරිල්ලියක් රසකිඳ වැලකින් බඳනා ලද්දී එහි වධයට හෝ බන්ධනයට හෝ මරණයට හෝ පැමිණෙයි. ඇයට එය සවි නැති බැඳුමෙක, දුබල බැඳුමෙක, අස්ථිර බැඳුමෙක, හරනැති බැඳුමෙකැයි යමෙක් කියයි නම් උදායීය, ඔහු හරිවූවක් කියන්නේද?" "ස්වාමීනි, එසේ නොවේය. ස්වාමීනි, රසකිඳ, වැලෙන් බඳින ලද ඒ හුළං කිරිල්ලිය එතැනම වධයට හෝ බන්ධනයට හෝ මරණයට හෝ පැමිණෙයි. එය ඇයට බලවත් බැඳුමෙක, දැඩි බැඳුමෙක, ස්ථිර බැඳුමෙක, ශක්තිමත් බැඳුමෙක, බෙල්ලේ එල්ලූ මහ ලීයක් වැනිය.

7. "උදායීය, එමෙන්ම ඇතැම් හිස් පුරුෂයෝ මෙය දුරකරව් යයි මා විසින් කියන ලද කල්හි ඔව්හු 'මේ සුළු කරුණ කුමටද, කුඩා කරුණ කුමටද? මේ ශ්‍රමණ තෙම මේ සුළු කරුණෙහිත් බොහෝ උත්සාහ කරත්යයි, කියත්. ඔවුහු එය අත්නොහරිත්. මා කෙරෙහිද ශික්ෂාව කැමති (-සිල්වත්) යම් භික්ෂූහු වෙත්ද, ඔවුන් කෙරෙහිද නොසතුට පහළ කරත්. ඔවුන්ට එය බලවත් බැඳුමක්, දැඩි බැඳුමක් ස්ථිර බැඳුමක්, ශක්තිමත් බැඳුමක් බෙල්ලේ එල්ලූ මහ ලීයක් මෙන් වෙයි.

8. "උදායීය, මේ ශාසනයෙහි ඇතැම් කුලපුත්‍රයෝ 'මෙය දුරුකරව්යයි' මා විසින් කියනු ලබන කල්හි ඔවුහු, භාග්‍යවතුන් වහන්සේ අපට යමක් දුරු කිරීමට කියත්ද එය ඉතා සුළු දෙයක් කුඩා දෙයක් නොවේදැයි, 'කියත්. ඔව්හු එය අත්හරිත්. මා කෙරෙහිද, ශික්ෂාව කැමති (සිල්වත්) යම් භික්ෂූහු වෙත්ද ඔවුන් කෙරෙහිද නොසතුට පහළ නොකරත්. ඔව්හු එය දුරුකොට වෙනසක් නැතිව, ලොමු දැහැගැනුම් නැතිව, අනුන් දෙන දෙයින් යැපෙන්නෝව, (අද හෙට කෙසේද යන) බලාපොරොත්තු නැති සිතින් යුක්තව වාසය කරත්. උදායීය, එය ඔවුන්ට සවි නැති බැඳුමෙක, දුබල බැඳුමෙක, අස්ථිර බැඳුමෙක, හරනැති බැඳුමෙක.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**9.** "උදායීය, යම්සේ නගුලිස් වැනි දත් ඇති, උදුරා දැමීමෙහි දක්ෂ, වංශවත්, යුදයට යන ඇතා දැඩි වර පට ඇත්තාවූ බැඳුමෙන් බඳනා ලද්දේ ශරීරය ටිකක් නමා ඒ බැඳුම් සිඳ බිඳ දමා කැමති තැනකින් ගමන් කරයි. උදායීය, නගුලිස් වැනි දත් ඇති, උදුරා දැමීමෙහි දක්ෂ, වංශවත්, යුදයට යන ඇතා දැඩි වරපටින් බඳනා ලද්දේ ශරීරය ටිකක් නමා ඒ බැඳුම් සිඳ බිඳ කැමති තැනකින් ගමන් කරයිද, ඒ ඇතාට එය බලවත් බැඳුමෙක, දැඩි බැඳුමෙක, තිර බැඳුමෙක, නොවෙනස් බැඳුමෙක, බෙල්ලේ එල්ලූ මහලීයක් මෙන් වේයයි යමෙක් කියන්නේ නම්, උදායීය, ඔහු හරිවූවක් කියන්නේද"?

"ස්වාමීනි, එසේ නොවේය."

"ස්වාමීනි, නගුලිස් වැනි දත් ඇති, උදුරු දැමීමෙහි දක්ෂ, වංශවත්. යුදයට ගිය, ඒ ඇතා දැඩි වරපට ඇති බැඳුමෙන් බඳනා ලද්දේ ශරීරය ටිකක් නමා ඒ බැඳුම්සිඳ බිඳ දමා කැමති තැනකින් ගමන් කරයිද, එය ඔහුට සවි නැති බැඳුමෙක, දුබල බැඳුමෙක, අස්ථිර බැඳුමෙක, හරනැති බැඳුමෙක." "උදායීය, එමෙන් මේ ශාසනයෙහි ඇතැම් කුල පුත්‍රයෝ මෙය අත්හරිව්යයි මා විසින් කියනු ලබන කල්හි 'භාග්‍යවතුන් වහන්සේ අපට යමක් දුරලීමට කී සේක්ද, මේ කිමෙක්ද, සුළු ඉතා සුළු පහකළ යුතු කරුණකියි. 'කියත්. ඔවුහු එය අත්හරිත්. මා කෙරෙහිද, ශික්ෂාව කැමති (සිල්වත්) භික්ෂූහු වෙත්ද, ඔවුන් කෙරෙහිද නොසතුට පළ නොකරත්. ඔව්හු එය දුරුකොට වෙහෙසක් නැතිව, ලොමුදැහැගැනුම් නැතිව, අනුන් දෙන දෙයින් යැපෙන්නෝව, (අද හෙට කෙසේද යන) බලාපොරොත්තු නැති සිතින් යුක්තව වාසය කරත්. උදායීය, එය ඔවුන්ට සවි නැති බැඳුමෙක, දුබල බැඳුමෙක, අස්ථිර බැඳුමෙක, හරනැති බැඳුමෙක.

**10.** "උදායීය, යම්සේ දිළිඳු, තමාගේයයි කියයුතු කිසි දෙයක් නැති දුප්පත් මිනිසෙක් වෙයිද, ඔහුට කැඩී බිඳී එල්බෙන, කපුටන් එහා මෙහා යන එක් ගෙපැලක් ඇත්තේය. ඉරීගිය එක් වැල් ඇඳක් ඇත්තේය. කුරහන්, ලබු ඇට, මෑඇට දැමූ එක්මුට්ටියක් ඇත්තේය. ඔහුට අවලක්ෂණ බිරිඳක් ඇත්තේය. ඒ මිනිසා

ආරාමයක අත් පා සෝදා පිරිසුදු කොට හොඳ අහර වළඳා, සිහිල් සෙවනක හිඳ, සිත එකඟ කළ භික්ෂුවක් දක්නේය. (එවිට) ඔහුට මෙබඳු සිතක් වන්නේය. ‘පින්වත, මහණකම සැපය, පින්වත, මහණකම නීරෝගය’ (කියායි) (ඔහුට) යම්බඳුවූ ‘මම කෙස්රැවුල් කපා කසාවත් හැඳ පොරවා ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වන්නෙම් නම් හොඳයයි සිතෙන්නේය.’ එහෙත් ඔහුට කැඩී බිඳී එල්බෙන, කපුටන් එහා මෙහා යන ගෙපැල හැර දමා ඉරීගිය වැල් ඇඳ හැරදමා, කුරහන්, ලබු ඇට, මෑ ඇට මුට්ටිය හැරදමා, අවලක්ෂණ බිරිඳ හැරදමා, කෙස් රැවුල් බහා කසාවත් හැඳ පොරවා ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවන්ට නොහැකිවෙයි.

“උදායීය, යම්බඳු බැඳුමකින් බැඳුනු ඒ මිනිසා කැඩී බිඳී එල්බෙන, කපුටන් එහා මෙහා යන ගෙපැල හැරදමා ඉරීගිය වැල් ඇඳ හැර දමා, කුරහන්, ලබු ඇට මෑ ඇට මුට්ටිය හැරදමා, අවලක්ෂණ බිරිඳ හැරදමා කෙස් රැවුල් බහා කසාවත් හැඳ පොරවා ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවන්ට නොහැක්කේද, ඔහුගේ ඒ බැඳුම සවිනැති බැඳුමෙක, දුබල බැඳුමෙක, අස්ථිර බැඳුමෙක, හර නැති බැඳුමකැයි යමෙක් කියන්නේද, උදායිය, ඔහු හරිවූවක් කියන්නේද?” “නැත ස්වාමීනි”. යම් බැඳුමකින් බැඳුනු ඒ මිනිසා, කැඩී බිඳී එල්බෙන, කපුටන් එහා මෙහා යන ගෙපැල හැර දමා, ඉරී ගිය වැල් ඇඳ හැරදමා, කුරහන්, ලබු ඇට, මෑ ඇට මුට්ටිය හැරදමා, අවලක්ෂණ බිරිඳ හැරදමා කෙස් රැවුල් බහා කසාවත් හැඳ පොරවා ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවන්ට නොහැක්කේද. ඔහුගේ ඒ බැඳුම් සවි ඇති බැඳුමෙක, දැඩි බැඳුමෙක, ස්ථිර බැඳුමෙක, හර බැඳුමෙක, බෙල්ලේ බැඳි මහා ලීයක් වැනිය.

11. “උදායීය, එමෙන්ම, මේ ශාසනයෙහි ඇතැම් හිස් පුරුෂයෝ, මෙය අත්හරීවායයි මා විසින් කියනු ලබන කල්හි ‘මේ සුළු කරුණ කුමටද? මේ කුඩා කරුණ කුමටද? මේ ශ්‍රමණ තෙම කුඩා දෙයෙහි බොහෝ උත්සාහ කරතියි” කියත්. ඔවුහු එය නොහරිත්. මා කෙරෙහිද, ශික්ෂාව කැමති (-සිල්වත්) යම්

භික්ෂූහු වෙත්ද, ඔවුන් කෙරෙහිද නොසතුට පහළ කරත්. ඔවුන්ට එය බලවත් බැඳුමක්, දැඩි බැඳුමක්, ස්ථිර බැඳුමක්, ශක්තිමත් බැඳුමක්, බෙල්ලේ බැඳ මහලීයක් මෙන් වෙයි.

12. "උදායීය, යම්සේ නොයෙක් රන් මිළ රැස් කළාවූද, නොයෙක් වී ආදී ධාන්‍ය රැස් කළාවූද, නොයෙක් කුඹුරු රැස් කළාවූද නොයෙක් වතුපිටි රැස් කළාවූද, නොයෙක් භාර්යා සමූහ ඇත්තාවූද, නොයෙක් දාස සමූහයා ඇත්තාවූද, නොයෙක් දාසි සමූහයා ඇත්තාවූද, පොහොසත් ධනවත් සැපවත් ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ වෙත්ද, ඔව්හු අත් පා සෝදා පිරිසුදු කළ, හොඳ අහර වැළඳූ, සිහිල් සෙවනක හිඳ සිත එකඟ කළ, භික්ෂුවක් දක්නේය. (එවිට) ඔහුට මෙබඳු සිතක් වන්නේය. "පින්වත, මහණකම සැපය, පින්වත, මහණකම නිරෝගය (කියායි.) ඔහු යම් බඳුවූම, මම කෙස් රැවුල් බහා කසාවත් හැඳ පොරවා ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වන්නෙම් නම් හොඳයයි සිතන්නේය. ඔවුන්ට නොයෙක් රන් රාසි හැර, නොයෙක් ධාන්‍ය රාසි හැර, නොයෙක් කුඹුරු හැර, නොයෙක් භාර්යාවන් හැර, නොයෙක් වතුපිටි හැර නොයෙක් දාස සමූහයන් හැර, නොයෙක් දාසි සමූහයන් හැර, කෙස් රැවුල් කපා, කසාවත් හැඳ පොරවා, ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවන්ට හැකිවන්නේය. උදායීය, ඒ ගෘහපතියා හෝ ගෘහපති පුත්‍රයා හෝ යම් බැඳුමකින් බැඳුනේ නොයෙක් රන් රාසි හැර, නොයෙක් ධාන්‍ය රාසි හැර, නොයෙක් කුඹුරු හැර, නොයෙක් වතුපිටි හැර, නොයෙක් භාර්යා සමූහයන් හැර, නොයෙක් දාස සමූහයන් හැර, නොයෙක් දාසි සමූහයන් හැර, කෙස් රැවුල් බහා, කසාවත් හැඳ පොරවා ශාසනයෙහි පැවිදි වන්ට හැක්කේය. එය ඔහුට බලවත් බැඳුමෙක, දැඩි බැඳුමෙක, තිර බැඳුමෙක, ශක්තිමත් බැඳුමෙක, බෙල්ලේ බැඳි මහ ලීයක් වැනි'යි කියන්නේද? උදායීය, ඔහු හරිවූවක් කියන්නේද?"

"ස්වාමීනි, එසේ නොවේය."

"ස්වාමීනි, යම් බැඳුම්වලින් බැඳුනු ඒ ගෘහපතියා හෝ ගෘහපති පුත්‍රයා හෝ නොයෙක් රන් රාශි හැර, නොයෙක්

ධාන්‍ය රාශි හැර, නොයෙක් කුඹුරු හැර, නොයෙක් වතුපිටි හැර, නොයෙක් භාර්යා සමූහයන් හැර, නොයෙක් දාස සමූහයන් හැර, නොයෙක් දාසි සමූහයන් හැර, කෙස් රැවුල් බහා. කසාවත් හැඳ පොරවා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවන්ට හැකිවෙයි. එය ඔහුට සවි නැති බැඳුමෙක, අස්ථිර බැඳුමෙක, හර නැති බැඳුමෙක.

13. "උදායීය, එමෙන්ම මේ ශාසනයෙහි ඇතැම් කුල පුත්‍රයෝ මෙය අත්හරිව්යයි මා විසින් කියනු ලබන කල්හි 'භාග්‍යවතුන් වහන්සේ අපට යමක් පහ කිරීමට කියත්ද, සුගතයන් වහන්සේ අපට යමක් දුරලීමට කියත්ද මේ කිමෙක්ද? සුළු ඉතා සුළු පහකළ යුතුකරුණකියි. 'කියත්. ඔවුහු එය අත් හරිත්, මා කෙරෙහිද ශික්ෂාව කැමති (සිල්වත්) යම් භික්ෂූහු වෙත්ද, ඔවුන් කෙරෙහිද නොසතුට පහළ නොකරත්. ඔවුහු එය දුරු කොට, වෙහෙසක් නැතිව, ලොමු දැහැගැනුම් නැතිව, අනුන් දෙන දෙයින් යැපෙන්නෝව, (අද හෙට කෙසේද යන) බලාපොරොත්තු නැති සිතින් යුක්ත වාසය කරත්. උදායීය, එය ඔවුන්ට සවිනැති බැඳුමෙක, අබල බැඳුමෙක, අස්ථිර බැඳුමෙක.

14. "උදායීය, ලෝකයෙහි මේ පුද්ගලයෝ සතර දෙනෙක් වෙත්. ඒ සතර දෙන කවරහුද? උදායීය, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් උපධි දුරුකිරීම පිණිස, උපධි පහ කිරීම පිණිස පිළිපන්නේ වෙයි. උපධි දුරලීම පිණිස, උපධි පහකිරීම පිණිස, පිළිපන්නාවූ ඒ පුද්ගලයා උපධි හා යෙදුනු කල්පනාවෝ යට කරත්. ඔහු ඒ උපධීන් ඉවසයි. දුරු නොකරයි. නොසංසිඳුවයි. අවසන් නොකරයි. නැතිබවට නොපමුණුවයි. උදායීය, මම මේ පුද්ගලයා කෙලෙස් සහිත යයි කියමි. කෙලෙස් රහිතයයි නොකියමි. එයට හේතු කවරේද? උදායීය, මා විසින් මේ පුද්ගලයා කෙරෙහි ඉඳුරන්ගේ වෙනස් බව දන්නා ලදී.

15. "උදායීය, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් උපධි දුරලීම පිණිස, උපධි පහකිරීම පිණිස, පිළිපදින්නේ වෙයි. උපධි දුරලීම පිණිස, උපධි පහකිරීම පිණිස පිළිපදින ඔහු උපධි හා යෙදුන කල්පනාවෝ යට කරත්. ඔහු ඒ උපධීන් නොඉවසයි.

දුරු කෙරෙයි, සංසිඳුවයි, අවසන්කරයි. උදායීය, මම මේ පුද්ගලයාද කෙලෙස් සහිතයෙකැයි කියමි. කෙලෙස් රහිතයයි නොකියමි. එයට හේතු කවරේද? උදායීය, මා විසින් මේ පුද්ගලයා කෙරෙහි ඉඳුරන්ගේ වෙනස් බව දන්නා ලදී.

16. "උදායීය, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් උපධි දුරලීම පිණිස, උපධි පහකිරීම පිණිස පිළිපන්නේ වෙයි. උපධි දුරලීම පිණිස, උපධි පහකිරීම පිණිස පිළිපන් ඔහු ඇතැම් විටෙක සිහි මුළාව හෙතුකොට ගෙන උපධි හා යෙදුනු කල්පනාවෝ යට කරත්. උදායීය, (ඔහුට) සිහිය පහළවීම ප්‍රමාදය. සිහිය පහළවනවාත් සමඟම එය වහාම දුරුකරයි. සංසිඳුවයි. අවසන් කරයි නැති බවට පමුණුවයි. උදායීය, යම්සේ දවසක් මුලුල්ලෙහිම රත්කරණ ලද යකඩ තැටියක දියබිංදු දෙකක් තුනක් වැටේද උදායීය, දියබිඳු වැටීම ප්‍රමාදවෙයිද, වැටෙනවා සමගම ඒ දියබිඳු වහා ක්ෂයවීමට, අවසානයට යන්නේද, උදායීය, එමෙන් මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් උපධි දුරලීම පිණිස උපධි නැතිකිරීම පිණිස පිළිපදින්නේවේද, උපධි දුරලීම පිණිස උපධි අතහැර දැමීම පණිස පිළිපදින ඔහු කිසිවිටෙක සිහි මුළාව නිසා උපධි හා කල්පනාවෝ යට කරත්ද, උදායීය, සිහිය පහළවීම ප්‍රමාද වෙයි. සිහිය පහළ වනු සමගම වහාම එය දුරු කරයි. සංසිඳුවයි. අවසන් කරයි. නැති බවට පමුණුවයි. උදායීය මම මේ පුද්ගලයාද කෙලෙස් සහිතයයි කියමි. කෙලෙස් රහිතයයි නොකියමි. එයට හේතු කවරේද? උදායීය, මේ පුද්ගලයා කෙරෙහි මා විසින් ඉඳුරන්ගේ වෙනස් බව දන්නා ලදී.

17. උදායීය, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් පඤ්චස්කන්ධ උපධිය දුකට මුලයයි දැන ක්ලේශ උපධිය නැත්තෙක් වේද නිවන අරමුණු කිරීමෙන් කෙලෙසුන් කෙරෙන් මිදුනේද, උදායීය මම මේ පුද්ගලයා කෙලෙස් රහිතයෙකැයි කියමි. කෙලෙස් සහිතයෙකැයි නොකියමි. එයට හේතු කවරේද? උදායීය මේ පුද්ගලයා කෙරෙහි ඉඳුරන්ගේ වෙනස් බව මා විසින් දන්නා ලදී.

18. උදායීය, මේ කාමගුණ පසෙකි. ඔහු කවරහුද? ඉෂ්ට කාන්ත මන වඩන ප්‍රිය ස්වභාවය ඇති ඇලුම් කරණ ඇසින් දැක්ක යුතු රූපයෝය. ඉෂ්ටවූ කාන්තවූ මන වඩන්නාවූ ප්‍රියවූ කාමයෙන් යුතු කණින් ඇසියයුතු ශබ්දයෝය. ඉෂ්ටවූ කාන්තවූ මන වඩන්නාවූ ප්‍රියවූ කාමයෙන් යුතු නාසයෙන් දත යුතු ගන්ධයෝය. ඉෂ්ටවූ කාන්තවූ මන වඩන්නාවූ ප්‍රියවූ කාමයෙන් යුතු දිවෙන් දතයුතු රසයෝය. ඉෂ්ට කාන්ත මන වඩන ප්‍රිය කයින් දතයුතු ස්පර්ශයෝ යන මොහු පස්කම් ගුණයෝය.

"උදායීය, මේ පස්කම් ගුණ නිසා යම් සැප සොම්නසක් උපදීද, මේ කාම සැපය, අසුචි සැපයෙක, පුහුදුන් සැපයෙක, අනාර්ය සැපයෙක, සේවනය නොකළ යුත්තෙක, නොවැඩිය යුත්තෙක, බහුල නොකළ යුත්තෙකැයි කියනු ලැබේ. මේ සැපයට බිය විය යුතුයයි කියමි.

උදායීය, මේ ශාසනයෙහි භික්ෂුවක් කාමයන්ගෙන් වෙන්ව අකුසලයන්ගෙන් වෙන්ව, විතර්ක විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ප්‍රථම ධ්‍යානයට එළඹ වාසය කරයිද, විතර්ක විචාරයන්ගේ සංසිඳවීමෙන් සිතෙහි පැහැදීම ඇති. සිත පිළිබඳ එකගබව ඇති, අවිතර්ක අවිචාර සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කරයිද, ප්‍රීතියෙහිද නො ඇලීමෙන් උපෙක්ෂා ඇත්තේ වාසය කරයිද, සිහියෙන් යුක්ත වූයේ නුවණින් යුක්තවූයේ ශරීරයෙන් සුවය විඳින්නේද, යම් ඒ ධ්‍යානයක් උපේක්ෂා ඇත්තේ සිහි ඇත්තේ සැප විහරණ ඇත්තේයයි ආර්යයෝ කියත්ද ඒ තුන්වන ධ්‍යානයට පැමිණ වාසය කරයිද, සැපය දුරු කිරීමෙන්ද, දුක දුරු කිරීමෙන්ද, පළමුවම සොම්නස් දොම්නස් දෙදෙනාගේ නැති කිරීමෙන් දුක්ද නොවූ සැපද නොවූ උපේක්ෂා සිහියෙන්. පිරිසිදු බව ඇති සතරවන ධ්‍යානයට පැමිණ වාසය කරයිද, මේ කාමයෙන් නික්මුනු සැපයයිද, විවේකයෙන් ලත් සැපයයිද, කෙලෙස් සංසිඳුවීමෙන් ලත් සැපයයිද, මාර්ගාවබෝධය පිණිස සැපයයිද, සේවනය කළයුතු සැපයයිද, වැඩිය යුතු සැපයයිද, බහුල කළයුතු සැපයයිද කියනු ලැබේ. මේ සැපයට බිය නොවිය යුතුයයි කියමි.

19. "උදායීය, මේ ශාසනයෙහි භික්ෂුවක් කාමයන්ගෙන් වෙන්ව අකුශල ධර්මයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරයිද, උදායීය, මම මෙය කම්පාවන ස්වභාවය ඇත්තේයයි කියමි. එහි කම්පාවීම නම් කුමක්ද, එහි නිරුද්ධ නොකළාවූ විතර්ක විචාරයෝ වෙත්ද, මේ එහි කම්පාවීමයි. උදායීය, මේ ශාසනයෙහි භික්ෂුවක් විතර්ක විචාරයන්ගේ සංසිඳවීමෙන් තමා තුළ පැහැදීම ඇති, හිතේ එකඟ බව ඇති, විතර්ක රහිතවූ, විචාර රහිතවූ, සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති දෙවෙනි ධ්‍යානයට පැමිණ වාසය කරයිද, උදායීය, මෙයද මම කම්පාවන ස්වභාවය ඇත්තේයයි කියමි. එහි කම්පාවීම නම් කුමක්ද? එහි යම් නිරුද්ධ නොකළාවූ ප්‍රීතිය හා සැපය වේද මේ එහි කම්පාවීමයි. උදායීය, මේ ශාසනයෙහි භික්ෂුවක් ප්‍රීතියේද නොඇලීමෙන් උපේක්ෂා ඇත්තේ වාසය කරයි, සිහියෙන් යුක්තවූ නුවණින් යුක්තවූයේ ශරීරයෙන් සුවය විඳින්නේද, යම් ඒ ධ්‍යානයක් උපෙක්ෂා ඇත්තේ සිහි ඇත්තේ සැප විහරණ ඇත්තේයයි ආර්යයෝ කියද්ද, ඒ තුන්වන ධ්‍යානයට පැමිණ වාසය කරයිද, උදායීය, මම මෙයද කම්පාවන ස්වභාවය ඇත්තේ යයි කියමි. එහි කම්පාවීම නම් කුමක්ද? එහි නිරුද්ධ නොකළාවූ උපේක්ෂා සැපයක් වේද, මේ එහි කම්පාවීමයි. උදායීය, මේ ශාසනයෙහි භික්ෂුවක් සැපය දුරු කිරීමෙන්ද, දුක දුරුකිරීමෙන්ද, පළමුවම සොම්නස් දොම්නස් දෙදෙනාගේ නැසීමෙන් දුක්ද නොවූ සැපද නොවූ උපේක්ෂා සිහියෙන් පිරිසිදු බව ඇති සතරවන ධ්‍යානයට පැමිණ වාසය කරයිද, උදායීය, මෙය මම කම්පා නොවන ස්වභාවය ඇත්තේයයි කියමි.

20. "උදායීය, මේ ශාසනයෙහි භික්ෂුවක් කාමයන්ගෙන් වෙන්වම අකුශල ධර්මයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති පළමුවන ධ්‍යානයට පැමිණ වාසය කරයිද, උදායීය, මෙය මම සෑහේයයි නොකියමි. 'දුරුකරව්' යයි කියමි. 'ඉක්මවව්' යයි කියමි. එහි ඉක්මවීම නම් කුමක්ද? උදායීය, මේ ශාසනයෙහි භික්ෂුවක්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

විතර්ක විචාරයන් සන්සිඳවීමෙන් තමා තුළ පැහැදීම ඇති. හිතේ එකඟබව ඇති, විතර්ක රහිතවූ විචාර රහිතවූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති දෙවන ධ්‍යානයට පැමිණ වාසය කරයිද, මේ එය ඉක්මවීමයි. උදායීය, මෙයද මම සෑහේයයි නොකියමි. දුරුකරව්යයි කියමි. ඉක්මවව්යයි කියමි. එහි ඉක්මවීම නම් කුමක්ද? උදායීය, මේ ලෝකයෙහි භික්ෂුවක් ප්‍රීතියගේද නො ඇලීමෙන් උපේක්ෂා ඇත්තේ වාසය කරයි. සිහියෙන් යුක්තවූයේ නුවණින් යුක්තවූයේ ශරීරයෙන් සුවය විඳින්නේද, යම් ඒ ධ්‍යානයක් උපේක්ෂා ඇත්තේ සිහි ඇත්තේ සැප විහරණ ඇත්තේයයි ආර්යයෝ කියද්ද, ඒ තුන්වන ධ්‍යානයට පැමිණ වාසය කරයිද මේ එය ඉක්මවීමයි. උදායීය, මම මෙයද සෑහේයයි නොකියමි. 'දුරු කරව්'යයි කියමි. ඉක්මවව්'යයි කියමි. එහි ඉක්මවීම නම් කුමක්ද? උදායීය, මේ ශාසනයෙහි භික්ෂුවක් සැපයද පහ කිරීමෙන් දුකද පහකිරීමෙන් පළමුවම සොම්නස් දොම්නස් දෙදෙනාගේ නැසීමෙන් දුක්ද නොවූ සැපද නොවූ උපෙක්ෂා සිහියෙන් පිරිසිදු බව ඇති ඒ සිවුවන ධ්‍යානයට පැමිණ වාසය කරයිද, මේ එය ඉක්මීමයි. උදායීය, මම මෙයද සෑහේයයි නොකියමි. 'දුරු කරව්'යයි කියමි. 'ඉක්මවව්'යයි කියමි. එහි ඉක්මවීම කුමක්ද, උදායීය, මේ ශාසනයෙහි භික්ෂුවක් සර්වප්‍රකාරයෙන් රූපසංඥාවන්ගේ ඉක්ම වීමෙන්, පටිඝසංඥාවන්ගේ දුරලීමෙන් නානත්තසංඥාවන්ගේ මෙනෙහි නොකිරීමෙන් ආකාශය අනන්තයයි ආකාශානඤ්චායතනයට පැමිණ වාසය කරයි. මේ එය ඉක්මවීමයි. උදායීය, මම මෙයද සෑහේයයි නොකියමි. 'දුරුකරව්'යයි කියමි. 'ඉක්මවව්'යයි කියමි. එය ඉක්මවීම කවරේද? උදායීය, මේ ශාසනයෙහි භික්ෂුවක් සර්වප්‍රකාරයෙන් ආකාශානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තයයි විඤ්ඤාණඤ්චායතනයට පැමිණ වාසය කරයි. මේ එය ඉක්මවීමයි. උදායීය, මම මෙයද සෑහේයයි නොකියමි. 'දුරුකරව්'යයි කියමි. 'ඉක්මවව්ය'යි කියමි. එය ඉක්මවීම නම් කුමක්ද, උදායීය, මේ ශාසනයෙහි භික්ෂුවක් සර්වප්‍රකාරයෙන් විඤ්ඤාණඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ වාසය කරයි. මේ එය ඉක්ම

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වීමයි. උදායීය. මම මෙයද, සෑහේයයි නොකියමි. 'දුරු කරව්'යයි කියමි. 'ඉක්මවව්'යයි කියමි. එහි ඉක්මවීම කුමක්ද?

"උදායීය, මේ ශාසනයෙහි භික්ෂුවක් සර්වප්‍රකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤාණාසඤ්ඤායතනයට පැමිණ වාසය කරයි. මේ එය ඉක්මවීමයි. උදායීය, මම මෙයද සෑහේයයි නොකියමි. 'දුරුකරව්'යයි කියමි. 'ඉක්මවව්'යයි කියමි. උදායීය, මේ ශාසනයෙහි භික්ෂුවක් සර්වප්‍රකාරයෙන් නෙවසඤ්ඤාණාසඤ්ඤායතනය ඉක්මවා සඤ්ඤාවෙදයිත නිරොධයට පැමිණ වාසය කරයි. මේ එය ඉක්මවීමයි. උදායීය, මෙසේ මම නෙවසඤ්ඤානාසඤ්ඤායතනයාගේද දුරු කිරීම කියමි. උදායීය, මම කුඩාවූ හෝ මහත්වූ හෝ යම් සංයොජනයක්හුගේ පහකිරීම නොකියම්ද එවැනි සංයෝජනයක් දක්නෙහිද?

"ස්වාමීනි, එසේ නොවේය"යි කීය.

22. "භාග්‍යවතුන් වහන්සේ මේ සූත්‍රය දෙසනා කළහ. ආයුෂ්මත් උදායී ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ කීමට සතුටු විය.

**භයවෙනිවූ ලටුකිකොපම සූත්‍රය නිමි. (2-6)**

---

## 17 චාතුම සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ චාතුමා නුවර නෙල්ලි වනයෙහි වාසය කළහ. එකල්හි වනාහි සැරියුත් මුගලන් දෙනම ප්‍රධාන කොට ඇති පන්සියයක් පමණ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ දැකීම පිණිස චාතුමා නුවරට පැමිණියාහු වෙත්. ඒ ආගන්තුක භික්ෂූහු නේවාසික භික්ෂූන් සමග සතුටු වෙමින් සෙනසුන් පනවන්නාහු පාසිවුරු තැන්පත් කර තබන්නාහු උස් ශබ්ද මහා ශබ්ද ඇත්තෝ වූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්

වහන්සේට කථාකළහ. "ආනන්දය මසුන් අල්ලන තැන කෙවුලන් මෙන් උස් ශබ්ද මහා ශබ්ද කරන්නෝ කවරහුද?"

2. "ස්වාමීනි, මේ සැරියුත් මුගලන් දෙනම ප්‍රධාන කොට ඇති පන්සියයක් පමණ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ දැකීම පිණිස, චාතුමා නගරයට පැමිණියාහුය. ඒ ආගන්තුක භික්ෂූහු නේවාසික භික්ෂූන් සමග සතුටු වන්නාහු, සෙනසුන් පනවන්නාහු, පා සිවුරු තැන්පත් කර තබන්නාහු, උස් ශබ්ද මහා ශබ්ද ඇත්තාහුය"යි (කීය). "ආනන්දය එසේ නම් 'ශාස්තෘන් වහන්සේ ආයුෂ්මතුන් කැඳවති'යි. මාගේ වචනයෙන් ඒ භික්ෂූන් කැඳවව" "එසේය ස්වාමීනි"යි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට පිළිවදන්දී ඒ භික්ෂූහු යම් තැනකද එහි පැමිණියේය. එහි පැමිණ, 'ශාස්තෘන් වහන්සේ ආයුෂ්මතුන් කැඳවති'යි ඒ භික්ෂූන්ට කීය. 'එසේය ඇවැත්නි"යි ඒ භික්ෂූහු ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට පිළිවදන් දී, භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එහි පැමිණියාහුය. එහි පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පසෙක උන්නාහුය. එක්පසෙක හුන් ඒ භික්ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය කීය. "මහණෙනි, කුමක්හෙයින් තොපි මසුන් අල්ලන තැන කෙවුලන් මෙන් උස් ශබ්ද මහත් ශබ්ද කරන්නහුද"? "ස්වාමීනි, මේ සැරියුත් මුගලන් දෙනම ප්‍රධාන කොට ඇති පන්සියයක් පමණ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ දැකීම පිණිස චාතුමා නුවරට පැමිණියාහුය. ඒ මේ ආගන්තුක භික්ෂූහු නේවාසික භික්ෂූන් සමග සතුටු වන්නාහු සෙනසුන් පනවන්නාහු පා සිවුරු තැන්පත්කර තබන්නාහු, උස් ශබ්ද මහා ශබ්ද ඇත්තාහුය"යි (කීහ.) "මහණෙනි, යව් තොප නෙරපමි. තොප මා වෙත නොවැසිය යුතුය"යි (වදාළහ). "එසේය ස්වාමීනි" ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට සෙනසුන් අකුලා තැන්පත්කර තබා පා සිවුරු ගෙණ ගියාහුය.

3. එසමයෙහි වනාහි චාතුමා නුවර වැසි ශාක්‍යයෝ නගර ශාලාවෙහි රැස්ව හුන්නාහුය. (ඒ) චාතුමා නුවර වැසි ශාක්‍යයෝ දුරදීම ඒ එන භික්ෂූන් දුටුවාහුය. දැක ඒ භික්ෂූහු යම් තැනකද

එතැනට පැමිණියාහුය. පැමිණ ඒ භික්ෂූන්ට "ආයුෂ්මත් නුඹවහන්සේලා මේ දැන් අවුත් මේ දැන් කොහි යන්නහුදැයි?" ඇසූහ.

"ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂූහු සංඝයා නෙරපන ලද්දේය."

"එසේ නම්, ආයුෂ්මතුන් වහන්සේලා මොහොතක් හිඳිනු මැනව. අපි භාග්‍යවතුන් වහන්සේ පහදවන්ට හැකි වන්නෙමු නම් යෙහෙක" කීහ. "එසේය, ඇවැත්නි"යි ඒ භික්ෂූහු චාතුමා නුවර වැසි ශාක්‍යයන්ට පිළිතුරු දුන්නාහුය.

4. ඉක්බිති චාතුමෙය්‍යක ශාක්‍යයෝ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එහි පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පැත්තක උන්නාහුය. එක් පැත්තක හුන් චාතුමෙය්‍යක ශාක්‍යයෝ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීවාහුය. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයාට කැමතිවන සේක්වා ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයාට කථා කරණ සේක්වා. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ යම් සේ පෙර භික්ෂු සංඝයාට අනුග්‍රහ කරණ ලද්දේද, එමෙන්ම භාග්‍යවතුන් වහන්සේ මෙකල්හිත් අනුග්‍රහ කරණ සේක්වා. ස්වාමීනි, ලඟදී පැවිදිවූ මේ ශාසනයට අලුත පැමිණි නවක භික්ෂූහු ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ දැකීමට නොලැබෙන ඒ භික්ෂූන්ට ශ්‍රද්ධාවේ වෙනසක් වන්නේය. පෙරළීමක් වන්නේය. ස්වාමීනි, යම්සේ වතුර නොලැබෙන ළපැටි බීජයන්ට වෙනසක් වන්නේද, පෙරළීමක් වන්නේද, ස්වාමීනි, එමෙන්ම ලඟදී පැවිදිවූ, මේ ශාසනයට අලුතෙන් පැමිණි නවක භික්ෂූහු ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ දකින්ට නොලැබෙන ඒ භික්ෂූන්ට වෙනසක් වන්නේය, පෙරළියක් වන්නේය, ස්වාමීනි, යම්සේ මව දකින්ට නොලැබෙන වසු පැටවෙකුට වෙනසක් වන්නේද, පෙරළියක් වන්නේද, එමෙන්ම ස්වාමීනි, ලඟදී පැවිදිවූ මේ ශාසනයට අලුතෙන් පැමිණි නවක භික්ෂූ ඇත්තාහුය. භාග්‍යවතුන් වහන්සේ නොදක්නා ඔවුන්ට අමුත්තක් වන්නේය. පෙරළියක් වන්නේය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ භික්ෂු

සංඝයාට කැමති වන සේක්වා. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයාට කථා කරණ සේක්වා, ස්වාමීනි, යම්සේ භාග්‍යවතුන් වහන්සේ විසින් පෙර භික්ෂු සංඝයාට අනුග්‍රහ කරණ ලද්දේද, එමෙන්ම භාග්‍යවතුන් වහන්සේ මෙකල්හි භික්ෂු සංඝයාට අනුග්‍රහ කරණසේක්වා.

5. ඉක්බිති සහම්පතී බ්‍රහ්මතෙම තමාගේ සිතින් භාග්‍යවතුන් වහන්සේගේ සිත පිළිබඳ කල්පනාව දැන යම්සේ බලවත් පුරුෂයෙක් හකුලන ලද අත දිගුකෙරේද, දිගුකළ අත හකුලුවාද, එමෙන් බඹලොවෙහි අතුරුදන්වී (නොපෙනී ගොස්) භාග්‍යවතුන් වහන්සේ ඉදිරියෙහි පහළවිය. ඉක්බිති සහම්පතී බ්‍රහ්මතෙම උතුරු සළුව එකාංශකොට භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට ඇඟිලි එකට තබා වැඳ නමස්කාර කොට මේකාරණය කීය. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයාට කැමතිවන සේක්වා. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයාට කථා කරණ සේක්වා ස්වාමීනි, යම්සේ භාග්‍යවතුන් වහන්සේ විසින් පෙර භික්ෂු සංඝයාට අනුග්‍රහ කරන ලදද එමෙන්ම භාග්‍යවතුන් වහන්සේ මෙකල්හි භික්ෂු සංඝයාට අනුග්‍රහ කරන සේක්වා.

ස්වාමීනි, ළඟදී පැවිදිවූ, මේ ශාසනයට අලුත පැමිණි නවක භික්ෂූහු ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ දැකීමට නොලැබෙන ඒ භික්ෂූන්ට අමුත්තක් වන්නේය. වෙනස්කමක් වන්නේය. ස්වාමීනි, යම්සේ වතුර නොලැබෙන ළපැටි බීජයන්ට වෙනසක් වන්නේද, පෙරළීමක් වන්නේද, ස්වාමීනි, එමෙන්ම ළඟදී පැවිදිවූ, මේ ශාසනයට අලුතෙන් පැමිණි නවක භික්ෂූහු ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ දකින්ට නොලැබෙන ඒ භික්ෂූන්ට අමුත්තක් වන්නේය. වෙනස්කමක් වන්නේය.

"ස්වාමීනි, මව දකින්නට නොලැබෙන වසුපැටවෙකුට අමුත්තක් වන්නේද, වෙනස්කමක් වන්නේද එමෙන්ම ස්වාමීනි, ළඟදී පැවිදිවූ මේ ශාසනයට අලුතෙන් පැමිණි නවක භික්ෂූහු ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ නොදන්නා ඔවුන්ට අමුත්තක් වන්නේය. වෙනස්කමක් වන්නේය. ස්වාමීනි, භාග්‍යවතුන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

වහන්සේ භික්ෂු සංඝයාට කැමතිවන සේක්වා. ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයාට කථා කරන සේක්වා. ස්වාමීනි යම්සේ භාග්‍යවතුන් වහන්සේ පෙර භික්ෂු සංඝයාට අනුග්‍රහ කරන ලද්දේද, එමෙන්ම භාග්‍යවතුන් වහන්සේ මෙකල්හි භික්ෂු සංඝයාට අනුග්‍රහ කරන සේක්වා.”

**6.** චාතුමෙය්‍යක ශාක්‍යයෝ හා සහම්පතී බ්‍රහ්මයා බීජෝපමාවෙන් හා තරුණෝපමාවෙන් භාග්‍යවතුන් වහන්සේ පහදවන්ට හැකිවූහ. ඉක්බිති ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේ භික්ෂූන් කැඳවූහ. “ඇවැත්නි, නැගිටිව්, පාසිවුරු ගනිව්, චාතුමෙය්‍යක ශාක්‍යයන් විසින්ද, සහම්පතී බ්‍රහ්මයා විසින්ද, බීජෝපමාවෙන් සහ තරුණෝපමාවෙන් භාග්‍යවතුන් වහන්සේ පහදවන ලදහ”. “එසේය ඇවැත්නි”යි ඒ භික්ෂූහු ආයුෂ්මත් මහා මොග්ගල්ලාන ස්ථවිරයන් වහන්සේට උත්තර දී හුන්තැනින් නැගිට පා සිවුරු ගෙණ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එහි පැමිණියාහුය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක් පැත්තක හුන්නාහුය. එක් පැත්තක හුන් ඇවැත්වූ සැරියුත් තෙරුන්ට භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය කීහ. “ශාරීපුත්තය, මා විසින් භික්ෂූන් නෙරපූ කල්හි ඔබට කුමක් සිතුනේද?’ “ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් භික්ෂු සංඝයා නෙරපූ කල්හි මට මෙබඳු සිතක් විය. ‘භාග්‍යවතුන් වහන්සේ දැන් මද උත්සාහ ඇතිව ඵල සමවත් විහරණයෙහි යෙදී වාසය කරති. අපිදු දැන් මද උත්සාහ ඇතිව ඵලසමවත් විහරණයෙහි යෙදී වාසය කරමු’ (කියායි)

**7.** “ඉවසව සාරිපුත්ත, ඉවසව සාරිපුත්ත, ඔබ විසින් නැවතත් මෙබඳු සිතක් නොඉපදවිය යුතුය.” ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ මහ මුගලන් තෙරුන්ට කථාකළහ. “මොග්ගල්ලානය, මා විසින් භික්ෂු සංඝයා නෙරපූ කල්හි ඔබට කුමක් සිතුනේ ද?” “භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා නෙරපූ කල්හි මට මෙබඳු සිතක් විය. “භාග්‍යවතුන් වහන්සේ දැන් මද උත්සාහ ඇත්තාහ. ඵලසමවත් සැප විහරණයෙහි යෙදී වාසය කරති. මම ද ආයුෂ්මත් සැරියුත් තෙරහු ද භික්ෂු සංඝයා පරිහරණය කරමු කියායි.”

"මොග්ගල්ලානය, යහපති යහපති, මොග්ගල්ලානය, මම හෝ භික්ෂු සංඝයා පරිහරණය කරන්නෙමි, සැරියුත් මුගලන් දෙදෙනා හෝ පරිහරණය කරන්නාහුය."

8. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට කථා කළහ. "මහණෙනි, දියට බසින්නවුන් විසින් බිය සතරක් කැමති විය යුත්තාහුය. ඒ සතර කවරහු ද? රළ වේගයෙන් ඇතිවන බිය, කිඹුලන්ගෙන් ඇති වන බිය, දිය සුළි වලින් ඇති වන බිය, සැඩ මසුන්ගෙන් වන බිය යන මොහුය. දියට බස්නහු විසින් කැමති විය යුතු මේ බිය සතර වෙත්. මහණෙනි, එමෙන්ම ගිහිගෙන් නික්ම මේ සස්නෙහි පැවිදිවන්නහු කෙරෙහි මේ බිය සතරක් කැමති විය යුතුයි. ඒ සතර කවරහු ද? රළ බය, කිඹුල් බය, දිය සුළි බය, සැඩ මසුන් බය (යන සතරයි)

9. "මහණෙනි, (සස්නෙහි) රළ වේග බය නම් කුමක් ද? මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් කුල පුත්‍රයෙක් 'ඉපදීමෙන්, ජරා මරණ දෙකින්, ශොකයන් ගෙන්, වැලපීම්වලින්, දුක්වලින්, දොම්නස්වලින්, උපායාසයන්ගෙන් යුතු වූයෙමි. දුකට බැස ගතිමි. දුකින් මඩනා ලද්දෙමි. මේ සියලු දුක් රාසියේ අවසානයක් දැක්කහොත් යෙහෙකැයි, ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වෙයි. එසේ පැවිදිවූම ඔහුට එක්ව මහණදම් පුරන භික්ෂූහු අවවාද කරත්. අනුශාසනා කරත්. ඔබ මෙසේ ඉදිරියට යා යුතුය. ඔබ මෙසේ පසු හැරී යා යුතුය. ඔබ මෙසේ ඉදිරි දෙස බැලිය යුතුය. ඔබ මෙසේ අනුදිසා බැලිය යුතුය. ඔබ මෙසේ අත් පා දිගු කළ යුතුය. ඔබ මෙසේ දෙපට සිවුර පාත්‍රය තනිපට සිවුර හැඳ පෙරවිය යුතුය. (කියායි.) ඔහුට මෙබඳු සිතක් වෙයි. 'පෙර ගිහිගෙයි විසූ අපි අනුන්ට අවවාද කෙළෙමු. අනුශාසනා කෙළෙමු. අපගේ පුත්‍රයන් පමණයි සිතිය හැකි අපගේ මුණුපුරන් පමණයයි සිතිය හැකි මොව්හු අප අවවාද කළ යුත්තන් කොට අනුශාසනා කළ යුත්තන් කොට සිතත්" (යයි කියා) ඔහු ශික්ෂාව හැර දමා (-සිවුරු හැර) ගිහිවෙයි. මහණෙනි, 'මෙතෙම (සස්නෙහි) රළ වේගයට බයවූයේ ශික්ෂාව හැර දමා (-සිවුරු හැර) ගිහි වූයේ යයි' කියනු ලැබේ. මහණෙනි, රළ වේග බිය යනු ක්‍රොධ උපායාසට (-බලවත් ක්‍රොධයට) නමකි.

10. "මහණෙනි, කිඹුල් බිය කුමක් ද? මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් කුල පුත්‍රයෙක් 'ඉපදීමෙන් ජරා මරණ දෙකින්, ශොකයන්ගෙන් වැලපීම් වලින් දුක් වලින්, දොම්නස් වලින්, උපායාසයන්ගෙන් යුතුවූයෙමි. දුකට බැස ගතිමි. දුකින් මඩනා ලද්දෙමි. මේ සියලු දුක් රාශියේ අවසානයක් දැක්කහොත් යෙහෙකැයි. ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වෙයි. එසේ පැවිදිවූම ඔහුට සමාන බඹසර ඇත්තාහු අවවාද කරත්. අනුශාසනා කරත්. 'ඔබ මෙය කෑයුතුය. ඔබ මෙය නොකෑයුතුය. ඔබ මෙය අනුභව කළ යුතුය. ඔබ මෙය අනුභව නොකළ යුතුය. ඔබ මෙය රස විඳිය යුතුය. ඔබ මෙය රස නොවිඳිය යුතුය. ඔබ මෙය පානය කළ යුතුය. ඔබ මෙය පානය නොකළ යුතුය. ඔබ කැප දෙය කෑ යුතුය. ඔබ අකැප දෙය නොකෑ යුතුය. ඔබ කැප දෙය අනුභව කළ යුතුය. ඔබ අකැප දෙය අනුභව නොකළ යුතුය. ඔබ කැප දෙය රස විඳිය යුතුය. ඔබ අකැප දෙය රස නොවිඳිය යුතුය. ඔබ කැප දෙය පානය කළ යුතුය. ඔබ අකැප දෙය පානය නොකළ යුතුය. ඔබ කාලයෙහි කෑ යුතුය. ඔබ නොකල්හි නොකෑ යුතුය. ඔබ කාලයෙහි අනුභව කළ යුතුය. ඔබ නොකල්හි අනුභව නොකළ යුතුය. ඔබ කාලයෙහි රස විඳිය යුතුය. ඔබ නොකල්හි රස නොවිඳිය යුතුය. ඔබ කාලයෙහි පානය කළ යුතුය. ඔබ නොකල්හි පානය නොකළ යුතුය, (කියායි.) ඔහුට මෙබඳු සිතක් වෙයි. පෙර ගිහිගෙයි විසූ අපි යමක් කැමති වෙමුද, එය කෑවෙමු. යමක් නොකැමැත්තෙමුද, එය නොකෑවෙමු, යමක් කැමති වෙමුද, එය අනුභව කෙළෙමු. යමක් නොකැමැති වෙමුද, එය අනුභව නොකෙළෙමු. යමක් කැමති වෙමුද, එය රස වින්දෙමු, යමක් කැමති වෙමුද, එය පානය කෙළෙමු. යමක් කැමති නොවෙමුද, එය පානය නොකෙළෙමු. කැප දෙයද කෑවෙමු. අකැප දෙයද කෑවෙමු. කැප දෙයද අනුභව කෙළෙමු. අකැප දෙයද අනුභව කෙළෙමු. කැප දෙයද රස වින්දෙමු. අකැප දෙයද රස වින්දෙමු. කැප දෙයද පානය කෙළෙමු. අකැප දෙයද පානය කෙළෙමු. කාලයෙහිද කෑවෙමු. නොකල්හිද කෑවෙමු. කාලයෙහිද අනුභව කෙළෙමු. නොකල්හිද අනුභව කෙළෙමු. කාලයෙහිද රස

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වින්දෙමු. නොකල්හිද රස වින්දෙමු. කාලයෙහිද පානය කෙළෙමු. නොකල්හිද පානය කෙළෙමු. අපට සැදැහැවත් ගෘහපතියෝ දවල් නොකල්හි යම් රසවත් කන දෙයක් අනුභව කළ යුතු දෙයක් (-කන බොන දෙයක්) දෙත්ද, එහිදු මාගේ කටවැසීමක් කරන්නාක් මෙන් වැටහේය'යි ඔහු ශික්ෂාව හැර (-සිවුරු හැර) ගිහිවෙයි. මහණෙනි, මොහු කිඹුල් බයට බයව ශික්ෂාව හැරදමා ගිහිවූයේයයි කියනු ලැබේ. මහණෙනි, කිඹුල් බය යනු කෑදර කමට නමකි.

11. "මහණෙනි, දියසුලි බය කවරේද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් කුලපුත්‍රයෙක් 'ඉපදීමෙන්, ජරා මරණ දෙකින් ශොකයන්ගෙන් වැළපීම්වලින් දුක්වලින් දොම්නස්වලින් උපායාසයන්ගෙන් යුතුවූයෙමි. දුකට බැස ගතිමි. දුකින් මඩනා ලද්දෙමි. මේ සියලු දුක් රාසියේ අවසානයක් දැක්කහොත් යෙහෙකැයි' ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වෙයි. ඔහු මෙසේ පැවිදිවූයේම පෙරවරු කල හැඳ පොරවා පා සිවුරු ගෙණ ගමට හෝ නියම් ගමට හෝ නොරක්නා ලද කයින්, නොරක්නාලද වචනයෙන්, නොඑළඹී සිහියෙන් අසංවර ඉන්ද්‍රියයන්ගෙන් යුක්තව, පිඩු පිණිස පිවිසෙයි, ඔහු එහි පස්කම් ගුණයෙන් යුක්තව කම් සැප විඳින ගෘහපතියෙකු හෝ ගෘහපති පුත්‍රයෙකු හෝ දකී. ඔහුට මෙබඳු සිතක් වෙයි. 'අපි පෙර ගිහි වූවාහුම පස්කම් ගුණයෙන් සම්පූර්ණ වූවාහු' යුක්ත වූවාහු කම්සැප වින්දෙමු. ගෙදර සම්පත්ද වෙත්. සම්පත් අනුභව කරන්ටද පින් කරන්ටද පුළුවන' කියායි. ඔහු ශික්ෂාව හැර (-සිවුරු හැර) ගිහි වෙයි. මොහු දියසුලි බයට බයවූයේ ශික්ෂාව හැර (සිවුරු හැර) ගිහිවූයේයයි කියනු ලැබේ. මහණෙනි, දියසුලි බය යනු පස්කම් ගුණයට නමකි.

12. "මහණෙනි, සැඩමස් බය කුමක්ද? මහණෙනි, මේ ලොකයෙහි ඇතැම් කුල පුත්‍රයෙක් (මෙසේ සිතයි) 'ඉපදීමෙන් ජරා මරණ දෙකින්, ශොකයන්ගෙන්, වැළපීම්වලින් දුක් වලින්, දොම්නස් වලින් යුතුවූයෙමි. දුකට බැස ගතිමි. දුකින් මඩනා ලද්දෙමි. මේ සියලු දුක් රාසියේ අවසානයක් දැක්කහොත්

යෙහෙකැයි,' ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වෙයි. ඔහු මෙසේ පැවිදිවූයේම, පෙරවරුකල හැඳ පොරවා පා සිවුරු ගෙණ ගමට හෝ නියම් ගමට හෝ නොරක්නාලද කයින් නොරක්නාලද වචනයෙන්, නොඑළඹී සිහියෙන්, අසංවර ඉන්ද්‍රියයන්ගෙන් යුක්තව, පිඬු පිණිස පිවිසෙයි. ඒ භික්ෂුව ඒ ගමෙහි හරිහැටි නොහැන්ද, හොඳට නොපෙරෙවූ ස්ත්‍රියක් දැක රාගය තෙමේ භික්ෂුවගේ සිත නසයි. ඒ භික්ෂුව රාගයෙන් විනාශ කළ සිතින් යුක්තව, ශික්ෂාව හැර (-සිවුරු හැර) ගිහි වෙයි. මහණෙනි, සැඬමස් බය යනු මාගමට (-ස්ත්‍රියට) නමකි.

"මහණෙනි, ගිහිගෙන් නික්ම මේ සස්නෙහි පැවිදිවූ මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයන් වෙත මේ බය සතර කැමැති විය යුත්තාහ."

13. භාග්‍යවතුන් වහන්සේ මෙය දෙශනා කළහ. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටු වූහ.

**සත්වෙනිවූ චාතුම සූත්‍රය නිමි. (2-7)**

---

## 18. නලකපාන සූත්‍රය

1. මාගේ ඇසීම මෙසේය, එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ කොසොල් ජනපදයෙහි නලකපාන නම් ගමේ කැල (-එරබඳු) වනයෙහි වාසය කළහ. ඒ කාලයෙහි බොහෝ ප්‍රසිද්ධ ප්‍රසිද්ධ කුල පුත්‍රයෝ භාග්‍යවතුන් වහන්සේ උදෙසා ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූවාහු වෙත්. ආයුෂ්මත් අනුරුද්ධ, ආයුෂ්මත් නන්දිය, ආයුෂ්මත් කිම්බිල, ආයුෂ්මත් භගු, ආයුෂ්මත් කුණ්ඩධාන, ආයුෂ්මත් රෙවත, ආයුෂ්මත් ආනන්ද (සහ) වෙනත් ප්‍රසිද්ධ ප්‍රසිද්ධ කුල පුත්‍රයෝ වෙත්. ඒ කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් විසින් පිරිවරණ ලද්දේ හිස් තැනෙක වැඩහුන්නේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ කුල පුත්‍රයන් අරබයා භික්ෂූන්ට කථාකොට, "මහණෙනි, යම් ඒ

කුලපුත්‍රයෝ මා උදෙසා ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම, සස්නෙහි පැවිදි වූවාහුද, මහණෙනි, කිම ඒ භික්ෂූහු බ්‍රහ්මචර්යාවෙහි ඇලුනාහුද?" මෙසේ කීකල්හි ඒ භික්ෂූහු නිශ්ශබ්ද වූහ. දෙවෙනි වරත් භාග්‍යවතුන් වහන්සේ ඒ කුල පුත්‍රයන් අරබයා භික්ෂූන්ට, කථාකොට, "මහණෙනි, යම් ඒ කුල පුත්‍රයෝ මා උදෙසා ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූවාහුද, මහණෙනි, කිම ඒ භික්ෂූහු බ්‍රහ්මචර්යාවෙහි ඇලුනාහුද" දෙවෙනි වරත් ඒ භික්ෂූහු නිශ්ශබ්ද වූහ. තුන්වෙනි වරත් භාග්‍යවතුන් වහන්සේ ඒ කුලපුත්‍රයන් උදෙසා භික්ෂූන්ට කථාකොට, "මහණෙනි, යම් ඒ කුලපුත්‍රයෝ මා උදෙසා ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවූවාහුද මහණෙනි, කීම ඒ භික්ෂූහු බ්‍රහ්මචර්යාවෙහි ඇලුනාහුද? තුන් වන වරත් ඒ භික්ෂූහු නිශ්ශබ්ද වූහ.

2. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේට, මම ඒ කුලපුත්‍රයන්ගෙන්ම අසන්නෙම් නම් යෙහෙකැයි අදහස් විය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන්ට කථා කළහ. "අනුරුද්ධයෙනි, කිම තොපි බ්‍රහ්මචර්යාවෙහි ඇලුනාහුද?" "ස්වාමීනි, ඒකාන්තයෙන්ම අපි බ්‍රහ්මචර්යාවෙහි ඇලුනෝ වමු" "අනුරුද්ධයෙනි, යහපත, යහපත, අනුරුද්ධයෙනි, තොපි බ්‍රහ්මචර්යාවෙහි කැමතිවන්නාහු නම් එය ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම පැවිදිවූ තොප වැනි කුලපුත්‍රයන්ට, සුදුසුය. අනුරුද්ධයෙනි, හොඳ තරුණවයසින් යුත්, මුල් වයසෙහි සිටි, තරුණවූ කලු කෙස් ඇති යම්බඳු තොපි කම්සැප අනුභව කරන්නෝ වෙත්ද, අනුරුද්ධයෙනි, හොඳ තරුණ වයසින් යුත්, මුල්වයසෙහි සිටි, තරුණවූ කලුකෙස් ඇති, ඒ තොපි ගිහිගෙන් නික්ම සස්නෙහි නොපැවිදි වූවාහුය, අනුරුද්ධයෙනි, තොපි රජුන්ට බයව පැනගොස් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූවාහු නොවෙති, සොරුන්ට බයව පැනගොස් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවූවාහු නොවෙති, ණයෙන් පීඩාවී ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූවාහු නොවෙති, බයෙන් පීඩාවී ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූවාහු නොවෙති. ජීවත්වන්ට නොහැකිව ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවූවාහු නොවෙති. එතකුදුවුවත්: 'ඉපදීමෙන්, ජරාමරණ දෙකින් සොකයන්ගෙන්,

වැලපීම්වලින්, දුක්වලින්, දොම්නස්වලින්, උපායාසයන්ගෙන් යුක්ත වූයෙමි, දුකට බැසගතිමි, දුකින් මඩනා ලද්දෙමි. මේ සියලු දුක් රාශියේ අවසානය දක්ක හොත් යෙහෙකැ'යි, අනුරුද්ධයෙනි, මෙසේ තොපි ශ්‍රද්ධාවෙන් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූවාහු නොවෙත්ද?"

"එසේය, ස්වාමීනි."

3. "අනුරුද්ධයෙනි, මෙසේ පැවිදිවූ කුලපුත්‍රයා විසින් කුමක් කළ යුතු වන්නේද? අනුරුද්ධයෙනි, කාමයන්ගෙන් වෙන්වූ අකුශලධර්මයන්ගෙන් වෙන්වූ ප්‍රීති සැපයට හෝ නොපැමිණෙයිද, ඊට වඩා උසස් අනික් සැපයකට නොපැමිණෙයිද,

"ලෝභයද ඔහුගේ සිත මැඩගෙන සිටියි. ව්‍යාපාදයද ඔහුගේ සිත මැඩගෙන සිටියි, ථීනමිද්ධයද ඔහුගේ සිත මැඩගෙන සිටී, උද්ධච්ච කුක්කුච්චයද, ඔහුගේ සිත මැඩගෙන සිටී, විචිකිච්ඡාවද, ඔහුගේ සිත මැඩගෙන සිටියි. නොඇල්මද ඔහුගේ සිත මැඩගෙන සිටී. අලසකමද, ඔහුගේ සිත මැඩගෙණ සිටියි. අනුරුද්ධයෙනි, කාමයන්ගෙන් වෙන්වූ අකුශලයන්ගෙන් වෙන්ව ප්‍රීති සැපය හෝ එයින් අන්‍යවූ සැපයක් හෝ නොලබන්නේ නම් මෙසේ වන්නේය.

4. "අනුරුද්ධයෙනි, කාමයන්ගෙන් වෙන්වූ අකුශල ධර්මයන්ගෙන් වෙන්වූ ප්‍රීතිසැපයට හෝ පැමිණේද, ඊට වඩා උසස් අනික් සැපයකට හෝ පැමිණේද, ඔහුගේ සිත ලෝභයෙන් අල්වාගෙණ නොසිටී. ඔහුගේ සිත ව්‍යාපාදයෙන් අල්වාගෙණ නොසිටී. ඔහුගේ සිත ථීනමිද්ධයෙන් අල්වාගෙණ නොසිටී. ඔහුගේ සිත උද්ධච්ච කුක්කුච්චයෙන් අල්වාගෙණ නොසිටී. ඔහුගේ සිත විචිකිච්ඡාවෙන් අල්වාගෙණ නොසිටී. ඔහුගේ සිත නොඇල්මෙන් අල්වාගෙණ නොසිටී. ඔහුගේ සිත අලසබවෙන් අල්වාගෙණ නොසිටී. අනුරුද්ධයෙනි, කාමයන්ගෙන් වෙන්වූ අකුශල ධර්මයන්ගෙන් වෙන්වූ ප්‍රීති සැපයට හෝ පැමිණෙයිද, ඊට වඩා උසස් සැපයකට හෝ පැමිණෙයිද ඔහුට මෙසේ වන්නේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

5. "අනුරුද්ධයෙනි, කිමද? කෙලෙසන, නැවත ඉපදීම ඇතිකරණ පීඩා සහිත, දුක් විපාක ඇති, නැවත ඉපදීම ජරාව මරණය ඇතිකරණ, යම් ආශ්‍රවයෝ (වෙත්ද) තථාගතයන් වහන්සේගේ ඒ ආශ්‍රවයෝ ප්‍රහීණ නොවූවාහුය. එහෙයින් තථාගතයන් වහන්සේ සේවනය කළ යුතු කොටස දැන සේවනය කරයි. ඉවසිය යුතු කොටස දැන ඉවසයි. දුරුකළ යුතු කොටස දැන දුරුකරයි. සංසිඳවිය යුතු කොටස දැන සංසිඳවයි." කියා මා කෙරෙහි තොපි මෙසේ සිතව්ද?

6. "ස්වාමීනි, කෙලෙසන, නැවත ඉපදීම ඇතිකරණ පීඩා සහිත, දුක් විපාක ඇති, නැවත ඉපදීම, ජරාව, මරණය ඇතිකරණ යම් ආශ්‍රවයෝ (වෙත්ද) තථාගතයන් වහන්සේගේ ඒ ආශ්‍රවයෝ ප්‍රහීණ නොවූවාහු වෙත්, එහෙයින් තථාගතයන් වහන්සේ සේවනය කළ යුතු කොටස දැන සේවනය කරයි. ඉවසිය යුතු කොටස දැන ඉවසයි. දුරු කළ යුතු කොටස දැන දුරුකරයි. සංසිඳවිය යුතු කොටස දැන සංසිඳවයි කියා තථාගතයන් වහන්සේ කෙරෙහි අපට එබඳු සිතක් නැත.

"ස්වාමීනි, කෙලෙසන, නැවත ඉපදීම ඇතිකරණ, පීඩා සහිත දුක් විපාක ඇති, නැවත ඉපදීම ජරාව මරණය ඇතිකරණ, යම් ආශ්‍රවයෝ වෙත්ද, තථාගතයන් වහන්සේගේ ඒ ආශ්‍රවයෝ ප්‍රහීණ වූවාහු වෙත්. එහෙයින් තථාගතයන් වහන්සේ සේවනය කළ යුතු කොටස දැන සේවනය කරයි. ඉවසිය යුතු කොටස දැන ඉවසයි. දුරුකළ යුතු කොටස දැන දුරුකරයි. සංසිඳිය යුතු කොටස දැන සංසිඳවයි." භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි අපට මේ අදහස් වන්නේය.

7. "අනුරුද්ධයෙනි, යහපත, යහපත, අනුරුද්ධයෙනි, කෙලෙසන, නැවත ඉපදීම ඇතිකරණ, පීඩා සහිත දුක් විපාක ඇති, නැවත ඉපදීම, ජරාව, මරණය ඇතිකරණ, යම් ආශ්‍රවයෝ වූවාහුද, තථාගතයන් වහන්සේගේ (ඒ ආශ්‍රවයෝ) ප්‍රහීණ වූවාහුය. මුළුසුන්කරණ ලද්දාහුය. මස්තකය සිඳි තල්ගසක් මෙන් කරණ ලද්දාහුය. විනාශ කරණ ලද්දාහුය. නැවත ඉපදීම නැතිකරණලද්දාහුය. අනුරුද්ධයෙනි, යම්සේ මස්තකය සිඳින

ලද තල්ගස නැවත වැඩීමට සුදුසු නොවේද, අනුරුද්ධයෙනි, එමෙන්ම කෙලෙසන නැවත ඉපදීම ඇතිකරණ, පීඩා සහිත, දුක් විපාක ඇති නැවත ඉපදීම ජරාව මරණය ඇතිකරණ යම් ආශ්‍රවයෝ වෙත්ද (ඒ ආශ්‍රවයෝ) තථාගතයන් වහන්සේ විසින් පහකරන ලද්දාහුය. මුලුසුන් කරණලද්දාහුය. මස්තකය සිඳින තල් වත්තක් මෙන් කරණ ලද්දාහුය. විනාශකරන ලද්දාහුය. නැවත ඉපදීම නැතිකරණ ලද්දාහුය. එහෙයින් තථාගතයන් වහන්සේ සේවනය කළ යුතු කොටස දැන සේවනය කරයි. ඉවසිය යුතු කොටස දැන ඉවසයි. දුරු කළ යුතු කොටස දැන දුරුකරයි. සංසිඳවිය යුතු කොටස දැන සංසිඳවයි කියා තථාගතයන් වහන්සේ කෙරෙහි මේ අදහස වන්නේය.

8. "අනුරුද්ධයෙනි, ඒ කුමකැයි සිතන්නහුද? කවර ප්‍රයොජනයක් බලාපොරොත්තුවන තථාගතයන් වහන්සේ 'අසුවලා අසුවල් තැන උපන්නේය, අසුවලා අසුවල් තැන උපන්නේය'යි ඉකුත්වූ කාලක්‍රියා කළ ශ්‍රාවකයන් පිළිබඳ උප්පත්තීන් ප්‍රකාශ කරයිද?"

"ස්වාමීනි, අපගේ ධර්මයෝ භාග්‍යවතුන් වහන්සේ මුල් කොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ ආදිකොට ඇත්තාහ. භාග්‍යවතුන් වහන්සේ පිහිටකොට ඇත්තාහ. ස්වාමීනි, මේ කරුණ පිළිබඳ අර්ථය භාග්‍යවතුන් වහන්සේටම වැටහෙන සේක්නම් යහපති. භාග්‍යවතුන් වහන්සේගෙන් අසා භික්ෂූහු දරත්" යයි (කීවාහුය.) අනුරුද්ධයෙනි, තථාගතයන් වහන්සේ ජනයන් පුදුම කරවනු පිණිස, ජනයන් පොළඹවනු පිණිස, ලාභ සත්කාර කීර්තිය පිණිස 'මා ජනයා මෙසේ දැන හැඳිනගණිවා'යි 'අසුවලා අසුවල් තැන උපන්නේය. අසුවලා අසුවල් තැන උපන්නේය'යි ඉකුත්වූ මැරීගිය ශ්‍රාවකයන් පිළිබඳ උප්පත්තිය ප්‍රකාශ නොකරයි. අනුරුද්ධයෙනි, ශ්‍රද්ධාව ඇති, බොහෝ සතුටු ඇති, බොහෝ මහත් සතුටු ඇති කුලපුත්‍රයෝ ඇත්තාහුය. ඔව්හු එය අසා ශ්‍රාවකභාවය (-පැවිදිබව) පිණිස සිත එලවත්. අනුරුද්ධයෙනි, ඔවුන්ට එය බොහෝ කලක් හිත සැප පිණිස වෙයි.

**9.** "අනුරුද්ධයෙනි, මේ ශාසනයෙහි භික්ෂුවක් 'මෙනම් භික්ෂුව කාලක්‍රියා කෙළේය. භාග්‍යවතුන් වහන්සේ විසින් 'ඒ භික්ෂුව රහත් බැව්හි පිහිටියේයයි' ප්‍රකාශ කරණ ලද්දේයයි අසයි. ඒ ආයුෂ්මත්තෙම තමා විසින්ම දක්නා ලද්දේ හෝ වෙයිද, ඒ ආයුෂ්මත්තෙමේ මෙබඳු සිල් ඇත්තෙකැයිද, ඒ ආයුෂ්මත්තෙම මෙබඳු ස්වභාව ඇත්තෙකැයිද, ඒ ආයුෂ්මත්තෙම මෙබඳු නුවණ ඇත්තෙකැයි කියාද, ඒ ආයුෂ්මත්තෙම මෙබඳු හැසුරුම් ඇත්තෙකැයිද, ඒ ආයුෂ්මත් තෙම මෙසේ භවයෙන් මිදුනේයයිද, අසනලද්දේ හෝ වෙයිද, ඒ භික්ෂුව ඒ ආයුෂ්මත්හුගේ ශ්‍රද්ධාවද, ශීලයද, උගත් බවද, ත්‍යාගයද, ප්‍රඥාවද සිහි කරමින් ඒ බව පිණිස සිත යොදවයි. අනුරුද්ධයෙනි මෙසේද භික්ෂුවගේ සැපවිහරණය වේ.

"අනුරුද්ධයෙනි, මේ ශාසනයෙහි භික්ෂුවක් 'මෙනම් භික්ෂුව කාල ක්‍රියා කෙළේය. භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ භික්ෂුව කාමලෝකය භජනය කරන සංයොජන පස නැති කිරීමෙන් ඖපපාතිකව එහි පිරිනිවෙන ස්වභාවය ඇති ඒ ලෝකයෙන් මෙහි නොඑන ස්වභාව ඇත්තේයයි ප්‍රකාශ කරණ ලද්දේයයි අසයිද, ඒ භික්සුව තමා විසින් දකින ලද්දේ හෝ වෙයිද, 'ඒ ආයුෂ්මත්තෙමේ මෙබඳු සිල් ඇත්තෙකැයි ඒ ආයුෂ්මතෙමේ මෙබඳු ස්වභාව ඇත්තෙකැයි ඒ ආයුෂ්මත් තෙමේ මෙසේ භවයෙන් මිදුනේයයි' අසනලද්දේ හෝ වෙයිද, ඒ භික්ෂුව ඒ ආයුෂ්මත්හුගේ ශ්‍රද්ධාවද, ශීලයද, උගත් බවද ත්‍යාගයද, ප්‍රඥාවද, සිහිකරමින් ඒ බව පිණිස සිත යොදවයි. අනුරුද්ධයෙනි, මෙසේ භික්ෂුවට සැපවිහරණය වේ.

**10.** "අනුරුද්ධයෙනි, මේ ශාසනයෙහි භික්ෂුවක්, 'මෙනම් භික්ෂුව කාලක්‍රියා කෙළේය. භාග්‍යවතුන් වහන්සේ විසින් 'ඒ භික්ෂුව සංයොජන (භවබන්ධන) තුනක් නැතිකිරීමෙන්, රාග ද්වේෂ මොහයන් තුනී කිරීමෙන් සකෘදාගාමීව මේ ලෝකයට එක් වරක්ම (උප්පත්ති වශයෙන්) පැමිණ දුක් කෙළවර කරන්නේයයි ප්‍රකාශ කරණ ලද්දේයයි' අසයිද, 'ඒ භික්ෂුව තමා විසින්ම දක්නා ලද්දේ හෝ වෙයිද, ඒ ආයුෂ්මත්තෙමේ මෙබඳු

සිල් ඇත්තෙක. ඒ ආයුෂ්මත්තෙම මෙබඳු ස්වභාව ඇත්තෙක. ඒ ආයුෂ්මත්තෙමේ මෙබඳු නුවණ ඇත්තෙක. ඒ ආයුෂ්මත්තෙම මෙබඳු හැසුරුම් ඇත්තෙක. ඒ ආයුෂ්මත්තෙම මෙසේ භවයෙන් මිදුනේයයි' අසන ලද්දේ හෝ වෙයිද, ඒ භික්ෂුව ඒ ආයුෂ්මත්හුගේ ශ්‍රද්ධාවද, ශීලයද, උගත්බවද, ත්‍යාගයද, ප්‍රඥාවද, සිහිකරමින් ඒ බව පිණිස සිතයොදවයි. අනුරුද්ධයෙනි, මෙසේද භික්ෂුවට සැපවිහරණය වේ.

11. "අනුරුද්ධයෙනි, මේ ශාසනයෙහි භික්ෂුවක් 'මෙනම් භික්ෂුව කාලක්‍රියා කෙළේය. භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ භික්ෂුව සංයොජන (භවබන්ධන) තුනක් නැති කිරීමෙන් සෝවාන්ව, අපායෙහි උපදින ස්වභාවය නැත්තෙක්ව නියමයෙන්ම නිවන් පිහිටකොට ඇත්තෙක් වීයයි. ප්‍රකාශ කරණ ලද්දේය'යි, අසයිද 'ඒ භික්ෂුව තමන් විසින්ම දක්නා ලද්දේ හෝ වෙයිද' ඒ ආයුෂ්මත්තෙමේ මෙබඳු සිල් ඇත්තෙක ඒ ආයුෂ්මත්තෙමේ මෙබඳු ස්වභාවඇත්කෙ. ඒ ආයුෂ්මත්තෙමේ මෙබඳු නුවණ ඇත්තෙක. ඒ ආයුෂ්මත් තෙමේ මෙබඳු හැසුරුම් ඇත්තෙක. ඒ ආයුෂ්මත්තෙමේ මෙසේ භවයෙන් මිදුනේයයි' අසන ලද්දේ හෝ වෙයිද. ඒ භික්ෂුව ඒ ආයුෂ්මත්හුගේ ශ්‍රද්ධාවද, ශීලයද, උගත්බවද, ත්‍යාගයද, ප්‍රඥාවද, සිහිකරමින් ඒ බව පිණිස සිතයොදවයි. අනුරුද්ධයෙනි මෙසේද භික්ෂුවට සැප විහරණය වේ.

12. "අනුරුද්ධයෙනි, මේ ශාසනයෙහි භික්ෂුණියක් 'මෙනම් භික්ෂුණිය කාලක්‍රියා කළාය. භාග්‍යවතුන් වහන්සේ විසින් 'ඒ භික්ෂුණිය රහත් බැව්හි පිහිටියායයි ප්‍රකාශ කරණ ලද්දේයයි, අසයිද, 'ඒ භික්ෂුණිය තමා විසින්ම දක්නා ලද්දී හෝ වෙයිද, ඒ නැගනිය මෙබඳු සිල් ඇත්තීය. ඒ නැගනිය මෙබඳු ස්වභාව ඇත්තීය. ඒ නැගනිය මෙබඳු නුවණ ඇත්තීය. ඒ නැගනිය මෙබඳු හැසුරුම් ඇත්තීය. ඒ නැගනිය මෙසේ භවයෙන් මිදුනීයයි' අසන ලද්දී හෝ වෙයිද. ඒ භික්ෂුණියගේ ශ්‍රද්ධාවද, ශීලයද, උගත්බවද, ත්‍යාගයද, ප්‍රඥාවද, සිහිකරමින් ඒ බව පිණිස

සිත යොදවයි. අනුරුද්ධයෙනි, මෙසේද භික්ෂුණියට සැප විහරණය වේ.

13. "අනුරුද්ධයෙනි, මේ ශාසනයෙහි භික්ෂුණියක් 'මෙනම් භික්ෂුණිය කාලක්‍රියා කළාය. භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ භික්ෂුණිය, කාම ලොකය භජනය කරණ සංයොජන පස නැතිකිරීමෙන් ඖපපාතිකව එහි පිරිනිවෙන ඒ ලෝකයෙන් මෙහි නොඑන ස්වභාව ඇත්තේයයි' ප්‍රකාශ කරණ ලද්දීය. ඒ භික්ෂුණිය තමා විසින් දක්නා ලද්දී හෝ වෙයිද, ඒ නැගණිය 'මෙබඳු සිල් ඇත්තීය, ඒ නැගනිය මෙබඳු ස්වභාව ඇත්තීය, ඒ නැගනිය මෙබඳු නුවණ ඇත්තීය, ඒ නැගනිය මෙබඳු හැසිරීම් ඇත්තීය, ඒ නැගනිය මෙසේ භවයෙන් මිදුනීයයි' අසන ලද්දී හෝ වෙයි. ඒ භික්ෂුණිය ඒ භික්ෂුණියගේ ශ්‍රද්ධාවද, සීලයද, උගත්බවද, ත්‍යාගයද, ප්‍රඥාවද සිහි කරමින්, ඒ බව පිණිස සිත යොදවයි. අනුරුද්ධයෙනි, මෙසේද භික්ෂුණියට සැපවිහරණය වේ.

14. "අනුරුද්ධයෙනි, මේ ශාසනයෙහි භික්ෂුණියක් 'මෙනම් භික්ෂුණිය කාලක්‍රියා කළාය. භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ භික්ෂුණිය සංයොජන (භවබන්ධන) තුන නැති කිරීමෙන් රාග දොස මොහයන්ගේ තුනීකිරීමෙන් සකෘදාගාමීව මේ ලෝකයට එකවරක්ම (උප්පත්ති වශයෙන්) පැමිණ දුක් කෙළවර කරන්නීයයි ප්‍රකාශ කරණ ලද්දීයයි, අසයිද, ඒ භික්ෂුණිය තමා විසින්ම දක්නා ලද්දී හෝ වෙයිද, ඒ නැගනිය මෙබඳු සිල් ඇත්තීය. ඒ නැගනිය මෙබඳු ස්වභාව ඇත්තීය, ඒ නැගනිය මෙබඳු නුවණ ඇත්තීය, ඒ නැගනිය මෙබඳු හැසිරීම් ඇත්තීය, ඒ නැගනිය මෙසේ භවයෙන් මිදුනීය'යි, අසන ලද්දී හෝ වෙයිද, ඒ භික්ෂුණිය ඒ භික්ෂුණියගේ ශ්‍රද්ධාවද, සීලයද, උගත් බවද, ත්‍යාගයද, ප්‍රඥාවද සිහිකරමින්, ඒ බව පිණිස සිත යොදවයි. අනුරුද්ධයෙනි, මෙසේද භික්ෂුණියට සැපවිහරණය වේ.

15. "අනුරුද්ධයෙනි, මේ ශාසනයෙහි භික්ෂුණියක් 'මෙනම් භික්ෂුණිය කාලක්‍රියා කළාය. භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ භික්ෂුණිය සංයොජන (භවබන්ධන) තුනක් නැතිකිරීමෙන් සෝවාන්ව සතර අපායෙහි ඉපදීමට නොපැමිණෙන්නියක්ව

නියමයෙන්ම නිවන් පිහිටකොට ඇත්තියක් වීයයි ප්‍රකාශ කරණ ලද්දීයයි අසයිද. ඒ භික්ෂුණිය තමා විසින්ම දක්නා ලද්දී හෝ වෙයිද, ඒ නැගනිය මෙබඳු සිල් ඇත්තීය, ඒ නැගනිය මෙබඳු ස්වභාව ඇත්තීය, ඒ නැගනිය මෙබඳු නුවණ ඇත්තීය, ඒ නැගනිය මෙබඳු හැසිරීම් ඇත්තීය. ඒ නැගනිය මෙසේ භවයෙන් මිදුනීයයි අසන ලද්දී හෝ වෙයිද, ඒ භික්ෂුණිය ඒ භික්ෂුණියගේ ශ්‍රද්ධාවද, සීලයද, උගත් බවද,ත්‍යාගයද, ප්‍රඥාවද, සිහිකරමින් ඒ බව පිණිස සිත යොදවයි. අනුරුද්ධයෙනි, මෙසේද භික්ෂුණියට සැප විහරණය වේ.

**16.** "අනුරුද්ධයෙනි, මේ ශාසනයෙහි උපාසකයෙක් 'මෙනම් උපාසකයා කාලක්‍රියාකළේය. භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ උපාසකයා කාමලොකය භජනය කරන සංයොජන පස නැතිකිරීමෙන් ඔපපාතිකව එහි පිරිනිවෙන, ඒ ලෝකයෙන් මෙහි නොඑන ස්වභාව ඇත්තේයයි ප්‍රකාශ කරණ ලද්දේයයි' අසයිද, ඒ උපාසකයා තමා විසින්ම දක්නා ලද්දේ හෝ වෙයිද, 'ඒ උපාසකයා මෙබඳු සිල් ඇත්තෙක, ඒ උපාසකයා මෙබඳු ස්වභාව ඇත්තෙක, ඒ උපාසකයා මෙබඳු නුවණ ඇත්තෙක, ඒ උපාසකයා මෙබඳු හැසිරීම් ඇත්තෙක, ඒ උපාසකයා මෙසේ භවයෙන් මිදුනේයයි' අසන ලද්දේ හෝ වෙයිද, ඒ උපාසකයා ඒ උපාසකයාගේ ශ්‍රද්ධාවද, සීලයද, උගත් බවද, ත්‍යාගයද, ප්‍රඥාවද සිහිකරමින් ඒ බව පිණිස සිත යොදවයි. අනුරුද්ධයෙනි, මෙසේද උපාසකයාට සැපවිහරණය වේ.

**17.** "අනුරුද්ධයෙනි, මේ ශාසනයෙහි උපාසකයෙක් 'මෙනම් උපාසකයා කාලක්‍රියා කෙළේය. භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ උපාසකයා සංයොජන තුනක් නැතිකිරීමෙන් රාග, දොස, මොහයන්ගේ තුනී කිරීමෙන් සකෘදාගාමීව මේ ලෝකයට එක්වරක්ම (උප්පත්ති වශයෙන්) පැමිණ දුක් කෙළවර කරන්නේයයි ප්‍රකාශ කරණ ලද්දේයයි' අසයිද, ඒ උපාසකයා තමා විසින්ම දක්නා ලද්දේද, 'ඒ උපාසකයා මෙබඳු සිල් ඇත්තෙක, ඒ උපාසකයා මෙබඳු ස්වභාව ඇත්තෙක, ඒ උපාසකයා මෙබඳු නුවණ ඇත්තෙක, ඒ උපාසකයා මෙබඳු

හැසිරීම් ඇත්තෙක, ඒ උපාසකයා මෙසේ භවයෙන් මිදුනේ යයිද,' අසන ලද්දේ හෝ වෙයිද. ඒ උපාසකයා ඒ උපාසකයාගේ ශ්‍රද්ධාවද සීලයද, උගත් බවද, ත්‍යාගයද, ප්‍රඥාවද සිහිකරමින් ඒ බව පිණිස සිත යොදවයි. අනුරුද්ධයෙනි, මෙසේද උපාසකයාහට සැපවිහරණය වේ.

18. "අනුරුද්ධයෙනි, මේ ශාසනයෙහි උපාසකයෙක් 'මෙනම් උපාසකයා කාලක්‍රියා කෙළේය. භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ උපාසකයා සංයොජන (භව බන්ධන) තුනක් නැති කිරීමෙන් සෝවාන්ව, අපාය ලෝකයන්හි ඉපදීමට නොපැමිණෙන්නෙක්ව නියමයෙන්ම නිවන් පිහිට කොට ඇත්තෙක් වීයයි ප්‍රකාශ කරණ ලද්දේයයි' අසයිද, ඒ උපාසකයා තමා විසින්ම දක්නා ලද්දේ හෝ වෙයිද, 'ඒ උපාසකයා මෙබඳු සිල් ඇත්තෙක, ඒ උපාසකයා මෙබඳු ස්වභාව ඇත්තෙක, ඒ උපාසකයා මෙබඳු හැසිරීම් ඇත්තෙක, ඒ උපාසකයා මෙසේ භවයෙන් මිදුනේයයි,' අසන ලද්දේ හෝ වෙයිද, ඒ උපාසකයා ඒ උපාසකයාගේ ශ්‍රද්ධාවද, සීලයද, උගත් බවද, ත්‍යාගයද, ප්‍රඥාවද, සිහිකරමින් ඒ බව පිණිස සිත යොදවයි. අනුරුද්ධයෙනි, මෙසේද උපාසකයාට සැපවිහරණය වේ.

19. "අනුරුද්ධයෙනි, මේ ශාසනයෙහි උපාසිකාවක් 'මෙනම් උපාසිකාව කාලක්‍රියා කළාය. භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ උපාසිකාව කාම ලොකය භජනය කරන සංයොජන පස නැතිකිරීමෙන් ඕපපාතිකව එහි පිරිනිවෙන ඒ ලෝකයෙන් මෙහි නොඑන ස්වභාව ඇත්තීයයි ප්‍රකාශ කරණ ලද්දීයයි අසයිද, 'ඒ උපාසිකාව තමා විසින්ම දක්නා ලද්දීද, 'ඒ උපාසිකාව මෙබඳු සිල් ඇත්තීයයිද, ඒ උපාසිකාව මෙබඳු ස්වභාව ඇත්තීයයිද, ඒ උපාසිකාව මෙබඳු නුවණ ඇත්තීයද, ඒ උපාසිකාව මෙබඳු හැසිරිම් ඇත්තීය. ඒ උපාසිකාව මෙසේ භවයෙන් මිදුනීයයි,' අසන ලද්දේ හෝ වෙයිද. ඒ උපාසිකාව, ඒ උපාසිකාවගේ ශ්‍රද්ධාවද, සීලයද, උගත්කමද, ත්‍යාගය හා ප්‍රඥාවද සිහිකරමින් ඒ බව පිණිස සිත යොදවයි. අනුරුද්ධයෙනි, මෙසේද උපාසිකාවට සැපවිහරණය වේ.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

20. "අනුරුද්ධයෙනි, මේ ශාසනයෙහි උපාසිකාවක් 'මෙනම් උපාසිකාව කාලක්‍රියා කළාය. භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ උපාසිකාව සංයොජන (-භවබන්ධන) තුන නැතිකිරීමෙන් රාග, ද්වේස, මොහයන්ගේ තුනී කිරීමෙන් සකෘදාගාමීව මේ ලෝකයට එක වරක්ම (උප්පත්ති වශයෙන්) පැමිණ දුක් කෙළවර කරන්නීයයි ප්‍රකාශ කරණ ලද්දීයයි' අසයිද, ඒ උපාසිකාව තමා විසින්ම දක්නා ලද්දී හෝ වෙයිද, 'ඒ උපාසිකාව මෙබඳු සිල් ඇත්තීය, ඒ උපාසිකාව මෙබඳු ස්වභාව ඇත්තීය, ඒ උපාසිකාව මෙබඳු නුවණ ඇත්තීය, ඒ උපාසිකාව මෙබඳු හැසිරීම් ඇත්තීය, ඒ උපාසිකාව මෙසේ භවයෙන් මිදුනීයයි' අසන ලද්දේ හෝ වෙයිද, ඒ උපාසිකාවගේ ශ්‍රද්ධාවද, සීලයද උගත් බවද, ත්‍යාගයද, ප්‍රඥාවද සිහිකරමින් ඒ බව පිණිස සිත යොදවයි. අනුරුද්ධයෙනි, මෙසේද උපාසිකාවට සැපවිහරණය වේ.

21. "අනුරුද්ධයෙනි, මේ ශාසනයෙහි උපාසිකාවක් 'මෙනම් උපාසිකාව කාලක්‍රියා කළාය. භාග්‍යවතුන් වහන්සේ විසින් ඒ උපාසිකාව සංයොජන (-භවබන්ධන) තුනක් නැති කිරීමෙන් සෝවාන්ව, අපාය ලෝකයන්හි ඉපදීමට නොපැමිණෙන්නියක්ව, නියමයෙන්ම නිවන් පිහිටකොට ඇත්තියක් වීයයි ප්‍රකාශ කරණ ලද්දීයයි' අසයිද, ඒ උපාසිකාව තමා විසින් දක්නා ලද්දී හෝ වෙයිද, 'ඒ උපාසිකාව මෙබඳු සිල් ඇත්තීය, ඒ උපාසිකාව මෙබඳු ස්වභාවඇත්තීය, ඒ උපාසිකාව මෙබඳු නුවණ ඇත්තීය, ඒ උපාසිකාව මෙබඳු හැසිරීම් ඇත්තීය, ඒ උපාසිකාව මෙසේ භවයෙන් මිදුනීයයි අසන ලද්දේ හෝ වෙයිද, ඒ උපාසිකාව, ඒ උපාසිකාවගේ ශ්‍රද්ධාවද, සීලයද, උගත් බවද, ත්‍යාගයද, ප්‍රඥාවද, සිහි කරමින් ඒ බව පිණිස සිත යොදවයි අනුරුද්ධයෙනි, මෙසේද උපාසිකාවට සැපවිහරණය වේ."

භාග්‍යවතුන් වහන්සේ මෙය දෙසූ සේක. සතුටු සිත් ඇති ආයුෂ්මත් අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටු විය.

**අටවෙනිවූ නලකපාන සූත්‍රය නිමි. (2-8)**

---

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

## 19. ගුලිස්සානි සූත්‍රය

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයක භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර වෙළුවනයෙහි කලන්දක නිවාප නම් තැන වාසය කළහ. ඒ කාලයෙහි වනාහි වනයෙහි වසන ගොරෝසු පැවතුම් ඇති ගුලිස්සානි භික්ෂුව කිසියම් කටයුත්තක් නිසා සඟ මැදට පැමිණියේ වෙයි. ඒ කාලයෙහි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ගුලිස්සානි භික්ෂුව අරභයා (-කරුණු කොට) භික්ෂූන්ට කථා කළහ.

2. "ඇවැත්නි, සංඝයාට අයත්, සංඝයා අතර හැසිරෙණ වනයෙහි වසන භික්ෂුව විසින් සමාන බඹසර ඇත්තවුන් කෙරෙහි ගෞරව සහිතයකු, බුහුමන් සහිතයකු විය යුතුයි. ඇවැත්නි, ඉදින් සංඝයාට අයත් සංඝයා අතර හැසිරෙන වනයෙහි වසන භික්ෂුව විසින් සමාන බඹසර ඇත්තවුන් කෙරෙහි ගෞරව නැත්තෙකු, බුහුමන් නැත්තෙකු වෙයිද, 'යම් මේ ආයුෂ්මතෙක් සමාන බඹසර ඇත්තවුන් කෙරෙහි, ගෞරව නැත්තේද, බුහුමන් නැත්තේද ඔහුට 'වනයෙහි වාසය කරණ ඒ මේ ආයුෂ්මත්හුගේ තනිව කැමතිසේ වනයෙහි වාසය කිරීමෙන්, කවර ප්‍රයෝජනයක් දැයි' කියන්නෝ වෙත්, එබැවින් සංඝයාට අයත්, සංඝයා අතර හැසිරෙන වනයෙහි වසන භික්ෂුව විසින් සමාන බඹසර ඇත්තවුන් කෙරෙහි, ගෞරව සහිතයකු, බුහුමන් සහිතයකු විය යුතුයි.

3. "ඇවැත්නි, සංඝයාට අයත්, සංඝයා අතර හැසිරෙණ වනයෙහි වසන භික්ෂුව විසින් 'මෙසේ ස්ථවිර භික්ෂූන් ගටා (-තදකොට) නොහිඳින්නෙමි. නවක (-අලුත්) භික්ෂූන් ආසනයෙන් අස් නොකරන්නෙමියි' ආසන දැනීමෙහි දක්ෂයෙකු විය යුතුයි. ඇවැත්නි, ඉදින් සංඝයාට අයත්, සංඝයා අතර හැසිරෙන වනයෙහි වසන භික්ෂුව ආසන දැනීමෙහි දක්ෂයෙකු නොවෙයිද, 'යම් මේ ආයුෂ්මතෙක් වත් පිළිවෙත් නොදන්නේද, ඔහුට වනයෙහි වාසය කරණ මේ ආයුෂ්මත්හුගේ තනිව කැමතිසේ වනයෙහි වාසය කිරීමෙන් කවර ප්‍රයෝජනයක්දැ'යි කියන්නෝ වෙත්. එබැවින් සංඝයාට අයත් සංඝයා අතර හැසිරෙන

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වනයෙහි වසන භික්ෂුව විසින් ආසන දැනීමෙහි දක්ෂයෙකු විය යුතුයි.

**4.** "ඇවැත්නි, සංඝයාට අයත් සංඝයා අතර හැසිරෙණ වනයෙහි වසන භික්ෂුව විසින් ඉතා කලින් ගමට නොයායුතු, ඉතා දවල් පෙරළා නොආ යුතුයි. ඇවැත්නි, ඉදින් සංඝයාට අයත් සංඝයා අතර හැසිරෙන වනයෙහි වසන භික්ෂුව ඉතා කලින් ගමට යයිද, ඉතා දවල් ආපසු එයිද, ඔහුට 'ඉතා කලින් ගමට යයි. ඉතා දවල් ආපසු එයි. වනයෙහි වාසයකරණ මේ ආයුෂ්මත්හුගේ තනිව කැමතිසේ වනයෙහි වාසය කිරීමෙන් කවර ප්‍රයෝජනයක්දැ'යි කියන්නෝ වෙත්. එබැවින් සංඝයාට අයත් සංඝයා අතර හැසිරෙණ වනයෙහි වසන භික්ෂුව විසින් ඉතා කලින් ගමට නොයායුතුයි. ඉතා දවල් ආපසු නොආ යුතුයි.

**5.** "ඇවැත්නි, සංඝයාට, අයත්, සංඝයා අතර හැසිරෙණ වනයෙහි වසන භික්ෂුව විසින් පෙරවරුද පස්වරුද ගෙවල්වල ඇවිදීමට නොපැමිණිය යුතුයි. ඇවැත්නි, ඉදින් සංඝයාට අයත් සංඝයා අතර හැසිරෙණ වනයෙහි වසන භික්ෂුව පෙරවරුද පස්වරුද ගෙවල්වල ඇවිදීමට පැමිණෙයිද, ඔහුට 'වනයෙහි වසන තනිව වනයෙහි කැමතිසේ වසන මේ ආයුෂ්මත්හුගේ නොකල්හි හැසිරීම වැඩි වශයෙන් කරණ ලදී. සංඝයා මැදට පැමිණි ඔහුටද එසේ ව්‍යවහාර කරන්නේය'යි කියන්නෝ වෙත්. එබැවින් සංඝයාට අයත් සංඝයා අතර හැසිරෙන වනයෙහි වසන භික්ෂුව විසින් පෙරවරුද පස්වරුද ගෙවල්වල ඇවිදීමට නොපැමිණිය යුතුයි.

**6.** "ඇවැත්නි, සංඝයාට අයත් සංඝයා අතර හැසිරෙන වනයෙහි වසන භික්ෂුව නොසන්සුන් නොවූවෙකු චපල නොවූවකු විය යුතුයි. ඇවැත්නි, ඉදින් සංඝයාට අයත් සංඝයා අතර හැසිරෙන වනයෙහි වසන භික්ෂුව නොසන්සුන් වූවෙක් චපලවූවෙක් වෙයිද, ඔහුට 'වනයෙහි වසන තනිව වනයෙහි කැමතිසේ වසන මේ ආයුෂ්මත්හුගේ නොසන්සුන් බව හා චපල

බව වැඩිව කරණ ලදැයි' කියන්නෝ වෙත්. එබැවින් සංඝයාට අයත් සංඝයා අතර හැසිරෙන වනයෙහි වසන භික්ෂුව නොසන්සුන් නොවූවකු, චපල නොවූවකු විය යුතුයි.

7. "ඇවැත්නි, සංඝයාට අයත් සංඝයා අතර හැසිරෙන වනයෙහි වසන භික්ෂුව රළු වචන නැත්තෙකු විසිර ගිය වචන නැත්තෙකු විය යුතුයි. ඇවැත්නි, ඉදින් සංඝයාට අයත්, සංඝයා අතර හැසිරෙන, වනයෙහි වසන භික්ෂුව, රළු වචන කියන්නෙක් විසිරුණු වචන කියන්නෙක් වෙයිද, 'යම් මේ ආයුෂ්මත්තෙමේ රළු වචන කියන්නෙක විසුරුණු වචන කියන්නෙක වනයෙහි වසන මේ ආයුෂ්මත්හුගේ තනිව වනයෙහි කැමතිසේ විසීමෙන් කවර ප්‍රයෝජනයක්දැ'යි කියන්නෝ වෙත්. එබැවින් සංඝයාට අයත් සංඝයා අතර හැසිරෙන වනයෙහි වසන භික්ෂුව රළු වචන නැත්තෙකු, විසිර ගිය වචන නැත්තෙකු විය යුතුයි.

8. "ඇවැත්නි, සංඝයාට අයත්, සංඝයා අතර හැසිරෙන වනයෙහි වසන භික්ෂුව සුවචවූවකු, යහපත් මිතුරන් ඇත්තකු විය යුතුයි. ඇවැත්නි, ඉදින් සංඝයාට අයත් සංඝයා අතර හැසිරෙන වනයෙහි වසන භික්ෂුව දුර්වචයෙක් පවිටු මිතුරන් ඇත්තෙක් වෙයිද, ඔහුට 'යම් මේ ආයුෂ්මත් තෙමේ දුර්වචයෙක පවිටු මිතුරන් ඇත්තෙක වනයෙහි වසන මේ ආයුෂ්මත්හුගේ තනිව වනයෙහි කැමතිසේ විසීමෙන් කවර ප්‍රයෝජනයක්දැ'යි කියන්නාහු වෙත්. එබැවින් සංඝයාට අයත්, සංඝයා අතර හැසිරෙන වනයෙහි වසන භික්ෂුව සුවචවූවකු යහපත් මිතුරන් ඇත්තකු විය යුතුයි.

9. "ඇවැත්නි, වනයෙහි වසන භික්ෂුව ඉඳුරන්හි වසනලද දොර ඇත්තකු වියයුතුයි. ඇවැත්නි, ඉදින් වනයෙහි වසන භික්ෂුව ඉඳුරන්හි නොවසනලද දොර ඇත්තෙක් වෙයිද, ඔහුට 'යම් මේ ආයුෂ්මත්තෙමේ ඉඳුරන්හි නොවසන ලද දොර ඇත්තෙක වනයෙහි වසන මේ ආයුෂ්මත්හුගේ තනිව වනයෙහි කැමතිසේ විසීමෙන් කවර ප්‍රයෝජනයක්දැ'යි කියන්නෝ වෙත්. එබැවින් වනයෙහි වසන භික්ෂුව ඉඳුරන්හි වසනලද දොර ඇත්තකු විය යුතුයි.

10. "ඇවැත්නි, වනයෙහි වසන භික්ෂුව වැළඳීමෙහි, පමණ දන්නෙකු විය යුතුයි. ඇවැත්නි, ඉදින් වනයෙහි වසන භික්ෂුව වැළඳීමෙහි පමණ නොදන්නෙක් වෙයිද ඔහුට 'යම් මේ ආයුෂ්මත්තෙමේ වැළඳීමෙහි පමණ නොදන්නෙක වනයෙහි වසන මේ ආයුෂ්මත්හුගේ තනිව වනයෙහි කැමතිසේ විසීමෙන් කවර ප්‍රයෝජනයක්දැයි' කියන්නෝ වෙත්. එබැවින් වනයෙහි වසන භික්ෂුව වැළඳීමෙහි පමණ දන්නකු විය යුතුයි.

11. "ඇවැත්නි, වනයෙහි වසන භික්ෂුව නිදි දුරුකිරීමෙහි යෙදුනකු විය යුතුයි. ඇවැත්නි, ඉදින් වනයෙහි වසන භික්ෂුව නිදි දුරු කිරීමෙහි නොයෙදුනෙක් වෙයිද, ඔහුට 'යම් මේ ආයුෂ්මත්තෙමේ නිදි දුරුකිරීමෙහි නොයෙදුනෙක් වෙයි. වනයෙහි වසන මේ ආයුෂ්මත්හුගේ තනිව වනයෙහි කැමතිසේ විසීමෙන් කවර ප්‍රයෝජනයක්දැ'යි කියන්නෝ වෙත්. එහෙයින් වනයෙහි වසන භික්ෂුව නිදි දුරු කිරීමෙහි යෙදුනකු විය යුතුයි.

12. "ඇවැත්නි, වනයෙහි වසන භික්ෂුව පටන් ගත් වීර්ය ඇත්තකු විය යුතුයි. ඇවැත්නි, ඉදින් වනයෙහි වසන භික්ෂුව කුසීත වෙයිද, ඔහුට 'යම් මේ ආයුෂ්මත්තෙමේ කුසීතයෙක වනයෙහි වසන මේ ආයුෂ්මත්හුගේ තනිව වනයෙහි කැමතිසේ විසීමෙන් කවර ප්‍රයෝජනයක් දැයි' කියන්නෝ වෙත්. එහෙයින් වනයෙහි වසන භික්ෂුව පටන්ගත් වීර්ය ඇත්තකු විය යුතුයි.

13. ඇවැත්නි, වනයෙහි වසන භික්ෂුව එළඹ සිටි සිහි ඇත්තකු විය යුතුයි. ඇවැත්නි, ඉදින් වනයෙහි වසන භික්ෂුව මුළා සිහි ඇත්තෙකු වෙයිද, ඔහුට 'යම් මේ ආයුෂ්මත් තෙමේ මුළා සිහි ඇත්තෙක වනයෙහි වසන මේ ආයුෂ්මත්හුගේ තනිව වනයෙහි විසීමෙන් කවර ප්‍රයෝජනයක් දැයි' කියන්නෝ වෙත්. එහෙයින් වනයෙහි වසන භික්ෂුව එළඹ සිටි සිහි ඇත්තෙකු විය යුතුයි.

14. "ඇවැත්නි, වනයෙහි වසන භික්ෂුව එකඟ සිත් ඇත්තකු විය යුතුයි. ඇවැත්නි, ඉදින් වනයෙහි වසන භික්ෂුව එකඟ සිත් නැත්තෙක් වෙයිද, ඔහුට, 'යම් මේ ආයුෂ්මත්තෙමේ එකඟ

සිත් නැත්තෙක, වනයෙහි වසන මේ ආයුෂ්මත්හුගේ තනිව වනයෙහි කැමතිසේ විසීමෙන් කවර ප්‍රයෝජනයක් දැයි' කියන්නෝ වෙත්. එහෙයින් වනයෙහි වසන භික්ෂුව එකඟ සිත් ඇත්තකු විය යුතුයි.

**15.** "ඇවැත්නි, වනයෙහි වසන භික්ෂුව නුවණැත්තකු විය යුතු. ඇවැත්නි, ඉදින් වනයෙහි වසන භික්ෂුව නුවණ නැත්තෙක් වෙයිද, ඔහුට, 'යම් මේ ආයුෂ්මත්තෙමේ නුවණ නැත්තෙක, වනයෙහි වසන මේ ආයුෂ්මත්හුගේ තනිව වනයෙහි කැමතිසේ විසීමෙන් කවර ප්‍රයෝජනයක්දැ'යි කියන්නෝ වෙත්. එහෙයින් වනයෙහි වසන භික්ෂුව නුවණැත්තකු විය යුතුයි.

**16.** "ඇවැත්නි, වනයෙහි වසන භික්ෂුව අභිධර්ම පිටකයද, විනය පිටකයද ඉගෙණීමෙහි උත්සාහ කළ යුතුයි. ඇවැත්නි, වනයෙහි වසන භික්ෂුවගෙන් අභිධර්ම පිටකයෙහිද විනය පිටකයෙහිද ප්‍රශ්න අසන්නෝ වෙත්. ඇවැත්නි ඉදින් වනයෙහි වසන භික්ෂුවගෙන් අභිධර්මයෙහිද විනයෙහිද ප්‍රශ්න අසන ලද්දේ විසඳන්ට නොහැකි වෙයිද ඔහුට 'යම් මේ ආයුෂ්මත්තෙමේ අභිධර්මයෙහිද විනයෙහිද ප්‍රශ්න විචාරණ ලද්දේ විසඳන්ට නොහැකිය. වනයෙහි වසන මේ ආයුෂ්මත්හුගේ තනිව වනයෙහි කැමතිසේ විසීමෙන් කවර ප්‍රයෝජනයක් දැයි' කියන්නෝ වෙත්. එහෙයින් වනයෙහි වසන භික්ෂුව අභිධර්ම පිටකයද විනය පිටකයද ඉගෙණීමෙහි උත්සාහ කළ යුතුයි.

**17.** "ඇවැත්නි, වනයෙහි වසන භික්ෂුව රූපාවචර ධ්‍යානයන් ඉක්මවා ඇති යම් ඒ ශාන්ත විමොක්ෂ අරූපාවචර ධ්‍යානයෝ වෙත්ද, එහි උත්සාහ කළ යුතුයි. ඇවැත්නි, වනයෙහි වසන භික්ෂුවගෙන් රූපාවචර ධ්‍යාන ඉක්මවා ඇති යම් ඒ ශාන්ත විමොක්ෂ අරූපාවචර ධ්‍යානයෝ වෙත්ද, එහි ප්‍රශ්න අසන්නෝ වෙත්. ඇවැත්නි, ඉදින් වනයෙහි වසන භික්ෂුව රූපාවචර ධ්‍යානයන් ඉක්මවා ඇති ශාන්ත විමොක්ෂ අරූපාවචර ධ්‍යාන වෙත්ද, එහි ප්‍රශ්න විචාරණ ලද්දේ විසඳන්ට නොහැකිවෙයිද, ඔහුට 'යම් මේ ආයුෂ්මත්තෙමේ රූපාවචර

ධ්‍යානයන් ඉක්මවා ඇති යම් ඒ ශාන්ත විමොක්ෂ අරූපාවචර ධ්‍යානයෝ වෙත්ද, එහි ප්‍රශ්න විචාරණ ලද්දේ විසඳන්ට නොහැක්කේය. වනයෙහි වසන මේ ආයුෂ්මත්හුගේ තනිව වනයෙහි කැමතිසේ විසීමෙන් කවර ප්‍රයෝජනයක්දැයි' කියන්නෝ වෙත්. එහෙයින් වනයෙහි වසන භික්ෂුව විසින් රූපාවචර ධ්‍යානයන් ඉක්මවා ඇති යම් ඒ ශාන්ත විමොක්ෂ අරූපාවචර ධ්‍යානයෝ වෙත්ද එහි උත්සාහ කළ යුතුයි.

18. "ඇවැත්නි, වනයෙහි වසන භික්ෂුව ලෝකෝත්තර ධර්මයෙහි උත්සාහ කළ යුතුයි. ඇවැත්නි, වනයෙහි වසන භික්ෂුවගෙන් ලෝකෝත්තර ධර්මයෙහි ප්‍රශ්න විචාරන්නෝ වෙත්. ඇවැත්නි. ඉදින් වනයෙහි වසන භික්ෂුව ලෝකෝත්තර ධර්මයෙහි ප්‍රශ්න විචාරණ ලද්දේ විසඳන්ට නොහැකි වෙයිද, ඔහුට 'මේ ආයුෂ්මත්තෙමේ යම් ප්‍රයෝජනයක් නිසා පැවිදිවීද ඒ ප්‍රයෝජනය නොදන්නේය වනයෙහි වසන මේ ආයුෂ්මත්හුගේ තනිව වනයෙහි කැමතිසේ විසීමෙන් කවර ප්‍රයෝජනයක්දැ'යි කියන්නෝ වෙත්. එහෙයින් වනයෙහි වසන භික්ෂුව විසින් ලෝකෝත්තර ධර්මයෙහි උත්සාහ කළ යුතුයි."

19. මෙසේ දෙසූ කල්හි ආයුෂ්මත් මහ මුගලන් තෙරුන් වහන්සේ සැරියුත් තෙරුන්ට මේ කරුණ කීහ. "ආයුෂ්මත් ශාරිපුත්‍රය, වනයෙහි වසන භික්ෂුව විසින්ම මේ ධර්මයන් ගෙණ පැවතිය යුතුද නැතහොත් ගමෙහි වසන භික්ෂුව විසිනුත් එසේ පැවතිය යුතුද?"

"ආයුෂ්මත් මොග්ගල්ලානය, වනයෙහි වසන භික්ෂුව විසින්ද මේ ධර්මයන් ගෙණ පැවතිය යුතුය. ගමෙහි වසන භික්ෂුවට වනාහි කියනුම කවරේදැ"යි වදාළහ.

**නවවෙනිවූ ගුලිස්සානි සූත්‍රය නිමි. (2-9)**

# 20. කීටාගිරි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ බොහෝ භික්ෂු සංඝයා සමග කසී ජනපදයෙහි චාරිකාවෙහි හැසිරෙන්නෝය. එකල භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට කථා කළහ. "මහණෙනි, මම රාත්‍රි භෝජනයෙන් තොරව අනුභව කරමි. ඒ රාත්‍රි භෝජනයෙන් වෙන්ව අනුභව කරන්නාවූ මම ස්වල්ප ආබාධ ඇති බවද, ස්වල්ප රෝග ඇති බවද, පහසුවෙන් ඉරියව් පැවැත්වීමද, කාය බලයද, සැප විහරණයද ඇති බව දනිමි. මහණෙනි, තොපිද එව, රාත්‍රි භෝජනයෙන් තොරව අනුභව කරව්, රාත්‍රි භෝජනයෙන් තොරව අනුභව කරන්නාවූ තොපිද ස්වල්ප ආබාධ ඇති බවද, ස්වල්ප රෝග ඇති බවද, පහසුවෙන් ඉරියව් පැවැත්වීමද, කායබලයද, සැපවිහරණයද දන්නාහුය."

"එසේය පින්වතුන් වහන්සැ"යි ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ වචනයට උත්තර දුන්හ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කසී ජනපදවල පිළිවෙළින් චාරිකාවෙහි හැසිරෙමින් කීටාගිරි නම් කසී රට වැස්සන්ගේ නියම් ගම යම් තැනකද, එහි වැඩි සේක. එකල්හි භාග්‍යවතුන් වහන්සේ කසී රට වැස්සන්ගේ නියම් ගමවූ කීටාගිරියෙහි විසූවාහ.

2. ඒ කාලයෙහි අස්සජී - පුනබ්බසුක නම් භික්ෂූහු කීටාගිරියෙහි ආවාසිකයෝ වෙත්. එකල්හි බොහෝ භික්ෂූහු අස්සජී පුනබ්බසුක භික්ෂූන් යම් තැනකද එහි පැමිණියාහුය. පැමිණ අස්සජී පුනබ්බසුක භික්ෂූන්ට මේ කාරණය කීවාහුය. "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේද භික්ෂු සංඝයාද රාත්‍රි භෝජනයෙන් තොරව අනුභව කරති. රාත්‍රි භෝජනයෙන් තොරව අනුභව කරන්නාහු ස්වල්ප ආබාධ ඇති බවද, ස්වල්ප රෝග ඇති බවද, පහසුවෙන් ඉරියව් පැවැත්මද, කාය බලයද, සැප විහරණයද ඇති බව දනිත්. ඇවැත්නි, තොපිද එව්. රාත්‍රි භොජනයෙන් තොරව අනුභව කරව්. ඇවැත්නි, රාත්‍රි භෝජනයෙන් තොරව අනුභව කරණ යුෂ්මත්හුද, ස්වල්ප ආබාධ ඇති බවද, ස්වල්ප රෝග ඇතිබවද, පහසුවෙන් ඉරියව්

පැවැත්මද, කාය බලයද සැප විහරණයද, ඇති බව දැනගනිත්වා.” මෙසේ කී කල්හි අස්සජි පුනබ්බසුක භික්ෂූහු ඒ භික්ෂූන්ට මෙසේ කීවාහුය.

3. “ඇවැත්නි, අපි සවස් කාලයෙහිද අනුභව කරමු. උදේද අනුභව කරමු. දවල් කාලයෙහිද අනුභව කරමු. ඒ උදේද, සවසද, දවල්ද නොකල්හිද අනුභව කරණ අපි ස්වල්ප ආබාධ ඇති බවද, ස්වල්ප රෝග ඇති බවද, පහසුවෙන් ඉරියව් පැවැත්මද, කාය බලයද, සැපවිහරණයද දනිමු. ඒ අපි අත්දුටු කරුණු හැර ඉදිරි කල පැමිණිය යුතු ප්‍රයෝජනයට කුමට දුවමුද? අපි සවසද, පෙරවරුද, දවල් නොකල්හිද අනුභව කරමු”යි කීහ. යම් හෙයකින් ඒ භික්ෂූහු අස්සජි පුනබ්බසුක භික්ෂූන්ට ඒ කරුණ අවබෝධ කරවන්ට නොහැකි වූවාහුද, ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එහි පැමිණියාහුය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පැත්තක හුන්නාහුය. එක් පැත්තක හුන් ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මේ කරුණ කීවාහුය.

4. “ස්වාමීනි, අපි අස්සජි පුනබ්බසුක භික්ෂූහු යම් තැනෙක්හිද එහි පැමිණියෙමු. පැමිණ, අස්සජි පුනබ්බසුක භික්ෂූන්ට මේ කරුණු කීවෙමු. ‘භාග්‍යවතුන් වහන්සේද භික්ෂු සංඝයාද රාත්‍රි භෝජනයෙන් තොරව අනුභව කරති. රාත්‍රි භෝජනයෙන් තොරව අනුභවකරන්නාහු ස්වල්ප ආබාධ ඇති බවද, ස්වල්ප රෝග ඇති බවද, පහසුවෙන් ඉරියවු පැවැත්මද, කාය බලයද, සැප විහරණයද දනිත්. ඇවැත්නි, යුෂ්මත්හුද එව්. රාත්‍රි භෝජනයෙන් තොරව අනුභව කරව්. ඇවැත්නි, රාත්‍රි භෝජනයෙන් තොරව අනුභව කරණ යුෂ්මත්හුද ස්වල්ප ආබාධ ඇති බවද, ස්වල්ප රෝග ඇතිබවද, පහසුවෙන් ඉරියව් පැවැත්මද, කාය බලයද, සැප විහරණයද දනිව් (කියායි.)

“ස්වාමීනි, මෙසේ කී කල්හි අස්සජි පුනබ්බසුක භික්ෂූහු අපට මේ කරුණ කීවාහුය. ‘ඇවැත්නි, අපි සවසද, උදේද, දවල්, නොකල්හිද අනුභව කරමු. සවසද, උදේද, දවල් නොකල්හිද අනුභව කරණ අපි ස්වල්ප ආබාධ ඇති බවද,

ස්වල්ප රෝග ඇතිබවද, පහසු ඉරියව් පැවැත්මද, කාය බලයද, සැප විහරණයද දනිමු. ඒ අපි දත් කරුණ හැර ඉදිරි කල පැමිණිය යුතු ප්‍රයොජනයට කුමට දුවමුද? අපි සවසද, උදේද, දවල් නොකල්හිද, අනුභව කරමු'යි කීවාහුය. ස්වාමීනි, අපි යම් හෙයකින් අස්සජි පුනබ්බසුක භික්ෂූන්ට ඒ කරුණු අවබොධ කරවන්ට නොහැකිවූමුද එහෙයින් අපි මේ කරුණ භාග්‍යවතුන් වහන්සේට දන්වමුයි කීහ.

**5.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එක්තරා භික්ෂුවකට කථා කළහ. "මහණ, මෙහි එව්. "ශාස්තෲන් වහන්සේ ආයුෂ්මතුන් කැඳවත්යයි මාගේ වචනයෙන් අස්සජි පුනබ්බසුක භික්ෂූන් කැඳවව."

"එසේය, පින්වතුන් වහන්සැ'යි ඒ භික්ෂුව භාග්‍යවතුන් වහන්සේට පිළිතුරුදී, අස්සජි පුනබ්බසුක භික්ෂූන් යම් තැනෙක්හිද එහි පැමිණියේය. එහි පැමිණ, "ශාස්තෲන් වහන්සේ ආයුෂ්මතුන් කැඳවත්යයි," අස්සජි පුනබ්බසුක භික්ෂූන්ට කීය. "එසේය, ඇවැත්නියි" අස්සජි පුනබ්බසුක භික්ෂූහු ඒ භික්ෂුවට පිළිතුරුදී භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක් හිද එහි පැමිණියහ. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ වැඳ, එක් තැනෙක හුන්නාහුය. එක් තැනෙක හුන් අස්සජි පුනබ්බසුක භික්ෂූන්ට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය.

**6.** "මහණෙනි, සැබෑද? බොහෝ භික්ෂූහු තොප වෙත පැමිණ මේ කරුණ කීවාහුද? 'ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ හා භික්ෂු සංඝයා රාත්‍රි භෝජනයෙන් තොරව අනුභව කරති. ඇවැත්නි, රාත්‍රි භෝජනයෙන් තොරව අනුභව කරන්නාහු ස්වල්ප ආබාධ ඇති බවද, ස්වල්ප රෝග ඇති බවද, පහසුවෙන් ඉරියව් පැවැත්මද, කාය බලයද, සැපවිහරණයද ඇති බව දනිත්. ඇවැත්නි, යුෂ්මත්හුද එව්. රාත්‍රි භෝජනයෙන් තොරව අනුභව කරව්. ඇවැත්නි, යුෂ්මත්හුද රාත්‍රි භෝජනයෙන් තොරව අනුභව කරන්නාහු, ස්වල්ප ආබාධ ඇති බවද, ස්වල්ප රෝග ඇති බවද, පහසුවෙන් ඉරියව් පැවැත්මද, කාය බලයද, සැපවිහරණයද, දැනගන්නාහුයයි (කියායි)

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"මෙසේ කී කල්හි තොපි ඒ භික්ෂූන්ට මෙසේ කීවාහුද? 'ඇවැත්නි, අපි සවසද, උදේද, දවල් විකාලයෙහිද අනුභව කරමු. පස්වරුද, උදේද, දවල්ද, නොකල්හිද අනුභව කරන්නාවූ අපි ස්වල්ප ආබාධ ඇති බවද, ස්වල්ප රෝග ඇති බවද, කාය බලයද, සැපවිහරණයද දන්නෙමු. ඒ අපි අත් දුටු කරුණ හැර ඉදිරියට ඇති ප්‍රයෝජනය ගැණ කුමට දුවමුද? අපි පස්වරුද, උදේද, දවල්ද, නොකල්හිද අනුභව කරමුය"යි (කීවාහුද)

"එසේය, ස්වාමීනි"

7. "මහණෙනි, 'පුද්ගලයෙක් යම්කිසි සැපක් හෝ දුකක් හෝ සැප දුක් නොවූවක් හෝ විඳීද, ඔහුගේ අකුශල ධර්ම පිරිහෙත්, කුශල ධර්ම වැඩෙත්ය'යි මෙසේ මා විසින් දෙසනලද ධර්මයක් තොපි දනිව්ද?

"ස්වාමීනි, එසේ නොදනිමු."

"මහණෙනි, මේ ලෝකයෙහි මෙබඳු සැප වේදනාවක් විඳින ඇතැම් පුද්ගලයෙකුගේ අකුශල ධර්මයෝ වැඩෙත්, කුශල ධර්මයෝ පිරිහෙත්, මේ ලෝකයෙහි මෙබඳු සැපවේදනාවක් විඳින ඇතැම් පුද්ගලයෙකුගේ අකුශල ධර්මයෝ පිරිහෙත්, කුශල ධර්මයෝ වැඩෙත්. මේ ලෝකයෙහි මෙබඳු දුක් වේදනාවක් විඳින "ඇතැම් පුද්ගලයෙකුගේ අකුශල ධර්මයෝ වැඩෙත්, කුශල ධර්මයෝ පිරිහෙත්, මේ ලෝකයෙහි මෙබඳු දුක් වේදනාවක් විඳින ඇතැම් පුද්ගලයෙකුගේ අකුශල ධර්මයෝ පිරිහෙත්. කුශල ධර්මයෝ වැඩෙත්. මේ ලෝකයෙහි මෙබඳු සැප දුක් නොවූ වේදනාව විඳින ඇතැම් පුද්ගලයෙකුගේ අකුශල ධර්මයෝ වැඩෙත්, කුශල ධර්මයෝ පිරිහෙත්, මේ ලෝකයෙහි මෙබඳු සැප දුක් නොවූ වේදනා විඳින ඇතැම් පුද්ගලයෙකුගේ අකුශල ධර්මයෝ පිරිහෙත්, කුශල ධර්මයෝ වැඩෙත්යයි මා විසින් දෙසනලද ධර්මයක් තොපි දන්නාහු නොවෙත්ද?"

"එසේය, ස්වාමීනි,"

8. "මහණෙනි, යහපති, මහණෙනි, මේ ලෝකයෙහි මෙබඳු සැප වේදනාවක් විඳින ඇතැම් පුද්ගලයෙකුගේ අකුශල ධර්මයෝ

වැඩෙත්, කුසල ධර්මයෝ පිරිහෙත්යයි එය මා විසින් නොදන්නා ලද්දේ, නොදක්නා ලද්දේ, නොවිඳිනා ලද්දේ, ප්‍රත්‍යක්ෂ නොකරන ලද්දේ, නුවණින් ස්පර්ශ නොකරන ලද්දේ, වන්නේනම් එසේ මම නොදන්නේ මෙබඳු සැප වේදනාවක් දුරුකරව්යයි කියත් නම්, මහණෙනි, මට එය සුදුසු වන්නේද?"

"ස්වාමීනි, සුදුසු නොවේය."

"මහණෙනි, යම් හෙයකින් මේ ලෝකයෙහි මෙබඳු සැප වේදනාවක් විඳින ඇතැම් පුද්ගලයෙකුගේ අකුශල ධර්මයෝ වැඩෙත්, කුශල ධර්මයෝ පිරිහෙත්යයි, එය මා විසින් දන්නා ලද්දේද, දක්නා ලද්දේද, විඳින ලද්දේද, ප්‍රත්‍යක්ෂ කරන ලද්දේද, එහෙයින් මෙබඳු සැප වේදනාවක් දුරුකරව් යයි කියමි.

**9.** "මහණෙනි, මේ ලෝකයෙහි මෙබඳු සැපවේදනාවක් විඳින ඇතැම් පුද්ගලයෙකුගේ අකුශල ධර්මයෝ පිරිහෙත්, කුශල ධර්මයෝ වැඩෙත්ය'යි එය මා විසින් නොදන්නා ලද්දේ, නොදක්නා ලද්දේ, නොවිඳින ලද්දේ, ප්‍රත්‍යක්ෂ නොකරන ලද්දේ, නුවණින් ස්පර්ශ නොකරන ලද්දේ, වන්නේ නම්, එසේ මම නොදන්නේ මෙබඳු සැප වේදනාවකට එළඹ වාසය කරව්ය'යි කියම් නම්, මහණෙනි, මට එය සුදුසු වන්නේද?"

"ස්වාමීනි, සුදුසු නොවේය."

"මහණෙනි, යම් හෙයකින් මේ ලෝකයෙහි යම්බඳු සැප වේදනාවක් විඳින ඇතැම් පුද්ගලයෙකුගේ අකුශල ධර්මයෝ පිරිහෙත්. කුශල ධර්මයෝ වැඩෙත්ය'යි එය මා විසින් දන්නා ලද්දේද, දක්නා ලද්දේද, විඳින ලද්දේද, එහෙයින් මම මෙබඳු සැපවේදනාවකට එළඹ වසව්ය'යි කියමි.

**10.** "මහණෙනි, මේ ලෝකයෙහි මෙබඳු දුක්වේදනාවක් විඳින ඇතැම් පුද්ගලයෙකුගේ අකුශල ධර්මයෝ වැඩෙත්, කුශලධර්මයෝ පිරිහෙත්යයි මා විසින් එය නොදන්නා ලද්දේ, නොදක්නා ලද්දේ, නොවිඳින ලද්දේ, ප්‍රත්‍යක්ෂ නොකරන ලද්දේ වන්නේ නම්, මෙසේ මම නොදන්නේ මෙබඳු දුක් වේදනාවක් දුරුකරව්ය'යි කියන්නෙම් නම්, එය මට සුදුසු වන්නේද?"

"ස්වාමීනි, සුදුසු නොවේය"

"මහණෙනි, යම් හේතුවකින් මේ ලෝකයෙහි මෙබඳු දුක් වේදනාවක් විඳින ඇතැම් පුද්ගලයෙකුගේ අකුසල ධර්මයෝ වැඩෙත්. කුසල ධර්මයෝ පිරිහෙත්ය'යි එය මා විසින් දන්නා ලද්දේද, දක්නා ලද්දේද, විඳින ලද්දේද, එහෙයින් මම මෙබඳු දුක් වේදනාවකට එළඹ වසව්ය'යි කියමි.

11. "මහණෙනි, මේ ලෝකයෙහි මෙබඳු දුක් නොවූ සැපද නොවූ වේදනාවක් විඳින ඇතැම් පුද්ගලයෙකුගේ අකුශල ධර්මයෝ වැඩෙත්, කුසල ධර්මයෝ පිරිහෙත්යයි මා විසින් එය නොදන්නා ලද්දේ, නොදක්නා ලද්දේ, නොවිඳිනා ලද්දේ, ප්‍රත්‍යක්ෂ නොකරන ලද්දේ වන්නෙම් නම්, මෙසේ මම නොදන්නේ මෙබඳු දුක් වේදනාවක් දුරුකරව්යයි' කියන්නෙම් නම් එය මට සුදුසු වන්නේද?"

"ස්වාමීනි, සුදුසු නොවේය".

"මහණෙනි, යම් හෙතුවකින් මේ ලෝකයෙහි මෙබඳු දුක්ද නොවූ සැපද නොවූ වේදනාවක් විඳින ඇතැම් පුද්ගලයෙකුගේ අකුශල ධර්මයෝ වැඩෙත්, කුශල ධර්මයෝ පිරිහෙත් යයි මා විසින් දන්නා ලද්දේද, දක්නා ලද්දේද, විඳිනා ලද්දේද, එහෙයින් මම මෙබඳු දුක්ද නොවූ සැපද නොවූ වේදනාවකට එළඹ වාසය කරව්යයි කියමි.

12. "මහණෙනි, මම සියලුම භික්ෂූන්ට 'නොපමාවෙන් (කටයුතු) කළයුතුය'යි නොකියමි. මහණෙනි, මම සියලුම භික්ෂූන්ට නොපමා නොවීමෙන් (කටයුතු) කළයුතුය'යි නොකියමි. මහණෙනි, රහත්වූ ආශ්‍රවයන් ක්ෂයකළ, වැස නිමවූ බඹසර ඇති, කළ යුතු දේ කළ, බහා තැබූ ස්කන්ධාදී බර ඇති, පැමිණි ස්වකියාර්ථය (-රහත් බව) ඇති, භව බන්ධනය නැතිකළ, මනාව දැන සසරින් මිදුනු, යම් ඒ භික්ෂූහු වෙත්ද, මහණෙනි, මම එවැනි භික්ෂූන්ට නොපමාවෙන් (කටයුතු) කළ යුතුය'යි නොකියමි, ඊට හේතු කවරේද? ඔවුන් නොපමාවෙන් (කටයුතු) කරන ලද්දාහ. ඔවුහු පමාවන්ට නුසුදුස්සෝය. මහණෙනි, සෙඛ

(-නිවන් ලැබීමට හික්මෙන) රහත් බවට නොපැමිණි, උතුම් නිවන් පතමින් යම් ඒ භික්ෂූහු වසත්ද, මහණෙනි, මම එවැනි භික්ෂූන්ට නොපමාවෙන් (කටයුතු) කළ යුතුය'යි කියමි. ඊට හේතු කවරේද? මේ ආයුෂ්මත්හු, සුදුසු සෙනසුන් සෙවනය කරමින්, කල්‍යාණ මිත්‍රයන් ඇසුරු කරමින්, ඉඳුරන් සමකරමින්, යමක් නිසා කුලපුත්‍රයෝ මනාකොට ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වෙත්ද, බ්‍රහ්මචරියාව කෙළවර කොට ඇති, ඒ උතුම් නිර්වාණය මේ අත්බැව්හි තමා නුවණින් දැන, ප්‍රත්‍යක්ෂ කොට (රහත් බවට) පැමිණ වාසය කරන්නාහුනම්, යෙහෙකැයි (කියායි) මහණෙනි, මම මේ භික්ෂූන්ගේ මේ අප්‍රමාද ඵලය බලමින් නොපමාවෙන් (කටයුතු) කළ යුතුයයි කියමි.

13. "මහණෙනි, මේ ලෝකයෙහි මේ නම් පුද්ගලයෝ සත්දෙනෙක් වෙත්. ඒ සත්දෙන කවරහුද? උභතොභාග විමුත්තය, පඤ්ඤාවිමුත්තය, කායසක්ඛිය, දිට්ඨප්පත්තය, සද්ධාවිමුත්තිය, ධම්මානුසාරීය, සද්ධානුසාරිය (යන සත්දෙනයි.)

"මහණෙනි, උභතොභාග විමුක්ත පුද්ගලයා නම් කවරේද? මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් යම් ඒ ශාන්ත විමොක්ෂ යයි කියන ලද අරූපාවචර ධ්‍යානයෝ වෙත්ද, රූප ධ්‍යානයන් ඉක්මවා ඒ අරූප ධ්‍යානයන් කයින් ස්පර්ශ කොට වාසය කෙරේද, ඔහුගේ විදර්ශනා නුවණින් දැන ආශ්‍රවයෝ ක්ෂය වූවාහුද, මහණෙනි, මේ පුද්ගල තෙමේ උභතොභාග විමුක්ත පුද්ගලයායයි, කියනු ලැබේ. මහණෙනි, මම මේ භික්ෂුවට අප්‍රමාදයෙන් (කටයුතු) කළ යුතුයයි නොකියමි. ඊට හේතු කවරේද, ඔහු අප්‍රමාදයෙන් (කටයුතු) කරණ ලද්දාහ. ඔහු ප්‍රමාද වීමට නුසුදුසුය.

14. "මහණෙනි, පඤ්ඤාවිමුත්ත පුද්ගලයා නම් කවරේද, මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් රූපාවචර ධ්‍යානයන් ඉක්මවා යම් ඒ ශාන්ත විමොක්ෂ යයි කියන ලද අරූපාවචර ධ්‍යානයෝ වෙත්ද, ඒ අරූප ධ්‍යානයන් කයින් ස්පර්ශ නොකොට වාසය කෙරේද, ඔහුගේ විදර්ශනා නුවණින් දැන ආශ්‍රවයෝ ක්ෂය වූවාහුද, මහණෙනි, මේ තෙමේ පඤ්ඤාවිමුත්ත

පුද්ගලයා යයි කියනු ලැබේ. මහණෙනි, මම මේ භික්ෂුවටද අප්‍රමාදයෙන් (කටයුතු) කළ යුතු යයි නොකියමි. ඊට හේතු කවරේද, ඔහු අප්‍රමාදයෙන් (කටයුතු) කරණ ලදහ. ඔහු ප්‍රමාද වීමට නුසුදුසුය.

15. "මහණෙනි, කායසක්ඛී පුද්ගලයා නම් කවරේද? මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් රූපාවචර ධ්‍යානයන් ඉක්මවා යම් ඒ ශාන්ත විමොක්ෂ යයි කියන ලද අරූපාවචර ධ්‍යානයෝ වෙත්ද, ඒ අරූපධ්‍යානයන් කයින් ස්පර්ශ කොට වාසය නොකෙරේද, ඔහුගේ නුවණින් දැක ඇතැම් ආශ්‍රවයෝ ක්ෂය වූවාහු වෙත්ද, මහණෙනි, මේ පුද්ගලයා කායසක්ඛී ය'යි කියනු ලැබේ. මහණෙනි, මම මේ භික්ෂුවට අප්‍රමාදයෙන් (කටයුතු) කළ යුතු යයි කියමි. ඊට හේතු කවරේද? මේ ආයුෂ්මත් තෙමේ සුදුසු සෙනසුන් සෙවනය කරමින් කළ්‍යාණ මිත්‍රයන් ඇසුරු කරමින්, ඉඳුරන් සමකරමින්, යමක් නිසා කුලපුත්‍රයෝ මනා කොට ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වෙත්ද, ඒ මාර්ග බ්‍රහ්මචර්යාව කෙළවර කොට ඇති, අනුත්තර නිර්වාණය, මේ ආත්මයෙහි තමා නුවණින් දැන, ප්‍රත්‍යක්ෂ කොට, (රහත් බවට) පැමිණ වාසය කරන්නේ නම් යෙහෙකැයි' (කියා) මහණෙනි මම මේ භික්ෂුවට මේ අප්‍රමාද ඵලය දකිමින් අප්‍රමාදයෙන් කටයුතු කළ යුතු යයි කියමි.

16. "මහණෙනි, දිට්ඨප්පත්ත පුද්ගලයා නම් කවරේද? මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් රූපාවචර ධ්‍යානයන් ඉක්මවා ශාන්ත විමොක්ෂ යයි කියනලද යම් ඒ අරූප ධ්‍යාන කෙනෙක් වෙත්ද, ඒ අරූප ධ්‍යානයන් නාම කයින් ස්පර්ශ කොට වාසය නොකරයිද, ඔහුගේ විදර්ශනා නුවණින් දැක ඇතැම් ආශ්‍රවක්ෂය වූවාහු වෙත්ද, තථාගතයන් වහන්සේ විසින් දැන ගන්නා ලද ධර්මයෝ ඔහුගේ නුවණින් මනා කොට දැන ගන්නා ලද්දාහුද, මහණෙනි, මේ තෙමේ දිට්ඨප්පත්ත පුද්ගලයාය'යි කියනු ලැබේ. මහණෙනි, මම මේ භික්ෂුවටද අප්‍රමාදයෙන් (කටයුතු) කළ යුතුයයි කියමි. ඊට හේතු කවරේද? මේ ආයුෂ්මත් තෙමේ සුදුසු සෙනසුන් සේවනය කරමින්

කල්‍යාණ මිත්‍රයින්, ආශ්‍රය කරමින්, ඉන්ද්‍රියයන් සම කරමින්, යමක් නිසා කුල පුත්‍රයෝ මනා කොට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙත්ද, මාර්ග බ්‍රහ්මචර්යාව කෙළවර කොට ඇති ඒ නිර්වාණය මේ ආත්මයෙහි තමා නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරන්නාහු නම් යෙහෙකැයි (කියායි). මහණෙනි, මම මේ භික්ෂුවගේ අප්‍රමාද ඵලය බලමින් නො පමාවෙන් (කටයුතු) කළ යුතුයයි කියමි.

17. "මහණෙනි, සද්ධාවිමුත්ත පුද්ගලයා නම් කවරේද? මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් රූපාවචර ධ්‍යානයන් ඉක්මවා යම් ඒ ශාන්තවිමොක්ෂ යයි කියනලද අරූපාවචර ධ්‍යාන කෙනෙක් වෙත්ද, ඒ අරූප ධ්‍යානයන් කයින් ස්පර් නොකොට වාසය කරයිද, ඔහුගේ විදර්ශනා නුවණින් දැක ඇතම් ආශ්‍රවයෝ ක්ෂයවූවාහු වෙත්ද, තථාගතයන් වහන්සේ කෙරෙහි ඔහුගේ ශ්‍රද්ධාව බැසගත්තීවේද, මුල් බැස පිහිටියාවේද, මහණෙනි, මේ තෙමේ සද්ධාවිමුත්ත පුද්ගලයායි කියනු ලැබේ. මහණෙනි, මම මේ භික්ෂුවටද, අප්‍රමාදයෙන් කටයුතු කළ යුතුයයි කියමි. ඊට හේතු කවරේද? මේ ආයුෂ්මත් තෙමේ සුදුසු සෙනසුන් සේවනය කරමින් කල්‍යාණ මිත්‍රයන් ආශ්‍රය කරමින්, ඉන්ද්‍රියයන් සම කරමින්, යමක් නිසා කුලපුත්‍රයො මනාකොට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙද්ද, මාර්ගබ්‍රහ්මචර්යාව කෙළවර කොට ඇති ඒ නිර්වාණය මේ ආත්මයෙහිම තමා නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරන්නේ නම් යෙහෙකැයි (කියායි). මහණෙනි, මම මේ භික්ෂුවගේ මේ අප්‍රමාද ඵලය දකිමින් අප්‍රමාදයෙන් (කටයුතු) කළ යුතුයයි කියමි.

18. "මහණෙනි, ධම්මානුසාරී පුද්ගලයා කවරේද? මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් රූපාවචර ධ්‍යානයන් ඉක්මවා යම් ඒ ශාන්ත විමොක්ෂයයි කියන ලද අරූපාවචර ධ්‍යානයෝ වෙත්ද, ඒ අරූප ධ්‍යානයන් නාම කයින් ස්පර්ශ නොකොට වාසය කරයිද, ඔහුගේ නුවණින් දැක ආශ්‍රවයෝ ක්ෂය නොවූවාහු වෙත්ද, තථාගතයන් වහන්සේ විසින් දැනගන්නා ලද ධර්මය ඔහුගේ නුවණින් පමණකින් දැකීමට

පැමිණෙත්. තවද ඔහුට මේ ධර්මයෝ වෙත්, කවරහුද? සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්චෙන්ද්‍රිය ය (යන මොහුයි) මහණෙනි, මේ තෙමේ ධම්මානුසාරි පුද්ගලයායයි කියනු ලැබේ. මහණෙනි, මම මේ භික්ෂුවටද අප්‍රමාදයෙන් කටයුතු කළයුතුයයි කියමි. ඊට හේතු කවරේද? මේ ආයුෂ්මත් තෙමේ සුදුසු සෙනසුන් සේවනය කරමින් කළ්‍යාණ මිත්‍රයන්, ආශ්‍රය කරමින්, ඉන්ද්‍රියන් සමකරමින් යමක් නිසා කුලපුත්‍රයෝ මනාකොට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙයිද, මාර්ග බ්‍රහ්මචර්යාව කෙළවර කොට ඇති ඒ නිර්වාණය මේ ආත්මයෙහි තමා නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරන්නේ නම් යෙහෙකැයි (කියායි). මහණෙනි, මම මේ භික්ෂුවගේ අප්‍රමාද ඵලය දකිමින් අප්‍රමාදයෙන් කටයුතු කළයුතුයයි කියමි.

**19.** "මහණෙනි, සද්ධානුසාරී පුද්ගලයා නම් කවරේද? මහණෙනි, මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් රූපාවචර ධ්‍යානයන් ඉක්මවා යම් ඒ ශාන්ත විමොක්ෂයයි කියන ලද අරූපාවචර ධ්‍යානයෝ වෙත්ද, ඒ අරූප ධ්‍යානයන් නාම කයින් ස්පර්ශ කොට වාසය නොකරයිද, ඔහුගේ නුවණින් දැක ආශ්‍රවයෝ ක්ෂය නොවූවාහු වෙත්ද, තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව පමණක් භක්තිය පමණක් වෙයිද, තවද ඔහුට මේ ධර්මයෝ වෙත්, එනම් සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය (යන මොහුයි) මහණෙනි, මේ තෙමේ සද්ධානුසාරී පුද්ගලයායි කියනු ලැබේ. මහණෙනි. මම මේ භික්ෂුවට අප්‍රමාදයෙන් කටයුතු කළ යුතුයයි කියමි.

ඊට හේතු කවරේද?

මේ ආයුෂ්මතෙමේ සුදුසු සෙනසුන් සේවනය කරමින් කළ්‍යාණ මිත්‍රයන්, ආශ්‍රය කරමින්, ඉන්ද්‍රියයන් සමකරමින්, යමක් නිසා කුල පුත්‍රයෝ මනා කොට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙත්ද, මාර්ගබ්‍රහ්මචර්යාව කෙළවර කොට ඇති ඒ නිර්වාණය මේ ආත්මයෙහිම තමා නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කරන්නේ නම් යෙහෙකැයි (කියායි)

මහණෙනි, මම මේ භික්ෂුවගේ අප්‍රමාද ඵලය දකිමින් අප්‍රමාදයෙන් කටයුතු කළ යුතුයයි කියමි.

**20.** "මහණෙනි, මම එක්වරටම රහත්වීම නොකියමි. එසේවුවත් මහණෙනි, පිළිවෙළින් හික්මීමෙන්, පිළිවෙළින් කටයුතු කිරීමෙන් පිළිවෙළින් පිළිවෙත් පිරීමෙන් රහත් බවට පැමිණීම වේ.

"මහණෙනි, කෙසේ පිළිවෙළින් හික්මීමෙන් පිළිවෙළින් කටයුතු කිරීමෙන් පිළිවෙළින් පිළිවෙත් පිරීමෙන් රහත් බවට පැමිණීම වේද? මහණෙනි, මේ ශාසනයෙහි ශ්‍රද්ධාව හටගත් තැනැත්තේ ගුරුන්වෙත එළඹෙයි, ගුරුන්වෙත එළඹුනේ, ආශ්‍රය කරයි. ආශ්‍රය කරන්නේ, කණ එළවා තබයි, කණ එළවා තැබූයේ, බණ අසයි, බණ අසා දරාගනියි, දරාගන්නේ ධර්මයන්ගේ අර්ථය සලකා බලයි, අර්ථය සලකා බලන්නේ වැටහෙන නුවණ උපදියි. වැටහෙන නුවණ ඇතිවූ කල්හි කැමැත්ත ඇතිවෙයි, කැමැත්ත ඇත්තේ, උත්සාහ කරයි. උත්සාහ කොට අනිත්‍ය දුඃඛ අනාත්මයයි විමසාබලයි. විමසා බලා දැන මාර්ගය ලැබීමට උත්සාහ කරයි. මාර්ගය ලැබීමට උත්සාහ කළේ නාමකයින් නිවන්සුව අවබොධ කරයි. මාර්ග ප්‍රඥාවෙන් විනිවිද බලයි, මහණෙනි, ඒ ශ්‍රද්ධාව නොවීද, මහණෙනි, ඒ ගුරුන්වෙත එළඹීමද, නොවීද මහණෙනි, ඒ ආශ්‍රය නොවේද, මහණෙනි, ඒ කණ එළවා තැබීමද නොවේ. මහණෙනි, ඒ බණ ඇසීම නොවීද, මහණෙනි ඒ ධර්මය දැරීමද, නොවේ. මහණෙනි, ඒ දරන ලද ධර්මයාගේ අර්ථය සලකා බැලීම නොවේද, මහණෙනි, ඒ ධර්මය වටහා ගත් නුවණ නොවේ, මහණෙනි, ඒ කැමැත්ත නොවීද, මහණෙනි, ඒ උත්සාහය නොවේ, මහණෙනි, ඒ විමසා බැලීම නොවීද, මහණෙනි, ඒ මාර්ගය ලැබීමේ උත්සාහය නොවේ. මහණෙනි, විරුද්ධව පිළිපන්නෝ වූවාහුය. මහණෙනි, වරදවා පිළිපන්නෝ වූවාහුය, මහණෙනි, මේ හිස් පුරුෂයෝ කොතරම් දුර මේ ශාසනයෙන් පහවගියාහු වෙත්ද?

මහණෙනි, මේ උදෙසීමක් (-කොටින් කීමක්) හේතු කොට ගෙන නුවණ ඇති පුරුෂ තෙමේ නොබෝ කලකින් නුවණින්

අර්ථය (-කාරණය) දනීද, ඒ සතර පද (චතුස් සත්‍ය) ප්‍රකාශයක් ඇත්තේය.

**21.** "මහණෙනි, තොපට (එය) කොටින් කියමි. එය දැනගණිව්" "ස්වාමීනි, අපි කවුරුද, ධර්මය දැන ගන්නෝ කවුරුද" (අපි ධර්මය දැනගැනීමට තරම් නොවෙමු යන අදහසයි) "මහණෙනි, යම් ඒ ශාස්තෘවරයෙක් ආමිෂය ගරු කොට ඇත්තේ, ආමිෂය දායාද කොට ඇත්තේ. ආමිෂයෙහි ඇලී වසයිද, ඔහුගේ ධර්මයෙහිද, 'අපට මෙසේ වන්නේ නම් මෙසේ කරන්නෙමු. අපට එසේ නොවන්නේ නම් එය නොකරන්නෙමුය'යි මෙවැනි මිළ නියම කිරීමක් හා අඩුවෙන් ඉල්ලීමක් නැත.

**22.** "මහණෙනි, කිමෙක්ද? තථාගතතෙම සර්වප්‍රකාරයෙන් ආමිෂයෙන් වෙන්ව වසන්නේ නොවේද? (ඒ තථාගතයන්ගේ ශාසනයෙහි එවැනි මිළ නියම කිරීමක් හෝ අඩුකර ඉල්ලීමක් කෙසේ නම් යෙදෙන්නේ?) මහණෙනි, ශාස්තෘන් වහන්සේගේ අනුශාසනයන් උසස් කොට ගෙණ ගන්නා සැදැහැවත් ශ්‍රාවකයාගේ මේ ස්වභාවය වෙයි. භාග්‍යවතුන් වහන්සේ ශාස්තෘ වෙයි. මම ශ්‍රාවක වෙමි. භාග්‍යවතුන් වහන්සේ දනී. මම නොදනිමි.

**23.** "මහණෙනි, ශාස්තෘන් වහන්සේගේ අනුශාසනයන් උසස්කොට ගන්නා ශ්‍රාවකයා නිසා ශාස්තෘ ශාසනය දියුණු වේ. ඕජාවත් වේ.

"මහණෙනි, ශාස්තෘන් වහන්සේගේ අනුශාසනයන් උසස් කොට ගන්නා සැදැහැවත් කුලපුත්‍රයාගේ මේ ස්වභාව වේ. 'ඒකාන්තයෙන් ශරීරයෙහි සම, නහර, ඇට, ඉතිරිවේවා මස් ලේ වියලේවා, යම් ඒ පුරුෂ ශක්තියකින් පුරුෂ වීර්යයකින්, පුරුෂ පරාක්‍රමයකින්, යමකට පැමිණිය යුතුද, ඊට නොපැමිණ වීර්යයාගේ නැවැත්මක් නොවන්නේය. (කියායි)

**24.** "මහණෙනි, ශාස්තෘ ශාසනයන් උසස් කොට ගන්නා සැදැහැවත් කුලපුත්‍රයා දෙවදෑරුම් ඵලයන් අතුරෙන් එක්තරා

ඵලයක් කැමති විය යුතු. මේ අත්බැව්හි රහත් බව හෝ ස්කන්ධය ඉතිරිව ඇතිකල්හි අනාගාමි බව හෝ ය."

භාග්‍යවතුන් වහන්සේ මෙය දෙසූ සේක. සතුටු සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ කීමට සතුටු වූහ.

දහවෙනිවූ කීටාගිරි සූත්‍රය නිමි. (2-10)

---

(අම්බලට්ඨික රාහුලොවාද සූත්‍රය, මහා රාහුලොවාද සූත්‍රය, චූල මාලුංක්‍ය සූත්‍රය, මහා මාලුංක්‍ය සූත්‍රය, භද්දාලි සූත්‍රය, ලටුකිකොපම සූත්‍රය, චාතුම සූත්‍රය, නලකපාන සූත්‍රය, ගුලිස්සානි සූත්‍රය, කීටාගිරි සූත්‍රය යන සූත්‍ර දසයවූ)

දෙවෙනි භික්ෂු වර්ගයි.

---

## 21. තෙවිජ්ජ වච්ඡගොත්ත සූත්‍රය.

1. "මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ විසාලාමහනුවර මහවනයෙහිවූ කූටාගාර ශාලාවෙහි වාසය කළහ. එකල්හි වනාහි වච්ඡගොත්ත නම් පරිව්‍රාජක තෙම එකපුණ්ඩරීක නම්වූ පරිව්‍රාජකාරාමයෙහි වාසය කරයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ උදය කාලයෙහි හැඳ පොරවා පා සිවුරු රැගෙණ විසාලා මහනුවර පිඬු පිණිස පැමිණියෝය.

2. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේට 'විසාලා මහනුවර පිඬු සිඟීමට තවම කල් වැඩිය. මම එකපුණ්ඩරීක නම්වූ පරිව්‍රාජකාරාමය යම් තැනකද, වච්ඡගොත්ත නම් පරිව්‍රාජක තෙම යම් තැනකද, එතැනට පැමිණෙන්නෙම් නම් යහපතැයි' අදහස් විය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ එකපුණ්ඩරීක නම්වූ පරිව්‍රාජකාරාමය යම් තැනකද, වච්ඡගොත්ත නම් පරිව්‍රාජක තෙම යම් තැනකද, එතැනට පැමිණියෝය.

3. වච්ඡගොත්ත නම් පරිව්‍රාජක තෙම, වඩින්නාවූ භාග්‍යවතුන් වහන්සේ දුරදීම දුටුයේය. දැක භාග්‍යවතුන්

වහන්සේට "ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේගේ මෙහි වැඩීම යහපති. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ බොහෝ කලකින් මෙහි වැඩියහ. ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ වැඩඉන්නා සේක්වා. මේ ආසනය පනවන ලදැයි" කීයේය. භාග්‍යවතුන් වහන්සේ පනවන ලද අස්නෙහි වැඩඋන්හ. වච්ඡගොත්ත නම් පරිව්‍රාජක තෙමේද, එක්තරා මිටි අස්නක් ගෙණ එක් පැත්තක උන්නේය. එක් පැත්තක උන්නාවූම වච්ඡගොත්ත නම් පරිව්‍රාජක තෙම "ස්වාමීනි, 'ශ්‍රමණ ගෞතම තෙම සර්වඥය සියල්ල දක්නේය, සියල්ල දක්නා ඥානයක් ඇතැයි ප්‍රකාශ කරයි. යන්නාවූද, සිටින්නාවූද, නිදන්නාවූද, නොනිදන්නාවූද, මට නිරන්තරයෙන් සියල්ල දක්නා නුවණ එළඹ සිටියේය' යන මෙය මා විසින් අසන ලදී. ස්වාමීනි, යම් ඒ කෙනෙක් 'ශ්‍රමණ ගෞතම තෙම සර්වඥය, සියල්ල දක්නේය. සියල්ල දක්නා ඥානයක් ඇතැයි ප්‍රතිඥා කරයි. යන්නාවූද, සිටින්නාවූද, නිදන්නාවූද, නොනිදන්නාවූද, මට නිරන්තරයෙන් සියල්ල දක්නා නුවණ එළඹ සිටින්නේය'යි මෙසේ කියත්ද, ස්වාමීනි, කිමෙක්ද, ඔව්හු භාග්‍යවතුන් වහන්සේට කියන ලද්දක් කියන්නාහුද, භාග්‍යවතුන් වහන්සේට නැති දෙයකින් දොෂාරොපන නොකරද්ද, ධර්මයට අනුකූලවූවක් ප්‍රකාශ කෙරෙත්ද, කිසියම් මේ කීම කරුණු සහිතව නුවණැත්තන් විසින් ගැරහිය යුතු තැනට නොපැමිණේද?"යි භාග්‍යවතුන් වහන්සේගෙන් ඇසීය.

4. "වච්ඡය, 'ශ්‍රමණ ගෞතම තෙමේ සර්වඥය, සියල්ල දක්නේය, සියල්ල දක්නා නුවණක් ඇතැයි ප්‍රකාශ කරයි. යන්නාවූද, සිටින්නාවූද, නිදන්නාවූද, නොනිදන්නාවූද, මට නිරන්තරයෙන් සියල්ල දක්නා නුවණ එළඹ සිටියේයයි' යම් කෙනෙක් මට කීවාහු නම් ඔව්හු මා විසින් කියන ලද්දක් කියන්නෝ නොවෙත්. ඔව්හු මට අසත්‍යයෙන් චොදනා කරත්."

5. "ස්වාමීනි, කෙසේ ප්‍රකාශ කරන්නාවූ අපි වනාහි භාග්‍යවතුන් වහන්සේට කියන ලද්දක් කියන්නෝ වන්නෙමුද, භාග්‍යවතුන් වහන්සේට අසත්‍යයෙන් දොස්නොකියන්නෙමුද, ධර්මයට අනුකූලවූවක් ප්‍රකාශ කරන්නෙමුද, කරුණු සහිතවූ

නුවණැත්තන් විසින් ගැරහිය යුතු බවට නොපැමිණෙන කිසියම් කීමක් වන්නේද?

**6.** "වච්ඡය, 'ශ්‍රමණ ගෞතම තෙම ත්‍රිවිද්‍යාවෙන් යුක්තය'යි ප්‍රකාශ කරණු ලබන්නේ, මට කියන ලද්ද කියන්නේද වන්නේය. මට බොරුවෙන් දොස්ද නොකියන්නේය. ධර්මයට අනුකූලවූවක් ප්‍රකාශ කරන්නේය. ඒ කීම කරුණු සහිතව නුවණැත්තන්ගේ ගැරහිය යුතු බවට නොපැමිණෙන්නේය. වච්ඡය, මම වනාහි යම්තාක්ම කැමැති වෙම්ද, (ඒතාක්) අනෙකප්‍රකාරවූ පෙරවිසූ භව සිහිකරමි. එනම්, එක ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති හතරක්ද, ජාති පසක්ද ජාති දසයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති සතළිසක්ද, ජාති පනසක්ද, ජාති සියයක්ද, දහස් ජාතියක්ද, සියක් දහස් ජාතියක්ද, නොයෙක් විනාශ වෙමින් පවතින කල්පයන්ද, නොයෙක් හැදෙමින් පවතින කල්පයන්ද, නොයෙක් විනාශවන හෝ හැදෙන කල්පයන්ද, 'අසුවල් තැන වීමි, මෙනම් ඇත්තෙම්, මේ ගොත්‍ර ඇත්තෙම්, මේ පාට ඇත්තෙම්, මේ කෑම ඇත්තෙම්, මේ සැප දුක් වින්දෙම්, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුතවූයෙම්, අසුවල් තැන උපන්නෙමි, එහිදු මෙනම් ඇත්තෙම්, මේ ගොත්‍ර ඇත්තෙම්, මේ පාට ඇත්තෙම්, මේ කෑම ඇත්තෙම්, මේ සැප දුක් වින්දෙම්, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුතවූයෙම්, මෙහි උපන්නෙමි'යි මෙසේ ආකාර සහිතවූ, උදෙසීම් සහිතවූ අනෙක ප්‍රකාරවූ පෙරවිසූම් සිහිකරමි. වච්ඡය, මම වනාහි යම්තාක්ම කැමැති වෙම්ද, (ඒතාක්) පිරිසිදුවූ මිනිස් ඇස ඉක්ම පැවැත්තාවූ දිව්‍යවූ ඇසින් චුත වන්නාවූද, උපදින්නාවූද, හීනවූද, ප්‍රණීතවූද, යහපත් වර්ණ ඇත්තාවූද, අයහපත් වර්ණ ඇත්තාවූද, සුගතිවල උපන්නාවූද දුර්ගතිවල උපන්නාවූද සත්වයන් දකිමි. 'මේ පින්වත් සත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්තවූහ, වාග් දුශ්චරිතයෙන් යුක්තවූහ. මනො දුශ්චරිතයෙන් යුක්තවූහ. ආර්යයන්ට ගරහන්නෝ වූහ. මිථ්‍යාදෘෂ්ටිකයෝ වූහ, මිථ්‍යාදෘෂ්ටි කර්ම සමාදන්වූවෝ වූහ. ඔවුහු මරණින් මතු සැපයෙන් පහවූ නපුරුවූ දුක්වූ නිරයට පැමිණෙත්. නැතහොත්, මේ පින්වත් සත්වයෝ කාය

සුචරිතයෙන් යුක්තවූහ, වාග් සුචරිතයෙන් යුක්තවූහ, මනො සුචරිතයෙන් යුක්ත වූහ, ආර්යයන්ට නොගරහන්නෝ වූහ. සත්‍යය අදහන්නෝ වූහ, සත්‍ය ඇදහීම් සමාදන්වූවෝ වූහ. ඔව්හු මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයට පැමිණියෝ'යි මෙසේ පිරිසිදුවූ, මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින් චුත වන උපදින සත්වයන් දකිමි, මෙසේ පිරිසිදුවූ, මනුෂ්‍යත්වය ඉක්ම සිටියාවූ දිවැසින් චුතවන්නාවූද උපදින්නාවූද පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද හොඳ ලොවට ගියාවූද, නරක ලොවට ගියාවූද, කම්වූ පරිද්දෙන් පරලොව ගියාවූ සත්වයන් දැනගනිමි.

7. "වච්ඡය, මම වනාහි ආශ්‍රවයන් (කෙළෙස්) ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ සමාධිය කරණකොට මිදීමත්, ප්‍රඥාව කරණකොට මිදීමත්, මේ ආත්මයෙහිම තමන්ම විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කරමි. වච්ඡය, ශ්‍රමණ ගෞතම තෙම ත්‍රිවිද්‍යාවෙන් යුක්තයයි, ප්‍රකාශ කරණු ලබන්නේ, මට කියන ලද්ද කියන්නේද වන්නේය. මට අසත්‍යයෙන් නින්දාද නොකරන්නේය. ධර්මයටද අනුකූල වූවක් ප්‍රකාශ කරන්නේය. ඒ කීම කරුණු සහිතව නුවණැතියන් විසින් හැරගිය යුතු තැනටද නොපැමිණෙන්නේයයි" වදාළේය.

8. මෙසේ වදාළ කල්හි වච්ඡගොත්ත නම් පරිව්‍රාජක තෙම "භවත් ගෞතමයන් වහන්ස, ගිහිබන්ධනය (ගිහියන් විසින් පරිහරණය කරන දෙයෙහි ආශාව) දුරුනොකොට කිසියම් ගිහියෙක් ශරීරයාගේ බිඳීමෙන් පසුදුක් කෙළවර කෙරේදැ"යි භාග්‍යවතුන් වහන්සේගෙන් ඇසීය.

"වච්ඡය, කිසියම් ගිහියෙක් ගිහිසංයොජනය දුරු නොකොට ශරීරයාගේ බිඳීමෙන් පසු දුක් කෙළවර කරන්නෙක් නැත්තේය"යි වදාළේය.

9. "භවත් ගෞතමයන් වහන්ස, කිසියම් ගිහියෙක් ගිහි සංයොජනය දුරු නොකොට ශරීරයාගේ බිඳීමෙන් පසු දෙව්ලොවට පැමිණෙන්නෙක් ඇත්තේදැ"යි ඇසීය.

"වච්ඡය, ගිහිසංයෝජන දුරු නොකොට මරණින් පසු ස්වර්ගයට ගියාහු සියයක්ද නොවෙයි, දෙසියයක්ද නොවෙයි, තුන්සියයක්ද නොවෙයි, සාරසියයක්ද නොවෙයි, පන්සියයක්ද නොවෙයි, හුදෙක් ඉතා බොහෝය"යි වදාළේය.

10. "භවත් ගෞතමයන් වහන්ස, ශරීරයාගේ බිඳීමෙන් පසු දුක් කෙළවර කරන්නාවූ කිසියම ආජීවකයෙක් ඇත්තේද" "වච්ඡය, ශරීරයාගේ බිඳීමෙන් පසු දුක් කෙළවර කරන්නාවූ කිසියම් ආජීවකයෙක් නැත්තේය."

11. "භවත් ගෞතමයන් වහන්ස, කිසියම් ආජීවකයෙක් ශරීරයාගේ බිඳීමෙන් දෙව්ලොව ගියේද, එබන්දෙක් ඇත්තේද?"

"වච්ඡය, මම යම් කල්පයක් සිහිකරම්ද, ඒ මෙයින් ඒකානූවන කල්පයයි. එකෙකු හැර දෙව්ලොව ගියාවූ කිසියම් ආජීවකයෙකු නොදනිමි. හෙතෙමේද කර්මවාද ඇත්තාවූ ක්‍රියාවද ඇත්තාවූ (ආජීවකයෙක්) වූයේයයි" වදාළේය.

12. "භවත් ගෞතමයන් වහන්ස, මෙසේ ඇති කල්හි මේ තීර්ථායතනය යටත්පිරිසෙයින් ස්වර්ගයට යන්නෙකුගෙනුත් සූන්‍යයයි"

"වච්ඡය, මෙසේ ඇති කල්හි මේ තීර්ථායතනය, යටත් පිරිසෙයින් දෙව්ලොව යන්නෙකුගෙන් පවා හිස්යයි" වදාළේය. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ. සතුටු සිත් ඇත්තාවූ වච්ඡගොත්ත නම් පරිව්‍රාජක තෙම භාග්‍යවතුන් වහන්සේගේ දේසනාව සතුටින් පිළිගත්තේය.

**පළමුවෙනිවූ තෙවිජ්ජ වච්ඡගොත්ත සූත්‍රය නිමි. (3-1)**

---

## 22. අග්ගි වච්ඡගොත්ත සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර අනේපිඬු මහ සිටුහුගේ ජේතවන නම්වූ ආරාමයෙහි වාසය කළහ. එකල්හි වච්ඡගොත්ත පරිව්‍රාජක තෙම,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූයේය. සතුටු විය යුතු සිහිකටයුතු කථාව කොට නිමවා එක්පැත්තක උන්නේය. එක්පැත්තක උන්නාවූම වච්ඡගොත්ත නම් පරිව්‍රාජක තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේය.

**2.** "භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද? භවත් ගෞතම තෙමේ 'ලොකය සදාකාලිකය, මෙයම සත්‍යයි මෙයින් අන්‍යමත සිස්ය, යන මේ දෘෂ්ටිය ඇත්තේද?"

"වච්ඡය, මම 'ලොකය සදාකාලිකය, මෙයම සත්‍යයි මෙයින් අන්‍ය මත සිස්ය, යන මෙබඳු දෘෂ්ටිය ඇත්තේ නොවෙමි."

**3.** "භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද? භවත් ගෞතම තෙමේ 'ලොකය සදාකාලික නොවේ. මෙයම සත්‍යයි මෙයින් අන්‍ය මත හිස්ය, යන මෙබඳු දෘෂ්ටි ඇත්තේද?"

"වච්ඡය, මම 'ලොකය සදාකාලික, නොවේ. මෙයම සත්‍යය මෙයින් අන්‍ය මත සිස්ය, යන මෙබඳු දෘෂ්ටිය ඇත්තේ නොවෙමි."

**4.** "භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද? භවත් ගෞතම තෙමේ 'ලොකයේ කෙළවර ඇත්තේය. මෙයම සත්‍යය, මෙයින් අන්‍ය මත සිස්ය'යි, මෙබඳු දෘෂ්ටිය ඇත්තේද?"

"වච්ඡය, මම 'ලොකය කෙළවර ඇත්තේය. මෙයම සත්‍යය, මෙයින් අන්‍ය මත හිස්ය'යි මෙබඳු දෘෂ්ටි ඇත්තේ නොවෙමි."

**5.** "භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද? භවත් ගෞතම තෙමේ 'ලොකය කෙළවර නැත්තේය. මෙයම සත්‍යය, මෙයින් අන්‍ය මත හිස්ය'යි මෙබඳු දෘෂ්ටිය ඇත්තේද?"

"වච්ඡය, මම 'ලොකය කෙළවර නැත්තේය. මෙයම සත්‍යය, මෙයින් අන්‍ය මත හිස්ය'යි යන මෙබඳු දෘෂ්ටිය ඇත්තේ නොවෙමි."

**6.** "භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද? භවත් ගෞතම තෙමේ 'එයම ජීවය වේ, එයම ශරීරය වේ. මෙයම සත්‍යය, මෙයින් අන්‍යමත සිස්ය'යි, මෙබඳු දෘෂ්ටි ඇත්තේද?"

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"වච්ඡය මම 'එයම ජීවය වේ, එයම ශරීරය වේ, මෙයම සත්‍යය, මෙයින් අන්‍යමත සිස්ය'යි, මෙබඳු දෘෂ්ටි ඇත්තේ නොවෙමි."

7. "භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද? භවත් ගෞතම තෙමේ 'ජීවය අනිකක් වේ. ශරීරය අනිකක් වේ. මෙයම සත්‍යය, මෙයින් අන්‍යමත සිස්ය'යි, මෙබඳු දෘෂ්ටි ඇත්තේද?"

"වච්ඡය, මම 'ජීවය අනිකක් වේ. ශරීරය අනිකක් වේ. මෙයම සත්‍යය, මෙයින් අන්‍යමත සිස්යයි මෙබඳු දෘෂ්ටි ඇත්තේ නොවෙමි."

8. "භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද? භවත් ගෞතම තෙමේ 'සත්ව තෙම මරණින් මතු වෙයි. මෙයම සත්‍යය, මෙයින් අන්‍යමත සිස්ය'යි, මෙබඳු දෘෂ්ටි ඇත්තේද?"

"වච්ඡය, මම 'සත්වතෙම මරණින් මතු වේ. මෙයම සත්‍යය, මෙයින් අන්‍යමත සිස්ය'යි, මෙබඳු දෘෂ්ටි ඇත්තේ නොවෙමි."

9. "භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද? භවත් ගෞතම තෙමේ 'සත්ව තෙම මරණින් මතු නොවේ. මෙයම සත්‍යය, මෙයින් අන්‍යමත සිස්ය'යි, මෙබඳු දෘෂ්ටි ඇත්තේද?"

"වච්ඡය, මම 'සත්ව තෙම මරණින් මත්තෙහි නොවේ. මෙයම සත්‍යය මෙයින් අන්‍යමත සිස්ය'යි, මෙබඳු දෘෂ්ටි ඇත්තේ නොවෙමි."

10. "භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද? භවත් ගෞතම තෙමේ 'සත්ව තෙම මරණින් මතු වන්නේද වෙයි. නොවන්නේද වෙයි, මෙයම සත්‍යය, මෙයින් අන්‍ය මත සිස්ය'යි, මෙබඳු දෘෂ්ටි ඇත්තේද?"

"වච්ඡය, මම 'සත්ව තෙම මරණින් මත්තෙහි වන්නේද වෙයි, නොවන්නේද වෙයි මෙයම සත්‍යය, මෙයින් අන්‍ය මත සිස්ය'යි, මෙබඳු දෘෂ්ටි ඇත්තේ නොවෙමි."

"භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද? භවත් ගෞතම තෙමේ, 'සත්ව තෙම මරණින් මතු නොම වෙයි. නොවන්නේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

නොවෙයි, මෙයම සත්‍යය. මෙයින් අන්‍ය මත සිස්ය'යි මෙබඳු දෘෂ්ටි ඇත්තේද?"

"වච්ඡය, "මම සත්ව තෙම මරණින් මත්තෙහි නොමවෙයි. නොවන්නේ නොවෙයි. මෙයම සත්‍යය, මෙයින් අන්‍ය මත සිස්ය'යි, මෙබඳු දෘෂ්ටි ඇත්තේ නොවෙමි."

12. "භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද? භවත් ගෞතම තෙමේ, 'ලොකය සදාකාලික වේ. මෙයම සත්‍යය. මෙයින් අන්‍ය මත සිස්ය'යි, මෙබඳු දෘෂ්ටි ඇත්තේදැයි මෙසේ විචාරණ ලද්දේ 'වච්ඡය මම ලොකය සදාකාලිකය, මෙයම සත්‍යය, මෙයින් අන්‍ය මත සිස්ය'යි මෙබඳු දෘෂ්ටි ඇත්තේ නොවෙමියි' කීවෙහිය.

13. "භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද? භවත් ගෞතම තෙමේ, ලොකය ශාස්වත නොවේ. මෙයම සත්‍යය. මෙයින් අන්‍ය මත සිස්ය'යි, මෙබඳු දෘෂ්ටි ඇත්තේදැ?'යි මෙසේ විචාරණ ලද්දේද 'වච්ඡය, මම, ලොකය සදාකාලික නොවේ. මෙයම සත්‍යය, මෙයින් අන්‍ය මත සිස්ය'යි, මෙබඳු දෘෂ්ටි ඇත්තේද නොවෙමියි කීයෙහිය.

14. "භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද, භවත් ගෞතම තෙමේ, ලොකය කෙළවර ඇත්තේය. මෙයම සත්‍යය, මෙයින් අන්‍යමත සිස්ය'යි මෙබඳු දෘෂ්ටි ඇත්තේද?'යි මෙසේ විචාරණ ලද්දේද 'වච්ඡය, මම ලොකය කෙළවර ඇත්තේය. මෙයම සත්‍යය, මෙයින් අන්‍ය මත සිස්ය'යි, මෙබඳු දෘෂ්ටි ඇත්තේත් නොවෙමියි' කීයෙහිය.

15. "භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද, භවත් ගෞතම තෙමේ ලොකය කෙළවර නැත්තේය. මෙයම සත්‍යය, මෙයින් අන්‍ය මත සිස්යයි, මෙබඳු දෘෂ්ටි ඇත්තේදැයි මෙසේ විචාරන ලද්දේද 'වච්ඡය, මම ලොකය කෙළවර නැත්තේය. මෙයම සත්‍යය, මෙයින් අන්‍ය මත සිස්ය'යි, මෙබඳු දෘෂ්ටි ඇත්තේ නොවෙමියි' කීයෙහිය.

16. භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද? භවත් ගෞතම තෙමේ එයම ජීවයවේ, එයම ශරීරයවේ, මෙයම සත්‍යයි. මෙයින්

අන්‍ය මත හිස්යයි, මෙබඳු දෘෂ්ටි ඇත්තේදැ?'යි මෙසේ විචාරණ ලද්දේද, 'වච්ඡය, මම එය ජීවය එය ශරීරය මෙයම සත්‍යය මෙයින් අන්‍ය මත සිස්යයි මම මෙබඳු දෘෂ්ටි ඇත්තේ නෙවෙමියි' කීයෙහිය.

17. "භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද? භවත් ගෞතම තෙමේ ජීවය අනිකක, ශරීරය අනිකක, මෙයම සත්‍යය, මෙයින් අන්‍ය මත සිස්යයි, මෙබඳු දෘෂ්ටි ඇත්තේද?" මෙසේ විචාරණ ලද්දේද, "වච්ඡය, ජීවය අනිකක, ශරීරය අනිකක, මෙයම සත්‍යය, මෙයින් අන්‍යමත සිස්යයි, මම මෙබඳු දෘෂ්ටි ඇත්තේ නොවෙමියි' කීයෙහිය.

18. "භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද, භවත් ගෞතම තෙමේ, සත්වතෙම මරණින් මත්තෙහි වෙයි. මෙයම සත්‍යය, මෙයින් අන්‍ය මත සිස්යයි, මෙබඳු දෘෂ්ටි ඇත්තේද?" මෙසේ විචාරණ ලද්දේද, 'වච්ඡය, සත්ව තෙම මරණින් මත්තෙහි වෙයි. මෙයම සත්‍යය, මෙයින් අන්‍ය මත සිස්යයි, මම මෙබඳු දෘෂ්ටි ඇත්තේ නොවෙමියි' කීයෙහිය.

19. "භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද? භවත් ගෞතම තෙමේ, සත්වතෙම මරණින් මත්තෙහි නොවෙයි. මෙයම සත්‍යය, මෙයින් අන්‍ය මත සිස්යයි, මෙබඳු දෘෂ්ටි ඇත්තේදැයි, මෙසේ විචාරණ ලද්දේද, "වච්ඡය, සත්ව තෙම මරණින් මත්තෙහි නොවෙයි. මෙයම සත්‍යය, මෙයින් අන්‍ය මත සිස්යයි මම මෙබඳු දෘෂ්ටි ඇත්තේ නොවෙමියි' කීයෙහිය.

20. "භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද? භවත් ගෞතම තෙමේ, සත්ව තෙම මරණින් මත්තෙහි වන්නේද වෙයි, නොවන්නේද වෙයි, මෙයම සත්‍යය, මෙයින් අන්‍ය මත සිස්යි මෙබඳු දෘෂ්ටි ඇත්තේද? මෙසේ විචාරණ ලද්දේද, 'වච්ඡය, මම සත්ව තෙම මරණින් මත්තෙහි වන්නේද වෙයි, නොවන්නේද වෙයි, මෙයම සත්‍යය, මෙයින් අන්‍යමත සිස්යයි මෙබඳු දෘෂ්ටි ඇත්තේ නොවෙමියි' කීයෙහිය.

21. "භවත් ගෞතමයන් වහන්ස, කිමෙක්ද? භවත් ගෞතම තෙමේ, සත්ව තෙම මරණින් මත්තෙහි නොම වෙයි.

නොවන්නේත් නොවෙයි. මෙයම සත්‍යය, මෙයින් අන්‍යමත සිස්යි, මෙබඳු දෘෂ්ටි ඇත්තේද? මෙසේ විචාරණ ලද්දේද, 'වච්ඡය, සත්වතෙම මරණින් මත්තෙහි නොමවෙයි. නොවන්නේත් නොවෙයි. මෙයම සත්‍යය, මෙයින් අන්‍යමත සිස්යයි, මම මෙබඳු දෘෂ්ටි ඇත්තේ නොවෙමියි' කීයෙහිය.

22. "භවත් ගෞතම තෙමේ කිනම් ආදීනවයක් දකිමින් මෙසේ මේ සියලු දෘෂ්ටි ගතිවලට නොපැමිණියේ වෙහිද?"

"වච්ඡය, ලොකය ශාස්වතය යන මේ දෘෂ්ටිය, දෘෂ්ටිවනය, දෘෂ්ටිකාන්තාරය, දෘෂ්ටිහුලය, දෘෂ්ටිචපලබව, දෘෂ්ටි සංයොජනය දුක් සහිතය, උවදුරු සහිතය, වෙහෙස සහිතය, දැවිලි සහිතය, කලකිරීම පිණිස, නොඇලීම පිණිස, දුක් නැතිකිරීම පිණිස, සංසිඳීම පිණිස, දැනීම පිණිස, අවබොධය පිණිස, නිර්වාණය පිණිස නොපවතියි.

23. "වච්ඡය, ලොකය අශාස්වතය යන මේ දෘෂ්ටිය, දෘෂ්ටිවනය, දෘෂ්ටිකාන්තාරය, දෘෂ්ටිවිසකටුව, දෘෂ්ටිචපලබව, දෘෂ්ටි රැහැන දුක් සහිත වේ, උවදුරු සහිතවේ. දැඩි වෙහෙස සහිතවේ. දැවිලි සහිතවේ. කලකිරීම පිණිස, නොඇලීම පිණිස, දුක් නිවීම පිණිස, සංසිඳීම පිණිස, යහපත් දැනීම පිණිස, අවබොධය පිණිස නිවන් පිණිස නොපවතියි.

24. "වච්ඡය ලොකය කෙළවර ඇත්තේය යන මේ දෘෂ්ටිය, දෘෂ්ටිවනය, දෘෂ්ටිකාන්තාරය, දෘෂ්ටිවිසකටුව, දෘෂ්ටි චපලබව දෘෂ්ටිරැහැන දුක්සහිතවේ. උවදුරු සහිතවේ. දැඩි වෙහෙස සහිතවේ. දැවිලි සහිතවේ. කලකිරීම පිණිස, නො ඇලීම පිණිස, දුක් නිවීම පිණිස, සංසිඳීම පිණිස, යහපත් දැනීම පිණිස, අවබොධය පිණිස, නිවන් පිණිස නොපවතියි.

25. "වච්ඡය, ලොකය කෙළවර නැත්තේය යන මේ දෘෂ්ටිය, දෘෂ්ටිවනය, දෘෂ්ටිකාන්තාරය, දෘෂ්ටිවිසකටුව, දෘෂ්ටි චපලබව, දෘෂ්ටිරැහැන දුක්සහිතවේ. උවදුරු සහිතවේ. දැඩි වෙහෙස සහිතවේ. දැවිලි සහිතවේ. කලකිරීම පිණිස, නොඇලීම පිණිස, දුක්නිවීම පිණිස, සංසිඳීම පිණිස, යහපත් දැනීම පිණිස, අවබොධය පිණිස නිවන් පිණිස, නොපවතියි.

**26.** "වච්ඡය, එය ජීවයවේ. එය ශරීරයවේය යන මේ දෘෂ්ටිය දෘෂ්ටිවනය, දෘෂ්ටිකාන්තාරය, දෘෂ්ටිවිසකටුව, දෘෂ්ටි චපලබව, දෘෂ්ටිරැහැන දුක්සහිතවේ. උවදුරු සහිතවේ. දැඩි වෙහෙස සහිතවේ. දැවිලි සහිතවේ. කලකිරීම පිණිස, නොඇලීම පිණිස, දුක්නිවීම පිණිස, සංසිඳීම පිණිස, යහපත් දැනීම පිණිස, අවබොධය පිණිස, නිවන් පිණිස නොපවතියි.

**27.** "වච්ඡය, ජීවය අනිකක, ශරීරය අනිකක යන මේ දෘෂ්ටිය, දෘෂ්ටිවනය, දෘෂ්ටිකාන්තාරය, දෘෂ්ටිවිසකටුව, දෘෂ්ටිචපලබව, දෘෂ්ටිරැහැන දුක්සහිතවේ. උවදුරු සහිතවේ. දැඩිවෙහෙස සහිතවේ. දැවිලි සහිතවේ. කලකිරීම පිණිස, නොඇලීම පිණිස, දුක්නිවීම පිණිස, සංසිඳීම පිණිස, යහපත් දැනීම පිණිස, අවබොධය පිණිස, නිවන් පිණිස නොපවතියි.

**28.** "වච්ඡය, සත්ව තෙම මරණින් මත්තෙහි වේය යන මේ දෘෂ්ටිය, දෘෂ්ටිවනය, දෘෂ්ටිකාන්තාරය, දෘෂ්ටිවිසකටුව, දෘෂ්ටිචපලබව, දෘෂ්ටිරැහැන දුක්සහිතවේ. උවදුරු සහිත වේ. දැඩිවෙහෙස සහිතවේ. දැවිලි සහිතවේ. කලකිරීම පිණිස, නොඇලීම පිණිස, දුක්නිවීම පිණිස, සංසිඳීම පිණිස යහපත් දැනීම පිණිස, අවබොධය පිණිස, නිවන් පිණිස නොපවතියි.

**29.** "වච්ඡය, සත්වතෙම මරණින් මත්තෙහි නොවේය යන මේ දෘෂ්ටිය, දෘෂ්ටිවනය, දෘෂ්ටිකාන්තාරය, දෘෂ්ටිවිසකටුව, දෘෂ්ටිචපලබව, දෘෂ්ටිරැහැන දුක්සහිතවේ. උවදුරු සහිතවේ. දැඩිවෙහෙස සහිතවේ. දැවිලි සහිතවේ. කලකිරීම පිණිස, නොඇලීම පිණිස, දුක්නිවීම පිණිස, සංසිඳීම පිණිස, යහපත් දැනීම පිණිස, අවබොධය පිණිස, නිවන් පිණිස නොපවතියි.

**30.** "වච්ඡය, සත්ව තෙම මරණින් මත්තෙහි වන්නේද වෙයි, නොවන්නේද වෙයි යන මේ දෘෂ්ටිය, දෘෂ්ටිවනය, දෘෂ්ටිකාන්තාරය, දෘෂ්ටිවිසකටුව, දෘෂ්ටිචපලබව, දෘෂ්ටි රැහැන දුක්සහිතවේ. උවදුරු සහිතවේ. දැඩි වෙහෙස සහිතවේ. දැවිලි සහිතවේ. කලකිරීම පිණිස, නොඇලීම පිණිස, දුක් නිවීම පිණිස, සංසිඳීම පිණිස, යහපත් දැනීම පිණිස, අවබොධය පිණිස නිවන් පිණිස නොපවතියි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

31. "වච්ඡය, සත්වතෙම මරණින් මත්තෙහි නොමවෙයි. නොවන්නේත් නොවෙයි යන මේ දෘෂ්ටිය දෘෂ්ටිකැලය, දෘෂ්ටිකාන්තාරය, දෘෂටිහුල, දෘෂ්ටිචපලබව, දෘෂ්ටිසංයොජනය, දුක්සහිතවේ. උවදුරු සහිතවේ. වෙහෙස සහිතවේ. දැවිලි සහිතවේ. කලකිරීම පිණිස, නොඇලීම පිණිස, දුක් නැතිකිරීම පිණිස, සංසිඳීම පිණිස, නුවණින් දැනීම පිණිස, අවබොධය පිණිස, නිර්වාණය පිණිස නොපවතියි. වච්ඡය, මම මේ දොෂය දකිමින් මේ දෘෂ්ටිවලට සියලු ආකාරයෙන් නොඑළඹුනේ වෙමියි" කීහ.

32. "භවත් ගෞතමයන් වහන්සේගේ කිසියම් දෘෂ්ටි ගතියක් ඇද්ද?" "වච්ඡය, දෘෂ්ටිගතිය යන මෙය තථාගතයන් විසින් බැහැර කරන ලදී. වච්ඡය, තථාගතයන් විසින් රූපය මේය, රූපයාගේ හෙතුව මේය. රූපයාගේ විනාසය මේය, වෙදනාව මේය, වෙදනාවගේ හෙතුව මේය. වෙදනාවගේ විනාසය මේය. සංඥාව මේය, සංඥාවගේ හෙතුව මේය. සංඥාවගේ විනාසය මේය. සංස්කාරයෝ මොහුය. සංස්කාරයන්ගේ හේතුව මේය. සංස්කාරයන්ගේ විනාසය මේය. විඤ්ඤාණය මේය, විඤ්ඤාණයාගේ හෙතුව මේය. විඤ්ඤාණයාගේ විනාසය මේයයි. දන්නා ලද්දේමය. එහෙයින් තථාගත තෙම සියලු මඤ්ඤිතයන්ගේ (තණ්හාදිට්ඨිමානයන්ගේ) සියලු මථතයන්ගේ (තණ්හාදිට්ඨිමානයන්ගේ) මමයයි ගන්නා දෘෂ්ටිය මගේයයි ගන්නා තෘෂ්ණාව මමයයි හඟින මානය යන අනුශයයන්ගේ නැසීමෙන් දුරුකිරීමෙන් නිරුද්ධ කිරීමෙන්, හැරදැමීමෙන්, උපාදාන රහිතව මිදුනේයි කියමියි" වදාළේය.

33. "භවත් ගෞතමයන් වහන්ස, මෙසේ මිදුනාවූ සිත් ඇති භික්ෂුතෙම වනාහි කොහි උපදීද? "වච්ඡය, උපදී යනු නොයෙදෙයි. "භවත් ගෞතමයන් වහන්ස, එසේවීනම් නූපදීද?"

"වච්ඡය, නූපදී යනුද නොයෙදෙයි (සුදුසු නොවෙයි)"

"භවත් ගෞතමයන් වහන්ස, එසේවීනම් උපදීද, නූපදීද?"

"වච්ඡය, උපදීද, නූපදීද යනුද නොයෙදෙයි."

භවත් ගෞතමයන් වහන්ස, එසේවීනම්, නොමඋපදියි, නූපදින්නේත් නොවේද?"

"වච්ඡය, නොම උපදියි නූපදින්නේත් නොවෙයි යනුද නොයෙදේයයි වදාළේය.

**34.** "භවත් ගෞතමයන් වහන්ස, මෙසේ මිදුනු සිත් ඇති භික්ෂුතෙම වනාහි කොහි උපදීද?' මෙසේ විචාරණ ලද්දේද, "වච්ඡය, උපදියි යනු නොයෙදේ යයි" කීයෙහිය.

"භවත් ගෞතමයන් වහන්ස, එසේවීනම් නූපදීද? මෙසේ විචාරණ ලද්දේද "වච්ඡය, නූපදියි යනු නොයෙදේයයි" කීයෙහිය.

"භවත් ගෞතමයන් වහන්ස, එසේවීනම් උපදීද නූපදීද?" මෙසේ විචාරණ ලද්දේද "වච්ඡය, උපදීද නූපදීද යනු නොයෙදේයයි" කීයෙහිය.

"භවත් ගෞතමයන් වහන්ස, නොම උපදියි, නූපදින්නේත් නොවේද?"

මෙසේ විචාරණ ලද්දේ "වච්ඡය, නොම උපදියි නූපදින්නේත් නොවේය යනු නොයෙදේයයි" කීයෙහිය.

"භවත් ගෞතමයන් වහන්ස, මෙහි මම නොදැනීමට පැමිණියෙමි. මෙහි මුළාවට පැමිණියෙමි. භවත් ගෞතමයන් වහන්සේගේ පළමු කථාවෙන් මා හට යම් ප්‍රසාද මාත්‍රයක් ඇතිවීද, එයද දැන් මට නැතිවිය."

**35.** "වච්ඡය, තාගේ නොදැනීමට සුදුසුය. මුළාවීමට සුදුසුය. වච්ඡය, මේ ධර්මය තෙමේ ගැඹුරුය. දැකීම දුෂ්කරය අවබොධ කිරීම දුෂ්කරය, ශාන්තය, ප්‍රණීතය, තර්කයෙන් බැසගත නොහැක්කේය. සියුම්ය. පණ්ඩිතයන් විසින් දත යුතුය. අන්‍ය දෘෂ්ටිකවූ අනික් දෘෂ්ටියක් පිළිගන්නාවූ අනික් දෘෂ්ටියක් කැමතිවන්නාවූ අනික් දෘෂ්ටියෙක්හි යෙදෙන්නාවූ අනික් දෘෂ්ටියක ගුරුවරුන් ඇත්තාවූ තා විසින් ඒ ධර්මය දැනගැණීම දුෂ්කරය. වච්ඡය, එසේවීනම් මෙහිලා තගෙන්ම අසමි. තොපට

යම්සේ කැමැති වන්නේද එපරිද්දෙන් එය ප්‍රකාශ කරව. වච්ඡය ඒ කුමකැයි හඟින්නෙහිද?"

36. "ඉදින් තොපගේ ඉදිරියෙහි ගින්නක් ඇවිලෙන්නේය. නුඹ 'මාගේ ඉදිරියෙහි මේ ගින්න ඇවිලේ යයි දන්නෙහිද?

"භවත් ගෞතමයන් වහන්ස, ඉදින් මාගේ ඉදිරියෙහි ගින්නක් ඇවිලෙන්නේ නම් මේ ගින්න මා ඉදිරියෙහි ඇවිලේයයි මම දනිමි."

"වච්ඡය, ඉදින් වනාහි තගෙන් 'යම් මේ ගින්නක් තොප ඉදිරියේ ඇවිලේද, මේ ගින්න කුමක් නිසා ඇවිලේද?" මෙසේ අසන්නේ නම් වච්ඡය මෙසේ අසන ලද්දාවූ නුඹ කුමකැයි ප්‍රකාශ කරන්නෙහිද?

"භවත් ගෞතමයන් වහන්ස, 'යම් මේ ගින්නක් තොප ඉදිරියේ ඇවිලේද, මේ ගින්න කුමක් නිසා ඇවිලේදැයි, ඉදින් මගෙන් මෙසේ අසන්නේ නම් භවත් ගෞතමයන් වහන්ස, මෙසේ අසනු ලැබූ මම 'යම් මේ ගින්නක් මා ඉදිරියෙහි ඇවිලේද, මේ ගින්න තෘණ දැව දර නිසා ඇවිලේයයි මෙසේ ප්‍රකාශ කරන්නෙමි.

"වච්ඡය, ඉදින් තොප ඉදිරියෙහි මේ ගින්න නිවෙන්නේ නම් මේ ගින්න මා ඉදිරියෙහි නිවුනේ යයි දන්නෙහිද?"

"භවත් ගෞතමයන් වහන්ස, ඉදින් මා ඉදිරියෙහි ඒ ගින්න නිවුනේ නම්, මේ ගින්න මා ඉදිරියේ නිවුනේ යයි මම දනිමි."

"වච්ඡය, 'යම් මේ ගින්නක් තොප ඉදිරියෙහි නිවුනේද ඒ ගින්න මෙතැනින් නැගෙනහිර දිශාවට හෝ බස්නාහිර දිශාවට හෝ උතුරු දිශාවට හෝ දකුණු දිශාවට හෝ කවර නම් දිසාවකට ගියේදැයි, ඉදින් තගෙන් මෙසේ අසන ලද්දේ නම් වච්ඡය, මෙසේ අසන ලද්දාවූ නුඹ කුමකැයි ප්‍රකාශ කරන්නෙහිද?"

"භවත් ගෞතමයන් වහන්ස, එසේ කීම නොයෙදෙයි. භවත් ගෞතමයන් වසන්ස, ඒ ගින්න තෘණ දර ආදී යමක් නිසා

ඇවිලුනේද, එය කෙළවර වීමෙන්, දැවීමට අන් දෙයක්ද නැති හෙයින් නිවුණේයයි කියයුතු බවට පැමිණේයයි” (කීයේය.)

37. “වච්ඡය, මෙපරිද්දෙන්ම යම් රූපයක් නිසා තථාගතයන් වහන්සේ සත්වයෙකැයි පනවන්නේද, කියන්නේද, ඒ රූපය තථාගතයන් විසින් ප්‍රහීණ කරණ ලද්දේය. මුල් සිඳින ලද්දේය, කරටිය සිඳින ලද තල් ගසක් මෙන් කරණ ලදී. විනාශ කරණ ලදී. මතු නූපදනා බවට පමුණුවන ලදී. වච්ඡය, රූපය කියන ස්වභාවයෙන් මිදුනාවූ තථාගත තෙම මහා සමුද්‍රය මෙන් ගුණයෙන් ගැඹුරුවූයේ ප්‍රමාණ කළ නොහැක්කේ බැස ගැනීමට නොහැකිවූයේ වෙයි. උපදීයයි කීමටද නුසුදුසුය නූපදීයයි කීමටද නුසුදුසුය. උපදීයයිද නූපදීයයිද, කීමටද නුසුදුසුය. නොම උපදියි, නූපදින්නේද නොවේයයි කීමටද නුසුදුසුය.

38. “යම් වෙදනාවක් නිසා තථාගතයන් වහන්සේ සත්වයෙකැයි පනවන්නේද, කියන්නේද, ඒ වෙදනාව තථාගතයන් විසින් පහකරණ ලදී. මුල් සිඳින ලදී කරටිය සිඳින ලද තල් ගසක් මෙන් කරණ ලදී. විනාශ කරණ ලදී. මතු නූපදනා බවට පමුණුවන ලදී. වච්ඡය, වේදනාවයයි කියන ස්වභාවයෙන් මිදුනාවූ තථාගත තෙමේ මහා සමුද්‍රය මෙන් ගුණයෙන් ගැඹුරුවූයේ, ප්‍රමාණ කළ නොහැක්කේ, බැසගැණීමට දුෂ්කරවූයේ වෙයි. උපදීයයි කීමටද නුසුදුසුය. නූපදීයයි කීමටද නුසුදුසුය. උපදීයයිද නූපදීයයිද කීමටද නුසුදුසුය. නොම උපදියි, නූපදින්නේ නොවේ යයිද කීමටද නුසුදුසුය.

39. “යම් සංඥාවක් නිසා තථාගතයන් වහන්සේ සත්වයෙකැයි පනවන්නේද, කියන්නේද ඒ සංඥාව තථාගතයන් විසින් ප්‍රහීණ කරණ ලදී. මුල් සිඳින ලදී, කරටිය සුන් කළ තල් ගසක් මෙන් කරණලදී. විනාශ කරණ ලදී. මතු නූපදනා බවට පමුණුවන ලදී. වච්ඡය, සංඥාවයයි කියන ස්වභාවයෙන් මිදුනාවූ තථාගත තෙමේ මහා සමුද්‍රය මෙන් ගුණයෙන් ගැඹුරුය. ප්‍රමාණ කළ නොහැක්කේය. බැසගැණීමට දුෂ්කරය. උපදීයයි කීමටද නුසුදුසුය. නූපදීයයි කීමටද නුසුදුසුය. උපදීයයිද නූපදීයයිද

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කීමටද නුසුදුසුය. නොම උපදියි, නූපදින්නේ නොවේයයිද කීමටද නුසුදුසුය.

40. "යම් සංස්කාරයක් නිසා තථාගතයන් වහන්සේ සත්වයෙකැයි පනවනු ලබන්නේද, කියනු ලබන්නේද, ඒ සංස්කාරයෝ තථාගතයන් විසින් පහකරණ ලදහ. සිඳින ලදහ. කරටිය සුන් කළ තල් ගසක් මෙන් කරණ ලද්දාහ. විනාශ කරණ ලද්දාහ. මතු නූපදනා බවට පමුණුවනලදහ. වච්ඡය, සංස්කාරයයි කියන ස්වභාවයෙන් මිදුනාවූ තථාගත තෙමේ මහමුහුද මෙන් ගුණයෙන් ගැඹුරුය, ප්‍රමාණ කළ නොහැක්කේය. බැස ගැණීමට දුෂ්කරය. උපදීයයි කීමටද නුසුදුසුය. නූපදීයයි, කීමටද නුසුදුසුය. උපදීයයිද නූපදීයයිද කීමට නුසුදුසුය නොම උපදියි නූපදින්නේ නොවේය කීමටද නුසුදුසුය.

41. "යම්විඤ්ඤාණයක් නිසා තථාගතයන් වහන්සේ සත්වයකැයි පනවනු ලබන්නේද, කියනු ලබන්නේද ඒ විඤ්ඤාණය තථාගතයන් විසින් පහකරනලදී. මුල් සිඳින ලදී. කරටිය සුන්කළ තල් ගසක් මෙන්කරණ ලදී. විනාශ කරණ ලදී. මතු නූපදනා බවට පමුණුවනලදී. වච්ඡය, විඤ්ඤාණ යයි කියන ස්වභායෙන් මිදුනාවූ තථාගත තෙමේ මහ මුහුද මෙන් ගුණයෙන් ගැඹුරුය. ප්‍රමාණ කළ නොහැක්කේය. බැස ගැණීමට දුෂ්කරය. උපදීයයි කීමටද නුසුදුසුය. නූපදීයයි කීමටද නුසුදුසුය, උපදීයයිද නූපදීයයිද කීමටද නුසුදුසුය නොම උපදියි නූපදින්නේ නොවේයයි කීමටද නුසුදුසුයි." (වදාළේය.)

42. මෙසේ වදාළ කල්හි වච්ඡගොත්ත නම් පරිව්‍රාජක තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය සැළ කෙළේය. "භවත් ගෞතමයන් වහන්ස, යම්සේ ගමකට හෝ නියම් ගමකට හෝ නුදුරු තන්හි මහසල් රුකක් වේද, එය අනිත්‍ය බැවින් අතු පතර බිඳෙන්නේය. සිවිය හා පතුරු බිඳෙන්නාහුය. එලය බිඳෙන්නේය. ඒ ගස පසු කලෙක්හි පහව ගිය අතු පතර ඇත්තේ, ගැලවුන සිවිය හා පතුරු ඇත්තේ, සැලුනු එලය ඇත්තේ පිරිසිදුවූ සාරයෙහි පිහිටන්නේය. මෙපරිද්දෙන්ම භවත් ගෞතමයන් වහන්සේගේ මේ ධර්මය පහව ගිය අතු පතර ඇති පහවූ සිවිය

හා පතුරු ඇති පහවූ ඵලය ඇති පිරිසිදුවූ සාරයෙහි පිහිටියේ වෙයි.

"භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත. භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත, භවත් ගෞතමයන් වහන්ස, යම්සේ යටිකුරු කොට තබන ලද්දක් හෝ උඩුකුරු කරන්නේද, වසා තබන ලද්දක් හෝ වැසුම් හරින්නේද මං මුළාවූවෙකුට හෝ මග කියන්නේද, අන්ධකාරයෙහි හෝ ඇස් ඇත්තෝ රූප දකිත්වායි තෙල් පහනක් දරන්නේද, මෙපරිද්දෙන්ම භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් ප්‍රකාරයෙන් ධර්මය දෙශනා කරණ ලදී. මේ මම භවත් ගෞතමයන් වහන්සේ සරණ කොට යමි. ධර්මයද භික්ෂු සංඝයාද (සරණකොට යමි) භවත් ගෞතම තෙමේ මා අද පටන් දිවිහිම්කොට සරණ ගියාවූ උපාසකයෙකැයි, දරණසේක්වා"යි (කීය)

**දෙවෙනිවූ අග්ගි වච්ඡගොත්ත සූත්‍රයයි.**

---

## 23. මහා වච්ඡගොත්ත සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දකනිවාප නම්වූ වේළුවනාරාමයෙහි වාසය කළහ. එකල්හි වච්ඡගොත්ත නම් පරිව්‍රාජකතෙම, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූයේය. සතුටු විය යුතුවූ සිහිකටයුතුවූ කථාව කොට නිමවා එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූම, වච්ඡගොත්ත නම් පරිව්‍රාජක තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීවේය.

**2.** "මම භවත් ගෞතමයන් වහන්සේ හා බොහෝ කලක් කළ කථා ඇත්තේ වෙමි. භවත් ගෞතම තෙමේ මට කොටින් කුසල් හා අකුසල් දෙශනා කරත්වා."

"වච්ඡය, මම තොපට කොටින්ද කුසල් අකුසල් දෙශනා කරන්නෙමි. වච්ඡය, මම තොපට විස්තර වශයෙන්ද කුසල්

අකුසල් දෙශනා කරන්නෙමි. වච්ඡය, එතකුදු වුවත් මම තොපට කොටින් කුසල් අකුසල් දෙශනා කරන්නෙමි. එය අසව. යහපත් කොට මෙනෙහි කරව, කියන්නෙමියි" වදාළේය.

"එසේය පින්වතුන් වහන්සැ"යි වච්ඡගොත්ත නම් පරිව්‍රාජක තෙම, භාග්‍යවතුන් වහන්සේට උත්තර දුන්නේය. භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.

3. "වච්ඡය, ලොභය වනාහි අකුසල්ය, අලොභය කුසල්ය, වච්ඡය, ද්වේෂය වනාහි අකුසල්ය, අද්වේෂය කුසල්ය වච්ඡය, මොහය වනාහි අකුසල්ය, අමොහය කුසල්ය. වච්ඡය මෙසේ මේ ධර්ම තුන අකුසල් වෙත්. මේ ධර්ම තුන කුසල් වෙත්.

4. "වච්ඡය, සතුන් මැරීම අකුසල්ය, සතුන් මැරීමෙන් වැලකීම කුසල්ය. වච්ඡය සොරකම් කිරීම අකුසල්ය, සොරකම් කිරීමෙන් වැළකීම කුසල්ය. වච්ඡය, කාමයන්හි වරදවා හැසිරීම අකුසල්ය, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකීම කුසල්ය. වච්ඡය; බොරුකීම අකුසල්ය; බොරු කීමෙන් වැළකීම කුසල්ය. වච්ඡය, කේලාම් කීම අකුසල්ය; කේලාම් කීමෙන් වැළකීම කුසල්ය. වච්ඡය, ඵරුෂ වචන කීම අකුසල්ය, ඵරුෂ වචන කීමෙන් වැළකීම කුසල්ය. වච්ඡය, හිස්බස් කීම අකුසල්ය, හිස්බස් කීමෙන් වැළකීම කුසල්ය. වච්ඡය, දැඩි ලොභය අකුසල්ය; දැඩි ලොභය නැතිවීම කුසල්ය. වච්ඡය, අනුන් නැසෙත්වායි සිතීම අකුසල්ය, අනුන් නැසෙත්වායි නොසිතීම කුසල්ය. වච්ඡය, මිථ්‍යා දෘෂ්ටිය අකුසල්ය, සම්‍යක් දෘෂ්ටිය කුසල්ය. වච්ඡය, මෙසේ වනාහි මේ ධර්ම දසය අකුසල් වෙත්. මේ ධර්ම දසය කුසල් වෙත්.

5. "වච්ඡය, යම්හෙයකින් වනාහි භික්ෂූහුගේ තෘෂ්ණාව ප්‍රහීණවූවා සිඳිනලද මුල් ඇත්තී මුදුන සුන්කළ තල්ගස මෙන් කරණ ලද්දී, විනාශ කරණ ලද්දී මත්තෙහි නූපදනා ස්වභාව ඇත්තී වේද, ක්ෂයවූ ආශ්‍රව ඇති, වැස නිමවන ලද බ්‍රහ්මචර්යාව ඇති, කරණ ලද කටයුතු ඇති, බහා තබනලද ස්කන්ධභාරය ඇති, පිළිවෙළින් පැමිණියාවූ අර්හත්වය ඇති, නැතිකළාවූ

භවසංයොජනය ඇති, මනාකොට නුවණින් දැන කෙලෙසුන් කෙරෙන් මිදුනාවූ, ඒ භික්ෂුතෙම රහත්වූයේ වෙයි.”

6. “භවත් ගෞතමයන් හැර භවත් ගෞතමයන් වහන්සේගේ ශ්‍රාවකවූ එක භික්ෂුවකුත් ආශ්‍රවයන් ක්ෂය කිරීමෙන් ආශ්‍රව රහිතවූ අර්හත්ඵල සමාධිය හා ප්‍රඥාව මේ ආත්මයෙහිම තෙමේ දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කෙරේද?”

“වච්ඡය මාගේ ශ්‍රාවකවූ යම් භික්ෂූහු ආශ්‍රවයන් නැසීමෙන් ආශ්‍රව රහිත අර්හත්ඵල සමාධියට හා ප්‍රඥාවට මේ ආත්මයෙහිම තෙමේ මනානුවණින් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කෙරෙත්ද, ඔව්හු එක්සියයක්ද නොවෙයි. දෙසියයක්ද නොවෙයි. තුන්සියයක්ද නොවෙයි. හාරසියයක්ද නොවෙයි. පන්සියයක්ද නොවෙයි. බොහෝ වූවාහුම වෙත්.”

7. “භවත් ගෞතමයන්ද හැර, භික්ෂූන්ද හැර, භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවිකාවූ එකභික්ෂුණියකුත් ආශ්‍රවයන් ක්ෂයකිරීමෙන් අනාශ්‍රවවූ අර්හත්ඵල සමාධියට හා ප්‍රඥාවට මේ ආත්මයෙහිම තෙමේ මනානුවණින් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කෙරේද?”

“වච්ඡය, මාගේ ශ්‍රාවිකාවූ යම් භික්ෂුණීහු ආශ්‍රවයන් නැසීමෙන් අනාශ්‍රවවූ අර්හත්ඵල සමාධියට හා ප්‍රඥාවට මේ ආත්මයෙහිම තෙමේ මනානුවණින් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කෙරෙත්ද, ඔව්හු එක්සියයක්ම නොවෙයි. දෙසියයක් නොවෙයි. තුන්සියයක් නොවෙයි. හාරසියයක් නොවෙයි. පන්සියයක් නොවෙයි. බොහෝ වූවාහුම වෙත්.”

8. “භවත් ගෞතමයන්ද හැර, භික්ෂූන්ද හැර, භික්ෂුණීන්ද හැර ගෘහස්ථවූ සුදු වස්ත්‍ර හඳනාවූ බ්‍රහ්මචාරීවූ ඔරම්භාගිය සංයොජන පස නැතිකිරීමෙන් ඔපපාතික ඉපදීම ඇත්තාවූ එහිදී පිරිනිවීම ඇත්තාවූ ඒ ලොකයෙන් පෙරලා නොඑන ස්වභාව ඇත්තාවූ භවත් ගෞතමයන් වහන්සේගේ ශ්‍රාවකවූ එක උපාසකයෙකුත් ඇත්තේද?”

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වච්ඡය, ශ්‍රාවකවූ ගෘහස්ථවූ සුදුවත් හඳනාවූ බඹසර ඇත්තාවූ ඔරම්භාගිය සංයොජන පස නැසීමෙන් ඔපපාතිකවූ එහි පිරිනිවීම ඇත්තාවූ ඒ ලොකයෙන් පෙරලා නොඑන ස්වභාව ඇත්තාවූ යම් උපාසකයෝ වෙත්ද, ඔව්හු එක් සියයක්ම නොවෙයි. දෙසියයක් නොවේ. තුන්සියයක් නොවේ. හාරසියයක් නොවේ. පන්සියයක් නොවේ. බොහෝ වූවාහුම වෙත්.”

**9.** “භවත් ගෞතමයන් හැර භික්ෂූන්ද හැර භික්ෂුණීන්ද හැර ගෘහස්ථවූ සුදුපිළි සඳනාවූ බ්‍රහ්මචාරීවූ උපාසකයන්ද හැර භවත් ගෞතමයන් වහන්සේගේ ගිහිවූ සුදු වස්ත්‍ර සඳනාවූ කම්සැප අනුභවකරන්නාවූ අනුශාසනාව කරන්නාවූ අවවාදයට අනුව පිළිපදින්නාවූ, විචිකිච්ඡාව දුරුකළාවූ පහවූ සැකය ඇති, විසාරද බවට පැමිණියාවූ ශාස්තෘශාසනයෙහි අන්‍ය ශාස්තෘවරයන්ගේ පිහිට නොසොයන එක උපාසකයෙකුත් ඇත්ද?”

“වච්ඡය, මාගේ ශ්‍රාවකවූ ගිහිවූ සුදුපිළි සඳනාවූ කම්සැප අනුභව කරන්නාවූ අනුශාසනාව කරන්නාවූ අවවාදය පිළිපදින්නාවූ නැති කළ විචිකිච්ඡාව ඇත්තාවූ පහකළ සැකය ඇත්තාවූ විසාරද බවට පැමිණියාවූ ශාස්තෘශාසනයෙහි අන් පිහිට නොසොයන්නාවූ යම් ඒ උපාසකයෝ වාසය කෙරෙත්ද, ඔව්හු එක්සියයක්ම නොවෙයි. දෙසියයක් නොවෙයි. තුන්සියයක් නොවෙයි. සාරසියයක් නොවෙයි. පන්සියයක් නොවෙයි. බොහෝ වූවාහුමැයි.”

**10.** “භවත් ගෞතමයන්ද හැර භික්ෂූන්ද හැර, භික්ෂුණීන්ද හැර, සුදු වස්ත්‍ර හඳනාවූ බ්‍රහ්මචාරීවූ ගිහි උපාසකවරුන්ද හැර, සුදුවත් හඳනාවූ කම් සැප අනුභව කරන්නාවූ, ගිහි උපාසක වරුන්ද හැර, භවත් ගෞතමයන් වහන්සේගේ ශ්‍රාවිකාවූ සුදුවත් හඳනාවූ බ්‍රහ්මචාරිනිවූ, ඔරම්භාගිය සංයොජන පස නැසීමෙන් ඔපපාතිකවූ එහි පිරිනිවන්පාන සුළුවූ ඒ ලෝකයෙන් පෙරලා නොඑන ස්වභාව ඇති උපාසිකාවකුත් ඇත්තේද?”

“වච්ඡය, මාගේ ශ්‍රාවිකාවූ ගෘහස්ථ සුදු පිළි හඳනාවූ බ්‍රහ්මචාරිනීවූ ඔරම්භාගිය සංයොජන පස නැසීමෙන්

ඔපපාතිකවූ එහි පිරිනිවෙන සුළුවූ ඒ ලෝකයෙන් පෙරලා නොඑන ස්වභාව ඇත්තාවූ යම් උපාසිකා කෙනෙක් වෙත්ද, ඒ උපාසිකාවරු එක්සියයක්ම නොවෙයි. දෙසියයක් නොවෙයි. තුන්සියයක් නොවෙයි. සාරසියයක් නොවෙයි. පන්සියයක් නොවෙයි. බොහෝ වෙත්.”

11. “භවත් ගෞතමයන්ද හැර, භික්ෂූන්ද හැර, භික්ෂුණීන්ද හැර, සුදුවත් සඳහා බඹසර රක්නාවූ ගිහි උපාසකවරුන්ද හැර, සුදුවත් හඳනාවූ කම් සැප අනුභව කරන්නාවූ ගිහි උපාසකවරුන්ද හැර, සුදුවත් හඳනාවූ බ්‍රහ්මචාරීවූ ගිහි උපාසිකාවන්ද හැර, භවත් ගෞතමයන් වහන්සේගේ ගිහිශ්‍රාවිකාවූ සුදුවත් හඳනාවූ කම්සැප අනුභව කරන්නාවූ, අනුශාසනාව කරන්නාවූ අවවාදය පිළිපදින්නාවූ දුරුකළ විචිකිච්ඡා ඇත්තාවූ විසාරද බවට පැමිණියාවූ ශාස්තෘ ශාසනයෙහි අන් පිහිටක් නොසොයන එක උපාසිකාවකුත් ඇත්තේද?”

වච්ඡය, මාගේ ගිහි ශ්‍රාවිකවූ සුදු පිළි හඳනාවූ කම්සැප අනුභව කරන්නාවූ අනුශාසනය කරන්නාවූ අවවාදය පිළිපදින්නාවූ දුරුකළ විචිකිච්ඡා ඇත්තාවූ, පහවූ සැකය ඇත්තාවූ විශාරද බවට පැමිණියාවූ ශාස්තෘ ශාසනයෙහි අන් පිහිටක් නොසොයන යම් උපාසිකාවෝ වෙත්ද එබඳු උපාසිකාවරු එක් සියයක්ම නොවෙයි. දෙසියයක් නොවෙයි. තුන්සියයක් නොවෙයි. හාරසියයක් නොවෙයි. පන්සියක් නොවෙයි. බොහෝ වෙත්.”

12. “භවත් ගෞතමයන් වහන්ස, භවත් ගෞතමයන් වන්සේම මේ ධර්මය සම්පූර්ණ කෙළේ නම් භික්ෂූහු සම්පූර්ණ නොකළාහු නම් ඒ කාරණයෙන් මෙසේ මේ ශාසනය සම්පූර්ණ නොවන්නේය.”

“භවත් ගෞතමයන් වහන්ස, යම් හෙයකින් මේ ධර්මය භවත් ගෞතමයන් වහන්සේ සම්පූර්ණ කළෝය. භික්ෂූහුද සම්පූර්ණ කළහ. ඒ හෙතුවෙන් මෙසේ මේ ශාසනය සම්පූර්ණ වූයේය.”

"භවත් ගෞතමයන් වහන්ස, ඉදින් මේ ධර්මය භවත් ගෞතම තෙමේත් සම්පූර්ණ කෙළේද, භික්ෂූහුත් සම්පූර්ණ කළාහුද, භික්ෂුණීහු සම්පූර්ණ නොකළාහු නම් ඒ කාරණයෙන් මෙසේ මේ ශාසනය සම්පූර්ණ නොවන්නේය.

"භවත් ගෞතමයන් වහන්ස, යම් හෙයකින් මේ ධර්මය භවත් ගෞතම තෙමේත් සම්පූර්ණ කෙළේය. භික්ෂූහුත් සම්පූර්ණ කළාහුය. භික්ෂුණීත් සම්පූර්ණ කළාහුය. ඒ කාරණයෙන් මෙසේ මේ ශාසනය සම්පූර්ණ විය."

"භවත් ගෞතමයන් වහන්ස ඉදින් මේ ධර්මය භවත් ගෞතම තෙමේත් සම්පූර්ණ කෙළේද, භික්ෂූහුත් සම්පූර්ණ කළාහුද, භික්ෂුණීහුත් සම්පූර්ණ කළාහුද ගෘහස්ථ සුදු වස්ත්‍ර හඳනාවූ බ්‍රහ්මචාරිවූ උපාසකවරු සම්පූර්ණ නොකළාහු නම් ඒ කාරණයෙන් මෙසේ මේ ශාසනය අසම්පූර්ණ වන්නේය.

13. "භවත් ගෞතමයන් වහන්ස, යම් හෙයකිනුත් මේ ධර්මය භවත් ගෞතම තෙමේත් සම්පූර්ණ කෙළේය. භික්ෂූහුත් සම්පූර්ණ කළාහුය. භික්ෂුණීහුත් සම්පූර්ණ කළාහුය. සුදු පිළිහඳනා බ්‍රහ්මචාරීවූ ගිහි උපාසක වරුත් සම්පූර්ණ කළාහුය. ඒ කාරණයෙන් මෙසේ මේ ශාසනය සම්පූර්ණ විය."

"භවත් ගෞතමයන් වහන්ස, ඉදින් මේ ධර්මය භවත් ගෞතම තෙමේත් සම්පූර්ණ කෙළේද, භික්ෂූහුත් සම්පූර්ණ කළාහුද, භික්ෂුණීහුත් සම්පූර්ණ කළාහුද, සුදුවත් හඳනාවූ බ්‍රහ්මචාරීවූ ගිහි උපාසකවරුත් සම්පූර්ණ කළාහුද, සුදුවත් හඳනාවූ කම් සැප අනුභව කරන්නාවූ ගිහි උපාසකවරු සම්පූර්ණ නොකළාහු නම්, මෙසේ ඒ කාරණයෙන් මේ ශාසනය සම්පූර්ණ නොවන්නේය.

14. "භවත් ගෞතමයන් වහන්ස, යම් හෙයකින් මේ ධර්මය භවත් ගෞතම තෙමේත් සම්පූර්ණ කෙළේය. භික්ෂූහුත් සම්පූර්ණ කළාහුය, භික්ෂුණීහුත් සම්පූර්ණ කළාහුය. සුදුවත් හඳනා බ්‍රහ්මචාරී ගිහි උපාසකවරුත් සම්පූර්ණ කළාහුය, සුදුවත් හඳනා

කම් සැප අනුභව කරන්නා වූ ගිහි උපාසකවරුත් සම්පූර්ණ කළාහුය' ඒ කාරණයෙන් මෙසේ මේ ශාසනය සම්පූර්ණ විය.

15. "භවත් ගෞතමයන් වහන්ස, ඉදින් වනාහි මේ ධර්මය භවත් ගෞතම තෙමෙත් සම්පූර්ණ කෙළේද, භික්ෂූහුත් සම්පූර්ණ කළාහුද, භික්ෂුණීහුත් සම්පූර්ණ කළාහුද, සුදුවත් හඳනා බ්‍රහ්මචාරීවූ ගිහි උපාසකවරුත් සම්පූර්ණ කළාහුද, සුදුවත් හඳනා කම්සැප අනුභව කරන්නාවූ ගිහි උපාසකවරුත් සම්පූර්ණ කළාහුද, සුදුවත් හඳනා බ්‍රහ්මචාරිනීවූ ගිහි උපාසිකාවරු සම්පූර්ණ නොකළාහු නම්, ඒ කාරණයෙන් මෙසේ මේ ශාසනය අසම්පූර්ණ වන්නේය. භවත් ගෞතම තෙමේත් සම්පූර්ණ කෙළේය. භික්ෂූහුත් සම්පූර්ණ කළාහුය. භික්ෂුණීහුත් සම්පූර්ණ කළාහුය. සුදු පිළි හඳනා බඹසර රක්නා ගිහි උපාසකවරුත් සම්පූර්ණ කළාහුය. සුදුපිළි හඳනා කම්සැප විඳින්නාවූ ගිහි උපාසකවරුත් සම්පූර්ණ කළාහුය. සුදුපිළි හඳනා බඹසර රක්නා ගිහි උපාසිකාවරුත් සම්පූර්ණ කළාහුය. ඒ කාරණයෙන් මෙසේ මේ ශාසනය සම්පූර්ණ විය. භවත් ගෞතමයන් වහන්ස, ඉදින් වනාහි මේ ධර්මය භවත් ගෞතම තෙමේත් සම්පූර්ණ කෙළේද, භික්ෂූහූත් සම්පූර්ණ කළාහුද, භික්ෂුණීහුත් සම්පූර්ණ කළාහුද, සුදුපිළි හඳනාවූ බ්‍රහ්මචාරීවූ ගිහි උපාසකවරුත් සම්පූර්ණ කළාහුද, සුදුපිළි හඳනාවූ බ්‍රහ්මචාරිනීවූ ගිහි උපාසිකාවෝත් සම්පූර්ණ කළාහුද, සුදුපිළි හඳනා කම්සැප විඳින්නාවූ ගිහි උපාසිකාවෝ සම්පූර්ණ නොකළාහු නම් ඒ කාරණයෙන් මෙසේ මේ ශාසනය අසම්පූර්ණ වන්නේය. භවත් ගෞතමයන් වහන්ස, යම් හෙයකින් මේ ධර්මය භවත් ගෞතම තෙමේත් සම්පූර්ණ කෙළේය. භික්ෂූහුත් සම්පූර්ණ කළාහුය. භික්ෂුණීහුත් සම්පූර්ණ කළාහුය. සුදුවත් හඳනා බ්‍රහ්මචාරීවූ ගිහි උපාසකවරුත් සම්පූර්ණ කළාහුය. සුදුවත් හඳනා කම්සැප විඳින්නාවූ බ්‍රහ්මචාරිනීවූ ගිහි උපාසිකාවෝත් සම්පූර්ණ කළාහුය. සුදුවත් හඳනා කම්සැප විඳින්නාවූ ගිහි උපාසිකාවෝත් සම්පූර්ණ කළාහුය. ඒ කාරණයෙන් මෙසේ මේ ශාසනය සම්පූර්ණ විය.

16. "භවත් ගෞතමයන් වහන්ස, යම්සේ ගංගානම් නදිය සමුද්‍රය වෙත නැමී සමුද්‍රයට හැරී, සමුද්‍රයට බරවී, සමුද්‍රයට වැද

සිටීද, එපරිද්දෙන්ම භවත් ගෞතමයන් වහන්සේගේ ගිහි පැවිද්දන් සහිතවූ මේ පිරිස නිවණට හැරී, නිවණට බරවී නිවණට වැද සිටී. භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත. භවත් ගෞතමයන් වහන්ස ඉතා යහපත භවත් ගෞතමයන් වහන්ස, යම්සේ යටිකුරු කොට තබන ලද්දක් උඩුකුරු කරන්නේ හෝ වේද, වසා තබන ලද්දක් වැසුම් හරින්නේ හෝ වේද, මංමුලාවූවෙකුට මඟ කියන්නේ හෝ වේද, අන්ධකාරයෙහි හෝ ඇස් ඇත්තෝ රූප දකිත්වායි තෙල් පහනක් දරන්නේ ද, එපරිද්දෙන්ම භවත් ගෞතමයාණන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය ප්‍රකාශ කරනලදී. ඒ මම භවත් ගෞතමයන් වහන්සේ සරණකොට යමි. ධර්මයද භික්ෂු සංඝයාද සරණ කොට යමි. මම භවත් ගෞතමයන් වහන්සේගේ සමීපයෙහි මහණකම ලබන්නෙමි. උපසම්පදාව ලබන්නෙමි" (කීයේය.)

17. "වච්ඡය, පෙර අන්‍යතීර්ථකවූ යමෙක් මේ ශාසනයෙහි මහණකම් කැමැති වේද, උපසම්පදාව කැමැති වේද, හෙතෙම සාරමසක් පිරිවෙස් (පුරුදුවෙමින්) වසයි. සාරමසක්හුගේ ඇවෑමෙන් සතුටු සිත් ඇත්තාවූ භික්ෂූහු, භික්ෂුභාවය පිණිස මහණ කරවත්, උපසම්පදා කරවත්. එතකුදු වූවත් මෙහි මා විසින් පුද්ගලයන්ගේ වෙනස් බව දැනගන්නා ලදැයි" කීය.

18. "ස්වාමීනි, ඉදින් පෙර අන්‍යතීර්ථක වූවෝ මේ ශාසනයෙහි මහණකම කැමැතිවන්නාහු, උපසම්පදාව කැමැතිවන්නාහු සාරමසක් පිරිවෙස් වසත්ද, සාරමසක්හුගේ ඇවෑමෙන් සතුටුසිත් ඇත්තාවූ භික්ෂූහු භික්ෂුභාවය පිණිස පැවිදි කරවත් නම්, උපසම්පදා කරවත් නම්, මම සතර අවුරුද්දක් පිරිවෙස් වසන්නෙමි. සතර අවුරුද්දක්හුගේ ඇවෑමෙන් සතුටුසිත් ඇත්තාහු භික්ෂූහු මා භික්ෂුභාවය පිණිස පැවිදි කෙරෙත්වා, උපසම්පදා කෙරෙත්වායි" කීය.

වච්ඡගොත්ත පරිව්‍රාජක තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි පැවිදිවීම ලැබූයේය. උපසම්පදාව ලැබූයේය.

19. උපසපන්ව නොබෝ කල් ඇති ආයුෂ්මත් වච්ඡගොත්ත ස්ථවිර තෙමේ වනාහි උපසම්පදාවූ අඩමස් ඇත්තේ භාග්‍යවතුන්

වහන්සේ යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ ආයුෂ්මත් වච්ඡගොත්ත ස්ථවිර තෙමේ, භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේය. "ස්වාමීනි, ශෛක්ෂවූ (සෝවාන් සකෘදාගාමි අනාගාමි) ඥානයෙන්, ශෛක්ෂවූ විද්‍යාවෙන් යම් තැනකට පැමිණිය යුතුද, මා විසින් එයට පැමිණෙන ලදී. භාග්‍යවතුන් වහන්සේ මතුධර්මයන් උදෙසා මට ධර්මය දෙශනා කරණ සේක්වා."

**20.** "වච්ඡය, එසේවීනම්, නුඹ සමථයත්, විදර්ශනාවත් යන දෙක වැඩියත් වඩව. වච්ඡය, තොප විසින් වැඩියත් වඩන ලද්දාවූ සමථයද, විදර්ශනාවද යන ධර්ම දෙක නොයෙක් ඥාන විශෙෂයන් අවබොධ කිරීම පිණිස පවත්නාහුය. වච්ඡය, ඒ නුඹ යම්විටෙක 'අනෙකප්‍රකාරවූ ඍද්ධිවිධිය අනුභව කරන්නෙමි'යි, කැමති වන්නෙහිද, එකෙක්ව බොහෝ දෙනෙකුවන්නෙමි, බොහෝ දෙනෙක්ව එකෙක් වන්නෙමි. ප්‍රකාශ බවට මුවහ වීමට බිත්තියෙන් පිටතට ප්‍රාකාරයෙන් පිටතට අහසෙහි මෙන් නොගැටෙමින් යන්නෙමි. පොලොවෙහිද දියෙහිමෙන් මතුවීම ගැලීම කරන්නෙමි, දියෙහිද පොලොවෙහිමෙන් නොබිඳිමින් යන්නෙමි. අහසෙහිද පියාපත් ඇති ලිහිණියෙකු මෙන් පර්යංකයෙන් හිඳ ගමන් කරන්නෙමි. මෙසේ මහත් ඍද්ධි ඇත්තාවූ මෙසේ මහත් ආනුභාව ඇත්තාවූ මේ සඳ හිරු දෙදෙනද අතින් අල්වන්නෙමි. පිරිමදින්නෙමි. බඹලොව දක්වාද කයින් වසඟයෙහි පවත් වන්නෙමි'යි කැමති වන්නෙහි නම් ඒ ඒ තන්හිම කරුණු ඇති ඇති කල්හි හැකි බවට පැමිණෙන්නෙහිය.

**21.** "වච්ඡය, ඒ නුඹ යම් විටක 'පිරිසිදුවූ මිනිස්බව ඉක්ම පවත්නාවූ දිව්‍ය ශ්‍රොත්‍රයෙන් දිව්‍යවූද, මනුෂ්‍යවූද දුරවූද ලඟ වූද, යම් ශබ්දයෝ වෙත්ද, ඒ දෙවදෑරුම් ශබ්දයන් අසන්නෙමි'යි, කැමති වන්නෙහිද, ඒ ඒ තන්හිම කරුණ ඇති ඇති කල්හි පැමිණෙන්නෙහිය.

22. "වච්ඡය, ඒ නුඹ යම්තාක්ම 'අන්සතුන්ගේ අන්‍ය පුද්ගලයන්ගේ සිත තමන්ගේ සිතින් පිරිසිඳ දැනගන්නෙමි, රාග සහිතවූ හෝ සිත රාග සහිත සිතයයි දැනගන්නෙමි පහවූ රාගය ඇති සිත හෝ පහවූ රාගය ඇති සිතයයි දැනගන්නෙමි. ද්වේෂ සහිතවූ සිත හෝ ද්වේෂ සහිත සිතයයි දැනගන්නෙමි. පහවූ ද්වේෂය ඇති සිත හෝ පහවූ ද්වේෂය ඇති සිතයයි දැනගන්නෙමි. මොහ සහිතවූ සිත හෝ මොහ සහිත සිත යයි දැනගන්නෙමි. පහවූ මොහය ඇති සිත හෝ පහවූ මොහය ඇති සිතයයි දැනගන්නෙමි. හැකුළුනාවූ සිත හෝ හැකුළුනාවූ සිතයයි දැනගන්නෙමි. විසුරුනාවූ සිත හෝ විසුරුනාවූ සිතයයි දැනගන්නෙමි. මහද්ගතවූ (මහත් බවට පැමිණි) සිත හෝ මහද්ගතවූ සිතයයි දැනගන්නෙමි. මහද්ගතනොවූ සිත හෝ මහද්ගත නොවූ සිතයයි දැනගන්නෙමි. උත්තර සහිතවූ සිත හෝ උත්තර සහිතවූ සිතයයි දැනගන්නෙමි. නිරුත්තරවූ සිත හෝ නිරුත්තරවූ සිතයයි දැනගන්නෙමි. එකඟවූ සිත හෝ එකඟවූ සිතයයි දැනගන්නෙමි. එකඟ නොවූ සිත හෝ එකඟ නොවූ සිතයයි දැනගන්නෙමි. මිදුනාවූ සිත හෝ මිදුනාවූ සිතයයි දැන ගන්නෙමි. නොමිදුනාවූ සිත හෝ නොමිදුනාවූ සිතයයි දැන ගන්නෙමි'යි කැමති වන්නෙහිද ඒ ඒතන්හිම කරුණු ඇති ඇති කල්හි හැකි බවට පැමිණෙන්නෙහිය.

23. "වච්ඡය, ඒ නුඹ යම් විටෙක 'අනෙකප්‍රකාරවූ පෙරවිසූ භව පිළිවෙල සිහි කරන්නෙමි'යි කැමති වන්නෙහිද, එනම්, 'එක ජාතියක්ද, ජාති දෙකක්ද ජාති තුනක්ද ජාති සතරක්ද ජාති පසක්ද ජාති දසයක්ද ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති හතලිහක්ද ජාති පණසක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද ජාති ලක්ෂයක්ද, නොයෙක් සංවර්තකල්පයන්ද, නොයෙක් විවර්ත කල්පයන්ද, නොයෙක් සංවර්ත විවර්ත කල්පයන්ද අසවල් තන්හි මෙබඳු නම් ඇත්තෙක් මෙබඳු ගොත්‍ර ඇත්තෙක් මෙබඳු වර්ණ ඇත්තෙක් මෙබඳු ආහාර ඇත්තෙක් මෙබඳු සුවදුක් විඳින්නෙක් මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තෙක් වීමි. ඒ මම එයින් චුතවූයේ අසවල් තන්හි ඉපදුනෙමි. එහිදු මෙබඳු නම් ඇත්තෙක්

මෙබඳු ගොත්‍ර ඇත්තෙක් මෙබඳු වර්ණ ඇත්තෙක් මෙබඳු ආහාර ඇත්තෙක් මෙබඳු සුවදුක් විඳින්නෙක් මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තෙක් වීමි. ඒ මම ඉන් චුතවූයේ මෙහි උපන්නේ වෙමියි, මෙසේ ආකාර සහිතවූ උද්දෙස සහිතවූ අනෙක ප්‍රකාරවූ පෙරවිසූ භවපිළිවෙළ සිහිකරන්නෙමි'යි කැමති වන්නෙහිද ඒ ඒ තන්හිම කරුණු ඇති ඇති කල්හි හැකි බවට පැමිණෙන්නෙහිය.

24. "වච්ඡය, ඒ නුඹ යම් විටක 'පිරිසිදුවූ මිනිසැස ඉක්ම පවත්නාවූ දිව්‍යවූ ඇසින් චුතවනු ලබන්නාවූද, උපදිනු ලබන්නාවූද හීනවූද ප්‍රණීතවූද යහපත් වර්ණ ඇත්තාවූද අයහපත් වර්ණ ඇත්තාවූද හොඳ ලොව උපන්නාවූද නරක ලොව උපන්නාවූද සත්වයන් දක්නෙමි. ඒකාන්තයෙන් මේ පින්වත් සත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්තවූවාහු වාග්දුශ්චරිතයෙන් යුක්තවූවාහු මනො දුශ්චරිතයෙන් යුක්තවූවාහු ආර්යයන්ට දොස් කියන්නාහු මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහු මිථ්‍යාදෘෂ්ටීන්ගේ කර්ම සමාදන්වූවාහු වෙත්. ඔව්හු ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි සැප නැත්තාවූ නපුරුගති ඇත්තාවූ යටිකුරුව වැටෙන්නාවූ නරකයෙහි උපන්නාහු වෙත්. ඒකාන්තයෙන් මේ පින්වත් සත්වයෝ කාය සුචරිතයෙන් යුක්තවූවාහු වාග් සුචරිතයෙන් යුක්තවූවාහු මනො සුචරිතයෙන් යුක්තවූවාහු ආර්යයන්ට දොස් නොකියන්නාහු සම්‍යක් දෘෂ්ටි ඇත්තාහු, සම්‍යක් දෘෂ්ටිකයන්ගේ කර්ම සමාදන්වූවාහු වෙත්. ඔව්හු ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇත්තාවූ දිව්‍ය ලොකයෙහි උපන්නාහු වෙත්යයි, මෙසේ පිරිසිදුවූ මිනිසැස ඉක්ම පවත්නාවූ දිව්‍යවූ ඇසින් චුතවනු ලබන්නාවූද උපදිනු ලබන්නාවූද හීනවූද ප්‍රණීතවූද යහපත් වර්ණ ඇත්තාවූද අයහපත් වර්ණ ඇත්තාවූද හොඳ ලොව උපන්නාවූද නරක ලොව උපන්නාවූද කර්මයවූ පරිද්දෙන් පැමිණියාවූ සත්වයන් දැනගන්නෙමි'යි කැමතිවන්නෙහිද ඒ ඒ තන්හිම කරුණු ඇති ඇති කල්හි හැකි බවට පැමිණෙන්නෙහිය.

25. "වච්ඡය, ඒ නුඹ යම්විටක 'ආශ්‍රවයන් නැසීමෙන් අනාශ්‍රවූ අර්හත්ඵලය හා යෙදුන සමාධිය හා ප්‍රඥාව කරණකොට

මිදීමට මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කරන්නෙමියි,' කැමැති වන්නෙහිද, ඒ ඒ තන්හිම කරුණු ඇති ඇති කල්හි හැකි බවට පැමිණෙන්නෙහිය."

**26.** ඉක්බිති ආයුෂ්මත් වච්ඡගොත්ත ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගෙණ අනුමෝදන්ව හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට සකස් කොට වැඳ ප්‍රදක්ෂිණාකොට ගියේය. ඉක්බිති ආයුෂ්මත් වච්ඡගොත්ත ස්ථවිර තෙමේ තනිව, වෙන්වූ වාසය ඇත්තේ අප්‍රමාදව කෙලෙස් තවන වීර්ය ඇතිව හරිණ ලද ආත්ම ආලය ඇතිව වාසය කරමින් නොබෝ කලෙකින්ම යමක් සඳහා කුලපුත්‍රයෝ මනාකොටම ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙත්ද, මාර්ග බ්‍රහ්ම චර්යාව කෙළවරකොට ඇති අර්හත්වයට, මේ ආත්මයෙහි තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කෙළේය. ඉපදීම නැති කරණ ලදී. මාර්ග බ්‍රහ්ම චර්යාව වැස නිමවන ලදී. කළයුත්ත කරණ ලදී. මේ ආත්ම භාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැන ගත්තේය. ආයුෂ්මත් වච්ඡගොත්ත ස්ථවිර තෙමේ වනාහි රහතුන්ගෙන් එක්තරා නමක් වූයේය.

එසමයෙහි වනාහි බොහෝවූ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ දැකීමට යත්, ආයුෂ්මත් වච්ඡගොත්ත ස්ථවිර තෙමේ වනාහි යන්නාවූ ඒ භික්ෂූන් යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ ඒ භික්ෂූන්ට මෙසේ කීයේය. "ආයුෂ්මත් නුඹවහන්සේලා කොහි යව්ද?" "ඇවැත්නි" අපි භාග්‍යවතුන් වහන්සේ දැකීමට යමුයි" කීහ.

"ආයුෂ්මත්නි, එසේ වීනම් මාගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් සිරසින් වඳිනු මැනවි.

"ස්වාමීනි, වච්ඡගොත්ත නම් භික්ෂු තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් සිරසින් වඳියි මෙසේද කියයි. මා විසින් භාග්‍යවතුන් වහන්සේට උපස්ථාන කරණ ලද්දේය. මා විසින් සුගතයන් වහන්සේට උපස්ථාන කරන ලද්දේය' යනුයි.

"ඇවැත්නි, එසේයයි" කියා ඒ භික්ෂූහු ආයුෂ්මත් වච්ඡගොත්ත ස්ථවිරයන්ට උත්තර දුන්හ. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියාහුය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට මනාකොට වැඳ, එක් පැත්තක හුන්නාහුය. එක් පැත්තක හුන්නාවූම ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකළාහුය. "ස්වාමීනි, ආයුෂ්මත් වච්ඡගොත්ත ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් සිරසින් වඳියි. මෙසේද කියයි. 'භාග්‍යවතුන් වහන්සේට මා විසින් උපස්ථාන කරණ ලදී. සුගතයන් වහන්සේට මා විසින් උපස්ථාන කරණ ලද්දේ" යනුයි.

"මහණෙනි, පළමුව මා විසින් සිතින් සිත පිරිසිඳ වච්ඡගොත්ත භික්ෂුතෙම දන්නා ලද්දේය. වච්ඡගොත්ත භික්ෂුතෙම ත්‍රිවිද්‍යා ඇත්තෙක. මහත් ඍද්ධි ඇත්තෙක. මහත් ආනුභාව ඇත්තෙකැයි දැනගන්නා ලදී. දෙවතාවෝද කීවාහුය. 'ස්වාමීනි වච්ඡගොත්ත නම් භික්ෂුතෙම ත්‍රිවිද්‍යා ඇත්තේය. මහත් ඍද්ධි ඇත්තේය. මහත් ආනුභාව ඇත්තේය'යි මට මේ කාරණය කීවාහුය."

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටු සිත් ඇත්තාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ කීම සතුටින් පිළිගත්තාහුය.

**තුන්වෙනිවූ මහා වච්ඡගොත්ත සූත්‍රය නිමි. (3-3)**

---

## 24. දීඝ නඛ සූත්‍රය.

1. මා විසින් (මේ සූත්‍රය) මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර ගිජ්ජකූට පර්වතයෙහිවූ සූකරඛත නම් ලෙණෙහි වාසය කළහ. එකල්හි දීඝ නඛ නම් පරිව්‍රාජකතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වියයුතුවූ සිහිකටයුතුවූ කථාව කොට නිමවා එක් පැත්තක සිටියේය.

එක් පැත්තක සිටියාවූ දීඝනඛ නම් පරිව්‍රාජකතෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීවේය.

2. "භවත් ගෞතමයන් වහන්ස, මම වනාහි 'සියල්ල මට රුචි නොවේය' යන මෙබඳු වාද ඇත්තේ මෙබඳු දෘෂ්ටි ඇත්තේ වෙමියි" කීය. "අග්ගිවෙස්සනය, 'සියල්ල මට රුචි නොවේයයි' තොපගේ යම් මේ දෘෂ්ටියක් වේනම් මේ දෘෂ්ටියද තොපට රුචි නොවේදැයි?" ඇසූහ.

"භවත් ගෞතමයන් වහන්ස, ඉදින් මේ දෘෂ්ටිය මට රුචි වන්නේ නම් ඒ 'සියල්ල මට රුචිනොවේ' යන දෘෂ්ටියද එබඳුම වන්නේය."

"අග්ගිවෙස්සනය, යම් කෙනෙක් 'එයද එබඳුම වන්නේය' එයද එබඳුම වන්නේයයි' කියමින් ඒ දෘෂ්ටිය අත්නොහැරම අනික් දෘෂ්ටියක් ගන්නාහුද ඔව්හුම ලොකයෙහි ඉතා බොහෝ වෙත්.

"අග්ගිවෙස්සනය, යම් කෙනෙක්, 'එයද එබඳුම වන්නේය, එයද එබඳුම වන්නේයයි, කියමින් ඒ දෘෂ්ටියද දුරු කරමින් අනික් දෘෂ්ටියක්ද නොගන්නාහුද ඔව්හු ඉතා ස්වල්ප වෙත්.

3. "අග්නිවෙස්සනය, 'සියල්ල මට රුචි වේයයි.' යන මෙබඳු වාද ඇති මෙබඳු දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණෝද ඇත්තාහ. අග්ගිවෙස්සනය, 'සියල්ල මට රුචිනොවෙයි,' යන මෙබඳු වාද ඇති මෙබඳු දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණෝද ඇත්තාහ. අග්ගිවෙස්සනය, 'සමහරක් මට රුචි වේ. සමහරක් මට රුචි නොවෙයි.' යන මෙබඳු වාද ඇති මෙබඳු දෘෂ්ටි ඇති මහණ බමුණෝද ඇත්තාහ.

4. "අග්ගිවෙස්සනය, ඔවුන් අතුරෙන් යම් ඒ මහණ බමුණෝ 'සියල්ල මට රුචි වේයයි,' මෙබඳු වාද ඇත්තේ මෙබඳු දෘෂ්ටි ඇත්තෝ වෙත්ද, ඔවුන්ගේ මේ දෘෂ්ටිය රාග වශයෙන් සසරට සමීපවෙයි. සංයොජන වශයෙන් සසරට සමීපවෙයි. තෘෂ්ණා දෘෂ්ටි දෙකින් සතුටුවීම් වශයෙන් සසරට සමීප වෙයි. තෘෂ්ණා දෘෂ්ටි දෙක්හි ගිලීමෙන් සසරට සමීප වෙයි. අග්ගිවෙස්සනය,

ඔවුන් අතුරෙන් යම් ඒ මහණ බමුණෝ 'සියල්ල මට රුචි නොවේය.' යන මෙබඳු වාද ඇත්තෝ මෙබඳු දෘෂ්ටි ඇත්තෝ වෙත්ද, ඔවුන්ගේ ඒ දෘෂ්ටිය සසර නොඇල්මට සමීපවේ. සසර නොබැඳීමට සමීපවේ. තෘෂ්ණා දෘෂ්ටි දෙකින් සතුටු නොවීමට සමීපවෙයි. තෘෂ්ණා දෘෂ්ටි දෙක්හි නොගිලීමට ආසන්න වෙයි."

**5.** මෙසේ වදාළ කල්හි දීඝ නඛ නම් පරිව්‍රාජක තෙම, "භවත් ගෞතම තෙමේ මාගේ දෘෂ්ටිය උසස් කෙරෙයි. භවත් ගෞතම තෙමේ මාගේ දෘෂ්ටිය ඉතා උසස් කෙරේය". භාග්‍යවතුන් වහන්සේට කීය.

"අග්ගිවෙස්සනය, ඔවුන් අතුරෙන් යම් ඒ මහණ බමුණෝ 'සමහරක් මට රුචිවෙයි. සමහරක් මට රුචි නොවේය' යන මෙබඳු වාද ඇත්තෝ මෙබඳු දෘෂ්ටි ඇත්තෝ වෙත්ද, යම් දෘෂ්ටියක් ඔවුන්ට රුචි වේද, ඒ මේ දෘෂ්ටිය රාග වශයෙන් සසරට ළංවේ. සංයෝජන වශයෙන් සසරට ළංවේ. තණ්හා දිට්ඨි (ලොභය හා වැරදි දැකීම්) වශයෙන් සසරට ළංවේ. තණ්හා දිට්ඨි දෙක්හි ගිලීමෙන් සසරට ළංවේ. යම් දෘෂ්ටියක් ඔවුන්ට රුචි නොවේද ඒ දෘෂ්ටිය සසර නොඇලීමට ළංවේ. නොබැඳීමට ළංවේ. තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් සතුටු නොවීමට ළංවෙයි. තෘෂ්ණා දෘෂ්ටි දෙක්හි නොගිලීමට ළංවෙයි.

**6.** "අග්ගිවෙස්සනය, ඔවුන් අතුරෙන් යම් ඒ මහණ බමුණෝ 'සියල්ල මට රුචි වේයයි,' මෙබඳු වාද ඇත්තෝ මෙබඳු දෘෂ්ටි ඇත්තෝ වෙත්ද, එහි නුවණ ඇති පුරුෂතෙම මෙසේ කල්පනා කරයි. 'සියල්ල මට රුචිවේය' යන යම් මේ මාගේ දෘෂ්ටියක් වේද, ඉදින් මම මේ දෘෂ්ටිය දැඩි වශයෙන් අල්වාගෙන ඇතුලත්ව මෙයම සත්‍යය, අනික සිස්යයි ව්‍යවහාර කෙරෙම්ද, ඒ මට දෙයාකාරයකින් කොලාහල උපදින්නේය. යම් මේ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ 'සියල්ල මට රුචි නොවේයයි'. මෙබඳු වාද ඇත්තේද, මෙබඳු දෘෂ්ටි ඇත්තේද, යම් මේ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ 'සමහරක් මට රුචි වේ. සමහරක් මට රුචි නොවේයයි' මෙබඳු වාද ඇත්තේ දෘෂ්ටි ඇත්තේත් වේද, මේ දෙයාකාරයෙන් මට කොළාහල උපදින්නේය. මෙසේ

කොලාහලය ඇති කල්හි විරුද්ධ වචන කීම වන්නේය. විරුද්ධ වචන කීම ඇති කල්හි පහරදීම වන්නේය. පහරදීම ඇති කල්හි හිංසාව වන්නේය. මෙසේ හෙතෙම කොලාහලයද විවාදයද පහරදීමද හිංසාවද තමාට ඇතිවන බව දැන ඒ දෘෂ්ටියද දුරු කරයි. අනික් දෘෂ්ටියක්ද නොගනියි. මෙසේ මේ දෘෂ්ටීන්ගේ ප්‍රහානයවේ. මෙසේ මේ දෘෂ්ටීන්ගේ දුරලීම වේ.

7. "අග්ගිවෙස්සනය, ඔවුන් අතුරෙන් යම් ඒ මහණ බමුණෝ මට සියල්ල රුචි නොවේයයි, මෙසේ වාද ඇත්තෝ මෙබඳු දෘෂ්ටි ඇත්තෝ වෙත්ද, ඔවුන් අතුරෙන් නුවණ ඇති පුරුෂයෙක් තෙම මෙසේ සලකයි. 'සියල්ල මට රුචි නොවේ යයි,' මාගේ යම් මේ දෘෂ්ටියක් වේද, ඉදින් මම 'මේ දෘෂ්ටිය මෙයම සත්‍යය, අනික සිස්යයි,' දැඩි වශයෙන් අල්වාගෙණ ඇතුළත්ව වාසය කෙරෙම්ද, මට දෙයාකාරයකින් කොලාහල වන්නෝය. යම් මේ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ මට 'සියල්ල රුචි වේයයි,' මෙබඳු වාද ඇත්තේ මෙබඳු දෘෂ්ටි ඇත්තේ වේද, යම් මේ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ මට 'සමහරක් රුචිවේ. සමහරක් මට රුචි නොවේයයි' මෙබඳු වාද ඇත්තේ මෙබඳු දෘෂ්ටි ඇත්තෙක් වේද, මේ දෙයාකාරයෙන් මට කලහය වන්නේය. මෙසේ කලහය ඇති කල්හි විවාදය වන්නේය. විවාදය ඇති කල්හි පහරදීම වන්නේය. පහරදීම ඇති කල්හි වෙහෙස වන්නේය.' මෙසේ හෙතෙම කලහයද, විවාදයද, පහරදීමද, හිංසාවද, තමාට උපදින බව දකිමින් ඒ දෘෂ්ටියද හැරදමයි. අනික් දෘෂ්ටියක්ද අල්වා නොගනියි. මෙසේ මේ දෘෂ්ටීන්ගේ දුරු කිරීම වේ. මේ දෘෂ්ටීන්ගේ දුරලීම වේ.

8. "අග්ගිවෙස්සනය, ඔවුන් අතුරෙන් යම් ඒ මහණ බමුණෙක්, 'සමහරක් මට රුචිවේ. සමහරක් මට රුචි නොවේයයි, මෙබඳු වාද ඇත්තෝ මෙබඳු දෘෂ්ටිය ඇත්තෝවේද එහි නුවණ ඇති පුරුෂයෙක් තෙම මෙසේ සලකයි, 'සමහරක් මට රුචිවේ, සමහරක් මට රුචි නොවේයයි, මාගේ යම් මේ දෘෂ්ටියක් වේද, ඉදින් මම මේ දෘෂ්ටිය දැඩිවශයෙන් අල්වාගණී. වැදගෙණ මෙයම සත්‍යය අනික සිස්යයි, ව්‍යවහාර කෙරෙම්ද,

මට දෙයාකාරයකින්, කලහය වන්නේය,' යම් මේ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ 'සියල්ල මට රුචි වේයයි,' මෙබඳු වාද ඇත්තේ මෙබඳු දෘෂ්ටි ඇත්තේ වේද, යම් මේ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ 'සියල්ල මට රුචි නොවේයයි,' මෙබඳු වාද ඇත්තේ මෙබඳු දෘෂ්ටි ඇත්තේත් වේද, මේ දෙයාකාරයෙන් මට කොලහලය වන්නේය. මෙසේ කොලහලය ඇතිකල්හි විරුද්ධ වචන වන්නේය, විරුද්ධ වචන ඇතිකල්හි පහරදීම වන්නේය. පහරදීම ඇතිකල්හි හිංසාව වන්නේය, මෙසේ හෙතෙම කලහයද විවාදයද පහරදීමද හිංසාවද තමාට උපදින බව දකිමින් ඒ දෘෂ්ටියද දුරු කරයි, අනික් දෘෂ්ටියක්ද අල්වා නොගණියි. මෙසේ මේ දෘෂ්ටීන්ගේ ප්‍රහානය වේ. මෙසේ මේ දෘෂ්ටීන්ගේ දුරලීම වේ,

**9.** "අග්ගිවෙස්සනය, සතර මහා භූතයන් ගෙන් හටගත් මවුපිය සම්භවයෙන් හටගත්, බතින් හා කොමුපිඩුවලින් වැඩුණු රූපය අනිත්‍යය. ඇඟඉලීමය, පිරිමැදීමය, බිඳීමය, විනාසය, ස්වභාවකොට ඇත්තාවූ රූපසමූහයක් වන මේ කය අනිත්‍ය වශයෙන් දුක්වශයෙන් රොගවශයෙන් ගඩක් වශයෙන් හුලක් වශයෙන් ලාමකවූවක් වශයෙන් ආබාධයක් වශයෙන් අන්‍යවූවක් වශයෙන් නැසීම් වශයෙන් ශූන්‍යවශයෙන් අනාත්ම වශයෙන් දැක්කයුතුය. මේ කය අනිත්‍ය වශයෙන් දුක්වශයෙන් රොගවශයෙන් ගඩක් වශයෙන් හුලක් වශයෙන් විපතක් වශයෙන් ආබාධයක් වශයෙන් අන්‍යවූවක් වශයෙන් නැසෙන්නක් වශයෙන් ශූන්‍යවූවක් වශයෙන් අනාත්ම වශයෙන් දක්නාවූ ඔහුගේ කයෙහි යම් ඇල්මෙක් කයෙහි යම් ස්නෙහයෙක් කය අනුව යාමක් වේද, එය දුරුවෙයි.'

**10.** "අග්ගිවෙස්සනය, මේ වෙදනා තුනක්වෙත්. සැප වෙදනාය, දුක් වෙදනාය, දුක්දනොවූ සැපද නොවූ වේදනාවය යන වෙදනා තුනයි. අග්ගිවෙස්සනය, යම් කලෙක්හි සැපවූ වෙදනාව විඳීද, එකල්හි දුක්වූ වෙදනාව නොම විඳියි. අග්ගිවෙස්සනය, යම් කලෙක්හි දුක්වූ වෙදනාව විඳීද, එකල්හි සැපවූ වෙදනාවක් නොම විඳියි. දුක්ද නොවූ සැපද නොවූ

වෙදනාවක් නොවිඳයි. එකල්හි දුක්වූ වෙදනාවම විඳියි අග්ගිවෙස්සනය, යම් කලෙක්හි දුක්නොවූ සැපද නොවූ වෙදනාව විඳීද, එකල්හි සැපවූ වෙදනා නොම විඳියි. දුක්වූ වෙදනාව නොවිඳියි. එකල්හි දුක්ද නොවූ සැපද නොවූ වෙදනාවම විඳියි. අග්ගිවෙස්සනය, සැප වෙදනාවද අනිත්‍යය, සකස් කරනලදී, හෙතුප්‍රත්‍යයන් ගෙන් හටගන්නීය. ක්ෂය වන ස්වභාව ඇත්තීය. විනාසය ස්වභාව කොට ඇත්තීය. විරාගය ස්වභාව කොට ඇත්තීය, නිරොධය ස්වභාව කොට ඇත්තීය. අග්ගිවෙස්සනය, දුක් වෙදනාවද අනිත්‍යය, සකස් කරනලද්දීය. ප්‍රත්‍යයෙන් හටගත්තීය. ක්ෂයවීම ස්වභාව කොට ඇත්තීය, විනාසය ස්වභාව කොට ඇත්තීය, විරාගය ස්වභාව කොට ඇත්තීය, නිරොධය ස්වභාව කොට ඇත්තීය, අග්ගිවෙස්සනය, දුක්ද නොවූ සැපද නොවූ වෙදනාවද අනිත්‍යය සකස් කරන ලද්දීය, ප්‍රත්‍යයෙන් හටගත්තීය, ක්ෂයවන ස්වභාව ඇත්තීය, විනාසවන ස්වභාව ඇත්තීය, විරාග ස්වභාව ඇත්තීය, නිරොධය ස්වභාව කොට ඇත්තීය,

11. අග්ගිවෙස්සනය, මෙසේ දක්නාවූ ඇසූ පිරූ තැන් ඇති ආර්ය ශ්‍රාවක තෙම සැප වෙදනාව කෙරෙහිද කලකිරෙයි. දුක් වෙදනාව කෙරෙහිද කලකිරෙයි. දුක්ද නොවූ සැපද නොවූ වෙදනාව කෙරෙහිද කලකිරෙයි. කලකිරෙන්නේ නොඇලෙයි. නොඇලීමෙන් මිදෙයි. මිදුනු කල්හි මිදුනේය යන දැනීම වේ. ජාතිය ක්ෂය කරණ ලද්දීය, බ්‍රහ්මචර්ය වැස නිමවන ලද්දේය. සතර මගින් කළ යුත්ත කරන ලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගනියි. අග්ගිවෙස්සනය, මෙසේ මිදුනු සිත් ඇත්තාවූ භික්ෂු තෙමේ වනාහි කිසිවෙකු සමගත් විරුද්ධව කථා නොකෙරෙයි. කිසිවෙකු සමගත් විවාද නොකෙරෙයි. ලොකයෙහි යම් ව්‍යවහාරයක් වේද, ඒ ව්‍යවහාරයෙන් ව්‍යවහාර කරයි. දෘෂ්ටි වශයෙන් නොගනියි.

12. එකල්හි වනාහි ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේගේ පිටුපසින් භාග්‍යවතුන් වහන්සේට පවන් සලමින් සිටියේ වෙයි. ඉක්බිති ආයුෂ්මත් ශාරීපුත්‍ර

ස්ථවිරයන්ට මෙබඳු අදහස් විය. 'භාග්‍යවතුන් වහන්සේ වනාහි අපට නුවණින් දැන ඒ ඒ ධර්මයන්ගේ දුරු කිරීම වදාළේය. සුගතයන් වහන්සේ වනාහි අපට නුවණින් දැන ධර්මයන්ගේ දුරලීම වදාළේයයි. මෙසේ මෙනෙහි කරන්නාවූ ආයුෂ්මත් ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ සිත තෘෂ්ණා දෘෂ්ටීන්ගෙන් අලවා නොගෙන ආශ්‍රවයන්ගෙන් මිදුනේය. දීඝනඛ පරිව්‍රාජකයාහට වනාහි යම් කිසිවක් ඉපදීම ස්වභාව කොට ඇත්තේද, ඒ සියල්ල නිරුද්ධවීම ස්වභාවකොට ඇත්තේයයි කෙලෙස් රජස් රහිතවූ පහවූ මල ඇති ධර්ම චක්ෂුස (සෝවාන් මාර්ගඥානය) පහලවූයේය.

13. ඉක්බිති දීඝ නඛ නම් පරිව්‍රාජක තෙමේ දක්නාලද ධර්මය ඇත්තේ පැමිණියාවූ ධර්මය ඇත්තේ දැනගන්නාලද ධර්මය ඇත්තේ බැසගත්තාවූ ධර්මය ඇත්තේ දුරු කළාවූ විචිකිච්ඡා ඇත්තේ පහවූ සැකය ඇත්තේ විසාරද බවට පැමිණියේ ශාස්තෘ ශාසනයෙහි අන් පිහිටක් නොසොයන බවට පැමිණියේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවේය. "භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත, භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත, භවත් ගෞතමයන් වහන්ස, යම්සේ යටිකුරු කොට තබන ලද්දක් හෝ උඩුකුරු කරන්නේද, වසා තබන ලද්දක් හෝ වැසුම් අරින්නේද, මංමුළාවූවෙකුට හෝ මග කියන්නේද අන්ධකාරයෙහි හෝ 'ඇස් ඇත්තෝ රූප දකිත්වායි තෙල් පහනක් දරන්නේද, මෙපරිද්දෙන් භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් පකාරයෙන් ධර්මය දෙශනා කරණලදී. මේ මම භවත් ගෞතමයන් වහන්සේ සරණ කොටයමි. ධර්මයද භික්ෂු සංඝයාද (සරණ කොටයමි) භවත් ගෞතම තෙමේ මා අද පටන් දිවිහිම් කොට සරණගියාවූ උපාසකයෙකැයි දරණ සේක්වායි" කීය.

**දීඝ නඛ සූත්‍රය නිමි. (3-4)**

# 25. මාගන්දිය සූත්‍රය

1. මා විසින් (මේ සූත්‍රය) මෙසේ අසන ලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ කුරුජනපදයෙහි කම්මාස්සදම්ම නම්වූ කුරුවැස්සන්ගේ නියම් ගමෙහි භාරද්වාජගොත්ත නම්වූ බ්‍රාහ්මණයාගේ ගිනිපුදන ශාලාවෙහි තණ ඇතිරියෙක්හි වාසය කළහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ උදය කාලයෙහි හැඳ පොරවා පාත්‍රා සිවුරු රැගෙන කම්මාස්සදම්ම නම් ගමට පිණ්ඩපාතය පිණිස පැමිණියෝය. කම්මාස්සදම්ම නම් ගමෙහි පිඬු පිණිස හැසිර බතින් පසු කාලයෙහි පිණ්ඩපාතයෙන් වැලකුනේ එක්තරා වන ලැහැබක් යම් තැනෙක්හිද දවල් වාසය පිණිස එතැනට පැමිණියෝය. ඒ වනලැහැබට ඇතුල්ව එක්තරා ගසක් මුල දවල් වාසය කිරීමෙන් වැඩහුන් සේක.

2. ඉක්බිති මාගන්දිය නම් පරිව්‍රාජක තෙම (පාගමනින්) සක්මන් කරණු ලබන්නේ, හැසිරෙනු ලබන්නේ භාරද්වාජගොත්ත නම් බ්‍රාහ්මණයාගේ ගිනි පුදන ශාලාව යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. මාගන්දිය නම් පරිව්‍රාජක තෙම භාරද්වාජගොත්ත නම් පරිව්‍රාජිකයාගේ ගිනි පුදන ශාලාවෙහි පනවනලද තණ ඇතිරිය දුටුයේමය. දැක භාරද්වාජගොත්ත නම් බ්‍රාහ්මණයාට මෙය කීයේය. "පින්වත් භාරද්වාජගේ ගිනි පුදන ශාලාවෙහි ශ්‍රමණයෙකුගේ සයනයට සුදුසුවූවක් මෙන් පනවන ලද මේ තණ ඇතිරිය කවරෙකුටද?"

"පින්වත් මාගන්දිය, ශාක්‍යපුත්‍රවූ ශාක්‍ය කුලයෙන් නික්ම පැවිදිවූ ශ්‍රමණ ගෞතම නම් කෙනෙක් ඇත්තේය. ඒ භාග්‍යවත් ගෞතමයන් වහන්සේගේ වනාහි මෙබඳු යහපත්වූ ගුණ ඝෝෂාවක් උස්ව නැංගේය. ඒ භාග්‍යවත් තෙම මේ කාරණයෙනුත් අර්හත්ය, සම්බුද්ධය, විද්‍යාචරණ සම්පන්නය, සුගතය, ලොකවිදූය, නිරුත්තරවූ පුරුෂයන් දමනය කිරීමෙහි සාර්ථි වාහකයෙකු බඳුය, දෙව් මිනිසුන්ට අනුශාසනා කරන්නෙක. චතුස්සත්‍ය අවබොධ කෙළේය. සියලු කෙලෙසුන් දුරුකළ සේක යනුවෙනි. ඒ භවත් ගෞතමයන් වහන්සේට මේ සයනය පනවන ලද්දේය."

3. "පින්වත් භාරද්වාජය, යම්බඳු අපි ඉන්ද්‍රියයන්ගේ වැඩීම නසන්නාවූ ඒ භවත් ගෞතමයන්ගේ සයනාසනය දුටුවෙමුද, ඒ අපි දැකීමට (නුසුදුසුවූවක්) දුටුවෙමුයි" කීය.

"මාගන්දිය, මේ වචනය රැකගනුව, මාගන්දිය මේ වචනය රැකගනුව, ඒ භවත් ගෞතමයන්ගේ පිරිසිදු කරුණු වූ කුශල ධර්මයෙහි පැහැදුනාවූද, හික්මුණාවූද ක්ෂත්‍රිය පණ්ඩිතයෝද, බ්‍රාහ්මණ පණ්ඩිතයෝද, ගෘහපති පණ්ඩිතයෝද, ශ්‍රමණ පණ්ඩිතයෝද බොහෝ වෙත්යයි" කීය.

"පින්වත් භාරද්වාජය, ඉදින් අපි ඒ භවත් ගෞතමයන් ඉදිරියෙහි දක්නෙමුද, ශ්‍රමණ ගෞතම තෙමේ ඉන්ද්‍රියයන්ගේ වැඩීම නසන්නෙකැයි කියන්නෙමු, ඊට හේතු කවරේද, මෙසේ වනාහි අපගේ සූත්‍රයෙහි ඇතිහෙයිනි. ඉදින් භවත් මාගන්දිය හට එය බරක් නොවේ. නම්, ශ්‍රමණ ගෞතමයන් වහන්සේට මෙය කියන්නෙමියි," (භාරද්වාජ තෙමේ කීය.) භවත් භාරද්වාජ තෙමේ මාරැකගැනීමට වෙහෙස නොවී මා කියනලද සේම කියවයි" කීය.

4. භාග්‍යවතුන් වහන්සේ පිරිසිදුවූ මිනිසැස ඉක්ම පැවැත්තාවූ දිව්‍යවූ ශ්‍රොත්‍ර ධාතුවෙන් (දිවකණින්) භාරද්වාජහොත්ත නම් බ්‍රාහ්මණයාගේ මාගන්දිය නම් පරිව්‍රාජකයා සමගවූ මේ කථාව ඇසුවෝය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සවස් වේලෙහි පලසමවතින් නැගී සිටියේ භාරද්වාජගොත්ත නම් බ්‍රාහ්මණයාගේ ගිනි පුදන ශාලාව යම් තැනෙක්හිද, එතැනට පැමිණියහ. පැමිණ පනවනලද්දාවූම තණ ඇතිරියෙහි වැඩහුන්නේය. එකල්හි භාරද්වාජගොත්ත නම් බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වූයේය. සතුටු විය යුතු සිහිකටයුතු කථාව කොට නිමවා, එක් පැත්තක උන්නේය. එක් පැත්තක උන්නාවූ භාරද්වාජගොත්ත නම් බ්‍රාහ්මණයාට භාග්‍යවතුන් වහන්සේ මෙය කීවාහුය.

"භාරද්වාජය, මාගන්දිය පරිව්‍රාජකයා සමග මේ තණ ඇතිරිය අරබයා තොපගේ කිසියම් කතා බහක් වූයේද?" මෙසේ

ඇසූ කල්හි භාරද්වාජගොත්ත නම් බ්‍රාහ්මණ තෙම ප්‍රීතියෙන් සංවෙගයට පැමිණියේ ලොමු ඩැහැ ගන්නා ලද්දේ භාග්‍යවතුන් වහන්සේට මෙය කීවේය.

"අපි භවත් ගෞතමයන් වහන්සේට මෙයම කියනු කැමැත්තෝ වෙමු. එතකුදු වුවත් භවත් ගෞතමයන් වහන්සේ නොකීම කළහ." භාග්‍යවතුන් වන්සේ භාරද්වාජගොත්ත නම් බමුණා සමග මේ අතුරු කථාව කොට අවසාන නොකෙළේද.' එකල්හි මාගන්දිය පරිව්‍රාජකතෙම ගමනින් සක්මන් කරණු ලබන්නේ හැසිරෙනු ලබන්නේ භාරද්වාජගොත්ත නම් බමුණාගේ ගිනි පුදන ශාලාව යම් තැනෙක්හිද, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමඟ සතුටු වූයේය. සතුටු විය යුතුවූ සිහිකටයුතුවූ කථාවකොට නිමවා එක් පැත්තක උන්නේය. එක් පැත්තක උන්නාවූම මාගන්දිය නම් පරිව්‍රාජකයාට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය.

**6.** "මාගන්දිය ඇස වනාහි රූපය වාසස්ථාන කොට ඇත්තේය. රූපයෙහි ඇළුනේය. රූපයෙන් සතුටු වූයේය. තථාගතයන් වහන්සේ විසින් ඒ ඇස දමනය කරනලදී. භික්ෂුවගේ සංවරය පිණිසද, ධර්මය දෙශනාකරති. මාගන්දියය, තොප විසින් ශ්‍රමණ ගෞතමතෙම ඉන්ද්‍රියයන්ගේ වැඩීම නසන්නෙකැයි කියනලද්දේද මේ සඳහාද?"

"භවත් ගෞතමයන් වසන්ස, මා විසින් මේ සඳහාම ශ්‍රමණ ගෞතම තෙමේ ඉන්ද්‍රියයන්ගේ වැඩීම නසන්නෙකැයි කියන ලදී. ඊට හේතු කවරේද, මෙසේ වනාහි අපගේ සූත්‍රයෙහි ඇතුළත් වන හෙයිනි.

**7.** "මාගන්දියය, කණ වනාහි ශබ්දය (වාසස්ථාන) කොට ඇත්තේය. ශබ්දයෙහි ඇලුනේය, ශබ්දයෙන් සතුටුවිය. එය තථාගතයන් වහන්සේ විසින් ඒ කණ දමනය කරනලදී. රක්නාලදී සංවර කරනලදී. ඒ කණේද සංවරය පිණිස ධර්ම දෙශනා කරති. මාගන්දිය, ශ්‍රමණ ගෞතම තෙම ඉන්ද්‍රියයන්ගේ

වැඩීම් නසන්නෙකැ යන මෙය මේ සඳහා කියන ලද්ද?" "භවත් ගෞතමයන් වහන්ස, මා විසින් ශ්‍රමණ ගෞතම තෙම ඉන්ද්‍රියයන්ගේ වැඩීම් නසන්නෙකැයි මේ සඳහාම කියන ලදී. මෙසේ වනාහි අපගේ සූත්‍රයෙහි ඇතුළත්වන හෙයිනි."

"මාගන්දිය, නාසය වනාහි ගන්ධය අරමුණු කොට ඇත්තේය. ගන්ධයෙහි ඇලුනේය. ගන්ධයෙන් සතුටු විය. එය තථාගතයන් විසින් දමනය කරනලදී. ආරක්ෂා කරණලදී. සංවර කරනලදී. ඒ නාසයේද සංවරය පිණිස ධර්ම දෙශනා කරති. මාගන්දියය, ශ්‍රමණ ගෞතමතෙම ඉන්ද්‍රියයන්ගේ වැඩීම නසන්නෙක යන මෙය මේ සඳහා කියන ලදද?" "භවත් ගෞතමයන් වහන්ස, මා විසින් ශ්‍රමණ ගෞතම තෙම වැඩීම නසන්නෙකැයි මේ සඳහාම කියන ලදී. මෙසේ වනාහි අපගේ සූත්‍රයෙහි ඇතුළත්වන හෙයිනි."

8. "මාගන්දියය, දිව වනාහි රසය අරමුණු කොට ඇත්තේය. රසයෙහි ඇළුනේය. රසයෙන් සතුටුවිය. එම දිව තථාගතයන් විසින් දමනය කරනලදී. ආරක්ෂා කරනලදී. සංවර කරනලදී. ඒ ජිව්හාවගේද, සංවරය පිණිස ධර්මය දෙශනා කරති. මාගන්දියය, ශ්‍රමණ ගෞතම තෙම ඉන්ද්‍රියන්ගේ වැඩීම් නසන්නෙක යන මෙය මේ සඳහා කියන ලදද?" "භවත් ගෞතමයන් වහන්ස, මා විසින් ශ්‍රමණ ගෞතම තෙම ඉන්ද්‍රියන්ගේ වැඩීම් නසන්නෙකැයි මේ සඳහාම කියනලද ඊට හෙතු කවරේද, මෙසේ වනාහි අපගේ සූත්‍රයෙහි ඇතුළත්වන හෙයිනි."

10. "මාගන්දිය, කය වනාහි ස්පර්ශය අරමුණුකොට ඇත්තේය. ස්පර්ශයෙහි ඇලුනේය. ස්පර්ශයෙන් සතුටුවිය එය තථාගතයන්වහන්සේ විසින් දමනය කරනලදී. ආරක්ෂා කරනලදී. සංවර කරනලදී. ශරීරයේද සංවරය පිණිස ධර්මදෙශනා කරති. මාගන්දියය, ශ්‍රමණ තෙම ඉන්ද්‍රියයන්ගේ වැඩීම නසන්නෙක යන මෙය මේ සඳහා කියන ලදද? භවත් ගෞතමයන් වහන්ස මා විසින් ශ්‍රමණ ගෞතම තෙම ඉන්ද්‍රියයන්ගේ වැඩීම නසන්නෙකැයි මේ සඳහාම කියන ලදී.

11. "මාගන්දියය, සිත වනාහි ධර්මාරමුණු ආරාමකොට ඇත්තේය. ධර්මාරම්මණයෙහි ඇළුනේය. ධර්මාරම්මණයෙහි සතුටුවූයේ වෙයි. සිත තථාගතයන් විසින් දමනය කරන ලදී. රක්ෂාකරන ලදී. සිතේ සංවරය පිණිස ධර්මය දෙශනා කරයි. මාගන්දියය, තොප විසින් ශ්‍රමණ ගෞතම තෙම ඉන්ද්‍රියයන්ගේ වැඩීම් නසන්නෙක යන මෙය මේ සඳහා කියන ලදද?"

"භවත් ගෞතමයන් වහන්ස, මා විසින් ශ්‍රමණ ගෞතම තෙම ඉන්ද්‍රියන්ගේ වැඩීම් නසන්නෙකැයි, මේ සඳහාම කියන ලදී. ඊටහෙතු කවරේද, මෙසේ වනාහි අපගේ ඇතුළත් වන හෙයිනියි (කීයේය.)

12. "මාගන්දියය, ඒ කුමකැයි හඟින්නෙහිද? මේ ශාසනයෙහි ඇතැමෙක් ඇසින් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මන වඩන්නාවූ ප්‍රියස්වභාව ඇත්තාවූ කාමයෙන් යුක්තවූ ඇළුම් කටයුතුවූ රූපවලින් පෙර සිත් පිනවන ලද්දෙක් වන්නේය. හෙතෙම පසු කලෙක්හි රූපයන්ගේ හටගැන්මද නැසීමද රසවිඳීමද දොෂයද දුරු කිරීමද තත්වූ පරිද්දෙන් දැන රූපයෙහි තෘෂ්ණාව හැර රූපය නිසා හටගත් දැවිල්ල දුරු කොට පහවූ පිපාස ඇත්තේ තමා තුළ සංසිඳවනලද සිත් ඇත්තේ වාසය කරන්නේය. මාගන්දියය, තොප විසින් මොහුට වනාහි කුමක් කියයුතු වන්නේද?"

"භවත් ගෞතමයන් වහන්ස, කිසිවක් නැත."

13. "මාගන්දියය, ඒ කුමකැයි හඟින්නෙහිද, "මෙහි ඇතමෙක් කණින් දතයුතුවූ යහපත්වූ සිත් අලවන්නාවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාවවූ, 'ආසාව ඉපදීමට කරුණුවූ, ඇළුම් කටයුතුවූ ශබ්දයන්ගෙන් පෙර සිත් පිනවන ලද්දේත් වන්නේය. හෙතෙම පසු කාලයෙහි ශබ්දයන්ගේ හට ගැන්මද නැසීමද, රස විඳීමද, දොෂයද දුරු කිරීමද ඇති සැටියෙන් දැන ශබ්දයෙහි තණ්හාව හැර ශබ්දය නිසා හටගත් දැවිල්ල දුරු කොට පහවූ පිපාස ඇත්තේ, තමා තුළ සංසිඳවන ලද සිත් ඇත්තේ වාසය කරන්නේය. මාගන්දියය තොප විසින් මොහු ගැන කුමක් කියයුතු වන්නේද?" "භවත් ගෞතමයන් වහන්ස කිසිවක් නැත."

"මාගන්දියය, ඒ කුමකැයි සිතන්නෙහිද? මෙහි ඇතැමෙක් නාසයෙන් දතයුතුවූ යහපත්වූ සිත් අලවන්නාවූ මන වඩන්නාවූ ප්‍රිය ස්වභාවවූ, ආසාව ඉපදීමට කරුණුවූ, ඇළුම් කටයුතුවූ ගන්ධයන්ගෙන් පෙර සිත් පිනවන ලද්දේ වන්නේය. හෙතෙම පසු කාලයෙහි ගන්ධයන්ගේ හටගැන්මද, නැසීමද, රස විඳීමද, දොෂයද, දුරු කිරීමද ඇති සැටියෙන් දැන ගන්ධයෙහි තණ්හාව හැර ගන්ධය නිසා හටගත් දැවිල්ල දුරු කොට පහවූ පිපාස ඇත්තේ, තමා තුළ සිත් ඇත්තේ වාසය කරන්නේය. මාගන්දිය, තොප විසින් මොහු ගැන කුමක් කියයුතු වන්නේද?"

"භවත් ගෞතමයන් වහන්ස, කිසිවක් නැත,"

"මාගන්දියය, ඒ කුමකැයි සිතන්නේද? මෙහි ඇතමෙක් ජිව්හා විඤ්ඤාණයෙන් (රස දැනගන්නා සිතින්) දත යුතුවූ යහපත්වූ, සිත් අලවන්නාවූ, මන වඩන්නාවූ ප්‍රිය ස්වභාවවූ ආසාව ඉපදීමට කරුණුවූ, ඇළුම් කටයුතුවූ රසයන් ගෙන් පෙර සිත් අලවන ලද්දේ වන්නේය. හෙතෙම මෑත කාලයෙහි රසයන්ගේම හට ගැන්මද, නැසීමද, රසවිඳීමද, දොෂයද, දුරු කිරීමද ඇති සැටියෙන් දැන රසයෙහි තණ්හාව හැර, රස නිසා හටගත් දැවිල්ල දුරු කොට, පහවූ පිපාස ඇත්තේ, තමා කෙරෙහි සංසුන් සිත් ඇත්තේ වාසය කරන්නේය. මාගන්දිය, තොප විසින් මොහු ගැන කුමක් කිය යුතු වන්නේද?"

"භවත් ගෞතමයන් වහන්ස, කිසිවක් නැත,"

"මාගන්දියය, ඒ කුමකැයි හඟින්නෙහිද? ඇතමෙක් මෙහි හෙතෙම පසු කාලයෙක්හි ස්පර්ශ කළ යුත්තවුන්ගේ හටගැන්මද විනාසයද ආශ්වාදයද ආදීනවයද විඳීමද තත්වූ පරිද්දෙන් දැන ස්පර්ශයෙහි වූ තෘෂ්ණාව හැර ස්පර්ශයෙන් හටගත් දැවිල්ල දුරුකොට පහව ගිය පිපාසා ඇත්තේ තමා තුළ සංසිඳුවන ලද සිත් ඇත්තේ වාසය කරන්නේය. මාගන්දියය තොප විසින් මොහුට වනාහි කුමක් කිය යුතු වන්නේද?

"භවත් ගෞතමයන් වහන්ස, කිසිවක් නැත"

14. "මාගන්දියය, මම වනාහි පෙර ගිහිගෙයි වූයේ ඇසින් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තාවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ,

කම්සැප එලවන්නාවූ, ඇළුම් කටයුතුවූ, රූපයන්ගෙන් යුක්තවූ, පංචකාම ගුණයන්ගෙන් යුක්ත වූයේ සැප විඳිමින් වාසය කෙළෙමි. කණින් දතයුතුවූ, යහපත්වූ, සිත් අලවන්නාවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව වූ, ආසාව ඉපදීමට කරුණුවූ, ඇළුම් කටයුතුවූ, ශද්දයන්ගෙන් යුක්තවූ පංචකාම ගුණයන්ගෙන් යුක්ත වූයේ, සැප විඳීමෙන් වාසය කෙළෙමි. නාසයෙන් දතයුතුවූ, යහපත්වූ, සිත් අලවන්නාවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාවවූ, ආසාව ඉපදීමට කරුණුවූ, ඇළුම් කටයුතුවූ, ගන්ධයන්ගෙන් යුක්තවූ, පංචකාම ගුණයන්ගෙන් යුක්ත වූයේ සැප විඳිමින් වාසය කෙළෙමි. දිවෙන් දතයුතුවූ, යහපත්වූ, සිත් අලවන්නාවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාවවූ, ආසාව ඉපදීමට, කරුණුවූ, ඇළුම් කටයුතුවූ රසයන්ගෙන් යුක්ත වූයේ සැප විඳිමින් වාසය කෙළෙමි. කයින් දතයුතුවූ, ඉෂ්ටවූ කාන්තවූ, මනාපවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම් සැප එලවන්නාවූ, ඇළුම් කටයුතුවූ, ස්ප්‍රෂ්ටව්‍යයන්ගෙන් යුක්තවූ, පස්කම් ගුණයන්ගෙන් යුක්ත වූයේ සැප විඳිමින් වාසය කෙළෙමි. මාගන්දියය, ඒ මට වර්ෂා ඍතුවට එකෙක, හෙමන්ත ඍතුවට එකෙක, ග්‍රීෂ්ම ඍතුවට එකෙක යයි ප්‍රාසාද තුනක් වූහ. මාගන්දියය, ඒ මම වනාහි වර්ෂා ඍතුවට සුදුසුවූ ප්‍රාසාදයෙහි වර්ෂා ඍතුවෙහිවූ සාර මස පුරුෂයන් නැත්තාවූ තූර්යවාදනයන්ගෙන් සිත් පිනවනු ලබන්නේ ප්‍රාසාදයන් යටට නොබසිමි. ඒ මම පසු කලෙක්හි කාමයන්ගේ හට ගැණීමද නැසීමද රසවිඳීමද ද්වේෂයද දුරු කිරීමද තත්වූ පරිද්දෙන් දැන කාමයන්හි තෘෂ්ණාව හැර කාමයන්ගෙන් හටගත් දැවිල්ල දුරුකොට පහව ගියාවූ පිපාසා ඇත්තේ තමන් තුළ සංසිඳවන ලද සිත් ඇත්තේ වාසය කරමි. ඒ මම කාමයන්හි පහනොවූ රාගය ඇති කාම තෘෂ්ණාවලින් කරනු ලබන්නාවූ කාම දැවිල්ලෙන් දනු ලබන්නාවූ කාමයන් සේවනය කරන්නාවූ අන්‍යයන් දකිම්ද, ඒ මම ඒ සැපයට නොකැමැත්තෙමි එහි සිත් නොඅලවමි. ඊට හෙතු කවරේද? මාගන්දියය, කාමයන්ගෙන් වෙන්වූ අකුසල ධර්මයන්ගෙන් වෙන්වූ යම් මේ ඇල්මක් දිව්‍යසැපය පවා යටත්කොට පවතීද, ඒ ඇල්මෙන් ඇලෙනු

ලබන්නේ හීන සැපයට, නොකැමැත්තෙමි. එහි සිත් නො අලවමි.

15. "මාගන්දිය, වැඩුනාවූ මහත්වූ ධන ඇත්තාවූ මහත් සම්පත් ඇත්තාවූ ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ ඇසින් දැක යුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සැප එලවන්නාවූ ඇළුම් කටයුතු වූ රූපයන්ගෙන් යුක්තව පංචකාම ගුණයන්ගෙන් යුක්තව වාසය කරන්නේද, කණින් දතයුතු වූ, ආසාව ඉපදීමට කරුණුවූ, ඇළුම් කටයුතුවූ ශබ්දයන්ගෙන් යුක්ත වූයේ, පංචකාම ගුණයන්ගෙන් යුක්තව වාසය කරන්නේද, නාසයෙන් දතයුතුවූ, යහපත්වූ, සිත් අලවන්නාවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව වූ ආසාව ඉපැදීමට කරුණුවූ, ඇළුම් කටයුතුවූ, ගන්ධයන්ගෙන් යුක්ත වූයේ, පංචකාම ගුණයන්ගෙන් යුක්තව, වාසය කරන්නේද, දිවෙන් දතයුතුවූ, යහපත්වූ, සිත් අලවන්නාවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාවවූ, ආසාව ඉපදීමට කරුණු වූ, ඇළුම් කටයුතුවූ රසයන්ගෙන් යුක්තව වාසය කරන්නේද, කයින් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම් සැප එලවන්නාවූ ඇළුම් කටයුතුවූ, ස්පර්ශයෙන් යුක්තව පස්කම් සැපයෙන් යුක්තව වාසය කරන්නේය. හෙතෙම කයින් සුචරිතයෙහි හැසිර, වචනයෙන් සුචරිතයෙහි හැසිර, සිතින් සුචරිතයෙහි හැසිර, ශරීරයාගේ භෙදයෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇති පස්කම් සැපයෙන් යුත් දිව්‍ය ලොකයෙහි තව්තිසා වැසිදෙවියන්ගේ සහභාවයට පැමිණෙන්නේය. හෙතෙම එහි නන්දන වනයෙහි අප්සරා සමූහයා විසින් පිරිවරණ ලද්දේ දිව්‍යවූ පස්කම් ගුණවලින් යුක්ත වූයේ සතුටු වන්නේය. හෙතෙම පස්කම් ගුණවලින් යුක්ත සතුටු වන්නාවූ ගෘහපතියෙකු හෝ ගෘහපති පුත්‍රයෙකු හෝ දක්නේය.

16. "මාගන්දිය, ඒ කුමකැයි හඟින්නෙහිද? නන්දන වනයෙහි අප්සරා සමූහයා විසින් පිරිවරණ ලද්දාවූ දිව්‍යවූ පස්කම් ගුණවලින් යුක්තවූ සතුටු වන්නාවූ ඒ දිව්‍යපුත්‍රතෙම මේ ගෘහපතියාට හෝ ගෘහපති පුත්‍රයාට හෝ මිනිසුන් අයත් පස්කම්

ගුණයන්ට හෝ කැමැති වන්නේද, මිනිසුන් අයත්වූ කාමයන්ගෙන් හෝ ආපසු හැරෙන්නේද?

"භවත්ගෞතමයන් වහන්ස, එය නොවන්නේ මැයි, ඊට හෙතු කවරේද, භවත් ගෞතමයන් වහන්ස මිනිසුන් අයත්වූ කාමයන් දිව්‍යවූ කාමයෝ අතිශයින් සිත් අලවන්නාහුද, අතිශයින් ප්‍රණීතවූවාහුද වෙත්."

17. "මාගන්දියය, එපරිද්දෙන්ම මම පෙර ගිහිගෙයි වූයේම යුක්තවූයේ ඇසින් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සැප එලවන්නාවූ ඇළුම් කටයුතුවූ රූපයන්ගෙන් යුක්තවූයේ පංචකාම ගුණයන්ගෙන් යුක්තවූයේ සැපවින්දෙමි. කණින් දතයුතුවූ, යහපත්වූ, සිත් අලවන්නාවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාවවූ, ආසාව ඉපදීමට කරුණුවූ, ඇළුම් කටයුතුවූ ගන්ධයන්ගෙන් යුක්තවූයේ, පංචකාම ගුණයන්ගෙන් යුක්තවූයේ සැපවින්දෙමි. දිවෙන් දතයුතුවූ, යහපත්වූ සිත් අලවන්නාවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාවවූ, ආසාව ඉපදීමට කරුණුවූ, ඇළුම් කටයුතුවූ රසයන්ගෙන් යුක්තවූයේ එක් වූයේම සැපවින්දෙමි.

කයින් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සැප එලවන්නාවූ ඇළුම් කටයුතුවූ ස්පර්ශයන්ගෙන් යුක්තවූ පංචකාම ගුණයෙන් යුක්තව වාසය කළෙමි. ඒ මම මෑත කලෙක්හි කාමයන්ගේ හටගැණීම්ද විනාසයද රස විඳීමද දොෂයද විඳීම තත්වූ පරිද්දෙන් දැන කාම තෘෂ්ණාව හැර කාමයන්ගෙන්වූ දැවිල්ල දුරුකොට පහවූ පිපාසා ඇත්තේ තමන් තුළ සංසිඳුනු සිත් ඇත්තේ වාසය කරමි. ඒ මම කාමයන්හි පහනොවූ රාගය ඇති කාමතෘෂ්ණාවෙන් කරනු ලබන්නාවූ කාම දැවිල්ලෙන් දවනු ලබන්නාවූ කාමයන් සේවනය කරන්නාවූ අන්‍යයන් දකිමි. ඒ මම ඒ සැපයට නොකැමැත්තෙමි. එහි සිත් නොඅලවමි. ඊට හෙතු කවරේද? මාගන්දියය, යම් මේ ඇල්මක් වනාහි කාමයන්ගෙන් තොරවම අකුසල ධර්මයන්ගෙන් වෙන්වම දිව්‍යවූ සැපය පවා යට කොට සිටීද, ඒ ඇල්මෙන් ඇලෙනු ලබන්නේ හීනවූ සැපයට නොකැමැත්තෙමි. එහි සිත්

නොඅලවමි මාගන්දියය, යම්සේ කුෂ්ටරොග ඇත්තාවූ පුරුෂයෙක් වණවූ සිරුර ඇත්තේ පැසවූ සිරුර ඇත්තේ පණුවන් විසින් කනු ලබන්නේ නියවලින් ව්‍රණමුඛයන් කසනු ලබන්නේ, අඟුරු වළෙක්හි සිරුර තවන්නේද, ඔහුගේ නෑදෑ මිත්‍රයෝ ශල්‍යකර්ම කරන්නාවූ වෛද්‍යකු කැඳවන්නාහුය. ඔහුට ඒ ශල්‍යවෛද්‍ය තෙම බෙහෙත් කරන්නේය. හෙතෙම ඒ බෙහෙත නිසා කුෂ්ටරොගයෙන් මිදෙන්නේය. නිරොග වූවෙක් සුව ඇත්තෙක් තනිව කටයුතු කළ හැක්කෙක් ශරීරය වසඟවූවෙක් කැමැති පරිදි යා හැක්කෙක් වන්නේය. හෙතෙම වණවූ සිරුර ඇති පැසවූ සිරුර ඇති පණුවන් විසින් කනු ලබන්නාවූ නියෙන් වණමුව කසනු ලබන්නාවූ අඟුරු වළෙක්හි සිරුර තවන්නාවූ කුෂ්ටරොගය ඇති අන් පුරුෂයෙකු දක්නේය. මාගන්දිය, ඒ කුමකැයි හඟින්නෙහිද, මේ පුරුෂ තෙම ඒ කුෂ්ටරොගය ඇති පුරුෂයාට කැමැති වන්නේද, අඟුරුවළට හෝ බෙහෙත් සේවනය කිරීමට හෝ කැමැති වන්නේද?”

18. “භවත් ගෞතමයන් වහන්ස, මෙය නොවන්නේ මැයි. ඊට හේතු කවරේද? භවත් ගෞතමයන් වහන්ස, රොගය ඇති කල්හිම බෙහෙතින් කටයුතුවේ. රොගය නැති කල්හි බෙහෙතින් කටයුත්තක් නැති හෙයිනි.

“මාගන්දියය, එපරිද්දෙන්ම මම පෙර ගිහිගෙයි වූයේම ඇසින් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සැප එලවන්නාවූ ඇළුම් කටයුතුවූ රූපයන්ගෙන් යුක්තවූයේ පංචකාම ගුණයන්ගෙන් යුක්තවූයේ කණින් දතයුතුවූ, යහපත්වූ, සිත් අලවන්නාවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාවවූ, ආසාව ඉපදීමට කරුණුවූ, ඇළුම් කටයුතුවූ ශබ්දයන්ගෙන් යුක්තවූයේ, පංචකාම ගුණයන්ගෙන් යුක්තවූයේ නාසයෙන් දතයුතුවූ, යහපත්වූ, සිත් අලවන්නාවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාවවූ ආසාව ඉපදීමට කරුණුවූ, ඇළුම් කටයුතුවූ, ගන්ධයන්ගෙන් යුක්තවූයේ, පංචකාම ගුණයන්ගෙන් යුක්තවූයේ, සැපවින්දෙමි. දිවෙන් දතයුතුවූ, යහපත්වූ සිත් අලවන්නාවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාවවූ, ආසාව ඉපදීමට කරුණුවූ, ඇළුම් කටයුතුවූ, රසයන්ගෙන්

යුක්තවූයේ එක් වූයේම සැපවින්දෙමි. කයින් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සැප එලවන්නාවූ ඇළුම් කටයුතුවූ ස්පර්ශයන්ගෙන් යුක්තවූ පඤ්චකාම ගුණයන්ගෙන් යුක්තව වාසය කෙළෙමි. ඒ මම පසු කලෙක්හි කාමයන්ගේ හටගැණීමද, නැසීමද, රසවිඳීමද, දෝෂයද දුරුකිරීමද තත්වූ පරිද්දෙන් දැන කාම තෘෂ්ණාව හැර කාමයෙන්වූ දැවිල්ල දුරුකොට පහවූ පිපාසා ඇත්තේ තමන් තුළ සංසිඳුවන ලද සිත් ඇත්තේ වාසය කරමි. ඒ මම කාමයන්හි පහ නොවූ රාග ඇති, කාම තෘෂ්ණාවලින් කරනු ලබන්නාවූ කාම දැවිල්ලෙන් දවනු ලබන්නාවූ කාමයන් සේවනය කරන්නාවූ, අන්‍ය සත්වයන් දකිමි. ඒ මම ඔවුන්ගේ සැපයට නොකැමැත්තෙමි. එහි සිත් නො අලවමි. ඊට හෙතු කවරේද? මාගන්දියය, කාමයන්ගෙන් වෙන්වූ අකුසල ධර්මයන්ගෙන් වෙන්වූ යම් මේ ඇල්මක් දිව්‍යවූ සැපයද මැඩගෙන සිටීද, ඒ ඇල්මෙන් ඇලෙනු ලබන්නේ හීනවූ සැපයකට නොකැමැත්තෙමි. එහි සිත් නොඅලවමි.

**19.** "මාගන්දියය, යම් සේ වණවූ ශරීර ඇති පැසවූ ශරීර ඇති කුෂ්ටරොග ඇති පුරුෂයෙක් තෙම පණුවන් කනු ලබන්නේ නියවලින් වණ මුඛයන් කසනු ලබමින් අඟුරු වළෙක්හි ශරීරය තවන්නේද, ඔහුගේ නෑදෑ හිත මිතුරෝ වෛද්‍යයෙකු කැඳවන්නාහුය. ඒ ශල්‍ය වෛද්‍ය තෙම ඔහුට බෙහෙත් කරන්නේය. හෙතෙම ඒ බෙහෙත් නිසා කුෂ්ට රොගවලින් මිදුනේ නිරොග වූයේ සුවපත් වූයේ තනිව හැසිරිය හැක්කේ ශරීරය වසඟ කර ගත හැක්කේ කැමති පරිදි යාම් ඊම් හැක්කෙක් වන්නේය. ඔහු ශක්තිමත් පුරුෂයෝ දෙදෙනෙක් දෙඅතින් අල්වා ගෙණ අඟුරු වළකට අදින්නාහුය. මාගන්දිය, ඒ කුමකැයි හඟින්නෙහිද? ඒ පුරුෂ තෙම එහාට මෙහාට සිරුර නමන්නේද?"

**20.** "භවත් ගෞතමයන් වහන්ස, එසේය. ඊට හේතු කවරේද? භවත් ගෞතමයන් වහන්ස, මේ ගින්න වනාහි දුක්වූ ස්පර්ශද, මහත්වූ තැවීමද, මහත්වූ දැවිල්ල' ඇති හෙයිනි." මාගන්දිය, කුමකැයි සිතන්නෙහිද? දැන් පමණක්ම ඒ ගින්න

දුක්වූ ස්පර්ශ ඇත්තේත් මහත්වූ තැවීම ඇත්තේත් මහත්වූ දැවිල්ල ඇත්තේත් වේද, නොහොත් පෙරත් ඒ ගින්න දුක්වූ ස්පර්ශ ඇත්තේත් මහත්වූ තැවීම ඇත්තේත් මහත්වූ දැවිල්ල ඇත්තේත් වේද?"

"භවත් ගෞතමයන් වහන්ස, දැනුදු ඒ ගින්න දුක්වූ ස්පර්ශ ඇත්තේත් මහත්වූ තැවීම ඇත්තේත් මහත්වූ දැවිල්ල ඇත්තේත් වෙයි. පෙරත් ඒ ගින්න දුක්වූ ස්පර්ශ ඇත්තේත් මහත්වූ තැවීම ඇත්තේත් මහත්වූ දැවිල්ල ඇත්තේත් වේ. භවත් ගෞතමයන් වහන්ස, මේ කුෂ්ටරොග ඇති පුරුෂ තෙමේද, වණවූ ශරීර ඇත්තේ පැසවූ ශරීර ඇත්තේ පණුවන් විසින් කනු ලබන්නේ නියවලින් වණ මුඛයන් කසනු ලබන්නේ නැසුණු කායෙන්ද්‍රිය ඇත්තේ දුක්වූ ස්පර්ශ ඇති ගින්නෙහි සැපය යන විපරිත සංඥාව ලැබුයේය." "මාගන්දිය, එපරිද්දෙන්ම ඉකුත්වූ කාලයෙහිද කාමයෝ දුක් සර්පශ ඇත්තාහුද, මහත් තැවීම ඇත්තාහුද, මහත් දැවිල්ල ඇත්තාහුද වූහ. මතු කාලයෙහිද කාමයෝ දුක්වූ ස්පර්ශ ඇත්තාහුද, මහත්වූ තැවීම ඇත්තාහුද, මහත්වූ දැවිල්ල ඇත්තාහුද, වන්නාහුය. දැනුදු මේ කාලයෙහි කාමයෝ දුක්වූ ස්පර්ශ ඇත්තාහුද මහත්වූ තැවීම ඇත්තාහුද, මහත්වූ දැවිල්ල ඇත්තාහුද වෙත්. මාගන්දියය, මේ සත්වයෝද කාමයන්හි පහනොවූ රාග ඇත්තාහු කාම තෘෂ්ණාවලින් කනු ලබන්නාහු කාම දැවිල්ලෙන් දවනු ලබන්නාහු නසනලද ප්‍රඥොන්ද්‍රිය ඇත්තාහු දුක් ස්පර්ශ ඇත්තාවූම කාමයන්හි සැපය යන විපරීත සංඥාව ලැබුවාහුය.

**21.** "මාගන්දිය, යම්සේ කුෂ්ටරෝග ඇත්තාවූ පුරුෂයෙක් වණවූ සිරුර ඇත්තේ පැසවූ සිරුර ඇත්තේ පණුවන් විසින් කනු ලබන්නේ නියවලින් වණ මුඛයන් කසනු ලබන්නේ අඟුරු වළෙක්හි කය තවාද, මාගන්දියය, යම් යම් ආකාරයකින් මේ කුෂ්ට රොග ඇති පුරුෂතෙම වණවූ සිරුර ඇත්තේ පැසවූ සිරුර ඇත්තේ පණුවන් විසින් කනු ලබන්නේ නියවලින් වණ මුඛයන් කසනු ලබන්නේ අඟුරු වළෙක්හි සිරුර තවාද, ඒ ඒ ආකාරයෙන් මොහුගේ ඒ වණ මුඛයෝ අතිශයින් අපවිත්‍ර වූවාහුද, අතිශයින් දුර්ගන්ධ වූවාහුද, අතිශයින් කුණුවූවාහුද, වෙත්. වණ

මුඛයන් කැසීම හෙතු කොට ගෙණ කිසියම් ස්වල්ප සැපයක් ස්වල්ප ආශ්වාදයක් වේමය. මාගන්දියය, එපරිද්දෙන්ම කාමයන්හි පහ නොවූ රාගය ඇති සත්වයෝ කාමතෘෂ්ණාවලින් කනු ලබන්නාහු කාම දැවිල්ලෙන් දවනු ලබන්නාහු, කාමයන් සේවනය කරත්. මාගන්දිය, යම් යම් ආකාරයකින් කාමයන්හි පහ නොවූ රාග ඇති සත්වයෝ කාමතෘෂ්ණාවලින් කරනු ලබන්නාහු කාම දැවිල්ලෙන් දවනු ලබන්නාහු කාමයන් සේවනය කරත්ද, ඒ ඒ ආකාරයෙන් ඒ සත්වයන්ගේ කාමතෘෂ්ණාවද වැඩේ. කාම දැවිල්ලෙන්ද දැවෙත්. පස්කම් ගුණයන් නිසා කිසියම් සැප මාත්‍රයක්ද, රසවිඳීම් මාත්‍රයක්ද වේමැයි.

22. "මාගන්දිය, ඒ කුමකැයි හඟින්නෙහිද? පස්කම් ගුණවලින් පිනවනු ලබන්නාවූ පස්කම්ගුණ සේවනය කරනු ලබන්නාවූ රජෙක් හෝ රාජමහාමාත්‍යයෙක් හෝ කාම තෘෂ්ණාව නොහැර කාම දැවිල්ල දුරු නොකොට පහවූ පිපාසය ඇතිව, තමන් තුළ සංසිඳුණ සිත් ඇතිව වාසය කෙළේයයි හෝ වාසය කෙරේයයි හෝ වාසය කරන්නේයයි හෝ, තොප විසින් දක්නා ලද්දේ හෝ අසන ලද්දේ හෝ වේද?"

"භවත් ගෞතමයන් වහන්ස, එය නොවේමැයි."

"මාගන්දිය, යහපත, මා විසිනුදු පඤ්චකාමගුණයන්ගෙන් යුක්තවූයේ පඤ්චකාමගුණ සේවනය කරනු ලබන්නාවූ රජෙක් හෝ රජ මහඇමතියෙක් හෝ කාමතෘෂ්ණාව නොහැර කාම දැවිල්ල දුරු නොකොට පහවූ පිපාසා ඇතිව තමා තුළ සංසිඳුණු සිත් ඇතිව වාසය කෙළේයයි හෝ වාසය කෙරේයයි හෝ වාසය කරන්නේයයි හෝ, යන මෙය නොමදක්නා ලදී, නොඅසනලදී.

"මාගන්දිය, තවද යම්කිසි ශ්‍රමණ කෙනෙක් හෝ බ්‍රාහ්මණ කෙනෙක් හෝ, පහවූ පිපාසා ඇතිව තමන් තුළ සංසුන් සිත් ඇතිව වාසය කළාහුද, වාසය කරත්ද, වාසය කරන්නාහුද, ඒ සියල්ලෝ කාමයන්ගේ හටගැන්මද, නැසීමද, ආශ්වාදයද,

ආදීනවයද, නිස්සරණයද, තත්වූ පරිද්දෙන් දැන කාමතෘෂ්ණාව හැර කාම දැවිල්ල දුරුකොට පහවූ පිපාසා ඇතිව තමන් තුළ සංසුන් සිත් ඇතිව වාසය කළාහුය. වාසය කෙරෙත්. වාසය කරන්නාහුයයි" වදාළේය.

23. "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ඒ වේලායෙහි මේ ප්‍රීති වාක්‍යය පහළකළ සේක. "නිරොගි බව උතුම්ම ලාභය වෙයි. නිර්වාණය උතුම්ම සැපය වෙයි. නිවණට පමුණුවන්නාවූ මාර්ගයන් අතුරෙන් භය රහිතවූ නිර්වාණයට පමුණවන අංග අටකින් යුත් මාර්ගයම උතුම් වන්නේය."

මෙසේ කී කල්හි මාගන්දිය පරිව්‍රාජක තෙම භාග්‍යවතුන් වහන්සේට, 'භවත් ගෞතමයන් වහන්ස, ආශ්චර්යය, භවත් ගෞතමයන් වහන්ස, අද්භූතය, භවත් ගෞතමයන් වහන්සේ විසින් "නිරොගිබව උතුම්ම ලාභයවේ, නිවන උතුම්ම සැපය වේ"යයි ඉතා යහපත් වචනයක්ම කියන ලදැයි" කීය.

"භවත් ගෞතමයන් වහන්ස, පෙර සිටි ආචාර්ය ප්‍රාචාර්ය වූ පරිව්‍රාජකයන් විසින් 'නිරොගිබව උතුම්ම ලාභයවේ. නිවන උතුම්ම සැපය වේයයි කියන ලද මේ වචනය මා විසිනුදු අසන ලදී. එයට මෙය සමවේයයි" කීය.

"මාගන්දිය, පූර්වයෙහිවූ ආචාර්ය ප්‍රාචාර්යවූ පරිව්‍රාජකයන් විසින් කියන ලද 'නිරොගිබව උතුම්ම ලාභය වෙයි. නිවන උතුම්ම සැපය වෙයි, යන යම් වචනයක් තොප විසින් අසන ලද්දේද, එහි කුමක්නම් නිරොගිබවද, කුමක්නම් නිවනද?"

24. මෙසේ වදාළ කල්හි මාගන්දිය පරිව්‍රාජක තෙමේ ස්වකීයවූම ශරීරාවයවයන් අතින් පිරිමදියි. "භවත් ගෞතමයන් වහන්ස, ඒ නිරොගීබව නම් මෙය වේ. ඒ නිවන නම් මෙය වේ. භවත් ගෞතමයන් වහන්ස, මම වනාහි දැන් නිරොගිව සුවසේ වසමි. මට කිසි රොගයක් පීඩා නොකෙරේ යයි" කීය.

"මාගන්දිය, ජාත්‍යන්ධවූ (උත්පත්තියෙන්ම ඇස් නොපෙනෙන) පුරුෂ තෙම කලු සුදු රූප නොදක්නේය. නිල්පැහැ ඇති රූප නොදක්නේය, රන්වන්වූ රූප නොදක්නේය,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ලේපාට රූප නොදක්නේය, මදටියපාට රූප නොදක්නේය, වල ගොඩැලි නොදක්නේය, තාරකා නොදක්නේය, සඳ හිරු දෙදෙන නොදක්නේය. මෙතෙම පින්වත්නි, ඒකාන්තයෙන් සුදු වස්ත්‍රය පිරිසිදුය, ලක්ෂණය, නිර්මලයයි කියන්නාවූ පුරුෂයෙකුගෙන් අසයි. මෙතෙම සුදු වස්ත්‍රයක් සෙවීමෙහි ඇවිදින්නේය. එක්තරා පුරුෂයෙක් තෙල් දැලි තැවරුනාවූ දළ වස්ත්‍රයකින්, 'පින්වත් පුරුෂය, නුඹගේ මේ සුදු වස්ත්‍රය ලක්ෂණය, නිර්මලය, පිරිසිදුයයි' ඔහු වඤ්චා කරන්නේය. මෙතෙම එය පිළිගන්නේය. පිළිගෙණ පොරවන්නේය. පොරවාගෙණ සතුටුව, 'පින්වත, ඒකාන්තයෙන් සුදුවූ වස්ත්‍රය, ලක්ෂණය, නිර්මලය, පිරිසිදුයයි' සතුටු වාක්‍යය ප්‍රකාශ කරන්නේය. මාගන්දිය, ඒ කුමකැයි හඟින්නෙහිද, ඒ ජාත්‍යන්ධවූ පුරුෂ තෙම දනිමින් දකිමින් මේ තෙල් දැලි තැවරුණු දළ වස්ත්‍රය පිළිගන්නේද, පිළිගෙණ පොරවන්නේද, පොරවා සතුටුව, 'පින්වත, ඒකාන්තයෙන් සුදුවස්ත්‍රය ලක්ෂණය, නිර්මලය, පිරිසිදුය' සතුටු වචන කියන්නේද? නොහොත් ඇස් ඇත්තහු ඇදහීමෙන් කියන්නේද?"

"භවත් ගෞතමයන් වහන්ස, නොදැන නොදැක මේ ජාත්‍යන්ධවූ පුරුෂ තෙම මේ තෙල් දැලි තැවරුණාවූ දළ වස්ත්‍රය පිළිගන්නේය. පිළිගෙණ පොරවන්නේය. පොරවා සතුටුව, 'පින්වත්නි, ඒකාන්තයෙන් සුදු වස්ත්‍රය ලක්ෂණය, නිර්මලය, පිරිසිදුයයි' ඇස් ඇත්තහුගේ වචනය ඇදහීමෙන් සතුටු වචන කියන්නේය."

"මාගන්දිය, එපරිද්දෙන්ම අන්‍ය තීර්ථවූ පරිව්‍රාජකයෝ අන්ධවූවාහු. ඇස් නැත්තාහු නිරොගබව නොදැන, නිවණ නොදැන, නිරොගිබව උතුම්ම ලාභය වේ. නිවණ උතුම්ම සැපය වෙයි' යන ගාථාව කියත්.

**25.** "මාගන්දිය, පූර්වයෙහිවූ අර්හත්වූ සම්‍යක් සම්බුදුවරයන් විසින් නිරොගිබව උතුම්ම ලාභයවේ. නිවණ උතුම්ම සැපවේ. මාර්ගයන්ගෙන් භය රහිතවූ, අමෘතය කරා ගමන් කරන්නාවූ,

අංග අටකින් යුත් මාර්ගයම ශ්‍රේෂ්ඨවන්නේය” යන ගාථාව කියන ලදී.

“ඒ ගාථාව මේ කාලයෙහි පිළිවෙළින් පෘථග්ජනයන් අතට පැමිණියාය. මාගන්දිය, මේ ශරීරය වනාහි රොගයක් වූයේය, ගඩක් වූයේය, හුලක් වූයේය, විනාසයක් වූයේය, ලෙඩක් වූයේය. ඒ නුඹ රොගයක්වූ, ගඩක්වූ, හුලක්වූ, විනාශයක්වූ, ලෙඩක්වූ මේ ශරීරය, ‘භවත් ගෞතමයන් වහන්ස, නිරොගි බවකි නිවණකි’යි කීයෙහිය. මාගන්දිය, නුඹ මේ පිරිසිදුවූ ඇසකින් නිරොගබව දැනගන්නෙහිද, නිවණ දක්නෙහිද, ඒ පිරිසිදුවූ ඇස තොපට නැත්තේය”යි (වදාළේය.)

**26.** “යම්සේ මම නිරොගිබව දැනගන්නෙම්ද, නිවණ දකින්නෙම්ද, භවත් ගෞතමයන් වහන්සේ එසේ මට ධර්මය දෙශනා කිරීමට පොහොසත් නම් එයින් මම භාග්‍යවතුන් වහන්සේට පැහැදුනෙක් වන්නෙමි.”

**27.** “මාගන්දිය, ජාත්‍යන්ධවූ පුරුෂ තෙම කළු සුදු රූප නොදක්නේය. නිල්පාට ඇති රූප නොදක්නේය. රන්වන් රූප නොදක්නේය. ලේපාට රූප නොදක්නේය. මදටිය පාට රූප නොදක්නේය. වල ගොඩැලි නොදක්නේය. තාරකා නොදක්නේය. සඳ හිරු දෙදෙන නොදක්නේය. ඔහුගේ නෑදෑ මිතුරෝ ශල්‍යවෛද්‍යයෙකු කැඳවන්නාහුය. ඔහුට ඒ වෛද්‍යතෙම බෙහෙත් කරන්නේය. හෙතෙම ඒ බෙහෙත් නිසා ඇස් නොලබන්නේය. ඇස පිරිසිදු නොවන්නේය. මාගන්දිය, ඒ කුමකැයි හඟින්නෙහිද? ඒ වෙදතෙම ඉතාමත්ම ක්ලාන්තයට වෙහෙසවීමට පැමිණෙන්නේ නොවේද?”

“භවත් ගෞතමයන් වහන්ස, එසේය”

**28.** “මාගන්දිය, එපරිද්දෙන්ම මමද තොපට මේ නිරොගබවය, මේ නිර්වාණයයි, ධර්මය දෙශනා කරන්නෙමි. ඒ නුඹ නිරොගිබව නොදන්නෙහි නම් නිවණ නොදක්නෙහි නම් ඒ මට ක්ලාන්තයෙක් වන්නේය. එය මට වෙහෙසක් වන්නේය.”

**29.** "යම්සේ මම නිරොගබව දැනගන්නෙම්ද, නිවණ දකින්නෙම්ද, භවත් ගෞතම තෙමේ මට එසේ ඒ ධර්මය දෙශනා කරන්ට පොහොසත් නම් මම භවත් ගෞතමයන් වහන්සේට මෙසේ ප්‍රසන්නවූයේ වෙමි,"

"මාගන්දිය, යම්සේ උත්පත්තියෙන් අන්ධවූ පුරුෂතෙම කළු සුදු රූපයන් නොදක්නේය. නිල්පාට ඇති රූප නොදක්නේය. රන්වන්වූ රූප නොදක්නේය. ලේපාට රූප නොදක්නේය. මදටියපාට රූප නොදක්නේය. වල ගොඩැලි දෙක නොදක්නේය. තාරකා නොදක්නේය. සඳු හිරු දෙදෙනා නොදක්නේය. හෙතෙම 'පින්වත, ඒකාන්තයෙන් සුදු වස්ත්‍රය ලක්ෂණය, නිර්මලය, පිරිසිදුයයි, කියන්නාවූ ඇස් ඇත්තෙකුගේ කීම අසන්නේය. එක්තරා පුරුෂයෙක් තෙල් දැලි තැවරුනාවූ දලවස්ත්‍රයකින් 'පින්වත් පුරුෂය, මේ සුදුවූ වස්ත්‍රය ලක්ෂණය, නිර්මලය, පිරිසිදුය' කියා ඔහු වඤ්චා කරන්නේය. හෙතෙම එය පිළිගන්නේය. පිළිගෙණ පොරවන්නේය. ඔහුගේ නෑදෑ මිත්‍රයෝ ශල්‍යවෛද්‍යවරයෙකු කැඳවන්නාහුය. ඔහුට ඒ ශල්‍යවෛද්‍යතෙම ලය විරේක, බඩ විරේක, අඳුන් ගැල්වීම, නැවත අඳුන් ගැල්වීම, නස්‍යකිරීම යන බෙහෙත් කරන්නේය. හෙතෙම ඒ බෙහෙත නිසා ඇස් ලබන්නේය. ඇස් පිරිසිදු කරන්නේය. ඇස් පහලවීම සමගම මේ තෙල් දැලි තැවරුනාවූ දළවස්ත්‍රයෙහි යම් ඇල්මෙක් වීද, ඒ ඇල්ම ප්‍රහීන වේ. ඔහුද, ඒ පුරුෂයා සතුරෙකු වශයෙන්ද තබන්නේය. පසමිතුරකු වශයෙන්ද තබන්නේය. තවද 'පින්වත්නි, මේ පුරුෂයා විසින් ඒකාන්තයෙන් මම බොහෝ කලක් තෙල් දැලි තැවරුනාවූ දළවස්ත්‍රයකින් 'පින්වත් පුරුෂය, තොපගේ මේ සුදු වස්ත්‍රය, ලක්ෂණය නිර්මලය, පිරිසිදුයි, රවටන ලද්දෙම්, වඤ්චාකරණ ලද්දෙම් ප්‍රයොග කරණ ලද්දෙම් වෙමියි.' ජීවිතයෙන් තොරකළ යුත්තෙකු කොටද හඟින්නේය. මාගන්දිය, එපරිද්දෙන්ම මමද තොපට මේ නිරොගි බවය, මේ නිර්වාණයයි, තොපට ධර්මය දෙශනා කරන්නෙම්, ඒ නුඹ නිරොග බව දන්නෙහි නම් නිර්වාණය දක්නෙහි නම්, ඒ නුඹගේ ඇස් පහලවීම සමගම පඤ්චුපාදානස්කන්ධයන්හි යම් ආලයෙක් වේද, ඒ දුරු වන්නේය. තවද තොපට 'පින්වත,

ඒකාන්තයෙන් මම බොහෝ කලක් මේ සිත විසින් රවටන ලද්දෙම් වඤ්චා කරණ ලද්දෙම් පොළඹන ලද්දෙම් වෙමි. මම වනාහි රූපයම මමයයි ගනිමින් අල්වා ගතිමි. වේදනාවම මමයයි ගනිමින් අල්වා ගතිමි. සංඥාවම මමයයි ගනිමින් අල්වා ගතිමි. සංස්කාරයන්ම මමයයි ගනිමින් අල්වා ගතිමි. විඤ්ඤාණයම මමයයි ගනිමින් අල්වා ගතිමි. ඒ මට මමයයි අල්වා ගැනීම හෙතුකොටගෙන කර්මය ඇතිවිය. කර්මය හෙතුකොටගෙන ඉපදීම ඇතිවිය. ඉපදීම හෙතුකොටගෙන දිරීමය, මැරීමය, සොකකිරීමය, වැලපීමය, කායික දුකය, මානසික දුකය, ශොකයෙන් වන දැඩි වෙහෙසය යන මොහු හටගත්තාහ. මෙසේ මේ සියලු දුක් සමූහයාගේ හටගැණීම වේය" යන අදහස පහළ වන්නේය.

**30.** "භවත් ගෞතමයන් වහන්සේ යම්සේ මම මේ ආසනයෙන් අන්ධනොවී නැගිටින්නෙම්ද, එසේ මට ධර්මය දෙශනා කරන්ට සමර්ථවේ නම්, මම භවත් ගෞතමයන් වහන්සේට එසේ ප්‍රසන්න වූයේ වෙමි."

"මාගන්දිය, එසේ වී නම්, නුඹ සත්පුරුෂයන් සේවනය කරව. මාගන්දිය, යම් හේතුවකින් නුඹ සත්පුරුෂන් සේවනය කරන්නෙහි නම්, මාගන්දිය, එහෙයින් නුඹ සද්ධර්මය අසන්නෙහිය. මාගන්දිය යම් හේතුවකින් නුඹ සද්ධර්මය අසන්නෙහි නම්, මාගන්දිය, එහෙයින් නුඹ ධර්මයට අනුකූලව පිළිපදින්නෙහිය. මාගන්දිය, යම් හේතුවකින් නුඹ ධර්මයට අනුකූලව පිළිපදින්නෙහි නම්, මාගන්දිය, එහෙයින් නුඹ, මොහු රොගය, ගඩය, හුල්ය, මෙහි රෝග ගඩ හුල් ඉතිරි නොවී නිරුද්ධ වෙත්. ඒ මාහට තණ්හාවෙන් අල්වා ගැණීම නිරුද්ධ කිරීම හේතුකොටගෙන කර්මභවය නිරොධය වේ. කර්ම භවය නිරුද්ධවීම ෙහ්තුකොටගෙන ඉපදීම නිරුද්ධ වේ. ඉපදීම නිරුද්ධවීම හේතුකොටගෙන ජරාවය, මරණය, ශොකය, වැලපීමය, කායික දුකය, චෛතසික දුකය, ශොකයෙන් හටගන්නා දැඩිවූ වෙහෙස යන මොහු නිරුද්ධ වෙත්. මෙසේ මේ සියලු දුක් සමූහයාගේ නිරොධය වේයයි තෙමේම දැනගන්නෙහිය. තෙමේම දක්නෙහියයි" (වදාළේය).

31. මෙසේ වදාළ කල්හි මාගන්දිය පරිව්‍රාජකතෙම භාග්‍යවතුන් වහන්සේට "භවත් ගෞතමයන්වහන්ස, ඉතා යහපත, භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත, භවත් ගෞතමයන් වහන්ස, යම්සේ යටිකුරු කොට තබන ලද්දක් උඩුකුරු කරන්නේ හෝ වේද, වසා තබන ලද්දක් වැසුම් හරින්නේ හෝ වේද, මංමුලාවූවෙකුට මග කියන්නේ හෝ වේද, අන්ධකාරයෙහි හෝ ඇස් ඇත්තෝ රූපදකිත්වායි, තෙල් පහනක් දරන්නේ ද, එපරිද්දෙන්ම භවත් ගෞතමයාණන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය ප්‍රකාශ කරනලදී. ඒ මම භවත් ගෞතමයන් වහන්සේ සරණකොට යමි. ධර්මයද භික්ෂු සංඝයාද සරණ කොට යමි. මම භවත් ගෞතමයන් වහන්සේගේ සමීපයෙහි මහණකම ලබන්නෙමි. උපසම්පදාව ලබන්නෙමියි" (කීයේය.)

32. "මාගන්දිය, පෙර අන්‍යතීර්ථකවූ යමෙක් මේ ශාසනයෙහි පැවිදිවීම කැමැති වේද, උපසම්පදාව කැමැති වේද, හෙතෙම සාරමසක් පිරිවෙස් වසයි. සාරමසක් ඇවෑමෙන් සතුටු සිත් ඇත්තාවූ භික්ෂූහු, භික්ෂුභාවය පිණිස මහණකරවත්, උපසම්පදා කරවත්. එතකුදු වුවත් මෙහි පුද්ගලයන්ගේ වෙනස් බව දැනගන්නා ලදැයි" වදාළේය.

"ස්වාමීනි, ඉදින් පෙර අන්‍යතීර්ථකවූවෝ මේ ශාසනයෙහි පැවිදිවීම කැමැති වන්නාහු. උපසම්පදාව කැමැති වන්නාහු, සාරමසක් පිරිවෙස් වසත්ද, සාරමසක්හුගේ ඇවෑමෙන් සතුටු සිත් ඇති භික්ෂූහු භික්ෂුභාවය පිණිස පැවිදි කරවත්ද, උපසම්පදා කරවත්ද, මම සතර අවුරුද්දක් පිරිවෙස් වසන්නෙමි. සතර අවුරුද්දක් ඇවෑමෙන් මා සතුටුසිත් ඇති භික්ෂූහු භික්ෂුභාවය පිණිස පැවිදි කෙරෙත්වා, උපසම්පදා කෙරෙත්වායි" කීය.

33. "මාගන්දිය, පරිව්‍රාජක තෙමේ වනාහි භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි පැවිදිබව ලැබීය. උපසම්පදාව ලැබීය. උපසපන්වූ නොබෝ කල් ඇති ආයුෂ්මත් මාගන්දිය ස්ථවිර තෙමේ තනිව වෙන්වූ වාසය ඇත්තේ අප්‍රමාදවූයේ කෙලෙස් තවන වීර්‍ය ඇත්තේ, අත්හරින ලද ආත්මාලය ඇත්තේ,

වාසයකර නොබෝ කලකින්ම, යමක් සඳහා කුලපුත්‍රයෝ මනාකොටම ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙත්ද, මාර්ග බ්‍රහ්මචර්යාව කෙළවරකොට ඇති ඒ රහත්බව මේ ආත්මයෙහිම තෙමේ විශෙෂ නුවණින් දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කෙළේය. ජාතිය කෙළවර කරණ ලදී. මාර්ග බ්‍රහ්මචරියාව වැස නිමවන ලදී. සතරමගින් කළ යුතු දෙය කරණ ලදී. මේ ආත්මභාවය පිණිස අනිකක් නැතැයි වෙසෙසින් දැනගත්තේය. ආයුෂ්මත් මාගන්දිය ස්ථවිර තෙමේ වනාහි රහතුන්ගෙන් එක්තරා කෙනෙක් වූහ.

**5 වන මාගන්දිය සූත්‍රය නිමි. (3-5)**

---

## 26. සන්දක සූත්‍රය.

1. මා විසින් (මේ සූත්‍රය) මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසඹෑනුවර ඝොසිතාරාමයෙහි වාසය කළහ. එකල්හි වනාහි සන්දක නම් පරිව්‍රාජක තෙම පිලක්ඛ නම් ගුහායෙහි පන්සියයක් පමණවූ, මහත් පරිව්‍රාජක පිරිස සමග වාසය කරයි. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම සවස් වේලෙහි පලසමවතින් නැගී සිටියේ, භික්ෂූන්ට කථාකළහ. "ඇවැත්නි, යමු. දේවකටසොබ්භය (-වර්ෂාවෙන් සෑරුණු දියවිල) යම් තැනෙක්හිද එහි ගුහාව දැකීම පිණිස එළඹෙන්නෙමුයි"

"ඇවැත්නි, එසේයයි" ඒ භික්ෂූහු ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට උත්තර දුන්හ.

2. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ බොහෝවූ භික්ෂූන් සමග දේවකටසොබ්භ නම් විල යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. එකල්හි වනාහි සන්දක නම් පරිව්‍රාජක තෙම උස්හඬින්ද, මහහඬින්ද, නොයෙක් ප්‍රකාර තිරිසන් කතා කියමින් මහත් ශබ්ද පවත්වන්නාවූ මහත් පිරිවැජි පිරිස සමග හුන්නේ වෙයි. එනම්, රජුන් පිළිබඳ කතාය, සොරුන් පිළිබඳ කතාය, මහ ඇමැතියන් පිළිබඳ කතාය, සේනාවන් පිළිබඳ

කතාය, භය පිළිබඳ කතාය, යුද්ධ පිළිබඳ කතාය, ආහාර පිළිබඳ කතාය, බොන දේ පිළිබඳ කතාය, ඇඳුම් පිළිබඳ කතාය, නිදන ආසන පිළිබඳ කතාය, මල්මාලා පිළිබඳ කතාය, සුවඳ පිළිබඳ කතාය, නෑයන් පිළිබඳ කතාය, රථ පිළිබඳ කතාය, ගම් පිළිබඳ කතාය, මහගම් පිළිබඳ කතාය, නගරයන් පිළිබඳ කතාය, ජනපද පිළිබඳ කතාය, ස්ත්‍රීන් පිළිබඳ කතාය, සූරයන් පිළිබඳ කතාය, වීථි පිළිබඳ කතාය, දියතොට පිළිබඳ කතාය, පූර්වඥාති ප්‍රේතයන් පිළිබඳ කතාය, නොයෙක් ස්වභාවයෙන් යුක්ත කතාය, ලොකය පිළිබඳ ප්‍රකාශ වන්නාවූ කතාය, සමුද්‍රය පිළිබඳව ප්‍රකාශ වන්නාවූ කතාය 'මෙසේ වන්නේය, මෙසේ නොවන්නේය' යන මෙය පිළිබඳ කතාය යන මේවායි.

3. සන්දකනම් පරිව්‍රාජක තෙම එන්නාවූ ආනන්ද ස්ථවිරයන් දුරදීම දුටුයේය. දැක ස්වකීය පිරිස තැන්පත් කෙළේය. "පින්වත්නි, ශබ්ද නොකරව්, මේ ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවකයන්වූ ශ්‍රමණවූ ආයුෂ්මත් ආනන්දස්ථවිර තෙමේ පැමිණෙයි. යම්තාක්ම ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවකයෝ කොසඹෑ නුවර වෙසෙත්ද, මේ ආනන්ද ශ්‍රමණ තෙමේ ඔවුන්ගෙන් එක්තරා කෙනෙක. ඒ ආයුෂ්මත්හු වනාහි නිශ්ශබ්ද බැව් කැමැත්තෝය. නිශ්ශබ්දවූ බුදුන් විසින් හික්මවන ලද්දාහුය. නිශ්ශබ්දභාවයාගේ ගුණ කියන්නෝය. ඒකාන්තයෙන් නිශ්ශබ්දවූ පිරිසක් බව දැන පැමිණිය යුතුයයි හඟින්නේයයි" කීය. ඉක්බිති පරිව්‍රාජකයෝ නිශ්ශබ්ද වූහ.

4. එකල්හි වනාහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ සන්දක නම් පරිව්‍රාජකයා යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. එකල්හි සන්දක නම් පරිව්‍රාජක තෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙය කීයේය. "භවත් ආනන්ද තෙමේ පැමිණේවා. භවත් ආනන්ද ස්ථවිරයන්ගේ යහපත් ඊමෙකි. බොහෝ කලකින් භවත් ආනන්ද ස්ථවිර තෙමේ මේ ආකාරය කළේය. එනම් මෙහි පැමිණීමෙනි. පින්වත් ආනන්ද ස්ථවිර තෙමේ වැඩහිඳීවා මේ ආසනය පනවන ලදැයි" කීය. ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම පනවන ලද අස්නෙහි හුන්නේය. සන්දක

නම් පරිව්‍රාජක තෙමේද එක්තරා මිටි අස්නක් ගෙණ එක්පැත්තක හුන්නේය. එක්පැත්තක හුන්නාවූ සන්දක නම් පරිව්‍රාජකයාට ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම මෙසේ කීය. "සන්දකය, දැන් කිනම් කථාවකින් යුක්තව හුන්නහුද, තොපගේ කිනම් අතුරු කථාවක් නතර කරන ලද්දීද?"

"භවත් ආනන්ද ස්ථවිරය, මේ කථාව තිබේවා. අපි යම් කථාවකින් යුක්තව දැන් හුන්නෙමුද, මේ කථාව භවත් ආනන්ද ස්ථවිරයන්ට පසුවද ඇසීමට දුර්ලභ නොවන්නීය. භවත් ආනන්ද ස්ථවිරයන්ටම ස්වකීය ආචාර්යවරයන්ගේ ඉගැන්වීමවූ දැහැමි කථාවක් වැටහේවා. එය මැනවැයි."

"සන්දකය, එසේ වීනම් අසව. යහපත්කොට මෙනෙහි කරව. කියන්නෙමි."

"එසේය, පින්වතුන් වහන්සැයි" සන්දක නම් පරිව්‍රාජක තෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට උත්තර දුන්නේය. ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙම මෙය වදාළේය.

**5.** "සන්දකය, ඒ දන්නාවූ දක්නාවූ සම්‍යක් සම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේ විසින් නුවණැති පුරුෂ තෙමේ යමක් ඒකාන්ත උතුම් හැසිරීමකැයි නොවසන්නාවූද වසන්නේ වී නමුත් සම්බන්ධය කුසල ධර්ම මාර්ගයයි, සිත් නොගන්නාවූද අබ්‍රහ්මචරිය වාස සතරක්ද අස් වැසීමක් නැති බ්‍රහ්මචරිය වාස සතරක්ද ප්‍රකාශ කරණ ලද්දාහ."

"භවත් ආනන්ද ස්ථවිරයෙනි, දන්නාවූ දක්නාවූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් යමක් නුවණ ඇති පුරුෂ තෙම බ්‍රහ්මචරියාවකැයි නොවසන්නේද වසන්නේ හෝ කුසල ධර්ම මාර්ගයයි සිත් නොගන්නේද එවැනි කවර නම් අබ්‍රහ්මචරියවාස සතරක් ප්‍රකාශ කරණ ලද්දාහුද".

**6.** "සන්දකය මේ ලෝකයෙහි ඇතැම් ශාස්තෘවරයෙක් (ආගම් කතෘවරයෙක්) මෙබඳු වාද ඇත්තේ මෙබඳු දෘෂ්ටි ඇත්තේවෙයි. 'දන් දීමෙන් පලක් නැත. පූජා කිරීමෙන් පලක් නැත. පුද පඬුරු දීමෙන් පලක් නැත. යහපත් අයහපත්

කර්මයන්ගේ ඵලයක් විපාකයක් නැත පරලොව වසන්නවුන්ගේ මෙලොව ඉපදීමක් නැත. මෙලොව වසන්නවුන්ගේ පරලොව ඉපදීමක් නැත. මවට කරණ හොඳ නරකවල විපාක නැත. පියාට කරන හොඳ නරකවල විපාක නැත. මළ පසු නැවතද උපදනා සත්වයෙක් නැත. යමෙක් තුමූ මේ ලොකයද පරලොකයද තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරෙත්ද, එබඳුවූ යහපත් මගට පැමිණියාවූ යහපත් මාර්ගයෙහි පිළිපන්නාවූ මහණ බමුණෝ ලොකයෙහි නැත්තාහ. මේ පුරුෂතෙම සතර මහා භූතයන්ගෙන් හටගත්තාවූ යම් කලෙක මැරෙයිද එකල්හි ශරීරයේ පෘථිවි ධාතුව පිටත පෘථිවිධාතුවට එක්වෙයි. අනුව යයි. ආපොධාතුව ආපොධාතුවට එක්වෙයි. අනුව යයි. තෙජො ධාතුව තෙජො ධාතුවට එක්වෙයි. අනුව යයි. වායො ධාතුව වායො ධාතුවට එක්වෙයි. අනුව යයි. ඉන්ද්‍රියයෝ අහසට යත්. ඇඳ පස්වෙනි කොට ඇති පුරුෂයෝ මලහු ගෙනයත්. පින් කෙළේය පවු කෙළේ යන ගුණයද සොහොන දක්වා පමණක් පැනෙත්. පරෙවියන්ගේ පාටට බඳු පාට ඇති ඇට ඉතිරි වෙත්. දෙනලද දන්පුද අලුවලින් කෙලවර විය. දානය නම් මෝඩයන් විසින් පනවන ලද්දකි. යම් කිසිවෙක් කරණ ලද කර්මයෙහි විපාක ඇතැයි කියත්ද, එය ඔවුන්ගේ හිස්වූ මුසාවූ ප්‍රලාපයකි. බාලයෝත් පණ්ඩිතයෝත් ශරීරයාගේ භේදයෙන් සිඳෙත්, විනාශ වෙත්, මරණින් මත්තෙහි නොවෙත්යයි කියත්ද.

"සන්දකය, එහි නුවණ ඇති පුරුෂ තෙම මෙසේ කල්පනා කරයි. මේ පින්වත් ශාස්තෘ තෙමේ වනාහි මෙබඳු වාද ඇත්තේ මෙබඳු දෘෂ්ටි ඇත්තේ වෙයි. දීමෙන් පලක් නැත. පූජා කිරීමෙන් පලක් නැත. පුද පඬුරු යැවීමෙන් පලක් නැත. කරණ ලද හොඳ නරක කර්මයන්ගේ ඵලයක් විපාකයක් නැත. පරලොව වසන්නවුන්ගේ මෙලොව ඉපදීමක් නැත. මෙලොව වසන්නවුන්ගේ පරලොව ඉපදීමක් නැත. මවට කරන හොඳ නරකවල විපාක නැත. පියාට කරන හොඳ නරකවල විපාක නැත. මළ පසු උපදින්නෙක් නැත. යම් කෙනෙක් මේ ලෝකයද පරලෝකයද තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට

ප්‍රකාශ කෙරෙත්ද? ලොකයෙහි එබඳුවූ යහපත් මාර්ගයට පැමිණියාවූ මනාව පිළිපන්නාවූ මහණ බමුණෝ නැත්තාහුය. සතර මහා භූතයන්ගෙන් හටගත්තාවූ මේ පුරුෂ තෙම යම් කලෙක මැරෙයිද, එකල්හි ශරීරයේ පෘථිවි ධාතු පිටත පෘථිවි ධාතුවට එක්වෙයි. අනුව යයි. ආපො ධාතුව ආපොධාතුවට පැමිණෙයි. අනුව යයි. තෙජො ධාතුව තෙජො ධාතුවට එක්වෙයි. අනුව යයි. වායො ධාතුව වායො ධාතුවට එක්වෙයි. අනුව යයි. ඉන්ද්‍රියයෝ අහසට යත්. ඇඳ පස්වෙනි කොට ඇති පුරුෂයෝ මළහු ගෙන යත්. සොහොන දක්වා ගුණ අගුණ කීම් පැනෙත්. පරෙවියන්ට බඳු පාට ඇති ඇට ඉතිරි වෙත්. කරන ලද දාන පූජා හලුවීමෙන් කෙළවර වෙත්. මේ දානය වනාහි මෝඩයන් විසින් පනවන ලද්දකි. යම් කිසි කෙනෙක් දානයෙහි විපාක ඇත යනාදිය කියත්ද, එය ඔවුන්ගේ හිස්වූ බොරු කථාවකි, අඥානයෝද පණ්ඩිතයෝද ශරීරයාගේ බිඳීමෙන් සිඳෙන්නාහුය. විනාශවන්නාහුය. මරණින් මත්තෙහි නොවෙත්යයි කියත්ද ඉදින් මේ පින්වත් ශාස්තෘහුගේ වචනය සත්‍ය වේ නම් මා විසින් මොහුගේ ශාසනයෙහි නොකරනලද මහණ කමක් කරණ ලදී.

මා විසින් මොහුගේ ශාසනයෙහි නොවසනලද බ්‍රහ්ම චර්යාවක් වසන ලදී. මේ මහණෙදම්හි ශාස්තෘ ශ්‍රාවක යන අපි දෙදෙනම ගුණයෙන් සමවූවාහු සමාන බවට පැමිණියාහු වෙමු. යම් ඒ මම ශරීරයාගේ භේදයෙන් දෙදෙනම සිඳෙන්නෙමු. නැසෙන්නෙමු. මරණින් මත්තෙහි නොවන්නෙමුයි, නොකියමි. මේ පින්වත් ශාස්තෘහුගේ වනාහි නග්න බව මුඩු බව උක්කුටුකව වීර්ය කිරීම හිසකේ රැවුල් ඉදිරීම වැඩියක්වේ. යම් ඒ මම අඹු දරුවන්ගේ පීඩා සහිත සයනයෙන් යුක්තව වාසය කරමින් කසී වස්ත්‍ර සඳුන් පරිභොග කරමින් මල් ගඳ විලවුන් දරමින් රන් රිදී ඉවසමින් මේ පින්වත් ශාස්තෘවරයා හා පරලෙව්හි සමාන ගති ඇත්තෙක් වන්නෙමි. ඒ මම කුමක් දැන කුමක් දැක මේ ශාස්තෘන් වෙත බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙම්දැයි හෙතෙම මේ බ්‍රහ්මචර්ය වාසයක් නොවේයයි මෙසේ දැන ඒ බ්‍රහ්මචර්යයෙන් කලකිරී බැහැර යෙයි. සන්දකය, මේ වනාහි ඒ දන්නාවූ දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ භාග්‍යවතුන්

වහන්සේ විසින් ප්‍රකාශ කරණ ලද්දාවූ නුවණ ඇති පුරුෂ තෙම ඒකාන්තයෙන් නොවසන්නාවූද, වාසය කරන්නේ හෝ කුසලධර්ම මාර්ගයෙකැයි සතුටු නොවන්නාවූද මේ පළමුවන අබ්‍රහ්මචර්ය වාසයවේ.

7. "සන්දකය, නැවත අනිකක්ද කියමි. මේ ලොකයෙහි ඇතැම් ශාස්තෲ කෙනෙක් මෙබඳු වාද ඇත්තේ වෙයි. මෙබඳු දෘෂ්ටි ඇත්තේ වෙයි. 'පව්කරන්නාහටද පවු කරවන්නාහටද අනුන්ගේ අත් පා ආදිය සිඳින්නාහටද සිඳුවන්නාහටද, අනුන් පෙළන්නාහටද, අනුන් පෙළඹවන්නාහටද අනුන්ට ශොක කරන්නාහටද කරවන්නාහටද අනුන් වෙහෙස කරන්නාහටද, කරවන්නාහටද සතුන් මරන්නාහටද, සොරකම් කරන්නාහටද, ගෙවල් බිඳින්නාහටද, ගම් පහරන්නාහටද එක ගෙයක් බිඳින්නාහටද මං පහරන්නාහටද අන් අඹුවන් කරා යන්නා හටද බොරු කියන්නා හටද, ඕනෑ කමින්මපවු කරන්නා හටද පාපය සිදු නොවේ. මුවහත් ආයුධවලින් යුත් චක්‍රයකින් යමෙක් මේ පොළොවෙහි සතුන් එක මස් ගොඩක් එක මස් රැසක් කරන්නේ නම් ඒ හෙතුවෙන්ද පාපයක් නැත්තේය. පාපයාගේ පැමිණීමක් නැත්තේය. ඉදින් ගංගානම් ගඟේ දකුණු ඉවුරටද අනුන් මරමින් මරවමින් අත් පා සිඳිමින් සිඳුවමින් අනුන් පෙළමින් පෙළවමින් යන්නේ නම් ඒ හේතුවෙන්ද පාපයක් නැත්තේය. පාපයාගේ පැමිණීමක් නැත්තේය. ඉදින් ගංගානම් ගඟේ උතුරු ඉවුරටද දෙමින් දෙවමින් පුදමින් පුදවමින් යන්නේ නම් ඒ හෙතුවෙන්ද පිනක් නැත්තේය. පින් පැමිණීමක් නැත්තේය. දීමෙන් ඉන්ද්‍රිය දමනයෙන් සංවරයෙන් සත්‍ය වචනයෙන් පිනක් නැත්තේය. පින් පැමිණීමක් නැත්තේයයි කියත්ද, සන්දකය, ඒ ශාසනයෙහි නුවණ ඇති පුරුෂ තෙම මෙසේ කල්පනා කරයි. 'මේ භවත් ශාස්තෲ තෙමේ වනාහි මෙබඳු වාද ඇත්තෙක් මෙබඳු දෘෂ්ටි ඇත්තෙක් වේ. පව් කරන්නාහට, පව් කරවන්නාහට, අත් පා ආදිය සිඳින්නාහට සිඳුවන්නාහට අනුන් පෙළන්නාහට පෙළවන්නාහට අනුන් ශොකකරන්නාහට ශොක කරවන්නාහට අනුන් වෙහෙස කරන්නාහට කරවන්නාහට සතුන් මරන්නාහට සොරකම්

කරන්නාහට ගෙවල් බිඳින්නාහට ගම් පහරන්නා හට එක් ගෙයක් බිඳින්නාහට, මං පහරන්නාහට, බොරු කියන්නාහට, ඕනෑකමින්ම පවු කරන්නාහට අන් අඹුවන් කරා යන්නාහට, පාපයක් සිදු නොවේ. මුවහත් ආයුධ ඇති චක්‍රයෙන්ද, ඉදින් යමෙක් මේ පොලොවෙහි සතුන් එක මස් ගොඩක් එක මස් රැසක් කරන්නේ නම් ඒ හෙතුවෙන් පාපයක් නැත්තේය. පාපය පැමිණීමක් නැත්තේය. ඉදින් ගංගානම් ගඟේ දකුණු ඉවුරටද මරමින් මරවමින් සිඳිමින් සිඳවමින්. පෙළමින් පෙලවමින් යන්නේ නම් ඒ හෙතුවෙන්ද පාපයක් නැත්තේය. පාපයාගේ පැමිණීමක් නැත්තේය. ඉදින් ගංගානම් ගඟේ උතුරු ඉවුරටද දෙමින් දෙවමින්, පුදමින් පුදවමින් යන්නේ නම් ඒ හෙතුවෙන්ද, පිනක් නැත්තේය. පින් පැමිණීමක් නැත්තේය. දීමෙන් ඉන්ද්‍රිය දමනයෙන් සංවරයෙන් සත්‍ය වචනයෙන් පිනක් නැත. පින් පැමිණීමක් නැතැයි කියන්නේද ඉදින් පින්වත් ශාස්තෲහුගේ වචනය සත්‍යය නම් මා විසින් මේ ශාසනයෙහි කරණලද නොකරනලද මේ ශාසනයෙහි මා විසින් නොවසනලද බ්‍රහ්මචර්යාවක් වසනලදී. අපි දෙදෙනම මෙහි සම සම ගුණ ඇත්තාහු සමාන බවට පැමිණියාහු වෙමු. යම් ඒ මමත් පවු කරන්නාවූ අප දෙදෙනාට පාපය නොවේයයි නොකියමි. මේ භවත් ශාස්තෲහුගේ වනාහි නග්න බව මුඩු බව උක්කුටුකව වීර්ය කිරීම හිසකේ රැවුල් ඉදිරීම වැඩිවූවක් වේ. යම් ඒ මම පුත්‍ර සම්බාධ ඇත්තාවූ සයනයෙන් යුක්තව වාසය කරමින් කසී වස්ත්‍රයන් පරිභොග කරමින් මල්ගඳ විලවුන් දරමින් රන් රිදී ඉවසමින් මේ මේ භවත් ශාස්තෲන් වහන්සේ හා සම සමවූ ගති ඇතිව පරලෙව්හි වන්නෙ ඒ මම කුමක් දැන කුමක් දැක මේ ශාස්තෲන්වෙත බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙන්නෙම්දැයි හෙතෙම මේ අබ්‍රහ්මචරිය වාසයයි. මෙසේ දැන ඒ බ්‍රහ්මචර්යාවෙන් කලකිරී බැහැර යෙයි. සන්දකය, මේ වනාහි දන්නාවූ දක්නාවූ අර්හත් සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ කරණ ලද නුවණ ඇති පුරුෂ තෙම ඒකාන්තයෙන් බ්‍රහ්මචර්යාවෙහි නොවසන්නාමද වාසය කරන්නේ හෝ කුසල

ධර්ම මාර්ගයයි. සතුටු නොවන්නාවූද දෙවන අබ්‍රහ්මචර්ය වාසය වේ.

8. සන්දකය නැවත අනිකක්ද කියමි. මේ ලොකයෙහි ඇතැම් ශාස්තෘවරයෙක් මෙබඳු වාද ඇත්තේ මෙබඳු දෘෂ්ටි ඇත්තේ වෙයි. 'සත්වයන්ගේ කෙලසීමට හෙතුවක් ප්‍රත්‍යයක් (කරුණක්) නැත. හෙතුවක් නැතුව ප්‍රත්‍යයක් නැතුව සත්වයෝ කෙලෙසෙන්නාහුය. සත්වයන්ගේ පිරිසිදුවීමට හෙතුවක් ප්‍රත්‍යයක් නැත. හෙතුවක් ප්‍රත්‍යයක් නැතිවම සත්වයෝ පිරිසිදු වෙත්. සත්වයන්ගේ පිරිසිදු වීමට හා අපිරිසිදුවීමට බලයක් නැත. වීර්යයක් නැත. පුරුෂ ශක්තියක් නැත. පුරුෂ පරාක්‍රමයක් නැත. සියලු සත්වයෝ සියලු ප්‍රාණීහු සියලු භූතයෝ සියලු ජීවයක් ඇත්තෝ වසඟයක් නැතිව බලයක් නැතිවම වීර්යයක් නැතිවම එක්තරා නියමයකින් ඒ ඒ ජාතිවල ඉපිද සුවදුක් දෙක විඳිත්යයි කියත්. සන්දකය, ඒ ශාසනයෙහි නුවණ ඇති පුරුෂ තෙම මෙසේ සලකයි. "මේ පින්වත් ශාස්තෘතෙමේ වනාහි මෙබඳු වාද ඇත්තෙක් මෙබඳු දෘෂ්ටි ඇත්තෙක් වේ. සත්වයන්ගේ කෙලසීමට හෙතුවක් ප්‍රත්‍යයක් නැත. හෙතුවක් ප්‍රත්‍යයක් නැතිවම සත්වයෝ කෙලෙසෙන්නාහුය. සත්වයන්ගේ පිරිසිදුවීම හෙතුවක් ප්‍රත්‍යයක් නැතුවම සත්වයෝ පිරිසිදු වෙත්. පිරිසිදුවීමට හා අපිරිසිදුවීමට බලයක් වීර්යයක් පුරුෂ ශක්තියක් පුරුෂ පරාක්‍රමයක් නැත. සියලු සත්වයෝ සියලු ප්‍රාණීහු සියලු භූතයෝ සියලු ජීවයෝ වසඟයක් නැතිවම බලයක් නැතිවම වීර්යයක් නැතිවම එක්තරා නියමයකින් ඒ ඒ ජාතිවල ඉපද සැප දුක් දෙක විඳිත්යයි' කියත්. ඉදින් මේ පින්වත් ශාස්තෘහුගේ වචනය සත්‍යනම් මා විසින් මේ ශාසනයෙහි මහණකමක් මා විසින් නොවසනලද බ්‍රහ්මචර්යාවක් නොකරන ලද අපි දෙදෙනම මෙහි සම සම ගුණ ඇත්තාහු. සමාන බවට පැමිණියාහු වෙමු. 'යම් ඒ මම දෙදෙන හෙතුවක් නැතුව ප්‍රත්‍යයක් නැතුව පිරිසිදු වන්නෙමුයි නොකියමි. මේ භවත් ශාස්තෘහුගේ වනාහි නග්න බව මුඩු බව උක්කුටුකයෙන් වීර්ය කිරීම හිසකේ රැවුල් ඉදිරීම වැඩියක් වේ. යම් බඳු මම අඹුදරු සම්බාධ ඇති සයනයෙන් යුක්තව වාසය කරමින් කසී වස්ත්‍ර සඳුන් පරිභොග කරමින්

මල් ගඳ විලවුන් දරමින් රන් රිදී පිළි ගනිමින් මේ පින්වත් ශාස්තෘන් හා පරලෙව්හි සම සමව ගති ඇත්තෙක් වන්නෙමි. එබඳු මම කුමක් දැන කුමක් දැක මේ ශාස්තෘ වෙත මහණ කමෙහි හැසිරෙන්නෙම් දැයි, හෙතෙම මේ අබ්‍රහ්මචර්ය වාසයයි, මෙසේ දැන ඒ මහණකමෙහි කලකිරී බැහැරයෙයි. සන්දකය, මේ වනාහි දන්නාවූ දක්නාවූ අර්හත් සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ කරණ ලද්දාවූ නුවණ ඇති පුරුෂ තෙම ඒ කාන්තයෙන් බ්‍රහ්මචර්යාවෙහි නොවසන්නාවූද, වසන්නේ හෝ කුසල ධර්ම මාර්ගයයි සතුට නොවන්නාවූද ඒ තුන්වන අබ්‍රහ්මචාර්ය වාසය වේ.

**9.** "සන්දකය, නැවතද අනිකක් කියමි. මේ ලොකයෙහි ඇතැම් ශාස්තෘවරයෙක් මෙබඳු වාද ඇත්තේ මෙබඳු දෘෂ්ටි ඇත්තේ වෙයි. නොකරණ ලද්දාවූ නොකළ විධාන ඇත්තාවූ නිර්මිත නොකරණ ලද්දාවූ නිර්මිත නොකරවන ලද්දාවූ වඳවූ පර්වතකූට මෙන් සිටියාවූ මහකණුවක් මෙන් සිටියාවූ මේ කොටස් සතක් වෙත්. ඔව්හු කම්පා නොවෙත්. නොපෙරලෙත්. ඔවුනොවුන්ට පීඩා නොකෙරෙත්. අන්‍යොන්‍යයන්ගේ සැපය පිණිස හෝ දුක පිණිස හෝ සැප දුක් පිණිස හෝ සමර්ථ නොවෙත්. කවර සතක්ද යත්? පෘථිවිධාතු සමූහය, ආපෝධාතු සමූහය, තේජෝධාතු සමූහය, වායෝධාතු සමූහය, සැපය දුකය ජීවිතෙන්ද්‍රියය යන මේ සතයි. මේ සමූහ සත නොකරණ ලද්දාවූ, නොකළ විධාන ඇත්තාවූ, නොමවන ලද්දාවූ, මැවීම නොකරවන ලද්දාවූ, වඳවූ, පර්වතකූට මෙන් සිටියාවූ කණු මෙන් සිටියාවූ, ස්ථිරව සිටියාවූ, කොටස් සත වෙත්. ඔව්හු කම්පා නොවෙත්. නොපෙරළෙත් ඔවුනොවුන් නොපෙළත්. ඔවුනොවුන්ගේ සැපය පිණිස හෝ දුක පිණිස හෝ සැප දුක් පිණිස හෝ සමර්ථ නොවෙත්. එහි නසන්නෙක් හෝ, නැසීම් කරවන්නෙක් හෝ, අසන්නෙක් හෝ, ඇසීම් කරවන්නෙක් හෝ, දැනගන්නෙක් හෝ, දැනගැණීම කරවන්නෙක් හෝ නැත්තේය. යම් කෙනෙකුන් තියුණුවූ ශස්ත්‍රයෙන් (ආයුධයෙන්) හිස සිඳීද, කිසිවෙක් කිසිවක්හු ජීවිතයෙන්ද තොර නොකෙරෙයි. සත්වැදෑරුම්වූම සමූහ අතරෙන් ආයුධය විවරයට පැමිණෙයි.

මේ ප්‍රධාන යෝනි තුදුස්ලක්ෂයක් වෙත්. හැටසියයක්ද, සසියයක්ද වෙත්. කර්මය පිළිබඳ පන්සියයක්ද කර්ම පසක්ද, කර්ම තුනක්ද, කර්ම දෙකක්ද, අර්ධ කර්මයන්ද, දෙසැට දෘෂ්ටි ප්‍රතිපදාද, දෙසැට අන්තර කල්පයෝද, සවැදෑරුම් අභිජාතීහුද, පුරුෂභූමි අටක්ද ආජීවක වෘත්ති එකුන්පණස්සියයක්ද පරිව්‍රාජක ප්‍රව්‍රජ්‍යා එකුන්පණස්සියයක්ද, ඉන්ද්‍රිය සියක්විස්සක්ද, නිරය සියක් තිසක්ද, රජෝධාතූන් (රජස් විසිරෙන තැන්) සතිසක්ද, සංඥා ඇති ගර්භ සතක්ද, සංඥා නැති ගර්භ සතක්ද, නිගණ්ඨි ගර්භ සතක්ද, දෙවියෝ සත්දෙනෙක්ද, මිනිස්සු සත්දෙනෙක්ද, පිසාචයෝ සත්දෙනෙක්ද, මහවිල් සතක්ද, ගණ්ඨිකා (ගැට) සතක්ද, මහා ප්‍රපාත සතක්ද, කුඩා ප්‍රපාත සත්සියයක්ද, මහා සිහින සතක්ද, කුඩා සිහින සත්සියයක්ද, යමක්හු බාලයෝද, පණ්ඩිතයෝද, සන්ධාහනය කොට ගමන්කොට දුක්ඛයාගේ කෙළවර කරන්නාහුද, එබඳු මහා කල්ප සම්බන්ධ අසූහතර ලක්ෂයක් වෙත්. එහි මම මේ සීලයෙන් හෝ මේ වෘතයෙන් හෝ මේ තපසින් හෝ මේ බ්‍රහ්මචර්යාවෙන් හෝ නොපැසුනාවූ කර්මය හෝ පැසවන්නෙමි. පැසවූ කර්මය හෝ ස්පර්ශ කර කෙළවර කරන්නෙමියි, මෙසේ ද්‍රොණයෙන් මැන්නාක් මෙන් කෙළවර කරණ ලද සුවදුක් සංසාරයෙහි නැත්තේය. පිරිහීම හා වැඩීම නැත්තේය. උස් පහත්වීම නැත්තේය. යම්සේ නූල්බෝලයක් දැමූ කල්හි ලිහනු ලැබීමටම පැමිණේද, මෙපරිද්දෙන්ම අඥානයෝද, නුවණැත්තෝද සන්ධාවාහනය කොට, ගමන්කොට දුක් කෙළවර කරන්නාහුයයි කියත්.

10. "සන්දකය, එහි නුවණැති පුද්ගල තෙමේ මෙසේ සලකයි. මේ පින්වත් ශාස්තෘ තෙමේ වනාහි මෙබඳු වාද ඇත්තේ මෙබඳු දෘෂ්ටි ඇත්තේ වේ. නොකරණ ලද්දාවූ නොකරණ ලද විධාන ඇත්තාවූ නොමවන ලද්දාවූ මැවීම නොකරවන ලද්දාවූ වඳවූ පර්වත මෙන් සිටියාවූ නගර දොරටු කණුව මෙන් සිටියාවූ මේ කොටස් හතක් වෙත්. ඔව්හු කම්පා නොවෙත්. වෙනස් නොවෙත්. එකිනෙකට බාධා නොකරත්. ඔවුනොවුන්ගේ සැප පිණිස හෝ දුක් පිණිස හෝ සැප දුක් දෙක පිණිස හෝ සමර්ථ වෙත්. කවර සතක්ද යත්? පෘථිවි ධාතු සමූහය, වායො ධාතු

සමූහය, සැපය දුකය ජීවිතෙන්ද්‍රිය යන මේ සතයි. මේ කොටස් හත නොකරන ලද්දාහු, නොකරවන ලද්දාහු, නොමවන ලද්දාහු නොමවවන ලද්දාහු, පර්වත මෙන් සිටියාහු, නගර දොරටු කණු මෙන් සිටියාහු වෙත්. ඔව්හු නොසෙල්වෙත්. වෙනස් නොවෙත්. ඔවුනොවුන්ට බාධා නොකරත්. ඔවුනොවුන්ගේ සැපය පිණිස හෝ දුක පිණිස හෝ සැප දුක් දෙක පිණිස හෝ සමර්ථ නොවෙත්. ඒ කොටස් සතෙහි නසන්නෙක් හෝ නස්වන්නෙක් හෝ අසන්නෙක් හෝ අස්වන්නෙක් හෝ දැනගන්නෙක් හෝ දැනගන්වන්නෙක් හෝ නැත්තේය. යමෙක් තියුණුවූ ආයුධයකින් යමෙකුගේ හිසසිඳීද, කිසිවෙක් කිසිවකුත් ජීවිතයෙන් තොර නොකෙරෙයි. සත්වැදෑරුම් කොටස් අතරෙන් ආයුධය සිදුරු ඔස්සේ යයි. මේ ප්‍රධාන වර්ග දාහතර ලක්ෂයක් වෙත්. අනික් වර්ග හයදාස්හයසියයක්ද හයසියයක්ද වෙත්. කර්ම පන්සියයක්ද, කර්ම පසක්ද, කර්ම තුනක්ද, කර්මයන්ද, අර්ධ කර්මයන්ද, දෙසැටක් ප්‍රතිපදාද, හැට දෙකක් අතුරු කල්පද, අභිජාති සයක්ද, පුරුෂභූමි අටක්ද, ආජීවක පැවතුම් එක්සියහතලිස්නවයක්ද, පරිව්‍රාජක මහණකම් එක්සියහතලිස්නවයක්ද, නාගමණ්ඩල සතයන් එක්සියහතලිස්නවයක්ද, ඉන්ද්‍රියයන් දෙදහසක්ද, නිරය තුන්දහසක්ද, අත්පුටු පාපුටු ආදිය සතිසක්ද, ඔටු ගොන් ආදී ජාති සතක්ද, හැල් යව ආදී ජාති සතක්ද, උක් හුණබට ආදී ජාති සතක්ද, දෙවියෝ සත්දෙනෙක්ද, මනුෂ්‍යයෝ සත්දෙනෙක්ද, පිසාචයෝ සත්දෙනෙක්ද, මහවිල් සතක්ද, ගණ්ඨිකා සතක්ද, මහා ප්‍රපාත සතක්ද, කුඩා ප්‍රපාත හත්සියයක්ද, මහා සිහින සතක්ද, කුඩා සිහින හත්සියයක්ද වෙත්. යමක්හු බාලයෝද, පණ්ඩිතයෝද ගමන්කොට දුක් කෙළවර කරන්නාහුද, එබඳු මහාකල්ප අසූහතරලක්ෂයක්ද වෙත්. එහි මම මේ සීලයෙන් හෝ ව්‍රතයෙන් හෝ තපසින් හෝ බ්‍රහ්මචර්යාවෙන් හෝ නොපැසුනාවූ කර්මය හෝ පැසවන්නෙමි. පැසුනාවූ කර්මය හෝ විඳ විඳ කෙළවර කරන්නෙමියි, මෙසේ ද්‍රොණයෙන් (නැලි සතරක බඳුන) මැන්නාක් මෙන් සීමා කළාවූ සැප දුක් සසර නැත්තේය. පිරිහීමක් වැඩීමක් නැත්තේය. උස් පහත්කම් නැත්තේය. යම්සේ නම් නූල් බෝලයක් බිමට දැමූ කල්හි

ලිහෙමින් වැටෙයිද, මෙපරිද්දෙන්ම අඥානයෝද, පණ්ඩිතයෝද සසර ගමන්කොට දුක් කෙළවර කරන්නාහුයයි එහි සුවණැති පුරුෂතෙමේ කියත්.

"ඉදින් මේ පින්වත් ශාස්තෘහුගේ වචනය සත්‍ය නම්, මා විසින් මෙහි නොකරන ලද්දක් කරණ ලදී. මා විසින් මෙහි නොවැසුවාවූ බ්‍රහ්මචර්යාවක් වසන ලදී. අපි දෙදෙනම මෙහි සම සම ගුණ ඇත්තෝ සමාන බවට පැමිණියෝ වෙමු. යම්බඳුවූ මමද දෙදෙන ගමන්කොට දුක් කෙළවර කරන්නෙමුයි නොකියමි. මේ පින්වත් ශාස්තෘහුගේ නග්න බව, මුඩුබව, උක්කුටුකයෙන් වීර්යකිරීම, හිසකේ රැවුල් ඉදිරීම වැඩියක්ම වේ. යම්බඳු මම අඹුදරුවන්ගේ කරදර ඇති සයනයෙන් යුක්තව වාසය කරමින් කසීවස්ත්‍ර සඳුන් පරිභොගකරමින් මල්ගඳ විලවුන් දරමින් රන්රිදී ඉවසමින් මේ පින්වත් ශාස්තෘන් හා පරලෙවිහි සම සම ගති ඇත්තෙක් වන්නෙමි. ඒ මම කුමක් දැන කුමක් දැක මේ ශාස්තෘන් වෙත බ්‍රහ්මචාර්යාවෙහි හැසිරෙන්නෙම්දැයි සිතා හෙතෙම මේ අබ්‍රහ්මචර්ය වාසයයි. මෙසේ දැන ඒ බ්‍රහ්මචර්යාවෙන් කලකිරී බැහැර වෙයි.

11. "සන්දකය, යම් තැනෙක්හි නුවණ ඇති පුරුෂතෙම ඒකාන්තයෙන් බ්‍රහ්මචර්යාවෙහි නොවසන්නේද, වසන්නේ හෝ කුසල ධර්ම මාර්ගයයි සතුටු නොවන්නේද?"

සන්දකය, යම් තැනෙක්හි නුවණැති පුරුෂ තෙමේ බ්‍රහ්මචර්යාවෙහි නොවසන්නේද, වසන්නේ හෝ ඒකාන්තයෙන් කුසල ධර්ම මාර්ගයයි සතුටු නොවන්නේද, දන්නාවූ, දක්නාවූ, අර්හත් සම්‍යක්සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ කරණ ලද්දාවූ ඒ මේ අබ්‍රහ්මචර්ය වාස සතර වෙත්.

12. "පින්වත් ආනන්ද ස්ථවිරයෙනි, යම් තැනෙක්හි නුවණ ඇති පුරුෂතෙම ඒකාන්තයෙන් බ්‍රහ්මචර්යාවෙහි නොවසන්නේද, වසන්නේ හෝ කුසල ධර්ම මාර්ගයයි සතුටු නොවන්නේද, දන්නාවූ දක්නාවූ අර්හත් සම්‍යක්සම්බුද්ධ වූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ කරණ ලද්දාවූ අස්වැසීමක් නැති ඒ බ්‍රහ්මචර්යා සතර කවරහුද?"

13. "සන්දකය, මේ ලොකයෙහි ඇතැම් ශාස්තෘවරයෙක් සර්වඥව, සියල්ල දක්නෙක්ව සුළුවූයේ යන්නාවූද, සිටින්නාවූද නිදන්නාවූද, නොනිදන්නාවූද, මට නිරන්තරයෙන් සියල්ල නුවණින් දැකීම එළඹ සිටියේයයි සියල්ල දක්නා ඥානයක් ඇතැයි ප්‍රකාශ කෙරේද, හෙතෙම හිස් ගෙයටද පැමිණෙයි. පිණ්ඩපාතයද නොලබයි. බල්ලෙක්ද ඔහු දෂ්ටකරයි. නපුරු ඇතෙකුටද සම්මුඛවෙයි. නපුරු අශ්වයෙකුටද සම්මුඛවෙයි. නපුරු ගොනෙකුටද සම්මුඛවෙයි. ස්ත්‍රියගේද පුරුෂයාගේද නමද ගොත්‍රයද අසයි. ගමකද, මහගමකද නමද මගද අසයි. හෙතෙම මේ කුමක්දැයි අසන ලද්දේ හිස් ගෙයකට මා විසින් පැමිණිය යුතු වූයේය. එහෙයින් පැමිණියෙමි. මා විසින් පිණ්ඩපාතය නොලැබිය යුතු වූයේය. එහෙයින් නොලැබුවෙමි. බල්ලා විසින් දෂ්ට කළ යුතු වූයේය. එහෙයින් දෂ්ට කරණ ලද්දේ වෙමි. නපුරු ඇතෙකුට සම්මුඛ විය යුතු වූයේය. එහෙයින් සම්මුඛ විය. නපුරු අශ්වයෙකුට සම්මුඛ විය යුතු වූයේය. එහෙයින් සම්මුඛ විය. නපුරු ගොනෙකුට සම්මුඛ විය යුතු වූයේය. එහෙයින් සම්මුඛ විය. ස්ත්‍රියගේද පුරුෂයාගේද නමද ගොත්‍රයද ඇසිය යුතු වූයේය. එහෙයින් ඇසුවෙමි. ගමක නියම්ගමක නමද මගද ඇසිය යුතු වූයේය. එහෙයින් ඇසුවෙමියි කියයි.

14. "සන්දකය, එහි නුවණ ඇති පුරුෂ තෙම මෙසේ සලකයි. මේ පින්වත් ශාස්තෘ තෙමේ වනාහි සර්වඥව සියල්ල දක්නෙක්ව යන්නාවූද, සිටින්නාවූද, නිදන්නාවූද, නොනිදන්නාවූද, මට නිරන්තරයෙන් සියල්ල නුවණින් දැකීම එළඹ සිටියේයයි නිරවශෙෂවූ ඥාන දර්ශනයක් ප්‍රකාශ කෙරෙයි. හෙතෙම හිස්වූ ගෙයටද පැමිණෙයි. පිණ්ඩපාතයද නොලබයි. බල්ලෙක්ද දෂ්ටකරයි. නපුරු ඇතෙකුටද සම්මුඛ වෙයි. නපුරු අශ්වයෙකුටද සම්මුඛ වෙයි. නපුරු ගොනෙකුටද සම්මුඛ වෙයි. ස්ත්‍රියගේද පුරුෂයාගේද නමද ගොත්‍රයද අසයි. ගමකද නියම්ගමකද නමද මගද අසයි. හෙතෙම මේ කුමක්දැයි අසන ලද්දේම මා විසින් හිස්වූ ගෙයකට පැමිණිය විය යුතු වූයේය. එහෙයින් පැමිණියෙමි. මා විසින් පිණ්ඩපාතය නොලැබිය යුතු වූයේය. එහෙයින් නොලැබූවෙමි. බල්ලෙකු විසින් දෂ්ටකළ

යුතු වූයේය. එහෙයින් දක්ට කරණ ලද්දේ වෙමි. නපුරු ඇතෙකුට මුණගැසිය යුතු වූයේය. එහෙයින් මුණගැසුණේය. නපුරු අශ්වයෙකුට මුණගැසිය යුතු වූයේය. එහෙයින් මුණගැසුණේය. නපුරු ගොනෙකුට මුණගැසිය යුතු වූයේය. එහෙයින් මුණගැසුණේය. ස්ත්‍රියකගේද පුරුෂයෙකුගේද නාමයද ගොත්‍රයද ඇසිය යුතු වූයේය. එහෙයින් ඇසුවෙමි. ගමකද නියම් ගමකද නමද මගද ඇසිය යුතු වූයේය. එහෙයින් ඇසුවෙමියි' කියයි. හෙතෙම මේ බ්‍රහ්මචර්යාව අස්වැසීම් රහිතයයි' මෙසේ දැන කලකිරී ඒ බ්‍රහ්මචර්යාවෙන් බැහැර වෙයි.

සන්දකය, මේ වනාහි යම්තැනෙක නුවණැති පුරුෂතෙම ඒකාන්තයෙන් බ්‍රහ්මචර්යාවෙහි නොවසන්නේද වසන්නේ හෝ න්‍යාය වශයෙන් කුශලධර්ම මාර්ගයයි සතුටු නොවන්නේද දන්නාවූ දක්නාවූ අර්හත්වූ සම්‍යක්සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් එබඳු අස්වැසීම් රහිතවූ ප්‍රකාශ කරණ ලද පළමුවන බ්‍රහ්මචර්යාව වේ.

**15.** "සන්දකය, නැවත අනිකක්ද කියමි. මේ ලොකයෙහි ඇතැම් ශාස්තෘවරයෙක් අසන්නෙක් වෙයි. ඇසීම සත්‍යයයි ගන්නෙක් වෙයි. හෙතෙම ඇසීම් වශයෙන් මෙසේ වෙයි. පරම්පරාවෙන් එන වර්ග පණ්ණාසක ඇතුළත් ග්‍රන්ථවලින්ද ධර්මය දෙශනා කරයි.

"සන්දකය, ඇසීමෙන් යුක්තවූ ඇසීම සත්‍යකොට ගත්තාවූ ශාස්තෘවූ විසින් වනාහි මනාකොට අසන ලද්දක්ද වෙයි. නොමනාව අසන ලද්දක්ද වෙයි. අසනලද ආකාරයෙනුත් වෙයි. අන් ආකාරයකිනුත් වෙයි. සන්දකය, එහි නුවණ ඇති පුරුෂ තෙම මෙසේ සලකයි. 'මේ පින්වත් ශාස්තෘ තෙමේ වනාහි ඇසීමෙන් යුක්තවූයේ ඇසීම සත්‍යකොට ගත්තේය. හෙතෙම ඇසීමෙන් මෙසේද මෙසේද වේයයි පරම්පරාවෙන් ග්‍රන්ථවලින් ධර්මය දෙශනා කරයි. ඇසීමෙන් යුක්තවූ ඇසීම සත්‍යකොට ගත්තාවූ ශාස්තෘහු විසින් වනාහි මනාකොට අසන ලද්දක්ද වෙයි. නොමනාව අසන ලද්දක්ද වෙයි. ඇසූ ආකාරයෙනුත් වෙයි. අන් පරිද්දෙකිනුත් වෙයි (යනුවෙනි). හෙතෙම මේ

බ්‍රහ්මචර්යාව අස්වැසීමක් නැතැයි මෙසේ දැන ඒ බ්‍රහ්මචර්යාවෙන් කලකිරී බැහැර වෙයි. සන්දකය, මේ වනාහි පුරුෂ තෙම ඒකාන්තයෙන් බ්‍රහ්මචර්යාවෙහි නොවසන්නේද, වසන්නේ හෝ කුසලධර්ම මාර්ගයයි සතුටු නොවන්නේද දන්නාවූ දක්නාවූ අර්හත්වූ සම්‍යක්සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ කරණ ලද එබඳුවූ අස්වැසීමක් නැත්තාවූ දෙවන බ්‍රහ්මචර්යාව වේ.”

**16.** “සන්දකය, නැවත අනිකක්ද කියමි. මේ ලොකයෙහි ඇතැම් ශාස්තෘවරයෙක් තර්කයෙන් විමසන්නේ වෙයි. හෙතෙම මාර්ගයෙන් පැමිණෙන ලද විමසීම අනුව ගියාවූ තමන්ගේ වැටහීමෙන් ධර්මය දෙශනා කරයි. සන්දකය, තර්ක කරන්නාවූ විමසන්නාවූ ශාස්තෘවරයා විසින් වනාහි මනාව තර්ක කරණ ලද්දක්ද වෙයි. නොමනාව තර්ක කරණ ලද්ද වෙයි. එසේත් වෙයි. අන් පරිද්දෙකිනුත් වෙයි. සන්දකය. එහි නුවණැති පුරුෂ තෙම මෙසේ සලකයි. මේ පින්වත් ශාස්තෘ තෙමේ වනාහි තර්ක කරන්නෙක් විමසන්නෙක් වෙයි. හෙතෙම තර්කයෙන් බැසගන්නාවූ විමසීම අනුව ගියාවූ තමන්ගේ වැටහීම පරිදි ධර්මදෙශනා කරයි. තර්ක කරන්නාවූ විමසන්නාවූ ශාස්තෘ විසින් වනාහි මනාව තර්ක කරණ ලද්දක්ද වෙයි. නොමනාව තර්ක කරණ ලද්දක් වෙයි. එසේත් වෙයි. අන් පරිද්දෙනුත් වෙයි. හෙතෙම මේ බ්‍රහ්මචර්යාව අස්වැසීම් රහිතයයි, මෙසේ දැන ඒ බ්‍රහ්මචර්යාවෙන් කලකිරී බැහැර වෙයි. සන්දකය, මේ වනාහි යම් තැනක නුවණැති පුරුෂ තෙම ඒකාන්තයෙන් බ්‍රහ්මචර්යාවෙහි නොවසන්නේද, වසන්නේ හෝ කුසල ධර්මය මාර්ගයයි සතුටු කරන්නේද දන්නාවූ දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ කරණ ලද එබඳු අස්වැසීමක් නැත්තාවූ තුන්වන බ්‍රහ්මචර්යාව වේ.

**17.** “සන්දකය. නැවත අනිකක්ද කියමි. මේ ලොකයෙහි ඇතැම් ශාස්තෘවරයෙක් මදනුවණ ඇත්තේ අතිශයින් මුලාවූයේ වෙයි. හෙතෙම මදනුවණ ඇති බැවින් අතිශයින් මුලාවූ බැවින් එසේ එසේ ප්‍රශ්න අසන ලද්දේ සීමාවක් නැතිව වචනයෙන්

ඉවත දැමීමට පැමිණෙයි. 'මෙසේත් මට නොවෙයි. එසේත් මට නොවෙයි. අන් පරිදිත් මට නොවෙයි. මට නැත්තේද නොවෙයි. මට නැත්තේ නොවන්නේද නොවේ'යි යනුවෙනි. සන්දකය, එහි නුවණැති පුරුෂ තෙම මෙසේ සලකයි. මේ පින්වත් ශාස්තෘ තෙමේ වනාහි මදනුවණ ඇත්තේ අතිශයින් මුලාවූයේ වෙයි. හෙතෙම මදනුවණ ඇති බැවින් අතිශයින් මුලාවූ බැවින් එසේ එසේ ප්‍රශ්න අසන ලද්දේ සීමාවක් නැති වචනයෙන් ඉවත දැමීමට පැමිණෙයි. 'මෙසේත් මට නොවෙයි. එසේත් මට නොවෙයි. අන් පරිදිත් මට නොවෙයි. මට නොවන්නේද නොවෙයි. මට නොවන්නේ නොවන්නේද නොවේයි' කියායි. හෙතෙම මේ අස්වැසීමක් නැත්තාවූ බ්‍රහ්මචර්යාවයයි මෙසේ දැන ඒ බ්‍රහ්මචර්යාවෙන් කලකිරී බැහැර වෙයි.' සන්දකය, මේ වනාහි යම් තැනක නුවණැති පුරුෂ තෙම ඒකාන්තයෙන් බ්‍රහ්මචර්යාවෙහි නොවසන්නේද වසන්නේ හෝ කුසලධර්ම මාර්ගයයි සතුටු නොවන්නේද, දන්නාවූ දක්නාවූ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ කරණ ලද එබඳු ඇසීමක් නැත්තාහු සතරවන බ්‍රහ්මචර්යාව වේ.

18. "සන්දකය, මොහු වනාහි යම් තැනක නුවණැති පුරුෂ තෙම ඒකාන්තයෙන් බ්‍රහ්මචර්යාවෙහි නොවසන්නේද වසන්නේ හෝ කුසලධර්ම මාර්ගයයි සතුටු නොවන්නේද, දන්නාවූ දක්නාවූ අර්හත්වූ සම්‍යක්සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රකාශ කරණ ලද්දාවූ එබඳුවූ අස්වැසීම් රහිතවූ බ්‍රහ්මචර්යා සතර වෙත්යයි" කීය.

19. "යම් තැනෙක්හි නුවණැති පුරුෂ තෙම ඒකාන්තයෙන් බ්‍රහ්මචර්යාවෙහි නොවසන්නේද, වසන්නේ හෝ කුසලධර්ම මාර්ගයයි සතුටු නොවන්නේද, ඒ දන්නාවූ දක්නාවූ අර්හත්වූ සම්‍යක්සම්බුද්ධවූ භාග්‍යවතුන් වහන්සේ විසින් යම්තාක්ම අස්වැසීමක් නැත්තාවූම බ්‍රහ්මචර්යාවෝයයි ප්‍රකාශ කරණ ලද්දාහුද, භවත් ආනන්ද ස්ථවිරය, ඒ දෙශනා කිරීම ආශ්චර්යයය, භවත් ආනන්ද ස්ථවිරය, පුදුමය.

"භවත් ආනන්ද ස්ථවිරයන් වහන්ස, යම් තැනෙක්හි නුවණැති පුරුෂ තෙම ඒකාන්තයෙන් බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි වසන්නේද, වසන්නේ හෝ කුසලධර්ම මාර්ගයයි සතුටු වන්නේද, යම් ඒ ශාස්තෘවරයෙක් එය කුමකැයි කියන්නේ කුමකැයි ප්‍රකාශ කරන්නේද?

**20.** "සන්දකය, මේ ලොකයෙහි අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ, අෂ්ටවිද්‍යාපසළොස්වරණධර්මයන්ගෙන් යුක්තවූ ශොභන ගමන් ඇත්තාවූ තුන්ලොව දන්නාවූ පුරුෂයන් දමනය කිරීමෙහි උතුම් සාර්ථවාහකයෙකු බඳුවූ දෙවිමිනිසුන්ට අනුශාසනා කරන්නාවූ චතුස්සත්‍යය අවබොධ කළාවූ සියලු ක්ලෙශයන් නැතිකළාවූ තථාගතයන් වහන්සේ පහළ වෙත්. උන්වහන්සේ දෙවියන් සහිතවූ මාරයන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ මේ ලොකය, මහණ බමුණන් සහිතවූ දෙවිමිනිසුන් සහිතවූ ප්‍රජාවද තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශ කෙරෙයි. උන්වහන්සේ මුල යහපත්වූ, මැද යහපත්වූ කෙළවර යහපත්වූ අර්ථ සහිතවූ ව්‍යංජන සහිතවූ ධර්මය දෙශනා කරයි. සියල්ලෙන් සම්පූර්ණවූ පිරිසිදුවූ මාර්ග බ්‍රහ්මචර්‍ය්‍යාව ප්‍රකාශ කරයි. ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ එක්තරා කුලයෙක්හි උපන්නෙක් හෝ ඒ ධර්මය අසයි. හෙතෙම ඒ ධර්මය අසා තථාගතයන් වහන්සේ කෙරෙහි පහදියි. එසේ පැහැදුනාවූ ඔහු මෙසේ සලකයි. ගිහිගෙහි විසීම අවහිර සහිතය, කෙලෙස් දූවිලි උපදින තැනකි, මහණකම වනාහි අවකාශය මෙන් නිදහස්ය. ගිහිගෙයි වසන්නහු විසින් ඒකාන්තයෙන් සම්පූර්ණකොට ඒකාන්තයෙන් පිරිසිදු කොට ලියවන ලද සකක් වැනිවූ මේ ශාසන බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන්ට පහසු නොවෙයි. 'මම හිසකෙස් දැළිරැවුල් කපා දමා, සිවුරු හැඳ ගිහිගෙන් නික්ම වන්නෙම් නම් ඉතා යෙහෙක' (කියායි). හෙතෙම පසුකාලයක ස්වල්පවූ හෝ සම්පත් හැර, බොහෝවූ හෝ සම්පත් හැර, ස්වල්පවූ හෝ නෑදෑ පිරිස් හැර, බොහෝවූ හෝ නෑදෑ පිරිස් හැර, හිසකේ දැළි රැවුල් කපා දමා, සිවුරු හැඳ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙයි. හෙතෙම මෙසේ පැවිදි වූයේම භික්ෂු ශීලයෙන් යුක්තවූයේ ප්‍රාණඝාතය හැර, ප්‍රාණඝාතයෙන් වැලකුනේ වෙයි. බහා තබන

ලද දඬු ඇත්තේ, පව්කිරීමට ලජ්ජා ඇත්තේ, කරුණාවෙන් යුක්තවූයේ සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇතිව වාසය කරයි. නුදුන් දෙය ගැණීම් හැර නුදුන් දෙය ගැණීමෙන් වැලකුනේ වෙයි. දුන් දෙය ගන්නේ දුන් දෙයෙහි බලාපොරොත්තු ඇත්තේ සොරනොවූ පිරිසිදු සිතින් යුක්තව වාසය කරයි.

21. "අබ්‍රහ්මචරියාව හැර උතුම් පැවතුම් ඇත්තේ ස්ත්‍රී පුරුෂ සංසර්ගය නම් ග්‍රාම ධර්මයෙන් වෙන්ව බ්‍රහ්මචාරීවේ. මුසාවාදය හැර, මුසාවාදයෙන් වැලකුනේ සත්‍ය වචන ඇත්තේ සත්‍යයෙන් සත්‍යය ගලපන්නේ ස්ථිර වචන ඇත්තේ ඇදහිය යුතු වචන ඇත්තේ ලොව මුළා නොකරන්නෙක් වෙයි. කේලාම් කීම හැර කේලාම් කීමෙන් වැලකුනේ වෙයි. මෙයින් අසා මොවුන්ගේ බිඳවීම පිණිස එතන්හි නොකියන්නේ වෙයි. එතණින් අසා ඔවුන් බිඳවීම පිණිස මොවුන්ට නොකියන්නේ වෙයි. මෙසේ බිඳනවුන් ගලපන්නේ හෝ සමගිවූවන්ට අනුබල දෙන්නේ හෝ සමගියෙහි ඇලුනේ සමගියට කැමතිවූයේ සමගියට සතුටුවූයේ සමගි කරන වචන කියන්නේ වෙයි. පරුෂ වචනය හැර පරුෂ වචනයෙන් වැලකුනේ වෙයි. යම් ඒ වචනයක් නිර්දොෂද, කණට මිහිරිද, ප්‍රෙමණීයද සිත සතුටු කරයිද, යහපත්ද, බොහෝ දෙනාට ප්‍රියද එබඳු වචන කියන්නේ වෙයි. සම්ඵප්‍රලාපය හැර හිස් කථා කිරීමෙන් වැලකුනේ වෙයි. කාලයට සුදුසු වචන ඇත්තේ සත්‍යවූ වචන ඇත්තේ, අර්ථයෙන් යුත් වචන ඇත්තේ ධර්මයෙන් යුත් වචන ඇත්තේ හික්මීමට සුදුසු වචන ඇත්තේ සුදුසු වචන ඇත්තේ සුදුසු කල්හි කියන කරුණු සහිතවූ සීමා සහිත අර්ථයෙන් යුක්තවූ, හිතෙහි තැන්පත් කටයුතුවූ වචන කියන්නේ වෙයි.

22. "හෙතෙම පැලවෙන තණ, ගස්, වැල් සිඳීම් බිඳීම් ආදියෙන් වැලකුනේ වෙයි. එක් වේලෙහි වළඳන බත් ඇත්තේ රාත්‍රි භොජනයෙන් තොරවූයේ විකල් බොජුනෙන් වැලකුනේ වෙයි. මල් ගඳ විලවුන් සැරසීම් දැරීම් යන මෙයින් වැලකුනේ වෙයි. උස් ආසන මහා ආසනයන්ගෙන් වැලකුනේ වෙයි. රන්

රිදී මසු කහවනු පිළිගැන්මෙන් වැලකුනේ වෙයි. අමුමස් පිළිගැනීමෙන් වැලකුනේ වෙයි. ස්ත්‍රීන් හා කුමරියන් පිළිගැන්මෙන් වැලකුනේ වෙයි. දාසයන් හා දාසීන් පිළිගැන්මෙන් වැලකුනේ වෙයි. එළුවන් හා තිරෙළුවන් පිළිගැන්මෙන් වැලකුනේ වෙයි. කුකුළන් හා ඌරන් පිළිගැන්මෙන් වැලකුනේ වෙයි. ඇතුන්ද, ගවයන්ද, අසුන්ද, වෙළඹුන්ද පිළිගැන්මෙන් වැලකුනේ වෙයි. කුඹුරු හා ඉඩම් පිළිගැන්මෙන් වැලකුනේ වෙයි. දූත මෙහෙවර හා පණිවුඩ පණත්වල යෙදීමෙන් වැලකුනේ වෙයි. බඩු විකිණීමෙන් හා මිළදී ගැණීමෙන් වැලකුනේ වෙයි. තරාදියෙන් හොරට වංචා කිරීමය යන මෙයින් වැලකුනේ වෙයි. අල්ලස් ගැණීමය, රැටීමය, කෛරාටික කම් කිරීමය, යන මෙයින් වැලකුනේ වෙයි. අත් පා ආදිය කැපීමය රැහැන් ආදියෙන් බැඳීමය. සැඟවී සිට මං පැහැරීමය, ගම් ආදියට පැන කොල්ලකෑමය, බලහත්කාර කම් කිරීම් යනාදියෙන් වැලකුනේ වෙයි.

23. "හෙතෙම කයින් පරිහරණය කරන සිවුරෙන්ද, කුසින් පරිහරණය කරණ ආහාරයෙන්ද සතුටුවූයේ වෙයි. හෙතෙම යම් යම් තැනකට යන්නේද, (තමන්ගේ අට පිරිකර පමණක්) අරගෙනම යයි. යම්සේ පියාපත් ඇති පක්ෂියෙක් යම් යම් තැනකට පියාඹන්නේ පියාපත් බර පමණක් ගෙන පියාඹන්නේද, එපරිද්දෙන්ම මහණතෙම කයින් පරිහරණය කරන සිවුරෙන්ද, කුසින් පරිහරණය කරන ආහාරයෙන්ද සතුටු වූයේ වෙයි. යම් යම් තැනකට යන්නේද (අටපිරිකර පමණක්) හැරගෙනම යයි. හෙතෙම මේ උතුම් සීලයෙන් යුක්තවූයේ අධ්‍යාත්මයෙහි නිවැරදිවූ සුවය විඳියි.

24. "හෙතෙම ඇසින් රූපයක් දැක එය නිමිති වශයෙන් නොගනියි. නැවත නැවත මතක්වනසේ සිතට නොගනියි. යමක් හේතුකොටගෙන චක්ෂු ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට ලොභ ද්වෙෂ අකුසල ධර්මයෝ උපදිත්ද, ඒ ඇසෙහි සංවරය පිණිස උපදියි. චක්ෂු ඉන්ද්‍රිය රකියි. චක්ෂු ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. කණින් ශබ්දයක් අසා එය නිමිති වශයෙන්

නොගනියි. නැවත නැවත මතක්වනසේ සිතට නොගනියි. යමක් හේතුකොටගෙන සොතඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට ලොභ ද්වෙෂ අකුසල ධර්මයෝ උපදිත්ද, ඒ කණෙහි සංවරය පිණිස පිළිපදියි. සොතඉන්ද්‍රියය රකියි. සොතඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. නාසයෙන් ගඳක් ආඝ්‍රාණය කොට එය නිමිති වශයෙන් නොගනියි. නැවත නැවත මතක්වනසේ සිතට නොගනියි. යමක් හේතුකොටගෙන ඝ්‍රාණෙන්ද්‍රියය අසංවරව වසන්නහුට ලොභ ද්වෙෂ අකුශල ධර්මයෝ උපදිද්ද, ඒ ඝ්‍රාණෙන්ද්‍රියයෙහි සංවරය පිණිස පිළිපදියි. ඝ්‍රාණඉන්ද්‍රියය රකියි. ඝ්‍රාණඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. දිවෙන් රසයක් විඳ එය නිමිති වශයෙන් නොගනියි. නැවත නැවත මතක්වනසේ සිතට නොගනියි. යමක් හේතුකොට ගෙන දිව අසංවරව වසන්නහුට ලොභ ද්වෙෂ අකුශල ධර්මයෝ උපදිත්ද, ඒ ජිව්හා ඉන්ද්‍රියයෙහි සංවරය පිණිස පිළිපදියි. ජිව්හා ඉන්ද්‍රියය රකියි. ජිව්හා ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. කයින් පහසක් ස්පර්ශකොට එය නිමිති වශයෙන් නොගනියි. නැවත නැවත මතක්වනසේ සිතට නොගනියි. යමක් හේතු කොටගෙන කය අසංවරව වසන්නහුට ලොභ ද්වෙෂ අකුශල ධර්මයෝ උපදිද්ද, ඒ කය සංවරය පිණිස පිළිපදියි. කායෙන්ද්‍රියය රකියි. කායෙන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. සිතින් ධර්ම අරමුණක් දැන එය නිමිති වශයෙන් නොගනියි. නැවත නැවත මතක්වනසේ සිතට නොගනියි. යමක් හේතුකොටගෙන මනින්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට ලොභ ද්වෙෂ අකුශල ධර්මයෝ උපදිද්ද, ඒ මනින්ද්‍රියයෙහි සංවරය පිණිස පිළිපදියි. මනින්ද්‍රිය රකියි. මනින්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි. හෙතෙම මේ උතුම් ඉන්ද්‍රිය සංවරයෙන් යුක්ත වූයේ තම සන්තානයෙහි කෙලෙසුන්ගෙන් තෙත් නොවූ සැපය විඳයි.

**25.** "හෙතෙම ඉදිරියට යාමෙහිද, ආපසු යාමෙහිද, නුවණින් දැන කරන්නේ වෙයි. ඉදිරිය බැලීමෙහිද හැසිරීමෙහිද නුවණින් දැන කරන්නේ වෙයි. අත් පා හැකිලීමෙහිද, දිගු කිරීමෙහිද නුවණින් දැන කරන්නේ වෙයි. සඟල සිවුර හා පාත්‍රා සිවුරු දැරීමෙහිද නුවණින් දැන කරන්නේ වෙයි. ආහාර වැළඳීමෙහිද,

බීමෙහිද, රස විඳීමෙහිද නුවණින් දැන කරන්නේ වෙයි. මලමුත්‍ර පහකිරීමෙහිද නුවණින් දැන කරන්නේ වෙයි. යාමෙහිද, සිටීමෙහිද, හිඳීමෙහිද, නිදාගැණීමෙහිද, නිදි දුරුකිරීමෙහිද, කථාකිරීමෙහිද, නිශ්ශබ්දව හිඳීමෙහිද, නුවණින් දැන කරන්නේ වෙයි. හෙතෙම මේ උතුම්වූ ශීල රාශියෙන්ද යුක්තවූයේ මේ ඉන්ද්‍රිය සංවරයෙන්ද යුක්තවූයේ මේ උතුම් සිහි නුවණ දෙකින් යුක්තවූයේ විවේකයට සුදුසුවූ ආරණ්‍යය, වෘක්ෂ මූලය, පර්වතය, කඳුරැලිය පර්වතය, ගුහාය, සොහොනය, දුරවූ වන සේනාසනය, හිස් තැනය, පිදුරු ගොඩවල්ය යන විවේක සේනාසනයක් සේවනය කරයි.

**26.** "හෙතෙම බතින් පසු පිණ්ඩපාතයෙන් වැලකුණේ ශරීරය කෙලින් තබා සිත අරමුණෙක පිහිටුවා හිඳගනියි. හෙතෙම ස්කන්ධලොකයෙහි ලොභය දුරුකොට දුරුකරන ලද ලොභය ඇති සිතින් යුක්තව වාසය කරයි. ලොභයෙන් සිත පිරිසිදු කරයි. සිත විනාශ කරන්නාවූ ක්‍රොධය දුරුකොට ක්‍රොධ රහිත සිත් ඇත්තේ සියලු සත්වයන් කෙරෙහි හිතානුකම්පා ඇත්තේ වාසය කරයි. ක්‍රොධයෙන් සිත පිරිසිදු කරයි. සිතෙහි ගිලන් බවයයි කියන ලද ථිනයද, චෛතසිකයන්ගේ ගිලන්බවයයි කියනලද මිද්ධයද හැර පහවූ ථිනමිද්ධ ඇත්තේ අලොක සංඥා ඇත්තේ සිහිය හා නුවණ ඇත්තේ වාසය කරයි. ථිනමිද්ධයෙන් සිත පිරිසිදුකරයි. නොසන් බව හා පසු තැවීම හැර සන්සුන්වූයේ අධ්‍යාත්මයෙහි සන්සිඳුනු සිත් ඇත්තේ වාසය කරයි. උද්ධච්ච කුක්කුච්චයෙන් සිත පිරිසිදු කරයි. විචිකිච්ඡාව හැර දුරු කරන ලද සැක ඇත්තේ (කුශල ධර්මයන්හි) මෙය කෙසේ කෙසේ වේදැයි පැවත් සැක නැත්තේ වාසය කරයි. විචිකිච්ඡාවෙන් සිත පිරිසිදු කරයි. හෙතෙම සිත කිලිටු කරන්නාවූ ප්‍රඥාව දුර්වල කරන්නාවූ මේ පඤ්ච නීවරණයන් හැර කාමයන්ගෙන් වෙන්වම අකුසල ධර්මයන්ගෙන් වෙන්වම විතර්කසහිතවූ විචාරසහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති පළමුවන ධ්‍යානයට පැමිණ වාසය කරයි. සන්දකය, යම් ශාස්තෘවරයෙකු වෙත ශ්‍රාවක තෙම මෙබඳුවූ මහත්වූ විශෙෂයක් ලබයිද එහි නුවණ

ඇති පුරුෂතෙම ඒකාන්තයෙන් බ්‍රහ්මචර්යාවෙහි වසන්නේය. වසන්නේ හෝ කුසල ධර්ම මාර්ගයන් සතුටු වන්නේය.

27. "සන්දකය, නැවත අනිකක්ද කියමි. භික්ෂුතෙම විතර්ක විචාර දෙදෙනාගේ සංසිඳීමෙන් අධ්‍යාත්මයෙහි පැහැදීම ඇති සිතේ එකඟ බව ඇති විතර්ක රහිතවූ විචාර රහිතවූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති දෙවන ධ්‍යානයට පැමිණ වාසය කරයි. සන්දකය, යම් ශාස්තෘවරයෙකු සමීපයෙහි වනාහී ශ්‍රාවකතෙම මෙබඳුවූ මහත්වූ විශෙෂයකට පැමිණේද, එහි නුවණ ඇති පුරුෂතෙම ඒකාන්තයෙන් බ්‍රහ්මචර්යාවෙහි වසන්නේය. වසන්නේ හෝ කුසල ධර්ම මාර්ගයයි සතුටු වන්නේය.

28. "සන්දකය, නැවත අනිකක්ද කියමි, භික්ෂුතෙම ප්‍රීතියද වැළැක්මෙන් උපේක්ෂා ඇත්තේ සිහිය හා නුවණ ඇත්තේද වාසය කරයි. කයින්ද සුවය විඳියි, යමක් උපේක්ෂා ඇත්තේ, සිහි ඇත්තේ සැප විහරණ ඇත්තේයයි ආර්යයෝ කියත්ද ඒ තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. සන්දකය, යම් ශාස්තෘවරයෙකු කෙරෙහි ශ්‍රාවකතෙම මෙබඳු මහත්වූ විශෙෂයකට පැමිණේද, එහි නුවණ ඇති පුරුෂතෙම ඒකාන්තයෙන් බ්‍රහ්මචර්යාවෙහි වසන්නේය. වසන්නේ හෝ කුසල ධර්ම මාර්ගයයි සතුටු වන්නේය.

29. "සන්දකය, නැවත අනිකක්ද කියමි භික්ෂුතෙම සැපයද දුරු කිරීමෙන් දුකද දුරු කිරීමෙන් පළමුවම සොම්නස් දොම්නස් දෙදෙනාගේ සංසිඳීමෙන් දුක්ද නොවූ සැපද නොවූ උපේක්ෂා සිහි පිරිසිදු බව ඇති සතරවන ධ්‍යානයට පැමිණ වාසය කරයි. සන්දකය, යම් ශාස්තෘවරයෙකු කෙරෙහි වනාහි ශ්‍රාවකතෙම මෙබඳු මහත් විශෙෂයකට පැමිණේද, එහි නුවණැති පුරුෂතෙම ඒකාන්තයෙන් බ්‍රහ්මචර්යාවෙහි වසන්නේය. වසන්නේ හෝ කුසල ධර්ම මාර්ගයයි සතුටු වන්නේය.

30. "හෙතෙම මෙසේ සිත එකඟවූ කල්හි පිරිසිදුවූ කල්හි කෙලෙස් රහිතවූ කල්හි උප ක්ලේශයන් පහව ගිය කල්හි මෘදුවූ කල්හි කර්මයට සුදුසුවූ කල්හි, ස්ථිරවූ කල්හි, කම්පා නොවන

බවට පැමිණි කල්හි, පෙරවිසූ භව පිළිවෙළ දැනගැණීම පිණිස සිත නමයි. හෙතෙම නොයෙක් ආකාරවූ පෙර විසීම සිහි කරයි. එනම් ජාති එකක්ද ජාති දෙකක්ද ජාති තුනක්ද ජාති හතරක්ද, ජාති පහක්ද, ජාති දසයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති හතළිසක්ද, ජාති පණසක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් විනාශ වෙමින් පවතින කල්පයන්ද, නෙයෙක් හැදෙමින් පවතින කල්පයන්ද නොයෙක් විනාශවන හෝ හැදෙන කල්පයන්ද, අසුල් තැන වීමි මෙනම් ඇත්තෙමි, මේ ගොත්‍ර ඇත්තෙමි, මෙබඳු වර්ණ ඇත්තෙමි, මෙබඳු ආහාර ඇත්තෙමි, මෙබඳු සුවදුක් වින්දෙමි. මෙබඳු ආයුෂ කෙළවරකොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුත වූයෙම් අසුවල් තැන ඉපදුනෙම් එහිදු මෙනම් ඇත්තෙම්, මේ ගොත්‍ර ඇත්තෙම්, මෙබඳු වර්ණ ඇත්තෙම්, මෙබඳු ආහාර ඇත්තෙම්, මෙබඳු සුවදුක් වින්දෙම්, මෙබඳු ආයුෂ කෙළවරකොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුතවූයේ මෙහි උපන්නේ වෙමි”යි මෙසේ ආකාර සහිතවූ, උදෙසීම් සහිතවූ, අනෙක ප්‍රකාරවූ, පෙරවිසීම් සිහි කරයි. සන්දකය, යම් ශාස්තෘවරයෙකු වෙත වනාහි ශ්‍රාවකතෙම මෙබඳු මහත් විශෙෂයකට පැමිණේද, එහි නුවණ ඇති පුරුෂ තෙම ඒකාන්තයෙන් බ්‍රහ්මචර්යාවෙහි වසන්නේය. වසන්නේ හෝ කුසල ධර්ම මාර්ගයයි සතුටු වන්නේය.

32. “හෙතෙම මෙසේ සිත එකගවූ කල්හි පිරිසිදුවූ කල්හි නිර්මලවූ කල්හි කෙලෙස් රහිතවූ කල්හි පහව ගිය උපක්ලේශයන් ඇතිකල්හි මෘදුවූ කල්හි කර්මයට සුදුසුවූ කල්හි ස්ථිරවූකල්හි කම්පානොවන බවට පැමිණි කල්හි, සත්වයන්ගේ චුති උත්පත්ති දැනගැණීම පිණිස සිත නමයි. හෙතෙම පිරිසිදුවූ මිනිස් ඇස ඉක්ම පවත්නාවූ දිව්‍යවූ ඇසින් චුතවනු ලබන්නාවූද, උපදිනු ලබන්නාවූද, ලාමකවූද, උතුම්වූද, යහපත් වර්ණ ඇත්තාවූද, අයහපත් වර්ණ ඇත්තාවූද, හොඳ ලොව ගියාවූද, නරක ලොව ගියාවූද සත්වයන් දකියි. ඒකාන්තයෙන් මේ පින්වත් සත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්ත වූවෝය. වාග් දුශ්චරිතයෙන් යුක්තවූවෝය, මනො දුශ්චරිතයෙන් යුක්තවූවෝය, ආර්යයන්ට

දොස් කීවෝය, මිථ්‍යාදෘෂ්ටි ඇත්තෝවූහ, මිථ්‍යාදෘෂ්ටි කර්ම සමාදන් වූවෝ වූහ. ඔව්හු ශරීරය බිඳීමෙන් මරණින් මත්තෙහි නපුරු ගති ඇති, යටිකුරුව වැටෙන්නාවූ නරකයෙහි උපන්නාහුය. නොහොත් මේ පින්වත් සත්වයෝ කාය සුචරිතයෙන් යුක්තවූහ, වාග් සුචරිතයෙන් යුක්ත වූහ, මනො සුචරිතයෙන් යුක්ත වූහ, ආර්යයන්ට දොස් නොකියන්නෝ වූහ. සම්‍යක් දෘෂ්ටි ඇත්තෝ වූහ, සම්‍යක්දෘෂ්ටි කර්ම සමාදන්වූවෝ වූහ. ඔව්හු කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපන්නාහුය. කම්වූ පරිද්දෙන් පැමිණියාවූ සත්වයන් දැන ගණියි. සන්දකය, යම් ශාස්තෘවරයෙකු සමීපයෙහි, වනාහි ශ්‍රාවකතෙම මෙබඳු මහත් විශෙෂයකට පැමිණේද එහි නුවණැති පුරුෂතෙම ඒකාන්තයෙන් බ්‍රහ්මචරියාවෙහි වසන්නේය. වසමින් හෝ කුසල ධර්ම මාර්ගයෙහි සතුටු වන්නේය.

33. "හෙතෙම මෙසේ සිත එකඟවූ කල්හි පිරිසිදුවූ කල්හි නිර්මලවූ කල්හි කෙලෙස් රහිතවූ කල්හි පහවගිය උපක්ලේශ ඇතිකල්හි මෘදුවූ කල්හි කර්මයට සුදුසුවූ කල්හි ස්ථිරවූකල්හි කම්පා නොවීමට පැමිණි කල්හි ආශ්‍රවයන් (කෙලෙස්) ක්ෂය කරන්නාවූ ඥානය පිණිස සිත නමයි. හෙතෙම මේ දුකයයි තත්වූ පරිද්දෙන් දැනගණියි. මේ දුක් ඉපදීමට හේතුයයි, තත්වූ පරිද්දෙන් දැනගණියි. මේ දුක් නැතිකිරීමයයි තත්වූ පරිද්දෙන් දැනගණියි, මේ දුක් නැති කිරීම පිණිස පිළිපදින මාර්ගයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි. මේ ආශ්‍රවයන් හට ගැනීමේ හෙතුවයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි. මේ ආශ්‍රවයන් නැති කිරීම යයි තත්වූ පරිද්දෙන් දැන ගණියි. මේ ආශ්‍රවයන් නැති කිරීමේ මාර්ගයයි තත්වූ පරිද්දෙන් දැන ගණියි. මෙසේ දන්නාවූ දක්නාවූ ඔහුගේ සිත කාමාශ්‍රව කෙරෙන්ද මිදෙයි. භවාශ්‍රව කෙරෙන්ද සිත මිදෙයි. අවිද්‍යාශ්‍රව කෙරෙන්ද සිත මිදෙයි. මිදුනු කල්හි මිදුනේය යන දැනීම වේ. ජාතිය ක්ෂය කරණ ලද්දීය. බ්‍රහ්මචර්යාව වැස නිමවන ලද්දේය. සතර මගින් කළයුතු දෙය කරණ ලදී. මේ ආත්ම භාවය පිණිස අනිකක් නැතැයි දැන ගනියි. සන්දකය, යම් ශාස්තෘවරයෙකු කෙරෙහි වනාහි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ශ්‍රාවකතෙම මෙබඳු මහත් විශෙෂයකට පැමිණේද, එහි නුවණැති පුරුෂතෙම ඒකාන්තයෙන් බ්‍රහ්මචර්‍ය්‍යාවෙහි වසන්නේය. වසමින් හෝ කුසල ධර්ම මාර්ගයයි සතුටු වන්නේය.

34. "භවත් ආනන්ද ස්ථවිරයෙනි, තෙමේ වනාහි රහත්වූයේ ක්ෂය කළ (දුරුකළ) ආශ්‍රව ඇති වැස නිමවූ බ්‍රහ්මචර්‍ය්‍යා ඇති සතර මගින් කරනලද කටයුතු ඇති බහා තබනලද කෙලෙස් බර ඇති පිළිවෙළින් පැමිණියාවූ අර්හත්වය ඇති නැසුවාවූ භවසංයෝජන (භවයෙහි බැඳීම්) මනාකොට නුවණින් දැන කෙලෙසුන් කෙරෙන් මිදුනේ වේද, හෙතෙම කම්සැප පරිභොග කරන්නේද?"

"සන්දකය, යම් ඒ භික්ෂුවක් රහත්වූයේ ක්ෂයවූ ආශ්‍රව ඇත්තේ වැස නිමවනලද බ්‍රහ්මචර්‍ය්‍යා ඇත්තේ සතර මගින් කරනලද කටයුතු ඇත්තේ බහා තබනලද කෙලෙස් බර ඇත්තේ පිළිවෙළින් පැමිණි රහත් බැව් ඇත්තේ දුරුකළ භවසංයෝජන ඇත්තේ මනාකොට නුවණින් දැන කෙලෙසුන් කෙරෙන් මිදුනේ වේද, හෙතෙම කරුණු පසක් කරන්ට නුසුදුසු වෙයි. රහත් භික්ෂුතෙම දැනගෙණ සතෙකු ජීවිතයෙන් තොරකිරීමට නුසුදුසු වේ. රහත් භික්ෂුතෙම නුදුන්දෙය සොරසිතින් ගැනීමට සුදුසු නොවේ. රහත් භික්ෂුතෙම මෛථුන ධර්මය සේවනය කිරීමට සුදුසු නොවේ. රහත් භික්ෂුතෙම දැනගෙන බොරු කීමට සුදුසු නොවේ. රහත් භික්ෂුතෙම පෙර ගිහිව සිටිද්දී මෙන් තැන්පත්කොට තබාගෙන ආහාර පානාදී කාම වස්තු පරිභොග කරන්ට සුදුසු නොවේ. සන්දකය, යම් ඒ භික්ෂුවක් රහත්වූයේ දුරුකළ ආශ්‍රව ඇත්තේ වැස නිමවූ බ්‍රහ්මචර්‍ය්‍යා ඇත්තේ සතර මගින් කරනලද කටයුතු ඇත්තේ බහාතුබූ කෙලෙස බර ඇත්තේ පිළිවෙළින් පැමිණි රහත්බැව් ඇත්තේ දුරුකළ භවසංයෝජන ඇත්තේ මනාකොට නුවණින් දැන කෙලෙසුන් කෙරෙන් මිදුනේ වේද, හෙතෙම මේ කරුණු පස කිරීමට සුදුසු නොවේයයි" කීය.

34. "භවත් ආනන්ද ස්ථවිරයෙනි, යම් ඒ භික්ෂුවක් තෙම රහත්වූයේ ක්ෂයවූ ආශ්‍රව ඇත්තේ වැස නිමවන ලද බ්‍රහ්මචර්‍ය්‍යා

ඇත්තේ සතර මගින් කළ කටයුතු ඇත්තේ බහාතුබූ කෙලෙස් බර ඇත්තේ පිළිවෙළින් පැමිණි රහත්බැව් ඇත්තේ දුරුකළ භවසංයොජන ඇත්තේ මනාකොට නුවණින් දැන කෙලෙසුන් කෙරෙන් මිදුනේ වේද, යන්නාවූද, සිටින්නාවූද, නිදන්නාවූද, නොනිදන්නාවූද ඔහුට මාගේ ආශ්‍රවයෝ දුරු වූවාහුයයි, නිරන්තරයෙන් සියලු ආකාරයෙන් නුවණින් දැකීම එළඹ සිටියේද?"

"සන්දකය, එසේවීනම් තොපට උපමාවක් දක්වන්නෙමි. උපමාවෙන්ද මේ ලොකයෙහි සමහර නුවණැති පුරුෂයෝ කියන ලද්දෙහි අර්ථය දැන ගණිත්. සන්දකය, යම්සේ පුරුෂයෙකුගේ අත්, පා කපන ලද්දාහු වෙත්ද, යන්නාවූද, සිටින්නාවූද, නිදන්නාවූද, නොනිදන්නාවූද ඔහුගේ හස්ත පාදයෝ නිරන්තරයෙන් සිඳින ලද්දාහුම වෙත්ද, එතකුදු වුවත් එය මෙනෙහි කරණු ලබන්නේ, මාගේ අත්, පා සිඳින ලද්දාහුයයි, දනීද, සන්දකය, එපරිද්දෙන්ම යම් ඒ භික්ෂුවක් තෙම රහත්වූයේ ක්ෂයවූ ආශ්‍රව ඇත්තේ වැස නිමවූ බ්‍රහ්මචර්යා ඇත්තේ සතර මගින් කළ කටයුතු ඇත්තේ, බහාතුබූ කෙලෙස් බර ඇත්තේ පිළිවෙළින් පැමිණි රහත්පල ඇත්තේ ක්ෂය කළාවූ භවසංයෝජන ඇත්තේ මනාකොට නුවණින් දැන කෙලෙසුන්ගෙන් මිදුනේ වේද, යන්නාවූද, සිටින්නාවූද, නිදන්නාවූද, නොනිදන්නාවූද ඔහුගේ ආශ්‍රවයෝ නිරන්තරයෙන් දුරුවූවාහුම වෙත්. එතකුදුවුවත් එය මෙනෙහිකරණු ලබන්නේ 'මාගේ කෙලෙස් දුරුවූවාහුයයි' දැන ගන්නේය.

**35.** "භවත් ආනන්ද ස්ථවිරයෙනි මේ ශාසනයෙහි එතරට පමුණුවන්නෝ කොපමණ බොහෝ වෙත්ද?" "සන්දකය, එක සියයක්ද නොවෙයි, දෙසියයක්ද නොවෙයි, තුන්සියයක්ද නොවෙයි, හාරසියයක්ද නොවෙයි. පන්සියයක්ද නොවෙයි, තවද මේ ශාසනයෙහි එතෙර කරන්නෝ බොහෝ වූ වාහුම වෙත්ය.

"භවත් ආනන්ද ස්ථවිරයෙනි, ආශ්චර්යයකි, භවත් ආනන්ද ස්ථවිරයෙනි, පුදුමයකි. ස්වකීය ධර්මය උසස් කිරීමක් හෝ

නොවන්නේය. අනුන්ගේ ධර්මය පහත් කිරීමක් හෝ නැත්තේය. කාරණයෙහි ධර්ම දෙශනාව හෙතු කොටගෙන එපමණ බොහෝ වූ එතර කරන්නෝ පැමිණෙන්නාහුය. මේ ආජීවකයෝ වනාහි පුතා මළ තැනැත්තියගේ පුත්‍රවූවෝ තමන්ම උසස් කෙරෙත්. අනුන් පහත් කෙරෙත්. එතරකරන්නෝ තුන්දෙනෙක්ම පණවත් එනම්, නන්ද වච්ඡය කිස සංකිච්චය, මක්ඛලි ගොසාලය යන තුන්දෙනාය." ඉක්බිති සන්දකනම් පරිව්‍රාජක තෙම ස්වකීය පිරිසට ආමන්ත්‍රණය කෙළේය. "පින්වත්, ශ්‍රමණ ගෞතමයන් වෙත බ්‍රහ්ම චර්ය වාසය කෙරේවා. දැන් අප විසින් ලාභ සත්කාර ප්‍රශංසාවන් අත්හරින්ට පහසු නොවේයයි" ඔව්හු කීහ. මෙසේ වනාහි සන්දක නම් පරිව්‍රාජක තෙම ස්වකීය පිරිස භාග්‍යවතුන් වහන්සේ වෙත බ්‍රහ්මචර්යාවෙහි යෙදවූයේයි.

**හයවෙනිවූ සන්දක සූත්‍රය නිමි. (3-6)**

---

## 27. මහා සකුලුදාය සූත්‍රය

**1.** "මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කලන්දක නිවාප නම්වූ වෙළුවනාරාමයෙහි වාසය කළහ. එකල්හි වනාහි බොහෝවූ ප්‍රසිද්ධවූ ප්‍රසිද්ධවූ පරිව්‍රාජකයෝ මෝර නිවාප නම්වූ පරිව්‍රාජකරාමයෙහි වාසය කෙරෙති. එනම්, අනුගාරය, වරචරය සකුළුදායි පරිව්‍රාජකයාද අන්‍යවූ ප්‍රසිද්ධ ප්‍රසිද්ධ පරිව්‍රාජකයෝද, වෙත්. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ උදය කාලයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරුගෙණ රජගහනුවරට පිණ්ඩපාතය පිණිස ඇතුළුවූහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේට මෙබඳු සිතක් පහළවිය. 'තවම රජගහනුවර පිඬු පිණිස හැසිරීමට ඉතා උදෑසනය. මම මෝර නිවාප නම් පරිව්‍රාජකාරාමය යම් තැනකද සකුළුදායි නම් පරිව්‍රාජකතෙම යම් තැනකද එතැනට පැමිණෙන්නෙම්නම් යෙහෙක,' කියායි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෝර නිවාප නම් පරිව්‍රාජකාරාමය යම් තැනකද එතැනට පැමිණුනහ.

2. එකල්හි වනාහි සකුළුදායි නම් පරිව්‍රාජක තෙම උස්හඬින් හා මහත් හඬින් ඝොෂා කරන්නාවූ නොයෙක් ආකාර තිරිසන් කථා කියන්නාවූ එනම්, රජුන් පිළිබඳ කථාය සොරුන් පිළිබඳ කථාය, මහඇමතියන් පිළිබඳ කථාය, සේනා කථාය, භය කථාය, යුද්ධ කථාය, ආහාර කථාය, පානය ගැන කථාය, වස්ත්‍ර ගැන කථාය, සයනය ගැන කථාය, මාලා ගැන කථාය, සුවඳවර්ග ගැන කථාය, ඥාතීන් ගැන කථාය, යානාවන් ගැන කථාය, ගම් පිළිබඳ කථාය, නියම්ගම් පිළිබඳ කථාය, නගර පිළිබඳ කථාය, ජනපද පිළිබඳ කථාය, ස්ත්‍රීන් පිළිබඳ කථාය සූරයන් පිළිබඳ කථාය, වීථි පිළිබඳ කථාය දිය තොටවල් පිළිබඳ කථාය, පරලොව ගිය නෑහැයන් පිළිබඳ කථාය නොයෙක් ස්වභාවයෙන් යුත් කථාය, ලොකය පිළිබඳ ප්‍රකාශ වන්නාවූ කථාය, මුහුද පිළිබඳ ප්‍රකාශ වන්නාවූ කථාය, මෙසේ වන්නේය නොවන්නේය. යන මෙ පිළිබඳ කථාවය කියා හෝ යන මේ කථාවලින් යුක්තවූ මහත්වූ පරිව්‍රාජක පිරිස සමග හුන්නේ වෙයි.

3. සකුළුදායි පරිව්‍රාජක තෙම වනාහි දුරදීම වඩින්නාවූ භාග්‍යවතුන් වහන්සේ දුටුයේය. දැක ස්වකීය පිරිස තැන්පත් කෙළේය.

"පින්වත්නි, නිශ්ශබ්ද වෙත්වා, පින්වත්නි, ශබ්ද නොකරව්, මේ ශ්‍රමණ ගෞතම තෙමේ එන්නේය. ඒ ආයුෂ්මත් තෙමේ වනාහි නිශ්ශබ්ද වීම කැමැත්තේය. නිශ්ශබ්ද වීමේ ගුණකියන්නෙක, පිරිස නිශ්ශබ්දයයි දැන මෙහි පැමිණිය යුතුයයි, හඟින්නේ නම් මැනව යනුවෙනි, ඉක්බිති ඒ පරිව්‍රාජකයෝ නිශ්ශබ්ද වූහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සකුළුදායී පරිව්‍රාජක තෙම යම් තැනෙක්හිද එතැනට පැමිණ ඉක්බිති සකුළුදායී පරිව්‍රාජක තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මෙහි වඩින සේක්වා. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ වැඩීම යහපති ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ බොහෝ කලකින් මෙහි වැඩීම කළහ. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ වැඩ හිඳින සේක්වා මේ ආසනය පනවන ලද්දේය" කීය.

4. "භාග්‍යවතුන් වහන්සේ පනවනලද ආසනයෙහි වැඩ හුන්නේය. සකුළුදායී පරිව්‍රාජක තෙමේද එක්තරා මිටි ආසනයක් ගෙන එක් පැත්තක හුන්නේය. එක පැත්තක හුන්නාවූම සකුළුදායී පරිව්‍රාජකයාට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළහ.

"උදායීය, දැන් මෙහි කිනම් කථාවකින් යුක්තව හුන්නාහුද? තොප විසින් කිනම් අතුරු කථාවක් අඩාල කරණ ලද්දීද?" "ස්වාමීනි, අපි දැන් යම් කථාවකින් යුක්තව හුන්නමෝද, මේ කථාව තිබේවා. ස්වාමීනි, මේ කථාව භාග්‍යවතුන් වහන්සේට පසුවදා ඇසීමට දුර්ලභ නොවන්නේය. ස්වාමීනි පසුගිය දවස්වල කුතුහල ශාලාවෙහි එක්ව උන්නාවූ රැස්වුනාවූ නොයෙක් තීර්ථකයන් මහණ බමුණන් අතර මේ අතුරු කථාව පහළවිය. පින්වත්නි, අඟුමගද වැස්සන්ට එකාන්තයෙන් ලාභයක. පින්වත්නි, අඟුමගද දනව් වැස්සන්ට ඒකාන්තයෙන් මනාව ලැබුණු ලාභයෙකි. යම් ජනපදයෙක්හි සමූහයා ඇත්තාවූ ගණයා ඇත්තාවූ ගණයාට ආචාර්යවූ ප්‍රසිද්ධවූ යසස් ඇත්තාවූ ආගම් දෙශනා කරන්නාවූ බොහෝ දෙනා විසින් යහපතැයි සම්මතවූ මේ මහණ බමුණෝ රජගහනුවරට වැඩ විසුමට රැස්වූවාහුය. මේ පූරණ කාශ්‍යප තෙමේද සමූහයා ඇත්තේද ශිෂ්‍ය ගණයා ඇත්තේද, ශිෂ්‍ය ගණයාට ආචාර්යවූද ප්‍රසිද්ධවූ යසස් ඇත්තාවූ ආගම් දෙශනාකරන්නාවූ බොහෝ දෙනා විසින් යහපතැයි සම්මතය, හෙතෙමේද රජගහනුවරට වස් කාලයෙහි විසීමට පැමිණියේ වෙයි. මේ මක්ඛලිගොසාල තෙමේද සමූහයා ඇත්තේ, ශිෂ්‍ය පිරිස ඇත්තේ ශිෂ්‍ය සමූහයාට ආචාර්ය වූයේ, ප්‍රසිද්ධ වූයේ, යසස් ඇත්තේ තීර්ථකරවූයේ බොහෝ දෙනා විසින් යහපතැයි සම්මතවූයේ වේ. හෙතෙමේද වර්ෂා ඍතුවෙහි රජගහ නුවර වාසයට පැමිණියේ වෙයි. අජිත කෙසකම්බලී තෙමේද සමූහයා ඇත්තේ ශිෂ්‍ය පිරිස ඇත්තේ ශිෂ්‍ය සමූහයාට ආචාර්යවූයේ ප්‍රසිද්ධවූයේ යසස් ඇත්තේ තීර්ථකර වූයේ බොහෝ දෙනා විසින් යහපතැයි සම්මතවූයේ වේ. හෙතෙමේද වර්ෂා ඍතුවෙහි රජගහනුවර වාසයට පැමිණියේ වෙයි. පකුධකච්චායන තෙමේද සමූහයා ඇත්තේ, ශිෂ්‍ය පිරිස ඇත්තේ,

ශිෂ්‍ය සමූහයාට ආචාර්ය වූයේ, ප්‍රසිද්ධ වූයේ, යසස් ඇත්තේ තීර්ථකර වූයේ බොහෝ දෙනා විසින් යහපතැයි සම්මත වූයේ වේ. හෙතෙමේද වර්ෂා ඍතුවෙහි රජගහනුවර වාසයට පැමිණියේ වෙයි. සඤ්ජය බෙල්ලට්ඨපුත්ත තෙමේද සමූහයා ඇත්තේ, ශිෂ්‍ය පිරිස ඇත්තේ ශිෂ්‍ය සමූහයාට ආචාර්ය වූයේ, ප්‍රසිද්ධ වූයේ යසස් ඇත්තේ තීර්ථකර වූයේ බොහෝ දෙනා විසින් යහපතැයි සම්මත වූයේ වේ. හෙතෙමේද, වර්ෂා ඍතුවෙහි රජගහ නුවර වාසයට පැමිණියේ වෙයි. නිගණ්ඨනාතපුත්‍ර තෙමේද, සමූහ ඇත්තේද ශිෂ්‍ය පිරිස ඇත්තේද, ශිෂ්‍ය සමූහයාට ආචාර්ය වූයේ ප්‍රසිද්ධ වූයේ යසස් ඇත්තේ ආගම් දෙශනා කරන්නාවූ බොහෝ දෙනා විසින් යහපතැයි සම්මතවූයේ වේ. හෙතෙමේද රජගහ නුවරට වස් කාලයෙහි විසීමට පැමිණියේ වෙයි. මේ ශ්‍රමණ ගෞතම තෙමේද, සමූහයා ඇත්තේද ශිෂ්‍ය ගණයා ඇත්තේද ශිෂ්‍ය සමූහයාට ආචාර්ය වූයේද ප්‍රසිද්ධවූයේ යසස් ඇත්තේ ආගම් දෙශනා කරන්නේ බොහෝ දෙනා විසින් යහපතැයි සම්මතවූයේ වෙයි. හෙතෙමේද, රජගහ නුවරට වැසි කාලයෙහි වාසයට පැමිණියේ වෙයි. සංඝයා ඇත්තාවූ ගණයා ඇත්තාවූ ගණයාට ආචාර්යවූ ප්‍රසිද්ධවූ යසස් ඇත්තාවූ ආගම් දෙශනා කරන්නාවූ බොහෝ දෙනා විසින් යහපතැයි සම්මතවූ මේ පින්වත් මහණ බමුණන්ගෙන් කවරෙක් නම්, ශ්‍රාවකයන් විසින් සත්කාර කරණ ලද්දේ ගෞරව කරණ ලද්දේ බුහුමන් කරණ ලද්දේ පුදන ලද්දේ වේද, ශ්‍රාවකයෝ සත්කාර කොට ගෞරව කොට කවරෙකු ආශ්‍රයකොට වාසය කෙරෙත්දැ”යි කථාවක් පහලවිය. ඔවුන් අතුරෙන් සමහරු මෙසේ කීහ. ‘මේ පූරණකාශ්‍යපය තෙමේ වනාහි සමූහයා ඇත්තේ ශිෂ්‍යගණයා ඇත්තේද ශිෂ්‍ය සමූහයාට ආචාර්යවූයේ ප්‍රසිද්ධවූයේ යසස් ඇත්තේ ආගම් දෙශනා කරන්නේ බොහෝ දෙනා විසින් යහපතැයි සම්මත වූයේ වෙයි. හෙතෙමේද ශ්‍රාවකයන් විසින් සත්කාර නොකරණ ලද්දේ ගෞරව නොකරණ ලද්දේ බුහුමන් නුපුදන ලද්දේ වෙයි. පූරණ කාශ්‍යපයන්ට ශ්‍රාවකයෝසත්කාර කොට ගෞරව කොට ඇසුරු කොට වාසය නොකරත්. පෙරවූවක් කියමි. පූරණ කාශ්‍යප තෙමේ නොයෙක් සිය ගණන්

පිරිසට ධර්මය දෙශනා කරයි. එහි එක්තරා පූරණ කාශ්‍යපගේ ශ්‍රාවකයෙක් 'පින්වත්නි, මේ කාරණය පූරණ කාශ්‍යපයන්ගෙන් නොඅසව්. එතෙම මෙය නොදනියි. අපි මෙය දනිමු. මේ කාරණය අපෙන් විචාරව්. අපි මෙය පින්වතුන්ට ප්‍රකාශ කරන්නෙමුයි' ශබ්ද කෙළේය. තවද පෙරවූවක් කියමි. පූරණ කාශ්‍යප තෙමේ දෙඅත් ඔසවා ගෙණ හඬමින්, 'පින්වත්නි, නිශ්ශබ්ද වෙත්වා. පින්වත්නි ශබ්ද නොකරව්. මොවුහු පින්වතුන්ගෙන් නොඅසත්. මොවුහු අපගෙන් අසත්. අපි මොවුන් ප්‍රකාශ කරන්නෙමුයි' කියා පිරිස නිශ්ශබ්ද කිරීමට නොහැකිවිය. පූරණ කාශ්‍යපගේ වනාහි බොහෝ ශ්‍රාවකයෝ 'නුඹ මේ ධර්ම විනය නොදන්නෙහිය. මම මේ ධර්මවිනය දනිමි. කිමෙක්ද නුඹ මේ ධර්ම විනය දන්නෙහිද, නුඹ වරදවා පිළිපන්නෙක් වෙහි. මම මනාකොට පිළිපන්නෙක් වෙමි. මගේ කීම කරුණු සහිතය. නුඹගේ කීම කරුණු සහිත නොවේ. පළමු කියයුත්ත පසුව කීයෙහිය. පසුව කියයුත්ත පළමු කීයෙහිය. නුඹ විසින් බොහෝ කලක් පුරුදු කරණ ලද්ද මා පිට පෙරළුනේය. නුඹ විසින් නගනලද වාදය නිග්‍රහ කරණ ලද්දේය. වාදයෙන් මිදීම පිණිස හැසිරෙව. ඉදින් හැක්කෙහි නම් අවුල් හෝ ලිහවයි.' වාදය නගා ඉවත්ව ගියාහුය. මෙසේ පූරණ කාශ්‍යප තෙම ශ්‍රාවකයන්ගෙන් සත්කාර නොලද්දේ ගෞරව නොලද්දේ බුහුමන් නොලද්දේ නුපුදන ලද්දේ වේ. පූරණ කාශ්‍යපයන් ශ්‍රාවකයෝ සත්කාර කොට ගෞරව කොට ඇසුරු කොට වාසය නොකරත්. පූරණ කාශ්‍යප තෙමේ ස්වභාවික ආක්‍රොශයෙන් ආක්‍රොශ කරණ ලද්දේ වේයයි, (සමහරු කීහ) ඇතැම්හු මෙසේ කීහ. 'මේ මක්ඛලි ගොසාල තෙමේද සමූහයා ඇත්තේද, ශිෂ්‍ය පිරිසට ආචාර්ය වූයේද, ප්‍රසිද්ධ වූයේද, යසස් ඇත්තේද, තීර්ථකර වූයේද, බොහෝ දෙනා විසින් යහපතැයි සම්මත වූයේද වේ. හෙතෙමේද ශ්‍රාවකයන් ගෙන් සත්කාර නොලද්දේ. බුහුමන් නොලද්දේ, නොපුදන ලද්දේවේ. ශ්‍රාවකයෝ මක්ඛලි ගොසාලයන් සත්කාර කොට ගරු කොට ඇසුරු කොට වාසය නොකරත්. පෙරවූවක් කියමි. මක්ඛලි ගොසාල තෙමේ නොයෙක් සිය ගනන් පිරිසට ධර්මය දෙශනා කරයි. එහි මක්ඛලි

ගොසාලයාගේ එක්තරා ශ්‍රාවකයෙක් 'පින්වත්නි මේ කාරණය මක්ඛලි ගොසාලයන් නොවිචාරව්. හෙතෙම මෙය නොදනියි. අපි මෙය දනිමු. මේ කාරණය අපගෙන් විචාරව්. අපි මෙය පින්වතුන්ට කියන්නෙමු'යි ශබ්ද කළේය. පෙරවූවක් කියමි. මක්ඛලි ගොසාල තෙම 'පින්වත්නි, නිශ්ශබ්ද වෙත්වා පින්වත්නි, ශබ්ද නොකරව්. මොවහු පින්වතුන් නොවිචාරත්. මොවුහු අප විචාරත්. අපි මෙය ප්‍රකාශ කරන්නෙමු'යි දෙඅත් ඔසවා හඬන්නේ නොලැබීය. මක්ඛලි ගොසාලයාගේ බොහෝවූ ශ්‍රාවකයෝද වාද නගා බැහැර ගියාහු වෙත්. නුඹ මේ ධර්ම විනය නොදන්නෙහිය මම මේ ධර්ම විනය නොදන්නෙහිය. මම මේ ධර්ම විනය දනිමි. කිම නුඹ මේ ධර්ම විනය දැනගන්නෙහිද නුඹ වරදවා පිළිපන්නේ වෙහිය. මම මනාව පිළිපන්නේ වෙමි. මට වැඩ සහිතවේ. නුඹට වැඩ සහිත නොවේ. පළමු කිවයුත්ත පසුව කීයෙහිය. පසුව කියයුත්ත පළමු කීයෙහිය. නුඹ විසින් බොහෝ කලක් පුරුදු කරන ලද්ද මා පිට පෙරළුනේය. නුඹ විසින් නගනලද වාදය නිග්‍රහ කරන ලද්දේ වූයේය. වාදයෙන් මිදීම පිණිස හැසිරෙව. හැකි නම් නිරවුල් කරව (කියායි) මෙසේ මක්ඛලි ගොසාල තෙමේ ශ්‍රාවකයන් ගෙන් සත්කාර නොලද්දේ ගෞරව නොලද්දේ බුහුමන් නොලද්දේ පූජා නොලද්දේ වේ. මක්ඛලි ගොසාලයන් ශ්‍රාවකයෝද සත්කාර කොට, ගෞරව කොට ඇසුරු කර ගෙන වාසය නොකරත්. මක්ඛලි ගොසාල තෙමේ වනාහි ස්වාභාවික ආක්‍රොශයෙන් ආක්‍රොශ කරන ලද්දේ වෙයි.

සමහරු මෙසේ කීහ. මේ අජිතකෙසකම්බලී තෙමේද, සමූහයා ඇත්තේද, ශිෂ්‍ය පිරිස ඇත්තේද, ශිෂ්‍ය පිරිසට ආචාර්ය වූයේද, ප්‍රසිද්ධ වූයේද, යසස් ඇත්තේද, තීර්ථකර වූයේද, බොහෝ දෙනා විසින් යහපතැයි සම්මත වූයේද වේ. හෙතෙමේද ශ්‍රාවකයන්ගෙන් සත්කාර නොලද්දේ ගෞරව නොලද්දේ බුහුමන් නොලද්දේ නොපුදන ලද්දේ වේ. ශ්‍රාවකයෝ අජිතකෙසකම්බලයන් සත්කාර කොට ගරුකොට ඇසුරු කොට වාසය නොකරත්. පෙරවූවක් කියමි. අජිතකෙසකම්බලි තෙමේ නොයෙක් සිය ගණන් පිරිසට ධර්මය දෙශනා කරයි. එහි අජිත

කෙසකම්බලගේ එක්තරා ශ්‍රාවකයෙක් ‘පින්වත්නි, මේ කාරණය අජිත කෙසකම්බලයන්ගේ නොවිචාරව්, හෙතෙම මෙය නොදනියි. අපි මෙය දනිමු. මේ කාරණය අපගෙන් විචාරව්. අපි මෙය පින්වතුන්ට කියන්නෙමු’යි ශබ්ද කළේය. පෙරවූවක් කියමි. අජිතකෙසකම්බලි තෙම ‘පින්වත්නි, නිශ්ශබ්ද වෙත්වා. පින්වත්නි, ශබ්ද නොකරව්. මොවුහු පින්වතුන් නොවිචාරත්. මොවුහු අප විචාරත්. අපි මෙය ප්‍රකාශ කරන්නෙමු’යි දෙඅත් ඔසවා හඬන්නේ නොලැබීය. අජිත කෙසකම්බලිගේ බොහෝ වූ ශ්‍රාවකයෝද වාද නගා බැහැර ගියාහුවෙත්. ‘නුඹ මේ ධර්ම විනය නොදන්නෙහිය. මම මේ ධර්ම විනය දනිමි. කිම නුඹ මේ මේ ධර්ම විනය දැනගන්නෙහිද? නුඹ වරදවා පිළිපන්නේ වෙහිය. මම මනාව පිළිපන්නේ වෙමි. මට වැඩ සහිත වේ. නුඹට වැඩ සහිත නොවේ. පළමු කිවයුත්ත පසුව කීයෙහිය පසුව කිවයුත්ත පළමුකීයෙහිය. නුඹ විසින් බොහෝ කලක් පුරුදු කරන ලද්ද මා පිට පෙරලුනේය. නුඹ විසින් නගනලද වාදය නිග්‍රහ කරන ලද්දේ විය. වාදයෙන් මිදීම පිණිස හැසිරෙව. හැකිනම් නිරවුල් කරව, (කියායි). මෙසේ අජිත කෙසකම්බලි තෙමේ ශ්‍රාවකයන්ගෙන් සත්කාර නොලද්දේ ගෞරව නොලද්දේ බුහුමන් නොලද්දේ පූජා නොලද්දේ වේ. අජිත කෙසකම්බලයන් ශ්‍රාවකයෝද, සත්කාර කොට ගෞරව කොට ඇසුරු කරගෙන වාසය නොකරත්. අජිතකෙසකම්බලි තෙමේ වනාහි ස්වාභාවික ආක්‍රොශයෙන් ආක්‍රොශ කරණ ලද්දේ වෙයි.

සමහරු මෙසේ කීහ. මේ පකුධකච්චායන තෙමේද, සමූහයා ඇත්තේද ශිෂ්‍ය පිරිස ඇත්තේද, ශිෂ්‍ය පිරිසට ආචාර්ය වූයේද, ප්‍රසිද්ධ වූයේද, යසස් ඇත්තේද, තීර්ථකර වූයේද බොහෝ දෙනා විසින් යහපතැයි සම්මත වූයේද වේ. හෙතෙමේද ශ්‍රාවකයන් ගෙන් සත්කාර නොලද්දේ, ගෞරව නොලද්දේ, බුහුමන් නොලද්දේ, නොපුදන ලද්දේ වේ. ශ්‍රාවකයෝ පකුධකච්චායනයන් සත්කාර කොට, ගරු කොට, ඇසුරු කොට වාසය නොකරත්. පෙරවූවක් කියමි. පකුධකච්චායන තෙමේ නොයෙක් සියගනන් පිරිසට ධර්ම දෙශනා කරයි. එහි පකුධකච්චායනගේ එක්තරා ශ්‍රාවකයෙක් ‘පින්වත්නි, මේ

කාරණය පකුධකච්චායනයන් ගෙන් නොවිචාරව්. හෙතෙම මෙය නොදනියි. අපි මෙය නොදනිමු. මේ කාරණය අපගෙන් විචාරව්. අපි මෙය පින්වතුන්ට කියන්නෙමු'යි ශබ්ද කෙළේය. පෙර වූවක් කියමි. පකුධකුච්චායන තෙම 'පින්වත්නි' නිශ්ශබ්ද වෙත්වා. පින්වත්නි ශබ්ද නොකරව් මොවුහු පින්වතුන් නොවිචාරත් මොවුහු අපි විචාරත්. අපි මේ ප්‍රකාශ කරන්නෙමු'යි ෙ ද අත් ඔසවා හඬන්නේ නොලැබීය. පකුධකච්චායනගේ බොහෝවූ ශ්‍රාවකයෝද, වාද නගා බැහැර ගියාහු වෙත්. 'නුඹ මේ ධර්ම විනය නොදන්නෙහිය. මම මේ ධර්ම විනය දනිමි. කිම නුඹ මේ ධර්මවිනය දන්නෙහිද? නුඹ වරදවා පිළිපන්නේ වෙහිය. මම මනාව පිළිපන්නේ වෙමි. මම වැඩ සහිතවේ. නුඹට වැඩ සහිත නොවේ. පළමු කිව යුත්ත පසුව කීයෙහිය පසුව කිව යුත්ත පළමු කීයෙහිය. නුඹ විසින් බොහෝ කලක් පුරුදු කරන ලද්ද මාපිට පෙරලුනේය. නුඹ විසින් නගන ලද වාදය නිග්‍රහ කරන ලද්දේ, එය වාදයෙන් මිදීම පිණිස හැසිරෙව හැකි නම් නිරවුල් කරව (කියායි) මෙසේ පකුධකච්චායන තෙමේ ශ්‍රාවකයන්ගෙන් සත්කාර නොලද්දේ ගෞරව නොලද්දේ, බුහුමන් නොලද්දේ, පූජා නොලද්දේ පකුධ කච්චායන ශ්‍රාවකයෝද සත්කාර කොට ගෞරවකොට ඇසුරු කරගෙන වාසය නොකරත්. පකුධකච්චායන තෙමේ වනාහි ස්වභාවික ආක්‍රොශයෙන් ආක්‍රොශ කරණ ලද්දේ වෙයි.

සමහරු මෙසේ කීහ. සඤ්ජයබෙල්ලට්ඨි පුත්ත තෙමේද සමූහයා ඇත්තේද, ශිෂ්‍ය පිරිස ඇත්තේද, ශිෂ්‍ය පිරිසට ආචාර්ය වූයේද, ප්‍රසිද්ධ වූයේද, යසස් ඇත්තේද, තීර්ථකර වූයේද, බොහෝ දෙනා විසින් යහපතැයි සම්මත වූයේද, වේ. හෙතෙමේද ශ්‍රාවකයන්ගෙන් සත්කාර නොලද්දේ ගෞරව නොලද්දේ, බුහුමන් නොලද්දේ, නොපුදන ලද්දේ වේ. ශ්‍රාවකයෝ සඤ්ජයබෙල්ලට්ඨි පුත්තයන් සත්කාර කොට, ගරු කොට, ඇසුරු කොට වාසය නොකරත්. පෙරවූවක් කියමි. සඤ්ජයබෙල්ලට්ඨි පුත්ත තෙමේ නොයෙක් සිය ගණන් පිරිසට ධර්ම දෙශනා කරයි. එහි සඤ්ජයබෙල්ලට්ඨි පුත්තයන්ගේ එක්තරා ශ්‍රාවකයෙක් 'පින්වත්නි, මේ කාරණය

සඤ්ජයබෙල්ලට්ඨි පුත්තයන්ගෙන් නොවිචාරව්. හෙතෙම මෙය නොදනියි. අපි මෙය දනිමු. මේ කාරණය අපගෙන් විචාරයි. අපි මෙය පින්වතුන්ට කියා දෙන්නෙමු'යි ශබ්ද කෙළේය. පෙරවූවක් කියමි. සඤ්ජයබෙල්ලට්ඨි පුත්ත තෙම 'පින්වත්නි' නිශ්ශබ්ද වෙත්වා. පින්වත්නි ශබ්ද නොකරව්. මොවුහු පින්වතුන් නොවිචාරත්. මොවුහු අප විචාරත්. අප මෙය ප්‍රකාශ කරන්නෙමු'යි දෙ අත් ඔසවා හඬන්නේ නොලැබීය. සඤ්ජය බෙල්ලට්ඨි පුත්තගේ බොහෝ ශ්‍රාවකයෝද වාද නගා බැහැර ගියාහු වෙත් 'නුඹ මේ ධර්ම විනය නොදන්නෙහිය. මම මේ ධර්ම විනය දන්නෙමි. කිම නුඹ මේ ධර්ම විනය දැන ගන්නෙහිද, නුඹ වරදවා පිළිපන්නේ වෙහිය. මම මනාව පිළිපන්නේ වෙමි. මම වැඩ සහිත වේ. නුඹට වැඩ සහිත නොවේ. පළමු කිව යුත්ත පසුව කීයෙහිය. පසුව කිව යුත්ත පළමු කීයෙහිය. නුඹ විසින් බොහෝ කලක් පුරුදු කරණ ලද්ද මා පිට පෙරලුනේය. නුඹ විසින් නගන ලද වාදය නිග්‍රහ කරන ලද්දේ එය වාදයෙන් මිදීම පිණිස හැසිරෙව. නැති නම් නිරවුල් කරව, (කියායි) මෙසේ සඤ්ජයබෙල්ලට්ඨි තෙමේ ශ්‍රාවකයන්ගෙන් සත්කාර නොලද්දේ ගෞරව නොලද්දේ, බුහුමන් නොලද්දේ පූජා නොලද්දේ වේ. සඤ්ජයබෙල්ලට්ඨි පුත්තයන් ශ්‍රාවකයෝද සත්කාර කොට, ගෞරව කොට, ඇසුරු කොට, වාසය නොකරත්. සඤ්ජයබෙල්ලට්ඨි පුත්ත තෙමේ වනාහි ස්වභාවික ආක්‍රොශයෙන් ආක්‍රොශ කරණ ලද්දේ වෙයි. සමහරු, මෙසේ කීහ.

නිගණ්ඨනාත පුත්‍ර තෙමේ සමූහයා ඇත්තේද ශිෂ්‍ය ගණයා ඇත්තේද, ශිෂ්‍යගණයාට ආචාර්යවූයේද, ප්‍රකටවූයේ යසස් ඇත්තේ ආගම් දෙශනාකරන්නේ බොහෝදෙනා විසින් යහපතැයි සම්මත කරණ ලද්දේ වේ. හෙතෙමේද ශ්‍රාවකයන්ගෙන් සත්කාර නොලද්දේ ගෞරව නොලද්දේ බුහුමන් නොලද්දේ නුපුදන ලද්දේ වේ. ශ්‍රාවකයෝ නිගණ්ඨනාත පුත්‍රයන් සත්කාරකොට ගරුකොට ඇසුරු කොට වාසය නොකරත්. පෙරවූවක් කියමි. නිගණ්ඨනාත පුත්‍ර තෙමේ නොයෙක් සියගණන් පිරිසට ධර්මය දෙශනා කරයි. එහි නිගණ්ඨනාත

පුත්‍රයාගේ එක්තරා ශ්‍රාවකයෙක් 'පින්වත්නි, මේ කාරණය නිගණ්ඨනාත පුත්‍රයන් නොවිචාරව්. හෙතෙම මෙය නොදනියි. අපි මෙය දනිමු. අප මේ කාරණය විචාරව්. අපි මෙය පින්වතුන්ට ප්‍රකාශ කරන්නෙමුයි' ශබ්ද කෙළේය.

"තවද පෙර වූවක් කියමි. නිගණ්ඨනාත පුත්‍ර තෙම පින්වත්නි, නිශ්ශබ්ද වෙත්වා පින්වත්නි ශබ්ද නොකරව් මොවුහු පින්වතුන් නොවිචාරත්. මොවුහු අප විචාරත්. අපි මෙය ප්‍රකාශ කරන්නෙමුයි' දෙඅත් ඔසවා හඬන්නේ නිශ්ශබ්ද කරවීම නොලැබීය. නිගණ්ඨනාත පුත්‍රයාගේ බොහෝවූ ශ්‍රාවකයෝද 'නුඹ මේ ධර්ම විනය නොදන්නෙහිය. මම මේ ධර්ම විනය දනිමි. කිම නුඹ මේ ධර්ම විනය දැනගන්නෙහිද? නුඹ වරදවා පිළිපන්නේ වෙහිය. මම මනාව පිළිපන්නේ වෙමි. මගේ කීම කරුණු සහිතය. නුඹගේ කීම කරුණු සහිත නොවේ. පළමු කියයුත්ත පසුව කීයෙහිය. පසුව කියයුත්ත පළමු කීයෙහිය. නුඹ විසින් බොහෝ කලක් පුරුදු කරණ ලද්ද මාපිට පෙරළුනේය. නුඹ විසින් නගනලද වාදය තෙම නිග්‍රහ කරණ ලද්දේ වූයේය. වාදයෙන් මිදීම පිණිස හැසිරෙව. හැක්කෙහි නම් නිරවුල් හෝ කරවයි' වාද නගා ඉවත්ව ගියහ. මෙසේ නිගණ්ඨනාත පුත්‍ර තෙමේ ශ්‍රාවකයන්ගෙන් සත්කාර නොලද්දේ ගෞරව නොලද්දේ බුහුමන් නොලද්දේ පූජා නොලද්දේ වේ. ශ්‍රාවකයෝද නිගණ්ඨනාත පුත්‍රයන් සත්කාරකොට ගෞරවකොට ඇසුරුකොට වාසය නොකරත්. නිගණ්ඨනාත පුත්‍ර තෙමේ වනාහි ස්වාභාවික ආක්‍රොශයෙන් ආක්‍රොශ කරණ ලද්දේ ද වේයයි ඇතැම්හු මෙසේ කීහ.

"මේ ශ්‍රමණ ගෞතම තෙමේ වනාහි සංඝයා ඇත්තේද ශිෂ්‍යගණයා ඇත්තේද, ශිෂ්‍ය සමූහයාට ආචාර්ය වූයේද ප්‍රකට වූයේ යසස් ඇත්තේ ආගම් දෙශනාකරන්නේ බොහෝ දෙනා විසින් යහපතැයි සම්මතද වේ. හෙතෙමේ වනාහි ශ්‍රාවකයන් විසින්ද සත්කාර කරණ ලද්දේ ගෞරව කරණ ලද්දේ, බුහුමන් කරණ ලද්දේ, පූජා කරණ ලද්දේ වේ. ශ්‍රාවකයෝ ශ්‍රමණ ගෞතමයන් සත්කාරකොට ගෞරවකොට ඇසුරුකොට වාසය

කරත්. පෙර වූවක් කියමි. ශ්‍රමණ ගෞතම තෙම නොයෙක් සියගණන් පිරිසට ධර්මය දේශනා කරයි. එහි ශ්‍රමණ ගෞතමයන්ගේ එක්තරා ශ්‍රාවකයෙක් කැරුයේය. ඔහුට එක්තරා බ්‍රහ්මචාරී කෙනෙක් 'ආයුෂ්මත් තෙමේ නිශ්ශබ්ද වේවා. ආයුෂ්මත් තෙමේ ශබ්ද නොකරේවා. අපගේ ශාස්තෲවූ භාග්‍යවතුන් වහන්සේ ධර්මය දෙශනා කෙරේයයි,' දනින් ගැටීම කෙළේය. යම් කලෙක්හි ශ්‍රමණ ගෞතම තෙමේ නොයෙක් සිය ගණන් පිරිසට ධර්මය දේශනා කෙරේද, එකල්හි ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවකයන්ගේ කිවිසිලි ශබ්දයක් හෝ කැරුම් ශබ්දයක් හෝ නොමවේ. ජනසමූහය තෙම භාග්‍යවතුන් වහන්සේ අපට යම් ධර්මයක් දෙශනා කරන්නේද, එය අපි අසන්නෙමුයි එය බලාපොරොත්තුවෙයි. යම්සේ පුරුෂයෙක් සතරමංසන්ධියෙක්හි මැස්සන් පහවගිය දඬුවැල් මීයක් කඩන්නේද, යම්සේ මහජන සමූහ තෙම එය බලාපොරොත්තුවෙන් පැමිණ සිටින්නේද, එපරිද්දෙන්ම යම් කලෙක්හි ශ්‍රමණ ගෞතම තෙම නොයෙක් සිය ගණන් පිරිසට ධර්මය දෙශනා කෙරේද, එකල්හි ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවකයන්ගේ කිවිසුම් ශබ්දයක් හෝ කැරීම් ශබ්දයක් හෝ නොම වේ. එය මහජන සමූහ තෙමේ අපට භාග්‍යවතුන් වහන්සේ යම් ධර්මයක් දේශනා කරන්නේද, එය අපි අසන්නෙමුයි බලාපොරොත්තුවෙන් පැමිණ සිටියේ වෙයි. ශ්‍රමණ ගෞතමයන්ගේ යම් ශ්‍රාවකයෝත් සබ්‍රම්සරුන් හා යම් සුලු අරගලයක්කොට ශික්ෂා ප්‍රත්‍යක්ඛ්‍යානය (උපසම්පදාව ඉවත්කිරීම) කොට ගිහි බවට පැමිණෙත්ද, ඔව්හුද ශාස්තෲහුගේ ගුණ කියන්නෝ වෙති. ධර්මයෙහි ගුණ කියන්නෝ වෙති. සංඝයාගේ ගුණ කියන්නෝ වෙති. තමහට ගර්හා කරන්නාහුම වෙත්. යම්බඳු අපි මෙබඳු මනාව ප්‍රකාශ කරණ ලද ශාසනයෙහි පැවිදිව දිවි හිමියෙන් සම්පූර්ණකොට පිරිසිදුකොට බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙන්ට නොහැකිවීමුද, මෙහි අපිම කාලකන්නිවූවෝ වෙමු. අපි මද පින් ඇත්තෝ වෙමු යනුවෙනි. අනුන්ට ගරහන්නෝ නොවෙත්. ඔව්හු ආරාමික වූවාහු හෝ උපාසක වූවාහු හෝ පඤ්චසීලයන් සමාදන්ව පවතිත්. මෙසේ

ශ්‍රමණ ගෞතම තෙම ශ්‍රාවකයන් විසින් සත්කාර කරණ ලද්දේ, ගෞරව කරණ ලද්දේ බුහුමන් කරණ ලද්දේ, පූජාකරණ ලද්දේ වේ. ශ්‍රාවකයෝ ශ්‍රමණ ගෞතමයන්ද සත්කාරකොට ගරුකොට ඇසුරුකොට වාසය කරන්නේයයි කීහ.

**5.** "උදායීය, යමකින් මාගේ ශ්‍රාවකයෝ සත්කාර කෙරෙත්ද ගෞරව කෙරෙත්ද, බුහුමන් කෙරෙත්ද, පුදත්ද, සත්කාර කොට ගෞරවකොට ඇසුරුකොට වාසය කෙරෙත්ද, එබඳු ධර්මකෙනෙක් නුඹ දන්නෙහිද?" "ස්වාමීනි, මම යමකින් භාග්‍යවතුන් වහන්සේට ශ්‍රාවකයෝ සත්කාර කෙරෙත්ද, ගෞරව කෙරෙත්ද, බුහුමන් කෙරෙත්ද, පුදත්ද, සත්කාර කොට, ගෞරවකොට, ඇසුරුකොට වාසය කෙරෙත්ද, එබඳු ධර්ම පසක් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි දක්නෙමි. කවර පසක්ද? ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ වනාහි ස්වල්ප ආහාර ඇත්තේ ස්වල්ප ආහාර ඇති බැව්හි ගුණ කියන්නේද වේ. ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ ස්වල්ප ආහාර ඇත්තේ, ස්වල්ප ආහාර ඇති බැව්හි ගුණ කියන්නේත් වේය යන යමක් ඇද්ද, ස්වාමීනි යමකින් භාග්‍යවතුන් වහන්සේට ශ්‍රාවකයෝ සත්කාර කෙරෙත්ද, ගෞරව කෙරෙත්ද, බුහුමන් කෙරෙත්ද, පූජා කෙරෙත්ද, සත්කාරකොට, ගෞරවකොට, ඇසුරුකොට වාසය කෙරෙත්ද, මේ පළමුවන ධර්මය වනාහි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මම දක්නෙමි.

"නැවත අනිකක්ද කියමි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ ලාමක ලාමක සිවුරකින් සතුටුවූයේ ලාමක ලාමක සිවුරකින් සන්තෝෂ වීමෙහි ගුණ කියන්නේද වේ. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ ලාමක ලාමක සිවුරකින් සතුටුවූයේ ලාමක ලාමක සිවුරකින් සන්තොෂ වීමෙහි ගුණ කියන්නේත් වේය යන යමක් වේද, ස්වාමීනි, යමකින් භාග්‍යවතුන් වහන්සේට ශ්‍රාවකයෝ සත්කාර කෙරෙත්ද, ගෞරව කෙරෙත්ද බුහුමන් කෙරෙත්ද පූජා කෙරෙත්ද, සත්කාර කොට ගෞරව කොට ඇසුරු කොට වාසය කෙරෙත්ද මේ දෙවන ධර්මය වනාහි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මම දක්නෙමි.

"නැවත අනිකක්ද කියමි. ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ ලාමක ලාමකවූ ආහාරයෙන් සතුටුවූයේ ලාමක ලාමක ආහාරයෙන් සන්තෝෂ විමෙහි ගුණකියන්නේද වේ. ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ ලාමක ලාමක ආහාරයෙන් සතුටුවූයේ ලාමක ලාමක ආහාරයෙන් සතුටුවීමෙහි ගුණ කියන්නේත් වේය යන යමක් ඇද්ද, ස්වාමීනි යමකින් භාග්‍යවතුන් වහන්සේට ශ්‍රාවකයෝ සත්කාර කෙරෙත්ද, ගෞරව කෙරෙත්ද, බුහුමන් කෙරෙත්ද, පූජා කෙරෙත්ද සත්කාර කොට ගෞරව කොට ඇසුරු කොට වාසය කෙරෙත්ද, මම මේ තුන්වන ධර්මය භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි දක්නෙමි.

"නැවත අනිකක්ද කියමි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ ලාමක ලාමක සෙනාසනයෙන් සතුටුවූයේ ලාමක ලාමක සේනාසනයෙන් සතුටුවීමෙහි ගුණ කියන්නේද වේ. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ ලාමක ලාමක සෙනාසනයෙන් සතුටුවූයේ ලාමක ලාමක සෙනාසනයෙහි සතුටුවීමෙහි ගුණ කියන්නේත් වේය යන යමක්වේද, ස්වාමීනි, යමකින් භාග්‍යවතුන් වහන්සේට ශ්‍රාවකයෝ සත්කාර කෙරෙත්ද, ගෞරව කෙරෙත්ද, බුහුමන් කෙරෙත්ද, පූජා කෙරෙත්ද, සත්කාර කොට ගෞරවකොට ඇසුරු කොට වාසය කෙරෙත්ද, මේ සතරවන ධර්මය භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මම දක්නෙමි.

"නැවත අනිකක්ද කියමි. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ උතුම් විවෙක ඇත්තේ උතුම් විවෙකයාගේ ගුණ කියන්නේද වේ. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ උතුම් විවේක ඇත්තේ උතුම් විවෙකයාගේ ගුණ කියන්නේත් වෙයි යන යමක් වේද, ස්වාමීනි, යමකින් භාග්‍යවතුන් වහන්සේට ශ්‍රාවකයෝ සත්කාර කෙරෙත්ද, ගෞරව කෙරෙත්ද බුහුමන් කෙරෙත්ද පූජා කෙරෙත්ද සත්කාර කොට ගෞරව කොට ඇසුරු කොට වාසය කෙරෙත්ද මේ පස්වන ධර්මය මම භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි දක්නෙමියි' කීයේය. "ස්වාමීනි, යමකින් භාග්‍යවතුන් වහන්සේට ශ්‍රාවකයෝ සත්කාර කෙරෙත්ද ගෞරව කෙරෙත්ද බුහුමන් කෙරෙත්ද පුදත්ද, සත්කාර කොට ගෞරව කොට ඇසුරු

කරගෙන වාසය කෙරෙත්ද ඒ මේ ධර්ම පස භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මම දක්නෙමියි” කීයේය.

**6.** “උදායීය, ශ්‍රමණ ගෞතමතෙම ස්වල්ප ආහාර ඇත්තේ ස්වල්ප ආහාර ඇති බැව්හි ගුණ කියන්නේත් වේයයි, ඉදින් මෙසේ මට ශ්‍රාවකයෝ සත්කාර කරන්නාහු නම් ගෞරව කරන්නාහු නම් බුහුමන් කරන්නාහු නම් පූජා කරන්නාහු නම් සත්කාර කොට ගෞරව කොට ඇසුරු කරගෙණ වාසය කරන්නාහු නම්, උදායීය, මාගේ ශ්‍රාවකයෝ වනාහි එක් කුඩා බඳුනක ආහාර වළඳා ජීවත් වන්නෝද වෙත්. එයින් බාගයක් වළඳා ජීවත් වන්නෝද වෙත්. බෙලිගෙඩියක් පමණ ආහාර වළඳා ජීවත් වන්නෝද, බෙලිගෙඩි බාගයක් පමණ ආහාර වළඳා ජීවත් වන්නෝද වෙත්. උදායීය මම වනාහි සමහර දවසක මේ පාත්‍රයෙන් මුවවිට දක්වාද වළඳමි, වැඩියක්ද වළඳමි, ශ්‍රමණ ගෞතම තෙමේ ස්වල්ප ආහාර ඇත්තේ ස්වල්ප ආහාර ඇතිබැව්හි ගුණ කියන්නේත් වේයයි, උදායීය, ඉදින් මට මෙසේ ශ්‍රාවකයෝ සත්කාර කරන්නාහු නම් ගෞරව කරන්නාහු නම් බුහුමන් කරන්නාහු නම් පූජා කරන්නාහු නම් සත්කාරකොට ගෞරවකොට ඇසුරුකොට වාසය කරන්නාහු නම් උදායීය, මාගේ යම් ඒ ශ්‍රාවකයෝ කුඩා භාජනයක ආහාර වළඳා ජීවත් වන්නෝද එයින් බාගයක් වළඳා ජීවත් වන්නෝද බෙලි ගෙඩියක් පමණ ආහාර වළඳන්නෝද බෙලිගෙඩි බාගයක් පමණ ආහාර වළඳන්නේද ඔව්හු මට මේ කාරණයෙන් සත්කාර නොකරන්නාහුය. ගෞරව නොකරන්නාහුය, බුහුමන් නොකරන්නාහුය. පූජා නොකරන්නාහුය, සත්කාර කොට ගෞරව කොට ඇසුරු කොට වාසය නොකරන්නාහුය.

“ශ්‍රමණ ගෞතමතෙම ලාමක ලාමක සිවුරකින් සතුටුවූයේ ලාමක ලාමක සිවුරකින් සන්තොෂ වීමෙහි ගුණ කියන්නේත් වේයයි, උදායීය, ඉදින් මට මෙසේ ශ්‍රාවකයෝ සත්කාර කරන්නාහු නම්, ගෞරව කරන්නාහු නම්, බුහුමන් කරන්නාහු නම්, පූජා කරන්නාහු නම් සත්කාර කොට ගෞරව කොට, ඇසුරු කොට වාසය කරන්නාහු නම්, උදායීය, රළු සිවුරු

දරන්නාවූ පංශුකූලිකවූ මාගේ ශ්‍රාවකයෝ වෙත්මය. ඔව්හු සොහොනෙන් හෝ කසලගොඩෙන් හෝ අවුලාගත් වස්ත්‍ර හෝ (කඩපිල් ලඟ දැමූ) වස්ත්‍ර හෝ කෙළවරවල් නැති වස්ත්‍රවලින් එකතුකොට සඟල සිවුරක් කොට දරත්. උදායීය, මම වනාහි සමහර දවසක දළවූ රූක්ෂවූද ලබු වැලෙහි බූව වැනි සියුම් නූලෙන් වියනලද සියුම්වූද ගෘහපතියන් විසින් දෙනලද සිවුරු දරමි. ශ්‍රමණ ගෞතම තෙම ලාමක ලාමක සිවුරෙන් සතුටුවූයේ ලාමක ලාමක සිවුරෙන් සන්තොෂ වීමෙහි ගුණකියන්නේත් වේයයි උදායීය, ඉදින් මෙසේ මට ශ්‍රාවකයෝ සත්කාර කරන්නාහුද ගෞරව කරන්නාහුද, බුහුමන් කරන්නාහුද, පුදන්නාහුද සත්කාර කොට, ගෞරව කොට, ඇසුරු කොට වාසය කරන්නාහුද, උදායීය, යම් ඒ මාගේ ශ්‍රාවකයෝ පාංශුකූලිකවූවාහු රළු සිවුරු දරන්නාහු සොහොනෙන් හෝ කසල ගොඩෙන් හෝ අව්ලාගත් වස්ත්‍ර හෝ කඩපිල් ලඟ දැමූ වස්ත්‍ර හෝ කෙළවරවල් නැති දිරූ වස්ත්‍රයෙන් එකතුකොට සඟල සිවුරක්කොට දරත්ද, ඒ ශ්‍රාවකයෝ මට මේ කාරණයෙන් සත්කාර නොකරන්නාහුය. ගෞරව නොකරන්නාහුය. බුහුමන් නොකරන්නාහුය, පූජා නොකරන්නාහුය, සත්කාර කොට ගෞරව කොට ඇසුරු කොට වාසය නොකරන්නාහුය.

"ශ්‍රමණ ගෞතම තෙම ලාමක ලාමක ආහාරයෙන් සතුටු වූයේ ලාමක ලාමක ආහාරයෙන් සන්තොෂ වීමෙහි ගුණ කියන්නේත් වේයයි, උදායීය, ඉදින් මෙසේ මට ශ්‍රාවකයෝ සත්කාර කරන්නාහුද ගෞරව කරන්නාහුද බුහුමන් කරන්නාහුද පුදන්නාහුද සත්කාර කොට ගෞරව කොට ඇසුරු කොට වාසය කරන්නාහුද, උදායීය, මාගේ ශ්‍රාවකයෝ වනාහි පිණ්ඩපාතිකවූවෝ ගෙපිළිවෙළින් හැසිරෙන්නේ පිඩු සිඟන වතෙහි ඇළුනෝ වෙත්. ඔව්හු ගමට පැමිණියාහු හිඳීමට කැඳවනු ලැබුවාහුද නොඉවසත්. උදායීය, මම වනාහි සමහර දවසක ආරාධනා ලැබූ තැන්වලද අව්ලාදමන ලද කලු ඇට ඇති නොයෙක් සූප ව්‍යඤ්ජන ඇති ඇල්හාලේ බත වළඳිමි.

"උදායීය, ශ්‍රමණ ගෞතම තෙම පහත් පහත් ආහාරයෙන් සතුටු වූයේ සතුටු වීමෙහි ගුණ කියන්නේත් වේයයි, ඉදින්

ශ්‍රාවකයෝ මට මෙසේ සත්කාර කරන්නාහු නම් ගෞරව කරන්නාහු නම් බුහුමන් කරන්නාහු නම් පුදන්නාහු නම් සත්කාර කොට ගෞරව කොට ඇසුරු කොට වසන්නාහු නම්, උදායීය, පිණ්ඩපාතයෙන් යැපෙන්නාවූ ගෙපිළිවෙළින් පිඬු පිණිස හැසිරෙන්නාවූ පිඬු සිඟන වතෙහි ඇලුනාවූ ගමට පැමිණියේවී නමුත් හිඳ ගැනීමට කැඳෙව්වත් නොපිළිගන්නාවූ මාගේ ශ්‍රාවකයෝ වෙත්ද, මේ කාරණයෙන් සත්කාර නොකරන්නාහුය. ගෞරව නොකරන්නාහුය. බුහුමන් නොකරන්නාහුය. නොපුදන්නාහුය. සත්කාර කොට ගෞරව කොට ඇසුරු කොට වාසය නොකරන්නාහුය.

"උදායීය, ශ්‍රමණ ගෞතමතෙම පහත් පහත්වූ සෙනසුන් සතුටු වූයේ පහත් පහත් සේනාසනයෙන් සතුටු වීමෙහි ගුණ කියන්නේත් වෙයි'. ඉදින් මෙසේ මට සත්කාර කරන්නාහු නම් ගෞරව කරන්නාහු නම් බුහුමන් කරන්නාහු නම් පුදන්නාහු නම් සත්කාර කොට ගෞරව කොට වාසය කරන්නාහු නම්, උදායීය, ගස්මුල්වල වාසය කරන්නාහු හිස්තැන්වල වාසය කරන්නාවූ මාගේ ශ්‍රාවකයෝ ඇත්තාහ. අටමසක් සෙවිළිකළ තැනකට ඇතුල් නොවෙත්. උදායීය, මම වනාහි සමහර දවසක උඩ යට ආලෙප කරණ ලද්දාවූ වාතය ඇතුල් නොවන්නාහු වසනලද දොර අගුල් ඇත්තාවූ වසනලද ජනෙල් ඇත්තාවූ කූළුගෙවල වලද වාසය කරමි. ශ්‍රමණ ගෞතම තෙමේ පහත් පහත්වූ සේනාසනයෙන් සතුටු වූයේ පහත් පහත්වූ සයනාසනයෙන් සතුටු විමෙහි ගුණ කියන්නේත් වේයයි, උදායීය, ඉදින් මෙසේ මට ශ්‍රාවකයෝ සත්කාර කරන්නාහු නම් ගෞරව කරන්නාහු නම් බුහුමන් කරන්නාහු නම් පුදන්නාහු නම්, සත්කාර කොට ගෞරව කොට ඇසුරුකොට වසන්නාහු නම්, උදායීය, ගස්මුල වසන්නාවූද හිස්තැන්වල වසන්නාවූද මාගේ යම් ඒ ශ්‍රාවකයෝ වෙත්ද, අටමසක් සෙවනකට නොපැමිණෙන්නාවූද, මාගේ යම් ඒ ශ්‍රාවකයෝ වෙත්ද, ඔවුහු මට මේ කාරණයෙන් සත්කාර නොකරන්නාහුය. ගෞරව නොකරන්නාහුය. බුහුමන් නොකරන්නාහුය. නොපුදන්නාහුය. සත්කාර කොට ගෞරව කොට ඇසුරු කොට වාසය නොකරන්නාහුය.

"ශ්‍රමණ ගෞතමතෙමේ උතුම්වූ විවේක ඇත්තේ උතුම්වූ විවේකයාගේ ගුණ කියන්නේත් වේයයි, උදායීය, ඉදින් මෙසේ මට ශ්‍රාවකයෝ සත්කාර කරන්නාහුනම් ගෞරව කරන්නාහුනම් බුහුමන් කරන්නාහුනම් පුදන්නාහුනම් සත්කාර කොට ගෞරව කොට ඇසුරු කොට වාසය කරන්නාහුනම්, උදායීය, ආරණ්‍යයෙහි වසන්නාවූ ඉතා දුර වන සෙනසුන් ඇතිව වනයෙහි ඉතාදුර සෙනසුන්වල වාසය කරන්නාවූ මාගේ ශ්‍රාවකයෝ නැත්තාහ. ඔව්හු අඩමසකට වරක් පොහෝ කිරීම සඳහා සංඝයාමැදට පැමිණෙත්. උදායීය, මම වනාහි සමහර දිනක භික්ෂූන්ගෙන් භික්ෂුණීන්ගෙන් උපාසකයන්ගෙන් උපාසිකාවන්ගෙන් රජුගෙන් රජ මහ ඇමතියන්ගෙන් තීර්ථකයන්ගෙන් තීර්ථක ශ්‍රාවකයන්ගෙන් පිරිවරනලදුවද වාසය කරමි. උදායීය, ශ්‍රමණ ගෞතම තෙම උතුම් විවේක ඇත්තේ උතුම් විවේකයාගේ ගුණ කියන්නේත් වේයයි, ඉදින් මෙසේ මට ශ්‍රාවකයෝ සත්කාර කරන්නාහු නම් ගෞරව කරන්නාහුනම් බුහුමන් කරන්නාහුනම් පුදන්නාහුනම් සත්කාර කොට ගෞරව කොට ඇසුරු කොට වාසය කරන්නාහුනම්, උදායීය, ආරණ්‍යයෙහි වාසය කරන්නාවූ ඉතා දුර වන සෙනසුන් ඇත්තාවූ, ආරණ්‍යයෙහි වනසෙනසුන් වලටද ඉතා දුරවූ සෙනසුන් වලටද ඇතුල්ව වාසය කරන්නාවූද අඩ මසකට වරක් සංඝයා මැදට පොහෝ කිරීම සඳහා රැස්වන්නාවූද යම් ඒ මාගේ ශ්‍රාවකයෝ ඔව්හු මේ කාරණයෙන් මට සත්කාර නොකරන්නාහුය. ගෞරව නොකරන්නාහුය බුහුමන් නොකරන්නාහුය, නුපුදන්නාහුය සත්කාර කොට ගෞරව කොට ඇසුරු කොට වාසය නොකරන්නාහුය. උදායීය, මෙසේ වනාහි ශ්‍රාවකයෝ මට මේ කරුණු පසින් සත්කාර නොකරත්. ගෞරව නොකරත්. බුහුමන් නොකරත්. නුපුදත්. සත්කාර කොට ගෞරව කොට ඇසුරු කොට වාසය නොකරත්.

7. "උදායීය, යමකින් මට ශ්‍රාවකයෝ සත්කාර කෙරෙත්ද ගෞරව කෙරෙත්ද බුහුමන් කෙරෙත්ද පුදත්ද සත්කාර කොට ගෞරව කොට ඇසුරු කොට වාසය කෙරෙත්ද, එබඳු අන්‍යවූද කරුණු පසක් ඇත්තාහ. කවර පසක්ද යත්? උදායීය, මේ

ශාසනයෙහි ශ්‍රාවකයෝ මට ශ්‍රමණ තෙම සිල් ඇත්තේ උතුම්වූ සීල සමූහයෙන් යුක්තවූයේයයි අධිසීලය කරුණුකොට ගරුකරත්. උදායීය, ශ්‍රමණ ගෞතම තෙම සිල් ඇත්තේ උතුම්වූ සීල සමූයෙන් යුක්තවූයේයයි, ශ්‍රාවකයෝ මට අධිසීලය නිමිතිකොට සම්භාවනා කෙරෙත්, යන යමක් වේද, උදායීය, මේ ශ්‍රාවකයන් මට සත්කාර කරන්නාවූ, ගෞරව කරන්නාවූ, බුහුමන් කරන්නාවූ, පුදන්නාවූ, සත්කාර කොට ගෞරව කොට ඇසුරු කොට වාසය කරන්නාවූ පළමුවන කාරණය වේ.

8. "උදායීය, නැවත අනිකක්ද කියමි. ශ්‍රමණ ගෞතමතෙම දැනම දනිමියි කියයි. ශ්‍රමණ ගෞතම තෙම දැකම දකිමියි කියයි. ශ්‍රමණ ගෞතම තෙම මනා නුවණින් දැන ධර්මය දෙශනා කරයි. නොදැන නොවෙයි. ශ්‍රමණ ගෞතම තෙම හෙතු සහිතව ධර්මය දෙශනා කරයි. හෙතු රහිතව නොවෙයි. ශ්‍රමණ ගෞතම තෙම කරුණු සහිතව ධර්මදෙශනා කරයි. කරුණු රහිතව නොවේයයි ශ්‍රාවකයෝ මට ශ්‍රේෂ්ඨවූ ඥානය (සර්වඥතාඥානය) කරුණුකොට ගරු කරත්. උදායීය, ශ්‍රමණ ගෞතම තෙම දැනම දනිමියි කියයි. ශ්‍රමණ ගෞතම තෙම දැකම දකිමියි කියයි. ශ්‍රමණ ගෞතම තෙම මනා නුවණින් දැන ධර්මය දෙශනා කරයි මනා නුවණින් නොදැන නොවෙයි. ශ්‍රමණ ගෞතම තෙම හෙතු සහිතව ධර්මය දෙශනා කරයි. හෙතු රහිතව නොවෙයි. ශ්‍රමණ ගෞතම තෙම කරුණු සහිතව ධර්මය දෙශනා කරයි. කරුණු රහිතව නොවේයයි ශ්‍රාවකයෝ මට ශ්‍රේෂ්ඨවූ ඥානය කරුණුකොට ගරු කෙරෙත් යන යමක්වේද, උදායීය, මේ වනාහි ශ්‍රාවකයන් මට සත්කාර කරන්නාවූ ගෞරව කරන්නාවූ බුහුමන් කරන්නාවූ පුදන්නාවූ, සත්කාරකොට ගෞරවකොට ඇසුරුකොට වාසය කරන්නාවූ ඒ දෙවන කාරණය වේ.

**9.** "උදායීය නැවත අනිකක්ද කියමි. ශ්‍රමණ ගෞතම තෙම ප්‍රඥා ඇත්තේ උතුම්වූ ප්‍රඥා රාශියෙන් යුක්තවූයෙ වෙයි. මතු පැමිණෙන්නාවූ වාද මාර්ග නොදක්නේය. උපන්නාවූ හෝ අනුන්ගේ වාද මාර්ග කරුණු සහිතව මනාව නිග්‍රහ කිරීමෙන් නිග්‍රහ නොකරන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේයයි

ශ්‍රාවකයෝ මට අධිප්‍රඥාව (එකෙණෙහි පහළවන නුවණ) නිමිතිකොට ගරු කෙරෙත්. උදායීය, ඒ කුමකැයි හඟින්නෙහිද? එසේ දන්නාවූ, එසේ දක්නාවූ මාගේ ශ්‍රාවකයෝ අතරතුර කථාව හෙලන්නාහුද?" "ස්වාමීනි, එසේ නැත." "උදායීය, මම වනාහි ශ්‍රාවකයන් කෙරෙන් අනුශාසනාවක් බලාපොරොත්තු නොවෙමි. ශ්‍රාවකයෝ ඒකාන්තයෙන් මගෙන්ම අනුශාසනාව බලාපොරොත්තුවෙති. උදායීය, ශ්‍රමණ ගෞතම තෙම ප්‍රඥා ඇත්තේ උතුම්වූ ප්‍රඥා සමූහයෙන් යුක්ත වූයේ වෙයි. මතු පැමිණෙන්නාවූ ඒ වාද මාර්ගය හෝ නොදක්නේය. උපන්නාවූ හෝ අනුන්ගේ වාදය කරුණු සහිතව මනාව නිග්‍රහ කිරීමෙන් නිග්‍රහ නොකරන්නේය යන මේ කාරණය විද්‍යමාන නොවේයයි, ශ්‍රාවකයෝ මට අධිප්‍රඥාව කරණකොට ගරුකෙරෙත්, යන යමක් වේද, උදායීය, ශ්‍රාවකයන් මට සත්කාර කරන්නාවූ, ගෞරව කරන්නාවූ, බුහුමන් කරන්නාවූ, පූජාකරන්නාවූ, සත්කාරකොට ගෞරවකොට ඇසුරුකරන්නාවූ තුන්වැනි කරුණ වේ.

**10.** "උදායීය නැවත අනිකක්ද කියමි. මාගේ ශ්‍රාවකයෝ යම් දුකකින් දුකට බැසගත්තාහුද, දුකින් පෙළුනාහුද, ඔව්හු මා කරා පැමිණ දුක්ඛ ආර්යසත්‍යය අසත්. දුක්ඛාර්යසත්‍ය විචාරණ ලද්දාවූ මම ඔවුන්ට ප්‍රකාශ කරමි. මම ඔවුන්ගේ සිත ප්‍රශ්න විසඳීමෙන් සතුටු කරමි. ඔව්හු මා දුක්ඛසමුදය සත්‍යය විචාරත්. ඔවුන්ට මම දුක්ඛ සමුදය සත්‍යය විචාරණ ලද්දේ ප්‍රකාශ කරමි. මම ඔවුන්ගේ ප්‍රශ්න විසඳීමෙන් සිත සතුටු කරමි. ඔව්හු දුක්ඛ නිරොධ සත්‍යය මා විචාරත්. ඔවුන්ට මම දුක්ඛ නිරොධ සත්‍යය විචාරන ලද්දේ ප්‍රකාශ කරමි. මම ඔවුන්ගේ ප්‍රශ්න විසඳීමෙන් සිත සතුටු කරමි. දුක් නිරුද්ධ කිරීම පිණිස පිළිපදින මාර්ගයවූ ආර්යසත්‍යය අසත්. ඔවුන්ට දුක්ඛ නිරොධගාමිනී ප්‍රතිපදාර්යසත්‍යය අසන ලද්දාවූ මම ප්‍රකාශ කරමි. මම ප්‍රශ්න විසඳීමෙන් ඔවුන් සතුටු කරමි.

**11.** "උදායීය, මාගේ ශ්‍රාවකයෝ යම් දුකකින් දුකට බැස ගත්තාවූද, දුකින් පෙළුනාවූද, ඔව්හු මා වෙත එළඹ දුක්ඛාර්ය සත්‍යය අසත්. අසන ලද්දාවූ මම ඔවුන්ට දුක්ඛාර්යසත්‍යය ප්‍රකාශ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කරමි. ඔවුන්ගේ සිත මම ප්‍රශ්න විසඳීමෙන් සතුටු කරමි. ඔව්හු මා දුක්ඛසමුදයාර්යසත්‍යය විචාරත්. ඔවුන්ට මම දුක්ඛ සමුදය සත්‍යය විචාරණ ලද්දේ ප්‍රකාශ කරමි. මම ඔවුන්ගේ ප්‍රශ්න විසඳීමෙන් සිත සතුටු කරමි. ඔව්හු දුක්ඛ නිරොධ සත්‍යය මා විචාරත්. ඔවුන්ට මම දුක්ඛ නිරොධ සත්‍යය විචාරන ලද්දේ ප්‍රකාශ කරමි. මම ඔවුන්ගේ ප්‍රශ්න විසඳීමෙන් සිත සතුටු කරමි. දුක්ඛ නිරොධගාමිනී ප්‍රතිපදාර්ය සත්‍යය අසත්. අසන ලද්දාවූ මම දුක්ඛ නිරොධගාමිනී ප්‍රතිපදාර්ය සත්‍යය ප්‍රකාශ කරමි. මම ඔවුන්ගේ සිත ප්‍රශ්න විසඳීමෙන් සතුටු කරමි, යන යමක් වේද, උදායීය, මේ වනාහි යමකින් මට ශ්‍රාවකයන් සත්කාර කරන්නාවූද, ගෞරව කරන්නාවූද, බුහුමන් කරන්නාවූද, පූජාකරන්නාවූද සත්කාරකොට ගෞරවකොට ඇසුරුකොට වාසය කරන්නාවූ සතරවන කරුණ වේ.

12. "උදායීය, නැවත අනිකක්ද කියමි. යම්සේ පිළිපැද්දාවූ මාගේ ශ්‍රාවකයෝ සතර සතිපට්ඨානයන් වඩත්ද, එසේ මා විසින් ශ්‍රාවකයන්ට ප්‍රතිපදාව ප්‍රකාශ කරණ ලද්දීය. උදායීය, මේ ශාසනයෙහි භික්ෂු තෙම කෙලෙස් තවන වීර්ය ඇත්තේ නුවණින් යුක්තවූයේ සිහි ඇත්තේ ස්කන්ධ ලොකයෙහි ලෝභය හා ද්වෙෂය දුරුකොට ශරීරයෙහි ශරීරය අනුව බලමින් වාසය කෙරේද, කෙලෙස් තවන වීර්ය ඇත්තේ මනා දැනුම් ඇත්තේ ලොකයෙහි විෂම ලෝභය හා සිතේ නොසතුට දුරුකොට වෙදනාවන්හි වෙදනාවන් අනුව බලමින් වාසය කෙරේද, කෙලෙස් තවන වීර්යය ඇත්තේ, මනා දැනුම් ඇත්තේ, ලොකයෙහි විසම ලොභය හා සිතේ නොසතුට දුරුකොට සිතෙහි සිත අනුව බලමින් වාසය කෙරේද, කෙලෙස් තවන වීර්ය ඇත්තේ නුවණින් යුක්ත වූයේ සිහි ඇත්තේ ස්කන්ධ ලොකයෙහි ලොභ දොෂයන් දුරු කොට ධර්මයන්හි ධර්මයන් අනුව බලමින් වාසය කෙරේද, ඒ සතරසතිපට්ඨානයන්හි වනාහි මාගේ බොහෝ ශ්‍රාවකයෝ දැනීමේ කෙළවරවන අර්හත්වයට පැමිණ වාසය කරත්.

13. "උදායීය, නැවත අනිකක්ද කියමි. යම්සේ පිළිපන්නාවූ මාගේ ශ්‍රාවකයෝ සතර සම්‍යක් ප්‍රධානයන් (මහාවීර්ය සතරක්)

වඩත්ද, මා විසින් ඒ ප්‍රතිපදාව ශ්‍රාවකයන්ට ප්‍රකාශ කරණ ලද්දීය. උදායීය, මේ ශාසනහෙහි භික්ෂුතෙම නූපන්නාවූ ලාමකවූ අකුසල ධර්මයන්ගේ නොඉපදීම පිණිස කැමැත්ත උපදවයි, උත්සාහ කරයි, වීර්ය පටන් ගනියි, සිත ඔසවයි, වීර්යකරයිද, උපන්නාවූ ලාමකවූ අකුසලධර්මයන්ගේ දුරුකිරීම පිණිස කැමැත්ත උපදවයි, ව්‍යායාම කරයි. වීර්ය පටන්ගනියි. සිත ඔසවයි, උත්සාහ කරයිද, නූපන්නාවූ කුසලධර්මයන්ගේ ඉපදීම පිණිස කැමැත්ත උපදවයි. ව්‍යායාම කරයි. වීර්ය පටන්ගනියි. සිත ඔසවයි. උත්සාහ කරයිද, උපන්නාවූ කුසලධර්මයන්ගේ පැවැත්ම පිණිස මුලානොවීම පිණිස, වැඩිවීම පිණිස, මහත් බැව් පිණිස, භාවනාව සම්පූර්ණ කිරීම පිණිස, කැමැත්ත උපදවයි, ව්‍යායාම කරයි. වීර්ය පටන් ගනියි, සිත ඔසවයි, උත්සාහ කරයිද, ඒ සම්‍යක් ප්‍රධාන වීර්ය සතරෙහිද වනාහි මාගේ බොහෝවූ ශ්‍රාවකයෝ අභිඥ්ඥාවොසාන පාරමී සංඛ්‍යාතවූ, දැනීමේ කෙළවරවන රහත් බවට පැමිණ වාසය කෙරෙත්.

14. "උදායීය, නැවත අනිකක්ද කියමි. යම්සේ පිළිපන්නාවූ මාගේ ශ්‍රාවකයෝ සතරඍද්ධිපාදයන් වඩත්ද, මා විසින් ශ්‍රාවකයන්ට ඒ ප්‍රතිපදාතොමෝ ප්‍රකාශ කරණ ලද්දීය. උදායීය, මේ ශාසනයෙහි භික්ෂු තෙම ඡන්දය නිසා පවත්නා සමාධියෙන් හා වීර්යයෙන් යුත් ඍද්ධිපාදය වඩයි. වීර්ය නිසා පවත්නා සමාධි ප්‍රධාන සංස්කාරයන්ගෙන් යුක්තවූ ඍද්ධිපාදය වඩයි. චිත්තසමාධි ප්‍රධාන සංස්කාරයන්ගෙන් යුක්තවූ ඍද්ධිපාදය වඩයි. ඥානය නිසා පවත්නාවූ සමාධියෙන් හා වීර්යයෙන් යුක්තවූ ඍද්ධිපාදය වඩයි. ඒ සතර ඍද්ධිපාදයන්හිද මාගේ බොහෝ ශ්‍රාවකයෝ නුවණින් කෙළවරට ගිය අර්හත්වයට පැමිණ වාසය කෙරෙත්.

15. "උදායීය, නැවත අනිකක්ද කියමි. යම්සේ පිළිපන්නාවූ මාගේ ශ්‍රාවකයෝ පඤ්චෙන්ද්‍රියයන් වඩත්ද, මා විසින් ශ්‍රාවකයන්ට ඒ ප්‍රතිපදාව ප්‍රකාශ කරණ ලද්දීය. උදායීය, මේ ශාසනයෙහි භික්ෂු තෙම ක්ලේශයන් සංසිඳීමට

පැමිණෙන්නාවූද, මාර්ග ඥාන අවබොධයට පමුණුවන්නාවූද ශ්‍රද්ධින්ද්‍රිය වඩයිද, සංසිඳීමට පමුණුවන්නාවූ සම්බොධියට පමුණුවන්නාවූ, වීරියෙන්ද්‍රිය වඩාද, සංසිඳීමට පමුණුවන්නාවූ සම්බොධියට පමුණුවන්නාවූ ස්මෘතින්ද්‍රිය වඩාද, සංසිඳීමට පමුණුවන්නාවූ, සම්බොධියට පමුණුවන්නාවූ, සමාධින්ද්‍රිය වඩාද ක්ලෙශයන් සංසිඳීමට පමුණුවන්නාවූද, මාර්ග ඥානාවබොධයට පමුණුවන්නාවූද, ප්‍රඥෙන්ද්‍රියය වඩායි. පඤ්චෙන්ද්‍රියයන්හිද මාගේ බොහෝවූ ශ්‍රාවකයෝ අභිඥාවොසාන පාරමී යයි කියන ලද රහත් බවට පැමිණියාහු වාසය කෙරෙත්.

**16.** "උදායීය, නැවත අනිකක්ද කියමි. යම්සේ පිළිපන්නාවූ මාගේ ශ්‍රාවකයෝ පඤ්ච බලයන් වඩත්ද, උදායීය, මේ ශාසනයෙහි භික්ෂු තෙම කෙළෙසුන් සංසිඳීමට පමුණුවන්නාවූ මාර්ග ඥානයට පමුණුවන්නාවූ ශ්‍රද්ධා බලය වඩාද, සංසිඳීමට පමුණුවන්නාවූ සම්බෝධියට පමුණුවන්නාවූ වීර්ය බලය වඩාද, සංසිඳීමට පමුණුවන්නාවූ, සම්බෝධියට පමුණුවන්නාවූ ස්මෘති බලය වඩාද, සංසිඳීමට පමුණුවන්නාවූ සම්බොධියට පමුණුවන්නාවූ සමාධි බලය වඩාද, කෙළෙසුන් සංසිඳීමට පමුණුවන්නාවූ මාර්ග ඥානයට පමුණුවන්නාවූ ප්‍රඥා බලය වඩාද, එයින්ද වනාහී මාගේ බොහෝවූ ශ්‍රාවකයෝ දැනීමේ කෙළවරට පමුණුවන්නාවූ රහත් බවට පැමිණ වාසය කෙරෙත්.

**17.** "උදායීය, නැවත අනිකක්ද කියමි. යම්සේ පිළිපන්නාවූ මාගේ ශ්‍රාවකයෝ සප්තබොද්ධ්‍යංගයන් වඩත්ද මා විසින් ශ්‍රාවකයන්ට ඒ ප්‍රතිපදාව ප්‍රකාශ කරන ලද්දීය. උදායීය, මේ ශාසනයෙහි භික්ෂුතෙම විවේකය ඇසුරු කළාවූද නොඇලීම ඇසුරු කළාවූද නිරොධය ඇසුරු කළාවූද නිවණට පමුණුවන්නාවූ සති සම්බොජ්ජංගය වඩාද, විවේකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ, නිවණට පමුණුවන්නාවූ ධම්ම විචය සම්බොජ්ජංගය වඩාද, විවේකය ඇසුරු කළාවූ, විරාග ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ, නිවණට පමුණුවන්නාවූ, විරිය සම්බොජ්ජංගය වඩාද, විවේකය ඇසුරු කළාවූ, විරාගය ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ,

නිවණට පමුණුවන්නාවූ, ප්‍රීති සම්බොජ්ජංගය වඩාද, විවේකය ඇසුරු කළාවූ, විරාග ඇසුරු කළාවූ නිරොධය ඇසුරු කළාවූ නිවණට පමුණුවන්නාවූ පස්සද්ධි සම්බොජ්ජංගය වඩාද, විවේකය ඇසුරු කළාවූ, විරාග ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ, නිවණට පමුණුවන්නාවූ සමාධි සම්බොජ්ජංගය වඩාද, විවේකය ඇසුරු කළාවූ නොඇලීම ඇසුරු කළාවූ, නිරොධය ඇසුරු කළාවූ, නිවනට පමුණුවන්නාවූ උපෙක්ඛා සම්බොජ්ජංගය වඩාද, එයිනුදු වනාහි මාගේ බොහෝවූ ශ්‍රාවකයෝ දැනීමේ කෙළවරට පමුණුවන්නාවූ රහත් බවට පැමිණ වාසය කෙරෙත්.

18. "උදායීය, නැවත අනිකක්ද කියමි. යම්සේ පිළිපන්නාවූ මාගේ ශ්‍රාවකයෝ ආර්යවූ අංග අටකින් යුත් මාර්ගය වඩත්ද, මා විසින් ශ්‍රාවකයන්ට ඒ ප්‍රතිපදාව ප්‍රකාශ කරණ ලද්දීය. උදායීය, මේ ශාසනයෙහි භික්ෂුතෙම සම්‍යක් දෘෂ්ටිය වඩාද, සම්‍යක් සංකල්පය වඩාද, සම්‍යක් වචනය වඩාද, සම්‍යක් කර්මාන්තය වඩාද, සම්‍යක් ආජීවය වඩාද, සම්‍යක් ව්‍යායාමය වඩාද, සම්‍යක් ස්මෘතිය වඩාද, සම්‍යක් සමාධිය වඩාද, එයිනුදු වනාහි මාගේ බොහෝවූ ශ්‍රාවකයෝ දැනීමේ කෙළවරට පමුණුවන්නාවූ රහත් බවට පැමිණ වාසය කෙරෙත්.

19. "උදායීය, නැවත අනිකක්ද කියමි. යම්සේ පිළිපන්නාවූ මාගේ ශ්‍රාවකයෝ විරුද්ධ ක්ලෙශයන්ගෙන් මිදීම් අටක් වඩත්ද මා විසින් ශ්‍රාවකයන්ට ඒ ප්‍රතිපදාව ප්‍රකාශ කරණ ලද්දීය. රූප ඇත්තේ රූපයන් දකියි. මේ පළමුවන මිදීමයි. තමන් කෙරෙහි අරූප සංඥා ඇත්තේ පිටත්හි රූපයන් දකියි. මේ දෙවන මිදීම වේ. සුභයයිම අදහස් ඇත්තේ වේ. මේ තුන්වන මිදීමයි. සියලු ආකාරයෙන් රූප සංඥාවන් ඉක්මවා ප්‍රතිඝ සංඥාවන් නැසීමෙන් නානාත්ව සංඥාවන් මෙනෙහි නොකිරීමෙන් ආකාසය කෙළවරක් නැත්තේයයි, ආකාසානඤ්චායතන සමාපත්තියට පැමිණ වාසයකරයි. මේ සතරවන මිදීමයි. සියලු ආකාරයෙන් ආකාසානඤ්චායතනය ඉක්මවා විඤ්ඤාණය අනන්තයයි, විඤ්ඤානඤ්චායතන සමාපත්තියට පැමිණ වාසය

කරයි. මේ පස්වන මිදීමයි. සියලු ආකාරයෙන් විඤ්ඤානඤ්චායතනය ඉක්මවා කිසිවක් නැතැයි ආකිඤ්චඤ්ඤායතන සමාපත්තියට පැමිණ වාසය කරයි. මේ සවන මිදීමයි. සියලු ආකාරයෙන් ආකිඤ්චඤ්ඤායතනය ඉක්මවා නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියට පැමිණ වාසය කරයි. මේ සත්වන මිදීමයි. සියලු ආකාරයෙන් නෙවසඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තිය ඉක්මවා සංඥා වෙදයිත නිරොධ සමාපත්තියට පැමිණ වාසය කරයි. මේ අටවන විමොක්ෂයයි. එයිනුදු වනාහි මාගේ බොහෝවූ ශ්‍රාවකයෝ දැනීමේ කෙළවරට පමුණුවන්නාවූ අර්හත්වයට පැමිණ වාසය කෙරෙත්.

**20.** "උදායීය, නැවත අනිකක්ද කියමි. යම්සේ පිළිපන්නාවූ මාගේ ශ්‍රාවකයෝ අභිභායතන (විරුද්ධ ධර්මයන් මැඩපවත්වන ධර්ම) අටක් වඩත්ද, මා විසින් ශ්‍රාවකයන්ට ඒ ප්‍රතිපදාව ප්‍රකාශ කරන ලද්දීය. අධ්‍යාත්මයෙහි රූප සංඥා ඇත්තේ එකෙක් පිටත්හිවූ ස්වල්පවූද යහපත් වර්ණ ඇත්තාවූද අයහපත් වර්ණ ඇත්තාවූද රූපයන් දකියි. ඔවුන් මැඩපවත්වා දනිමි, දකිමියි මෙබඳු සංඥා ඇත්තේවේ. මේ පළමුවන අභිභායතනයවේ. අධ්‍යාත්මයෙහි රූප සංඥා ඇත්තේ එකෙක් අප්‍රමාණවූ යහපත් වර්ණ ඇත්තාවූද, අයහපත් වර්ණ ඇත්තාවූද පිටත්හි රූපයන් දකියි. ඔවුන් මැඩපවත්වා දනිමි දකිමි, මෙබඳු සංඥා ඇත්තේවේ. මේ දෙවන අභිභායතනය වේ. අධ්‍යාත්මයෙහි අරූප සංඥා ඇත්තේ එකෙක් ස්වල්පවූ යහපත් වර්ණ ඇත්තාවූද අයහපත් වර්ණ ඇත්තාවූද පිටත්හි රූපයන් දකියි. ඔවුන් මැඩපවත්වා දනිමි දකිමියි මෙබඳු සංඥා ඇත්තේවේ. මේ තුන්වන අභිභායතනයයයි, අධ්‍යාත්මයෙහි අරූප සංඥා ඇත්තාවූ එකෙක් අප්‍රමාණවූ යහපත් වර්ණ ඇත්තාවූද අයහපත් වර්ණ ඇත්තාවූද පිටත්හි රූපයන් දකියි. ඔවුන් මැඩපවත්වා දනිමි දකිමියි මෙබඳු සංඥා ඇත්තේවේ. මේ සතරවන අභිභායතනයයි අධ්‍යාත්මයෙහි අරූප සංඥා ඇත්තේ නිල්වූ නීලවර්ණ ඇත්තාවූ නිල් දැකීම් ඇත්තාවූ නිල් බැබලුම් ඇත්තාවූ පිටත්හි රූපයන් දකියි. යම්සේ නම් දියබෙරලිය මල නිල්ද නිල් පැහැයද නිල් දැකීම් සහිතද

නිල් බැබලුම් ඇත්තක් වේද, (එමෙනි) යම්සේ හෝ දෙපස මදින ලද නිල්වූ නීලවර්ණ ඇත්තාවූ නිල් දැකීම් ඇත්තාවූ නිල් බැබලුම් ඇත්තාවූ බරණැසවූ ඒ වස්ත්‍රයක් වේද, (එමෙනි) මෙපරිද්දෙන්ම අධ්‍යාත්මයෙහි අරූප සංඥා ඇත්තේ එකෙක් නිල්වූ නිල්වන්වූ නිල් දැකීම් ඇත්තාවූ නිල් බැබලුම් ඇත්තාවූ පිටත්හි රූපයන් දකියි. ඔවුන් මැඩගෙණ දනිමි දකිමියි, මෙබඳු සංඥා ඇත්තේවේ. මේ පස්වන අභිභායතනයයි, අධ්‍යාත්මයෙහි අරූප සංඥා ඇත්තේ එකෙක් රන්වන්වූ රන්වන් දැකීම් ඇත්තේ රන්වන් බැබලුම් ඇත්තාවූ පිටත්හි රූපයන් දකියි, යම්සේ නම් කිණිහිරි මල රන්වන්ද රන්වන් දැකීම් ඇත්තේද, රන්වන් බැබලුම් ඇත්තේද යම්සේ හෝ බරණැස් නුවරෙහිවූ ඒ වස්ත්‍රය දෙපසින් මදිනලද්දේ රන්වන් වූයේ රන්වන් දැකීම් ඇත්තේ රන්වන් බැබලුම් ඇත්තේ වේද, එපරිද්දෙන්ම අධ්‍යාත්මයෙහි අරූපසංඥා ඇත්තේ එකෙක් රන්වන්වූ රන්වන් දැකීම් ඇත්තාවූ රන්වන් බැබලුම් ඇත්තාවූ පිටත්හි රූපයන් දකියි. ඔවුන් මැඩගෙණ දනිමි දකිමියි. මෙබඳු සංඥා ඇත්තේවේ. මේ සවැනි අභිභායතනයි. අධ්‍යාත්මයෙහි අරූප සංඥා ඇත්තේ එකෙක් ලේ වර්ණ ඇත්තාවූ ලේවන් දැකීම් ඇත්තාවූ ලේවන් බැබලුම් ඇත්තාවූ පිටත්හි රූපයන් දකියි. යම්සේ නම් බඳුවද මලක් ලේ පාට වේද, ලේ පාට ඇත්තේ ලේ පාට දැකීම් ඇත්තේද ලේ පාට බැබලුම් ඇත්තේද යම්සේ හෝ බරණැසෙහිවූ ඒ වස්ත්‍රය දෙපස මැදීම ඇත්තේ ලේ පාට දැකීම් ඇත්තේ ලේපාට බැබලීම් ඇත්තේවේද, එපරිද්දෙන්ම අධ්‍යාත්මයෙහි රූප සංඥා ඇත්තාවූ පුද්ගලයෙක් ලේ පාට ඇත්තාවූ ලේපාට දැකීම් ඇත්තාවූ ලේපාට බැබලුම් ඇත්තාවූ පිටත්හි රූපයන් දකියි. ඔවුන් මැඩගෙණ දනිමි දකිමියි, මෙබඳු සංඥා ඇත්තේ වේ. මේ සත්වන අභිභායතනයයි. අධ්‍යාත්මයෙහි අරූප සංඥා ඇත්තාවූ එක් පුද්ගලයෙක් සුදුවූ සුදුපාට ඇත්තාවූ සුදු දැකීම් ඇත්තාවූ සුදු බැබලීම් ඇත්තාවූ පිටත්හි රූපයන් දකියි. යම්සේ නම් පාන්තරුව සුදුවූවා සුදුපාට ඇත්තී සුදුපාට දැකීම් ඇත්තී සුදුපාට බැබලීම් ඇත්තීද යම්සේ හෝ බරණැසවූ ඒ වස්ත්‍රය දෙපස මැදීම ඇත්තේ සුදුවූයේ සුදුපාට ඇත්තේ සුදු දැකීම් ඇත්තේ සුදු බැබලීම්

ඇත්තේද එපරිද්දෙන්ම අධ්‍යාත්මයෙහි අරූප සංඥා ඇත්තේ එක් පුද්ගලයෙක් සුදුවූ සුදුපාට ඇත්තාවූ සුදුපාට දැකීම් ඇත්තාවූ සුදුපාට බැබලීම් ඇත්තාවූ පිටත්හි රූපයන් දකියි. ඔවුන් මැඩගෙණ දනිමි දකිමියි මෙබඳු සංඥා ඇත්තේ වේ. මේ අටවැනි අභිභායතනයයි. එයිනුදු වනාහි මාගේ බොහෝ ශ්‍රාවකයෝ ධ්‍යානඅභිඥාවගේ කෙළවරට පැමිණ වාසය කරත්.

21. "උදායීය, නැවත අනිකක්ද කියමි. යම්සේ පිළිපන්නාවූ මාගේ ශ්‍රාවකයෝ දසකසිණ අරමුණු වඩත්ද, මා විසින් ශ්‍රාවකයන්ට ඒ ප්‍රතිපදාව ප්‍රකාශ කරණ ලද්දීය. එක් පුද්ගලයෙක් උඩ භාගයෙහිද යට භාගයෙහිද සරසද හාත්පසද එකක්මවූ අප්‍රමාණවූ පඨවි කසිණය දැනගනියි. එක් පුද්ගලයෙක් උඩ යට සරස එකක්මවූ අප්‍රමාණවූ ආපො කසිණය දැනගනියි. එක් පුද්ගලයෙක් උඩ යට සරස එකක්මවූ අප්‍රමාණවූ තෙජො කසිණය දැනගනියි. එක් පුද්ගලයෙක් උඩ යට සරස එකක්මවූ අප්‍රමාණවූ වායො කසිණය දැනගනියි. එක් පුද්ගලයෙක් උඩ යට සරස එකක්මවූ අප්‍රමාණවූ නීල කසිණය දැනගනියි. එක් පුද්ගලයෙක් උඩ යට සරස එකක්මවූ අප්‍රමාණවූ පීත කසිණය දැනගනියි. එක් පුද්ගලයෙක් උඩ යට සරස එකක්මවූ අප්‍රමාණවූ ලොහිතකසිණය දැනගනියි. එක් පුද්ගලයෙක් උඩ යට සරස එකක්මවූ අප්‍රමාණවූ ඔදාත කසිණය දැනගනියි. එක් පුද්ගලයෙක් උඩ යටසරස එකක්මවූ අප්‍රමාණවූ ආකාස කසිණය දැනගනියි. එක් පුද්ගලයෙක් උඩ භාගයෙහිද යට භාගයෙහිද සරස හාත්පසද එකක්මවූ අප්‍රමාණවූ විඤ්ඤාණ කසිණය දැනගනියි. එයිනුදු වනාහි මාගේ බොහෝ ශ්‍රාවකයෝ ධ්‍යාන අභිඥාවන්ගේ කෙළවරට පැමිණ වාසය කරත්.

22. "උදායීය, නැවත අනිකක්ද කියමි. යම්සේ පිළිපන්නාවූ මාගේ ශ්‍රාවකයෝ සතරධ්‍යානයන් වඩත්ද, මාවිසින් ශ්‍රාවකයන්ට ඒ ප්‍රතිපදාව ප්‍රකාශ කරණ ලද්දීය. උදායීය, මේ ශාසනයෙහි භික්ෂුතෙම කාමයන්ගෙන් වෙන්වම අකුශල ධර්මයන්ගෙන් වෙන්ව විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරයි.

හෙතෙම මෙම කය විවේකයෙන් හටගත්තාවූ ප්‍රීති සැපයෙන් මනාව තෙමයි. හාත්පසින් තෙමයි. සම්පූර්ණ කරයි. හාත්පසින් පුරවයි. මොහුගේ සියලු ශරීරය පිළිබඳ කිසිවකුත් විවේකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් නොපැතිරෙන ලද්දේ නොවේ. උදායීය, යම්සේ දක්ෂවූ නාවන්නෙක් හෝ නාවන්නෙකුගේ අතවැසියෙක් හෝ ලොහෝ තලියෙහි නෑමට ගන්නා සුණු බහා ජලයෙන් හන හනා තෙමන්නේද, ඒ මොහුගේ නෑමට ගන්නා සුණු පිඩ හොඳින් ඇනී හොඳින් කලවන් වූයේ ඇතුළත පිටත සමසේ ස්පර්ශ කරණ ලද්දේ යහපත් ආකාරයෙන් වැගිරෙන්නේද, උදායීය, එපරිද්දෙන්ම භික්ෂු තෙම මෙම ශරීරය විවෙකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් මනාව තෙමයි. හාත්පස තෙමයි. සම්පූර්ණ කරයි. හාත්පස පතුරුවයි. මොහුගේ සියලුම කය පිළිබඳ කිසිවකුත් විවෙකයෙන් හටගත් ප්‍රීති සැපයෙන් නොපැතිරෙන ලද්දේ නොවෙයි.

23. "උදායීය, නැවත අනිකක්ද කියමි. භික්ෂු තෙම විතර්ක විචාරකයන් සංසිඳීමෙන් ඇතුලත පැහැදීම ඇති, හිතේ එකඟ බව ඇති, විතර්ක රහිතවූ විචාර රහිතවූ, සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. හෙතෙම මෙම ශරීරය සමාධියෙන් හටගත්තාවූ ප්‍රීති සැපයෙන් මනාව තෙමයි, හාත්පස තෙමයි, සම්පූර්ණ කරයි, හාත්පස පතුරුවයි. මොහුගේ සියලුම කය පිළිබඳ කිසිවකුත් සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් නොපැතිරෙන ලද්දේ නොවෙයි. උදායීය, යම්සේ උල්පත්වලින් එන ජලය ඇති දියවිලක් වේද එයට පූර්වදිශාවෙහි දිය එන්නාවූ දොරටුවක්ද නොවන්නේය, පශ්චිම දිශාවෙහි දිය එන්නාවූ දොරටුවක්ද නොවන්නේය. උතුරු දිශාවෙහි දිය එන්නාවූ දොරටුවක්ද නොවන්නේය. දකුණු දිශාවෙහි දිය එන්නාවූ දොරටුවක්ද නොවන්නේය. වැස්සද කලින් කල මනාකොට නොවස්නේය. එකල්හි ඒ දිය විලෙන්ම සිහිල්වූ ජලධාරාවෝ උඩට නැගී ඒ දියවිලම සිහිල් ජලයෙන් මනාව තෙමන්නේද, හාත්පස තෙමන්නේද පුරවන්නේද පැතිරෙන්නේද මේ සියලුම දියවිලේ කිසිවකුත් සිහිල්වූ ජලයෙන්

නොපැතුරුනේ නොවන්නේද, උදායීය, එපරිද්දෙන්ම භික්ෂුතෙම මෙම ශරීරය සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් මනාව තෙමයි හාත්පස තෙමයි, සම්පූර්ණ කරයි. හාත්පස පතුරුවයි. මේ සියලුම ශරීරය පිළිබඳ කිසිවකුත් සමාධියෙන් හටගත් ප්‍රීති සැපයෙන් නොපැතුරුනේ නොවෙයි.

**24.** "උදායීය, නැවත අනිකක්ද කියමි. භික්ෂුතෙම ප්‍රීතියෙහිද නොඇල්මෙන් උපෙක්ෂාඇත්තේ වාසය කරයිද, සිහියෙන් යුක්තවූයේ, නුවණින් යුක්තවූයේ, ශරීරයෙන් සුවය විඳින්නේද, යම් ඒ ධ්‍යානයක් උපෙක්ෂා ඇත්තේ සිහි ඇත්තේ, සැප විහරණ ඇත්තේයයි ආර්යයෝ කියත්ද, ඒ තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. හෙතෙම මෙම ශරීරය ප්‍රීති රහිතවූ සැපයෙන් මනාව තෙමයි, හාත්පස තෙමයි, පුරවයි, හාත්පස පතුරුවයි. මොහුගේ සියලුම ශරීරය පිළිබඳ කිසිවකුත් ප්‍රීති රහිතවූ සැපයෙන් නොපැතුරුනේ නොවෙයි. උදායීය, යම්සේ රතු නෙලුම් විලක හෝ මානෙල්විලක හෝ සුදුනෙලුම් විලක හෝ ඇතැම් රතුනෙලුම් හෝ මානෙල් හෝ සුදුනෙලුම් හෝ දියෙහි හටගත්තාහු දියෙහි වැඩුනාහු දියෙන් මතු නොවූවාහු ඇතුළත ගැලී වැඩුණාහු අග දක්වාද මුල දක්වාද සිහිල් ජලයෙන් මනාව තෙමුනාහු හාත්පස තෙමුනාහු සම්පූර්ණ වූවාහු හාත්පස පැතුරුනාහු වෙත්ද, ඒ සියලු රතු නෙළුම්වල හෝ මානෙල්වල හෝ සුදු නෙළුම්වල හෝ කිසිවකුත් සිහිල් දියෙන් නොපැතුරුනේ නොවන්නේද, උදායීය, එපරිද්දෙන්ම භික්ෂු තෙම මෙම ශරීරය ප්‍රීති රහිතවූ සැපයෙන් මනාව තෙමයි, හාත්පස තෙමයි, සම්පූර්ණ කරයි, හාත්පස පතුරුවයි. මේ සියලුම කය පිළිබඳ කිසිවෙකුත් ප්‍රීති රහිතවූ සැපයෙන් නොපැතුරුනේ නොවේ.

**25.** "උදායීය, නැවත අනිකක්ද කියමි. භික්ෂුතෙම සැපයද දුරු කිරීමෙන් දුකද දුරු කිරීමෙන් පළමු කොටම සොම්නස් දොම්නස් දෙදෙනා නැසීමෙන් නිදුක්වූ නොසැපවූ උපෙක්ඛා සති දෙදෙනාගේ පිරිසිදු බව ඇති සතරවන ධ්‍යානයට පැමිණ වාසය කරයි. හෙතෙම මෙම ශරීරය පිරිසිදුවූ නිර්මලවූ සිතින්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පැතිර හුන්නේ වෙයි. ඔහුගේ සියලුම ශරීරය පිළිබඳ කිසිවකුත් පිරිසිදුවූ නිර්මලවූ සිතින් නොපැතුරුනේ නොවෙයි.

"උදායීය, යම්සේ පුරුෂතෙම සුදුවූ වස්ත්‍රයකින් හිස සහිතව පෙරවා හුන්නෙක් වන්නේද ඔහුගේ සියලුම ශරීරය පිළිබඳව කිසිවකුත් සුදුවූ වස්ත්‍රයෙන් නොපැතුරුනේ නොවන්නේද, උදායීය, එපරිද්දෙන්ම භික්ෂුතෙම මෙම ශරීරය පිරිසිදුවූ නිර්මලවූ සිතින් පැතිර හුන්නේවේ. මොහුගේ සියලුම ශරීරය පිළිබඳ කිසිවකුත් පිරිසිදුවූ නිර්මලවූ සිතින් නොපැතුරුනේ නොවෙයි. එයිනුදු වනාහි මාගේ බොහෝ ශ්‍රාවකයෝ ධ්‍යාන අභිඥාවගේ කෙළවරට පැමිණ වාසය කරත්.

**26.** "උදායීය, නැවත අනිකක්ද කියමි. යම්සේ පිළිපන්නාවූ මාගේ ශ්‍රාවකයෝ මෙසේ දැන ගණිත්ද, මා විසින් ශ්‍රාවකයන්ට ඒ ප්‍රතිපදාව ප්‍රකාශ කරණ ලද්දීය. මාගේ මේ ශරීරය වනාහි රූපයන්ගෙන් යුක්ත වූයේ සතර මහා භූතයන්ගෙන් හටගත්තේ මව්පිය දෙදෙනාගේ සම්භවයෙන් (ශුක්‍ර ශෝණිතයන්ගෙන්) හටගත්තේ බත් කොමු (තිරිඟු) වලින් වැඩුණේ අනිත්‍යය ඇඟ ඉලීමය, පිරිමැදීමය, බිඳීමය, විනාසය යන ස්වභාව කොට මොවුන් ඇත්තේ වේ. මාගේ මේ සිතද මේ කය ඇසුරු කළේ මේ කය පිළිබඳ වූයේයයි, දැනගනිත්. උදායීය, යම්සේ යහපත්වූ ජාතිමත්වූ අටැස් ඇත්තාවූ මොනවට ඔපදමන ලද්දාවූ ප්‍රසන්නවූ විශෙෂයෙන් ප්‍රසන්නවූ සියලු ආකාරයෙන් යුක්තවූ දියමන්ති මාණික්‍යයක් වේද, එහි නිල් පාටවූ හෝ කහපාටවූ හෝ රතුපාටවූ හෝ සුදුපාටවූ හෝ දුඹුරුපාටවූ හෝ නූලක් අවුනන ලද්දේ වන්නේද, එය ඇස් ඇති පුරුෂයෙක් අතට ගෙන කල්පනා කරන්නේය. මේ මැණික වනාහි යහපත්වූ ජාතිමත්වූ අටැස් ඇත්තාවූ මනාව ඔපදමන ලද්දාවූ පිරිසිදුවූ ප්‍රසන්නවූ සියලු ආකාරයන් ගෙන් යුක්තවූ දියමන්ති මැණිකක් වේ. නිල්වූ හෝ කහපාටවූ හෝ රතුපාටවූ හෝ සුදුපාටවූ හෝ දුඹුරු පාටවූ නූලක් එහි අවුනන ලද්දේ වේයයි දැන ගන්නේය. උදායීය, එපරිද්දෙන්ම මා විසින් යම්සේ පිළිපන්නාවූ මාගේ ශ්‍රාවකයෝ එසේ දැන ගනිද්ද, ශ්‍රාවකයන්ට ඒ ප්‍රතිපදාව ප්‍රකාශ කරණ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ලද්දීය. මේ මාගේ ශරීරය වනාහි රූපයෙන් යුක්ත වූයේ සතර මහා භූතයන්ගෙන් හටගත්තේ මව්පිය සම්භවයෙන් හටගත්තේ බතින් හා කොමු පිඬු වලින් (තිරිගු) වැඩුණෙ අනිත්‍යය ඇඟ ඉලීමය, පිරිමැදීමය, බිඳීමය, නැසීමය යන මොවුන් ස්වභාව කොට ඇත්තේ වේ. මාගේ මේ සිතද වනාහි ඒ කය ඇසුරු කළේ කය පිළිබඳ වූයේ යයි, දැන ගනිත්. එයිනුදු වනාහි මාගේ බොහෝ ශ්‍රාවකයෝ දැනීමේ කෙළවරට පමුණුවන්නාවූ රහත් බවට පැමිණ වාසය කෙරෙත්.

27. "උදායීය, නැවතද අනිකක් කියමි. යම්සේ පිළිපන්නාවූ මාගේ ශ්‍රාවකයෝ මේ ශරීරයෙන් අන්‍යවූ සිතින් නිපදවන ලද්දාවූ සියලු කුඩාමහත් අවයවයන්ගෙන් යුක්තවූ නොබිඳුනු ඉන්ද්‍රිය ඇති රූප සහිත ශරීරයක් මවත්ද, එබඳු ප්‍රතිපදාවක් කියන ලද්දීය. උදායීය, යම්සේ පුරුෂ තෙම මුදු තණ ගසින් ගොබයක් ඇදගන්නේද, ඔහුට මේ මුදුතණ ගසය මේ ගොබය මුදු තණගස අනිකක්ය ගොබය අනිකක්ය මුදු තණ ගසින්ම ගොබය ඇද ගන්නා ලද්දේ යයි, මෙබඳු සිතක් වන්නේද, උදායීය, යම්සේ හෝ පුරුෂයෙක් කඩුව කොපුවෙන් ඇද ගන්නේද ඔහුට මේ කඩුවය මේ කොපුවය කඩුව අනිකක්ය කොපුව අනිකක්ය කොපුවෙන්ම කඩුව ඇදගන්නා ලද්දේ යයි මෙබඳු සිතක් වන්නේද, උදායීය, යම්සේ හෝ පුරුෂයෙක් තෙම සර්පයෙකු නයි පෙට්ටියෙන් උඩට ගන්නේද, ඔහුට මේ සර්පයාය මේ නයි පෙට්ටියය සර්පයා අනිකෙක නයි පෙට්ටිය අනිකෙක නයි පෙට්ටියෙන්ම සර්පයා උඩට ගන්නා ලද්දේ යයි, මෙබඳු සිතක් වන්නේද, උදායීය, එපරිද්දෙන්ම යම්සේ පිළිපන්නාවූ මාගේ ශ්‍රාවකයෝ මේ ශරීරයෙන් අන්‍යවූ සිතින්ම නිපදවූ සියලු කුඩා මහත් අවයවවලින් යුක්තවූ නොබිඳුනු ඉන්ද්‍රියයන් ඇති රූපසහිත ශරීරයක් මවත්ද, මා විසින් ශ්‍රාවකයන්ට ඒ ප්‍රතිපදාව ප්‍රකාශ කරණ ලද්දීය. එයිනුදු වනාහි මාගේ බොහෝවූ ශ්‍රාවකයෝ ධ්‍යාන අභිඥාවගේ කෙළවරට පැමිණ වාසය කෙරෙත්.

28. "උදායීය, නැවත අනිකක්ද කියමි. යම්සේ පිළිපන්නාවූ මාගේ ශ්‍රාවකයෝ නොයෙක් ආකාරවූ ඍද්ධි විධියක් අනුභව

කෙරෙත්ද, ඒ ප්‍රතිපදාව ශ්‍රාවකයන්ට මා විසින් ප්‍රකාශ කරණ ලද්දීය, එනම් එකෙක්වද, බොහෝ දෙනෙක් වෙත්. බොහෝ දෙනෙක්වද එකෙක් වෙත්. පෙනෙන්ටද නොපෙනෙන්ටද අහසෙහි මෙන් භික්තිය සරසටද ප්‍රාකාරය සරසටද පර්වතය සරසටද නොගැටෙමින් යෙත්. පොළොවෙහිද දියෙහි මෙන් මතුවීම කිමිදීම කරත්. දියෙහිද පොළොවෙහි මෙන් දිය නොබිඳ ගමන් කරත්. පියාපත් ඇති පක්ෂියෙකු මෙන් අහසෙහිද පර්යංකයෙන් ගමන් කරත්. මෙසේ මහත් ඍද්ධි ඇත්තාවූ මෙසේ මහත් ආනුභාව ඇත්තාවූ මේ සඳ හිරු දෙදෙනද අතින් අල්වත්. පිරිමදිත්. බඹලොව දක්වාද කයින් වසඟයෙහි පවත්වත්ද, උදායීය, යම්සේ දක්ෂවූ වලන්කරුවෙක් හෝ වලන්කරු අතවැසියෙක් හෝ මනාව පදම් කරණ ලද මැටියෙන් යම් යම් භාජන විශෙෂයක් කැමැති වන්නේද, ඒ ඒ දෙයම කරන්නේද නිපදවන්නේද, උදායීය, යම්සේ හෝ දක්ෂවූ දළ කම්කරුවෙක් හෝ දළ කම්කරුවෙකුගේ අතවැසියෙක් හෝ මනාව පදම් කළ දළයෙහි යම් යම් දළ කැටයමක් කැමැති වන්නේද, ඒ කැටයමම කරන්නේද නිපදවන්නේද, උදායීය, යම්සේ හෝ දක්ෂවූ රන් කරුවෙක් හෝ රන් කරුවෙකුගේ අතවැසියෙක් හෝ පදම් කළාවූ ස්වර්ණයෙහි යම් යම් රන්කැට යමක් කැමතිවන්නේද, ඒ කැටයමම කරන්නේද නිපදවන්නේද, උදායීය, එපරිද්දෙන්ම යම්සේ පිළිපන්නාවූ මාගේ ශ්‍රාවකයෝ නොයෙක් ප්‍රකාරවූ ඍද්ධිවිධිය අනුභව කෙරෙත්ද, ඒ ප්‍රතිපදාව මා විසින් ශ්‍රාවකයින්ට ප්‍රකාශකරණ ලද්දීය. එනම් එකෙක්වද බොහෝ දෙනෙක් වෙත්, බොහෝ දෙනෙක්වද එකෙක් වෙයි. පෙනෙන්ටද නොපෙනෙන්ටද ආකාශයෙහි මෙන්, භික්තිය සරසටද ප්‍රාකාරය සරසටද පර්වතය සරසටද නොගැටෙමින් යත්. පොළොවෙහිද දියෙහි මෙන් මතුවීම කිමිදීම කරත්. දියෙහිද පොළොවෙහි මෙන් දිය නොබිඳ යත්. අහසෙහිද පියාපත් ඇත්තාවූ පක්ෂියෙකු මෙන් පර්යංකයෙන් ගමන් කරත්. මෙසේ මහත් ඍද්ධි ඇත්තාවූ මහත් ආනුභාව ඇත්තාවූ මේ සඳ හිරු දෙදෙනද අතින් අල්වත්. පිරිමදිත්. බඹලොව දක්වාම කයින්

වසඟයෙහි පවත්වත්. එහිදු වනාහි බොහෝ ශ්‍රාවකයෝ ධ්‍යාන අභිඥා වන්නේ කෙළවරට පැමිණ වාසය කරත්.

**29.** "උදායීය, නැවත අනිකක්ද කියමි. යම්සේ පිළිපන්නාවූ මාගේ ශ්‍රාවකයෝ පිරිසිදුවූ මිනිස් කණ ඉක්ම පවත්නාවූ දිව්‍යවූ කණින් දිව්‍යවූද මනුෂ්‍යවූද දුරෙහිද ලඟද යම් ශබ්ද කෙනෙක් වෙත්ද ඒ දෙවදෑරුම්වූ ශබ්දයන් අසත්ද, ඒ ප්‍රතිපදාව මා විසින් ශ්‍රාවකයින්ට ප්‍රකාශ කරන ලද්දීය. යම්සේ බලවත්වූ සක් පිඹින්නෙක් පහසුවෙන්ම සතර දිසාවන්ට දන්වන්නේද උදායීය, එපරිද්දෙන් යම්සේ පිළිපන්නාවූ මාගේ ශ්‍රාවකයෝ පිරිසිදුවූ මිනිස් කණ ඉක්ම පවත්නාවූ දිව්‍යවූ කණින් දිව්‍යවූද මනුෂ්‍යවූද, දුරද, ලඟද යම් ශබ්ද කෙනෙක් වෙත්ද, ඒ දෙවැදෑරුම් ශබ්දයන් අසත්ද ඒ ප්‍රතිපදාව මා විසින් ශ්‍රාවකයන්ට ප්‍රකාශ කරන ලද්දීය. එයිනුදු වනාහි මාගේ බෙහෝ ශ්‍රාවකයෝ ධ්‍යාන අභිඤ්ඤාවගේ කෙළවරට පැමිණ වාසය කරති.

**30.** "උදායීය, නැවත අනිකක්ද කියමි. යම්සේ පිළිපන්නාවූ මාගේ ශ්‍රාවකයෝ අන්‍යසත්වයන්ගේ අන්‍ය පුද්ගලයන්ගේ සිත තමන්ගේ සිතින් පිරිසිඳ දැන ගණිත්ද, ඒ ප්‍රතිපදාව මා විසින් ශ්‍රාවකයන්ට ප්‍රකාශ කරණ ලද්දීය. රාග සහිතවූ හෝ සිත රාග සහිත සිතයයි දැන ගණිත්. පහවූ රාග ඇති සිත හෝ පහවූ රාග ඇති සිතයයි දැන ගණිත්. දොෂ සහිත සිත හෝ දොෂ සහිත සිතයයි දැන ගණිත්. පහවූ දොෂ ඇති සිත හෝ පහවූ දොෂ ඇති සිතයයි දැන ගණිත්. මොහ සහිතවූ සිත හෝ මොහ සහිත සිතයයි දැන ගණිත්. පහවූ මොහය ඇති සිත හෝ පහවූ මොහය ඇති සිතයයි දැන ගණිත්. හැකුළුනාවූ සිත හෝ හැකුළුනාවූ සිතයයි දැන ගණිත්. විසුරුණාවූ සිත හෝ විසුරුණාවූ සිතයයි දැන ගණිත්, මහත් බවට ගියාවූ සිත හෝ මහත් බවට ගියාවූ සිතයයි දැන ගණිත්. මහත් බවට නොගියාවූ සිත හෝ මහත් බවට නොගියාවූ සිතයයි දැන ගණිත්. තමහට වඩා උසස් සිත් සහිතවූ සිත හෝ තමහට වඩා උසස් සිත් සහිතවූ සිතයයි දැන ගණිත්. තමහට වඩා උසස් සිත් රහිතවූ සිත හෝ තමහට වඩා උසස් සිත් රහිතවූ සිතයයි දැන ගණිත්.

එකඟවූ සිත හෝ එකඟවූ සිතයයි දැන ගණිත්. එකඟ නොවූ සිත හෝ එකඟ නොවූ සිතයයි දැන ගණිත්. මිදුනාවූ සිත හෝ මිදුනාවූ සිතයයි දැනගණිත්. නොමිදුනාවූ සිත හෝ නොමිදුනාවූ සිතයයි දැනගණිත්. උදායීය, යම්සේ, ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ තරුණවූයේ යෞවන වූයේ සැරසෙන ස්වභාව ඇත්තේ පිරිසිදුවූ නිර්මලවූ කැඩපතෙහි හෝ ප්‍රසන්නවූ දිය භාජනයෙහි හෝ ස්වකීය මුඛ සටහන බලනු ලබන්නේ දෝස සහිත අවයවය හෝ දෝස සහිත අවයවයයි දන්නේද, දෝස රහිත අවයව හෝ දෝස රහිතවූ අවයවයයි දන්නේද උදායීය, එපරිද්දෙන්ම යම්සේ පිළිපන්නා වූ මාගේ ශ්‍රාවකයෝ අන්‍යසත්වයන්ගේ අන්‍ය පුද්ගලයන්ගේ සිත තමන්ගේ සිතින් පිරිසිඳ දැන ගණිත්ද, ඒ ප්‍රතිපදාව මා විසින් ශ්‍රාවකයන්ට ප්‍රකාශ කරන ලද්දීය. රාග සහිතවූ සිත හෝ රාග සහිත වූ සිතයයි දැන ගණිත්ද, පහවූ රාග ඇති සිත හෝ පහවූ රාග ඇති සිතයයි දැන ගණිත්ද, ද්වෙෂ සහිතවූ සිත හෝ ද්වෙෂ සහිත සිතයයි දැනගනිත්ද, මොහ සහිත සිත හෝ මොහ සහිත සිතයයි දැනගනිත්ද, පහවූ මොහය ඇති සිත හෝ පහවූ මොහය ඇති සිතයයි දැනගනිත්ද, හැකුළුනා වූ සිත හෝ හැකුළුණාවූ සිතයයි දැනගනිත්ද, විසුරුනාවූ සිත හෝ විසුරුනාවූ සිතයයි දැනගනිත්ද, මහත් බවට ගිය සිත හෝ මහත් බවට ගිය සිතයයි දැනගනිත්ද, මහත් බවට නොගියා වූ සිත හෝ මහත් බවට නොගිය සිතයයි දැන ගනිත්ද, උසස් බවට ගිය සිත හෝ උසස් බවට ගිය සිතයයි දැනගනිත්ද, උසස් බවට නොගිය සිත හෝ උසස් බවට නොගිය සිතයයි දැනගනිත්ද, එකඟවූ සිත හෝ එකඟවූ සිතයයි දැන ගනිත්ද, එකඟ නොවූ සිත හෝ එකඟ නොවූ සිතයයි දැන ගනිත්ද, මිදුනාවූ සිත හෝ මිදුනාවූ සිතයයි දැනගනිත්ද, නොමිදුනාවූ සිත හෝ නොමිදුනාවූ සිතයයි දැන ගණිත්ද, එයිනු වනාහි මාගේ බොහෝවූ ශ්‍රාවකයෝ ධ්‍යාන අභිඥාවගේ කෙළවරට පැමිණ වාසය කරත්.

31. "උදායීය, නැවත අනිකක්ද කියමි. යම්සේ පිළිපන්නාවූ මාගේ ශ්‍රාවකයෝ නොයෙක් ආකාරවූ පෙරවිසූ භව පිළිවෙළ සිහි කරත්ද, එනම්, එක ජාතියෙක්ද, ජාති දෙකක්ද ජාති තුනක්ද,

ජාති සතරක්ද, ජාති පහක්ද, ජාති දහයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති හතළිසක්ද, ජාති පණසක්ද ජාති සියයක්ද, ජාති දහසක්ද ජාති සියක් දහසක්ද නොයෙක් සංවර්ත කල්පයන්ද නොයෙක් විවර්ත කල්පයන්ද, නොයෙක් සංවර්ත විවර්ත කල්පයන්ද අසවල් තැන මෙනම් ඇත්තෙක් මෙබඳු ගොත්‍ර ඇත්තෙක් මෙබඳු වර්ණ ඇත්තෙක් මෙබඳු ආහාර ඇත්තෙක් මෙබඳු සුවදුක් විඳින්නෙක් මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තෙක් වීමි. ඒ මම එයින් චුතවූයේ අසවල්තන්හි ඉපදුනෙමි. එහිදු මෙනම් ඇත්තෙක් මෙබඳු ගොත්‍ර ඇත්තෙක් මෙබඳු වර්ණ ඇත්තෙක් මෙබඳු ආහාර ඇත්තෙක් මෙබඳු සුවදුක් විඳින්නෙක් මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තෙක් වීමි. ඒ මම එයින් චුතවූයේ මෙහි උපන්නේ වෙමියි, මෙසේ ආකාර සහිතවූ උද්දෙස සහිතවූ අනෙකප්‍රකාරවූ පෙරවිසූ භව පිළිවෙල සිහිකරත්ද, ඒ ප්‍රතිපදාව මා විසින් ශ්‍රාවකයන්ට ප්‍රකාශ කරන ලද්දීය. උදායීය, යම්සේ පුරුෂයෙක් ස්වකීය ගමින් අනික් ගමකට යන්නේද එගමිනුත් අන් ගමකට යන්නේද හෙතෙම ඒ ගමින් ස්වකීය ගමටම පසුව එන්නේද, ඔහුට මෙබඳු අදහසක් වන්නේය. මම වනාහි ස්වකීය ගමන් අසවල් ගමට ගියෙමි. එහි මෙසේ සිටියෙමි. මෙසේ හුන්නෙමි. මෙසේ කතා කෙළෙමි. මෙසේ නිශ්ශබ්ද වීමි. එගමිනුත් අසවල් ගමට ගියෙමි. එහිදු මෙසේ සිටියෙමි. මෙසේ හුන්නෙමි මෙසේ කතා කෙළෙමි. මෙසේ නිශ්ශබ්ද වීමි. ඒ මම එගමින් ස්වකීය ගමටම පෙරලා ආයේ වෙමියි දන්නේද, උදායීය, එපරිද්දෙන්ම යම්සේ පිළිපන්නාවූ මාගේ ශ්‍රාවකයෝ අනෙකප්‍රකාරවූ පෙර විසූ භව පිළිවෙළ සිහිකරත්ද, එනම්, එක ජාතියක්ද ජාති දෙකක්ද ජාති තුනක්ද, ජාති සතරක්ද, ජාති පහක්ද, ජාති දහයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති හතළිහක්ද, ජාති පනසක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති සියක් දහසක්ද නොයෙක් සංවර්ත කල්පයන්ද නොයෙක් විවර්ත කල්පයන්ද නොයෙක් සංවර්ත විවර්ත කල්පයන්ද, අසවල් තැන මෙනම් ඇත්තෙක්, මෙබඳු ගොත්‍ර ඇත්තෙක්, මෙබඳු වර්ණ ඇත්තෙක් මෙබඳු ආහාර ඇත්තෙක්, මෙබඳු සුවදුක් විඳින්නෙක් මෙබඳු ආයුෂ කෙළවර

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කොට ඇත්තෙක් වීමි. ඒ මම එයින් චුතවූයේ අසවල් තැන ඉපදුනෙමි. එහිද මෙනම් ඇත්තෙක්, මෙබඳු ගොත්‍ර ඇත්තෙක්, මෙබඳු වර්ණ ඇත්තෙක්, මෙබඳු ආහාර ඇත්තෙක්, මෙබඳු සුවදුක් විඳින්නෙක් මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තෙක් වීමි. ඒ මම එයින් චුතවූයේ මෙහි උපන්නේ වෙමියි. මෙසේ ආකාර සහිත වූ උදෙසීම් සහිතවූ අනෙක ප්‍රකාරවූ පෙර විසූ කඳ පිළිවෙළ සිහි කරත්ද, ඒ ප්‍රතිපදාව ශ්‍රාවකයන්ට මා විසින් ප්‍රකාශ කරණ ලද්දීය. එයිනුදු වනාහි මාගේ බොහෝ ශ්‍රාවකයෝ ධ්‍යාන අභිඥ්ඥාවන්ගේ කෙළවරට පැමිණ වාසය කෙරෙත්.

32. "උදායිය, නැවතද අනිකක් කියමි. යම්සේ පිළිපන්නාවූ මාගේ ශ්‍රාවකයෝ පිරිසිදුවූ මිනිසැස ඉක්ම පවත්නාවූ දිව්‍යවූ ඇසින් චුතවනු ලබන්නාවූද උපදිනු ලබන්නාවූද ලාමකවූද උතුම්වූද යහපත් වර්ණ ඇත්තාවූද අයහපත් වර්ණ ඇත්තාවූද යහපත් ගති ඇත්තාවූද අයහපත් ගති ඇත්තාවූද සත්වයන් දකිත්ද, පින්වත්නි, ඒකාන්තයෙන් මේ සත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්තවූවාහුය. වාක් දුශ්චරිතයෙන් යුක්තවූවාහුය. මනොදුශ්චරිතයෙන් යුක්තවූවාහුය. ආර්යයන්ට දොස් කියන්නාහුය. මිථ්‍යාදෘෂ්ටි ඇත්තාහුය. මිථ්‍යාදෘෂ්ටිකයන්ගේ කර්ම සමාදන් වූවාහුය. ඔව්හු ශරීරයාගේ භෙදයෙන් මරණින් මතු සැප නැත්තාවූ දුක්වන්නාවූ යටිකුරුව වැටෙන්නාවූ නරකයෙහි උපන්නාහුය. පින්වත්නි, මේ සත්වයෝ කායසුචරිතයෙන් යුක්තවූවාහුය. වචී සුචරිතයෙන් යුක්තවූවාහුය. මනොසුචරිතයෙන් යුක්ත වූවාහුය. ආර්යන්ට දොස් නොකියන්නාහුය. සම්‍යක් දෘෂ්ටි ඇත්තාහුය. සම්‍යක් දෘෂ්ටිකයන්ගේ කර්ම සමාදන් වූවාහුය. ඔව්හු ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු ශොභන ගති ඇත්තාවූ පස්කම් සැපයෙන් යුක්තවූ දිව්‍යලොකයෙහි උපන්නාහුයයි, කම්වූ පරිදි පැමිණියාවූ සත්වයන් මෙසේ පිරිසිදුවූ මිනිසැස ඉක්ම පවත්නාවූ දිව්‍යවූ ඇසින් චුතවනු ලබන්නා වූද උපදිනු ලබන්නාවූද, ලාමකවූද, උතුම්වූද, යහපත් වර්ණ ඇත්තාවූද, අයහපත් වර්ණ ඇත්තාවූද, යහපත් ගති ඇත්තාවූද, අයහපත් ගති ඇත්තාවූද, සත්වයන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

දකිත්ද, කම් වූ පරිද්දෙන් ගියාවූ සත්වයන් දැනගනිත්ද, ඒ ප්‍රතිපදාව මා විසින් ප්‍රකාශ කරන ලද්දීය. උදායීය, යම්සේ දොරටු සහිතවූ ගෙවල් දෙකක් වෙත්ද, එහි ඇස් ඇති පුරුෂයෙක් මැද සිටියේ ගෙවලට ඇතුල් වන්නාවූද, එයින් නික්මෙන්නා වූද, අනුව හැසිරෙන්නාවූද, ඔබමොබ හැසිරෙන්නාවූද මනුෂ්‍යයන් දන්නේද, උදායීය, එපරිද්දෙන්ම යම්සේ පිළිපන්නාවූ මාගේ ශ්‍රාවකයෝ පිරිසිදුවූ මිනිසැස ඉක්ම පවත්නාවූ දිව්‍යවූ ඇසින් චුතවනු ලබන්නාවූද, උපදිනු ලබන්නාවූද හීනවූද, ප්‍රනීතවූද, යහපත් වර්ණ ඇත්තාවූද, අයහපත් වර්ණ ඇත්තාවූද හොඳ ලොව ගියාවූද, නරක ලොව ගියාවූද සත්වයන් දකිත්. කම් වූ පරිද්දෙන් පැමිණියාවූ සත්වයන් දැනගණිත්. එයිනුදු වනාහි මාගේ බොහෝ ශ්‍රාවකයෝ ධ්‍යාන අභිඥාවන්ගේ කෙළවරට පැමිණ වාසය කරත්.

33. "උදායීය, නැවත අනිකක්ද කියමි. යම්සේ පිළිපන්නාවූ මාගේ ශ්‍රාවකයෝ ආශ්‍රවයන් නැසීමෙන් ආශ්‍රව නැත්තාවූ අර්හත්ඵල සමාධියටද, අර්හත්ඵල ප්‍රඥාවටද, ඉහාත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කෙරෙත්ද, ඒ ප්‍රතිපදාව මා විසින් ශ්‍රාවකයන්ට ප්‍රකාශ කරණ ලද්දීය. උදායීය, යම් සේ කඳුමුදුනක නිර්මලවූ නොකැළඹුනාවූ දිය විලක් වේද, එහි ඉවුරෙහි සිටියාවූ ඇස් ඇති පුරුෂයෙක් තිබෙන්නාවූද හැසිරෙන්නාවූද සිප්පිබෙල්නන් හා සක්බෙල්ලන්ද, ගල්කැට හා කැබිලිතිකටුද, මත්ස්‍ය සමූහයා දක්නේද, උදායීය, එපරිද්දෙන්ම යම්සේ පිළිපන්නාවූ මාගේ ශ්‍රාවකයෝ ආශ්‍රවයන් නැසීමෙන් ආශ්‍රව නැත්තාවූ අර්හත්ඵල සමාධියටද, අර්හත්ඵල ප්‍රඥාවටද මේ ආත්මයෙහිම තෙමේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට පැමිණ වාසය කෙරෙත්. එයිනුදු වනාහි මාගේ බොහෝ ශ්‍රාවකයෝ දැනීමේ කෙළවරට පමුණුවන්නාවූ රහත් බවට පැමිණ වාසය කෙරෙත්. උදායීය, මේ වනාහි යමකින් මට ශ්‍රාවකයෝ සත්කාර කෙරෙත්ද, ගෞරව කෙරෙත්ද, බුහුමන් කෙරෙත්ද පුදත්ද, සත්කාරකොට ගෞරවකොට ඇසුරුකොට වාසය කෙරෙත්ද ඒ පස්වන කරුණ වේ.

"උදායීය, යමකින් මට ශ්‍රාවකයෝ සත්කාර කරත්ද ගෞරව කරත්ද, බුහුමන් කරත්ද, පුදත්ද, සත්කාරකොට ගෞරව කොට ඇසුරුකොට වාසය කරත්ද ඒ මේ කරුණු පස වෙත්යයි" (වදාළේය.)

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක. සතුටු සිත් ඇත්තාවූ සකුළුදායි පරිව්‍රාජකතෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්තේය.

**සත්වෙනිවූ මහා සකුළුදායි සූත්‍රය නිමි. (3-7)**

---

## 28. සමණ මණ්ඩික සූත්‍රය

1. "මා විසින් (මේ සූත්‍රය) මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනේපිඬු මහ සිටුහු විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැසූහ. එකල්හි වනාහි සමණ මණ්ඩිකා පුත්‍රවූ උග්ගහමාන නම් පරිව්‍රාජක තෙමෙ ආගම් පිළිබඳ කථා කරන්නාවූ තිඹිරි ගස්වලින් වටවූ හෙයින් තින්දුකාචීර නම්වූ මල්ලිකා දේවියගේ උයනෙහි කරවනලද හෙයින් මල්ලිකාරාම නම් එක සාලකනම් ශාලාවෙහි සත්සියයක් පමණවූ මහත් පරිව්‍රාජක පිරිසක් හා සමග වාසය කරයි. එකල්හි (ආයුධ පසක් ඇතිහෙයින්) පඤ්චකංග නම් වඩුතෙම දවල් කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ දැකීමට සැවැත්නුවරින් නික්මුනේය. ඉක්බිති පඤ්චකංග නම් වඩුහට මෙබඳු සිතක් වූයේය. තවම භාග්‍යවතුන් වහන්සේ දැකීමට සුදුසු කල් නොවේ. භාග්‍යවතුන් වහන්සේ පලසම යුක්තවූයේ වෙයි. සිත වැඩීමෙහි යෙදුනාවූ භික්ෂූන් වහන්සේලාගේ ද දැකීමට මෙය කාලය නොවෙයි. සිත දියුණු කරන්නාවූ භික්ෂූහුද ධ්‍යානයන්ට සමවැදී වාසය කරති. මම සමයප්පවාදක නම්වූද තින්දුකාචීර නම්වූද මල්ලිකාරාම නම් වූද එකසාලක නම් ශාලාව යම් තැනද සමණ මණ්ඩිකා පුත්‍රවූ උග්ගහමාන නම් පරිව්‍රාජක තෙම යම් තැනද එතැනට පැමිණෙන්නෙම් නම් යෙහෙකැයි යනුයි. ඉක්බිති

පඤ්චකංග නම් ථපති තෙම සමයප්පවාදකවූද තින්දුකාචීර නම්වූද මල්ලිකාරාම නම්වූද එකසාලක නම්වූ ශාලාව යම් තැනෙක්හිද සමණ මණ්ඩිකා පුත්‍රවූ උග්ගහමාන නම් පරිව්‍රාජක තෙම යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. එකල්හි වනාහි සමණ මණ්ඩිකා පුත්‍රවූ උග්ගහමාන නම් පරිව්‍රාජක තෙම උස්හඬ ඇත්තාවූ මහත්හඬ ඇත්තාවූ අනෙක ප්‍රකාර තිරිසන් කථා කියන්නා මහත්කොට ශබ්ද කරන්නාවූ මහත්වූ පරිව්‍රාජක පිරිස සමග හුන්නේ වෙයි. එනම් රජුන් පිළිබඳ කථාය, සොරුන් පිළිබඳ කථාය, මහඇමතියන් පිළිබඳ කථාය, සේනා පිළිබඳ කථාය, භය පිළිබඳ කථාය, යුද්ධ පිළිබඳ කථාය, ආහාර පිළිබඳ කථාය, බීම් පිළිබඳ කථාය, වස්ත්‍ර පිළිබඳ කථාය, සයන පිළිබඳ කථාය, මාලා පිළිබඳ කථාය, සුවඳ පිළිබඳ කථාය, නෑයන් පිළිබඳ කථාය, රථ පිළිබඳ කථාය ගම් පිළිබඳ කථාය. මහගම් පිළිබඳ කථාය, නගර පිළිබඳ කථාය, ජනපද පිළිබඳ කථාය, ස්ත්‍රීන් පිළිබඳ කථාය, සූරයන් පිළිබඳ කථාය, වීථි පිළිබඳ කථාය, දිය ගෙනෙනතැන් පිළිබඳ කථාය, මියගියවුන් පිළිබඳ කථාය, නොයෙක් දේ පිළිබඳ කථාය, ලොකය පිළිබඳ කථාය, සමුද්‍රය පිළිබඳ කථාය, දියුණුව, පිළිබඳ කථාය භානිය පිළිබඳ කථාය යන කථායි. සමණමණ්ඩිකා පුත්‍රවූ උග්ගහමාන නම් පරිව්‍රාජකතෙම එන්නාවූ පඤ්චකංග නම් වඩුවා දුරදීම දුටුයේය. දැක ස්වකීය පිරිස තැන්පත් කෙළේය. 'පින්වත්නි, නිශ්ශබ්ද වෙත්වා, පින්වත්නි, ශබ්ද නොකරව්, මේ ශ්‍රමණ භවත් ගෞතමයන්ගේ ශ්‍රාවකයෙක්වූ පඤ්චකංග නම් වඩුතෙමේ එයි ශ්‍රමණ ගෞතමයන්ගේ ගිහිවූ සුදුවත් හඳින්නාවූ යම්තාක් ශ්‍රාවකයෝ සැවැත් නුවර වාසය කෙරෙත්ද, මේ පඤ්චකංග නම් ථපති තෙමේද ඔවුන්ගෙන් එක්තරා කෙනෙකි. ඒ ආයුෂ්මත්හු වනාහි ස්වල්ප ශබ්ද ඇත්තෝය. ස්වල්ප ශබ්ද ඇත්තවුන් විසින් හික්මවන ලද්දෝය. ස්වල්ප ශබ්ද ඇත්තවුන්ගේ ගුණ කියන්නෝය. ස්වල්ප ශබ්ද ඇති පිරිසකැයි සිතා මෙහි පැමිණීමට අදහස් කරන්නේ නම් මැනවයි" කියා පිරිස සන්සුන් කෙළේය. ඉක්බිති ඒ පරිව්‍රාජකයෝ නිශ්ශබ්ද වූහ. එකල්හි පඤ්චකංග නම් වඩුතෙම සමණ මණ්ඩිකා පුත්‍රවූ උග්ගහමාන

නම් පරිව්‍රාජකතෙම යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ සමණ මණ්ඩිකා පුත්‍රවූ උග්ගහමාන නම් පරිව්‍රාජකයා සමග සතුටු වූයේය. සතුටු වියයුතුවූ සිහි කටයුතුවූ කථාවකොට නිමවා එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ පඤ්චකංග නම් වඩුවාට සමණ මණ්ඩිකා පුත්‍රවූ උග්ගමාන නම් පරිව්‍රජාක තෙම මෙසේ කීයේය.

2. "ථපතිය, මම කරුණු සතරකින් යුක්තවූ පුරුෂ පුද්ගලයා සම්පූර්ණවූ කුසල් ඇති උතුම්වූ කුසල් ඇති උත්තම පැමිණීමට පැමිණියාවූ වාද කොට සෙලවිය නොහැකි ශ්‍රමණයා යයි කියමි. කවර සතරකින්ද යත්? ථපතිය, මේ ලොකයෙහි කයින් පව්කම් නොකෙරේද, ලාමකවූ වචන නොකියයිද, පවිටු වූ කල්පනා කල්පනා නොකෙරේද, ලාමකවූ ජීවිකාවෙන් ජීවිකාව නොකෙරේද, ථපතිය, මම වනාහි මේ කරුණු සතරින් යුක්තවූ පුරුෂ පුද්ගලයා සම්පූර්ණ කුසල් ඇති උතුම් කුසල් ඇති උතුම් පැමිණීමට පැමිණියාවූ වාද කොට සෙලවිය නොහැකි ශ්‍රමණයායි ප්‍රකාශ කරමියි" කීය.

ඉක්බිති පඤ්චකංග නම් ථපති තෙම සමණ මණ්ඩිකා පුත්‍රවූ උග්ගහ මාන නම් පරිව්‍රාජකයාගේ කීමට සතුටුද නොවිය. ප්‍රතික්ෂෙපද නොකෙළේය. සතුටු නොවී ප්‍රතික්ෂෙප නොකොට හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙන් මේ කියමනේ අර්ථය දැන ගන්නෙමියි. (සිතා) ගියේය.

3. ඉක්බිති පඤ්චකංග නම් ථපති තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට මනා කොට වැඳ එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාවූ පඤ්චකංග නම් ථපති තෙම සමණ මණ්ඩිකා පුත්‍රවූ උග්ගහමාන නම් පරිව්‍රාජක සමග කථාබහ යම් පමණ වීද, ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේට දැන්වූයේය. මෙසේ දැන්වූ කල්හි භාග්‍යවතුන් වහන්සෙ පඤ්චකංග නම් වඩුවාට මෙසේ වදාළේය. 'සමණ මණ්ඩිකා උග්ගහමාන නම් පරිව්‍රාජකයාගේ කීම පරිද්දෙන් ථපතිය, පුත්‍රවූ එසේ නම් ළදරුවූ බාලවූ උඩුකුරුවූ සයනය කරන කුමාර සම්පූර්ණ කුසල්

ඇත්තෙක් උතුම්වූ කුසල් ඇත්තෙක් උතුම් පැමිණීමට පැමිණියෙක් වාද කොට සෙලවිය නොහැකි ශ්‍රමණයෙක් වන්නේය. ථපතිය, ළදරුවූ බාලවූ උඩුකුරුව සයනය කරන්නාවූ කුමාර තෙම වනාහි පව් කිරීමට තරම් ශරීරයක්ද නැත කෙසේනම් සෙලවීම් මාත්‍රය හැර කයින් පව්කම් කරන්නේද, ථපතිය, ළදරුවූ බාලවූ උඩුකුරුව සයනය කරන්නාවූ කුමාරයාහට වනාහි වචනයක්ද නැත. කෙසේ නම් හැඬීම පමණක් හැර වචනයෙන් ලාමක වචන කියන්නේද, ථපතිය, බාලවූ ළදරුවූ උඩුකුරුව සයනය කරන්නාවූ කුමාරයාහට කල්පනාවක්ද නැත. කෙසේනම් සිනාසීම් මාත්‍රයක් හැර පවිටු කල්පනා කල්පනා කරන්නේද, ථපතිය, ළදරුවූ බාලවූ උඩුකුරුව නිදන්නාවූ කුමාරයාහට වනාහි ජීවිකාවක්ද නැත. කෙසේනම් මවගේ කිරි බීම හැර ලාමකවූ ජීවිකාවෙන් ජීවිකාව කරන්නේද, ථපතිය, මෙසේ ඇති කල්හි වනාහි සමණමණ්ඩිකා පුත්‍රවූ උග්ගහමාන නම් පරිව්‍රාජකයාගේ කීම පරිදි ළදරුවූ බාලවූ උඩුකුරුව නිදන්නාවූ කුමාරතෙම සම්පූර්ණ කුසල් ඇති උතුම්වූ කුසල් ඇති උතුම් පැමිණීමට පැමිණියාවූ වාදකොට ජය ගත නොහැකි ශ්‍රමණයෙක් වෙයි.

4. "ථපතිය, මම වනාහි කුසල් නැත්තාවූද උතුම් කුසල් නැත්තාවූද උතුම් පැමිණීමට නොපැමිණියාවූද වාදකොට සෙලවිය නොහැක්කාවූද තවද මේ ළදරුවූ බාලවූ උඩුකුරුව නිදන්නාවූ කුමාරයාට වඩා විශෙෂවූ කරුණු සතරකින් යුක්තවූ සම්පූර්ණවූ පුරුෂ පුද්ගලයෙකු ප්‍රකාශ කරමි.

"කවර සතරකින්ද යත්, ථපතිය, මේ ලොකයෙහි කයින් පව්කම් නොකෙරේද, ලාමක වචන නොකියාද, ලාමකවූ කල්පනා කල්පනා නොකෙරේද, ලාමකවූ ජීවිකාවෙන් ජීවිකාව නොකෙරෙයිද, ථපතිය, මම වනාහි මේ කරුණු සතරින් යුක්තවූ පුරුෂ පුද්ගලයා සම්පූර්ණ කුසල් නැත්තාවූද, උතුම් කුසල් නැත්තාවූද, උතුම් පැමිණීමට නොපැමිණියාවූද, වාදයෙන් සෙලවිය නොහැක්කාවූද, තවද ළදරුවූ බාලවූ උඩුකුරුව

නිදන්නාවූ මේ කුමාරයාට වඩා විශෙෂවූද ශ්‍රමණයෙකැයි ප්‍රකාශ කරමි.

**5.** "ථපතිය, මම වනාහි කරුණු දසයකින් යුක්තවූ පුරුෂ පුද්ගලයා සම්පූර්ණ 'කුසල් ඇත්තාවූද, උතුම් කුසල් ඇත්තාවූද, උතුම් පැමිණීමට පැමිණියාවූද, වාදයෙන් නොසෙල්විය හැක්කාවූද ශ්‍රමණයෙකැයි ප්‍රකාශ කරමි.

"ථපතිය, අකුශල ස්වභාවයෝ කවරහුදැයි දතයුතුයයි කියමි. ථපතිය, මේ අකුශල ස්වභාවයෝ කුමක් හෙතුකොට ගෙන හටගත්තාහුදැයි දතයුතුදැයි කියමි. ථපතිය, මේ අකුශල ස්වභාවයෝ කොතැන්හි ඉතිරිනොවී නිරුද්ධ වෙත්දැයි දතයුතුයයි කියමි. ථපතිය, කෙසේ පිළිපදින්නාවූ තැනැත්තේ මේ අකුශල ස්වභාවයන්ගේ නිරොධය පිණිස පිළිපන්නේ වේදැයි දැනගත යුතුයයි කියමි.

**6.** "ථපතිය, මේ කුශල ස්වභාවයෝ කවරහුදැයි දත යුතුයයි කියමි. ථපතිය, මේ කුසල ස්වභාව කුමක් හටගන්නාහුදැයයි කියමි. ථපතිය මේ කුශල ස්වභාවයෙන් කොතැන්හි ඉතිරි නොවී නිරුද්ධ වෙත්දැයි දැනගත යුතුයි කියමි. ථපතිය, කෙසේ පිළිපදින මේ කුසල ස්වභාවයන්ගේ නිරොධය පිණිස පිළිපන්නේදැයි දතයුතුයයි කියමි. ථපතිය, මේ අකුශල කල්පනා කවරහුදැයි දතයුතුයයි කියමි. ථපතිය, මේ අකුශල කල්පනාවෝ කුමකින් හටගන්නාහුදැයි දතයුතුයයි කියමි. ථපතිය, මේ අකුශල කල්පනාවෝ ඉතිරි නොවී කොතැන්හි නිරුද්ධ වෙත්දැයි දතයුතුයයි කියමි. ථපතිය, කෙසේ පිළිපන්නාවූ පුද්ගලතෙමේ මේ අකුසල කල්පනාවන්ගේ නිරොධය පිණිස පිළිපන්නේදැයි දතයුතුයයි කියමි. ථපතිය, මේ කුසල කල්පනාවෝ කවරහුදැයි දතයුතුයි කියමි. ථපතිය, මේ කුසල කල්පනාවෝ කුමකින් හටගන්නාහුදැයි දතයුතුයයි කියමි. ථපතිය, මේ කුසල කල්පනාවෝ කොතැන්හි ඉතිරි නැතිව නිරුද්ධ වෙත්දැයි දතයුතුයයි කියමි. ථපතිය, කෙසේ පිළිපන්නාවූ පුද්ගල තෙමේ මේ කුසල කල්පනාවන්ගේ නිරොධය පිළිපදින්නේදැයි දතයුතුයයි කියමි.

7. "ථපතිය, අකුසල ස්වභාවයෝ කවරහුද, අකුසල්වූ කාය කර්මය අකුසල්වූ වාග්කර්මය ලාමකවූ ජීවිකාවය යන මොහුයි. ථපතිය, මොව්හු අකුසල ස්වභාවයෝයයි කියනු ලැබෙත්. ථපතිය මේ අකුසල ස්වභාවයෝ කුමක් හේතු කොටගෙන හට ගන්නාහුද? ඔවුන්ගේ ඉපදීමට හෙතුව කියනු ලැබේ. සිත නිසා උපදින්නාහුයයි කියයුතු වෙත්. සිත කවරේද? සිත වනාහි බොහෝ වැදෑරුම්හ. නොයෙක් ආකාරය. ඒ සිත රාග සහිතදවේ. ද්වෙෂ සහිතදවේ. මෝහ සහිතද වේ. මේ අකුසල ස්වභාවයෝ මේ සිත නිසා හටගත්තාහුය. ථපතිය, මේ අකුසල ස්වභාවයෝ කොතැන්හි ඉතිරි නැතිව නිරුද්ධවෙත්ද, ඔවුන්ගේ නිරොධය කියනු ලැබේ. ථපතිය, මේ ශාසනයෙහි භික්ෂුතෙම කාය දුශ්චරිතය හැර කාය සුචරිතය වඩාද, වාග් දුශ්චරිතය හැර වාග් සුචරිතය වඩාද, මනො දුශ්චරිතය හැර මනො සුචරිතය වඩාද මිථ්‍යා ආජීවය හැර යහපත් ජීවිකාවෙන් ජීවිකාව කෙරේද, මෙහි මේ අකුසල ස්වභාවයෝ ඉතිරි නොවී නිරුද්ධවෙත්. ගෘහපතිය, කෙසේ පිළිපදින්නාවූ පුද්ගල තෙමේ අකුසල සීලයන්ගේ නිරොධය පිණිස පිළිපන්නේවේද? ගෘහපතිය, මේ ශාසනයෙහි භික්ෂුතෙම නූපන්නාවූ ලාමකවූ අකුශල ධර්මයන්ගේ නොඉපදීම පිණිස කැමැත්ත උපදවයිද ව්‍යායාම් කරයිද, වීර්ය පටන්ගනියිද, සිත ඔසවයිද, වීර්ය කරයිද, උපන්නාවූ ලාමකවූ අකුශල ධර්මයන්ගේ දුරුකිරීම පිණිස කැමැත්ත උපදවයිද, ව්‍යායාම් කරයිද, වීර්ය පටන්ගනියිද, සිත ඔසවයිද, උත්සාහ කරයිද, නූපන්නාවූ කුසල ධර්මයන්ගේ ඉපදීම පිණිස කැමැත්ත උපදවයිද, ව්‍යායාම කරයිද, වීර්ය පටන් ගනියිද, සිත ඔසවයිද, උත්සාහ කරයිද, උපන්නාවූ කුසල ධර්මයන්ගේ පැවැත්ම පිණිස, මුලානොවීම පිණිස, වැඩිවීම පිණිස, මහත්බව පිණිස, දියුණු කිරීම පිණිස කැමැත්ත උපදවයිද, ව්‍යායාම කරයිද, වීර්ය පටන්ගනියිද, සිත ඔසවයිද, උත්සාහ කරයිද, ගෘහපතිය, මෙසේ පිළිපදින්නාවූ පුද්ගල තෙමේ ස්වභාවයන්ගේ නිරොධය පිණිස පිළිපන්නේ වෙයි.

8. "ගෘහපතිය, කුසල ස්වභාවයෝ කවරහුද? ගෘහපතිය කාය කර්මයද, කුසලවූ කර්යද, පිරිසිදු ජීවිකාවද මම සීලයයි

කියමි. ගෘහපතිය, මොව්හු කුසල ස්වභාවයෝයයි කියනු ලැබෙත්. ගෘහපතිය, මේ කුසල ස්වභාවයෝ කුමක් හෙතුකොටගෙන උපදින්නාහුද, ඔවුන්ගේ උත්පත්ති හෙතුව කියනු ලැබේ. හිත නිසා උපදින්නාහුයයි කියයුතු වෙත්. සිත කවරේද, සිත බොහෝ වැදෑරුම්ය, නානාප්‍රකාරය. ඒ සිත පහවූ රාග ඇත්තේද, පහවූ ද්වේෂ ඇත්තේද පහවූ මොහ ඇත්තේද වෙයි. කුසල ස්වභාවයෝ මේ සිත නිසා හටගත්තාහු වෙත්. ගෘහපතිය, මේ කුසල ස්වභාවයෝ කොහිදී ඉතිරි නොවී නිරුද්ධ වෙත්ද? ඔවුන්ගේ නිරොධය කියතහොත් ගෘහපතිය, මේ ශාසනයෙහි භික්ෂුතෙම සිල්වත් වේද, මින්පසු රක්කයුතු තවත් සීලයක් නැත්තේද යම්තැනක ඔහුගේ ඒ කුසල ස්වභාවයෝ ඉතිරි නොවී නිරුද්ධ වෙත්ද, ඒ අර්හත්ඵල සමාධියද ඒ අර්හත්ඵල ප්‍රඥාවද තත්වූ පරිද්දෙන් දැනගනියි.

**9.** "ගෘහපතිය, කෙසේ පිළිපදින්නේ කුසල ස්වභාවයන්ගේ නිරොධය පිණිස පිළිපන්නේ වේද? ගෘහපතිය, මේ ශාසනයෙහි භික්ෂුතෙම නූපන්නාවූ ලාමකවූ අකුශල ධර්මයන්ගේ නොඉපදීම පිණිස කැමැත්ත උපදවයිද ව්‍යායාම කරයිද, වීර්ය පටන්ගනියිද, සිත ඔසවයිද, උත්සාහ කරයිද උපන්නාවූ ලාමකවූ අකුසල ධර්මයන්ගේ දුරුකිරීම පිණිස කැමැත්ත උපදවයි වෑයම් කරයි. වීර්ය පටන්ගනියි. උත්සාහ කරයි. නූපන්නාවූ කුශල ධර්මයන්ගේ ඉපදීම පිණිස කැමැත්ත උපදවයි. වෑයම් කරයි. වීර්ය පටන්ගනියි. උත්සාහ කරයි. උපන්නාවූ කුසල ධර්මයන්ගේ පැවැත්ම පිණිස, මුලානොවීම පිණිස, වැඩිවීම පිණිස, මහත් බැව් පිණිස, දියුණුව පිණිස, කැමැත්ත උපදවයිද, ව්‍යායාම කරයිද , වීර්ය පටන්ගනියිද, සිත ඔසොවයිද, උත්සාහ කරයිද, ගෘහපතිය, මෙසේ පිළිපදින පුද්ගල තෙමේ ස්වභාවයන්ගේ නිරොධය පිණිස පිළිපන්නේ වේ.

**10.** "ගෘහපතිය, අකුසල කල්පනාවෝ කවරහුද? කාම කල්පනාය, ව්‍යාපද කල්පනාය, විහිංසා කල්පනාය. ගෘහපතිය, මොව්හු අකුසල කල්පනාවෝයයි කියනු ලැබෙත්. ගෘහපතිය, මේ අකුසල කල්පනාවෝද කුමකින් හටගන්නාහුද? ඔවුන්ගේ

හටගැනීමට හෙතුවද කියනු ලැබේ. සංඥාව නිසා හටගන්නාහුයයි කියයුතු වෙත්. සංඥාව නම් කවරීද? සංඥාවද බොහෝ වැදෑරුම්ය, නානාප්‍රකාරය. කාම සංඥාවෝය, ව්‍යාපද සංඥාය, විහිංසා යන මොහුයි. අකුසල කල්පනාවෝ මේ හෙතුකොටගෙන හටගන්නාහු වෙත්. ගෘහපතිය, මේ අකුසල සංකල්පනාවෝ කොහිදී ඉතිරි නැතිව නිරුද්ධ වෙත්ද, ඔවුන්ගේ නිරොධය ද කියනු ලැබේ. ගෘහපතිය, මේ ශාසනයෙහි භික්ෂුතෙම කාමයන්ගෙන් වෙන්වම අකුශල ධර්මයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ, විචාර සහිතවූ, විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරයි. මෙහි මේ අකුශල සංකල්පනාවෝ ඉතිරිනැතිව නිරුද්ධ වෙත්. ගෘහපතිය, කෙසේ පිළිපදින පුද්ගල තෙමේ අකුශල සංකල්පනාවන්ගේ නිරොධය පිණිස පිළිපන්නේ වේද, ගෘහපතිය, මේ ශාසනයෙහි භික්ෂුතෙම නූපන්නාවූ ලාමකවූ අකුසල ධර්මයන්ගේ නොඉපදීම පිණිස කැමැත්ත උපදවයි. වෑයම් කරයි. වීර්ය පටන්ගනියි. සිත ඔසවයි. උත්සාහ කරයි. උපන්නාවූ ලාමකවූ අකුසල ධර්මයන්ගේ දුරුකිරීම පිණිස කැමැත්ත උපදවයි. වෑයම් කරයි. වීර්ය පටන්ගනියි. උත්සාහ කරයි. නූපන්නාවූ කුශල ධර්මයන්ගේ ඉපදීම පිණිස කැමැත්ත උපදයි. වෑයම් කරයි. වීර්ය පටන්ගනියි. උත්සාහ කරයි. උපන්නාවූ කුසල ධර්මයන්ගේ පැවැත්ම පිණිස, මුලානොවීම පිණිස, වැඩිවීම පිණිස, මහත්බැව් පිණිස, දියුණුව පිණිස කැමැත්ත උපදවයි. වෑයම් කරයි. වීර්ය පටන්ගනියි. සිත ඔසවයි. උත්සාහ කරයි. ගෘහපතිය, මෙසේ පිළිපදින පුද්ගල තෙමේ අකුසල කල්පනාවන්ගේ නිරොධය පිණිස පිළිපන්නේ වේ.

11. "ගෘහපතිය, කුසල කල්පනාවෝ කවරහුද? නෛෂ්ක්‍රම්‍ය කල්පනාය, අව්‍යාපද කල්පනාය, අවිහිංසා කල්පනාය යන මොහුයි. ගෘහපතිය, මොව්හු කුසල සංකල්පයෝයයි කියනු ලැබෙත්. ගෘහපතිය, මේ කුසල කල්පනාවෝ කුමකින් හටගන්නාහු වෙත්ද, ඔවුන්ගේ හටගැනීමද කියනලදී. සංඥාව නිසා හටගන්නාහුයයි කියයුතු වෙත්. සංඥා තොමෝ කවරීද? සංඥාවෝද බොහෝ වැදෑරුම්ය, නානාප්‍රකාරය. කාමයන්ගෙන්

සිත නික්මවීම පිළිබඳ සංඥාවය, අනුන්ට වෛර නොකිරීම පිළිබඳ සංඥාවය, හිංසා නොකිරීම පිළිබඳ සංඥාවය යන මොහුයි. කුසල කල්පනාවෝ මේ සංඥා නිසා හටගන්නාහු වෙත්. ගෘහපතිය, මේ අකුසල සංකල්පනාවෝ කොහිදී ඉතිරි නැතිව නිරුද්ධ වෙත්ද, ඔවුන්ගේ නිරොධයද කියනලදී. ගෘහපතිය, මේ ශාසනයෙහි භික්ෂුතෙම් විතර්ක විචාරයන්ගෙන් සංසිඳීමෙන් ඇතුලත පැහැදීම ඇති හිතේ එකඟබව ඇති විතර්ක රහිතවූ විචාර සහිතවූ, සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි. මෙහි මේ කුසල කල්පනාවෝ ඉතිරිනොවී නිරුද්ධ වෙත්. ගෘහතිය, මෙසේ පිළිපදින්නේ කුසල කල්පනාවන්ගේ නිරොධය පිණිස පිළිපන්නේ වේද, ගෘහපතිය, මේ ශාසනයෙහි භික්ෂුතෙම නූපන්නාවූ ලාමකවූ අකුසල ධර්මයන්ගේ නොඉපදීම පිණිස කැමැත්ත උපදවයිද, වෑයම් කරයිද, වීර්ය පටන්ගනියිද, සිත ඔසවයිද, උත්සාහ කරයිද, උපන්නාවූ ලාමකවූ අකුසල ධර්මයන්ගේ දුරුකිරීම පිණිස කැමැත්ත උපදවයි. වෑයම් කරයි. වීර්ය පටන්ගනියි. උත්සාහ කරයි. නූපන්නාවූ කුශල ධර්මයන්ගේ ඉපදීම පිණිස කැමැත්ත උපදයි. වෑයම් කරයි. වීර්ය පටන්ගනියි. උත්සාහ කරයි. උපන්නාවූ කුසල ධර්මයන්ගේ පැවැත්ම පිණිස, මුළා නොවීම පිණිස, වැඩිවීම පිණිස, මහත් බැව් පිණිස, දියුණුව පිණිස, කැමැත්ත උපදවයි. වෑයම් කරයි, වීර්ය පටන්ගනියි, සිත ඔසවයි, උත්සාහ කරයි. ගෘහපතිය, මෙසේ පිළිපන්නේම කුසල කල්පනාවන්ගේ නිරොධය පිණිස පිළිපන්නේ වේ.

12. "ගෘහපතිය, මම කවර නම් කරුණු දසයකින් යුක්තවූ පුරුෂ පුද්ගලයා සම්පූර්ණ කුසල් ඇති, උතුම් කුසල් ඇති, උතුම් පැමිණීමට පැමිණියාවූ, වාදයෙන් නොසෙල්විය හැකිවූ ශ්‍රමණයයි ප්‍රකාශ කරම්ද? ගෘහපතිය, මේ ශාසනයෙහි භික්ෂු තෙම අශෛක්ෂ වූ (රහත්වූ) සම්‍යක් දෘෂ්ටියෙන් (යහපත් දැකීමෙන්) යුක්තවූයේ වේද, අශෛක්ෂවූ (රහත්වූ) සම්‍යක් සංකල්පනයෙන් (යහපත් කල්පනාවෙන්) යුක්තවූයේ වේද, අශෛක්ෂවූ (රහත්) සම්‍යක් වචනයෙන් (යහපත් වචනයෙන්) යුක්තවූයේ වේද, අශෛක්ෂවූ (රහත්) සම්‍යක් කර්මාන්තයෙන්

(යහපත් කිරීමෙන්) යුක්තවූයේ වේද, අශෛක්ෂවූ (රහත්) සම්‍යක් ආජීවයෙන් (යහපත් ජීවිකාවෙන්) යුක්තවූයේ වේද, අශෛක්ෂවූ (රහත්) සම්‍යක් ව්‍යායාමයෙන් (යහපත් උත්සාහයෙන්) යුක්තවූයේ වේද, අශෛක්ෂවූ (රහත්) සම්‍යක් ස්මෘතියෙන් (යහපත් සිහියෙන්) යුක්තවූයේ වේද, අශෛක්ෂවූ (රහත්) සම්‍යක් සමාධියෙන් (යහපත් සිතේ එකඟබවෙන්) යුක්තවූයේ වේද, අශෛක්ෂවූ (රහත්) සම්‍යක් ඥානයෙන් (යහපත් නුවණින්) යුක්තවූයේ වේද, අශෛක්ෂවූ (රහත්) සම්‍යක් විමුක්තියෙන් (යහපත් මිදීමෙන්) යුක්තවූයේ වේද, ගෘහපතිය, මම වනාහි මේ කරුණු දහයෙන් යුක්තවූ පුරුෂ පුද්ගලයා සම්පූර්ණ කුසල් ඇති උතුම්වූ කුසල් ඇති, උතුම්වූ පැමිණීමට පැමිණියාවූ වාදයෙන් නොසෙල්විය හැකි ශ්‍රමණයෙකැයි ප්‍රකාශ කරමි.

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළසේක සතුටු සිත් ඇත්තාවූ පඤ්චකංග නම්ගෘහපති තෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගත්තේය.

**අටවෙනිවූ සමණමණ්ඩික සූත්‍රය නිමි (3-8)**

## 29. චූල සකුළුදායී සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර කලන්දක නිවාප නම්වූ වෙළුවනාරාමයෙහි වැඩ විසූහ.

එකල්හි වනාහි සකුළුදායී නම් පරිව්‍රාජක තෙම මෝරනිවාප නම්වූ පරිබ්‍රාජකාරාමයෙහි මහත්වූ පරිබ්‍රාජක පිරිස සමග වාසය කරයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ උදය කාලයෙහි හැඳපෙරවා පාසිවුරු ගෙණ රජගහ නුවරට පිඬු පිණිස පැමිණියෝය. එකල්හි භාග්‍යවතුන් වහන්සේට මෙබඳු සිතක් විය. තවම රජගහනුවරට පිඬුපිණිස පැමිණෙන්ට ඉතා උදෑසන වේ. 'මම මෝරනිවාප නම් පරිබ්‍රාජකාරාමය යම් තැන තැනකද, සකුළුදායී නම් පරිව්‍රාජක තෙම යම් තැනකද එහි එළඹෙන්නෙම්

නම් යෙහෙක, කියායි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ මෝරනිවාප නම් පරිබ්‍රාජකාරාමය යම් තැනකද එතැනට පැමිණියෝය. එකල්හි වනාහි සකුළුදායී නම් පරිබ්‍රාජක තෙම උස්හඬින් හා මහත්වූ හඬින් ඝෝෂා කරමින් නොයෙක් තිරිසන් කථා කියන්නාවූ මහත් පරිබ්‍රාජක පිරිස සමග හුන්නේ වෙයි. එනම්, රජුන් පිළිබඳ කථාය, සොරුන් පිළිබඳ කථාය, මහ ඇමතියන් පිළිබඳ කථාය, සේනා පිළිබඳ කථාය, භය පිළිබඳ කථාය, යුද්ධ ගැන කථාය, ආහාර ගැන කථාය, බීම ගැන කථාය, වස්ත්‍ර ගැන කථාය, සයන ගැන කථාය, මාලා ගැන කථාය, ගන්ධ ගැන කථාය, නෑයන් ගැන කථාය, යානා ගැන කථාය, ගම් ගැන කථාය, මහගම් ගැන කථාය, නගර ගැන කථාය, ජනපද ගැන කථාය, ස්ත්‍රීන් ගැන කථාය, සූරයන් ගැන කථාය. වීථි ගැන කථාය, දිය ගන්නා තැන් ගැන කථාය, මළවුන් ගැන කථාය. නොයෙක් නොයෙක් කථාය, ලොකය ගැන කථාය, සමුද්‍රය ගැන කථාය, පිරිහීම නොපිරිහීම ගැන කථාය යන මෙයි. සකුළුදායී පරිව්‍රාජක තෙම දුරදීම එන්නාවූ භාග්‍යවතුන් වහන්සේ දුටුයේය. දැක තම පිරිස තැන්පත් කෙළේය. 'පින්වත්නි නිශ්ශබ්ද වෙත්වා පින්වත්නි ශබ්ද නොකරව්. මේ ශ්‍රමණ ගෞතම තෙමේ එන්නේය. ඒ ආයුෂ්මත් තෙමේ වනාහි නිශ්ශබ්ද වීම කැමැත්තේ නිශ්ශබ්ද වූවහුගේ ගුණ කියන්නේ වේ. නිශ්ශබ්ද වු පිරිසක් බව දැන මෙහි පැමිණිය යුතුයයි හැඟෙන්නේනම් ඉතා යෙහකැයි,' (පිරිස සන්සුන් කෙළේය.) ඉක්බිති ඒ පරිව්‍රාජකයෝ නිශ්ශබ්ද වූහ. එකල්හි භාග්‍යවතුන් වහන්සේ සකුළුදායි පරිව්‍රාජක තෙම යම් තැනකද එතැනට පැමිණියෝය. එකල්හි සකුළුදායි පරිව්‍රාජක තෙම භාග්‍යවතුන් වහන්සේට 'ස්වාමිනී, භාග්‍යවතුන් වහන්සේ වඩින සේක්වා. ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේගේ වැඩමවීම යහපත්ය. ස්වාමිනි භාග්‍යවතුන් වහන්සේ බොහෝ කලකින් මේ ආකාරය කළසේක. එනම් මෙහි වැඩම වීමෙනි. ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේ වැඩ ඉන්නා සේක්වා. මේ ආසනය පණවන ලදැයි, කීය. භාග්‍යවතුන් වහන්සේ පණවන ලද ආසනයෙහි වැඩහුන්සේක. සකුළුදායී පරිව්‍රාජක තෙමේද එක්තරා මිටි අස්නක් ගෙණ එක්

පැත්තක හුන්නේය. එක් පැත්තක හුන්නාමවූ සකුළුදායී පරිව්‍රාජකයාට භාග්‍යවතුන් වහන්සේ මෙසේ කීහ.

2. "උදායීය, දැන් කවර කථාවකින් යුක්තව හුන්නාහුද තොපගේ කිනම් කථාවක් අඩාල වූවාද, යනුයි" ස්වාමීනි, අපි දැන් යම් කථාවකින් යුක්තව හුන්නමුද, ඒ කථාව තිබේවා. ස්වාමිනි, මේ කථාව භාග්‍යවතුන් වහන්සේට පසුවද ඇසීමට දුර්ලභ නොවන්නීය. ස්වාමීනි, මම යම් කලෙක මේ පිරිසට නොපැමිණියෙම්ද, එකල්හි මේ පිරිස නොයෙක් ආකාර තිරිසන් කථා කියමින් හුන්නීය. ස්වාමීනි, යම් කලෙකින් මම මේ පිරිසට පැමිණියෙම්ද, එකල්හි මේ පිරිස මාගේ මුහුණම බලමින්, උදායීය, 'ශ්‍රමණ තෙම අපට යමක් කියන්නේද අපි එය අසන්නෙමුයි' හුන්නීවෙයි. ස්වාමීනි, යම්කලක භාග්‍යවතුන් වහන්සේ මේ පිරිසට පැමිණියේ වේද, එකල්හි මමද මේ පිරිසද භාග්‍යවතුන් වහන්සේගේම මුහුණ බලමින් භාග්‍යවතුන් වහන්සේ අපට යම් ධර්මයක් දෙශනා කරන්නේද අපි එය අසන්නෙමුයි, හුන්නෝ වෙමුයි," කීය.

3. "උදායීය, එසේවී නම් යම්සේ මට ධර්මදෙශනාවට කරුණුකර ගැනීම සඳහා තොපිම එක් කාරණයක් ප්‍රකාශ කරව්." "ස්වාමීනි ඊයේ පෙරේදා පළමුදා දවස්වල සර්වඥය, සියල්ල දක්නේය, යන්නාවූද සිටින්නාවූද, නිදන්නාවූද, නොනිදන්නාවූද, මට නිරන්තරයෙන් සියල්ල නුවණින් දැකීම එළඹ සිටියේයයි, නිරවශෙෂ (ඉතිරි නැති) නුවණින් දැකීම ප්‍රකාශ කරන්නෙක් වීද මා විසින් අතීතය අරබයා ප්‍රශ්නයක් අසන ලද්දාවූ හෙතෙම අනිකකින් අනිකක් වසා කීයේය. කථාව පිටතට හැර වීය. කොපයද ද්වෙෂයද නොසතුටු බවද පහළ කෙළේය. ස්වාමීනි, මට ඒ භාග්‍යවතුන් වහන්සේම අරබයා ප්‍රීතිය පහළවූයේය. යමෙක් මේ ධර්මයෙහි දක්ෂවූයේද ඒ භාග්‍යවතුන් වහන්සේ ඉතායහපත ඒ සුගතයන් වහන්සේ ඉතා යහපතැයි, උදායීය, මේ කවරෙක් වනාහි සර්වඥය සියල්ල දක්නේය. යන්නාවූද සිටින්නාවූද නිදන්නාවූද නොනිදින්නාවූද මග නිරන්තරයෙන් සියල්ල නුවණින් දැකීම එළඹ සිටියේයයි,

නිර්වශෙෂ ඥාන දර්ශනයක් ප්‍රකාශ කරන්නේ වීද, තොප විසින් අතීතය අරබයා ප්‍රශ්නයක් විචාරණ ලද්දේම අනිකකින් අනිකක් වසා කීයේ, කථාව බැහැර කෙළේ, කොපයද ද්වෙෂයද නොසතුටද පහළ කෙළේ කවරෙක්ද?" "ස්වාමීනි, නිගණ්ඨ නාත පුත්‍ර තෙමේය" "උදායීය, යමෙක් වනාහි අනෙකප්‍රකාරවූ පෙරවිසූ කඳ පිළිවෙළ සිහිකරන්නේද, එනම් ජාති එකක්ද ජාති දෙකක්ද ජාති තුනක්ද, ජාති සතරක්ද, ජාති පහක්ද, ජාති දසයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති සතළිසක්ද, ජාති පණසක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති සියක් දහසක්ද, නොයෙක් සංවර්ත කල්පයක්ද, විවර්ත කල්පයන්ද, නොයෙක් සංවර්ත විවර්ත කල්පයන්ද අසවල් තැන වීමි, මෙනම් ඇත්තෙක් මේ ගොත්‍ර ඇත්තෙම් මෙබඳු වර්ණ ඇත්තෙම් මෙබඳු ආහාර ඇත්තෙම් මෙබඳු සුවදුක් වින්දෙම් මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුත වූයෙමි. අසවල් තැන ඉපදුනෙමි. එහිද මෙනම් ඇත්තෙම්, මෙබඳු ගොත්‍ර ඇත්තෙම්, මෙබඳු වර්ණ ඇත්තෙම්, මෙබඳු ආහාර ඇත්තෙම්, මෙබඳු සුවදුක් වින්දෙම් මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුතව මෙහි උපන්නේ වෙමි'යි මෙසේ ආකාර සහිතවූ උදෙසීම් සහිතවූ අනෙකප්‍රකාරවූ පෙරවිසූ භව පිළිවෙළ සිහිකරන්නේද, හෙතෙම මාගෙන් අතීතය අරබයා ප්‍රශ්න අසන්නේ, නම් මම පූර්ව කෙළවර අරබයා ඔහුගෙන්ද ප්‍රශ්න අසන්නෙමි. හෙතෙම පූර්ව කෙළවර අරබයා ප්‍රශ්න විසඳීමෙන් මාගේ සිත සතුටු කරන්නේ නම් මමද පූර්ව කෙළවර අරබයා ප්‍රශ්න විසඳීමෙන් ඔහුගේ සිත සතුටු කරන්නෙමි. උදායීය, යමෙක් වනාහි පිරිසිදුවූ මිනිසැස ඉක්ම පවත්නාවූ දිව්‍යවූ ඇසින් චුතවනු ලබන්නාවූද, උපදිනු ලබන්නාවූද හීනවූද ප්‍රණීතවූද යහපත් වර්ණ ඇත්තාවූද අයහපත් වර්ණ ඇත්තාවූද හොඳලොව ගියාවූද නරක ලොව ගියාවූද, සත්වයන් දකින්නේද මේ පින්වත් සත්වයෝ ඒකාන්තයෙන් කාය දුශ්චරිතයෙන් යුක්ත වූහ. වාග් දුශ්චරිතයෙන් යුක්ත වූහ. මනො දුශ්චරිතයෙන් යුක්ත වූහ. ආර්යයන් දොස් කියන්නෝ වූහ. මිථ්‍යා දෘෂ්ටිකයෝ වූහ. මිථ්‍යා දෘෂ්ටි කර්ම සමාදන් වූවෝ වූහ. ඔවුහු ශරීරය බිඳීමෙන් මරණින්

මතු නපුරු ගති ඇති යටිකුරුව වැටෙන්නාවූ නරකයෙහි උපන්නාහුය. හෙවත් මේ පින්වත් සත්වයෝ කාය සුචරිතයෙන් යුක්ත වූහ. වාග් සුචරිතයෙන් යුක්ත වූහ. මනො සුචරිතයෙන් යුක්ත වූහ. ආර්යයන්ට දොස් නොකියන්නාහු. සම්‍යග් දෘෂ්ටි ඇත්තෝ වූහ. සම්‍යක් දෘෂ්ටි කර්ම සමාදන් වූවෝ වූහ. ඔව්හු ශරීරය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපන්නාහුයයි මෙසේ පිරිසිදුවූ, මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින් කම්වූ පරිද්දෙන් මිය පරලොව ගියාවූ සත්වයන් දකින්නේද, පහත්වූද උසස්වූද, යහපත් වර්ණ ඇත්තාවූද, හොඳ ලොවට ගියාවූද, නරක ලොවට ගියාවූද චුතවනු ලබන්නාවූද, උපදිනු ලබන්නාවූද කම්වූ පරිද්දෙන් පැමිණියාවූ සත්වයන් දැන ගන්නේද හෙතෙම අනාගතය අරභයා මගෙන් ප්‍රශ්න අසන්නේ නම් මමද අනාගතය අරභයා ඔහුගෙන් ප්‍රශ්න අසන්නෙමි. හෙතෙම අනාගතය අරබයා ප්‍රශ්න විසඳීමෙන් මාගේ සිත සතුටු කරන්නේ නම්, මමද අනාගතය අරබයා ප්‍රශ්න විසඳීමෙන් ඔහුගේ සිත සතුටු කරන්නෙමි. උදායිය, එතකුදු වුවත් අතීතය තිබේවා. අනාගතය තිබේවා, මෙය ඇතිකල්හි මෙය වෙයි. මොහුගේ ඉපදීමෙන් මෙය උපදියි. මෙය නැතිකල්හි මෙය නොවෙයි මොහුගේ නිරුද්ධවීමෙන් මෙය නිරුද්ධවේයයි, ධර්මය තොපට දෙශනාකරන්නෙමි. ස්වාමීනි, මම ජීවිතයෙන් යම්තාක් කල් ගත කෙළෙම්ද, එයද මෙසේ ආකාර සහිතව දැක්වීම් සහිතව සිහිකරන්ට නොපොහොසත් වෙමි. මම කෙසේ නම් නොයෙක් ආකාරවූ පෙරවිසූ භව පිළිවෙළ සිහිකරන්නෙම්ද එනම්, ජාති එකක්ද ජාති දෙකක්ද ජාති තුනක්ද, ජාති සතරක්ද, ජාති පහක්ද, ජාති දහයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති සතළිසක්ද, ජාති පණසක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති සියක් දහසක්ද, නොයෙක් සංවර්ත කල්පයක්ද, විවර්ත කල්පයන්ද, නොයෙක් සංවර්ත විවර්ත කල්පයන්ද අසවල් තැන වීමි, මෙනම් ඇත්තෙමි මේ ගොත්‍ර ඇත්තෙමි, මෙබඳු වර්ණ ඇත්තෙමි මෙබඳු ආහාර ඇත්තෙමි මෙබඳු සුවදුක් වින්දෙමි මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුත වූයෙමි. අසවල් තැන

ඉපදුනෙමි. එහිද මෙනම් ඇත්තෙමි. මෙබඳු ගොත්‍ර ඇත්තෙමි, මෙබඳු වර්ණ ඇත්තෙම් මෙබඳු ආහාර ඇත්තෙමි, මෙබඳු සුවදුක් වින්දෙමි, මෙබඳු ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුතව මෙහි උපන්නේ වෙමි'යි මෙසේ ආකාර සහිතවූ උදෙසීම් සහිතවූ අනෙකප්‍රකාරවූ පෙර විසූ භව පිළිවෙළ භාග්‍යවතුන් වහන්සේ මෙන් කෙසේනම් සිහිකරන්නෙම්ද, ස්වාමීනි මම වනාහි දැන් පංශු පිසාචයෙකුවත් නොදන්නෙමි. මම කෙසේ නම් පිරිසිදුවූ මිනිසැස ඉක්ම පවත්නාවූ දිව්‍යවූ ඇසින් චුතවනු ලබන්නාවූද උපදිනු ලබන්නාවූද හීනවූ ප්‍රණීතවූ යහපත් වර්ණ ඇත්තාවූ අයහපත් වර්ණ ඇත්තාවූද හොඳ ලොව ගියාවූද නරකලොව ගියාවූද සත්වයන් දක්නෙම්ද? මේ පින්වත් සත්වයෝ ඒකාන්තයෙන් කාය දුශ්චරිතයෙන් යුක්තවූහ. වාග් දුශ්චරිතයෙන් යුක්තවූහ. මනො දුශ්චරිතයෙන් යුක්තවූහ. ආර්යයන් දොස් කියන්නෝ වූහ. මිථ්‍යාදෘෂ්ටිකයෝ වූහ. මිථ්‍යාදෘෂ්ටි කර්ම සමාදන්වූවෝ වූහ. ඔවුහු ශරීරය බිඳීමෙන් මරණින් මතු නපුරු ගති ඇති යටිකුරුව වැටෙන්නාවූ නරකයෙහි උපන්නාහුය හෙවත් මේ පින්වත් සත්වයෝ කාය සුචරිතයෙන් යුක්තවූහ. වාග් සුචරිතයෙන් යුක්තවූහ. මනො සුචරිතයෙන් යුක්තවූහ. ආර්යයන්ට දොස් නොකියන්නාහු සම්‍යක්දෘෂ්ටි ඇත්තෝ වූහ. සම්‍යක් දෘෂ්ටි කර්ම සමාදන්වූවෝ වූහ. ඔවුහු ශරීරය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපන්නාහුයයි මෙසේ පිරිසිදුවූ මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින් කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියාවූ සත්වයන් දකින්නේද, පහත්වූද, උසස්වූද, යහපත් වර්ණ ඇත්තාවූද, අයහපත් වර්ණ ඇත්තාවූද, හොඳ ලොවට ගියා වූද, නරක ලොවට ගියාවූද, චුතවනු ලබන්නාවූද, උපදිනු ලබන්නාවූද, කම් වූ පරිද්දෙන් පැමිණියාවූ සත්වයන් භාග්‍යවතුන් වහන්සේ මෙන් දැනගන්නෙම්ද? ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට' උදායීය, එතකුදු වුවත් අතීතය තිබේවා. අනාගතය තිබේවා. මෙය ඇති කල්හි මෙය වේ. මෙය ඉපදීමෙන් මෙය උපදියි. මෙය නැති කල්හි මෙය නොවේ. මෙය නැතිවීමෙන් මෙය නැතිවේයයි තොපට ධර්මය දෙශනා කරන්නෙමි යන යම්

වචනයක් වදාළේද, එය මට වැඩියක් නොවැටහෙන්නේය. ස්වාමීනි, මම ස්වකීය ආචාර්යවරයන්ගේ ඉගැන්වීම වන ප්‍රශ්න විසඳීමෙන් භාග්‍යවතුන් වහන්සේගේ සිත සතුටු කරන්නෙම් නම් ඉතා යෙහෙක.

4. "උදායීය, කුමක් නම් තොපගේ ආචාර්යයන්ගේ ඉගැන්වීම වේද? ස්වාමීනි, අපගේ ආචාර්යයන්ගේ ඉගැන්වීම මෙසේ වන්නේය. මේ ආත්මය උතුම් වර්ණ ඇත්තේය. මේ ආත්මය උතුම් වර්ණ ඇත්තේය යනුයි. උදායීය, තොපගේ ස්වකීය ආචාර්යයන්ගේ ඉගැන්වීම මේ ආත්මය උතුම් වර්ණ ඇත්තේය, මේ ආත්මය උතුම් වර්ණ ඇත්තේය යනු නම් ඒ උතුම් වර්ණ නම් කුමක්ද? ස්වාමීනි, යම් වර්ණයකට වඩා වැඩිවූද, උසස්වූද අන් වර්ණයක් නැත්නම් එය උතුම් වර්ණයයි. උදායීය, යම් වර්ණයකට වඩා උසස්වූද වැඩිවූද යම්වර්ණයක් නැති ඒ උතුම් වර්ණය නම් කුමක්ද? ස්වාමීනි, යම් වර්ණයකට වඩා වැඩිවූද උසස්වූද අන් වර්ණයක් නැත්නම් එය උතුම් වර්ණයයි. උදායීය, තොපගේ මේ වචනය දිගින් දිගට යන්නේය. ස්වාමීනි, යම් වර්ණයකට වඩා වැඩිවූද උසස්වූද අන් වර්ණයක් නැත්නම් එය උතුම් වර්ණයයි කියන්නෙහිය. ඒ වර්ණයද නොකියන්නෙහිය. උදායීය, යම්සේ පුරුෂයෙක් මෙසේ කියන්නේද? මම මේ ජනපදයෙහි යම් ජනපද කල්‍යාණිය (ඉතා රූපත් ස්ත්‍රිය) කැමතිවෙමි, පතමියි කියන්නේය. ඔහුට මෙසේ කියන්නාහුය. පින්වත් පුරුෂය, නුඹ ජනපද කල්‍යාණිය කැමැත්තෙහිය, පතන්නෙහිය. නුඹ, ජනපද කල්‍යාණිය ක්ෂත්‍රියාවක්දැයි හෝ බ්‍රාහ්මණියක්දැයි හෝ වෛශ්‍යවංශ ඇත්තියක්දැයි හෝ ශුද්‍රවංශ ඇත්තියක්දැයි හෝ මෙසේ දන්නෙහිදැ'යි අසන ලද්දේ නැතැයි කියන්නේය. ඔහුට මෙසේ කියන්නාහුය. 'පින්වත් පුරුෂය, නුඹ යම් ජනපද කල්‍යාණියක් කැමැත්තෙහිද, පතන්නෙහිද, නුඹ ඒ ජනපද කල්‍යාණිය මෙනම් ඇත්තීයයි හෝ මෙනම් ගොත්‍ර ඇත්තීයයි හෝ දන්නෙහිදැයි මෙසේ අසන ලද්දේ නැතැයි කියන්නේය. උස් තැනැත්තියක් හෝ මිටි තැනැත්තියක් හෝ මධ්‍යම තැනැත්තියක් හෝ වේයයි

දන්නෙහිදැයි මෙසේ අසන ලද්දේ නැතැයි කියන්නේය. කලු තැනැත්තියක් හෝ හෙලලු වන් තැනැත්තියක් හෝ දුඹුරු පාට තැනැත්තියක් හෝ වේයයි දන්නෙහිදැයි, මෙසේ අසන ලද්දේ 'නැතැයි, කියන්නේය. අසවල් ගමෙහි හෝ නියම් ගමෙහි හෝ නගරයෙහි හෝ වේදැයි මෙසේ අසන ලද්දේ 'නැතැයි, කියන්නේය. ඔහුට මෙසේ කියන්නාහුය. 'පින්වත් පුරුෂය, නුඹ යම් ස්ත්‍රියක් නොදන්නෙහිද, නොදක්නෙහිද, නුඹ ඇය කැමැතිවන්නෙහිද පතන්නෙහිදැයි, මෙසේ අසන ලද්දේ 'එසේයයි, කියන්නේය. උදායීය, ඒ කුමකැයි හඟින්නෙහිද, මෙසේ ඇතිකල්හි ඒ පුරුෂයාගේ කීම නිරර්ථකවූ කීමක් බවට නොපැමිණෙන්නේද?" "ස්වාමීනි, ඒකාන්තයෙන්ම එසේ ඇති කල්හි, ඒ පුරුෂයාගේ කීම නිරර්ථකවූ කීමක් බවට පැමිණෙන්නේය, වන්නේය. උදායීය, එපරිද්දෙන්ම යම් වර්ණයකට වඩා වැඩිවූද උසස්වූද අන් වර්ණයක් නැත්නම් ඒ වර්ණය උතුම් වර්ණය වේයයි, කියන්නෙහිය. ඒ වර්ණයද නොකියන්නෙහිය.

**5.** "ස්වාමීනි, යම්සේ යහපත්වූ ජාති සම්පන්නවූ, අටැස්වූ, මනාව ඔප දමන ලද්දාවූ වෛඩූර්ය මාණික්‍යය කම්බිලියෙක්හි බහා තබන ලද්දේ බබලයිද, දිලිසෙයිද මරණින් මත්තෙහි උවදුරක් නැතිව පවත්නා ආත්මය මේ වර්ණය ඇත්තේය. "උදායීය, ඒ කුමකැයි හඟින්නෙහිද? යහපත්වූ, ජාතිමත්වූ, අටැස් ඇත්තාවූ, මනාව ඔප දමන ලද්දාවූ, වෛඩූර්ය මාණික්‍යය පඬුවන් කම්බිලියෙක්හි බහා තබන ලද්දේ බබලයිද, දිලිසෙයිද, මහත්වූ අන්ධකාර ඇති රාත්‍රියෙක්හි යම් කදෝපැනි නම් පණුවෙක් (කණාමැදිරියෙක්) වේද, මේ වර්ණයන් දෙදෙනාගෙන් කවර වර්ණයක් මෙ ඉතා වඩා බබලන්නේත් වඩා උසස් වන්නේත් වේද?"

**6.** "ස්වාමීනි, මහත් අන්ධකාර ඇති රාත්‍රියෙහි යම් මේ කදෝපැනිනම් පණුවෙක් වේද, හෙතෙම මේ වර්ණ දෙක අතුරෙන් වඩා බබලන්නේත් වඩා උසස් වන්නේත් වෙයි." උදායීය, ඒ කුමකැයි හඟින්නෙහිද? මහත් අන්ධකාර ඇති

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

රාත්‍රියෙහි යම් කදෝපැනි නම් පණුවෙක් හෝ වේද, මහත් අන්ධකාර ඇති රාත්‍රියෙහි යම් තෙල් පහණක් හෝ වේද මේ වර්ණ දෙක අතුරෙන් කවර වර්ණයක් තෙම වඩා බබලන්නේත්, වඩා උසස් වන්නේත් වේද?

"ස්වාමීනි, මහත් අඳුරු ඇති රාත්‍රියෙහි යම් මේ තෙල් පහනක් වේද, මෙය මේ වර්ණ දෙක අතුරෙන් වඩා බබලන්නේත් වඩා උසස් වන්නේත් වෙයි". "උදායීය, ඒ කුමකැයි හඟින්නෙහිද? මහත් අඳුරු ඇති රාත්‍රියෙහි යම් තෙල් පහනක් හෝ වේද, මහත් අඳුරු ඇති රාත්‍රියෙහි යම් මහ ගිනිකඳක් හෝ වේද, මේ වර්ණ දෙක අතුරෙන් කවර වර්ණයක් වඩා බබලන්නේත් වඩා උසස් වන්නේත් වේද?" "ස්වාමීනි, මහත් අඳුරු ඇති රාත්‍රියෙහි යම් මේ මහත් ගිනි කඳක් වේද, මේ වර්ණ දෙක අතුරෙන් වඩා බබලන්නේත් වඩා උසස් වන්නේත් වෙයි."

7. "උදායීය, ඒ කුමකැයි හඟින්නෙහිද, මහත් අඳුරු ඇති රාත්‍රියෙහි යම් මහත් ගිනිකඳක් හෝ වේද, රාත්‍රි අළුයම් කාලයෙහි පහව ගියාවූ වැස්ස ඇති දුරුවූ වළාකුල් ඇති අහසෙහි යම් ඔසධී (පහන්) තාරකාවක් හෝ වේද, මේ වර්ණ දෙක අතුරෙන් කවර නම් වර්ණයක් වඩා බබලන්නේත් වඩා උසස් වන්නේත් වේද? ස්වාමීනි රාත්‍රි බලවත් වැස්ස ඇති අළුයම් කාලයෙහි දුරුවූ පහවූ වළාකුල් ඇති අහසෙහි යම් ඔසධී (පහන්) තාරකාවක් වේද, මෙය මේ උභය වර්ණයන්ගෙන් වඩා යහපත් වන්නේද වඩා උසස් වන්නේද? උදායීය, ඒ කුමකැයි හඟින්නෙහිද, රාත්‍රි අළුයම් කාලයෙහි දුරුවූ වැස්ස ඇති පහවූ වලාකුල් ඇති අහසෙහි යම් පහන් තරුවක් හෝ එදවස්හි පොහොය ඇති පසළොස්වක්හි දුරුවූ පහවූ වළාකුල් ඇති අහසෙහි සම්පූර්ණ අඩ රෑ වැස්ස ඇති කාලයෙහි යම් පුන්සඳක් වේද, මේ වර්ණදෙක අතුරෙන් කවර වර්ණයක් වඩා බබලන්නේත් වඩා උසස් වන්නේත් වේද?"

8. "ස්වාමීනි, යම් මේ එදවස්හිවූ පොහොය ඇති පසළොස්වක්හි දුරුව ගියාවූ වැස්ස ඇති, පහවූ වළාකුල් ඇති අහසෙහි සම්පූර්ණ අඩ රෑ කාලයෙහි පුන්සඳ වේද, මෙය මේ

වර්ණ දෙක අතුරෙන් වඩා බබලන්නේත් වඩා උසස් වන්නේත් වෙයි. උදායීය, ඒ කුමකැයි හඟින්නෙහිද, එදවස්හි පොහොය ඇති පසළොස්වක්හි දුරුව ගියාවූ වැස්ස ඇති, පහවූ පළාකුල් ඇති. අහසෙහි සම්පූර්ණ අඩ රෑ කාලයෙහි යම් පුන්සඳක් හෝ වේද, වැසි කාලයේ අන්තිම මාසය වන සරත් කාලයෙහි දුරුව ගියාවූ වැස්ස ඇති, පහවූ වළාකුල් ඇති අහසෙහි සම්පූර්ණ ඉරමුදුන් කාලයෙහි යම් සූර්යයෙක් හෝ වේද, මේ වර්ණදෙක අතුරෙන් කවර නම් වර්ණයක් වඩා බබලන්නේත් වඩා උසස් වන්නේත් වේද?"

"ස්වාමීනි, යම් මේ වැසිකාලයේ අන්තිම මාසය වන සරත් කාලයෙහි දුරුව ගියාවූ වැස්ස ඇති, පහවූ වළාකුල් ඇති අහසෙහි සම්පූර්ණ ඉරමුදුන් කාලයෙහි සූර්යයා වේද, එය මේ වර්ණදෙක අතුරෙන් වඩා බබලන්නේත් වඩා උසස් වන්නේත් වෙයි.

**9.** "උදායීය, මේ සඳ හිරු දෙදෙනාගෙන් ආලොකය නොලබා තම ශරීරයෙන්ම මීටද වඩා ආලොකවත්වූ දෙවියෝ බොහෝ වෙත්. ඉතා බොහෝ වෙත්. මම ඔවුන්ද දනිමි. එහෙත් යම් වර්ණයකට වඩා අතිශයින් උසස්වූද අතිශයින් ප්‍රණීතවූද අනික් වර්ණයෙක් නැත්තේ යයි මම නොකියමි. එතකුදු වුවත් උදායීය, නුඹ මේ කණමැදිරි පණුවෙකුගේ වර්ණයටත් වඩා පහත්වූද, පිළිකුල්වූද වර්ණයක් උතුම් වර්ණයයි කීයෙහිය. ඒ වර්ණයද පනවන්නෙහිය".

"භාග්‍යවතුන් වහන්සේ කථාව කපා හැරියේය. සුගතයන් වහන්සේ කථාව කපා හැරියේය."

**10.** "උදායීය, කුමක් හෙයින් නුඹ 'භාග්‍යවතුන් වහන්සේ කථාව කපා හැරියේය. සුගතයන් වහන්සේ කථාව කපා හැරියේයයි, මෙසේ කීයෙහිද?'

"ස්වාමීනි, අපගේ ස්වකීය ආචාර්යයන්ගේ ඉගැන්වීමෙහි මෙසේ ඇත්තේය. මේ ආත්මය උතුම් වර්ණ ඇත්තේය. මේ ආත්මය උතුම් වර්ණය ඇත්තේය යනුයි. ස්වාමීනි, ස්වකීය ආචාර්යයන්ගේ ඉගැන්වීම පිළිබඳව පැහැදිලි කරනු ලබන්නාවූ,

කරුණු දක්වනු ලබන්නාවූ, කරුණු කියනු ලබන්නාවූ අපි භාග්‍යවතුන් වහන්සේ විසින් හිස්කරන ලද්දෝ වැරැද්දට පමුණුවන ලද්දෝ වෙමු"

"උදායිය, කිමෙක්ද ඒකාන්තයෙන් සැප ඇත්තාවූ ලොකයක් ඇත්තේද? ඒකාන්ත සැප ඇත්තාවූ ලොකයට පැමිණීම පිණිස කරුණු සහිත මාර්ගයක් ඇත්තේද? "ස්වාමීනි, අපගේ ස්වකීය ආචාර්යයන්ගේ ඉගැන්වීමෙහි එකාන්තයෙන් සැප ඇත්තාවූ ලොකයක් ඇත්තේය. එකාන්ත සැප ඇත්තාවූ ලොකයට පැමිණීම පිණිස කරුණු සහිතවූ මාර්ගයක් ඇත්තේය යන ඉගැන්වීම වෙයි."

11. "උදායිය, ඒකාන්ත සැප ඇත්තාවූ ලොකයට පැමිණීම පිණිස (පවත්නාවූ) ඒ කරුණු සහිත මාර්ගය කුමක්ද?" ස්වාමීනි, මේ ලොකයෙහි ඇතමෙක් ප්‍රාණඝාතය හැර ප්‍රාණඝාතයෙන් වැලකුනේ වෙයි. සොරකම් කිරීම හැර සොරකමින් වැලකුනේ වෙයි. කාමයෙහි වරදවා හැසිරීම හැර කාමයෙහි වරදවා හැසිරීමෙන් වැලකුනේ වෙයි. බොරුකීම හැර බොරුකීමෙන් වැලකුනේ වෙයි. එක්තරා තපස් ගුණයක් හෝ සමාදන්ව පවතියි. ස්වාමීනි, මේ වනාහි ඒකාන්ත සැප ඇත්තාවූ ලොකයට පැමිණීම පිණිස පවත්නා ඒ කරුණු සහිතවූ මාර්ගය වේ."

12. "උදායිය, ඒ කුමකැයි හඟින්නෙහිද? යම් කලෙක්හි ප්‍රාණඝාතය හැර ප්‍රාණඝාතයෙන් වැලකුනේ වේද, එකල්හි ඒකාන්ත සුව ඇත්තාවූ ආත්මය හෝ වේද, සුවදුක් දෙකින් යුක්තවූ ආත්මය හෝ වේද?" "ස්වාමීනි, සුවදුක් දෙකින් යුක්තවූ ආත්මය ඇත්තේ වෙයි"

"උදායිය, ඒ කුමකැයි හඟින්නෙහිද? යම් කලෙක්හි සොරකම් හැර සොරකමින් වැලකුනේ වේද, එකල්හි ඒකාන්ත සුව ඇත්තාවූ ආත්මය හෝ වේද, සුවදුක් දෙකින් යුක්තවූ ආත්මය හෝ වේද?" "ස්වාමීනි, සුවදුක් දෙකින් යුක්තවූ ආත්මය වේ.

"උදායිය, ඒ කුමකැයි හඟින්නෙහිද? යම් කලෙක්හි කාම මිථ්‍යාචාරය හැර කාම මිථ්‍යාචාරයෙන් වැලකුනේ වේද, එකල්හි

ඒකාන්ත සුව ඇත්තාවූ ආත්මය හෝ වේද, සුවදුක් දෙකින් යුක්තවූ ආත්මය හෝ වේද?" "ස්වාමීනි, සුවදුක් දෙකින් යුක්තව ආත්මය වේ."

"උදායීය, ඒ කුමකැයි හඟින්නෙහිද? යම් කලෙක්හි මුසාවාදය හැර මුසාවාදයෙන් වැලකුනේ වේද, එකල්හි ඒකාන්ත සුව ඇත්තාවූ ආත්මය හෝ වේද, සුවදුක් දෙකින් යුක්තවූ ආත්මය හෝ වේද?" "ස්වාමීනි, සුවදුක් දෙකින් යුක්තවූ ආත්මය වේ."

13. "උදායීය, ඒ කුමකැයි හඟින්නෙහිද? යම් කලෙක්හි එක්තරා තපස් ගුණයක් සමාදන්ව පවතීද, එකල්හි ඒකාන්ත සුව ඇත්තාවූ ආත්මය, හෝ වේද, සුවදුක් දෙකින් යුක්තවූ ආත්මය හෝ වේද?" "ස්වාමීනි, සුවදුක් දෙකින් යුක්තවූ ආත්මය වේ."

"උදායීය, ඒ කුමකැයි හඟින්නෙහිද? කිම, සැපදුක් දෙකින් මිශ්‍ර වූයේ සුවදුක් දෙකම ඇති ප්‍රතිපදාවකට පැමිණ ඒකාන්ත සුව ඇත්තාවූ ලොකයට පැමිණීමෙක්වේද?" "භාග්‍යවතුන් වහන්සේ කථාව සින්දේය සුගතයන් වහන්සේ කථාව සිංදේය" "උදායීය, නුඹ කුමකට වනාහි භාග්‍යවතුන් වහන්සේ කථාව සින්දේය, සුගතයන් වහන්සේ කථාව සින්දේයයි, මෙසේ කීයෙහිද?" "ස්වාමීනි, අපගේ ස්වකීයවූ ආචාර්යයන්ගේ ඉගැන්වීමෙහි ඒකාන්ත සැප ඇති ලොකයක් ඇත්තේය. 'ඒකාන්ත සැප ඇත්තාවූ ලොකයට පැමිණීම පිණිස කරුණු සහිතවූ මාර්ගයෙක් ඇත්තේය' යන මේ ඉගැන්වීම වෙයි. ස්වාමීනි, ස්වකීය ආචාර්යයන්ගේ ඉගැන්වීම මනාව ගෙනහැර දක්වනු ලබන්නාවූ මනාව ගන්වනු ලබන්නාවූ මනාව කියනු ලබන්නාවූ ඒ අපි භාග්‍යවතුන් වහන්සේ විසින් හිස් කරන ලද්දේ නින්දා කරන ලද්දේ වරදට පමුණුවන ලද්දේ වෙමු.

14. "ස්වාමීනි, කිම, ඒකාන්ත සුවයක් ඇත්තාවූ ලොකයක් ඇත්තේද, ඒකාන්ත සුව ඇත්තාවූ ලොකයට පැමිණීම පිණිස කරුණු සහිතවූ මාර්ගයක් ඇත්තේද?" "උදායීය, ඒකාන්ත සුව ඇත්තාවූ ලොකයක් ඇත්තේය. ඒකාන්ත සුව ඇත්තාවූ

ලොකයට පැමිණීම පිණිස කරුණු සහිතවූ මාර්ගයෙක් ඇත්තේය. ස්වාමීනි, ඒකාන්ත සුව ඇත්තාවූ ලොකයට පැමිණීම පිණිස පවත්නා ඒ කරුණු සහිතවූ ඒ මාර්ගය කවරේද?"

"උදායීය, මේ ශාසනයෙහි භික්ෂු තෙම කාමයන්ගෙන් වෙන්වම විචාරත්. ඔවුන්ට මම දුක්ඛ සමුදය සත්‍යය විචාරණ ලද්දේ ප්‍රකාශකරමි. මම ඔවුන්ගේ ප්‍රශ්න විසඳීමෙන් සිත සතුටු කරමි. ඔව්හු දුක්ඛනිරොධසත්‍යය මා විචාරත්. ඔවුන්ට මම දුක්ඛනිරොධ සත්‍යය විචාරන ලද්දේ ප්‍රකාශ කරමි. මම ඔවුන්ගේ ප්‍රශ්න විසඳීමෙන් සිත සතුටු කරමි. (භික්ෂුතෙම) ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරයි, විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් කෙලෙස් තවන වීර්යය ඇත්තේ, මනා දැනුම් ඇත්තේ ලොකයෙහි විසම ලොභය හා සිතේ නොසතුට දුරුකොට වෙදනාවන්හි වෙදනාවන් අනුව බලමින් වාසය කෙරේද, කෙලෙස් තවන වීර්යය ඇත්තේ මනා දැනුම් ඇත්තේ ලොකයෙහි විසම ලොභය හා සිතේ නොසතුට දුරුකොට සිතෙහි සිත අනුව බලමින් වාසය කෙරේද, ද්විතීය ධ්‍යානයට ප්‍රධාන සංස්කාරයන්ගෙන් යුක්තවූ ඍද්ධිපාදය වඩයි. චිත්ත සමාධි ප්‍රධාන සංස්කාරයන්ගෙන් යුක්තවූ ඍද්ධිපාදය වඩයි. තෘතීයධ්‍යානයට පැමිණ වාසය කරයි, උදායීය, මේ වනාහි ඒකාන්ත සුව ඇත්තාවූ ලොකයට පැමිණීම පිණිස පවත්නා ඒ කරුණු සහිතවූ මාර්ගයයි" "ස්වාමීනි, ඒ වනාහි ඒකාන්ත සුව ඇත්තාවූ ලොකයට පැමිණීම පිණිස පවත්නා මාර්ගය නොවෙයි. ස්වාමීනි, මෙතෙකින් ඔහු විසින් ඒකාන්ත සුව ඇත්තාවූ ලොකයට පැමිණෙන ලද්දේ වෙයි." "උදායීය, මෙතෙකින් ඔහු ඒකාන්ත සුව ඇත්තාවූ ලොකයට නොපැමිණියේ වෙයි. මෙය ඒකාන්ත සුව ඇත්තාවූ ලොකයට පැමිණීම පිණිස ඇති කරුණු සහිතවූ මාර්ගය වන්නේය.

**15.** මෙසේ වදාළ කල්හි "අපි මෙහි ආචාර්යයන් සහිතව නැසුනෙමු. අපි මෙහි ආචාර්යයන් සහිතව නැසුනෙමු. අපි මීට වඩා වැඩිදෙයක් නොදනිමුයි" සකුළුදායි පරිබ්‍රාජකයාගේ පිරිස උස් හඬින් මහ හඬින් කෑ ගැසීය. ඉක්බිති සකුළුදායි

පරිබ්‍රාජක තෙම ඒ පරිබ්‍රාජකයන් නිශ්ශබ්ද කොට භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය. "ස්වාමීනි, කොපමණකින් වනාහි මොහු විසින් ඒකාන්ත සුව ඇත්තාවූ ලොකයට පැමිණෙන ලද්දෝවේද?" "උදායීය, මේ ශාසනයෙහි භික්ෂුතෙම සුවයද දුරුකිරීමෙන් සංසිඳීමට පමුණුවන්නාවූ, සම්බොධියට පමුණුවන්නාවූ විරියෙන්ද්‍රිය වඩාද, සංසිඳීමට පමුණුවන්නාවූ සම්බොධියට පමුණුවන්නාවූ ස්මෘතින්ද්‍රිය වඩාද, සංසිඳීමට පමුණුවන්නාවූ, සම්බොධියට පමුණුවන්නාවූ සමාධින්ද්‍රිය වඩාද, චතුර්ථධ්‍යානයට පැමිණ වාසය කරයි. යම්තාක් දෙවියෝ ඒකාන්ත සුව ඇත්තාවූ ලොකයෙහි උපන්නාහුද, ඒ දෙවියන් සමග එක්ව සිටියිද, එක්ව කථාකරයිද, සාකච්ඡාවටද, පැමිණෙයිද, උදායීය, මෙතෙකින් වනාහි මොහු විසින් ඒකාන්ත සුව ඇත්තාවූ ලොකයට පැමිණෙන ලද්දේ වෙයි.".

"ස්වාමීනි, ඒකාන්තයෙන් මේ ඒකාන්ත සුව ඇති ලොකයට පැමිණීම පිණිස භික්ෂුහු භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි උතුම් හැසිරීමෙහි හැසිරෙද්ද?" "උදායීය, මේ ඒකාන්ත සුව ඇත්තාවූ ලොකයට පැමිණීම පිණිස භික්ෂුහු මාගේ ශාසනයෙහි (බඹසර) උතුම් හැසිරීමෙහි නොහැසිරෙත්. උදායීය, යම් ධර්මයන් ප්‍රත්‍යක්ෂ කිරීම සඳහා භික්ෂූහු මාගේ ශාසනයෙහි උතුම් හැසිරීමෙහි හැසිරෙත්ද, මෙයින් අන්‍යවූ ඒ ඉතා උතුම්වූද, ඉතා ප්‍රණීතවූද ධර්මයෝ ඇත්තාහ."

**16.** "ස්වාමීනි, යම් ධර්මයන් ප්‍රත්‍යක්ෂ කිරීම සඳහා භික්ෂුහු භාග්‍යවතුන් වහන්සේගේ ශාසනයෙහි උතුම් හැසිරීමෙහි හැසිරෙද්ද, මෙයින් අන්‍යවූ ඒ අතිශයින් උතුම්වූද, අතිශයින් ප්‍රණීතවූද ඒ ධර්මයෝ කවරහුද?"

"උදායීය, එසේම මේ ලොකයෙහි අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ, විද්‍යාචරණ සම්පන්නවූ, යහපත් ගති ඇත්තාවූ, සියලු ලොකයන් දන්නාවූ, ශ්‍රෙෂ්ඨවූ, හික්මවිය යුතු පුරුෂයන් දමනය කිරීමෙහි රියැදුරෙකු වැනිවූ, දෙවිමිනිසුන්ට ගුරුවරයෙක්වූ, චතුස්සත්‍ය අවබොධ කළාවූ තථාගත කෙනෙක් මෙලොව උපදනාහ. ඒ තථාගත තෙමේ දෙවියන් සහිතවූ, මරුන් සහිතවූ,

බ්‍රහ්මයන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ, දෙවි මිනිසුන් සහිතවූ, මේ ලොකය ස්වකීය විශේෂ ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශ කරයි. ඒ තථාගතයන් වහන්සේ මුල යහපත්වූ, මැද යහපත්වූ, අවසානය යහපත්වූ, අර්ථ සහිතවූ, දස වැදෑරුම් අක්ෂර සම්පත්තියෙන් යුක්තවූ සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, පිරිසිදුවූ, ශාසන බ්‍රහ්මචර්යාව ප්‍රකාශ කරති.

17. "ඒ ධර්මය ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ අන් කුල අතුරෙන් එක් කුලයක උපන්නෙක් හෝ අසයිද, ඔහු ඒ ධර්මය අසා තථාගතයන් වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව ඇති කරයි ඔහු ඒ ශ්‍රද්ධාවෙන් යුක්ත වූයේ මෙසේ සලකන්නේය. ගිහිගෙයි විසීම අවහිර සහිතය. කෙලෙස් දූවිලි උපදින තැනකි. මහණකම වනාහි කිසිවක් නොමැති අවකාශය මෙන් නිදහස්ය. ගිහිගෙයි වසන්නහු විසින් සියලු ආකාරයෙන් සම්පූර්ණවූ, සියලු ආකාරයෙන් පිරිසිදුවූ, ලියවූ හක්ගෙඩියක් වැනි මෙම බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන්ට නොහැක්කේය. මම කෙස් දැළිරැවුලු කපාදමා සිවුරු හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි මහණ වන්නෙම් නම් ඉතා යහපතැයි කියායි.

18. "ඔහු පසු කාලයක ස්වල්පවූ හෝ බොහෝවූ හෝ සම්පත් හැර, ස්වල්පවූ හෝ බොහෝවූ නෑපිරිස් හැර, කෙස් දැළිරැවුලු කපාදමා සිවුරු හැඳ, ගිහිගෙන් නික්ම, සස්නෙහි මහණ වන්නේය. එසේ මහණවූ හෙතෙම භික්ෂු සීලයෙන් යුක්තවූයේ, ප්‍රාණවධය හැර, ඉන් සම්පූර්ණයෙන් වැළකුනේ, බහා තබන ලද දඬු ඇත්තේ, බහා තබන ලද ආයුධ ඇත්තේ, පව්කිරීමෙහි ලජ්ජා ඇත්තේ, කරුණාවන්ත වූයේ, සියලු ප්‍රාණීන් කෙරෙහි හිත අනුකම්පාව ඇතුව වාසය කෙරේ. නොදුන් දෙය ගැනීමෙන් වෙන්ව, එයින් සම්පූර්ණයෙන් වැළකුණේ, දුන් දෙයම ගන්නේ, දුන් දෙයම කැමති වන්නේ, සොර නොවූ, පිරිසිදුවූ සිතින් යුක්තව වාසයකෙරේ. අබ්‍රහ්මචර්යාව හැර උතුම් පැවතුම් ඇත්තේ ස්ත්‍රී පුරුෂ සංසර්ගය නම්වූ ග්‍රාම ධර්මයෙන් වෙන් වූයේ බ්‍රහ්මචාරීවේ. බොරු කීමෙන් දුරුව, ඉන් සම්පූර්ණයෙන් වැළකුණේ, සැබෑ වචන කියන්නේ, සැබැවින් සැබව ගළපන

ගති ඇතුව ස්ථිර කථා ඇත්තේ, ඇදහිය යුතු වචන ඇත්තේ ලෝකයා අතර විරුද්ධ කථා ඇති නොකෙරේ. පිසුනුබස් හැර, ඉන් සම්පූර්ණයෙන් වැළකුණේ, මෙතැනින් අසා මොවුන් බිඳවීම පිණිස එතැන නොකියන ගති ඇත්තේ, එතැනින් අසා මොවුන් බිඳවීම පිණිස මෙතැන නොකියන ගති ඇත්තේ, මෙසේ භෙද වූවන් ගළපන්නේ, සමගි වූවන්ගේ සමගිය තහවුරු කිරීමට අනුබල දෙන්නේ, සමගියෙහි ඇලුම් බහුල කොට ඇත්තේ, සමගිකම්හි ඇලුනේ, සමගිකම්හි සතුටුවන ගති ඇත්තේ, සමගිය ඇතිකරණ වචන කියන්නේය. පරුෂ වචනය හැර ඉන් සම්පූර්ණයෙන් වැළකුණේ, යම් වචනයක් නිදොස් වේද, කණට මිහිරිද ප්‍රෙමණීයද, සතුටු කරයිද, යහපත්ද, බොහෝදෙනාට ප්‍රියද, බොහෝදෙනාගේ හිත් ප්‍රිය කරන්නේද, එබඳු වචනම කියන්නේ වේ. හිස්වූ ප්‍රලාප කථා හැර ඉන් සම්පූර්ණයෙන් වැළකුණේ, කාලයට සුදුසු කථා කරන්නේ, සිදුවූ වචනම කියන්නේ, අර්ථයෙන් යුක්තවූ, ධර්මයෙන් යුක්තවූ, විනයයෙන් යුක්තවූ, වචන කියන්නේ, සුදුසු කල්හි උපමා හා කරුණු සහිතවූ, සීමා ඇති, අර්ථයෙන් යුත්, නිධානයක් මෙන් සිතෙහි තැබිය යුතු වචන කියන්නේ වේ.

**19.** "හෙතෙම තණ, ගස්, වැල් සිඳීම් බිඳීම් ආදියෙන් වැළකුණේ වෙයි එක් වේලක් වළඳන්නේ රාත්‍රි භොජනයෙන් හා විකාල භොජනයෙන් වැළකුණේ වෙයි. නැටීම්, ගී කීම්, බෙර ආදිය වැයීම්, විසුලු දැකීම් යන මෙයින් වැළකුණේ වෙයි. මල්, ගඳ, විලවුන් පැළඳීම, ඉන් සැරසීම, අඩු තැන් පිරවීමෙන් අලංකාර කිරීම යන මෙයින් වැළකුණේ වෙයි. උස් අසුන් මහ අසුන් යන මෙයින් වැළකුණේ වෙයි. රන්, රිදී, මසු, කහවණු පිළිගැන්මෙන් වැළකුණේ වෙයි. අමු ධාන්‍ය වර්ග පිළිගැන්මෙන් තොරවූයේ වෙයි. අමු මස් පිළිගැන්මෙන් තොරවූයේ වෙයි. ස්ත්‍රීන් තරුණීන් පිළිගැන්මෙන් තොර වූයේ වෙයි. වැඩකරුවන් වැඩකාරියන් පිළිගැන්මෙන් තොර වූයේ වෙයි. එළුවන් බැටළුවන් පිළිගැනීමෙන් වැළකුණේ වෙයි. ඌරන්, කුකුළන් පිළිගැනීමෙන් වැළකුණේ වෙයි. ඇතුන්, ගවයින්, අසුන්, වෙළඹුන්, පිළිගැන්මෙන් වැළකුණේ වෙයි. කෙත්, වත්,

පිළිගැනීමෙන් වැළකුණේ වෙයි. ගිහින්ගේ දූත මෙහෙවරය, ගෙන් ගෙට යන මහත් මෙහෙවරය යන මෙයින් වැළකුණේ වෙයි. විකිණීම මිළට ගැනීම යන මෙයින් වැළකුණේ වෙයි. තරාදියෙන් හොරට කිරීම, රන් නොරන් කිරීමාදියෙන්, හොරකිරීම, මැනීමෙන් හොර කිරීමාදියෙන් වැළකුණේ වෙයි. හිමියන් අහිමි කිරීමාදිය සඳහා අල්ලස් ගැන්මය, උපායෙන් අනුන් රැවටීමය, යකඩ ආදී ලොහ රන් රිදීයයි අගවා වඤ්චා කිරීමය, නොයෙක් ආකාරවූ කුටිල ප්‍රයොගය යන මෙයින් වැළකුණේ වෙයි. කැපීමය, බැඳීමය, සැඟවී සිට වස්තු පැහැරගැන්මය, ගම් නියම්ගම් ආදිය පැහැරීමය, බලාත්කාරකමින් වස්තු පැහැර ගැන්මය යන මෙයින් වැළකුණේ වෙයි.

"හෙතෙමේ යන්තම් කය වැසීමට තරම්වූ සිවුරෙන්ද, යැපීමට ප්‍රමාණවූ ආහාරයෙන්ද සතුටුවන්නේ වේ. ඔහු යම් යම් තැනකට යේ නම් ඒ ඒ තැනට එය ගෙනයන්නේ වෙයි. යම්සේ පක්ෂියෙක් යම් තැනකට පියාඹා යේ නම් ඒ සියලු තැන පියාපත් බර පමණකින් යුක්තව පියාඹා යේද, එපරිද්දෙන්ම භික්ෂු තෙමේද ශරීරය වැසීමට ප්‍රමාණවූ සිවුරෙන්ද, යැපීමට ප්‍රමාණවූ ආහාරයෙන්ද සතුටුවන්නේ වේ. ඔහු යම් තැනකට යා නම් ඒ ඒ තැන එය රැගෙණම යයි. හෙතෙමේ මේ උතුම් සීලයෙන් යුක්තවූයේ තම සන්තානයෙහි නිරවද්‍යවූ සැපය විඳින්නේය.

**20.** "හෙතෙමේ, ඇසින් රූපයක් දැක එහි මහත් සටහන් සිතට ගන්නේ නැත. කුඩා සටහන් සිතට ගන්නේ නැත. චක්ෂු ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට යමක් හේතු කොට ගෙන ලොභ ද්වේෂ අකුශල ධර්මයෝ හිතට ඇතුල් වන්නාහුද, එහි සංවරය පිණිස ඔහු පිළිපදී. ඔහු තමාගේ චක්ෂු ඉන්ද්‍රියය රකී, චක්ෂු ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ.

"කණින් ශබ්දයක් අසා එය නිමිති වශයෙන් ගන්නේ නොවේ. නැවත නැවත මතක් වනසේ අල්ලා ගන්නේ නොවේ. යමක් හේතු කොට ගෙන ශ්‍රොතෙන්ද්‍රිය (කන්) අසංවරව

වසන්නහුට ලොභ ද්වේෂ අකුශල ධර්මයෝ උපදිත්ද, ඒ ශ්‍රොතෙන්ද්‍රියෙහි සංවරය පිණිස පිළිපදියි. ශ්‍රොතඉන්ද්‍රිය රකී. ශ්‍රොතෙන්ද්‍රියෙහි සංවරයට පැමිණෙයි.

"නාසයෙන් ගඳක් ආඝ්‍රාණය කොට එය නිමිති වශයෙන් නොගනී. නැවත නැවත මතක් වනසේ සිතට නොගනී. යමක් හේතු කොට ගෙන ඝානෙන්ද්‍රිය (නාසය) අසංවරව වාසය කරන්නහුට ලොභ ද්වේෂ අකුසල ධර්මයෝ උපදිත්ද එහි සංවරය පිණිස පිළිපදියි. ඝානෙන්ද්‍රිය රකියි. ඝානෙන්ද්‍රියාගේ සංවරයට පැමිණෙයි. දිවෙන් රසක් විඳ එය අරමුණු වශයෙන් නොගනී. නැවත නැවත මතක්වනසේ නොගනී. යමක් හේතු කොට ගෙන, ජිව්හේන්ද්‍රිය සංවර නොකොට වාසයකරන්නාහට ලොභ ද්වේෂ අකුශල ධර්මයෝ උපදිත්ද එහි සංවරය පිළිපදියි. ජිව්හෙන්ද්‍රිය (දිව) ආරක්ෂා කරයි. ජිව්හේන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි.

"කයින් පහසක් ස්පර්ශකොට නිමිති වශයෙන් නොගනියි. නැවත නැවත මතක් වන සේ සිතට නොගනියි. යමක් හේතු කොට කායෙන්ද්‍රිය අසංවරව වාසය කරන්නහුට ලොභ ද්වේෂ අකුසල ධර්මයෝ උපදිත්ද, ඒ කායෙන්ද්‍රිය සංවරය පිණිස පිළිපදියි. කායෙන්ද්‍රිය ආරක්ෂා කරයි. කායෙන්ද්‍රියේ සංවරයට පැමිණෙයි. සිතින් ධර්මාරම්මණයක් දැන නිමිති වශයෙන් නොගනී. නැවත නැවතත් මතක් වන සේ සිතට නොගනී. යම් හෙයකින් සිත අසංවරව වාසය කරන්නහුට ලොභ ද්වේෂ අකුශල ධර්මයෝ උපදිත්ද, ඒ මනින්ද්‍රිය (සිත) සංවරය පිණිස පිළිපදියි. මනින්ද්‍රිය රකී. මනින්ද්‍රිය සංවරයට පැමිණෙයි. හෙතෙමේ මේ උතුම් ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූයේ තම සන්තානයෙහි කෙලෙසුන්ගෙන් තෙත් නොවූ සැපය විඳින්නේය.

**21.** "හෙතෙමේ ඉදිරියට යාමෙහිද ආපසු යාමෙහිද නුවණින් යුක්තවූයේ වෙයි. ඉදිරිපස බැලීමෙහිද හැරී බැලීමෙහිද නුවණින් යුක්තවූයේ වෙයි. අත් පා හැකිලීමෙහිද දිගුකිරීමෙහිද නුවණින් යුක්තවූයේ වෙයි. සඟළ සිවුර සහ පාත්‍රා සිවුරු දැරීමෙහි නුවණින් යුක්තවූයේ වෙයි.

"අනුභව කිරීමය, පානය කිරීමය, රස විඳීමය යන මෙහිද නුවණින් යුක්තවූයේ වෙයි. මල මුත්‍ර පහකිරීමෙහිද නුවණින් යුක්තවූයේ වෙයි. යෑම්, සිටීම්, හිඳීම්, සැතපීම්, නිදි තොර කිරීම්, කථාකිරීම්, නිශ්ශබ්ද වීම් යන මෙහිද නුවණින් යුක්තවූයේ වෙයි.

"උතුම්වූ මේ සීලසමූහයෙන් යුක්තවූද උතුම්වූ මේ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූද, මේ උතුම්වූ සතිසම්පජඤ්ඤයෙන් යුක්තවූද, ඒ භික්ෂු තෙමේ කැලයද, ගහක් මුලද, පර්වතද, කඳුරැලිද, ගල්ගුහාද, සොහොන්ද, ඉතා දුරවූ කැලෑද, හිස්තැන්ද, පිදුරු ගොඩවල්ද යන මේ විවේක සෙනාසන භජනය කෙරෙයි. ඔහු පසුබත් කාලයෙහි පිණ්ඩපාත ආහාරයෙන් වැළකුණේ, පර්යංක බැඳ, ශරීරය කෙළින් තබා සිත අරමුණෙහි පිහිටුවා හිඳගනියි.

"ඔහු ස්කන්ධ ලොකයෙහි ලොභය පහකොට ලොභ රහිත සිතින් යුක්තව වාසය කෙරේ. ලොභයෙන් සිත පිරිසිදු කෙරේ. සිත කෙලෙසන්නාවූ ක්‍රොධය පහකොට, ක්‍රොධයෙන් දුරුවූ සිත් ඇතිව වාසය කරයි. සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇතිව වාසය කරයි. ක්‍රොධයෙන් සිත පිරිසිදු කෙරේ. කාය චිත්ත දෙදෙනාගේ අලස බව දුරු කොට කය-සිත පිළිබඳ පහවූ අලස බව ඇත්තේ ආලොක සංඥා ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් ප්‍රඥා ඇත්තෙක්ව ථිනමිද්ධයෙන් සිත පිරිසිදු කෙරේ. නොසන්සුන්කම හා පසුතැවීම දුරුකොට, සංසිඳුනු සිත් ඇතිව වාසය කෙරේ. ඇතුළත සංසිඳුනු සිත් ඇත්තේ, උද්ධච්චකුක්කුච්චයෙන් සිත පිරිසිදු කෙරේ. සැකය දුරු කොට, පහකළ සැක ඇත්තේ කුශල ධර්ම විෂයෙහි එසේද මෙසේදැයි සැක නැතිව විචිකිච්ඡාවෙන් සිත පිරිසිදු කෙරේ.

**22.** "හෙතෙම සිත කිලුටු කරන්නාවූ, ප්‍රඥාව දුර්වල කරන්නාවූ මේ පංච නීවරණයන් දුරුකොට, කාමයන්ගෙන් වෙන්වම අකුශල ධර්මයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කරයිද, උදායීය, යමක් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස භික්ෂූහු මාගේ ශාසනයෙහි උතුම් හැසිරීමෙහි හැසිරෙත්ද

අතිශයින් උතුම්වූද, අතිශයින් ප්‍රණීතවූද මේ ධර්මයද වේ. උදායීය, නැවත අනිකක්ද කියමි. මහණ තෙම විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් ඇතුලත පැහැදීම ඇති, හිතේ එකඟ බව ඇති, විතර්ක රහිතවූ විචාර රහිතවූ සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ද්විතීය ධ්‍යානයට පැමිණ වාසය කරයිද, උදායීය, යමක් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස භික්ෂූහු මාගේ ශාසනයෙහි උතුම් හැසිරීමෙහි හැසිරෙත්ද අතිශයින් උතුම්වූද, අතිශයින් ප්‍රණීතවූද මේ ධර්මයද වේ.

"උදායීය, නැවත අනිකක්ද කියමි. මහණතෙම ප්‍රීතියෙහිද නොඇලීමෙන් උපෙක්ෂා ඇත්තේ වාසය කරයිද, සිහියෙන් යුක්ත වූයේ, නුවණින් යුක්තවූයේ ශරීරයෙන් සුවය විඳින්නේද, ආර්යයෝ යම් ඒ ධ්‍යානයක් උපෙක්ෂා ඇති සිහි ඇති සැප විහරණ ඇත්තේයයි කියද්ද, ඒ තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කරයිද, උදායීය, යමක් ප්‍රත්‍යක්ෂ කිරීම සඳහා භික්ෂූහු මාගේ ශාසනයෙහි උතුම් හැසිරීමෙහි හැසිරෙත්ද, අතිශයින් උතුම්වූද අතිශයින් ප්‍රණීතවූද මේ ධර්මයද වේ.

23. "උදායීය, නැවත අනිකක්ද කියමි. මහණ තෙම සැපය දුරු කිරීමෙන්ද, දුක දුරු කිරීමෙන්ද, (ධ්‍යානය ලැබීමට) පළමුවම සොම්නස් දොම්නස් දෙදෙනාගේ නැසීමෙන් දුක්ද නොවූ, සැපද නොවූ උපෙක්ෂා සිහියෙන් පිරිසිදු බව ඇති සතරවන ධ්‍යානයට පැමිණ වාසය කරයිද,

"හෙතෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම හිත් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පානොවන බවට පැමිණි කල්හි, පෙර ජාති සිහි කිරීමේ ඥානය පිණිස සිත නමයි. හේ තෙමේ නොයෙක් විදියේ පෙර විසීම් සිහි කෙරෙයි. කෙසේදයත්, 'එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති හතරක්ද, ජාති පසක්ද, ජාති දසයක්ද ජාති විස්සක්ද, ජාති තිසක්ද, ජාති සතළිසක්ද, ජාති පනසක්ද, ජාති සියයක්ද, දහස් ජාතියක්ද, සියක් දහස් ජාතියක්ද, නොයෙක් විනාශ වෙමින් පවතින කල්පයන්ද, නොයෙක්

හැදෙමින් පවතින කල්පයන්ද, නොයෙක් විනාශවන හෝ හැදෙන කල්පයන්ද, 'අසුවල් තැන වීමි. මෙනම් ඇත්තෙම්, මේ ගොත්‍ර ඇත්තෙම්, මේ පාට ඇත්තෙම්, මේ කෑම ඇත්තෙම්, මේ සැප දුක් වින්දෙම්, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුතවූයෙම්, අසුවල් තැන උපන්නෙම්, එහිදු මෙනම් ඇත්තෙම්, මේ ගොත්‍ර ඇත්තෙම්, මේ පාට ඇත්තෙම් මේ කෑම ඇත්තෙම්, මේ සැප දුක් වින්දෙම්, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුතවූයෙම්, මෙහි උපන්නෙමි'යි මෙසේ ආකාර සහිතව, දැක්වීම් සහිතව, නොයෙක් විදියේ පෙර ජීවිත සිහි කෙරෙයි. උදායීය, යමක් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස භික්ෂූහු මාගේ ශාසනයෙහි උතුම් හැසිරීමෙහි හැසිරෙත්ද අතිශයින් උතුම් වූද, අතිශයින් ප්‍රණීතවූද, මේ ධර්මයද වේ.

24. "ඔහු මේ මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, කෙලෙස් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, චුති උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිත නමයි. හේ පිරිසිදුවූ මිනිස් ඇස ඉක්මවූ, දිව ඇසින් චුතවන උපදින සත්ත්වයන් දකී. පහත්වූද උසස්වූද, ලක්ෂණවූද, අවලක්ෂණවූද, හොඳ ලොව උපදින්නාවූද, නරක ලොව උපදින්නාවූද, කර්මයට අනුව උපදින්නාවූ සත්ත්වයන් දකී. 'මේ පින්වත් සත්ත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්තවූහ. වාග් දුශ්චරිතයෙන් යුක්තවූහ. මනො දුශ්චරිතයෙන් යුක්තවූහ. ආර්යයන්ට ගරහන්නෝ වූහ, මිථ්‍යාදෘෂ්ටිකයෝ වූහ. මිථ්‍යාදෘෂ්ටි කර්ම සමාදන්වූවෝ වූහ. ඔව්හු මරණින් මතු සැපයෙන් පහවූ නපුරුවූ දුක්වූ නිරයට පැමිණෙත්. නැතහොත්, මේ පින්වත් සත්ත්වයෝ කාය සුචරිතයෙන් යුක්තවූහ. වාක් සුචරිතයෙන් යුක්ත වූහ, මනො සුචරිතයෙන් යුක්ත වූහ, ආර්යයන්ට නොගරහන්නෝ වූහ, සත්‍යය අදහන්නෝ වූහ, සත්‍ය ඇදහීම් සමාදන් වූහ. ඔව්හු මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයට පැමිණියෝ"යි මෙසේ පිරිසිදුවූ මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින් චුතවන උපදින සත්ත්වයන් දකී. මෙසේ

පිරිසිදුවූ මනුෂ්‍යත්වය ඉක්ම සිටියාවූ දිවැසින් චුතවන්නාවූද උපදින්නාවූද පහත්වූද උසස්වූද ලක්ෂණවූද අවලක්ෂණවූද හොඳ ලොවට ගියාවූද නරක ලොවට ගියාවූද කර්මය ලෙස පැමිණි සත්ත්වයන් දනී.

**25.** "ඔහු මේ මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, ක්ලෙශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පානොවන බවට පැමිණි කල්හි සිතේ පැසවන කෙලෙස් පහකිරීමේ ඥානය පිණිස සිත නමයි. ඔහු මේ දුකයයි තතු ලෙස දැනගණී, මේ දුක් ඉපදීමේ හෙතුවයයි තතු ලෙස දැනගණී, මේ දුක් නැතිකිරීමයයි තතු ලෙස දැන ගණී, මේ දුක් නැතිකිරීමේ මාර්ගයයි තතු ලෙස දැනගණී, මේ පැසවන කෙලෙස්යයි තතු ලෙස දැනගණී මේ පැසවන ක්ලේශයන්ගේ හේතුවයයි තතු ලෙස දැනගණී, මේ ඒ කෙලෙස් නැතිකිරීමයයි තතු ලෙස දැනගනී, මේ ඒ කෙළෙස් නැතිකිරීමේ මාර්ගයයයි තතුලෙස දැනගනී

"මෙසේ දන්නා දක්නා ඔහුගේ සිත කාම ආශ්‍රවය කෙරෙන්ද මිදේ, භව ආශ්‍රවය කෙරෙන්ද සිත මිදේ අවිද්‍යාශ්‍රවය කෙරෙන්ද සිත මිදේ, මිදුනු කල්හි මිදුනේය යන ඥානය පහළවෙයි. ඉපදීම නැති විය. උතුම් හැසිරීමෙහි වසනලදි, කටයුත්ත කරණ ලදී, මින් පසු මේ සඳහා කළ යුත්තක් නැතැ'යිද දැනගණී.

"උදායීය, යමක් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස භික්ෂූහු මාගේ ශාසනයෙහි උතුම් හැසිරීමෙහි හැසිරෙත්ද මේ වනාහි ඒ ඉතා උතුම්වූද, ඉතා ප්‍රණීතවූද ධර්මය වේ. උදායීය, යම් ධර්මයන් ප්‍රත්‍යක්ෂ කිරීම සඳහා භික්ෂූහු මාගේ ශාසනයෙහි උතුම් හැසිරීමෙහි හැසිරෙත්ද මේ වනාහි ඉතා උතුම්වූද, ඉතා ප්‍රණීතවූද ධර්මයෝ වෙතියි" වදාළේය.

**26.** මෙසේ වදාළ කල්හි සකුළුදායී පරිබ්‍රාජක තෙමෙ භාග්‍යවතුන් වහන්සේට මෙය කීයේය. "ස්වාමීනී, ඉතා යහපත. ස්වාමීනි, ඉතා යහපත. ස්වාමීනි, යම්සේ යටිකුරු කොට තබන ලද්දක් උඩුකුරු කරන්නේද, වසා තබන ලද්දක් හෝ විවෘත

කරන්නේද, මං මුලාවූවෙකුට හෝ මග කියන්නේද, අන්ධකාරයෙහි හෝ ඇස් ඇත්තෝ රූප දකිත්වායි තෙල් පහනක් දරන්නේද, එපරිද්දෙන්ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය දෙශනා කරණ ලදී. ස්වාමීනි, ඒ මම භාග්‍යවතුන් වහන්සේ සරණකොට යමි. ධර්මයද භික්ෂු සංඝයාද (සරණකොට යමි) ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි පැවිදිවීම ලබන්නෙමියි" මෙසේ කී කල්හි සකුළුදායී පරිබ්‍රාජකයාගේ පිරිස සකුළුදායී පරිව්‍රාජකයාට මෙසේ කීයේය.

27. "භවත් උදායීය, ශ්‍රමණ ගෞතමයන් කෙරෙහි බ්‍රහ්මචර්යාවෙහි නොහැසිරේවා. භවත් උදායී තෙමේ ආචාර්යයෙක්ව සිට අතවැසිව වාසය නොකෙරේවා. යම්සේ නම් මහ දිය සැලියක්ව දිය ඉසින කිතිස්සක් වන්නේද, භවත් උදායීහුගේ මේ කාරණය එසේ වන්නේය. උදායීය ශ්‍රමණ ගෞතමයන් කෙරෙහි බ්‍රහ්ම චර්යාවෙහි නොහැසිරේවා. භවත් උදායීය තෙමේ ගුරුවරයෙක්ව සිට අතවැසිව නොවෙසේවා" යනුයි.

මෙසේ වනාහි සකුළුදායී පරිබ්‍රාජකයාගේ පිරිස සකුළුදායී පරිබ්‍රාජකයාගේ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි බ්‍රහ්මචර්යාවෙහි හැසිරීමට අනතුරු කෙළේය.

**නවවෙනිවූ චූල සකුළුදායි සූත්‍රය නිමි. (3-9)**

---

## 30. වෙඛණ සූත්‍රය.

1. මා විසින් (මේ සූත්‍රය) මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවන නම්වූ අනේපිඬු මහ සිටුහුගේ ආරාමයෙහි වැඩ විසූහ.

එකල්හි වේඛණස නම් පරිබ්‍රාජකතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවූයේය. සතුටුවියයුතු සිහිකටයුතු කථාකොට නිමවා එකත් පසක සිටියේය. එකත්

පසක සිටියාවූ වේඛණස නම් පරිබ්‍රාජක තෙම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි 'මෙය උතුම් වර්ණය වේයයි', ප්‍රීති වාක්‍ය පැවැත්වූයේය.

2. ඒ උතුම් වර්ණය කවරේදැයි භාග්‍යවතුන් වහන්සේ ඇසූහ. "භවත් ගෞතමයන් වහන්ස, යම් වර්ණයකට වඩා ඉතා උතුම්වූද ඉතා ප්‍රණීතවූද අනික් වර්ණයක් නැත්තේද එය උතුම් වර්ණය වේයි." "කච්චානය, යම් වර්ණයකට වඩා උතුම්වූද උසස්වූද අනික් වර්ණයක් නැත්තේද ඒ වර්ණය කුමක්ද?" "භවත් ගෞතමයන් වහන්ස, යම් වර්ණයකට වඩා ඉතා උතුම්වූද ඉතා උසස්වූද අනික් වර්ණයක් නැත්තේද එය උතුම් වර්ණයවේයි", "කච්චාණය යම් වර්ණයකට වඩා උතුම්වූද උසස්වූද අනික් වර්ණයක් නැත්තේනම් එය උතුම් වර්ණයයි කියන්නෙහි නම් තොපගේ මේ කීම දිගින්දිගට පැතිරෙන්නේය. ඒ වර්ණයද නොදක්වන්නෙහිය. කච්චානය, යම්සේ පුරුෂයෙක් මම මේ 'ජනපදයෙහි යම් ජනපද කල්‍යාණියක් (රූපත් ස්ත්‍රිය) වේද, ඇය කැමැත්තෙමි ඇය පතමියි". මෙසේ කියන්නේද ඔහුට මෙසේ කියන්නාහුය. 'පින්වත් පුරුෂය, නුඹ යම් ජනපද කල්‍යාණියක්, කැමැත්තෙහිද පතන්නෙහිද, නුඹ ජනපද කල්‍යාණිය ක්ෂත්‍රිය ස්ත්‍රියක් හෝ බ්‍රාහ්මණ ස්ත්‍රියක් හෝ වෛශ්‍ය ස්ත්‍රියක් හෝ ශුද්‍ර ස්ත්‍රියක් හෝ වේයයි දන්නෙහිද, මෙසේ අසන ලද්දේ 'නැතැයි' කියන්නේය. ඔහුට 'එම්බල පුරුෂය, නුඹ යම් ජනපද කල්‍යාණියක් කැමැත්තෙහිද පතන්නෙහිද නුඹ ජනපද කල්‍යාණි තොමෝ මෙනම් ඇත්තීයයි හෝ මෙබඳු ගොත්‍ර ඇත්තීයයි හෝ දන්නෙහිදැයි, මෙසේ කියන්නාහුය. මෙසේ අසන ලද්දේ 'නැතැයි' කියන්නේය. දික්වූ තැනැත්තියක් හෝ මිටි තැනැත්තියක් හෝ මධ්‍යම තැනැත්තියක් හෝ වේයයි, කලුපාට තැනැත්තියක් හෝ එලලුපාට තැනැත්තියක් හෝ දුඹුරුපාට ඇත්තියක් හෝ වේයයි, දන්නෙහිද,යි මෙසේ අසන ලද්දේ නැතැයි කියන්නේය. 'අසවල් ගමෙහි හෝ නියම් ගමෙහි හෝ නගරයෙහි හෝ වූවායයි, දන්නෙහිදැයි, මෙසේ අසනලද්දෙ,' නැතැයි කියන්නේය'. ඔහුට 'එම්බල පුරුෂය, නුඹ යමක් නොදන්නෙහිද නොදක්නෙහිද, නුඹ එය කැමැත්තෙහිද,

පතන්නෙහිදැයි, මෙසේ කියන්නාහුය. මෙසේ අසන ලද්දේ ‘එසේයයි’ කියන්නේය. කච්චානය, ඒ කුමකැයි හඟින්නෙහිද මෙසේ ඇති කල්හි ඒ පුරුෂයාගේ කථාව හිස්වූවක් නොවන්නේද?” “භවත් ගෞතමයන් වහන්ස, ඒකාන්තයෙන් එසේ ඇති කල්හි ඒ පුරුෂයාගේ කථාව හිස්වූවක් වේයයි’ කීය. “කච්චානය, යම් වර්ණයකට වඩා ඉතා උතුම්වූද ප්‍රණීතවූද අනික් වර්ණයක් නැත්තේ නම් එය උතුම් වර්ණයයි කියන්නෙහි නම් ඒ වර්ණයද නොදක්වන්නෙහි නම් ඒ කථාවද එසේමය.

3. “භවත් ගෞතමයන් වහන්ස, යහපත්වූද, ජාතිමත්වූද අටැස් ඇත්තාවූ මනාව ඔපදමන ලද්දාවූ වෛඩූර්ය මාණික්‍යය පඬුවන් කම්බිලියෙහි බහන ලද්දේ බබලාද පැමිනියේද විශෙෂයෙන් බබලාද, මෙබඳු වර්ණ ඇත්තාවූ ආත්මය තෙම මරණින් මත්තෙහි උවදුරු රහිතව පවත්නේය.” “කච්චානය, ඒ කුමකැයි හඟින්නෙහිද, යහපත්වූ ජාතිමත්වූ අටැස් ඇත්තාවූ මනාව ඔපදමන ලද්දාවූ යම් වෛඩූර්ය මාණික්‍යයක් හෝ පඬුවන් කම්බිලියෙහි බහන ලද්දේ ආලොක පැතිරේද, දිලිසේද විශෙෂයෙන් බබලාද ඝනාන්ධකාරවූ රාත්‍රියෙහි යම් කණ මැදිරියෙක් හෝ වේද, මේ මේ වර්ණදෙකින් කවර වර්ණයක් අතිශයින් බබලන්නේත් අතිශයින් ප්‍රණීතවූයේ වේද”? “භවත් ගෞතමයන් වහන්ස, රාත්‍රිඝනාන්ධකාරයෙහි යම් මේ කණමැදිරියෙක් වේද? මෙම මේ වර්ණ දෙක අතුරෙන් අතිශයින් බබලන්නේත් අතිශයින් ප්‍රණීතවූයේත් වේයි.” “කච්චානය, ඒ කුමකැයි හඟින්නෙහිද? රාත්‍රි ඝනාන්ධකාරයෙහි යම් කණමැදිරියෙක් වේද, රාත්‍රි ඝනාන්ධකාරයෙහි යම් තෙල් පහනක් හෝ වේද, මේ වර්ණ දෙකින් කවර වර්ණයක් අතිශයින් බබලන්නේත් අතිශයින් ප්‍රණීතවූයේත් වේද”? “භවත් ගෞතමයන් වහන්ස, රාත්‍රිඝනාන්ධකාරයෙහි යම් මේ තෙල් පහනක් වේද, මෙය මේ වර්ණ දෙක අතුරෙන් අතිශයින් බබලන්නේත් අතිශයින් ප්‍රණීතදවූයේත් වෙයි.” “කච්චානය, ඒකුමකැයි හඟින්නෙහිද? රාත්‍රි ඝනාන්ධකාරයෙහි යම් තෙල් පහනක් හෝ වේද, රාත්‍රි ඝනාන්ධකාරයෙහි යම් මහ ගිනි කඳක් හෝ වේද, මේ වර්ණ දෙකින් කවර වර්ණයක් අතිශයින් බබලන්නේත්

හෝ අතිශයින් ප්‍රණීතවූයේත්වේද?" "භවත් ගෞතමයන් වහන්ස, රාත්‍රි ඝනාන්ධකාරයෙහි යම් මේ මහ ගිනි කඳක්වේද මෙය මේ වර්ණය දෙකින් අතිශයින් බබලන්නේත් අතිශයින් ප්‍රණීතද වූයේත් වේයි". "කච්චානය, ඒ කුමකැයි හඟින්නෙහිද? රාත්‍රි ඝනාන්ධකාරයෙහි මහ ගිනිකඳක් හෝ වේද, රාත්‍රි අළුයම් කාලයෙහි දුරුවූ වැස්ස ඇති, පහව ගිය වලාකුල් ඇති අහසෙහි යම් පහන් තරුවක් හෝ වේද, මේ වර්ණ දෙක අතුරෙන් කවර වර්ණයක් අතිශයින් බබලන්නේත් අතිශයින් ප්‍රණීතවූයේත්වේද?" භවත් ගෞතමයන් වහන්ස, රාත්‍රි අළුයම් කාලයෙහි දුරුවූ වැස්ස ඇති පහවූ වලාකුල් ඇති අහසෙහි යම් මේ පහන් තරුවක් වේද, මෙය මේ වර්ණ දෙකින් ඉතා බබලන්නේත් ඉතා ප්‍රණීතවූයේත් වෙයි" "කච්චායනය, ඒ කුමකැයි හඟින්නෙහිද? රාත්‍රි අළුයම් කාලයෙහි දුරුවූ වැස්ස ඇති, පහව ගියාවූ වලාකුල් ඇති අහසෙහි යම් පහන් තරුවක් හෝ වේද, එදවස්හි පොහොය ඇති පසළොස්වක්හි දුරුවූ වැස්ස ඇති පහව ගියාවූ වලාකුල් ඇති අහසෙහි මධ්‍යම රාත්‍රි කාලයෙහි යම් චන්ද්‍රයෙක් හෝ වේද, මේ වර්ණ දෙකින් කවර වර්ණයක් ඉතා බබලන්නේත් ඉතා ප්‍රණීතවූයේත් වේද?" භවත් ගෞතමයන් වහන්ස, එදවස්හි පොහොය ඇති පසළොස්වක්හි දුරුවූ වැස්ස ඇති, පහවූ වලාකුල් ඇති, අහසෙහි මධ්‍යම රාත්‍රිකාලයෙහි යම් චන්ද්‍රයෙක් වේද, මෙය මේ වර්ණ දෙකින් ඉතාම බබලන්නේත්, ඉතා ප්‍රණීත වූයේත් වෙයි". "කච්චායනය, ඒ කුමකැයි හඟින්නෙහිද? එදවස්හි පොහොය ඇති පසළොස්වක්හි, දුරුවූ වැස්ස ඇති, පහවූ වලාකුල් ඇති අහසෙහි මධ්‍යම රාත්‍රිකාලයෙහි යම් චන්ද්‍රයෙක් හෝ වේද, වර්ෂා මාසයන්හි අන්තිම මාසයවූ සරත් කාලයෙහි දුරුවූ වැස්ස ඇති පහව ගිය වලාකුල් ඇති අහසෙහි ඉරමුදුන් කාලයෙහි යම් සූර්යයෙක් හෝ වේද, මේ වර්ණ දෙකින් කවර වර්ණයක් ඉතා බබලන්නේත්, ඉතා ප්‍රණීත වූයේත් වේද?" "භවත් ගෞතමයන් වහන්ස, වර්ෂා මාසයවූ සරත් කාලයෙහි දුරුවූ වැස්ස ඇති පහවූ වලාකුල් ඇති අහසෙහි ඉරමුදුන් කාලයෙහි යම් මේ සූර්යයෙක් වේද, මෙය මේ වර්ණ දෙකින් ඉතා බබලන්නේත් ඉතා ප්‍රණීත වූයේත් වෙයි. කච්චායනය,

තවද මේ දෙවිකෙනෙක් මේ චන්ද්‍ර සූර්යයන්ගේ ආලොකයෙන් ආලොක නොවන්නාවූද ඒ දෙවියෝ බොහෝ වෙති. ඉතා බොහෝ වෙති. මම ඔවුන් දනිමි. එතකුදු වුවත් මම යම් වර්ණයකට වඩා ඉතා උතුම්වූද, ඉතා ප්‍රණීතවූද අන්‍යවූ වර්ණයක් නැත්තේයයි නොකියමි. කච්චායනය එතකුදු වුවත් නුඹ යම් මේ වර්ණයක් තෙම කණාමැදිරියෙකුටත් වඩා අතිශයින් හීනවූයේද, අතිශයින් පිළිකුල් වූයේද, ඒ වර්ණය තෙම උතුම් වර්ණය වේයයි කීයෙහිය. ඒ වර්ණයද නොදක්වන්නෙහිය.

4. "කච්චායනය, මේ කාම ගුණ පසක් වෙත්. කවර පසක්ද යත්? ඇසින් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ මනාපවූ ප්‍රිය ස්වභාව ඇත්තාවූ කම්සැප එලවන්නාවූ ඇලුම් කටයුතුවූ රූපයෝද, කණින් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මන වඩන්නාවූ, ප්‍රියස්වභාව ඇත්තාවූ, කම්සැප එලවන්නාවූ, ඇලුම් කටයුතුවූ ශබ්දයෝද, නාසයෙන් දතයුතුවූ ඉෂ්ටවූ කාන්තවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප එලවන්නාවූ, ඇලුම් කටයුතුවූ ගන්ධයෝද, දිවෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප එලවන්නාවූ, ඇලුම් කටයුතුවූ රසයෝද, කයෙන් දතයුතුවූ, ඉෂ්ටවූ, කාන්තවූ, මන වඩන්නාවූ, ප්‍රිය ස්වභාව ඇත්තාවූ, කම්සැප එලවන්නාවූ, ඇලුම් කටයුතුවූ, ස්පර්ශයෝද යන මොහුයි. කච්චායනය, මොහු වනාහි පඤ්චකාම ගුණයෝ වෙත්. කච්චායනය, මේ පස්කම් ගුණයන් නිසා යම් සැපක් සොම්නසක් උපදීද, මෙය කම්සැපයයි කියනු ලැබේ. මෙසේ කාම ගුණයන් කරණකොට කාම සැපය වේ. කාම සැපයට වඩා කාමයෙන් අග්‍රවූ සැපය (නිවණ) උතුම්යයි කියනු ලැබේ.

5. මෙසේ වදාළ කල්හි වේඛනස නම් පරිව්‍රාජක තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය. භවත් ගෞතමයන් වහන්ස, ආශ්චර්ය. භවත් ගෞතමයන් වහන්ස, පුදුමය. භවත් ගෞතමයන් වහන්සේ විසින් කාමගුණයන් කරණකොට කාම සැපය වේ. කාම සැපයට වඩා කාමයෙන් අග්‍ර සැපය (නිවණ) උතුම්යයි කියනු ලැබේය යන කීම යහපත් කොට කියන ලද්දකි.

කච්චායනය, අන්‍ය දෘෂ්ටි ඇත්තාවූ අන්‍ය ඇදහීම් ඇත්තාවූ, අනික් ධර්මයක් කැමති වන්නාවූ, අන් ධර්මයක යෙදෙන්නාවූ, අන් ගුරුවරුන් ඇත්තාවූ තොපට කාමයන් හෝ කාම සැපය හෝ කාමයෙන් අග්‍ර සැපය හෝ දැනගැනීම දුෂ්කර වේ. කච්චායනය, රහත්වූ ක්ෂය කළ ආශ්‍රව ඇත්තාවූ, වැස නිමවූ, බ්‍රහ්මචර්යාව ඇත්තාවූ සතර මගින් කළයුතු කටයුතු කොට නිමවූ, බහා තබනලද කෙලෙස් බර ඇති, පිළිවෙළින් පැමිණියාවූ අර්හත්වය ඇති, නැති කළාවූ භවයෙහි බැඳීම් ඇති, මනාකොට නුවණින් දැන කෙලෙසුන් කෙරෙන් මිදුනාවූ යම් මේ භික්ෂුහු වෙත්ද, ඔව්හු කාමයන්ද, කාම සැපයද, කාමයෙන් අග්‍ර සැපයද දන්නාහුයයි" (වදාළේය.)

**6.** මෙසේ වදාළ කල්හි වෙඛනස නම් පරිව්‍රාජක තෙම කිපියේ නොසතුටුවූයේ භාග්‍යවතුන් වහන්සේටම ක්‍රොධ කරමින් භාග්‍යවතුන් වහන්සේටම ගරහමින් භාග්‍යවතුන් වහන්සේට කියනු ලබන්නේ "ශ්‍රමණ ගෞතම තෙමේද නොදන්නෙක් වන්නේයයි" කියමින් භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය. "මෙසේම වනාහි මේ ලොකයෙහි සමහර මහණ බමුණෝ අතීතයද නොදන්නාහු, අනාගතයද නොදක්නාහු වෙත්. එසේද වුවත් ජාතිය ක්ෂය කරන ලද්දීය. බ්‍රහ්මචර්යාව වැස නිමවන ලද්දේය. සතර මගින් කටයුත්ත කරන ලද්දේය. මෙන් මතු කළ යුතු අනිකක් නැතැයි දනිමුයි ප්‍රකාශ කෙරෙත්. ඔවුන්ගේ මේ කීම සිනහවක් බවටම පැමිණෙයි. නාම මාත්‍රයක් බවටම පැමිණෙයි. හිස්වූවක් බවටම පැමිණෙයි." "කච්චායනය, යම් මේ මහණ බමුණෝ අතීතය නොදන්නාහු අනාගතය නොදක්නාහු, ජාතිය ක්ෂය කරණ ලද්දීය. බ්‍රහ්මචර්යාව වැස නිමවන ලද්දේය. සතර මගින් කළයුත්ත කරණ ලද්දේය. මින්පසු කළ යුතු අනිකක් නැතැයි දනිමුයි ප්‍රකාශ කෙරෙත්නම් ඒ ඒ මහණ බමුණන්ට මේ යහපත්වූ නිග්‍රහනයක්වේ. කච්චානය, තවද අතීතය තිබේවා, අනාගතය තිබේවා, කෛරාටික නොවූ මායා නැත්තාවූ ඍජු ස්වභාව ඇති නුවණැති පුරුෂයෙක් පැමිණේත්වා, මම අනුශාසනා කරමි. මම ධර්මය දෙශනා කරමි. අනුශාසනා කළ පරිද්දෙන් පිළිපදිනු ලබන්නේ නොබෝ

කලකින්ම මෙසේ වනාහි මනා කොට අවිද්‍යා (නොදැනීම්) බැම්මෙන් මිදුනේයයි තෙමේම දන්නේය. තෙමේම දක්නේය. කච්චානය, යම්සේ බාලවූ උඩුකුරුව සයනය කරන්නාවූ ළදරු දරුවෙක් අත් පා සහ බෙල්ල නූල් බැම්වලින් (ඔහුගේ ආරක්ෂාව පිණිස) බඳනා ලද්දේ, ඔහු වැඩිවියට පැමිණ ඉන්ද්‍රයයන් මේරූ කල්හි ඒ බැම්වලින් මිදෙන්නේද, හෙතෙම මිදුනේ වෙමියි බැඳීමක් නැතැයි දන්නේද, කච්චානය, එපරිද්දෙන්ම කෛරාටික නොවූ මායා නැත්තාවූ ඍජු ස්වභාව ඇති නුවණැති පුරුෂයෙක් පැමිණෙත්වා, මම අනුශාසනා කරමි. මම ධර්මය දෙශනා කරමි. යම්සේ අනුශාසනා කරණ ලද්දේද, එසේ පිළිපදින්නේ නොබෝ කලකින්ම මෙසේ වනාහි මනා කොට අවිද්‍යා බැම්මෙන් මිදුනේ වෙමියි' තෙමේම දන්නේය, තෙමේම දක්නේයයි, (වදාළේය.)

7. මෙසේ වදාළ කල්හි වෙඛනස නම් පරිව්‍රාජක තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය. "භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත. භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත ස්වාමීනි, යම්සේ යටිකුරු කොට තබන ලද්දක්, උඩුකුරු කරන්නේ හෝ වේද, වසා තබන ලද්දක් වැසුම් අරින්නේ හෝ වේද මංමුළාවූවෙකුට මග කියන්නේ හෝ වේද, අන්ධකාරයෙහි ඇස් ඇත්තෝ රූප දකිත්වායි තෙල් පහනක් දරන්නේ හෝ වේද, එපරිද්දෙන්ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්ම දෙශනා කරන ලද්දේය. ස්වාමීනි, ඒ මම භාග්‍යවතුන් වහන්සේද, ධර්මයද, භික්ෂු සංඝයාද සරණ කොට යමි. භවත් ගෞතමයන් වහන්සේ මා අද පටන් දිවිහිමි කොට සරණ ගියාවූ උපාසකයෙකැයි, දරණ සේක්වා.

**දහවෙනිවූ වෙඛනස සූත්‍රය නිමි. (3-10)**

---

(තෙවිජ්ජවච්ඡගොත්ත සූත්‍රය, අග්ගිවච්ඡගොත්ත සූත්‍රය, මහාවච්ඡගොත්ත සූත්‍රය, දීඝනක සූත්‍රය, මාගන්දිය සූත්‍රය, සන්දක සූත්‍රය, මහාසකුළුදායි සූත්‍රය, සමණමණ්ඩික සූත්‍රය, වෙඛණ සූත්‍රය යන සූත්‍ර දසයවූ)

**පරිබ්‍රාජක වර්ගයයි.**

---

## 31. ඝටීකාර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ මහත්වූ භික්ෂු සමූහයක් සමග කොසොල් ජනපදයෙහි චාරිකාවෙහි වඩිනාසේක. ඒ කාලයෙහි මාර්ගයෙන් ඉවත්ව එක් පෙදෙසෙක්හි වැඩසිටියාවූ භාග්‍යවතුන් වහන්සේ සිනහ පහල කෙළේය.

2. එකල්හි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට මෙබඳු සිතෙක් විය. 'භාග්‍යවතුන් වහන්සේගේ සිනහ පහළකිරීමට හේතුව කිමෙක්ද? ප්‍රත්‍යය (කරුණ) කිමෙක්ද? තථාගතවරයෝ කරුණක් නැතිව සිනහ පහල නොකෙරෙති'යි (කියාය.)

ඉක්බිති ආයුෂ්මත් ආනන්ද තෙමේ සිවුර ඒකාංශකොට පොරවා, භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද ඒ දෙසට ඇඳිලිබැඳ වැඳ, භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීය.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ සිනහ පහළ කිරීමට හේතුව කුමක්ද? කාරණය කුමක්ද? තථාගත වරයෝ නොකරුණෙහි සිනහ පහල නොකෙරෙති"යි කියාය.

3. "ආනන්දය, පෙර වූවක් කියමි. එනම් මේ ප්‍රදෙශයෙහි සමෘර්ධවූ සම්පත් ඇති, සැපතින් පිරී ගියාවූ බොහෝ ජන සමූහයා ඇති, මිනිසුන්ගෙන් ගැවසීගත් වෙහලිංග නම් නියම්ගමෙක් විය.

"ආනන්දය, භාග්‍යවත්වූ අර්හත්වූ කාශ්‍යප සම්‍යක් සම්බුදුන් වහන්සේ වෙහලිංග නම් නියම්ගම ඇසුරුකොට විසූහ. ආනන්දය, භාග්‍යවත් අර්හත් කාශ්‍යප සම්‍යක් සම්බුදුන් වහන්සේ මෙහි වැඩහිඳ, භික්ෂු සංඝයාට අවවාද කෙරේයයි" (වදාළහ.)

4. එකල්හි ආයුෂ්මත් ආනන්දතෙමේ දෙපට සිවුර සතරට නමා අසුනක් පණවා භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීහ. "ස්වාමීනි, එසේ නම් භාග්‍යවතුන් වහන්සේ හිඳිනාසේක්වා. එසේ කල්හි මේ බිම් කොටස අර්හත්වූ සම්‍යක් සම්බුදුවරු

දෙදෙනෙකුන් වහන්සේ විසින් පරිභොග කරණ ලද්දේ වන්නේයයි” කීහ.

භාග්‍යවතුන් වහන්සේ පැණවූ අස්නෙහි වැඩඋන්හ හිඳගත් භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්දයන්ට කථාකළහ. “ආනන්දය, පෙර දවස මේ ප්‍රදෙශයෙහි ධනයෙන් පිරුණු සැපතෙන් පිරීගිය බොහෝ ජනයන් ඇති, මිනිසුන්ගෙන් ගහණවූ වෙහලිංග නම් නියම්ගමක් වූයේය.

“ආනන්දය, වෙහලිංග නම් නියම්ගම ඇසුරුකොට භගවත් අර්හත් කාශ්‍යප සම්‍යක් සම්බුදුන් වහන්සේ වැඩවිසූහ. ආනන්දය, මෙහි වූකලී භගවත් අර්හත් කාශ්‍යප සම්‍යක් සම්බුදුන්ගේ ආරාමය වූයේය. ආනන්දය, මෙහි වැඩහුන්නාවූ භගවත්වූ අර්හත්වූ කාශ්‍යප සම්‍යක් සම්බුදුන් වහන්සේ භික්ෂු සංඝයාට අවවාද දෙයි.

5. “ආනන්දය, වෙහලිංග නම් ගමෙහි භාග්‍යවත්වූ අර්හත්වූ කාශ්‍යප සම්‍යක් සම්බුදුන්ගේ උපස්ථායකවූ ඝටීකාර නම් කුම්භකාරයෙක් වූයේය. (ඔහු) අග්‍රවූ උපස්ථායක කෙනෙකි.

“ආනන්දය, ඝටීකාර නම් කුම්භකාරයාගේ යහළුවූ ජොතිපාල නම් තරුණයෙක්ද වූයේය. හේ ප්‍රියවූ යහළුවෙකි. ඒ කාලයෙහි ආනන්දය, ඝටීකාර කුම්භකාර තෙමේ ජොතිපාල මානවකයාට කථා කෙළේය.

“යහළු ජොතිපාලය, භාග්‍යවත්වූ අර්හත්වූ කාශ්‍යප සම්‍යක් සම්බුදුන් දැකීම පිණිස යමු. මාගේ ඒ භාග්‍යවත්වූ අර්හත්වූ ඒ සම්‍යක් සම්බුදුන්ගේ දැකීම් යහපතැයි සම්මත වූයේමය. එබැවින් යමු’යි (කීහ.)

“ආනන්දය, මෙසේ කීකල්හි ජොතිපාල මානව තෙමේ ඝටීකාර කුම්භකාරයාහට මෙසේ කීය.

‘මිත්‍ර ඝටීකාරය, ඒ මුඩු ශ්‍රමණයා දැකීමෙන් කවර නම් ප්‍රයෝජනයෙක්ද, ඉන් කම් නැතැයි, කීහ.

“ආනන්දය, දෙවනුවද, ඝටීකාර කුම්භකාර තෙමේ ජොතිපාල මානවකයාට මේ කාරණය කීයේය. “යහලු

ජොතිපාලය, අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ කාශ්‍යප භාග්‍යතවතුන් වහන්සේ දැකීම පිණිස යමු. මාගේ අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේගේ දැකීම මැනවැයි සම්මත වූයේ එය (එබැවින්) යමු"යි (කීය.) ආනන්දය, දෙවනුවත් ජොතිපාල මානවක තෙම ඝටීකාර කුම්භකාරයාට මෙසේ කීය යහලු ඝටීකාරය, ඒ හිස මුඩු ශ්‍රමණයාගේ දැකීමෙන් කුමන ප්‍රයෝජනයක්ද? ඉන් වැඩක් නැතැයි (කීය.)

ආනන්දය, තුන්වෙනුවද ඝටීකාර කුම්භකාර තෙමේ ජොතිපාල මානවකයාට මේ කාරණය කීහ. 'යහලු ජොතිපාලය, භාග්‍යවත්වූ අර්හත්වූ කාශ්‍යප සම්‍යක් සම්බුදුන් දැකීම පිණිසයමු. මාගේ භාග්‍යවත්වූ අර්හත්වූ ඒ සම්‍යක් සම්බුදුන්ගේ දැකීම මැනවයි සම්මත වූයේමය (එබැවින්) යමුයි' කීය.

"තුන්වෙනුවත්, ආනන්දය, ජොතිපාල මාණවක තෙමේ ඝටීකාර කුම්භකාරයාහට මේ කාරණය කීය. 'යහළුව ඝටීකාරය. ඒ මුඩු ශ්‍රමණයා දැකීමෙන් කවර ප්‍රයොජනයක්ද, ඉන් වැඩෙක් නැතැයි' කීය.

**6.** "එසේ නම් යහළු ජොතිපාලය, නහන සුණු ගෙන දියනාන්ට ගඟට යමුයි' කීය. ආනන්දය, ජොතිපාල මානවක තෙමේ, 'යහලුව එසේය' කියා, ඝටීකාර කුම්භකාරයාහට උත්තර දුනි. ඉක්බිති ආනන්දය, ඝටීකාර කුම්භකාර තෙමේද, ජොතිපාල මානවකතෙමේද (කුරුවින්ද පාෂාණයෙන් කළ) නහන සුණු ගෙණ දිය නෑමට ගඟට ගියාහුය.

එහිදී ආනන්දය, ඝටීකාර කුම්භකාර තෙමේ ජොතිපාල මානවකයාට කථා කළේය.

"යහලුව ජොතිපාලය, භාග්‍යවත්වූ අර්හත්වූ කාශ්‍යප සම්‍යක් සම්බුදුන්ගේ ආරාමය මේ ළඟය. මිත්‍ර ජොතිපාලය, භාග්‍යවත්වූ අර්හත්වූ කාශ්‍යප සම්‍යක් සම්බුදුන් දැකීමට යමු. මාගේ භාග්‍යවත්වූ අර්හත්වූ ඒ සම්‍යක් සම්බුදුන්ගේ දැකීම යහපතයයි සම්මත වූයේමය. (එබැවින්) යමුයි,' කීය.

"ආනන්දය, මෙසේ කී කල්හි ජොතිපාල තරුණ තෙමේ ඝටීකාර කුම්භකාරයාහට මෙසේ කීය. 'යහලුව ඝටීකාරය, මුඩු

ශ්‍රමණයා දැකීමෙන් කුමන වැඩෙක්ද, එයින් වැඩක් නැතැයි, කීය. ඝටීකාර කුම්භකාරතෙම ජෝතිපාල මානවකයාට මෙසේ කීය. 'යහලු ජෝතිපාලය, අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේගේ ආරාමය මේ ළඟය. යහලුව ජොතිපාලය, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේ දකින්ට එහි යමු' මාගේ අර්හත් සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේගේ දැකීම යහපතැයි සම්මතය, එහෙයින් යමු. ආනන්දය, දෙවනුවද ජෝතිපාල මානවක තෙම ඝටීකාර කුම්භකාරයාට මෙසේ කීය. 'යහලු ඝටීකාරය, ඒ හිස මුඩු මහණාගේ දැකීමෙන් කුමණ ප්‍රයෝජනයක්ද, එයින් වැඩක් නැතැයි' කීය.

"ආනන්දය, දෙවනුවත් තුන්වනුවත් ඝටීකාර කුම්භකාර තෙමේ ජොතිපාල මානවකයාට මෙසේ කීය. 'යහලුව ජොතිපාලය, භාග්‍යවත්වූ අර්හත්වූ කාශ්‍යප සම්බුදුන්ගේ ආරාමය මේ නුදුරුැතන්හිය. යහලුව ජොතිපාලය, භාග්‍යවත් අර්හත් කාශ්‍යප සම්‍යක් සම්බුදුන් දකිනු පිණිස (එහි) යමු.'

'මාගේ භාග්‍යවත්වූ අර්හත්වූ ඒ සම්‍යක් සම්බුදුන්ගේ දැකීම මැනවයි සම්මතමය, එහෙයින් යමුයි කීය. තුන්වෙනුවද, ආනන්දය, තරුණ ජොතිපාල තෙමේ ඝටීකාර කුම්භකාරයාහට මේ කාරණය කීය.

"මිත්‍ර ඝටීකාරය, ඒ හිස මුඩු ශ්‍රමණයා දැකීමෙන් කුමණ ප්‍රයෝජනයෙක්ද? (එහෙයින්) වැඩක් නැත' (යනුයි)

7. "එකල්හි ආනන්දය, ඝටීකාර කුම්භකාර තෙමේ ජොතිපාල මාණවකයාගේ ඔඩොක්කුවෙන් අල්වා ගෙන මෙසේ කීය. 'යහළුව ජොතිපාලයිනි, භාග්‍යවත්වූ අර්හත්වූ කාශ්‍යප සම්‍යක් සම්බුදුන්ගේ ආරාමය මේ සමීපයෙහිය. යහළුව ජොතිපාලයිනි, භාග්‍යවත් අර්හත් කාශ්‍යප සම්‍යක් සම්බුදුන් දැකීමට (එහි) යමු. මාගේ භාග්‍යවත්වූ අර්හත්වූ ඒ සම්‍යක් සම්බුදුන්ගේ දැකීම යහපතය කියා සම්මතය, (එහෙයින්) යමුයි' කීය.

"එකල්හි ආනන්දය, ජොතිපාල තරුණ තෙමේ ඔඩොක්කුව අත්හැර ඝටීකාර කුම්භකාරයාහට මෙසේ කීය. 'මිත්‍රය ඝටීකාරය, ඒ මුඩු ශ්‍රමණයා දැකීමෙන් කුමන පලයෙක්ද? එයින් කම් නැතැයි' කීහ. එකල්හි ආනන්දය, ඝටීකාර කුම්භකාර තෙමේ නානලද හිසින් යුත් ජොතිපාල මානවකයාගේ කෙස් වැටියෙන් අල්වාගෙණ මෙසේ කීය.

"යහලුව ජොතිපාලයිනි, භාග්‍යවත්වූ අර්හත්වූ කාශ්‍යප සම්‍යක් සම්බුදුන්ගේ මේ ආරාමය ඉතා ආසන්නයෙහිය. යහලුව ජොතිපාලයිනි, භාග්‍යවත්වූ අර්හත්වූ කාශ්‍යප සම්‍යක් සම්බුදුන් දැකීම පිණිස (එහි) යමු.'

'භාග්‍යවත්වූ අර්හත්වූ මාගේ ඒ සම්‍යක් සම්බුදුන්ගේ දැකීම සාධු සම්මතය. (එහෙයින්) යමුයි' කීය.

8. "එකල්හි ආනන්දය, ජොතිපාල මානවකයාහට මේ අදහස වූයේය. 'පින්වත, ආශ්චර්යකි. පුදුමයකි. (එනම්) යම් කාරණයකින් මේ ඝටීකාර කුම්භකාර තෙමේ පහත් ජාති ඇත්තෙකුවද ස්නානය කළ හිසින් යුත් අපගේ කෙස් වැටිය ඇල්ලීමට තරම් සිතීද, ඒ කාන්තයෙන් මේ කාරණය සුළු දෙයක් නොවන්නේය', කියා සිතීය. එසේ සිතා ඝටීකාර කුම්භකාරයාගෙන් 'යහලුව ඝටීකාරය, ඒ කාරණය මෙතරම් උසස් දෙයක්දැයි, (ඇසීය.) 'යහලුව ජොතිපාලයිනි, ඒ කාරණය එතරම් උසස් දෙයකියි' උත්තර දුනි. ඒ මාගේ භාග්‍යවත්වූ අර්හත්වූ ඒ සම්‍යක් සම්බුදුන්ගේ දැකීම එසේම යහපත්යයි සම්මත කරන ලද්දේ වෙයි.

'යහලුව ඝටීකාරය, එසේනම් (කෙස් වැටිය) මුදව. යන්නෙමැයි' (කීය).

9. "එකල්හි ආනන්දය, ඝටීකාර කුම්භකාර තෙමේද ජෙතිපාල තරුණ තෙමේද භාග්‍යවත්වූ අර්හත්වූ කාශ්‍යප සම්‍යක් සම්බුදුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියාහුය. පැමිණ ඝටීකාර කුම්භකාර තෙමේ භාග්‍යවත්වූ අර්හත්වූ කාශ්‍යප බුදුරජාණන් වහන්සේට වැඳ එක් පැත්තක හිඳ ගත්තේය.

"ජොතිපාල තරුණ තෙමේ වනාහි භාග්‍යවත්වූ අර්හත්වූ කාශ්‍යප සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ සමග සතුටු වූයේය. සතුටුවීමට නිසිවූ සිහි කිරීමට සුදුසුවූ කතාව කොට නිමවා එක් පැත්තක හිඳගත්තේය.

"ආනන්දය, එක් පසෙක උන්නාවූ ඝටීකාර කුම්භකාර තෙමේ 'ස්වාමීනි, තරුණවූ මේ ජොතිපාල තෙමේ මාගේ යහළුවෙකි. ප්‍රිය යහළුවෙක. භාග්‍යවතුන් වහන්සේ මොහුට ධර්ම දෙශනා කරණ සේක්වායි.' අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ කාශ්‍යප භාග්‍යවතුන් වහන්සේට කීය.

**10.** ආනන්දය, එකල්හි භාග්‍යවත්වූ අර්හත්වූ කාශ්‍යප බුදුරජ තෙමේ ඝටීකාර කුම්භකාරයාටද ජොතිපාල මානවයාටද දහම් කතාවෙන් කරුණු දැක්වූයේය. කරුණු ගැන්වූයේය. කරුණෙහි සිත් තියුණු කරවූයේය. පැහැදවූයේය.

"ආනන්දය, එකල්හි භාග්‍යත්වූ අර්හත්වූ කාශ්‍යප සම්‍යක් සම්බුදුන් විසින් ධර්ම කථාවෙන් කරුණු දක්වන ලද්දාවූද කරුණු ගන්වන ලද්දාවූද, එහි සිත් තියුණු කරවන ලද්දාවූද පහදවන ලද්දාවූද ඝටීකාර කුම්භකාර තෙමේද ජොතිපාල මානව තෙමේද භාග්‍යවත්වූ අර්හත්වූ කාශ්‍යප සම්බුදුන්ගේ දෙශනාවට ඉතා සතුටුව අනුමෝදන්ව හුනස්නෙන් නැගිට, භාග්‍යවත්වූ අර්හත්වූ කාශ්‍යප සම්‍යක් සම්බුදුන්ට වැඳ, පැදකුණු කොට ගියාහුය.

**11.** "එකල්හි ආනන්දය, ජොතිපාල මානවක තෙමේ ඝටීකාර කුම්භකාරයාගෙන් යහලුව ඝටීකාරය, නුඹ ධර්මය ඇසීම පමණක් කරන්නෙහිද, එපමණක් නොව ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිත් වන්නෙහිදැයි' ඇසී 'යහලුව, ජොතිපාලය, මා අන්ධවූ මහළුවූ මව්පියන් පොෂණය කරන බව නොදන්නෙහිද? 'යහලු ඝටීකාරය, එසේනම් මම ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වන්නෙමි'යි කීය.

"එවිට ආනන්දය, ඝටීකාර නම් කුම්භකාර තෙමේද ජොතිපාල නම් මානවක තෙමේද, භාග්‍යවත් අර්හත් කාශ්‍යප සම්‍යක් සම්බුද්ධ තෙමේ යම් තැනෙක්හිද එතනට පැමිණියාහුය.

පැමිණ, භාග්‍යවත්වූ අර්හත්වූ කාශ්‍යප සම්‍යක් සම්බුදුන් වැඳ එක් පසෙක හිඳගත්හ. ආනන්දය, එක් පසෙක හුන්නාවූ ඝටීකාර කුම්භකාර තෙමේ භාග්‍යවත්වූ අර්හත්වූ කාශ්‍යප සම්‍යක් සම්බුදුන්ට 'ස්වාමීනි, මේ ජෝතිපාල මානවක තෙමේ මාගේ යහළුවෙකි. ප්‍රිය යහළුවෙක. භාග්‍යවතුන් වහන්සේ මොහු පැවිදි කරණ සේක්වායි කීය.'

"ආනන්දය, ජෝතිපාල මානවක තෙමේ භාග්‍යවත්වූ අර්හත්වූ කාශ්‍යප සම්‍යක් සම්බුදුන් සමීපයෙහි මහණකම් ලැබී උපසම්පදාව ලැබී.

ඉක්බිති ආනන්දය, භාග්‍යවත්වූ අර්හත්වූ කාශ්‍යප සම්‍යක් සම්බුදු රජතෙමේ ජෝතිපාල මානව උපසම්පදාවූ නොබෝ කලකින් උපසම්පදාවී අඩමසකින් වෙහලිංගයෙහි කැමතිතාක්කල් වාසයකොට බරණැස යම් තැනෙක්හිද එහි චාරිකාව සඳහා වැඩියේය. පිළිවෙළින් චාරිකාවෙහි වඩිනුයේ බරණැස යම් තැනෙක්හිද එහි පැමිණියේය.

12. "එහිදී ආනන්දය, භාග්‍යවත් අර්හත් කාශ්‍යප සම්‍යක් සම්බුද්ධ තෙම බරණැස සමීපයෙහි මිගදාය නම් ඉසිපතනාරාමයෙහි වැඩවසයි.

"ආනන්දය, කිකී නම් කසීරජ භාග්‍යවත්වූ අර්හත්වූ සම්‍යක් කාශ්‍යප බුදුරජ තෙමේ බරණැසට පැමිණ, බරණැස මිගදාය නම් ඉසිපතනයෙහි වාසය කෙරේයයි ඇසුවේය.

එකල්හි ආනන්දය, කිකී කසී රජතෙම යහපත්වූ යහපත්වූ යානාවන් යොදවා, යහපත් යානාවක නැග, යහපත් යහපත් යානාවන්ගෙන් යුක්තව මහත් රාජානුභාවයෙන් භාග්‍යවත්වූ අර්හත්වූ කාශ්‍යප සම්‍යක් සම්බුදුන් දැකීම පිණිස බරණැසෙන් පිටත්ව ගියේය.

"යානාවෙන් යාමට සුදුසුතැන් දක්වා යානාවෙන් ගොස් යානාවෙන් බැස, භාග්‍යවත් අර්හත් කාශ්‍යප සම්‍යක් සම්බුදු රජතෙමේ යම් තැනෙක්හිද එතැනට පයින්ම ගියේය. ගොස්,

භාග්‍යවත්වූ අර්හත්වූ, කාශ්‍යප සම්‍යක් සම්බුදුන් වැඳ, එක පසෙක උන්නේය.

13. "ආනන්දය, එක් පසෙක හුන් කිකී නම් කසීරජුට භාග්‍යවත්වූ අර්හත්වූ කාශ්‍යප සම්‍යක් සම්බුදු රජතෙමේ ධර්ම කථාවෙන් මනාකොට කරුණු දැක්වීය. මනාව කරුණු ගැන්වීය. කරුණෙහි සිත මනාව තියුණු කරවීය. මනාකොට සිත පැහැද වීය.

"එකල්හි ආනන්දය, භාග්‍යවත්වූ අර්හත්වූ කාශ්‍යප සම්‍යක් සම්බුදුන් විසින් දහම් කතාවෙන් කරුණු දක්වන ලද්දාවූ, සමාදන් කරවන ලද්දාවූ, තියුණු කරණ ලද්දාවූ, පහදවන ලද්දාවූ, කිකී කසී රජ තෙමේ භාග්‍යවත් අර්හත් කාශ්‍යප සම්‍යක් සම්බුදුන්ට, 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා සමග සෙට දවස පිණිස මාගේ බත ඉවසනසේක්වායි' කීය. ආනන්දය, භාග්‍යවත්වූ අර්හත්වූ කාශ්‍යප සම්‍යක් සම්බුදු රජතෙමේ නිශ්ශබ්ද භාවයෙන් ඉවසීය.

"එකල්හි ආනන්දය, කිකී කසී රජතෙමේ භාග්‍යවත්වූ අර්හත්වූ කාශ්‍යප සම්‍යක් සම්බුදුන්ගේ ඉවසීම දැන ආසනයෙන් නැගිට, භාග්‍යවත්වූ අර්හත්වූ කාශ්‍යප සම්‍යක් සම්බුදුන් වැඳ, පැදකුණුකොට ගියේය.

14. "ඉක්බිති ආනන්දය, කිකී කසී රජතෙම ඒ රාත්‍රිය ඇවෑමෙන් සිය නිවසෙහි මිටිබැඳ අහසෙහි එල්වා වියනලද කළුඇට ඉවත් කරනලද රත්ඇල් සහලින් බත් හා නොයෙක් ව්‍යඤ්ජනයෙන් යුත් ඛාද්‍ය භොජ්‍යයන් පිළියෙල කරවා, 'ස්වාමීනි, බත නිමියේය. (ඊට) කාලය (වෙයි)' කියා භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදුන්ට සැලකර වීය.

"ඉක්බිති ආනන්දය, භාග්‍යවත්වූ අර්හත්වූ කාශ්‍යප සම්‍යක් සම්බුදු රජ පෙරවරුයෙහි හැඳ පොරවා පා සිවුරු ගෙණ කිකී කසී රජුගේ මාලිගය යම්තැනකද එතැනට වැඩියේය. (එසේ) වැඩ භික්ෂු සංඝයා සමග පැනවූ අස්නෙහි වැඩහුන්සේක.

"ඉක්බිති ආනන්දය, කිකී නම් කසී රජතෙමේ බුදුන් ප්‍රධාන භික්ෂු සංඝයා ප්‍රණීතවූ ආහාරපානවලින් සියතින් වැළඳ වීය. කැමතිතාක් වැළඳවීය.

"ඉක්බිති ආනන්දය, කිකී කසී රජතෙමේ, වළඳා අවසන්ව පාත්‍රය අතින් ඉවත තැබූ භාග්‍යවත් අර්හත් කාශ්‍යප සම්‍යක් සම්බුදුන් වෙත එක් මිටි අස්නක් ගෙණ හිඳගත්තේය.

15. "ආනන්දය, එක් පසෙක උන් කිකී නම් කසී රජ භාග්‍යවත්වූ අර්හත්වූ කාශ්‍යප සම්‍යක් සම්බුදුන්ට මේ කාරණය සැලකළේය.

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මාගේ බරණැස් නුවර වස්විසීම ඉවසනසේක්වා. මෙබඳුවූ උපස්ථානයක් සංඝයාට එන්නේයයි' කීය.

'කම් නැත. මහරජ, මා විසින් වස්විසීමක් ඉවසන ලද්දේය.'

දෙවනුවත් ආනන්දය, 'කිකී' නම් කසී රජතෙමේ භගවත්වූ අර්හත්වූ, කාශ්‍යප සම්මා සම්බුදුන්ට මේ කාරණය කීයේය. 'ස්වාමීනි, භාග්‍යවත් තෙමේ මාගේ බරණැසෙහි වස්විසීම ඉවසනසේක්වා, සංඝයාට මෙබඳුවූ උපස්ථානයක් වන්නේයයි' (කියායි)

තුන්වෙනුවත් ආනන්දය 'කිකී' කසී රජතෙමේ භාග්‍යවත්වූ අර්හත්වූ කාශ්‍යප සම්‍යක් සම්බුදුන්ට මේ කාරණය කීය.

'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මාගේ බරණැස් නුවර වස්විසීම ඉවසන සේක්වා. සංඝයාට මෙබඳුවූ උපස්ථානයක් වන්නේයයි' කියායි.

"කම් නැත, මහරජ, මා විසින් වස් විසීම ඉවසන ලද්දේයයි' වදාළේය.

16. "ඉක්බිති ආනන්දය, භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ බරණැස් නුවර වස් විසීම නොඉවසන්නාහයි කිකී නම් කසී රජහට නොසතුට පහළ වූයේය. දොම්නස පහළ වූයේමය.

ඉක්බිති ආනන්දය, කිකී කසී රජතෙම කාශ්‍යප භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදුන්ට මෙසේ කීය.

'ස්වාමීනි, නුඹවහන්සේට මට වඩා උපස්ථානකරන්නාවූ අන් කිසිවෙක් ඇත්තේදැයි' විචාළේය.

'මහරජ, වෙහලිංගනම් නියම් ගමෙක් ඇත. එහි ඝටීකාර නම් කුම්භකාරයෙක් වාසය කෙරෙයි. හෙතෙම මාගේ උපස්ථායක කෙනෙක. අග්‍ර උපස්ථායක කෙනෙක. මහරජ, තොපට වනාහි භාග්‍යවත් අර්හත් කාශ්‍යප සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ මාගේ වස්විසීම නොඉවසූහයි නොසතුට පහළ විය. දොම්නස පහළ විය. එය ඝටීකාර කුම්භකාරයාට නැත. ඇතිද නොවන්නේය.

'මහරජ, ඝටීකාර කුම්භකාර තෙමේ වනාහි බුදුන් සරණ ගියේය. දහම් සරණ ගියේය. සංඝයා සරණ ගියේය.

'මහරජ, ඝටීකාර කුම්භකාරතෙම වනාහි ප්‍රාණඝාතයෙන් වැළකුණේය. සොරකමින් වැළකුණේය. කාමයෙහිවරදවා හැසිරීමෙන් වැළකුණේය. මුසාවාදයෙන් වැළකුණේය. සුරාපානයෙන් වැළකුණේය.

"මහරජ, ඝටීකාර කුම්භකාරතෙම වනාහි බුදුන් කෙරෙහි නොසෙල්වෙන පැහැදීමෙන් යුක්ත වූයේ වෙයි. ධර්මයෙහි නොසෙල්වෙන පැහැදීමෙන් යුක්ත වූයේ වෙයි. සංඝයා කෙරෙහි නොසෙල්වෙන පැහැදීමෙන් යුක්ත වූයේ වෙයි. ආර්යයන් විසින් කැමතිවන ලද සීලයන්ගෙන් යුක්ත වූයේ වෙයි.

'මහරජ, ඝටීකාර කුම්භකාරතෙමේ වනාහි දුක්ඛ සත්‍යයෙහි සැක නැත්තේ වෙයි. දුක්ඛසමුදය සත්‍යයෙහි සැක නැත්තේ වෙයි. දුක්ඛ නිරොධසත්‍යයෙහි සැක නැත්තේ වෙයි. දුක්ඛ නිරොධ ගාමිණී ප්‍රතිපදා සත්‍යයෙහි සැක නැත්තේ වෙයි.

'මහරජ, ඝටීකාර කුම්භකාරතෙම වනාහි එක් වේලෙහි වළඳනා බ්‍රහ්මචර්යාවෙන් යුක්තවූ සිල්වත්වූ යහපත් ධර්මයෙන් යුක්ත වූවෙක් වෙයි.

'මහරජ, ඝටීකාර කුම්භකාරතෙමේ වනාහි රන් රුවන් ඉවත් කළ මසු කහවනු පිළිගැන්මෙන් වැළකුණේ වෙයි. මහරජ, ඝටීකාර කුම්භකාරතෙමේ වනාහි බහා තැබූ අවි ආයුධ ඇත්තේ සියතින් පොළොව නොම හාරයි. ගං ඉවුරු බිඳීගිය තන්හි වූ යම් පසක් වේද- මීයන් සුනඛයන් විසින් ඇද දමන ලද යම් පසක් වේද ඒ පස කැමති සේ ගෙණවුත් වලන් සාදා මෙසේ කියන්නේය. මෙහි යමෙක් කැමැත්තේ නම් සහල් හෝ මුං හෝ කඩල හෝ ගෙණවුත් තබා යමක් කැමති වේද එය ගෙණ යවයි (කියාය)

'මහරජ, ඝටීකාර කුම්භකාර තෙමේ වනාහි ඇස් අන්ධ වූ මහලු මව් පියන් පොෂණය කරන්නෙක. මහරජ, ඝටීකාර කුම්භකාර තෙමේ වනාහි කාම ලොකය භජනය කරන්නාවූ ඔරංභාගියසංයොජන (බැඳුම්) පස නැතිකොට (බඹලොව) ඔපපාතිකව උපදින ඒ බඹලොවෙන් නැවත ඉපදීම් වශයෙන් මෙහි නොඑන ඒ බ්‍රහ්ම ලොකයෙහිදීම පිරිණිවෙන ස්වභාව ඇත්තෙකැයි' (වදාළහ.)

17. "මහරජ, එක් කලෙක මම වෙහලිංග නම් නියම් ගම්හි වාසය කරමි. මහරජ එකල්හි මම පෙරවරු කාලයෙහි හැඳ පොරවා පාත්‍රසිවුරු ගෙණ ඝටීකාර කුම්භකාරයාගේ මව් පියන් යම්තෙනකද එහි පැමිණියෙමි. පැමිණ ඝටීකාර කුම්භකාරගේ මව්පිය දෙදෙනාගෙන් මේ මේ පින්වත් තැනැත්තේ කොහි ගියේදැයි ඇසීමි. ස්වාමීන් වහන්ස, ඔබගේ උපස්ථායක තෙම බැහැර ගියේය. මේ සැළියෙන් බත් ගෙණ මේ ව්‍යංජන භාජනයෙන් ව්‍යංජන ගෙණ වැළඳුව මැනවයි (කීහු.)

'ඉක්බිති මහරජ, මම සැළියෙන් බත් ගෙණ ව්‍යංජන භාජනයෙන් ව්‍යංජන ගෙණ වළඳා ආසනයෙන් නැගිට ගියෙමි. මහරජ, අනතුරුව ඝටීකාර කුම්භකාර තෙම මව්පියන් යම් තෙනකද එහි පැමිණ මව්පියන්ගෙන් කවරෙක් සැළියෙන් බත් ගෙණ ව්‍යංජන භාජනයෙන් ව්‍යංජන ගෙණ අනුභවකොට ආසනයෙන් නැගිට බැහැර ගියේදැ'යි ඇසීය.

'පුත්‍රය, භාග්‍යවත් අර්හත් කාශ්‍යප සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ සැළියෙන් බත් ගෙණ ව්‍යංජන ගෙණ වළඳා

ආසනයෙන් නැගිට බැහැර වැඩියේය'යි (කීහු.) 'එහිදී මහරජ, ඝටීකාර කුම්භකාරයාහට 'ඒකාන්තයෙන් මට ලාභයෙක. ඒකාන්තයෙන් මා විසින් යහපත්වූ ලාභයක් ලබන ලදී. භාග්‍යවත්වූ අර්හත්වූ කාශ්‍යප සම්‍යක් සම්බුදු රජානන් වහන්සේ මට මෙසේ විශ්වාස වූවෝය' යන සිත් පහළ විය. 'මහරජ, ඝටීකාර කුම්භකාරයාට අඩ මසක්ද මව්පියන්ට සත් දවසක්ද මෙයින් උපන් ප්‍රීති සැපය නොනැසී පැවතුණේය.

'මහරජ, එක් කලෙක මම ඒ වෙහලිංග නම් ගමෙහිම වෙසෙමි. ඉක්බිති මම පෙරවරු වේලෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙණ ඝටීකාර කුම්භකාරයාගේ මවුපියන් යම් තෙනකද එහි පැමිණියෙමි. පැමිණ ඝටීකාර කුම්භකාරයාගේ මව්පියන් ගෙන් පින්වතුනි, මේ පින්වත් තෙමේ කොහි ගියේදැ'යි ඇසීමි. 'පින්වතුන් වහන්ස, ඔබගේ උපස්ථායක තෙම බැහැර ගියේය. මේ සැළියෙන් කොමු පිඬු ගෙණ ව්‍යංජන භාජනයෙන් (ව්‍යංජන ගෙණ වළඳනු මැනවයි' (කීහු) 'මහරජ, එහිදී මම සැළියෙන් කොමු පිඬු ගෙණ ව්‍යංජන භාජනයෙන් ව්‍යංජන ගෙණ වළඳා ආසනයෙන් නැගිට ගියෙමි.

'ඉක්බිති මහරජ, ඝටීකාර කුම්භකාරතෙම මව්පියන් යම් තෙනකද එහි පැමිණියේය. පැමිණ මව්පියන් ගෙන් සැළියෙන් කොමු පිඬු ගෙණ ව්‍යංජන භාජනයෙන් ව්‍යංජන ගෙණ අනුභව කොට ගියේ කවරෙක්දැයි ඇසීය. 'දරුව, භාග්‍යවත් අර්හත් කාශ්‍යප සම්‍යක් සම්බුදුන් වහන්සේ සැළියෙන් කොමු පිඬු ගෙණ ව්‍යංජන භාජනයෙන් ව්‍යංජන ගෙණ වළඳා ආසනයෙන් නැගිට වැඩියෝයයි' (කීහු)

18. "ඉක්බිති මහරජ, ඝටීකාර කුම්භකාරයාහට, 'මට ඒකාන්තයෙන් ලාභයෙක. මා විසින් ඒකාන්තයෙන් යහපත් ලාභයක් ලබන ලදී. මට භාග්‍යවත් අර්හත් කාශ්‍යප සම්‍යක් සම්බුදුන් වහන්සේ විශ්වාස වූයේයයි, සිත් විය. මහරජ, ඝටීකාර කුම්භකාරයාට අඩ මසක්ද මව්පියන්ට සත් දවසක්ද එයින් උපන් ප්‍රීති සැපය, නොනැසී පැවතුණේය.

'මහරජ, මම එක් කලෙක්හි ඒ වෙහලිංග නම් නියම් ගමෙහි වෙසෙමි. ඒ කාලයෙහි වනාහි ගන්ධ කුටිය වැස්සෙන් තෙමෙයි. එහිදී මහරජ. මම භික්ෂූන්ට කථාකොට 'මහණෙනි, යව් ඝටිකාර කුම්භකාරයාගේ ගෙහි තණ දනිව්ය'යි කීයෙමි.

'මහරජ, මෙසේ කී කල්හි භික්ෂූහු මට 'ස්වාමීන් වහන්ස, ඝටීකාර කුම්භකාරයාගේ ගෙහි තණනැත්තේය. එනමුදු ඔහුගේ ගෘහය අලුත සොයන ලද පිදුරු ඇත්තේය. 'මහණෙනි, යව්. ඝටීකාර කුම්භකාරයාගේ ගෘහය සෙවිලි කළ පිදුරු ගෙණ එව'යි කීයෙමි.'

19. "ඉක්බිති මහරජ, ඒ භික්ෂූහු ඝටීකාර කුම්භකාරයාගේ ගෘහයෙහි සෙවිලි කරන ලද තණ ගෙණ ආවාහුය. එකල්හි මහරජ, ඝටීකාර කුම්භකාරයාගේ මව්පියෝ භික්ෂූන්ගෙන් 'කවරහු ගෘහයෙහි සෙවිලි කළ පිදුරු ගෙණ යෙත්දැ'යි ඇසූහ.

භික්ෂූහු, 'සොහොයුරිය, භාග්‍යවත් අර්හත් කාශ්‍යප සම්‍යක් සම්බුදු රජුන්ගේ ගඳකිළිය තෙමේය'යි කීහු. 'ස්වාමීනි දරුවෙනි, ගෙණයනු මැනව. සත්පුරුෂවරුනි, ගෙණයනු මැනව'යි කීහු.

ඉක්බිති මහරජ, ඝටීකාර, කුම්භකාරතෙමේ මව්පියන් යම් තෙනෙක්හි නම් එහි එළඹියේය. එළඹ මව්පියන්ගෙන් ගෙන සෙවිලි කළ පිදුරු ගෙන ගියෝ කවුරුදැ'යි ඇසීය.

'දරුව, භාග්‍යවත් අර්හත් කාශ්‍යප සම්‍යක් සම්බුදුන්ගේ ගඳකිළිය තෙමෙන්නේය කියා භික්ෂූහු ගෙණ ගියෝය'යි කීහු.

'එකල්හි මහරජ, ඝටීකාර කුම්භකාරයා හට ඒකාන්තයෙන් මට ලාභයෙක. ඒකාන්තයෙන් මා විසින් යහපත් ලාභයක් ලබන ලදී. මට භාග්‍යවත් අර්හත් කාශ්‍යප සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ මෙසේ විශ්වාස වූවෝය'යි සිත්විය. 'අනතුරුව මහරජ, ඝටීකාර කුම්භකාරයාහට අඩ මසක්ද මව්පියන්ට සත් දවසක්ද එයින් උපන් ප්‍රීති සැපය නොනැසී පැවැත්තේය.

20. "ඉක්බිති මහරජ, ඒ භාගය තෙමසක් මුලුල්ලෙහිම අහසම පියස්ස කොට සිටියේය. වැස්සෙන්ද නොතෙමියේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

මහරජ, ඝටීකාර කුම්භකාර තෙමේ මෙබඳු වූ ගුණ ඇත්තෙක් වේයයි වදාළහ.

'ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මෙසේ විශ්වාස වීමෙන් ඝටීකාර කුම්භකාරයාහට ලාභයෙක. ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඝටීකාර කුම්භකාරයා විසින් යහපත් ලාභයක් ලබන ලදී.

21. "ඉක්බිති ආනන්දය, කිකී නම් කසී රජ තෙමේ ඝටීකාර නම් කුම්භකාරයාහට මිටිකොට බැඳ වියනලද රත්හැල් සහල් ගැල් පන්සියයක්ද, ඊට සුදුසු ව්‍යංජන පිණිස ගත යුතු දේද පිටත්කොට යැවීය. ඉක්බිති ආනන්දය, ඒ රාජ පුරුෂයෝ ඝටීකාර නම් කුම්භකාරයා වෙත පැමිණ මෙසේ කීවාහුය.

'පින්වත, මිටිකොට බැඳ වියලන ලද රත්හැල් සහල් ගැල් පන්සියයක්ද ඊට සුදුසු ව්‍යංජන පිණිස ගතයුතුදේද කිකී නම් කසී රජ විසින් එවන ලද්දාහ.

"පින්වතුන් වහන්ස, ඒ භාණ්ඩයන් පිළිගත මැනව. රජ තෙමේ වනාහි බොහෝ වැඩ ඇත්තේ කටයුතු බහුල වූයේ වේය'යි කීහු. ඝටීකාර කුම්භකාර තෙමේ මට (එයින්) ප්‍රයෝජනයෙක් නැත. රජහටම වේවා'යි කීය.

22. "ආනන්දය, නුඹට මෙබඳු අදහසෙක් ඇතිවිය හැක. ඒ කාලයෙහි තරුණ ජෝතිපාල වූයේ ඒකාන්තයෙන් අනිකෙක කියාය.

"ආනන්දය, මේ කාරණය වනාහී එසේ නොදත යුතුය. ඒ කාලයෙහි තරුණ ජෝතිපාල වූයෙම් මම්මයයි' වදාළහ.

භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය වදාළසේක. සතුටු සිත් ඇති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටු වූහ.

**පළමුවෙනිවූ ඝටීකාර සූත්‍රය නිමි. (4-1)**

---

# 32. රට්ඨපාල සූත්‍රය.

1. මා විසින් (මේ සූත්‍රය) මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ කුරු ජනපදයන්හි මහත් වූ භික්ෂු සංඝයා සමග සැරිසරන්නේ ථුල්ලකොට්ඨිත නම්වූ කුරු දනව් වැස්සන්ගේ නිම් ගම යම් තැනෙක්හිද එහි වැඩියහ. ථුල්ලකොට්ඨිත නම් නියම් ගම වැසි බ්‍රාහ්මණ ගෘහපතීහු, ශාක්‍යපුත්‍රවූ ශාක්‍ය කුලයෙන් නික්ම පැවිදිවූ ශ්‍රමණභවත් ගෞතමයන් වහන්සේ මහත්වූ භික්ෂු සංඝයා සමග කුරු ජනපදයන්හි සැරිසරන්නේ, ථුල්ලකොට්ඨිත නම් නියම්ගමට පිළිවෙළින් පැමිණියේ වෙයි. ඒ භවත් ගෞතමයන් වහන්සේගේ වනාහි මෙබඳුවූ යහපත් ගුණ ඝොෂාවෙක් උස්ව නැංගේ වෙයි. ඒ භාග්‍යවත් තෙම මේ කාරණයෙනුත් අර්හත්ය. පුරුෂයන් දමනය කිරීමෙහි නිරුත්තරවූ සාර්ත්ථ වාහකයකු බඳුය. දෙව් මිනිසුන්ට අනුශාසනා කරන්නෙක. චතුස්සත්‍යය අවබොධ කළ හෙයින් බුද්ධය. සියලු කෙලෙසුන් නැසූ හෙයින් භාග්‍යවත්ය. (යනුවෙනි.) හෙතෙම දෙවියන් සහිතවූ මාරයන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ මේ ලොකයද මහණ බමුණන් සහිතවූ දෙව් මිනිසුන් සහිතවූ සත්ව සමූහයාද තෙමේ විශෙෂ නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට ප්‍රකාශ කෙරෙයි. හෙතෙම මුල යහපත්වූ මැද යහපත්වූ කෙළවර යහපත්වූ අර්ථ සහිතවූ ව්‍යංජන සහිතවූ සියල්ලෙන් සම්පූර්ණවූ ධර්මයක් දෙශනා කරයි. පිරිසිදුවූ බ්‍රහ්මචර්යාව ප්‍රකාශ කරයි. එබඳුවූ රහතුන් වහන්සේලාගේ දැක්ම වනාහි යහපත් වේයයි ඇසුවාහුමය.

2. ඉක්බිති ථුල්ලකොට්ඨිත නම් නියම් ගම වැසි බ්‍රාහ්මණයන් හා ගෘහපතීහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියාහුය. පැමිණ සමහරු භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පසෙක හිඳ ගත්හ. සමහරු භාග්‍යවතුන් වහන්සේ සමඟ සතුටු වූහ. සතුටු වියයුතුවූ සිහිකටයුතුවූ කථාව කොට නිමවා එක් පසෙක හිඳගත්හ. සමහරු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට ඇඳිලිබැඳ එක් පසෙක හිඳගත්හ. සමහරු භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි තමන්ගේ නාම

ගොත්‍ර දක්වා එක් පසෙක හිඳගත්හ. සමහරු නිශ්ශබ්දව එක්පසෙක හිඳගත්හ. එක්පසෙක හුන්නාවූ ථුල්ලකොට්ඨිත නම් නියම්ගම වැසි බමුණන් හා ගෘහපතීන් භාග්‍යවතුන් වහන්සේ දැහැමිවූ කථාවෙන් කරුණු දැක්වූයේය. සමාදන් කරවූයේය. සිත් තියුණු කරවූයේය. සතුටු කරවූයේය. එකල්හි වනාහි ඒ ථුල්ලකොට්ඨිත නම් නියම් ගමෙහිම ප්‍රධාන කුලවතාගේ පුත්වූ රට්ඨපාල නම් කුලපුත්‍ර තෙම ඒ පිරිසෙහි උන්නේ වෙයි. ඉක්බිති රට්ඨපාල නම් කුලපුත්‍රයාහට මෙබඳු අදහසක් විය. යම් යම් ආකාරයකින් වනාහි භාග්‍යවතුන් වහන්සේ ධර්මය දෙශනා කරයිද, ඒ ආකාරයෙන් ගිහිගෙයි වසන්නහු විසින් ඒකාන්තයෙන් සම්පූර්ණකොට ඒකාන්තයෙන් පිරිසිදුකොට ලියනලද සකක් මෙන් කොට මේ බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙන්ට පහසු නොවෙයි. මම හිස රැවුල් කපා කසාවත් හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වන්නෙම් නම් යෙහෙක කියායි.

3. ඉක්බිති ගෘහපතීහු භාග්‍යවතුන් වහන්සේ විසින් දැහැමිවූ කථාවෙන් කරුණු දක්වන ලද්දාවූ සමාදන් කරවන ලද්දාවූ සිත් තියුණු කරවන ලද්දාවූ සතුටු කරවන ලද්දාවූ ථුල්ලකොට්ඨිත නම් නියම්ගම් වැසි බ්‍රාහ්මණ ගෘහපතීහු භාග්‍යවතුන් වහන්සේගේ වචනය සතුටින් පිළිගෙණ අනුමෝදන්ව හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ පැදකුණුකොට ගියාහුය. ඉක්බිති රට්ඨපාල නම් කුලපුත්‍රතෙම ථුල්ලකොට්ඨිතක නම්වූ බ්‍රාහ්මණ ගෘහපතීන් ගිය නොබෝවේලාවකින් භාග්‍යවතුන්වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසෙක උන්නේය. එක්පසක උන්නාවූ රට්ඨපාල නම් කුලපුත්‍ර තෙම භාග්‍යවතුන් වහන්සේට ස්වාමීනි, යම් යම් ආකාරයෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරණ ලද ධර්මය මම දනිම්ද, ඒ ආකාරයෙන් ගිහිගෙයි වසන්නහු විසින් ඒකාන්තයෙන් සම්පූර්ණකොට ඒකාන්තයෙන් පිරිසිදුකොට ලියන ලද සකක් මෙන් කොට, මේ බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙන්ට පහසු නොවෙයි. ස්වාමීනි මම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි පැවිදි බව ලබන්නෙමි. උපසම්පදාව ලබන්නෙමියි” කීයේය.

**4.** "රට්ඨපාලය, නුඹ වනාහි ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවීමට මව්පියන්ගෙන් අවසර ලද්දේ වෙහිද"? "ස්වාමීනි, මම ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවීමට මව්පියන්ගෙන් අවසර ලද්දේ නොවෙමි".

"රට්ඨපාලය, තථාගතවරයෝ මව්පියන් විසින් අවසර නොදෙන ලද්දවුන් පැවිදි නොකරන්නාහ" "ස්වාමීනි, ඒ මම යම්සේ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවීමට මව්පියෝ අවසර දෙන්නාහුද එසේ කරන්නෙමියි" කීය.

**5.** ඉක්බිති රට්ඨපාල කුලපුත්‍රතෙම හුන් ආසනයෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ, පැදකුණු කොට මව්පියෝ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, "මෑණියෙනි, පියාණෙනි, මම යම් යම් ආකාරයකින් භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරණ ලද ධර්මය දනිම්ද? ඒ ආකාරයෙන් ගිහිගෙහි වසන්නහු විසින් ඒකාන්තයෙන් සම්පූර්ණ කොට ඒකාන්තයෙන් පිරිසිදුකොට ලියනලද සකක් මෙන් කොට බ්‍රහ්ම චර්යාවෙහි හැසිරෙන්ට පහසු නොවෙයි. මම ඉසකේ රැවුල් කපා කසාවත් හැඳ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවන්ට කැමැත්තෙමි. ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවීමට මට අවසර දුනමැනවැයි" මවුපියන්ට කීයේය.

**6.** මෙසේ කී කල්හි රට්ඨපාල නම් කුලපුත්‍රයාගේ මව්පියෝ, "පුත රට්ඨපාලය, නුඹවනාහි අපගේ ප්‍රියවූ මනාපවූ සුවසේ වැඩුනාවූ සුවසේ පොෂණය කළාවූ එකම පුතාවෙහිය. පුත රට්ඨපාලය, නුඹ කිසිත් දුකක් නොදන්නෙහිය. පුත රට්ඨපාලය, එව, නුඹ කව, බොව, ඉන්ද්‍රියයන් පිනවීම කරව. කමින්, බොමින්, ඉඳුරන් පිනවමින්, කම්සැප විඳිමින්, පින් කරමින්, සිත් අලවා වාසය කරව. අපි තොපට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවීමට අවසර නොදෙමු. තොපගේ මරණයෙනුත් අපි නොකැමැත්තෙන් වෙන් වන්නෙමු. කිමෙක්ද? අපි ජීවත්වන්නාවූ තොපට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවීමට අනුදන්නෙමුදැයි" රට්ඨපාල කුල පුත්‍රයාට කීවාහුය.

7. දෙවනුවද, රට්ඨපාල නම් කුලපුත්‍රතෙම මව්පියන්ට මෙසේ කීයේය. "මෑණියෙනි, පියාණෙනි, මම යම් යම් පරිද්දෙකින් භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරනලද ධර්මය දනිම්ද, ගිහිගෙයි වසන්නහු විසින් ඒකාන්තයෙන් සම්පූර්ණවූ ඒකාන්තයෙන් පිරිසිදුවූ, ලියනලද සකක් මෙන්වූ මේ බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන්නට පහසු නොවෙයි. මම හිසකෙස් රැවුල් කපාදමා, කසට වත් හැඳ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවන්නට කැමැත්තෙමි. ගිහිගෙන් නික්ම, ශාසනයෙහි පැවිදිවීමට මට අනුදනිව්යයි" කීය. දෙවනුවද, රට්ඨපාල නම් කුලපුත්‍රයාගේ මව්පියෝ රට්ඨපාල නම් කුලපුත්‍රයාට මෙසේ කීවාහුය. "පුත රට්ඨපාලය, නුඹ වනාහි අපගේ ප්‍රියවූ මනාපවූ සුවසේ වැඩුනාවූ සුවසේ පොෂණය කළාවූ එකම පුතාවෙහිය. පුත රට්ඨපාලය, නුඹ කිසිත් දුකක් නොදන්නෙහිය. පුත 'රට්ඨපාලය, එව, අනුභව කරව, පානයද කරව අනුභව කරමින්, පානය කරමින්, ඉන්ද්‍රියයන් පිනවමින්, පින් කරමින්, සිත් අලවා වාසය කරව. අපි නුඹට ගිහිගෙන් නික්ම, සසුනෙහි පැවිදිවීමට අවසර නොදෙමු. නුඹගේ මරණයෙනුත් අපි නොකැමැත්තෙන් වෙන් වන්නෙමු. කිමෙක්ද? අපි ජීවත්වන්නාවූ නුඹට ගිහිගෙන් නික්ම සසුනෙහි පැවිදිවීමට අවසර නොදෙන්නෙමුදැයි" (කීහ.)

8. රට්ඨපාල නම් කුලපුත්‍ර තෙම මව් පියන්ට මෑනියෙනි, පියාණෙනි, "මම යම් පරිද්දෙකින් භාග්‍යවතුන් වහන්සේ විසින් දෙශනා කරණ ලද ධර්මය දනිම්ද, ඒ ආකාරයෙන් ගිහිගෙයි වසන්නාහු විසින් ඒකාන්තයෙන් සම්පූර්ණවූ ඒකාන්තයෙන් පිරිසිදුවූ ලියනලද සකක් මෙන්වූ මේ බ්‍රහ්ම චර්යාවෙහි හැසිරෙන්ට පහසු නොවෙයි. මම හිසකේ රැවුල් කපා කසාවත් හැඳ, ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවන්ට කැමැත්තෙමි. ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවීමට මට අවසර දුනමැනවයි" කීය.

9. තුන්වෙනුවද රට්ඨපාල නම් කුලපුත්‍රයාගේ මව්පියෝ රට්ඨපාල නම් කුලපුත්‍රයාට, "පුත රට්ඨපාලය, නුඹ වනාහි අපගේ

ප්‍රියවූ මනාපවූ සුවසේ වැඩුනාවූ සුවසේ පොෂණය කළාවූ එකම පුතාවෙහිය. පුත රට්ඨපාලය, නුඹ කිසිත් දුකක් නොදන්නෙහිය. පුත රට්ඨපාලය, එව, කව, බොව, ඉන්ද්‍රියයන් පිනවීම කරව. කමින්, බොමින්, ඉඳුරන්, පිනවමින් කම්සැප විඳිමින්, පින් කරමින්, සිත් අලවා වාසය කරව. අපි නුඹට ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවීමට අවසර නොදෙමු. තොපගේ මරණයෙනුත් අපි නොකැමැත්තෙන් වෙන් වන්නෙමු. කිමෙක්ද? අපි ජීවත්වන්නාවූ නුඹට ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවීමට අවසර දෙන්නෙමුදැයි" රට්ඨපාල කුලපුත්‍රයාට කීවාහුය.

**10.** ඉක්බිති මව්පියන්ගෙන් පැවිදිවීමට අවසර නොලත් රට්ඨපාල නම් කුලපුත්‍රතෙම එහිම (ඇතිරීමකින්) අතරක් නැත්තාවූ භූමියෙහි "මෙහිම මාගේ මරණය හෝ වන්නේය. පැවිදිබව හෝ වන්නේයයි" නිදාගත්තේය. ඉක්බිති රට්ඨපාල නම් කුලපුත්‍රයාගේ මව්පියෝ රට්ඨපාල නම් කුලපුත්‍රයාට 'පුත රට්ටපාලය, නුඹ වනාහි අපගේ ප්‍රියවූ මනාපවූ සුවසේ වැඩුනාවූ සුවසේ පොෂණය කළාවූ එකම පුත්‍රයා වෙහිය, පුත රට්ඨපාලය, නුඹ කිසිත් දුකක් නොදන්නෙහිය. පුත රට්ඨපාලය, නැගීසිටුව. කව, බොව, ඉඳුරන් පිනවීමද කරව. කමින්, බොමින්, ඉන්ද්‍රියන් පිනවීම කරමින්, කම්සැප විඳිමින්, පින් කරමින්, සිත් අලවා වාසය කරව. අපි නුඹට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවීමට අවසර නොදෙමු. නුඹගේ මරණයෙනුත් අපි නොකැමැත්තෙන් වෙන් වන්නෙමු. කිමෙක්ද? අපි ජීවත්වන්නාවූ නුඹට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවීමට අවසර දෙන්නෙමුදැයි" රට්ඨපාල කුලපුත්‍රයාට කීවාහුය.

**11.** මෙසේ කීකල්හි රට්ඨපාල නම් කුලපුත්‍රතෙම නිශ්ශබ්ද විය, දෙවනුවද, රට්ඨපාල නම් කුලපුත්‍රයාගේ මව්පියෝ රට්ඨපාල නම් කුලපුත්‍රයාට මෙසේ කීවාහුය. "පුත රට්ඨපාලය, නුඹ වනාහි අපගේ ප්‍රියවූ, මනාපවූ, සුවසේ වැඩුනාවූ, සුවසේ පොෂණය කළාවූ එකම පුත්‍රයා වෙහිය. පුත රට්ඨපාලය, නුඹ කිසිත් දුකක් නොදන්නෙහිය. පුත රට්ඨපාලය, නැගී සිටුව, අනුභවද කරව,

පානයද කරව, ඉන්ද්‍රියයන් පිනවීමද කරව. අනුභව කරමින්, පානය කරමින්, ඉන්ද්‍රියයන් පිනවමින්, පින්කරමින්, සිත් අලවා වාසය කරව. අපි නුඹට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවීමට අවසර නොදෙමු. නුඹගේ මරණයෙනුත් අපි නොකැමැත්තෝ වෙන්වන්නෙමු. කිමෙක්ද? අපි ජීවත්වන්නාවූ නුඹට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවීමට අවසර දෙන්නෙමුදැ"යි කීහ. දෙවනුද රට්ටපාල නම් කුලපුත්‍ර තෙම නිශ්ශබ්ද වූයේය.

12. තුන්වෙනුවද රට්ඨපාල නම් කුලපුත්‍රයාගේ මව්පියෝ රට්ඨපාල නම් කුලපුත්‍රයාට "පුත රට්ඨපාලය, නුඹ වනාහි අපගේ ප්‍රියවූ, මනාපවූ, සුවසේ වැඩුනාවූ, සුවසේ පොෂණය කළාවූ එකම පුත්‍රයා වෙහිය. පුත රට්ඨපාලය, නුඹ කිසිත් දුකක් නොදන්නෙහිය. පුත රට්ඨපාලය, නැගී සිටුව, කව බොව, ඉන්ද්‍රියන් පිනවව, කමින් බොමින් ඉන්ද්‍රියන් පිනවමින් කම්සැප විඳිමින් පින්කරමින් සිත් අලවා වාසය කරව. අපි නුඹට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවීමට අවසර නොදෙමු. නුඹගේ මරණයෙනුත් අපි නොකැමැත්තෙන් නෝ වන්නෙමු. කිමෙක්ද? අපි ජීවත්වන්නාවූ නුඹට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවීමට අවසර දෙන්නෙමු දැයි" රට්ඨපාල කුලපුත්‍රයාට කීවාහුය. තුන්වෙනුවද රට්ඨපාල නම් කුලපුත්‍රතෙම නිශ්ශබ්ද වූයේය.

13. ඉක්බිති රට්ඨපාල නම් කුලපුත්‍රයාගේ මව්පියෝ රට්ඨපාල නම් කුලපුත්‍රයාගේ යහලුවෝ යම්තැනෙක්හිද, එතනට ගියාහුය. ගොස් රට්ඨපාල නම් කුලපුත්‍රයාගේ යහලුවන්ට "දරුවෙනි, මේ රට්ඨපාල නම් කුලපුත්‍රතෙම ඇතිරීමකින් අතරක් නැත්තාවූ බිම, 'මෙහිම මාගේ මරණය හෝ පැවිදිබව හෝ වන්නේයයි' නිදාගත්තේය. දරුවෙනි එව්. රට්ඨපාල නම් කුලපුත්‍රතෙම යම් තැනෙක්හිද, එතැනට පැමිණෙව්. පැමිණ රට්ඨපාල නම් කුලපුත්‍රයාට යහලු රට්ටපාලය, නුඹ වනාහි මව්පියන්ගේ ප්‍රියවූ, මනාපවූ, සුවසේ වැඩුනාවූ, සුවසේ පොෂණයවූ එකම පුත්‍රයා වේ. යහලු රට්ඨපාලය නුඹ කිසිත් දුකක් නොදන්නෙහිය. යහලු රට්ඨපාලය නැගී සිටුව, කව, බොව,

ඉන්ද්‍රියයන් සතුටු කරව, කමින් බොමින් ඉන්ද්‍රියයන් සතුටු කරමින් කම්සැප විඳිමින් පින්කරමින් සිත් අලවා වාසය කරව. මව්පියෝ නුඹට ගිහිගෙන්නික්ම ශාසනයෙහි පැවිදිවීමට අවසර නොදෙත්. නුඹගේ මරණයෙන්ද මව්පියෝ නොකැමැත්තෙන් වෙන්වන්නාහුය. කිමෙක්ද ජීවත්වන්නාවූ නුඹට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවීමට අවසර දෙන්නාහුදැයි" කියව්යයි කීවාහුය.

14. ඉක්බිති රට්ඨපාල නම් කුලපුත්‍රයාගේ යහලුවෝ රට්ඨපාල නම් කුලපුත්‍රයාගේ මව්පියන්ට උත්තර දී රට්ඨපාල නම් කුලපුත්‍රතෙම යම් තැනෙක්හිද, එතැනට ගියාහුය. ගොස් රට්ඨපාල නම් කුලපුත්‍රයාට, යහලු රට්ඨපාලය, නුඹ වනාහි මව්පියන්ගේ ප්‍රියවූ මනාපවූ සුවසේ වැඩුනාවූ සුවසේ පොෂණයවූ එකම පුත්‍රයා වෙහිය. යහලු රට්ඨපාලය, නුඹ කිසිත් දුකක් නොදන්නෙහිය. යහලු රට්ටපාලය, නැගීසිටුව, කව බොව ඉඳුරන් පිනවීමද කරව, කමින් බොමින් ඉන්ද්‍රියයන් පිනවමින් කම්සැප විඳිමින් පින් කරමින් සිත් අලවා වාසය කරව. මව්පියෝ නුඹට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවීමට අවසර නොදෙත්. නුඹගේ මව්පියෝ මරණයෙනුදු නොකැමැත්තෙන් වෙන්වන්නාහුය. කිමෙක්ද ජීවත් වන්නාවූ නුඹට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවීමට අවසර දෙන්නාහුදැයි" කීවාහුය.

මෙසේ කී කල්හි රට්ඨපාල නම් කුලපුත්‍රතෙම නිශ්ශබ්ද වූයේය. දෙවනුවද රට්ඨපාල නම් කුලපුත්‍රයාගේ යහලුවෝ රට්ටපාල නම් කුලපුත්‍රයාට මෙසේ කීවාහුය. "යහලු රට්ටපාලය, නුඹ වනාහි මව්පියන්ගේ ප්‍රියවූ, මනාපවූ, සුවසේ වැඩුනාවූ සුවසේ පොෂනය වූ එකම පුත්‍රයා වෙහිය. යහලු රට්ඨපාලය, නුඹ කිසිත් දුකක් නොදන්නෙහිය. යහලු රට්ඨපාලය නැගී සිටුව, අනුභවද කරව, පානයද කරව, ඉන්ද්‍රියයන් පිනවීමද කරව්, අනුභව කරමින්, පානය කරමින්, ඉන්ද්‍රියයන් පිනවමින් කම්සැප විඳිමින්, පින්කරමින්, අභිරමනය කරව, මව්පියෝ නුඹට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවීමට අවසර නොදෙත්. නුඹගේ මරණයෙන්ද මව්පියෝ නොකැමැත්තාහුම වෙන්වන්නාහුය.

කිමෙක්ද? ජීවත්වන්න. නුඹට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවීමට අවසර දෙන්නාහුද,” දෙවනුවද රට්ඨපාල කුලපුත්‍රතෙම නිශ්ශබ්ද වූයේය.

තුන්වෙනුවද රට්ඨපාල නම් කුලපුත්‍රයාගේ යහලුවෝ රට්ඨපාල නම් කුලපුත්‍රයාට “යහලු රට්ඨපාලය, නුඹ වනාහි මව්පියන්ගේ ප්‍රියවූ මනාපවූ සුවසේ වැඩුනාවූ සුවසේ පොෂණයවූ එකම පුත්‍රයාවෙහිය. යහලු රට්ටපාලය, නුඹ කිසිත් දුකක් නොදන්නෙහිය. යහලු රට්ඨපාලය, නැගී සිටුව, කව බොව, ඉන්ද්‍රියයන් පිනවීම කරව, කමින් බොමින් ඉන්ද්‍රියන් පිනවමින් කම්සැප විඳිමින් පින්කරමින් සිත් අලවා වාසය කරව. මව්පියෝ නුඹට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවීමට අවසර නොදෙත්. නුඹගේ මරණයෙන්ද මව්පියෝ නොකැමැත්තෙන්ම වෙන්වන්නාහුය. කිමෙක්ද ජීවත් වන්නාවූ නුඹට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවීමට අවසර දෙන්නාහුදැයි” කීවාහුය. තුන් වෙනුවද රට්ඨපාලනම් කුලපුත්‍ර තෙම නිශ්ශබ්දවූයේය.

**15.** ඉක්බිති රට්ඨපාලනම් කුලපුත්‍රයාගේ යහලුවෝ රට්ඨපාලනම් කුලපුත්‍රයාගේ මව්පියෝ යම් තැනෙක්හිද එතැනට ගියාහුය. ගොස් රට්ඨපාලනම් කුලපුත්‍රයාගේ මව්පියන් “මෑනියෙනි, පියාණෙනි, මේ රට්ඨපාල කුලපුත්‍රතෙම ඒ කිසිවකින් එලානැති භූමියෙහි, ‘මෙහිම මාගේ මරණය හෝ පැවිදිබව වන්නේයයි’ නිදාගත්තේ වෙයි. ඉදින් නුඹලා රට්ඨපාලනම් කුලුපත්‍රයාට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවීමට අවසර නොදෙන්නාහුනම් එහිම ඔහුගේ මරණය පැමිණෙන්නේය. ඉදින් වනාහි නුඹලා රට්ඨපාලනම් කුල පුත්‍රයාට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවීමට අවසර දෙන්නාහුනම් පැවිදිවූද ඔහු දක්නහුය. ඉදින් රට්ඨපාලනම් කුලපුත්‍රතෙම ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවීමට කැමති නොවන්නේනම් ඔහු වෙන කොහියන්නේද? මෙහිම ආපසු එන්නේය. රට්ඨපාලනම් කුලපුත්‍රයාට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවීමට අවසර දෙව්යයි, කීවාහුය. දරුවෙනි, රට්ඨපාලනම් කුලපුත්‍රයාට ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවීමට අවසර දෙමු. පැවිදිවූවහු විසින්ද මව්පියෝ දැකිය යුත්තාහුයයි”, කීවාහුය.

17. ඉක්බිති රට්ඨපාලනම් කුලපුත්‍රයාගේ යහලුවෝ රට්ඨපාල නම් කුලපුත්‍රයා යම්තැනෙක්හිද, එතැනට ගියාහුය. ගොස් රට්ඨපාලනම් කුලපුත්‍රයාට "යහලු රට්ඨපාලය, නුඹවනාහි මව්පියන්ගේ ප්‍රියවූ මනාපවූ සුවසේ වැඩුනාවූ සුවසේ පොෂ්‍යවූ එකම පුත්‍රයා වෙහිය. යහලු රට්ඨපාලය, නුඹ කිසිත් දුකක් නොදන්නෙහිය. යහලු රට්ඨපාලය, නැගී සිටුව, කව බොව ඉන්ද්‍රියයන් සතුටු කරව. කමින් බොමින් ඉඳුරන් සතුටු කරමින් කම්සැප විඳිමින් පින්කරමින් සිත් අලවා වාසය කරව. මව්පියන් විසින් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවීමට අවසර දෙන ලද්දේ වෙහිය. පැවිදිවූවාහු විසිනුත් නුඹගේ මව්පියෝ දැකියයුත්තාහුයයි", කීවාහුය.

18. ඉක්බිති රට්ඨපාලනම් කුලපුත්‍රතෙම නැගීසිට කාය ශක්තිය උපදවාගෙණ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක පසෙක හුන්නේය. එක පසෙක හුන්නාවූ රට්ටපාල නම් කුලපුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේට 'ස්වාමීනි වහන්ස, මම මව්පියන් විසින් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවීමට අවසර ලද්දේවෙමි. භාග්‍යවතුන් වහන්සේ මා පැවිදි කරණසේක්වායි", කීයේය. රට්ඨපාලනම් කුලපුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි පැවිදිබව ලැබුයේය. උපසම්පදාවද ලැබූයේය.

19. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත්වූ රට්ඨපාල ස්ථවිරයන් උපසම්පදාවූ නොබෝ කල් ඇති උපසම්පදාවූ අඩමසක් පමණ කල්හි ථුල්ලකොට්ඨිත නම් නියම් ගමෙහි කැමති පරිද්දෙන් වාසය කොට සැවැත්නුවර යම් තැනෙක්හිද එහි චාරිකාවෙහි වැඩියහ. පිළිවෙළින් වඩිනුයේ සැවැත්නුවර යම් තැනෙක්හිද එතැනට පැමිණියහ. එහි වනාහි භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවර ජේතවන නම්වූ අනේපිඩු මහ සිටුහුගේ ආරාමයෙහි වැඩ වසති. එකල්හි ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිරතෙම තනිව වෙන්වූ වාසය ඇත්තේ අප්‍රමාදව කෙලෙස්තවන වීර්යයෙන් ජීවිත ආශාව අත්හැර වාසය

කරන්නේ නොබෝ කලකින්ම යමක් සඳහා කුලපුත්‍රයෝ ගිහිගෙන් නික්ම මනාකොටම ශාසනයෙහි පැවිදිවෙත්ද, බ්‍රහ්මචර්යාවගේ අවසානය වූ ඒ අර්හත් ඵලය මේ ආත්මයෙහිම තෙමේ විශෙෂ නුවණින් ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කෙළේය. ජාතිය කෙළවර කරණ ලද්දීය. මාර්ග බ්‍රහ්මචර්යාව වැස නිමවන ලද්දේය. සතර මගින් කටයුතු දෙය කරණ ලදී. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගත්තේය. ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිර තෙමේ වනාහි රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක් වූහ.

**20.** ඉක්බිති ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසක හුන්නේය. එක්පසක උන්නාවූ ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේට ස්වාමීනි ඉදින් භාග්‍යවතුන් වහන්සේ මට අවසර දෙන්නේ නම් මම මව්පියන් දකින්ට කැමැත්තෙමියි" කීයේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිරයන්ගේ අදහස තමන් වහන්සේගේ සිතින් මෙනෙහි කළහ. භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිරතෙම ශික්ෂාව හැර ගිහිබවට පෙරලෙන්ට නුසුදුසු වේයයි, දැනගත්හ. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිරයන්ට "මෙය රට්ඨපාලය, තොපි දැන් යමකට කැමැත්තෙහිද, එයට කල් දනුවයි" (වදාළේය.) ඉක්බිති ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිර තෙම හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ පැදකුණු කොට සෙනාසනය තැන්පත් කොට තබා පාත්‍රා සිවුරු ගෙණ ථුල්ලකොට්ඨිත නම් නියම්ගම් යම් තැනෙක්හිද එහි චාරිකාවෙහි ගියේය. පිළිවෙළින් යනුයේ ථුල්ලකොට්ඨිත නම් නියම් ගම යම්තැනෙක්හිද එතැනට පැමිණියේය.

**21.** එහි වනාහි ආයුෂ්මත්වූ රට්ඨපාල ස්ථවිර තෙම ථුල්ලකොට්ඨිත නම් නියම් ගම්හි කොරව්‍ය නම් රජුගේ මිගාචීර නම් උයනෙහි වාසය කරයි. ඉක්බිති ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිරතෙම පෙරවරු වේලෙහි හැඳ පෙරවා පා සිව්රු ගෙන

ථුල්ලකොට්ඨිත නම් නියම් ගමට පිඬු පිණිස පැමිණියේය. ථුල්ලකොට්ඨිත නම් නියම් ගමෙහි ගෙපිළිවෙලින් පිඬු පිණිස හැසිරෙන්නේ ස්වකීය පියාගේ ගෘහය යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. එකල්හි වනාහි ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිරයන්ගේ පියතෙම මධ්‍යයෙහිවූ ද්වාරාශාලාවෙහි හිසකේ අවුල් හරවයි. ආයුෂ්මත්වූ රට්ඨපාල ස්ථවිරයන්ගේ පියතෙම දුරදීම එන්නාවූ ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිරයන් දුටුයේය. දැක "මේ හිසමුඩුවූ ශ්‍රමණයන් විසින් අපගේ ප්‍රියවූ මනාපවූ එකම පුත්‍රයා පැවිදි කරවනලද්දේයයි" කීයේය. ඉක්බිත්තෙන් ආයුෂ්මත්වූ රට්ඨපාල ස්ථවිරතෙම ස්වකීය පියාගේ ගෙදර දානයක් නොමලද්දේය. පිළිසඳර වචනමාත්‍රයකුදු නොලද්දේය. ඒකාන්තයෙන් ක්‍රොධ වචනයම ලද්දේය.

**22.** එකල්හි වනාහි ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිරයන්ට නෑවත දාසියක් එක්රැයක් ගතවූ යවපිට්ටුවක් අහක දමනු කැමැත්තී වෙයි. ඉක්බිති ආයුෂ්මත්වූ රට්ඨපාල ස්ථවිරතෙම ඒ නෑවන දාසියට නැගනිය, ඉදින් එක් රැයක් ඉක්මවූ මේ යවපිට්ටුව ඉවත දමනු කැමැත්තී නම් මාගේ මේ පාත්‍රයෙහි දමවයි (කීය) ඉක්බිත්තෙන් ආයුෂ්මත්වූ රට්ඨපාල ස්ථවිරයන්ගේ නෑ දාසිය රාත්‍රියක් ඉක්මවූ ඒ යවපිට්ටුව ආයුෂ්මත් වූ රට්ඨපාල ස්ථවිරයන්ගේ පාත්‍රයෙහි දමන්නී අත්වලද පාවලද ස්වරයෙහිද (ශබ්දයෙහිද) ආකාරය සිතට ගත්තේය. ඉක්බිති රට්ඨපාල ස්ථවිරයන්ගේ නෑ දාසිය ආයුෂ්මත්වූ රට්ඨපාල ස්ථවිරයන්ගේ මව යම්තැනෙක්හිද එතනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත්වූ රට්ඨපාල ස්ථවිරයන්ගේ මවට "අනේ! ආර්යාවෙනි දන්නෙහිද, රට්ඨපාලනම් ස්වාමි පුත්‍රතෙම පැමිණියේයයි" කීය. "ඉදින් කෙල්ල සැබැවක් කීයෙහි නම්, දාසකමින් නිදහස් වන්නෙහියයි" (කීවාය.) ඉක්බිති ආයුෂ්මත් වූ රට්ඨපාල ස්ථවිරයන්ගේ මව්තොමෝ ආයුෂ්මත්වූ රට්ඨපාල ස්ථවිරයන්ගේ පියතෙම යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත්වූ රට්ඨපාල ස්ථවිරයන්ගේ පියාට "අනේ ගෘහපතියෙනි, දන්නෙහිද, රට්ඨපාල නම් කුල පුත්‍රයා පැමිණියේයයි" (කීය)

23. "එකල්හි වනාහි ආයුෂ්මත්වූ රට්ඨපාල ස්ථවිරතෙම රාත්‍රියක් ඉක්මවූ ඒ යවපිට්ටුව එක්තරා බිත්තියක් ළඟ හිඳ වළඳයි. එකල්හි ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිරයන්ගේ පියතෙම ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිරයන් වහන්සේ යම්තැනෙක් හිද, එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් රට්ඨපාලස්ථවිරයන්ට "පුත්‍රවූ රට්ඨපාල ස්ථවිරයෙනි, රාත්‍රියක් ගතවූ කොමුපිට්ටුව අනුභව කිරීමට සෑහෙයිද? පුත්‍රවූ රට්ඨපාල ස්ථවිරයෙනි, ස්වකීය ගෙදරට යායුතු නොවේදැයි" කීය. "ගෘහපතිය ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවූ අපට ගෙදරක් කොයින්ද? ගෘහපතිය, අපි ගෙවල් නැත්තෝ වෙමු. ගෘහපතිය, නුඹගේ ගෙදරට ගියෙමු. එහි දානයක් නොම ලදුම්හ. පිළිසඳර වචනයක් නොම ලදුම්හ. ඒකාන්තයෙන්ම ආක්‍රොශයක්ම ලැබුවෙමුයි" කීය. "පුත්‍රවූ රට්ඨපාල ස්ථවිරයෙනි, එනු මැනව. ගෙදරට යන්නෙමුයි" (කීයේය.) "ගෘහපතිය, කම් නැත. අද මා විසින් ආහාර කෘත්‍යය කරණ ලදී.

"එසේවී නම්, පුත්‍රවූ රට්ඨපාල ස්ථවිරයෙනි, සෙට දවස පිණිස ආහාරය ඉවසනු මැනව." ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිරතෙම නිශ්ශබ්දවීමෙන් ඉවසීය.

24. ඉක්බිති ආයුෂ්මත්වූ රට්ඨපාල ස්ථවිරයන්ගේ පියතෙම ආයුෂ්මත්වූ රට්ඨපාල ස්ථවිරයන්ගේ ඉවසීම දැන ස්වකීය ගෘහය යම් තැනෙක්හිද එතැනට ගියේය. ගොස්, ආභරණ තැනූ රන්ද, නොතැනූ රන්ද, මහත් ගොඩක් ගසා, පැලලිවලින් වස්වා, ආයුෂ්මත්වූ රට්ඨපාල ස්ථවිරයන්ගේ පරණ දෙවැන්නන්ට (ගැහැනුන්ට) කථාකෙළේය. "ලේලිවරුනි, එව්. නුඹලා යම් සැරසීමකින් සැරසුනාහු, පෙර රට්ඨපාල කුලපුත්‍රයාහට ප්‍රිය තැනැත්තියෝ, මන වඩන්නියෝ වූවහුද, ඒ සැරසීමෙන් සැරසෙව්යයි" (කීයේය.) ඉක්බිති රට්ඨපාල ස්ථවිරයන්ගේ පිය තෙම ඒ රාත්‍රිය ඉක්මීමෙන් ස්වකීය ගෘහයෙහි ප්‍රණීතවූ ආහාරපාන පිළියෙළ කරවා, ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිරයන්ට කල් දැන්වීය. "පුත්‍රවූ රට්ඨපාල ස්ථවිරයෙනි, ආහාර පිළියෙළ

කිරීම නිමවන ලදී. දැන් සුදුසු කල් වේයයි" (දැන්වීය). ඉක්බිති ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිරතෙම පෙරවරුයෙහි හැඳ පොරවා, පාත්‍ර සිවුරු ගෙණ, සිය පියාගේ ගෙදර යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ, පණවනලද ආසනයෙහි වැඩ උන්නේය.

**25.** ඉක්බිති ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිරයන්ගේ පියතෙම රන් ගොඩ විවෘත කරවා ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිරයන්ට, "පුත්‍රවූ රට්ඨපාල ස්ථවිරයෙනි, මේ නුඹගේ මෑණියන් සතු ධනය වේ. සෙස්ස පිය සන්තක ධනය වේ. අනික් ධනය මුත්තනුවන් සතුය. පුත්‍රවූ රට්ඨපාල ස්ථවිරයෙනි, සම්පත් අනුභව කරන්ටද, පින් කරන්ටද හැක්කේය. පුත්‍රවූ රට්ඨපාල ස්ථවිරයෙනි, එනු මැනව. නුඹ මහණකම හැරදමා, ගිහිබවට පෙරලී, සම්පත් අනුභව කරව, පින්ද කරවයි," (කියේය.)

"ගෘහපතිය, ඉදින් නුඹ මාගේ වචනය කරන්නෙහි නම්, මේ මහත් රන්ගොඩ ගැල්වල පටවා අද්දවා ගංගානම් ගඟ මැද පාකර හරිනු මැනවි. ඊට හෙතු කවරේද? ගෘහපතිය, ඒ හෙතුකොටගෙන ශොකය, වැලපීමය, කායික දුකය, චෛතසික දුකය, දැඩි වෙහෙසය යන මොහු උපදින්නාහුයයි" කීය.

**26.** ඉක්බිති ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිරයන්ගේ පුරාණ ගැහැනුන් වෙන වෙනම පාදයන් අල්වාගෙණ ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිරයන්ට මෙය කීවාහුය. "ස්වාමිපුත්‍රයෙනි, නුඹවහන්සේ යම් දිව්‍ය ස්ත්‍රීන් නිසා බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙන්නෙහි නම් ඒ දිව්‍ය ස්ත්‍රීහු කෙබඳු නම් වෙත්දැයි" ඇසූහ.

"නැගණිවරුනි, අපි දිව්‍ය ස්ත්‍රීන් නිසා බ්‍රහ්මචර්යාවෙහි නොහැසිරෙමුයි" කීයේය.

"ස්වාමිපුත්‍රවූ රට්ඨපාල තෙමේ අපට 'නැගණිවරුනියි' කීමෙන් කථා කෙරේයයි" ඔව්හු එහිම මූර්ඡාවී වැටුනාහුය. ඉක්බිති ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිරතෙම පියාට, "ගෘහපතිය, ඉදින් භොජනය දිය යුතු නම් දෙව්. අපට වෙහෙස නොකරවයයි" කීය.

පුත්‍රවූ රට්ඨපාල ස්ථවිරයෙනි, වළඳනු මැනව. ආහාරය නිවෙන ලදැයි" කීයේය. ඉක්බිති ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිරයන්ගේ පියතෙම ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිරයන්ට ප්‍රණීතවූ කෑයුතු දෙයින් හා බුදියයුතු දෙයින් සිය අතින් වැළඳවීය. කැමතිතාක් වැළඳවිය.

27. ඉක්බිති ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිරතෙම වළඳා අවසන්කොට පාත්‍රයෙන් අත් ඉවත්කොට සිටියේම මේ ගාථාවන් ප්‍රකාශ කෙළේය.

1. "විසිතුරු කරණලද වණ සමූහයක් ඇති, ඇට නහර ආදියෙන් උඩට ඔසවනලද ජරා රොගාදියෙන් ආතුරවූ බොහෝදෙනා විසින් පතන්නාවූ යමක්හුගේ ස්ථිර පැවැත්මක් නැත්තේද, එබඳුවූ මේ ශරීරය බලව"

2. "මැණික්වලින්ද, කන්වල පළඳනා ආභරණවලින් විසිතුරු කරනලද ඇටවලින් හා සිවියෙන් ගැවසී ගත්තාවූ වස්ත්‍ර වස්ත්‍ර නිසා අලංකාරවූ මේ ශරීරය බලව.

3. "රතු සායමින් සායම් කරනලද්දාවූ පාදයෝද, සුණුවලින් තවරණ ලද්දාවූ මුහුණ අඥානයාගේ මුළාවට සුදුසු වේ. නිවන් සොයන්නහුට සුදුසු නොවේ.

4. "අට කොටසකට බෙදා ගොතනලද කෙශයෝද, අඳුන් ගානලද ඇස්ද, අඥානයාගේ මුලාවට සුදුසු වේ. නිවන් සොයන්නහුට සුදුසු නොවේ.

5. "විසිතුරුවූ අළුත්වූ අඳුන් හෙප්පුවක් මෙන් අලංකාර කරණ ලද්දාවූ මේ කුණු ශරීරය අඥානයාගේ මුලාවට සුදුසු වෙයි. නිවන් සොයන්නහුට සුදුසු නොවෙයි.

6. "මුව වැදිතෙම මළපුඬුව ඇටෙව්වේය. මුවතෙම යොදනලද පුඩුවට ලං නොවීය. නිවාපය (තෘණ ගොදුර) අනුභව කොට මුව වැද්දා හඬමින් සිටියදී ගියාක් මෙන් යන්නෙමු."

**28.** ඉක්බිති ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිරතෙම හිටගෙනම මේ ගාථාවන් කියා කොරව්‍ය රජුහුගේ මිගාචීර නම් උයන යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, එක්තරා ගසක් මුල දවල් කාලයේ හුන්නේය. ඉක්බිති කොරව්‍ය රජතෙම මිගව නම් උද්‍යානපාලයාට කථාකෙළේය. "යහලු මිගවය, මිගාචීර නම් උයන ශුද්ධකොට පිළියෙළ කරව. උයන දකිනු පිණිස යම්හයි" කීයේය.

"දෙවයන් වහන්ස, 'එසේය,' කියා මිගව නම් උද්‍යානපාල තෙම කොරව්‍ය නම් රජහට උත්තර දී මිගාචීර නම් උයන ශුද්ධකොට පිළියෙල කරන්නේ එක්තරා ගසක් මුල දවල් කාලයේ උන්නාවූ ආයුෂ්මත් රට්ටපාල ස්ථවිරයන් දුටුයේය. දැක, කොරව්‍ය නම් රජතෙම යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ, කොරව්‍ය නම් රජුට "දෙවයන්වහන්ස, මිගාචීර නම් උයන පිළියෙල කරනලදී. එහි මේ ථුල්ලකොට්ඨිත නම් නියම්ගමෙහිම ප්‍රධාන කුල ඇත්තහුගේ පුත්‍රවූ රට්ඨපාල නම් කුලපුත්‍රතෙම ඇත්තේය. නිරන්තරයෙන් නුඹවහන්සේ යමෙකුගේ ගුණ කියන්නේ වූයෙහිද, ඒ රට්ඨපාල ස්ථවිර තෙම එක්තරා ගසක් මුල දවල් කාලයේ වැඩඋන්නේයයි" කීයේය.

"එසේ වීනම් යහලු මිගවය, අද දැන් උයනට යන ගමනින් කම් නැත. දැන් අපි ඒ පින්වත්වූ රට්ඨපාල ස්ථවිරයන් ආශ්‍රය කරන්නෙමුයි" කීයේය.

**29.** ඉක්බිති කොරව්‍ය රජතෙම "එහි යම් කෑයුතු දෙයක්, බුදියයුතු දෙයක් පිළියෙළ කරණ ලදද, ඒ සියල්ල හැර දමව්යයි" කියා යහපත් යහපත්වූ යානාවන් පිළියෙල කරවා, යහපත් යානාවකට නැගී, යහපත් යහපත් යානාවලින් ථුල්ලකොට්ඨිත නම් නියම්ගමින් මහත්වූ රාජානුභාවයෙන් යුක්තව ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිරයන් දැකීමට නික්මුනේය. යානාවෙන් යායුතු භූමිය යම්තාක්ද ඒ තාක් යානාවෙන් ගොස්, යානාවෙන් බැස, පා ගමනින් යුක්තවූයේම, උසස් උසස්වූ පිරිස හා ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එතැන්හි පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිරයන් සමග

සතුටු වූයේය. සතුටු විය යුතුවූ සිහි කටයුතුවූ කතාව කොට නිමවා, එක්පසක සිටියේය. එක්පසක සිටියාවූ කොරව්‍ය රජතෙම ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිරයන්ට, 'පින්වත් රට්ඨපාල ස්ථවිර තෙමේ ඇතුන්පිට අතුරණ ඇතිරියෙහි වැඩඉන්නාසේක්වායි" කීය.

"මහරජ, කමක් නැත. නුඹ හිඳගනු මැනව. මම ස්වකීයවූ ආසනයෙහි හුන්නේවෙමියි" කීය. කොරව්‍ය රජ තෙම පණවනලද ආසනයෙහි හිඳගත්තේය. හිඳගෙන කොරව්‍ය රජතෙම ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිරයන්ට මෙය සැලකෙළේය.

**30.** පින්වත්වූ රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, යම්බඳු පිරිහීම්වලින් යුක්තවූ මේ ලොකයෙහි සමහර කෙනෙක් හිසකේ රැවුල් කපා හැර, කසාවත් හැඳ, ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙත්ද, එබඳුවූ මේ පිරිහීම් සතරක් වෙත්. කවර සතරක්ද යත්? ජරාවට පැමිණීමෙන් පිරිහීමය, ලෙඩ රෝගාදිය සෑදීමෙන් පිරිහීමය, වස්තුවෙන් පිරිහීමය, නෑයන්ගෙන් පිරිහීමය යන සතරයි. පින්වත්වූ රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, ජරාවට පැමිණීමෙන් පිරිහීම නම් කවරේද? පින්වත්වූ රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, මේ ලොකයෙහි ඇතමෙක් ජරාවට පැමිණියේ, වයසට පැමිණියේ ජාතියෙන් මහලුවූයේ, බොහෝ කල් ඉක්මගියේ, අන්තිම වයසට පැමිණියේ වේද, හෙතෙම මෙසේ කල්පනා කරයි. 'මම වනාහි දැන් දිරාගියේ වෙමි. වයස්ගත වූයේ වෙමි. මහලුවීමි. බොහෝ කල් ඉක්මගියේ වෙමි. අන්තිම වයසට පැමිණියෙමි. මා විසින් වනාහි නොලද්දාවූ සම්පත් ලබන්ටද ලැබුවාවූ සම්පත් දියුණු කරන්ටද පහසු නොවෙයි. මම හිසකේ රැවුල් කපාහැර, කසාවත් හැඳ, ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වන්නෙම් නම් ඉතා යෙහෙකැයි' (සිතන්නේය.)හෙතෙම ඒ ජරාව නිසා පිරිහීමෙන් යුක්තවූයේ හිස රැවුල් කපා කසාවත් හැඳ, ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙයි. පින්වත්වූ රට්ටපාල ස්ථවිරයෙනි, මේ ජරාවෙන් පිරිහීමයයි කියනු ලැබේ. පින්වත් රට්ඨපාල ස්ථවිර තෙමේ වනාහි දැන් ළදරුවූයේ තරුණවූයේ යෞවනවූයේ කලු හිසකේ

ඇත්තේ යහපත්වූ තරුණ භාවයෙන් යුක්තවූයේ පළමු වයසින් යුක්තවූයේ වෙයි. පින්වත්වූ රට්ඨපාල ස්ථවිරයන්ට ඒ ජරාවෙන් පිරිහීමක් නැත. පින්වත් රට්ඨපාල ස්ථවිර තෙමේ කුමක් දැන හෝ දැක හෝ අසා හෝ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේද?

31. "පින්වත් රට්ඨපාල ස්ථවිරයෙනි, රොගාබාධ නිසා පිරිහීම නම් කවරේද? පින්වත් රට්ඨපාල ස්ථවිරයෙනි, මේ ලොකයෙහි ඇතමෙක් හටගත් ආබාධ ඇත්තේ දුකින් පෙලුනේ දැඩි ගිලන්වූයේ වෙයි. හෙතෙම මෙසේ කල්පනා කරයි 'මම වනාහි දැන් හටගත් ආබාධ ඇත්තේ දුකින් පෙලුනේ දැඩි ගිලන්වූයේ වෙමි. මා විසින් නොලබනලද සම්පත් ලබන්ට හෝ ලබනලද සම්පත් දියුණුකරන්ට හෝ පහසු නොවෙයි. මම ඉසකේ රැවුල් කපාහැර කසාවත් හැඳ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවන්නෙම් නම් යෙහෙක, කියායි. හෙතෙම රොගාබාධයන් නිසා පිරිහීමෙන් යුක්ත වූයේ හිසකේ රැවුල් කපා හැර කසාවත් හැඳ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවේ. පින්වත් රට්ඨපාල ස්ථවිරයෙනි, මෙය ව්‍යාධිපරිහානියයි කියනු ලැබේ. පින්වත් රට්ඨපාල ස්ථවිර තෙමේ වනාහි දැන් ආබාධ නැත්තේ නීරොගවූයේ ඉතා මදද නොවූ ඉතා වැඩිද නොවූ සමවූ පැසවීම් ඇත්තාවූ ග්‍රහණියෙන් (ජඨරාග්නියෙන්) යුක්තවූයේ වේ. පින්වත් රට්ඨපාල ස්ථවිරයන්ට ඒ ව්‍යාධිය නිසා පිරිහීමක් නැත්තේය. පින්වත් රට්ඨපාල ස්ථවිර තෙමේ කුමක් දැන හෝ දැක හෝ අසා හෝ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවූයේද?

32. "පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, වස්තුවෙන් පිරිහීම නම් කවරේද? පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, මේ ලොකයෙහි ඇතමෙක් වස්තුවෙන් ආඪ්‍යවූයේ මහත් ධන ඇත්තේ මහත් සම්පත් ඇත්තේ වේද, ඔහුගේ වස්තුව පිළිවෙළින් විනාශවීමට පැමිණෙයි. හෙතෙම මෙසේ කල්පනා කරයි. 'මම වනාහි පෙර වස්තුවෙන් ආඪ්‍යවූයේ මහත් ධන ඇත්තේ මහත් සම්පත් ඇත්තේ වීමි. ඒ මාගේ ඒ සම්පත් පිළිවෙළින් විනාශයට

ගියාහුය. මා විසින් වනාහි නොලැබුවාවූ හෝ සම්පත් ලබන්ට හෝ ලැබුවාවූ හෝ සම්පත් දියුණු කරන්ට හෝ පහසු නොවන්නේය. මම හිස රැවුල් කපා හැර කසාවත් හැඳ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වන්නෙම් නම් ඉතා යෙහෙකැයි (සිතන්නේය) හෙතෙම ඒ වස්තු පිරිහීමෙන් යුක්තවූයේ හිසකේ රැවුලු කපාහැර කසාවත් හැඳ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවේ. පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, මේ වස්තුවෙන් පිරිහීමයයි කියනු ලැබේ. පින්වත් රට්ඨපාල ස්ථවිරතෙමේ වනාහි මේ ථුල්ලකොට්ඨිත නම් නියම්ගමෙහිම ප්‍රධාන කුලවත්හුගේ පුත්‍රයා වෙහිය. පින්වත් රට්ඨපාල ස්ථවිරයන්ට ඒ වස්තු පිරිහීමක් නැත්තේය. පින්වත් රට්ඨපාල ස්ථවිර තෙමේ කුමක් දැන හෝ කුමක් දැක හෝ කුමක් අසා හෝ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවූයේද?

33. "පින්වත් රට්ඨපාල ස්ථවිරයෙනි, නෑයන්ගෙන් පිරිහීම නම් කවරේද, පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, මේ ලොකයෙහි සමහරෙකුට බොහෝවූ යාළු මිත්‍රයෝද නෑ සහ ලේ නෑයෝද ඇත්තාහ. ඔහුගේ ඒ නෑයෝ පිළිවෙළින් විනාශයට පැමිණෙත්. හෙතෙම මෙසේ කල්පනා කරයි. 'මට වනාහි පෙර බොහෝවූ යාළු මිත්‍රයෝද නෑ සහ ලේ නෑයෝද වූහ. ඒ මාගේ නෑයෝ පිළිවෙළින් විනාශයට ගියාහුය. මා විසින් වනාහි නොලද්දාවූ සම්පත් ලබන්ට හෝ ලද්දාවූ සම්පත් සමෘද්ධ කරන්ට හෝ පහසු නොවෙයි. මම හිසකේ රැවුල් කපාහැර කසාවත් හැඳ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවන්නෙම් නම් ඉතා යෙහෙක' කියායි. හෙතෙම ඒ නෑයන්ගේ පිරිහීමෙන් යුක්තවූයේ හිසකේ රැවුල් කපා හැර කසාවත් හැඳ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවෙයි. පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, මේ නෑයන්ගෙන් පිරිහීමයයි කියනු ලැබේ. පින්වත් රට්ඨපාල ස්ථවිරයන්ට වනාහී මේ ථුල්ලකොට්ඨිත නම් නියම්ගමෙහිම බොහෝවූ යාළු මිත්‍රයෝද නෑ සහ ලේ නෑයෝද ඇත්තාහ. පින්වත් රට්ඨපාල ස්ථවිරයන්ට ඒ නෑයන්ගෙන් පිරිහීමක් නැත්තේය. පින්වත් රට්ඨපාල ස්ථවිර තෙමේ කුමක් දැන හෝ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

කුමක් දැක හෝ කුමක් අසා හෝ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවූයේද?

34. "පින්වත්වූ රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, යම් පිරිහීමකින් යුක්තවූ මේ ලොකයෙහි සමහරු හිසකේ රැවුල් කපාහැර කසාවත් හැඳ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙත්ද, මේ ඒ පිරිහීම් සතර වෙත්. පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්සේට ඒ පිරිහීම් නැත්තේය. පින්වත් රට්ඨපාල ස්ථවිර තෙමේ කුමක් දැන හෝ දැක හෝ අසා හෝ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවූයේදැ"යි ඇසුවේය.

35. "මහරජ, භාග්‍යවත්වූ සියල්ල දන්නාවූ සියලු ධර්මයන් දක්නාවූ අර්හත්වූ ඒ සම්‍යක්සම්බුද්ධයන් විසින් කොටින් වදාළ ධර්මපද සතරක් වෙත්. මේ ඒ ධර්මපද සතර දැන දැක අසා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවූයෙමි. ඒ ධර්මපද සතර නම් කවරහුද? මහරජ 'ලෝවැසි තෙම ජරා මරණ දෙකට පමුණුවනු ලැබෙයි. බොහෝ කල් නොපවත්නේය' යනු භාග්‍යවත්වූ සියල්ල දන්නාවූ සියලු ධර්මයන් දක්නාවූ අර්හත්වූ ඒ සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ විසින් වදාළ පළමුවෙනි ධර්මපදයයි. මම එය දැනද දැකද අසාද ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවූයෙමි.

36. "මහරජ, 'ලෝවැසිතෙම ආරක්ෂාවක් නැත්තේය. කිසි පිහිටක් නැත්තේය' යනු භාග්‍යවත්වූ සියල්ල දන්නාවූ සියලු ධර්මයන් දක්නාවූ අර්හත්වූ ඒ සම්‍යක්සම්බුද්ධයන් වහන්සේ විසින් වදාළ දෙවැනි ධර්මපදයයි. මම එය දැනද දැකද අසාද ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවූයෙමි.

37. "මහරජ, 'ලෝවැසිතෙම තමා සතුවූවක් නැත්තේය. සියල්ල හැර යා යුතුය' යනු භාග්‍යවත්වූ සියල්ල දන්නාවූ සියලු ධර්මයන් දක්නාවූ අර්හත්වූ ඒ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් වදාළ තුන්වැනි ධර්මපදයයි. මම එය දැනද දැකද අසාද ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයෙමි.

38. "මහරජ 'ලොකවාසී සත්වතෙම සෑහීමක් නැත්තේ ඇතිවීමකට නොපැමිණියේ තණ්හාවට දාසවූයේය' යනු

භාග්‍යවත්වූ සියල්ල දන්නාවූ සියල්ල දක්නාවූ ඒ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ විසින් වදාළ සතරවැනි ධර්මපදයයි. මම එය දැනද දැකද අසාද ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයෙමි. මහරජ, භාග්‍යවත්වූ සියල්ල දන්නාවූ සියලු ධර්මයන් දන්නාවූ අර්හත්වූ ඒ සර්වඥයන් වහන්සේ විසින් මේ ධර්මපද සතර කොටින් වදාළහ. මම ඒ ධර්මපද සතර දැනද දැකද අසාද ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවූයෙමි."

**39.** "පින්වත් රට්ඨපාල ස්ථවිර තෙමේ' 'ලෝවාසිතෙම ජරා මරණ දෙකට පමුණුවනු ලැබෙයි. බොහෝ කල් නොපවත්නේයයි, කීසේක. පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, මේ කීමේ අර්ථය කෙසේ දැනගත යුතුද?"

"මහරජ, ඒ කුමකැයි සිතන්නෙහිද? නුඹ විසිවයස් කල්හිද විය. පස්විසි වයස් කල්හිද හස්තිශිල්පයෙහිද දක්ෂවූයේ අශ්ව ශිල්පයෙහිද දක්ෂවූයේ රථ ශිල්පයෙහිද පුරුදුවූයේ දුනු ශිල්පයෙහිද කළ පුරුද්ද ඇත්තේ කඩු ශිල්පයෙහිද සමර්ථ වූයේ පාදයන්හිද බල ඇත්තේ අත්වලද බල ඇත්තේ යුද්ධයෙහි දක්ෂවූයේ යුද්ධ කිරීමට සමර්ථවූවෙක් වූයෙහිදැ"යි (ඇසුයේය.)

"පින්වත් රට්ටපාල ස්ථවිරයන් වහන්ස, මම විසිවයස් ඇතිකල්හි පස්විසි වයස් ඇතිකල්හි හස්ති ශිල්පයෙහිද දක්ෂ වූවෙක්, අශ්වශිල්පයෙහිද දක්ෂවූවෙක් රථනැගීමෙහිද පුහුණු වූවෙක් දුනු ශිල්පයෙහිද දක්ෂවූවෙක් කඩු ශිල්පයෙහිද කළ පුරුද්ද ඇත්තෙක් පාදයන්හිද බල ඇත්තෙක් අත්වලද බල ඇත්තෙක්ව යුද්ධයෙහි සූරයෙක්ද වීමි. යුද්ධ කිරීමටත් සමර්ථවීමි. පින්වත්වූ රට්ටපාල ස්ථවිරයන් වහන්ස, සමහර කලෙක මම ඍද්ධි ඇත්තෙකු මෙන් සිතමි. තමාගේ බලය හා සමවූ බල ඇත්තෙකු නොදක්නෙමියි" (කීයේය.)

**40.** "මහරජ, ඒ කුමකැයි හඟින්නෙහිද? නුඹ එපරිද්දෙන්ම දැන් පාදවල බල ඇත්තේ අත්වල බල ඇත්තේ, යුද්ධයෙහි ශූරවූයේ යුද්ධකරන්ට සමර්ථවූවෙක් වෙහිදැ"යි. (ඇසූයේය)

"පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, මෙය නොවේ මැයි, දැන් ජරාවෙන් දිරාගියේ වයසින් වැඩිවූයේ මහලුවූයේ

වයස් ඉක්ම ගියේ අන්තිම වයසට පැමිණියේ වෙමි. මට අසූවක් පමණ වයස්හි සිටිමි. පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, සමහර කලෙක මම මෙහි පය තබන්නෙමියි අන් තැනෙක්හිම පය තබමියි" (කීයේය)

**41.** "මහරජ, මේ සඳහා භාග්‍යවත්වූ සියල්ල දන්නාවූ ධර්මයන් දක්නාවූ ඒ සම්මා සම්බුදුන් විසින් ලෝවැසි තෙම ජරා මරණ දෙකම ගෙණයනු ලබන්නේය. ස්ථිර නොවේ යනු වදාරණ ලදී. මම ඒ කාරණය දැනද දැකද අසාද ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවූයෙමි" කීයේය.

"පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, ආශ්චර්යය, පින්වත් රට්ටපාල ස්ථවිරයන් වහන්ස පුදුමය. භාග්‍යවත්වූ සියල්ල දන්නාවූ සියලු ධර්මයන් දක්නාවූ අර්හත්වූ ඒ සම්මා සම්බුදුන් විසින් ලෝවැසි තෙම ජරා මරණ දෙකට ගෙණයනු ලබන්නේය. බොහෝ කල් නොපවත්නේය යන මේ කාරණය ඉතාම යහපත් කොට දෙශනා කරණලදී. පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, 'ලෝවැසි තෙම ජරා මරණ දෙක කරා ගෙණයනු ලබන්නේමය. බොහෝකල් නොපවත්නේමැයි"

**42.** "පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, අපට විපතක් පැමිණි කල්හි යම් කෙනෙක් ආරක්ෂාව පිණිස පවත්නාහුද? එබඳුවූ හස්ති සේනාවෝද අශ්ව සේනාවෝද රථ සේනාවෝද පාබල සේනාවෝද මේ රජකුලයෙහි ඇත්තාහ. ලෝවැසි තෙම ආරක්ෂාවක් නැත්තේ කිසිපිහිටක් නැත්තේයයි කියා පින්වත් රට්ඨපාල ස්ථවිර තෙමේ කීයේය. පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, මේ වචනයාගේ වනාහි අර්ථය කෙසේ දත යුතුදැයි" විචාළේය.

"මහරජ, ඒ කුමකැයි සිතන්නෙහිද? තොපගේ නොහැර පවත්නාවූ කිසියම් ආබාධයක් ඇත්තේදැයි" ඇසීය.

"පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, මාගේ නොහැර පවත්නාවූ වාතාබාධයෙක් ඇත්තේය. පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, සමහර කලෙක මා යහළු මිත්‍රයෝද නෑ

සහ ලේ නෑයෝද පිරිවරා දැන් කොරව්‍යනම් රජතෙම කලුරිය කරන්නේය. දැන් කොරව්‍යනම් රජතෙම කලුරිය කරන්නේයයි සිටියාහු වෙත්."

"මහරජ ඒ කුමකැයි හඟින්නෙහිද?" පින්වත්නි, "මාගේ යාළු මිත්‍රයෝද නෑ සහ ලේ නෑයෝද එත්වා. අවුත් මම යම්සේ ඉතා ටිකක් දුක් වේදනාව විඳින්නෙම්ද, (එසේ) මේ වේදනාව සියල්ලෝම බෙදා ගනිව්යයි" දුක් වේදනාව බෙදාදිය හැකි යාළු මිත්‍රයන් හෝ නෑසහ ලේ නෑයන් හෝ නුඹ ලබන්නෙහිද? නොහොත් නුඹම ඒ වේදනාව විඳින්නෙහිදැයි" (ඇසුවේය)

"පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, 'පින්වත්නි මාගේ මිත්‍රාමාත්‍යයෝද නෑ සහ ලේ නෑයෝද එත්වා. මම යම්සේ ඉතා ටිකක්වූ දුක් වෙදනාව විඳින්නෙම්ද, එසේ මේ වෙදනාව සියල්ලෝම බෙදාගනිව්යයි' බෙදාදිය හැකි යාළු මිත්‍රයන් හෝ නෑ සහ ලේ නෑයන් හෝ නොලබමි. මමම ඒ වේදනාව විඳිමියි" කීයේය.

43. "මහරජ, මේ සඳහා භාග්‍යවත්වූ සියල්ල දන්නාවූ සියලු ධර්මයන් දක්නාවූ අර්හත්වූ ඒ සර්වඥයන් වහන්සේ විසින් 'ලෝවැසිතෙම ආරක්ෂාවක් නැත්තේය පිහිටක් නැත්තේය'යි වදාරණ ලදී. මම ඒ කාරණය දැනද දැකද අසාද ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවූයෙමියි" කීයේය.

"පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, ආශ්චර්යයෙක පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, පුදුමයකි. භාග්‍යවත් වූ සියල්ල දන්නාවූ සියලු ධර්මයන් දක්නාවූ අර්හත්වූ ඒ කිසි පිහිටක් නැත්තේය' යන මේ කාරණය ඉතාම යහපත් කොට දෙශනා කරණ ලද්දේය. පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, ලෝවැසිතෙම ආරක්ෂාවක් නැත්තේමය. කිසි පිහිටක් නැත්තේමය.

44. "පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, මේ රාජ කුලයෙහි පොළොවෙහිද අහසෙහිද බොහෝ රන් රුවන් ඇත්තේමය. 'ලෝවැසිතෙම තමා සතු දෙයක් නැත්තේය. සියල්ල

හැර දමා යා යුතුයයි’ පින්වත් රට්ඨපාල ස්ථවිරතෙම කියේය. පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, මෙසේ කියන ලද වචනයාගේ අර්ථයතෙම කෙසේ දතයුත්තේදැයි ඇසීය.

“මහරජ, ඒ කුමකැයි හඟින්නෙහිද?

“නුඹ යම්සේ මෙකල්හි පඤ්චකාම සම්පත්තියෙන් යුක්තව සැප විඳින්නෙහිද? නුඹ පරලොවදිත් මෙපරිද්දෙන්ම මේ පඤ්චකාමසම්පත්තියෙන්ම යුක්තව සැප විඳීම ලබන්නෙහිද, නොහොත් අන්‍යයෝ මේ සම්පත්තිය පිළිපදින්නාහුය. නුඹ වනාහි කම්වූ පරිද්දෙන් මියපරලොව යන්නෙහි දැයි” කීයේය.

“පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, මම යම්සේ මෙකල්හි පඤ්චකාමසම්පත්තියෙන් සැප විඳින්නෙම්ද, පරලොව්හිද මෙපරිද්දෙන්ම මේ පඤ්චකාමසම්පත්තියෙන්ම යුක්තව සැප නොවිඳීම නොලබන්නෙමි. අන්‍යයෝ මේ සම්පත්තිය පිළිපදින්නාහුය. මම වනාහි කම්වූ පරිද්දෙන් මියපරලොව යන්නෙමියි” කීයේය.

“මහරජ, මෙ කාරණය සඳහා භාග්‍යවත්වූ සියල්ල දන්නාවූ සියලු ධර්මයන් දක්නාවූ අර්හත්වූ ඒ සර්වඥයන් වහන්සේ විසින් ‘ලෝවැසිතෙම තමා සතු දෙයක් නැත්තේය සියල්ල හැර යා යුතුයයි’ වදාරණ ලදී. මම ඒ කාරණය දැනද දැකද අසාද ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයෙමියි” කීයේය.

“පින්වත් රට්ටපාල ස්ථවිරයන් වහන්ස, ආශ්චර්යයය, පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, පුදුමය. භාග්‍යවත්වූ සියල්ල දන්නාවූ ධර්මයන් දක්නාවූ අර්හත්වූ ඒ සර්වඥයන් වහන්සේ විසින් වදාළ ලෝවැසිතෙම ස්වකීය වූවක් නැත්තේය. සියල්ල හැර දමා යා යුතුය යන මේ කාරණය ඉතාම යහපත්කොට වදාරණ ලදී. පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, ලෝවැසිතෙම, ස්වකීය වූවක් නැත්තේමැයි සියල්ල හැර දමා යා යුතුයයි” (කීයේය)

**45.** “ලෝවැසිතෙම නොපිරුණේ ඇතිවීමකට නොපැමිණියේ තණ්හාවට දාසවූයේ යයි, පින්වත් රට්ඨපාල

ස්ථවිර තෙමේ කීයේය. පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස මේ කීමේ අර්ථය කෙසේ දතයුතු දැයි" (විචාළේය.)

"මහරජ, ඒ කුමකැයි හඟින්නෙහිද? සමෘද්ධවූ කුරුරටට අධිපතිව වාසය කරන්නේදැයි" (ඇසීය.)

"පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, එසේය. සමෘද්ධවූ කුරුරටට අධිපතිව වාසය කරමියි" කීයේය.

"මහරජ ඒ කුමකැයි සිතන්නෙහිද? මෙහි තොපට නැගෙනහිර දිශාවෙන් ඇදහිය යුතුවූ විශ්වාස කටයුතුවූ පුරුෂයෙක් එන්නේය. හෙතෙම නුඹ කරා පැමිණ මෙසේ කියන්නේය. 'මහරජ, කාරණයක් දන්නෙහිද, මම නැගෙනහිර දිශාවෙන් එමි. ඒ දිශාවෙහි සමෘද්ධවූද, පිරුණාවූද බොහෝදෙනා ඇති මිනිසුන්ගෙන් ගැවසී ගත්තාවූ මහත්වූ ජනපදයක් දුටුවෙමි. එහි හස්ති සේනාවෝද අශ්ව සේනාවෝද රථ සේනාවෝද පාබල සේනාවෝද බොහෝ වෙත්. ඒ ජනපදයෙහි ඇත් අස් සෙනගද බොහෝය. එහි වැඩ කළා වූද වැඩ නොකළාවූද රත්රන් බොහෝය. එහි බොහෝ ස්ත්‍රී සමූහයා ඇත්තේය. මෙපමණවූ බලසෙනගකින් ජයගන්ටද හැක්කේය. මහරජ, ජයගනු මැනවැයි' (කියන්නේය.) එයට කුමක් කරන්නෙහිද?"

"පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, එයද දිනාගෙන වාසය කරම්හයි" කීයේය.

**46.** "මහරජ ඒ කුමකැයි හඟින්නෙහිද, මෙහි තොප වෙතට බස්නාහිර දිශාවෙන් ඇදහිය යුතු විශ්වාස කටයුතුවූ පුරුෂයෙක් එන්නේය. හෙතෙම නුඹ කරා පැමිණ මෙසේ කියන්නේය. 'මහරජ, කරුණක් දන්නෙහිද? මම බස්නාහිර දිශාවෙන් එමි. එහි සමෘද්ධවූද පිරුණාවූද බොහෝ දෙනා ඇති මිනිසුන් ගැවසීගත්තාවූ මහත්වූ ජනපදයක් දුටුවෙමි. එහි හස්ති සේනාවෝද අශ්ව සේනාවෝද රථ සේනාවෝද පාබල සේනාවෝද බොහෝ වෙත්. එහි ඇත් අස් සෙනගද බොහෝය. එහි වැඩ කළාවූද වැඩ නොකළාවූද රත්රන් බොහෝය, එහි බොහෝ ස්ත්‍රී සමූහයාද ඇත්තේය. මෙපමණ වූ බල සෙනඟකින්

ජය ගන්ටද හැක්කේය. මහරජ ජය ගණුවයි,' කියන්නේය. ඊට කුමක් නම් කරන්නෙහිදැයි," ඇසීය.

"පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, අපි ඒ ජනපදයද ජයගෙණ වාසය කරම්හයි" කීයේය.

**47.** "මහරජ ඒ කුමකැයි හඟින්නෙහිද? මෙහි තොපට බස්නාහිර දිශාවෙන්ද ඇදහිය යුතු විශ්වාස කටයුතුවූ පුරුෂයෙක් එන්නේය. හෙතෙම ඔබ කරා එළඹ මෙසේ කියන්නේය. 'එසේනම් මහරජ දන්නෙහිද? මම බස්නාහිර දිශාවෙන් එමි. එහි සමෘද්ධවූද, සම්පූර්ණවූද, බොහෝ ජනයා ඇති මිනිසුන්ගෙන් ගැවසී ගත් මහත්වූ ජනපදයක් දුටුවෙමි. එහි හස්ති සේනාවෝද, අශ්ව සේනාවෝද, රථ සේනාවෝද, පාබල සේනාවෝද, බොහෝ වෙත්. එහි හස්ති අශ්ව සමූහයා බොහෝය. එහි කළාවූද, නොකළාවූද, රත්රන් බොහෝය. එහි බොහෝ ස්ත්‍රී සමූහයාද ඇත්තේය. මෙපමණවූ මේ බලසෙනඟින් ජය ගන්නටද හැක්කේය. මහරජ ජය ගනුවයි කියන්නේය. ඊට කුමක් නම් කරන්නේදැයි" ඇසීය. "පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, අපි ඒ ජනපදයද ජය ගෙණ වාසය කරම්හයි" කීයේය. "උතුරු දිශාවෙන්ද මහරජ ඒ කුමකැයි සිතන්නේද? මෙහි තොපට ඇදහිය යුතු විශ්වාස කටයුතු වූ පුරුෂයෙක් එන්නේය. හෙතෙම ඔබ කරා එළඹ මෙසේ කියන්නේය. 'එසේනම් මහරජ, දන්නෙහිද? මම උතුරු දිශාවෙන් එමි. එහි සමෘද්ධවූද, සම්පූර්ණවූද, බොහෝ ජනයා ඇති මිනිසුන්ගෙන් ගැවසීගත් මහත්වූ ජනපදයක් දුටුවෙමි. එහි හස්ති සේනාවෝද, අශ්ව සේනාවෝද රථ සේනාවෝද පාබල සේනාවෝද බොහෝ වෙත්. එහි හස්ති අශ්ව සමූහයා බොහෝය. එහි කළාවූද නොකළාවූද, රත්රන් බොහෝය. එහි බොහෝ ස්ත්‍රී සමූහයාද ඇත්තේය. මෙපමණවූ මේ බල සෙනඟින් ජයගන්ටද හැක්කේය. මහරජ ජය ගනුවයි' කියන්නේය. ඊට කුමක් නම් කරන්නේදැයි" ඇසීය. "පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, අපි ඒ ජනපදයද ජය ගෙණ වාසය කරම්හයි" කීයේය.

**48.** "දකුණු දිශාවෙන්ද මහරජ ඒ කුමකැයි සිතන්නේද? මෙහි තොපට ඇදහිය යුතු විශ්වාස කටයුතුවූ පුරුෂයෙක් එන්නේය. හෙතෙම ඔබ කරා එළඹ මෙසේ කියන්නේය. 'එසේ නම් මහරජ, දන්නෙහිද? මම දකුණු දිශාවෙන් එමි. එහි සමෘද්ධවූද, සම්පූර්ණවූද, බොහෝ ජනයා ඇති මිනිසුන් ගෙන් ගැවසී ගත් මහත්වූ ජනපදයක් දුටුවෙමි. එහි ඇත් සේනාවෝද, අශ්ව සේනාවෝද, රථ සේනාවෝද, පාබල සේනාවෝද බොහෝ වෙත්. එහි හස්ති අශ්ව සමූහයා බොහෝය. එහි කළාවූද නොකළාවූද රත්රන් බොහෝය. එහි බොහෝ ස්ත්‍රී සමූහයාද ඇත්තේය. මෙපමණවූ මේ බලසෙනඟින් ජයගන්ට හැක්කේය. මහරජ, ජයගනුවයි කියන්නේය. 'එයට කුමක් නම් කරන්නෙහිදැයි" ඇසුවේය. "පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, අපි ඒ ජනපදයද ජය ගෙණ වාසය කරම්හයි" කීයේය.

**49.** මුහුද එතරින්ද ඇදහිය යුතු විශ්වාස කටයුතුවූ පුරුෂයෙක් එන්නේය. හෙතෙම නුවර කරා එළඹ මෙසේ කියන්නේය. "මහරජ, කරුණක් දන්නෙහිද? මම මුහුද එතරින් එමි. එහි සමෘද්ධවූද, සම්පූර්ණවූද බොහෝ ජනයා ඇති මිනිසුන්ගෙන් ගැවසී ගත් මහත් වූ ජනපදයක් දුටුවෙමි. එහි හස්ති සේනාවෝද, අශ්ව සේනාවෝද, රථ සේනාවෝද, පාබල සේනාවෝද බොහෝ වෙත්. එහි ඇත් අස් සමූහයා බොහෝය. එහි වැඩ කළාවූද, වැඩ නොකළාවූද රත්රන් බොහෝය. එහි බොහෝ ස්ත්‍රී සමූහයාද ඇත්තේය. මෙපමණවූ බල සෙනඟකින් ජයගන්ටද හැක්කේය. මහරජ, ජයගනු මැනවැයි' කියන්නේය. එයල කුමක් කරන්නෙහිදැයි" ඇසුයේය.

"පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, අපි ඒ ජනපදයද ජය ගෙණ වාසය කරම්හයි" කීයේය.

**50.** "මහරජ, මේ කාරණය සඳහා භාග්‍යවත්වූ සියල්ල දන්නාවූ සියලු ධර්මයන් දක්නාවූ අර්හත්වූ ඒ සර්වඥයන් වහන්සේ විසින් ලෝවැසි තෙම නොපිරුණේ වෙයි. සෑහීමට නොපැමිණියේ තණ්හාවට දාසවූයේ වේයයි වදාරණ ලදී. මම

ඒ කාරණය දැනද දැකද අසාද ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවූයේ"යි කීයේය.

"පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, ආශ්චර්යයය, පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, පුදුමය, භාග්‍යවත්වූ සියල්ල දන්නාවූ සියලු ධර්මයන් දක්නාවූ අර්හත්වූ ඒ සර්වඥයන් වහන්සේ විසින් වදාළ 'ලෝවැසි තෙම නොපිරුණේ වෙයි. සෑහීමකට නොපැමිණියේ තණ්හාවට දාසවූයේ වේය, යන කාරණය ඉතා යහපත් කොට වදාරණලදී. පින්වත් රට්ඨපාල ස්ථවිරයන් වහන්ස, ලෝවැසි තෙම නොපිරුණාවූ සිත් ඇත්තේමය. සෑහීමට නොපැමිණි සිත් ඇත්තේය. තෘෂ්ණාවට දාසව සිටියේයයි," කීය.

51. ආයුෂ්මත් රට්ඨපාල ස්ථවිරයන් වහන්සේ මෙය ප්‍රකාශ කළේය. මෙය ප්‍රකාශ කොට ඉක්බිති මේ ගාථාවන්ද වදාළේය.

1. "ලොකයෙහි යම් කෙනෙක් වස්තුව ලැබ මොහයෙන් නොදෙත්ද, ලොභොබිවූවාහු වස්තුව රැස් කිරීම කරත්ද, වැඩියක්ම කම්සැප විශෙෂයෙන් ප්‍රාර්ථනා කරත්ද, (එබඳු) වස්තු සහිතවූ මිනිසුන් දක්නෙමි.

2. "සාගර කෙළවර සහිතවූ පෘථිවිය බලාත්කාරයෙන් ජය ගෙණ මුහුද මෙතෙර පෘථිවියෙහි වාසය කරන්නාවූ රජතෙම සෑහීමට නොපැමිණි ස්වභාව ඇත්තේ මුහුදෙන් එතෙරද ප්‍රාර්ථනා කරන්නේය.

3. "රජතෙමේද අන්‍යවූ බොහෝ මිනිස්සුද පහනොවූ තෘෂ්ණාව ඇතිවම මරණයට පැමිණෙත්. නොපිරුණු බලාපොරොත්තු ඇතුවම සිරුර හරිත්. මේ ලොකයෙහි කම් සැපවලින් සෑහීමක් නම් නැත්තේය.

4. "ඔහුගේ නෑයෝ හිසකේ විසුරුවාගෙණ අපගේ නෑයෝ නොමැරෙන්නාහුනම් ඉතා යෙහෙකැයි කියා හඬත්. ඉන්පසු වස්ත්‍රයෙන් පොරවනලද ඒ මළ ශරීරය බැහැර කොට සෑයට නංවා දවන්නාහ.

5. "හෙතෙම එක් වස්ත්‍රයකින් යුක්තව සම්පත් හැරදමා හුල්වලින් අණිනු ලබන්නේ දවනු ලබයි. මේ ලොකයෙහි මැරෙනු ලබන්නහුට නෑයෝද මිත්‍රයෝද නොහොත් යහලුවෝද රක්ෂාස්ථාන නොවෙත්.

6. "උරුමක්කාරයෝ ඔහුගේ වස්තුව හැරගණිත්. සත්ව තෙමේ වනාහි කම්වූ පරිද්දෙන් යන්නේය. මැරෙනු ලබන්නහු සමග කිසි ධනයක් අනුව නොයන්නේය. පුත්‍රයෝද භාර්යාවෝද වස්තුවද රටද (යන මොහු කැටුව නොයන්නාහුය.)

7. "යම් හෙයකින් වස්තුව කරණ කොට ගෙණ දීර්ඝායුෂ නොබන්නේද වස්තුව කරණ කොටගෙණ ජරාව නොනසත්ද, එහෙයින් මේ ජීවිතය වනාහි ස්වල්පකාලයක් පවතියි, නුවණැත්තෝ අනිත්‍යය පෙරලෙන ස්වභාව ඇත්තේයයි කීහු.

8. "වස්තුවෙන් ආඪ්‍යවූවෝද දිලිඳුවූවෝද මරණයට පැමිණෙන්නාහුය. අඥාන තෙමෙද ඥානවන්ත තෙමේද එසේම මරණයට පැමිණෙන්නාහ. අඥාන පුද්ගලයා වනාහි නොකළ යුතුදේ කෙළෙමියයි කම්පා වෙමින් මරණයට පැමිණෙයි. නුවණැත්තේ මරණයෙන් කම්පා නොවේ.

9. "මේ ලොකයෙහි යම් ප්‍රඥාවකින් අවසානයයි කියනලද අර්හත් ඵලයට පැමිණෙන්නේද, එහෙයින් වනාහි ප්‍රඥාවම ධනයට වඩා උතුම්වන්නීය. ක්ලෙශයන් වියලීම නොකළ බැවින්ම කුදු මහත් භවයන්හි මුලාවීමෙන් පව්කම් කරන්නාහුය.

10. "හීන ප්‍රණීත වශයෙන් සංසාරයට පැමිණ පරම්පරා වශයෙන් මව්කුසද පරලොවද උපදියි. ඒ නුවණ නැති පුද්ගලයා තවත් නුවණ නැති පුද්ගලයෙක් අදහා ගනිමින් මව්කුසටද පරලොවටද පැමිණෙන්නේය.

11. "මංපැහැරීමේදී අල්ලා ගන්නාලද ලාමක ක්‍රියා ඇති සොරා තමාගේ ක්‍රියාවෙන් නසනුලැබේද එමෙන් ලාමක

ස්වභාවය ඇති සත්ව තෙමෙද මෙලොව පරලොව දෙක්හිම තමාගේ කර්මය විසින් නසනු ලැබේ.

12. "විසිතුරුවූ මිහිරිවූ සිත් සතුටුකරන්නාවූ කාමයෝ වනාහි විරූපවූ ස්වරූපයෙන් සිත කළඹත්. එහෙයින් මහරජ මම කාමගුණයන්හි දොෂය දැක පැවිදිවූයේ වෙමි.

13. "තරුණවූද මහළුවූද මානවකයෝ ශරීර භෙදයෙන් ගස්වල ගෙඩි මෙන් වැටෙන්නාහුය. මහරජ මේ කාරණයද දැක පැවිදිවූයේ වෙමි. නොවරදින මාර්ගයවූ ශ්‍රමණ භාවය උතුම් වන්නේය,"යි (වදාළේය)

**රට්ඨපාල සූත්‍රය නිමි.**

---

## 33. මඛාදෙව සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ මිථිලා නම් නගරයෙහි මඛාදෙව නම් අඹ උයනෙහි වැඩ වෙසෙත්. ඒ කාලයෙහි 'භාග්‍යවතුන් වහන්සේ එක්තරා තැනකදී සිනහ පහල කෙළේය. එහිදී ආයුෂ්මත් අනඳ තෙරුන්හට මේ සිත පහළ විය. භාග්‍යවතුන් වහන්සේගේ සිනහ පහල කිරීමට හේතුව කිම? කරුණ කිම? කරුණක් නැති කල්හි තථාගතවරයෝ සිනහ පහළ නොකෙරෙත්ය" කියාය.

එහිදී ආයුෂ්මත් ආනන්ද තෙමේ සිවුර ඒකාංශකොට පොරවා භාග්‍යවතුන් වහන්සේ දෙසට ඇඳිලි බැඳ වැඳ භාග්‍යවතුන් වහන්සේට මේ කාරණය කීය.

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේගේ සිනහ පහල කිරීමට හේතුව කිම? කරුණු කිම? තථාගතවරයෝ හේතුවක් නැතිව සිනහ පහල නොකෙරෙතියි" කියාය.

2. "ආනන්දය, පෙර දවස මේ මිථිලා නගරයෙහිම මඛාදෙව නම් රජෙක් වූයේය. ධාර්මිකවූ ධර්මයෙන් රජකම් කරන ධර්මයෙහි පිහිටි මහ රජෙක්ව බ්‍රාහ්මණ ගෘහපතියන් කෙරෙහිද

නියම් ගම් වැස්සන් කෙරෙහිද ජනපද වැස්සන් කෙරෙහිද ධර්මයෙන් පිළිපදියි.

"පක්ෂයෙහි තුදුස්වක් දිනයෙහිද පසලොස්වක් දිනයෙහිද අටවක් දිනයෙහිද සිල්සමාදන්ව වාසය කරයි.

"ආනන්දය, ඒ කාලයෙහි අවුරුදු බොහෝ ගණනක් අවුරුදු සියගණනක් අවුරුදු දහස් ගණනක් ගතවීමෙන් පසු මඛාදෙව රජ තෙමේ හිස රැවුල් කපන්නාට කථා කෙළේය. යහලුව, යම් දවසක මාගේ හිසෙහි පැසුණු හිසකෙස් වූවාහුද එකලී මට කියවයි' කීහ.

"ආනන්දය, 'දෙවයිනි, එසේයයි' හිස රැවුල් කපන්නා මඛාදෙව රජහට උත්තර දුන්නේය.

"ආනන්දය, බොහෝ අවුරුදු බොහෝ සියක් අවුරුදු බොහෝ දහසක් අවුරුදු ගතවීමෙන් හිස රැවුල් කපන්නා මඛාදෙව රජහුගේ හිසෙහි පැසුණු හිස කෙස් දිටීය, දැක මඛාදෙව රජහට දේවයන්හට දේවදූතයෝ පහළ වූවාහුය. හිසෙහි පැසුණු හිස කෙස් දක්නා ලැබෙත්යි" කීය. එසේ නම් යහළු ඒ පැසුණු කෙස් අඬුවෙන් ප්‍රවේශම්ව උදුරා මාගේ අතෙහි තබවයි" කීහ.

"ආනන්දය, දෙවයිනි, එසේයි' කියා ඇම්බැට්ට තෙමේ මඛාදෙව රජහට උත්තරදී ඒ පැසුණු කෙස් ප්‍රවේසමින් අඬුවෙන් උදුරා මඛාදෙව රජහුගේ අතේ තැබීය.

"ආනන්දය, එවිට රජවූ මඛදෙවතෙමේ ඇම්බැට්ටයාට ගම්වරයක්දී, වැඩිමහල් පුත් කුමරුට කථාකොට මෙසේ කීහ. දරුව කුමාරයිනි, මට දෙවදූතයෝ පහළ වූහ. හිසෙහි පැසුණු කෙස් දක්නා ලැබෙත්. මා විසින් මිනිස් කාම සම්පත් අනුභව කරණලදී. දැන් දිව්‍ය කාම සම්පත් සෙවීමට කාලය වෙයි.

'දරුව කුමාරය, එව. නුඹ මේ රාජ්‍යය පිළිගනුව. මම වනාහි කෙස් රැවුල් කපා හැර කසාවත් හැඳ පොරවා ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වන්නෙමි. දරුව කුමාරය. එසේම නුඹත්

යම් දවසක හිසෙහි පැසුණු හිස කෙස් දක්නෙහිද, එකල්හි ඇම්බැට්ටයාට ගම්වරක්දී දෙටු පුත් කුමරු යහපත් කොට රාජ්‍යයෙහි පිහිටුවා නොහොත් රජයෙන් අනුශාසනා කොට කෙස් රැවුල් කපාහැර කසාවත් හැඳ පොරවා ගිහිගෙන් නික්ම සාසනයෙහි පැවිදි වෙව. යම් හෙයකින් මා විසින් පිහිටුවන ලද මේ යහපත් පැවැත්ම අනුව පවත්නෙහිය. නුඹ මාගේ (වංශයෙහි) අන්තිම පුරුෂයා නොවෙව.

'දරුව කුමාරය, (මාගේ) වංශයෙහි උපන් යම් පුරුෂයෙකුගේ කාලයෙහි මේ යහපත් පැවතුමගේ සිඳීම වෙයි නම් හෙතෙම ඔවුන්ගේ අන්තිම පුරුෂයා වෙයි. දරුව කුමාරය, එහෙයින් ඔබට මම මෙසේ කියමි. යම් හෙයකින් මා විසින් පිහිටුවන ලද මේ යහපත් පැවැත්ම අනුව පවත්නෙහිය. නුඹ මාගේ (වංසයෙහි) අන්තිම පුරුෂයා නොවෙව'යි කීහ.

4. "එකල්හි ආනන්දය, මඛාදෙව රජතෙමේ ඇම්බැට්ටයාහට ගම්වර දී වැඩිමහල් පුත් කුමරු යහපත්ව රජයෙහි පිහිටුවා කෙස් රැවුල් කපාහැර කසාවත් හැඳ පොරවා මේ මඛාදෙව අඹ උයනෙහිම ගිහිගෙන් නික්ම පැවිදි වූයේය.

"හෙතෙම මෛත්‍රී සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කෙළේය. එසේම දෙවෙනි දිසාවද එසේම තුන්වෙනි දිසාවද එසේම සතරවැනි දිසාවදැයි මෙසේ උඩද යටද සරස දැයි සියලු කාලයෙහි සියලු තැන පැතිර පවත්නා බැවින් සියල්ල ඇත්තාවූ ලොකය මෛත්‍රිය සමග පවත්නාවූ මහත්වූ උසස් බවට පැමිණියාවූ ප්‍රමාණ නොකොට හැකිවූ වෛර නැත්තාවූ ක්‍රොධ රහිතවූ සිතින් පතුරුවා වාසය කෙළේය.

5. "කරුණාව සමග පැවැත්තාවූ සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කළේය. එසේම දෙවෙනි දිසාවද, එසේම තුන්වෙනි දිසාවද, එසේම සතර වෙනි දිසාවද මෙසේ උඩ යට සරස සියලු කාලයෙහි සියලු තැන පවත්නාවූ සියල්ල ඇත්තාවූ ලොකය මහත්වූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ වෛරනැත්තාවූ කරුණා සහගත සිතින් පතුරුවා වාසය කළේය. එක් දිසාවක් පතුරුවා වාසය කළේය. එසේම දෙවෙනි දිසාව

එසේම තුන්වෙනි දිසාවද, එසේම සතර වෙනි දිසාවද, මෙසේ උඩ යට සරස සියලු කාලයෙහි සියලු තැන පවත්නාවූ සියල්ල ඇත්තාවූ ලොකය මහත්වූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ වෛරනැත්තාවූ මුදිතා සහගත සිතින් පතුරුවා වාසය කළේය. මුදිතාව සමග පැවැත්තාවූ සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කළේය. එසේම දෙවෙනි දිසාවද එසේම තුන්වෙනි දිසාවද එසේම සතරවෙනි දිසාවද මෙසේ උඩ යට සරස සියලු කාලයෙහි සියලු තැන පවත්නාවූ සියල්ල ඇත්තාවූ ලොකය මහත්වූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ කරුණා සහගත සිතින් පතුරුවා වාසය කළේය. එක් දිසාවක් පතුරුවා වාසය කළේය, එසේම දෙවෙනි දිසාව, එසේම තුන්වෙනි දිසාවද, එසේම සතර වෙනි දිසාවද, මෙසේ උඩ යට සරස සියලු කාලයෙහි සියලු තැන පවත්නාවූ සියල්ල ඇත්තාවූ ලොකය මහත්වූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ මුදිතා සහගත සිතින් පතුරුවා වාසය කළේය. උපෙක්ෂාව සමග පැවැත්තාවූ සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කෙළේය. එසේම දෙවෙනි දිසාවද, එසේම තුන්වෙනි දිසාවද, එසේම සතරවෙනි දිසාවද මෙසේ උඩද යටද, සරසදැයි සියලු කාලයෙහි සියලු තැන පැතිර පවත්නා බැවින් සියල්ල ඇත්තාවූ ලොකය මහත්වූ උසස් බවට ගියාවූ ප්‍රමාණ කළ නොහැක්කාවූ වෛර නැත්තාවූ ව්‍යාපාද නැත්තාවූ උපේක්ෂා සහගත සිතින් පතුරුවා වාසය කෙළේය.

**6.** "ආනන්දය, මඛාදෙව රජතෙමේ වනාහි අසූහාර දහසක් අවුරුදු කුමාර ක්‍රීඩා කෙළේය. අසූහාර දහසක් අවුරුදු යුවරජකම කෙළේය. අසූහාර දහසක් අවුරුදු රජකම් කෙළේය. අසූහාර දහසක් අවුරුදු මේ මඛාදෙව අඹ උයනෙහිම ගිහිගෙන් නික්ම පැවිදිව බ්‍රහ්මචර්යාවෙහි හැසුරුණේය. හෙතෙමේ සතර බ්‍රහ්ම විහාර ධර්මයන් වඩා ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු බ්‍රහ්මලොකයට පැමිණියෙක් වූයේය.

"ඉක්බිති ආනන්දය, මඛාදෙව රජුගේ පුත්‍රතෙමේ බොහෝ අවුරුදු බොහෝ සියක් අවුරුදු බොහෝ දහසක් අවුරුදු ඉක්මවා ඇම්බැට්ටයාහට කථා කෙළේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

'යහලුව, යම් දිනක මාගේ හිසෙහි පැසුණු කෙස් දක්නෙහිද? එවිට මට කියවයි' කීය.

"ආනන්දය, 'දෙවයෙනි එසේය' කියා ඇම්බැට්ට තෙමේ මඛාදෙව රජුගේ පුත්‍රයාහට උත්තර දුන්නේය.

**7.** "ආනන්දය, බොහෝවූ අවුරුදු බොහෝවූ සියක් අවුරුදු බොහෝවූ දහස් අවුරුදු ඉක්ම ගිය තැන ඇම්බැට්ට තෙමේ මඛාදෙව රාජ පුත්‍රයාගේ හිසෙහි පැසුණ හිසකේ දිටීය. දැක මඛාදෙව රාජ පුත්‍රයාට දෙවයන් වහන්සේට දෙවදූතයෝ පහලවූහ. හිසෙහි පැසුණු හිසකේ දක්නා ලැබෙත්යයි' කීය.

'යහලුව, එසේ නම් ඒ පැසුණු හිසකේ ප්‍රවේශමින් අඬුවෙන් උදුරා මාගේ අතෙහි තබවයි' කීය.

"ආනන්දය, 'දෙවයෙනි, එසේය කියා ඇම්බැට්ටතෙම මඛාදෙවරාජ පුත්‍රයාහට උත්තරදී පැසුණු හිසකේ අඬුවෙන් ප්‍රවේසමින් උදුරා මඛාදෙවරාජ පුත්‍රයාගේ අතෙහි තැබීය.

"ඉක්බිති ආනන්දය, මඛාදෙවරාජ පුත්‍ර තෙමේ ඇම්බැට්ටයාට ගම්වරක් දී, වැඩිමහල් පුත් කුමරුට කථාකොට, පුත්‍රය, කුමාරයෙනි, මාහට දේවදූතයෝ පහලවූහ. හිසෙහි පැසුණු හිසකේ පෙණෙනි. මා විසින් මිනිස් කාමසම්පත් විඳින ලදී. දැන් දිව්‍ය කාම සම්පත් සොයන්නට කාලය වෙයි. පුත්‍ර කුමාරය, එව. නුඹ මේ රාජ්‍යය බාරගණුව. මම වනාහි කෙස් රැවුල් කපා කසාවත් හැඳ පොරවා ගිහිගෙන් නික්ම පැවිදි වන්නෙමියි' කීය.

'පුත්‍ර කුමාරයෙනි, එසේම යම්කලෙක නුඹද හිසෙහි පැසුණු කෙස් දක්නෙහිද එකල්හි ඇම්බැට්ටයාහට ගම්වරදී වැඩිමහල් පුත් කුමරු යහපත්සේ රාජ්‍යයෙහි පිහිටුවා කෙස් රැවුල් කපා හැර කසාවත් හැඳ පොරවා ගිහිගෙන් නික්ම පැවිදිවෙව. මා විසින් පිහිටුවන ලද මේ යහපත් පැවැත්ම අනුව පවත්නෙහිය. නුඹ මාගේ (වංශයෙහි) අන්තිම පුරුෂයා නොවේවා. පුත්‍ර කුමාරයිනි, (මාගේ) වංශයෙහි උපන් යම් පුරුෂයෙකුගේ කාලයෙහි මේ යහපත් පැවතුමගේ සිඳීම වේ නම් හෙතෙම

ඔවුන්ගේ අන්තිම පුරුෂයා වෙයි. එබැවින් දරුව කුමාරය, නුඹට මෙසේ කියමි. එහෙයින් නුඹ මා විසින් පිහිටුවන ලද මේ යහපත් පැවතුමට අනුව පවත්නෙහිය. නුඹ මාගේ (වංශයෙහි) අන්තිම පුරුෂයා නොවේවයි’ කීය.

“ඉක්බිති ආනන්දය, මඛාදෙව රජුගේ පුත්‍ර තෙමේ ඇම්බැට්ඨයාහට ගම්වරක් දී වැඩිමහල් කුමරු යහපත්ව රාජ්‍යහෙි පිහිටුවා කෙස් රැවුල් කපා හැර කසාවත් හැඳ පොරවා ගිහිගෙන් නික්ම මේ මඛාදෙව අඹ උයනෙහිදීම පැවිදි බවට පැමිණියේය.

8. “හෙතෙම මෛත්‍රිසහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කෙළේය. එසේම දෙවෙනි දිසාවද, එසේම තුන්වෙනි දිසාවද, එසේම සතරවෙනි දිසාවද, මෙසේ උඩද යටද සරසදැයි සියලු කාලයෙහි සියලු තැන පැතිර පවත්නා බැවින් සියල්ල ඇත්තාවූ ලොකය මෛත්‍රිය සමග පැවැත්තාවූ මහත්වූ උසස් බවට ගියාවූ ප්‍රමාණ කළ නොහැකිවූ වෛර නැත්තාවූ ක්‍රොධ රහිතවූ සිතින් පතුරුවා වාසය කෙළේය.

“කරුණා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කළේය. එසේම දෙවෙනි දිසාවද, එසේම තුන්වෙනි දිසාවද, එසේම සතරවෙනි දිසාවද, මෙසේ උඩ යට සරස සියලු කාලයෙහි සියලු තැන පවත්නාවූ සියල්ල ඇත්තාවූ ලොකය මහත්වූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ කරුණා සහගත සිතින් පතුරුවා වාසය කළේය. එක් දිසාවක් පතුරුවා වාසය කළේය. එසේම දෙවෙනි දිසාව එසේම තුන්වෙනි දිසාවද, එසේම සතරවෙනි දිසාවද, මෙසේ, උඩ යට සරස සියලු කාලයෙහි සියලු තැන පවත්නාවූ සියල්ල ඇත්තාවූ ලොකය මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ මුදිතා සහගත සිතින් පතුරුවා වාසය කළේය.

“උපෙක්ඛා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කෙළේය. එසේම දෙවෙනි දිසාවද, එසේම තුන්වෙනි දිසාවද, එසේම සතරවෙනි දිසාවද, මෙසේ උඩද යටද සරසද යන සියලු කාලයෙහි සියලු තැන පැතිර පවත්නා බැවින් සියල්ල

ඇත්තාවූ ලොකය උපෙක්ඛා සහගතවූ මහත්වූ උසස් බවට ගියාවූ පමණ කළ නොහැකිවූ වෛර නැත්තාවූ ක්‍රොධ රහිතවූ සිතින් පතුරුවා වාසය කෙළේය.

**9.** "ආනන්දය, මඛාදෙව රජුගේ පුත්‍ර තෙමේ චනාහි අවුරුදු අසූහාර දහසක් කුමාර ක්‍රීඩා කෙළේය. අසූහාර දහසක් අවුරුදු යුවරජකම් කෙළේය. අසූහාර දහසක් අවුරුදු රජකම් කෙළේය. අසූහාර දහසක් අවුරුදු ගිහිගෙන් නික්ම ශාසන පැවිදිව මේ මඛාදෙව අඹ උයනෙහිම බ්‍රහ්මචර්යාවෙහි හැසුරුණේය.

"හෙතෙම සතර බ්‍රහ්ම විහාර ධර්මයන් වඩා ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි බඹලොව පැමිණියෙක් වූයේය.

"ආනන්දය, මඛාදෙව රජුගේ දරුවන්ගේ දරුවන් පටන් කොට ඇති ඔහුගේ අසූහාර දහසක් පරම්පරාව මේ මඛාදෙව අඹ වනයෙහිම කෙස් රැවුල් කපා හැර කසාවත් හැඳ පොරවා ගිහිගෙන් නික්ම පැවිදි විය.

**10.** "ඔව්හු මෛත්‍රි සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කළහ. එසේම දෙවන දිසාවද, එසේම තුන්වැනි දිසාවද, එසේම සතරුවැනි දිසාවද, මෙසේ උඩද යටද සරසද සියලු කාලයෙහි සියලු තැන පැතිර පවත්නා බැවින් සියල්ල ඇත්තාවූ ලොකය මෛත්‍රී සහගතවූ විපුලවූ උසස්වූ ප්‍රමාණයක් නැත්තාවූ වෛර රහිතවූ ක්‍රොධ නැත්තාවූ සිතින් පතුරුවා වාසය කළහ.

"කරුණා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කළේය. එසේම දෙවෙනි දිසාවද, එසේම තුන්වෙනි දිසාවද එසේම සතරවෙනි දිසාවද, මෙසේ උඩ යට සරස සියලු කාලයෙහි සියලු තැන පවත්නාවූ සියල්ල ඇත්තාවූ ලොකය මහත්වූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ කරුණා සහගත සිතින් පතුරුවා වාසය කළේය. එක් දිසාවක් පතුරුවා වාසය කළේය. එසේම දෙවෙනි දිසාව එසේම තුන්වෙනි දිසාවද, එසේම සතරවෙනි දිසාවද, මෙසේ උඩ යට සරස සියලු කාලයෙහි සියලු තැන පවත්නාවූ සියල්ල ඇත්තාවූ

ලොකය මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ මුදිතා සහගත සිතින් පතුරුවා වාසය කළේය.

"මුදිතා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කළේය. එසේම දෙවෙනි දිසාවද, එසේම තුන්වෙනි දිසාවද එසේම සතරවෙනි දිසාවද, මෙසේ උඩ යට සරස සියලු කාලයෙහි සියලු තැන පවත්නාවූ සියල්ල ඇත්තාවූ ලොකය මහත්වූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ කරුණා සහගත සිතින් පතුරුවා වාසය කළේය. එක් දිසාවක් පතුරුවා වාසය කළේය. එසේම දෙවෙනි දිසාව එසේම තුන්වෙනි දිසාවද, එසේම සතර වෙනි දිසාවද, මෙසේ උඩ යට සරස සියලු කාලයෙහි සියලු තැන පවත්නාවූ සියල්ල ඇත්තාවූ ලොකය මහත්වූ මහත් බවට පැමිණියාවූ, අප්‍රමාණවූ වෛර නැත්තාවූ මුදිතා සහගත සිතින් පතුරුවා වාසය කළේය. උපෙක්ඛා සහගත සිතින් එක් දිසාවක් පැතිර විසූහ. එසේම දෙවන දිසාවද, එසේම තුන්වෙනි දිසාවද එසේම සතරවැනි දිසාවද, මෙසේ උඩද යටද සරසද සියලු කාලයෙහි සියලු තැන පැතිර පවත්නාවූ බැවින් සියල්ල ඇත්තාවූ ලොකය විපුලවූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ වෛර රහිතවූ ව්‍යාපාද රහිතවූ සිතින් පැතිර විසූහ.

11. "ඒ පරපුරෙහිවූ රජදරුවෝ අවුරුදු අසූහර දහසක් කුමාර ක්‍රීඩාකළහ. අසූහාරදහසක් අවුරුදු උපරජකම් කළාහුය. අසූහාර දහසක් අවුරුදු රජකම් කළාහුය. අසූහාර දහසක් අවුරුදු මේ මඛාදෙව අඹ වෙනෙහිම ගිහිගෙන් නික්ම පැවිදි වූවාහු බ්‍රහ්මචර්යාවෙහි හැසුරුණාහුය.

"ඔව්හු සතර බ්‍රහ්ම විහරණයන් වඩා ශරීරයාගේ බිඳීමෙන් පසු මරණින් මත්තෙහි බඹලොව උපන්නෝ වූහ.

"ඒ රජුන් අතරෙහි අන්තිම තැනැත්තේ නිමිනම් රජ වූයේය. හෙතෙම ධාර්මිකවූ දැහැමින් රජකරන්නාවූ කුශල ධර්මයෙහි පිහිටියාවූ මහ රජෙකි. බ්‍රාහ්මණ ගෘහපතියන් කෙරෙහිද නියම් ගම් වාසීන් කෙරෙහිද ජනපද වාසීන් කෙරෙහිද ධර්මයෙන් හැසිරෙයි. පක්ෂයෙහි තුදුස්වක් දිනයෙහිද, පසලොස්වක් දිනයෙහිද, අටවක් දිනයෙහිද, සිල් සමාදන්ව වෙසෙයි.

12. "ආනන්දය, පෙරවූවක් නම් සුධර්මානම් දිව්‍ය සභාවෙහි තව්තිසා දෙවියන් අතර මේ කථාව පහළවිය. 'පින්වත්නි, විදෙහ වැසියන්ට ඒකාන්තයෙන් ලාභයෙක. පින්වතුනි විදෙහරට වැසියන් විසින් යහපත් ලාභයක් ලබනලදී. ඔවුන්ගේ ධාර්මිකවූ ධර්මයෙන් රජකම් කරන්නාවූ තෙමේ කුසල ධර්මයෙහි පිහිටියාවූ මහ රජෙක්වූ නිමිරජ ගෘහපතියන් කෙරෙහිද, නියම් ගම් වාසීන් කෙරෙහිද, ජනපද වාසීන් කෙරෙහිද ධර්මයෙන් හැසිරෙයි. පක්ෂයෙහි තුදුස්වක් දිනයෙහිද, පසළොස්වක් දිනයෙහිද, අටවක් දිනයෙහිද සිල්සමාදන්ව වාසය කරයි.

"එකල්හි ආනන්දය, සක්දෙව්රජතෙම තව්තිසා දෙවියන්ට කථාකෙළේය. කථාකොට 'නිදුකාණෙනි, තෙපි නිමිරජ දක්නට කැමතිවන්නහුදැයි' (ඇසීය).

"එකල්හි වනාහි හිස සිට ස්නානය කළාවූ නිමි රජතෙමේ පසළොස්වක් පොහොදිනයෙහි උපොසථ සිල්සමාදන්ව ප්‍රාසාදයෙහි මතුමහල් තලයෙහි හුන්නේ වෙයි.

13. ආනන්දය, එකල්හි සක්දෙව් රජතෙමේ යම්සේ බලවත් පුරුෂයෙක් හකුලන ලද අත හෝ දික්කරන්නේද දික්කරණ ලද අත හෝ හකුළන්නේද එපරිදි තව්තිසා දෙවියන් අතරෙන් අතුරුදන්ව නිමි රජු ඉදිරියෙහි පහළ විය.

"එකල්හි ආනන්දය, සක්දෙව්රජ තෙම නිමි රජුට මේ කාරණය කීයේය.

'මහරජ, ඔබට ලාභයෙක, මහරජ ඔබ විසින් යහපත් ලාභයක් ලබන ලදී. මහරජ තව්තිසා දෙව්ලොව දෙවියෝ සුධර්මා නම් දිව්‍යසභාවෙහි ඔබගේ ගුණ කියමින් හුන්නාහුය.

'පින්වත්නි, විදෙහ වැස්සන්ට ඒකාන්තයෙන් ලාභයෙක. පින්වත්නි, විදෙහ වැසියන් විසින් යහපත් ලාභයක් ලබන ලදී. ඔවුන්ගේ ධාර්මිකවූ ධර්මයෙන් රජකම් කරන්නාවූ කුශලධර්මයෙහි පිහිටියාවූ මහරජවූ නිමි රජතෙම බ්‍රාහ්මණ ගෘහපතියන් කෙරෙහිද නිගමවාසීන් කෙරෙහිද ජනපද වාසීන් කෙරෙහිද ධර්මයෙන් හැසිරෙයි.

'පක්ෂයෙහි තුදුස්වක් දිනයෙහිද, පසලොස්වක් දිනයෙහිද, අටවක් දිනයෙහිද, උපොසථ සිල් සමාදන්ව වාසය කරයි (යනුවෙනි) මහරජ, තව්තිසාදෙවියෝ ඔබ දකිනු කැමැත්තෙ වෙති. මහරජ, ඒ ඔබට මම දහසක් අසුන් යොදනලද උතුම් රථයක් එවන්නෙමි. මහරජ, දිව්‍යයානාවට බයක් නැතිව නගිනු මැනවැයි' කීය.

14. "ආනන්දය, නිමි රජ තෙමේ තුෂ්ණිම් භාවයෙන් ඉවසීය. එවිට ආනන්දය, සක්දෙව් රජතෙමේ නිමි රජුගේ ඉවසීම දැන බලවත් පුරුෂයෙක් තෙම යම්සේ හකුලන ලද අත හෝ දික්කරන්නේද, දික්කරණ ලද අත හෝ හකුලන්නේද එපරිද්දෙන් නිමි රජු ඉදිරියෙහි අතුරුදන්වූයේ තව්තිසාවෙහි දෙවියන් අතරෙහි පෙණී ගියේය.

"එකල්හි ආනන්දය, සක්දෙව් රජතෙමේ මාතලි දිව්‍යපුත්‍රයාට කථාකෙළේය. කථාකොට යහලුව මාතලිය, (මෙහි) එව නුඹ දහසක් අසුන් යොදනලද රථය පැදගෙණ ගොස් නිමි රජු කරා එළඹ මෙසේ කියව.

'මහරජ, දහසක් අසුන් යොදනලද මේ උතුම් රථය සක්දෙව්රජ විසින් ඔබට එවන ලදී. මහරජ, නිර්භයව දිව්‍ය රථයට නගිනු මැනව,' කියාය. 'පින්වතුන් වහන්ස එසේයයි' මාතලි දිව්‍යපුත්‍රතෙමේ සක්දෙව් රජහට උත්තරදී දහසක්අසුන් යොදනලද රථය පැදගෙණ නිමි රජු කරා පැමිණ මේ කාරණය කීය.

"මහරජ, දහසක් අසුන් යොදනලද මේ රථය සක්දෙව්රජ විසින් එවනා ලද්දේය. මහරජ භය නැතිව දිව්‍ය රථයට නගිනු මැනව. මහරජ, තවද යම් මගක පව්කම් කළ සත්වයෝ පව්කම්වල විපාක විඳිත්ද, යම් මගක පින්කම් කළ සත්වයෝ පින්කම්වල විපාක විඳිත්ද (ඒ දෙමගින්) කවර මගකින් ඔබ ගෙණයම්ද?, 'මාතලිය, ඒ දෙමගින්ම මා ගෙණයවයි' කීය. "ආනන්දය මාතලි දිව්‍ය පුත්‍ර තෙමේ නිමි රජුහු සුධර්මානම් දිව්‍ය සභාවට පැමිණවීය.

15. "ආනන්දය, සක්දෙව්රජ තෙම එන්නාවූ නිමි රජ දුරදීම දිටීය. දැක නිමි රජුට මෙසේ කීය. මහරජ එනු මැනව. මහරජ ඔබගේ යහපත් පැමිණීමක්ය.

"මහරජ, තව්තිසා දෙවියෝ සුධර්මා නම් දිව්‍ය සභාවෙහි ඔබගේ ගුණ කියමින් හුන්නාහුය. (කෙසේදයත්) 'පින්වතිනි, විදෙහ වැසියන්හට ඒකාන්තයෙන් ලාභයෙක පින්වත්නි, විදෙහ වැසියන් විසින් යහපත් ලාභයක් ලබනලදී.

'දැහැමිවූ ධර්මයෙන් රජකම් කරන්නාවූ කුසල ධර්මයෙහි පිහිටියාවූ මහරජවූ නිමි රජතෙමේ බ්‍රාහ්මණ ගෘහපතියන් කෙරෙහිද, නියම් ගම්වාසීන් කෙරෙහිද, ජනපද වාසීන් කෙරෙහිද ධර්මයෙහි හැසිරෙයි.

'පක්ෂයෙහි තුදුස්වක් දිනයෙහිද, පසළොස්වක් දිනයෙහිද අටවක් දිනයෙහිද උපොසථ සිල් සමාදන්ව වෙසෙයි.

'මහරජ තව්තිසා දෙවියෝ ඔබගේ දැකීම කැමැත්තෝය මහරජ දෙවියන් අතරෙහහි දෙවියන්ගේ ආනුභාවයෙන් සතුටු වන මැනවැයි' (කීය)

'නිදුකානෙනි, කම්නැත. මා මිථිලා නුවරට නැවත ගෙණ යේවා. එහි බ්‍රාහ්මණ ගෘහපතියන් කෙරෙහිද නියම් ගම් වැස්සන් කෙරෙහිද ජනපද වැස්සන් කෙරෙහිද ධර්මයෙහි හැසිරෙන්නෙමි.

'පක්ෂයෙහි තුදුස්වක් දිනයෙහිද, පසළොස්වක් දිනහිද අටවක් දිනෙහිද, උපොසථ සිල් සමාදන්ව වෙසෙන්නෙමි.'

"ඉක්බිති ආනන්දය, සක්දෙව් රජතෙමේ මාතලි දිව්‍ය පුත්‍රයා කැඳවීය. 'යහලු මාතලිය' (මෙහි) එව. නුඹ දහසක් අසුන් යොදන රථයෙහි අසුන් යොදා නිමි රජ එහි මිථිලාවට ආපසු පමුණුවයි' කීය.

"ආනන්දය, 'පින්වත එසේය' කියා මාතලී දිව්‍ය පුත්‍රතෙම සක්දෙව්රජ හට උත්තර දී දහසක් අසුන් යොදන රථයෙහි අසුන් යොදා නිමි රජු එහි මිථිලාවට ආපසු පැමිණවීය.

16. "ආනන්දය, එකල්හි වනාහි නිමි රජතෙමේ බ්‍රාහ්මණ ගෘහපතියන් කෙරෙහිද, නියම් ගම් වැස්සන් කෙරෙහිද, ජනපද වැස්සන් කෙරෙහිද ධර්මයෙහි හැසිරෙයි. පක්ෂයෙහි තුදුස්වක් දිනෙහිද පසළොස්වක් දිනෙහිද අටවක් දිනෙහිද අෂ්ටාංග සීලය සමාදන්ව වාසය කරයි.

"එකල්හි ආනන්දය, නිමි රජතෙමේ බොහෝවූ අවුරුදු සියක් බොහෝ අවුරුදු බොහෝවූ දහසක් අවුරුදු ගතවීමෙන් ඇම්බැට්ටයාට කථා කළේය. 'යහලුව, දවසක මාගේ හිසෙහි පැසුණු කෙහෙ දක්නෙහිනම් එකල්හි මට කියවයි' කීය.

"ආනන්දය, 'දෙවයෙනි එසේය' කියා ඇම්බැට්ටතෙමේ නිමිරජහට උත්තර දුන්නේය. "ආනන්දය, බොහෝවූ අවුරුදු බොහෝවූ සියක් අවුරුදු බොහෝවූ දහසක් අවුරුදු ගතවීමෙන් පසු නිමි රජුගේ හිසෙහි පැසුණු හිසකේ දුටුවේය. දැක නිමි රජුට මේ කාරණය කීය.

'දෙවයන්හට දෙවදූතයෝ පහළවූහ. හිසෙහි පැසුණු හිසකේ දක්නට ලැබෙත්යි' කීය. යහලුව, එසේනම් ඒ පැසුණු හිසකේ අඬුවෙන් ප්‍රවේසමින් උදුරා මාගේ අතෙහි තබවයි' කීය.

"ආනන්දය, 'දෙවයෙනි එසේය' කියා ඇම්බැට්ටතෙම නිමි රජහට උත්තරදී ඒ පැසුණු හිසකේ ප්‍රවේසමින් අඬුවෙන් උදුරා නිමි රජුගේ අතෙහි තැබීය.

"එකල්හි ආනන්දය, නිමි රජ ඇම්බැට්ටයාට ගම්වරක් දී වැඩිමහලු පුත් කුමරු කැඳවා මෙසේ කීවාය.

'පින්වත් කුමර, මට දේවදූතයෝ පහළවූහ. හිසෙහි පැසුණු කෙස් දක්නා ලැබෙති. මා විසින් මිනිස් කාම සම්පත් විඳින ලද්දාහ. දිව්‍යමයවූ කාම සම්පත් සොයන්ට කාලයවේ. දරුව කුමාරය, එව මේ රාජ්‍යය පිළිගනුව. මම වනාහි කෙස් රැවුල් කපාහැර කසාවත් හැඳ පොරවා ගිහි ගෙන් නික්ම පැවිදි වන්නෙමි.

'පින්වත් කුමාරය, එසේම යම් කලෙක්හි නුඹත් හිසෙහි පැසුණු කෙහෙ දක්නෙහිද එකල්හි ඇම්බැට්ටයාහට ගම්වරක්

දී වැඩිමහළු කුමරු රාජ්‍යයෙහි පිහිටුවා කෙස් රැවුල් කපා කසාවත් හැඳ පොරවා ගිහිගෙන් නික්ම පැවිදි වන්නෙහිය.

'මා විසින් පිහිටුවන ලද මේ යහපත් පැවතුමට අනුව පැවතව. නුඹ මාගේ වංශයෙහි අන්තිම පුරුෂයා නොවෙව.

'දරුව කුමාරය, වංශයෙහිවූ යම් පුරුෂයෙකුගේ කාලයෙහි මේ යහපත් පැවතුමයාගේ සිඳීමෙක් වේද? හෙතෙම ඔවුන් අතරෙහි අන්තිම පුරුෂයා වෙයි. දරුව කුමර ඔබට ඒ නිසා මම මෙසේ කියමි.

'යම් හෙයකින් මා විසින් පිහිටුවන ලද මේ යහපත් පැවතුමට අනුව පවතුව. නුඹ මාගේ (වංශයෙහි) අන්තිම පුරුෂයා යනු වෙව' (කියාය.)

17. "ඉක්බිති ආනන්දය, නිමි රජ තෙමේ ඇම්බැට්ටයාහට ගම්වරක්දී වැඩිමහලු පුත් කුමරු රාජ්‍යයෙහි පිහිටුවා මේ මඛාදෙව අඹවෙනෙහිම කෙස් රැවුල් කපා හැර කසාවත් හැඳ ගිහිගෙන් නික්ම ශාසනයට පැමිණියේය.

"හෙතෙම මෛත්‍රී සහගත සිතින් එක්දිසාවක් පතුරුවා වාසය කෙළේය. එසේම දෙවෙනි දිසාවද, එසේම තෙවෙනි දිසාවද, එසේම සිව්වෙනි දිසාවද, මෙසේ උඩද යටද හරහදැයි සියලු කාලයෙහි සියළු තැන පැතිර පවත්නා බැවින් සියල්ල ඇත්තාවූ ලොකය මෛත්‍රී සහගතවූ, මහත්වූ උසස් බවට පැමිණියාවූ, ප්‍රමාණ නොකොට හැක්කාවූ, වෛර නැත්තාවූ ක්‍රොධ රහිතවූ, සිතින් පතුරුවා වාසය කෙළේය. කරුණා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කළේය. එසේම දෙවෙනි දිසාවද, එසේම තුන්වෙනි දිසාවද, එසේම සතරවෙනි දිසාවද, මෙසේ උඩ යට සරස සියලු කාලයෙහි සියලු තැන පවත්නාවූ සියල්ල ඇත්තාවූ ලොකය මහත්වූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ කරුණා සහගත සිතින් පතුරුවා වාසය කළේය. එක් දිසාවක් පතුරුවා වාසය කළේය. එසේම දෙවෙනි දිසාවද, එසේම තුන්වෙනි දිසාවද, එසේම සතරවෙනි දිසාවද, මෙසේ උඩ යට සරස සියලු කාලයෙහි සියලු තැන

පවත්නාවූ සියල්ල ඇත්තාවූ ලොකය මහත්වූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ මුදිතා සහගත සිතින් පතුරුවා වාසය කළේය.

මුදිතා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කළේය. එසේම දෙවෙනි දිසාවද, එසේම තුන්වෙනි දිසාවද එසේම සතරවෙනි දිසාවද, මෙසේ උඩ යට සරස සියලු කාලයෙහි සියලු තැන පවත්නාවූ සියල්ල ඇත්තාවූ ලොකය මහත්වූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ කරුණා සහගත සිතින් පතුරුවා වාසය කළේය. එක් දිසාවක් පතුරුවා වාසය කළේය. එසේම දෙවෙනි දිසාවද, එසේම තුන්වෙනි දිසාවද, එසේම සතරවෙනි දිසාවද, මෙසේ උඩ යට සරස සියලු කාලයෙහි සියලු තැන පවත්නාවූ සියල්ල ඇත්තාවූ ලොකය මහත්වූ මහත් බවට පැමිණියාවූ අප්‍රමාණවූ වෛර නැත්තාවූ මුදිතා සහගත සිතින් පතුරුවා වාසය කළේය.

උපෙක්ඛා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කෙළේය. එසේම දෙවෙනි දිසාවද, එසේම තෙවෙනි දිසාවද, එසේම සතරවෙනි දිසාවද, යන මෙසේ උඩද යටද හරහදැයි සියලු කාලයෙහි සියලු තැන පැතිර පවත්නා බැවින් සියල්ල ඇත්තාවූ ලොකය මහත්වූ උසස් බවට ගියාවූ ප්‍රමාණ කළ නොහැක්කාවූ වෛර නැත්තාවූ ව්‍යාපාද නැත්තාවූ උපෙක්ඛා සහගත සිතින් පතුරුවා වාසය කෙළේය.

18. "ආනන්දය, නිමි රජ වනාහි අවුරුදු සූඅසූසාරදහසක් කුමාර ක්‍රීඩා කෙළේය. අවුරුදු සූඅසූසාරදහසක් යුවරජකම් කෙළේය. අවුරුදු සූඅසූසාරදහසක් රජකම් කෙළේය. අවුරුදු සූඅසූසාරදහසක් මේ මඛාදෙව අඹ උයනෙහිම ගිහිගෙන් නික්ම පැවිදිව බ්‍රහ්මචර්යාවෙහි හැසුරුණේය.

'හෙතෙම සතර බ්‍රහ්ම විහාර ධර්මයන් වඩා ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි බඹලොවට පැමිණියෙක් වූයේය.

19. "ආනන්දය, නිමි රජහට වනාහි කලාර ජනක නම් පුත්‍රයෙක් වී. හෙතෙම ගිහිගෙන් නික්ම පැවිදි නොවීය. හෙතෙම

ඒ යහපත් පැවතුම සිඳදැමීය. හෙතෙම ඔවුන් අතර අන්තිම පුරුෂයා විය.

**20.** "ආනන්දය, ඔබට මෙබඳු අදහසෙක් විය හැක්කේය. (එනම්) ඒ කාලයෙහි යමෙක් ඒ යහපත් පැවතුම පිහිටු වූයේද (ඒ) මඛාදෙව රජ තෙමේ ඒකාන්තයෙන් අන් කෙනෙක් වූයේද (කියායි). ආනන්දය, ඒ කාරණය වනාහි එසේ නොදතයුතුය.

"ඒ කාලයෙහි මම මඛාදෙව රජවීමි. මම ඒ යහපත් පැවතුම ඇතිකෙළෙමි. මා විසින් පිහිටුවන ලද ඒ යහපත් පැවතුමට අනුව පසු ජනතෙම පැවතුනේය.

**21.** "ආනන්දය, ඒ යහපත් පැවතුම් කලකිරීමය පිණිස නොඇලීම පිණිස, භව නිරොධය කෙලෙස් සංසිඳීම පිණිස, විශෙෂ ඥාණය පිණිස, අවබොධය පිණිස, නිර්වාණය පිණිස නොපවතී. යම්තාක් බ්‍රහ්මලෝකෝත්පත්තිය පිණිස වෙයි.

"ආනන්දය, දැන් වනාහි මා විසින් පිහිටුවන ලද මේ යහපත් පැවතුම වනාහි ඒකාන්තයෙන් කලකිරීම පිණිස, නොඇලීම පිණිස, භව නිරොධය පිණිස, කෙලෙස් සංසිඳීම පිණිස, විශෙෂ ඥාණය පිණිස, අවබොධය පිණිස, නිර්වාණය පිණිස පවතී.

"ආනන්දය, දැන් වනාහි මා විසින් පිහිටුවනලද ඒකාන්තයෙන් කලකිරීම පිණිස, නොඇලීම පිණිස, භව නිරොධය පිණිස, කෙලෙස් සංසිඳීම පිණිස, විශෙෂ ඥාණය අවබොධය පිණිස, නිර්වාණය පිණිස පවතින ඒ යහපත් පැවතුම කවරේද?

"මේ අංග අටක් ඇති ආර්ය මාර්ග එනම් යහපත් දැකීම යහපත් කල්පනාව, යහපත් වචනය, යහපත් කර්මාන්තය යහපත් ජීවිකාව, යහපත් උත්සාහය, යහපත් සිහිය, යහපත් සමාධිය යන මොව්හුය.

"ආනන්දය, දැන් මා විසින් පිහිටුවන ලද මේ යහපත් පැවතුම් ඒකාන්තයෙන් කලකිරීම පිණිස, නොඇලීම පිණිස,

භව නිරොධය පිණිස, කෙලෙස් සංසිඳීම පිණිස, විශේෂ ඥාණය පිණිස, අවබොධය පිණිස, නිර්වාණය පිණිස පවතියි.

22. "ආනන්දය, මම වනාහි නුඹට මෙසේ කියමි. මා විසින් පිහිටුවන ලද මේ යහපත් පැවතුමට අනුව පවතිව්. තෙපි මාගේ (වංශයෙහි) අන්තිම පුරුෂයෝ නොවව්. ආනන්දය, (මාගේ) වංශයෙහිවූ යම් පුරුෂයෙකුගේ කල්හි මෙසේවූ යහපත් පැවතුමගේ සිඳීයාම වෙයිද? හෙතෙම ඔවුන් අතර අන්තිම පුරුෂයා වෙයි.

"ආනන්දය, එහෙයින් තොපට මම මෙසේ කියමි. මා විසින් පිහිටුවන ලද මේ යහපත් පැවතුමට අනුව පවතිව්. තෙපි මාගේ (වංශයෙහි) අන්තිම පුරුෂයෝ නොවව්." (කියාය)

භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළේය. සතුටුවූ ආයුෂ්මත් ආනන්ද ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටු විය.

මඛාදෙව සූත්‍රය නිමි (4-3)

---

## 34. මාධුර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කාලයක ආයුෂ්මත් මහා කාත්‍යායණ ස්ථවිරයන් වහන්සේ මධුරා නගරය සමීපයෙහිවූ ගුන්ද වනයෙහි වැඩ වාසය කරයි.

ශ්‍රමණ භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්සේ මධුරා නුවර සමීපයෙහිවූ ගුන්ද වනයෙහි වැඩ වාසය කරතියි මධුරාවෙහි රජවූ අවන්ති පුත්‍රතෙමේ ඇසී.

"ඒ පින්වත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්සේ පිළිබඳව පණ්ඩිතයෙක, දක්ෂයෙක නුවණ ඇත්තෙක, බොහෝ ඇසූ පිරූතැන් ඇත්තෙක, විසිතුරු කථා ඇත්තෙක, යහපත් වැටහීම් ඇත්තෙක, වයසින් වැඩි සිටි රහත් කෙනැකැයි' මෙසේ උස්ව

නැගුණ යහපත් කීර්ති ශබ්දයෙක් ඇත්තේ වෙයි. එබඳුවූ රහතන්ගේ පැතීම යහපත්යයි සිතීය.

ඉක්බිති මධුරාවෙහි රජවූ අවන්ති පුත්‍ර තෙමේ හොඳ හොඳ යානාවන් යොදවා හොඳ යානාවකට නැග හොඳ හොඳ යානාවන් පිරිවරා මහත් රාජානුභාවයෙන් යුක්තව ආයුෂ්මත් මහා කාත්‍යායණ ස්ථවිරයන් දකිනු පිණිස මධුරා නගරයෙන් පිටත්ව ගියහ. යානාවෙන් යාමට සුදුසු තැන් දක්වා යානාවෙන් ගොස් යානාවෙන් බැස ආයුෂ්මත් මහා කාත්‍යායණ ස්ථවිරයන් වහන්සේ යම් තෙනකද එතනට පයින්ම පැමිණියේය.

පැමිණ ආයුෂ්මත් මහා කාත්‍යායණ ස්ථවිරයන් සමග සතුටු විය. සතුටුවිය යුතු සිහිකළ යුතු කතාව කොට අවසන් කොට එක්පසෙක්හි හුන්නේය.

2. එක්පසෙක හිඳගත් මධුරාවෙහි රජවූ අවන්ති පුත්‍රතෙමේ ආයුෂ්මත් මහා කාත්‍යායණ ස්ථවිරයන් වහන්සේට මෙසේ කීය.

'භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, බ්‍රාහ්මණයෝ මෙසේ කියන්නාහු වෙති. (එනම්) 'බ්‍රාහ්මණයෝ උසස් ජාතිය වෙත්. අනංගයා පහත් ජාතිය වෙත්. බ්‍රාහ්මණයෝම පිරිසිදු ජාතිය වේ. අනංගයා අපිරිසිදු ජාතිය වේ. බ්‍රාහ්මණයෝම පිරිසිදු වෙත්. බ්‍රාහ්මණ නොවන්නෝ පිරිසිදු නොවෙත්. බ්‍රාහ්මණයෝම බ්‍රහ්මයාගේ ලයෙහි හැදුනාවූ මුඛයෙන් උපන් බ්‍රහ්මයාගෙන් හටගත්. බ්‍රාහ්මයා විසින් මවනලද බ්‍රහ්මයා දායාද කොට ඇත්තෝ වෙත්.' (කියාය) මේ ගැන පින්වත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්සේ කුමක් කියන්නේද ඇසීය.

3. "මහරජ, බ්‍රාහ්මණයෝම උතුම් ජාතියවේ. අන්‍යයෝ පහත් ජාතීහුය. බ්‍රාහ්මණයෝම පිරිසිදු ජාතිය වේ. අනික් ජාති අපිරිසිදුය. බ්‍රාහ්මණයෝම පිරිසිදු වෙත්. බ්‍රාහ්මණ නොවන්නාහු පිරිසිදු නොවෙත්. බ්‍රාහ්මණයෝම බ්‍රාහ්මණයාගේ ලයෙහි සැදුනු පුත්‍රයෝය. මුඛයෙන් උපන්නෝය. බ්‍රහ්මයාගෙන් හටගත්තෝය. බ්‍රහ්මයා විසින් මවන ලද්දෝය. බ්‍රහ්මයා දායාද කොට ඇත්තෝය. යනු ලොකයෙහි පවත්නා ව්‍යවහාර මාත්‍රයෙක්මය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

"මහරජ! ලොකයෙහි බ්‍රාහ්මණයෝම උතුම් ජාතිය වේ. අනික් ජාතීහු පහත්ය. පිරිසිදු කුලය බ්‍රාහ්මණයෝමය. අන්‍ය කුල කෘෂ්ණය. බ්‍රාහ්මණයෝම සුද්ධියට පැමිණෙති. බ්‍රාහ්මණ නොවන්නාහු නොපැමිණෙති. බ්‍රාහ්මණයෝම බ්‍රහ්මයාගේ පුත්‍රයෝය. උරෙහි හටගත්තෝය. මුඛයෙහි උපන්නෝය. බ්‍රහ්මයාගෙන් හටගත්තෝය. බ්‍රහ්මයා විසින් මවන ලද්දෝය. බ්‍රහ්මයා දායාද කොට ඇත්තෝය. යන මේ ව්‍යවහාර මාත්‍රයක්ය යනු මේ ආකාරයෙන් දතයුතු.

**4.** "මහරජ, ඔබ කුමකැයි සිතන්නෙහිද? ක්ෂත්‍රියෙක හෝ ධනයෙන්ද, ධාන්‍ය හෝ රිදීයෙන්ද, රත්රනින්ද, සමෘද්ධ වන්නේ නම් ඔහුට ක්ෂත්‍රියාද පළමු නින්දෙන් නැගිටින පසුව නින්දට යන කීකරු සිත්සේ හැසිරෙන ප්‍රිය වචන කියන්නාවූ සේවකයෙක් වන්නේද? බ්‍රාහ්මණයාද ඔහුට පෙරටුව නින්දෙන් නැගිටින, පසුව නින්දට යන, සොයා බලා කටයුතු කරන සිත් පරිදි හැසිරෙන ප්‍රිය වචන කියන්නෙක් වන්නේද? වෛශ්‍ය තෙමේ පවා මේ ධණවත් ක්ෂත්‍රියාහටපෙරටුව නින්දෙන් නැගිටින පසුව නින්දට යන, සොයා බලා කටයුතු කරන සිත් පරිදි හැසිරෙන ප්‍රියවචන කියන්නෙක් වන්නේද ශුද්‍රයාද ඔහුට සිත් සේ හැසිරෙන ප්‍රිය වචන කියන්නාවූ සේවකයෙක් වන්නේද?

**5.** "භවත් කාත්‍යායණයන් වහන්ස, ඉදින් ක්ෂත්‍රියයෙක් ධනයෙන්ද, ධාන්‍යයෙන්ද, රිදීයෙන්ද, රත්රනින්ද සම්පූර්ණ වන්නේනම් ක්ෂත්‍රියයා ඔහුට පළමු නින්දෙන් නැගිටින පසුව නින්දට යන කීකරු සිත්සේ හැසිරෙන ප්‍රිය වචන කියන සේවකයෙක් වන්නේය. බ්‍රාහ්මණයාද ඔහුට පෙරටුව නින්දෙන් නැගිටින, පසුව නින්දට යන, සොයා බලා කටයුතු කරන, සිත් පරිදි හැසිරෙන, ප්‍රිය වචන කියන්නෙක් වන්නේය. වෛශ්‍ය තෙමේද මේ ක්ෂත්‍රියයාහට පෙරටුව නින්දෙන් නැගිටින, පසුව නින්දට යන, සොයා බලා කටයුතු කරන, සිත් පරිදි හැසිරෙන ප්‍රිය වචන කියන්නෙක් වන්නේය. වෛශ්‍යයාද පළමු නින්දෙන් නැගිටින පසු නින්දට යන කීකරු සිත්සේ හැසිරෙන ප්‍රිය වචන කියන්නාවූ සේවකයෙක් වන්නේය.

"ශුද්‍රයා ඔහුට පළමු නින්දෙන් නැගිටින පසුව නින්දට යන කීකරු සිත්සේ හැසිරෙන ප්‍රිය වචන කියන සේවකයෙක් වන්නේය."

6. "මහරජ! කුමක් හඟනෙහිද? ඉදින් බ්‍රාහ්මණයෙක් ධනයෙන්ද, ධාන්‍යයෙන්ද, රිදියෙන්ද, රත්රනින්ද සමෘද්ධ වන්නේ නම් ඔහුට බ්‍රාහ්මණයාද පළමු නින්දෙන් නැගිටින පසුව නින්දට යන කීකරු සිත්සේ හැසිරෙන ප්‍රිය වචන කියන සේවකයෙක් වන්නේද? වෛශ්‍යාද ඔහුට පෙරටුව නින්දෙන් නැගිටින, පසුව නින්දට යන, සොයා බලා කටයුතු කරන, සිත් පරිදි හැසිරෙන, ප්‍රියවචන කියන්නෙක් වන්නේය. ශුද්‍ර තෙමේද මේ ධනවත් බ්‍රාහ්මණයාහට පෙරටුව නින්දෙන් නැගිටින, පසුව නින්දට යන, සොයා බලා කටයුතු කරන, සිත් පරිදි හැසිරෙන ප්‍රිය වචන කියන්නෙක් වන්නේද ශුද්‍රයාද ඔහුට පෙරටුව නින්දෙන් නැගිටින, පසුව නින්දට යන සොයා බලා කටයුතු කරන, සිත් පරිදි හැසිරෙන ප්‍රිය වචන කියන්නෙක් වන්නේය. ශුද්‍ර තෙමේද මේ ධනවත් බ්‍රාහ්මණයාහට පෙරටුව නින්දෙන් නැගිටින, පසුව නින්දට යන, සොයා බලා කටයුතු කරන, සිත් පරිදි හැසිරෙන ප්‍රිය වචන කියන්නෙක් වන්නේය. ක්ෂත්‍රියයාද ඔහුට පළමු නින්දෙන් නැගිටින පසු නින්දට යන කීකරු සිත්සේ හැසිරෙන ප්‍රිය වචන කියන සේවකයෙක් වන්නේදැයි" (ඇසී)

7. "භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, බ්‍රාහ්මණයෙක්ද ධනයෙක්ද, ධාන්‍යයෙන්ද, රිදියෙන්ද, රත්රනින්ද ඉසුරුමත් වන්නේ නම් බ්‍රාහ්මණයාද ඔහුට පලමු නින්දෙන් නැගී සිටින පසු නින්දට යන කීකරු සිත්සේ හැසිරෙණ ප්‍රිය වචන කියන සේවකයෙක් වන්නේය. වෛශ්‍යයාද ඔහුට පෙරටුව නින්දෙන් නැගිටින, පසුව නින්දට යන, සොයාබලා කටයුතු කරන, සිත් පරිදි හැසිරෙන ප්‍රිය වචන කියන්නෙක් වන්නේද ශුද්‍ර තෙමේද මේ ධනවත් බ්‍රාහ්මණයාහට පෙරටුව නින්දෙන් නැගිටින පසුව නින්දට යන, සොයාබලා කටයුතු කරන, සිත්පරිදි හැසිරෙන ප්‍රියවචන කියන්නෙක් වන්නේද? ශුද්‍රයාද ඔහුට පෙරටුව නින්දෙන් නැගිටින, පසුව නින්දට යන සොයා බලා කටයුතු

කරන, සිත් පරිදි හැසිරෙන ප්‍රිය වචන කියන්නෙක් වන්නේය. ශුද්‍ර තෙමේද මේ ධනවත් බ්‍රාහ්මණයාහට පෙරටුව නින්දෙන් නැගිටින, පසුව නින්දට යන, සොයා බලා කටයුතු කරන, සිත් පරිදි හැසිරෙන ප්‍රිය වචන කියන්නෙක් වන්නේය. ක්ෂත්‍රිය, ඔහුට නින්දෙන් නැගී සිටින පසුව නින්දට යන කීකරු සිත්සේ හැසිරෙණ ප්‍රිය වචන කියන සේවකයෙක් වන්නේයයි" (කීය.)

8. "මහරජ, ඒ කුමක් සිතන්නෙහිද? වෛශ්‍යයෙක් ධනයෙන්ද, ධාන්‍යයෙන්ද, රිදියෙන්ද, රත්රනින්ද සම්පූර්ණ වන්නේ නම් වෛශ්‍යයාද ඔහුට පලමු නින්දෙන් නැගිටින පසුව නිදන කීකරු සිත්සේ හැසිරෙණ ප්‍රිය වචන කියන සේවකයෙක් වේද? ශුද්‍රයාද ඔහුට පෙරටුව නින්දෙන් නැගිටින පසුව නින්දට යන, සොයා බලා කටයුතු කරන සිත් පරිදි හැසිරෙන, ප්‍රිය වචන කියන්නෙක් වන්නේද? ක්ෂත්‍රිය තෙමේද මේ ධනවත් බ්‍රාහ්ණයාහට පෙරටුව නින්දෙන් නැගිටින, පසුව නින්දට යන, සොයා බලා කටයුතු කරන සිත් පරිදි හැසිරෙන ප්‍රිය වචන කියන්නෙක් වන්නේද? බ්‍රාහ්මණයාද ඔහුට පෙරටුව නින්දෙන් නැගිටින, පසුව නින්දට යන සොයා බලා කටයුතු කරන සිත් පරිදි හැසිරෙන, ප්‍රිය වචන කියන්නෙක් වන්නේය. ක්ෂත්‍රිය තෙමේද මේ ධනවත් බ්‍රාහ්මණයාහට පෙරටුව නින්දෙන් නැගිටින, පසුව නින්දට යන, සොයාබලා කටයුතු කරන, සිත් පරිදි හැසිරෙන ප්‍රියවචන කියන්නෙක් වන්නේය. ක්ෂත්‍රියාද ඔහුට පලමු නින්දෙන් නැගී සිටින පසු නිදන කීකරු සිත්සේ හැසිරෙන ප්‍රිය වචන කියන සේවකයෙක් වන්නේදැයි" (ඇසී)

"ඉදින් පින්වත් කාත්‍යායණයන් වහන්ස, වෛශ්‍යයෙක්ද, ධනයෙන්ද, ධාන්‍යයෙන්ද, රිදියෙන්ද, රනින්ද සම්පූර්ණ වන්නේ නම් වෛශ්‍යයා ඔහුට පලමුව නින්දෙන් නැගී සිටින පසුව නිදන කීකරු සිත්සේ හැසිරෙණ ප්‍රිය වචන කියන සේවකයෙක් වන්නේය. ශුද්‍රයාද ඔහුට පෙරටුව නින්දෙන් නැගිටින, පසුව නින්දට යන, සොයා බලා කටයුතු කරන සිත් පරිදි හැසිරෙන ප්‍රිය වචන කියන්නෙක් වන්නේය. ක්ෂත්‍රිය තෙමේද මේ ධනවත් බ්‍රාහ්මණයාහට පෙරටුව නින්දෙන් නැගිටින, පසුව නින්දට යන,

සොයා බලා කටයුතු කරන ප්‍රිය වචන කියන්නෙක් වන්නේය. බ්‍රාහ්මණයාද ඔහුට පලමුව නින්දෙන් නැගිටින පසුව නින්දට යන කීකරු සිත්සේ හැසිරෙණ ප්‍රිය වචන කියන සේවකයෙක් වන්නේය.

**9.** "මහරජ, ඒ කුමක් සිතන්නෙහිද? ශුද්‍රයෙක්ද, ධනයෙන්ද, ධාන්‍යයෙන්ද, රිදියෙන්ද, රත්රනින්ද සම්පූර්ණ වන්නේ නම් ශුද්‍රයාද ඔහුට පළමු නින්දෙන් නැගිටින පසුව නින්දට යන කීකරු සිත්සේ හැසිරෙන ප්‍රිය වචන කියන සේවකයෙක් වන්නේද? ක්ෂත්‍රියයාද ඔහුට පෙරටුව නින්දෙන් නැගිටින, පසුව නින්දට යන, සොයාබලා කටයුතු කරන සිත් ගෙන හැසිරෙන, ප්‍රිය වචන කියන්නෙක් වන්නේද, බ්‍රාහ්මණ තෙමේද මේ ධනවත් ශුද්‍රයාහට පෙරටුව නින්දෙන් නැගිටින පසුව නින්දට යන සොයා බලා කටයුතු කරන සිත් ගෙන හැසිරෙන ප්‍රිය වචන කියන්නෙක් වන්නේද, වෛශ්‍යයාද ඔහුට පලමු නැගී සිටින පසුනින්දට යන කීකරු සිත්සේ හැසිරෙන ප්‍රිය වචන කියන සෙවකයෙක් වන්නේද?"

**10.** "භවත් කාත්‍යායණයන් වහන්ස ශුද්‍රයෙක් ධනයෙන්ද, ධාන්‍යයෙන්ද, රිදියෙන්ද, රත්රනින්ද, සම්පූර්ණ වන්නේ නම් ශුද්‍රයාද ඔහුට පලමු නින්දෙන් නැගිටින පසු නිදන කීකරු සිත්සේ හැසිරෙණ ප්‍රිය වචන කියන සේවකයෙක් වන්නේය. ක්ෂත්‍රියයාද ඔහුට පෙරටුව නින්දෙන් නැගිටින, පසුව නින්දට යන, සොයා බලා කටයුතු කරන සිත්ගෙන හැසිරෙන, ප්‍රිය වචන කියන්නෙක් වන්නේය. බ්‍රාහ්මණ තෙමේද මේ ධනවත් ශුද්‍රයාහට පෙරටුව නින්දෙන් නැගිටින, පසුව නින්දට යන, සොයා බලා කටයුතු කරන, සිත් ගෙන හැසිරෙන, ප්‍රිය වචන කියන්නෙක් වන්නේය. වෛශ්‍යයාද ඔහුට පලමු නින්දෙන් නැගිටින පසු නිදන කීකරු සිත්සේ හැසිරෙණ ප්‍රිය වචන කියන සේවකයෙක් වන්නේය."

**11.** "මහරජ, කුමක් සිතන්නෙහිද? ඉදින් මෙසේ වන කල්හි මේ ජාති සතර සම සම හෝ වෙත්ද? සම සම නොවන්නාහු හෝ වෙත්ද? මෙහි ඔබගේ අදහස කුමක් හෝ වෙයිද?' 'භවත්

කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, මෙසේ ඇති කල්හි ඒකාන්තයෙන් මේ සතර ජාතීහුම සම සම වෙති. ඔවුන්ගේ මෙහි කිසි වෙනසක් නොදක්නෙමියි' කීය.

'මහරජ, මේ ආකාරයෙන්ද බ්‍රාහ්මණයෝම උතුම් ජාතියය. අන්‍ය ජාති පහත්ය. පිරිසිදු කුලය බ්‍රාහ්ණයෝමය. අන්‍ය කුල කෘෂ්ණය, බ්‍රාහ්මණයෝම සුද්ධියට පැමිණෙති. බ්‍රාහ්මණ නොවන්නාහු නොපැමිණෙති. බ්‍රාහ්මයාගේ පුත්‍රයෝය උරෙහි හට ගත්තෝය. මුඛයෙහි උපන්නෝය බ්‍රාහ්මයාගෙන් හට ගත්තෝය. බ්‍රාහ්මයා විසින් මවන ලද්දෝය. බ්‍රාහ්මයා දායාද කොට ඇත්තෝය. යනු මේ ලොකයෙහි පැවැති ව්‍යවහාර මාත්‍රයක් බව දතයුතු

මහරජ, ඒ කුමකැයි හඟනෙහිද? මෙහි පර පණ නසන, නුදුන් අන්සතු දෑ ගන්නාවූ, කාමයෙහි වරදවා හැසිරෙණ, බොරු කියන කේලාම් කියන, ඵරුෂ වචන කියන, හිස් බස් කථා කරන ලොභිවූ ක්‍රොධ කරන මිථ්‍යා දෘෂ්ටි ඇති, ක්ෂත්‍රියෙක් වන්නේය. (හෙතෙම) ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි සැපයෙන් පහවූ නපුරු ගති ඇති යටිකුරුව වැටෙන නිරයෙහි උපදනේද? නූපදින්නේද? මෙහි ඔබගේ අදහස කෙසේ හෝ වේදැයි" (ඇසී)

12. "භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, පර පණ නසන නුදුන් අන්සතු දෑ ගන්නා කාමයෙහි වරදවා හැසිරෙණ බොරු කියන කේලාම් කියන ඵරුෂ වචන කියන හිස් වචන කියන ලොභයෙන් යුත් ක්‍රොධයෙන් යුත් මිථ්‍යා දෘෂ්ටි ඇති ක්ෂත්‍රිය තෙමේද ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි සැපයෙන් පහවූ නපුරු ගති ඇති යටිකුරුව වැටෙන නිරයෙහි උපදනේය. මේ කරුණෙහි මාගේ අදහස මෙසේය. මා විසින් මේ කාරණය රහතන්ගෙන් අසන ලද්දේද මෙසේය."

13. "යහපති, යහපති. මහරජ, මහරජ, ඔබගේ මේ ඇසීම යහපත්මය, ඒ එසේම වෙයි. ඔබ විසින් මේ කාරණය රහතන්ගෙන් යහපත්වම අසනලදී."

"මහරජ, ඔබ මේ කිමැයි සිතන්නෙහිද? මෙහි පරපණ නසන, අන් අයත් දේ ගන්නා කාමයෙහි වරදවා හැසිරෙන, බොරු කියන, පිසුණු බස කියන, හිස් බස කියන, ලොභවූ, ක්‍රොධයෙන් පෙරලුන සිත් ඇති වැරදි ලබ්ධි ඇති බ්‍රාහ්මණයෙක් වන්නේය. හෙතෙම කය බිඳීමෙන් මරණින් මත්තෙහි සැපයෙන් පහවූ නපුරු ගති ඇති විවසව පතිතවන නරකයෙහි උපදනේද, නොඋපදනේද, මෙහි ඔබ අදහස කෙසේ හෝ වේද?" භවත් කාත්‍යායණයන් වහන්ස, පරපණ නසන සොරකම් කරන කාමයෙහි වරදවා හැසිරෙන, බොරු කියන, පිසුණු බස් කියන, හිස් බස් කියන, ලොභවූ, ක්‍රොධයෙන් පෙරලුන සිත් ඇති වැරදි ලබ්ධි ඇති බ්‍රාහ්මණ තෙමේද කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ, නපුරුගති ඇති විවසව පතිත වන නිරයෙහි උපදන්නේය. මේ කරුණෙහි මගේ හැඟීම මෙසේය. මා විසින් මේ කාරණය රහතන්ගෙන් අසන ලද්දේද මෙසේය". "යහපති, යහපති මහරජ, මහරජ ඔබගේ මේ ඇසීම යහපත්ය, ඒ එසේම වෙයි. ඔබ විසින් මේ කාරණය රහතන්ගෙන් යහපත්වම අසන ලදී.

14. "මහරජ කිමැයි හඟින්නෙහිද? මෙහි පරපණ නසන සොරකම් කරන, කාමයෙහි වරදවා හැසිරෙන, බොරු කියන, පිසුණු බස් කියන හිස් බස් කියන, ලොභවූ, ක්‍රොධයෙන් පෙරලුන සිත් ඇති වැරදි ලබ්ධි ඇති වෛශ්‍යයෙක් වන්නේය. හෙතෙම කය බිඳීමෙන් මරණින් මත්තෙහි සැපයෙන් පහවූ, නපුරු ගති ඇති විවසව පතිතවන නිරයෙහි උපදනේද? නොඋපදනේද? මෙහි ඔබ අදහස කෙසේ හෝ වේද?" "භවත් කාත්‍යායණයන් වහන්ස, පරපණ නසන සොරකම් කරන, බොරු කියන, පිසුණු බස් කියන හිස් බස් කියන ලොභවූ, ක්‍රොධයෙන් පෙරලුන සිත් ඇති, වැරදි ලබ්ධි ඇති, වෛශ්‍ය තෙමේද කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ, නපුරු ගති ඇති නරකයෙහි උපදනේය. මේ කරුණෙහි මගේ හැඟීම් මෙසේය. මා විසින් මේ කාරණය රහතන්ගෙන් අසන ලද්දේද මෙසේය." "යහපති, යහපති, මහරජ, මහරජ ඔබගේ මේ ඇසීම යහපත්ය, ඒ එසේම වෙයි. ඔබ විසින් මේ කාරණය රහතන්ගෙන් යහපත්වම අසන ලදී."

**15.** "මහරජ, ඒ කිමැයි සිතන්නෙහිද, මෙහි පරපණ නසන කාමයෙහි වරදවා හැසිරෙන සොරකම් කරන බොරු කියන පිසුණු බස් කියන, හිස් බස් කියන, ලොභවූ, ක්‍රොධයෙන් පෙරලුන සිත් ඇති, වැරදි ලබ්ධි ඇති ශූද්‍රයෙක් වන්නේය. (ඔහු) ශරීරය බිඳීමෙන් මරණින් මත්තෙහි සැපයෙන් පහවූ දුක් ගති ඇති යටිකුරුවූ වැටෙන නරකයෙහි උපදනේද? නූපදින්නේද? මෙහි ඔබගේ අදහස හෝ කෙසේද" (කියා) ඇසී,

"භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, පරපණ නසන නුදුන් අන් සතුදේ ගන්නා කාමයෙහි වරදවා හැසිරෙන, බොරු කියන, පිසුණු බස් කියන, හිස් බස් කියන, ලොභවූ, ක්‍රොධයෙන් පෙරලුන සිත් ඇති මිසදිටුවූ ශූද්‍රතෙමේද ශරීරය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ දුක් ගති ඇති යටිකුරුව වැටෙන නිරයෙහි උපදනේය. මෙහි මාගේ අදහස මෙසේ වෙයි. මා විසින් මේ කාරණය රහතන්ගෙන් අසන ලද්දේද මෙසේය."

"යහපති, යහපති මහරජ, මහරජ ඔබගේ මේ ඇසීම යහපත්මය, එසේම වෙයි. ඔබ විසින් මේ කාරණය යහපත්වම රහතන්ගෙන් අසන ලදී."

**16.** "මහරජ, ඔබ කුමක් සිතන්නෙහිද? ඉදින් මෙසේ ඇතිකල මේ සතර ජාතීහු සමසම වෙත්ද? නොවෙත්ද? මෙහි ඔබ අදහස හෝ කෙසේ වේදැයි' ඇසීය.

"භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, ඒකාන්තයෙන්ම මෙසේ ඇති කල්හි මේ ජාති සතර සම සම වෙති. මෙහි ඔවුන්ගේ කිසිත් වෙනසක් නොදන්නෙමියි" කීය.

"මහරජ, බ්‍රාහ්මණයෝම, උතුම් ජාතියවේ. අන්‍ය ජාති පහත්ය. පිරිසිදු කුලය බ්‍රාහ්මණයෝය, අන්‍ය කුල කෘෂ්ණය, බ්‍රාහ්මණයෝම සුද්ධියට පැමිණෙති. බ්‍රාහ්මණ නොවන්නාහු නොපැමිණෙති. බ්‍රාහ්මණයෝම බ්‍රහ්මයාගේ පුත්‍රයෝය. උරෙහි හටගත්තේය. මුඛයෙහි උපන්නේය. බ්‍රහ්මයාගෙන් හටගත්තෝය. බ්‍රහ්මයා විසින් මවනලද්දෝය. බ්‍රහ්මයා දායාද කොට ඇත්තාහුය යන මෙය ලොකයෙහි ව්‍යවහාර මාත්‍රයක් යන බව මේ ආකාරයෙන්ද දතයුතුය.

17. "මහරජ, මේ කරුණෙහිලා කොප කුමකැයි සිතන්නෙහිද, මෙ ලොව ප්‍රාණඝාතයෙන් වැලකුණු, සොරකමින් වැලකුණු, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැලකුණු බොරු කීමෙන් වැලකුණු, කේලාම් කීමෙන් වැලකුණු ඵරුෂ වචන කීමෙන් වැලකුණු, හිස් කථාවෙන් වැලකුණු, දැඩිලොභයෙන් තොරවූ ක්‍රොධයෙන් තොරවූ සම්‍යක් දෘෂ්ටි ඇති ක්ෂත්‍රියයෙක් වන්නේය. හෙතෙම ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇති ස්වර්ගයෙහි උපදනේද? නූපදින්නේද? මෙහි ඔබ අදහස හෝ කෙසේ වේදැයි" (ඇසී)

"භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, ප්‍රාණඝාතයෙන් වැලකුණු, සොරකමින් වැලකුණු, කාම මිථ්‍යාචාරයෙන් වැලකුණු බොරුකීමෙන් වැලකුණු, කේලාම් කීමෙන් වැලකුණු, ඵරුෂ වචන කීමෙන් වැලකුණු, හිස් කථාවෙන් වැලකුණු දැඩි ලොභයෙන් තොරවූ ක්‍රොධයෙන් දුරුවූ සම්‍යක් දෘෂ්ටි ඇති ක්ෂත්‍රිය තෙමේද ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇති ස්වර්ග ලොකයට පැමිණෙන්නේය. මෙහි මාගේ අදහස මෙසේ වෙයි. මා විසින් මේ කාරණය රහතන් හමුවෙන් මෙසේ අසන ලද්දේය."

"යහපති, යහපති මහරජ, ඔබගේ මේ ඇසීම යහපත්මය. ඒ එසේම වෙයි. රහතන් අතින්ද ඔබ විසින් යහපත් කොට අසන ලද්දේය"

18. "මහරජ, මේ කුමකැයි සිතන්නෙහිද? ප්‍රාණඝාතයෙන් තොර අදත්තා දානයෙන් තොර කාමයන්හි වරදවා හැසිරීමෙන් වැලකුණු මුසාවාදයෙන් වැලකුණු පිසුණු කීමෙන් වැලකුණු පරොස් බසින් වැලකුණු සමඵප්‍රලාපයෙන් වැලකුණු අභිධ්‍යා නම්වූ විෂම ලොභයෙන් තොරවූ අව්‍යාපාද සිතින්යුත් සම්දිටු වූ බ්‍රාහ්මණයෙක් වෙයි. කය බිඳීමෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇති ස්වර්ගයෙහි උපදනේද නොඋපදනේද මෙහි ඔබ අදහස හෝ කෙසේ වේද," "භවත් කාත්‍යායණයන් වහන්ස, ප්‍රාණඝාතයෙන් වැලකී, අදත්තාදානයෙන් වැලකී කාම මිථ්‍යාචාරයෙන් වැලකී මුසාවාදයෙන් වැලකී පිසුණු බසින්

වැලකී ඵරුෂ බසින් වැලකී සම්ඵප්‍රලාපයෙන් වැලකී අභිධ්‍යාවෙන් තොර අව්‍යාපාද සිතින් යුත් සම්දිටුගත් බ්‍රාහ්මණ තෙමේද කාබුන් මරණින් මත්තෙහි සුගති සංඛ්‍යාත ස්වර්ග ලොකයට පැමිණෙන්නේය. මෙහි මාගේ අදහස මෙසේ වෙයි. මා විසින් මේ කාරණය රහතන් මුවෙන් අසන ලද්දේද මෙසේමය" "යහපති, යහපති, මහරජ, ඔබගේ මේ ඇසීම යහපත්ය" ඒ එසේම වෙයි. රහතන් අතින් ඔබගේ ඇසීමද යහපත්ය."

**19.** "මහරජ, මේ මතු දක්වන කාරණය ඔබ කෙසේ සිතන්නෙහිද, ප්‍රාණඝාතයෙන් තොර අදත්තාදානයෙන් වැලකුණ කාමයන් වරදවා හැසිරීමෙන් වැලකුණ මුසාවාදයෙන් වැලකුණ පිසුනු කීමෙන් වැලකුණ පරොස් බසින් වැලකුණ සම්ඵප්‍රලාපයෙන් වැලකුණ අභිධ්‍යා විෂම ලොභයෙන් තොරවූ අව්‍යාපාද සිත් ඇති. සම්දිටුවූ වෛශ්‍යයෙක් වෙයි. කය බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගයෙහි උපදනේද, නොඋපදනේද, මෙහි ඔබ අදහස කෙසේ හෝ වේද," භවත් කාත්‍යායණයන් වහන්ස, ප්‍රාණඝාතයෙන් වැලකී අදිනාදින් වැලකී කාම මිථ්‍යාචාරයෙන් වැලකී මුසාවාදයෙන් වැලකී පිසුණු බසින් වැලකී පරොස් බසින් වැලකී අභිධ්‍යා විෂම ලොභයෙන් තොරවූ අව්‍යාපාද සිත් ඇති සම්දිටුවූ වෛශ්‍ය තෙමේද ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයට පැමිණෙන්නේය. මෙහි මාගේ අදහස මෙසේ වෙයි. මේ කාරණය මා විසින් රහතන් හමුවෙන් අසන ලද්දේද මෙසේමය". "යහපති, යහපති, මහරජ ඔබගේ මේ ඇසීම යහත්මය, ඒ එසේම වෙයි. රහතන් අතින් ඔබගේ ඇසීමද යහපත්ය."

**20.** "මහරජ, මේ මතු දැක්වෙන කරුණ ඔබ කෙසේ සිතන්නෙහිද, ප්‍රාණඝාතයෙන් වැලකුණ, අදත්තාදානනේ වැලකුණ කාමමිථ්‍යාචාරයෙන් වැලකුණ, මුසාවාදයෙන් වැලකුණ, පිසුණු බසින් වැලකුණ, පරුස බසින් වැලකුණ, සම්ඵප්‍රලාපයෙන් වැලකුණ, අභිධ්‍යාවෙන් තොර, අව්‍යාපාද

සිතින් යුත් සම්දිටුගත් ශූද්‍රයෙක් වෙයි. ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇති ස්වර්ගලොකයට පැමිණෙත්ද? නොපැමිණෙන්නේද? මේ කරුණෙහි ඔබ අදහස හෝ කෙසේ වේදැයි" (ඇසී).

"භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, ප්‍රාණඝාතයෙන් තොර, සොරකමින් තොර, කාමමිථ්‍යාචාරයෙන් තොර, මුසාවාදයෙන් තොර, පිසුණු බසින් තොර, ඵරුෂ වදනින් තොර, සම්ඵප්‍රලාපයෙන් තොර, අභිධ්‍යාවෙන් තොර, ව්‍යාපාදයෙන් තොර, සම්‍යක්දෘෂ්ටිවූ ශූද්‍රතෙමේද ශරීරයාගේ බිඳීමෙන් මරණින් මත්තෙහි යහපත් ගති ඇති ස්වර්ගලොකයට පැමිණේ. මෙහි මාගේ අදහස මෙසේ වෙයි. රහතන් අතින් මේ කාරණය මා විසින් මෙසේම අසන ලදී."

"යහපති, යහපති මහරජ, මහරජ මේ කාරණය පිළිබඳ ඔබගේ අදහස යහපත්ය. ඔබ විසින් රහතන් අතින් මේ කාරණය යහපත්වම අසන ලදී."

"මහරජ ඒ කිමැයි සිතන්නෙහිද? ඉදින් මෙසේ ඇති කල්හි මේ ජාති සතර සම සම වෙද? නොවෙද? මෙහිලා ඔබගේ අදහස හෝ කෙසේ වේදැයි" (ඇසී).

"පින්වත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, ඒකාන්තයෙන්ම මෙසේ ඇති කල්හි මේ ජාති සතර සම සම වෙති. මෙහිලා ඔවුන්ගේ කිසිත් වෙනසක් නොදක්නෙමියි" කීහ.

21. "මරහජ, මේ ආකාරයෙන්ද බ්‍රාහ්මණ තෙමේම උතුම් ජාති ඇත්තේය. අනික් ජාති ඇත්තේ පහත්ය. පිරිසිදු කුලය බ්‍රාහ්මණයෝය, අන්‍ය කුල කෘෂ්ණය, බ්‍රාහ්මණයෝම සුද්ධියට පැමිණෙති. බ්‍රාහ්මණ නොවන්නාහු නොපැමිණෙති. බ්‍රාහ්මණයෝම බ්‍රහ්මයාගේ පුත්‍රයෝය. උරෙහි හටගත්තෝය. මුඛයෙහි උපන්නෝය. බ්‍රහ්මයා දායාදකොට ඇත්තාහුය යනු මෙය ලොකයෙහි ව්‍යවහාර මාත්‍රයක්ම බව මේ කාරණයෙන්ද දතයුතු. (එසේය) මහරජ ඒ කුමකැයි හඟින්නෙහිද? මේ ලොකයෙහි ක්ෂත්‍රියෙක් තෙම ගම්පහරන්නේ හෝ වේද,

බලාත්කාරයෙන් හෝ ගන්නේද, එක ගෙයක් පැහැර ගැණීම හෝ කරන්නේද, මංපැහැරීමෙහි හෝ සිටින්නේද, පරස්ත්‍රීන් කරා හෝ යන්නේද, ඉදින් නුඹගේ පුරුෂයෝ ඔහු අල්වාගෙණ, 'දේවයන් වහන්ස, මෙතෙම ඔබගේ අපරාධ කරන්නාවූ සොරෙක් වේ. මොහුට යමක් කැමැත්තෙහි නම් ඒ දඬුවම පණවනු මැනවැයි' ඔබට දක්වන්නාහු නම් කිනම් දෙයක් ඔහුට කරන්නෙහිද?

22. "පින්වත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, නසන්නෙමු, හෝ වස්තු පැහැර ගන්නෙමු හෝ රටින් නෙරපන්නෙමු හෝ සුදුසු වූවක් හෝ කරන්නෙමු. ඊට හෙතු කවරේද? භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, පෙර මොහුගේ ක්ෂත්‍රියයා යන යම් නාමයක් වීද, මොහුගේ එය නැතිවිය. සොරෙක යන ව්‍යවහාරයටම පැමිණෙන හෙයිනි. මහරජ, ඒ කුමකැයි හඟින්නෙහිද? මේ ලොකයෙහි බ්‍රාහ්මණයෙක් ගෘහසන්ධි හෝ සිඳින්නේද, බලාත්කාරයෙන් හෝ ගන්නේද, එක් ගෙයක් පැහැරීම හෝ කරන්නේද, මංපැහැරීමෙහි හෝ යෙදෙන්නේද, අන් අඹුවන් කරා හෝ යන්නේද, ඉදින් නුඹගේ පුරුෂයෝ ඔහු අල්වාගෙන නුඹට දක්වන්නාහුද, 'දෙවයන් වහන්ස, මෙතෙම නුඹගේ අපරාධ කරන්නාවූ සොරෙක, මොහුට යමක් කැමැත්තෙහි නම් ඒ දඬුවම පණවනු මැනවැයි' කිනම් දෙයක් ඔහුට කරන්නෙහිද?" "භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, නසන්නෙමු හෝවස්තු පැහැර ගන්නෙමු හෝ රටින් නෙරපන්නෙමු හෝ සුදුසු පරිදි යමක් හෝ කරන්නෙමු. ඊට හේතු කවරේද? භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, පෙර මොහුගේ බ්‍රාහ්මණයාය යන නමක් වීද, මොහුගේ එය අතුරුදහන් විය. සොරාය කියාම ව්‍යවහාරයට ගියේය."

23. "මහරජ ඒ කුමකැයි හඟින්නේද, මේ ලොකයෙහි වෛශ්‍යයෙක් ගෘහසන්ධි හෝ සිඳින්නේද, බලාත්කාරයෙන් හෝ ගන්නේද, එක් ගෙයක් හෝ පැහැරීම කරන්නේද, මංපැහැරීමෙහි හෝ යෙදෙන්නේද, අන් අඹුවන් කරා හෝ යන්නේද, ඉදින් නුඹගේ පුරුෂයෝ ඔහු අල්වාගෙන නුඹට දක්වන්නාහුද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

'දෙවයන් වහන්ස, මෙතෙම නුඹගේ අපරාධ කරන්නාවූ සොරෙක. මොහුට යමක් කැමැත්තෙහි නම් ඒ දඬුවම පණවනු මැනවැයි' කියති. කිනම් දෙයක් ඔහුට කරන්නෙහිද?" භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, නසන්නෙමු හෝ වස්තු පැහැර ගන්නෙමු හෝ රටින් නෙරපන්නෙමු හෝ සුදුසු පරිදි යමක් හෝ කරන්නෙමු. ඊට හේතු කවරේද, භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, පෙර මොහුගේ වෛශ්‍යයාය යන නමක් වීද, මොහුගේ එය අතුරුදහන් විය. සොරාය කියාම ව්‍යවහාරයට ගියේය" "මහරජ ඒ කුමකැයි හඟින්නෙහිද, මේ ලොකයෙහි ශුද්‍රයෙක් ගම් පහරන්නේ හෝ වෙයිද, බලාත්කාරයෙන් හෝ ගන්නේද එක් ගෙයක් පැහැරීම හෝ කරන්නේද, මං පැහැරීමෙහි හෝ සිටින්නේද, අන් අඹුවන් කරා හෝ යන්නේද ඉදින් නුඹගේ පුරුෂයෝ ඔහු අල්වාගෙණ නුඹට දක්වන්නාහුද, 'දේවයන් වහන්ස, මෙතෙම නුඹගේ අපරාධ කරන්නාවූ සොරෙක මොහුට යමක් කැමැත්තෙහි නම් ඒ දඬුවම පණවනු මැනවැයි' ඔබට දක්වන්නාහු නම් කිනම් දෙයක් ඔහුට කරන්නෙහිද?

**24.** "භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, නසන්නෙමු හෝ වස්තු පැහැරගන්නෙමු හෝ රටින් නෙරපන්නෙමු හෝ සුදුසු පරිදි යමක් හෝ කරන්නෙමු. ඊට හේතු කවරේද? පින්වත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, පෙර මොහුගේ ශුද්‍රයාය යන නමක් වීද, මොහුගේ එය අතුරුදහන් විය. සොරාය යන ව්‍යාහාරයට පැමිණෙතියි" "මහරජ ඒ කුමකැයි හඟින්නෙහිද? ඉදින් මෙසේ ඇතිකල්හි මේ සතර ජාති ඇත්තෝ සම සම වූවාහු වෙත්ද? නොවෙත්ද? කෙසේ හෝ නුඹට මෙහි අදහස් වේද?" "භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, ඒකාන්තයෙන්ම මෙසේ ඇතිකල්හි මේ සතර ජාති ඇත්තෝ සම සමවූවාහු වෙත්. මොවුන්ගේ මෙහි කිසි වෙනසක් නොදක්නෙමියි" කීය.

"මහරජ, බ්‍රාහ්මණයාම උතුම් ජාති ඇත්තෙක, සෙසු ජාති ඇත්තේ පහත්ය, පිරිසිදු කුලය බ්‍රාහ්මණයෝමය. අන්‍යකුල කෘෂ්ණය, බ්‍රාහ්මණයෝම සුද්ධියට පැමිණෙති. බ්‍රාහ්මණ නොවන්නාහු නොපැමිණෙති. බ්‍රාහ්මණයෝම බ්‍රහ්මයාගේ

පුත්‍රයෝය. උරෙහි හට ගත්තෝය. මුඛයෙහි උපන්නෝය. බ්‍රහ්මයාගෙන් හටගත්තෝය. බ්‍රහ්මයා විසින් මවන ලද්දෝය. බ්‍රහ්මයා දායාද කොට ඇත්තාහුය යනු ලෝකයෙහි ව්‍යවහාර මාත්‍රයක්ම බව මේ කාරණයෙන් ද දතයුතු”.

**25.** “මහරජ, ඒ කුමකැයි හඟින්නෙහිද? මේ ලොකයෙහි ක්ෂත්‍රියයෙක් තෙම හිසකේ රැවුල් කපා කසටවත් හැඳ ගිහිගෙන් නික්ම පැවිදිව ප්‍රාණඝාතයෙන් වැලකුණු සොරකමින් වැළකුණු බොරුකීමෙන් වැළකුණු එකවේලෙහි වැළදීම ඇති බ්‍රහ්මචර්යාවෙන් යුත් සිල් ඇති යහපත් ගුණධර්ම ඇත්තෙක් වන්නේද? ඔහුට කුමක් නම් කරන්නෙහිද?” “භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, වඳින්නෙමු හෝ දැක හුනස්සෙන් නැගිටින්නෙමු හෝ හිඳගැනීමට දෙන්නෙමු හෝ චීවර පිණ්ඩපාත සයනාසන ගිලන්පස බෙහෙත් පිරිකර යන මේ දීමට කැඳවීම හෝ කරන්නෙමු. උන්වහන්සේට ධාර්මිකවූ ආරක්ෂාව හෝ සලසන්නෙමු. ඊට හෙතු කවරේද? “භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස පෙර උන්වහන්සේගේ ක්ෂත්‍රිය යන යම් නමක්වීද, මොහුගේ ඒ නම අතුරුදහන් විය. ශ්‍රමණ යන නම ව්‍යවහාරයට පැමිණ හෙයිනි”. “මහරජ, ඒ කුමකැයි හඟින්නෙහිද? මේ ලොකයෙහි බ්‍රාහ්මණයෙක්තෙම හිසකේ රැවුල බහවා කසා වස්ත්‍ර හැඳ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූයේ, සතුන් මැරීමෙන් වැලකුනේ, සොරකම් කිරීමෙන් වැලකුනේ, බොරු කීමෙන් වැලකුනේ, එක් වේලෙහි වැලදීම ඇත්තේ, බ්‍රහ්මචර්යා ඇත්තේ, සිල් ඇත්තේ, යහපත් ස්වභාව ඇත්තෙක් වන්නේය. ඔහුට කුමක් නම් කරන්නෙහිද?” “භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස වඳින්නෙමු. හෝ දැක හුනස්නෙන් නැගිටින්නෙමු හෝ ආසනයෙන් පවරන්නෙමු හෝ චීවරය, පිණ්ඩපාතය, සේනාසනය, ගිලන්පස බෙහෙත් පිරිකර යන මෙයින් ඔහුට පැවරීම හෝ කරන්නෙමි. උන්වහන්සේගේ ධාර්මිකවූ ආරක්ෂාවරණ ගොපනය හෝ නියම කරන්නෙමු. ඊට හේතු කවරේද? භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, පෙර මොහුගේ බ්‍රාහ්මණය යන යම් නමක් වීද මොහුගේ ඒ නම අතුරුදහන් විය. ශ්‍රමණයාය යන සංඛ්‍යාවටම පැමිණියේය.”

**26.** "මහරජ, ඒ කුමකැයි හඟින්නෙහිද, මේ ලොකයෙහි වෛශ්‍යයෙක් තෙම හිසකේ රැවුල් බහවා කසා වස්ත්‍ර හැඳ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවූයේ සතුන් මැරීමෙන් වැලකුනේ, සොරකම් කිරීමෙන් වැලකුනේ, බොරු කීමෙන් වැලකුනේ, එක් වේලෙහි වැලඳීම ඇත්තේ, බ්‍රහ්මචර්යා ඇත්තේ, සිල් ඇත්තේ, යහපත් ස්වභාව ඇත්තෙක් වන්නේය. ඔහුට කුමක් නම් කරන්නෙහිද?" "භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, වඳින්නෙමු. හෝ දැක හුනස්නෙන් නැගිටින්නෙමු හෝ ආසනයෙන් පවරන්නෙමු හෝ චීවරය පිණ්ඩපාතය, සේනාසනය, ගිලන්පස බෙහෙත් පිරිකර යන මෙයින් ඔහුට පැවරීම හෝ කරන්නෙමු. උන්වහන්සේගේ ධාර්මිකවූ ආරක්ෂාවරණ ගොපනය හෝ නියම කරන්නෙමු. ඊට හේතු කවරේද?" "භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, පෙර මොහුගේ වෛශ්‍යයාය යන යම් නමක් වීද මොහුගේ ඒ නම අතුරුදහන් විය. ශ්‍රමණයාය යන සංඛ්‍යාවටම පැමිණියේය." "මේ ලොකයෙහි ශුද්‍රයෙක් තෙම හිසකේ රැවුල් කපා කසාවත් හැඳ ගිහිගෙන් නික්ම පැවිදිව සතුන් මැරීමෙන් වැලකුනේ සොරකම් කිරීමෙන් වැලකුනේ බොරුකීමෙන් වැලකුනේ එක් වේලෙහි වැළඳීම බ්‍රහ්මචර්යාව ඇත්තේ සිල් ඇත්තේ යහපත් ස්වභාව ඇත්තෙක් වන්නේය. ඔහුට කුමක්නම් කරන්නෙහිද?" "භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, වඳින්නෙමු හෝ දැකහුනස්නෙන් නැගිටින්නෙමු හෝ ආසනයෙන් පවරන්නෙමු හෝ චීවර පිණ්ඩපාත සයනාසන ගිලන්පස බෙහෙත් පිරිකර යන මෙයින් පිදීම හෝ කරන්නෙමි. උන්වහන්සේට ධාර්මිකවූ ආරක්ෂාව හෝ සලසන්නෙමු. ඊට හේතුව කවරේද? භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, පෙර මොහුගේ ශුද්‍රයන මොහුගේ ඒ නම අතුරුදහන්විය ශ්‍රමණ යන සංඛ්‍යාවටම පැමිණි හෙයිනි" "මහරජ, ඒ කුමකැයි හඟින්නෙහිද, ඉදින් මෙසේ ඇති කල්හි මේ සතර ජාති ඇත්තෝ සම සමවූවෝ වෙත්ද? නොහොත් නොවෙත්ද? කෙසේ හෝ නුඹට මෙහි (අදහස්) වේද?" "භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, ඒකාන්තයෙන්ම මෙසේ ඇති කල්හි මේ සතර ජාති ඇත්තෝ සම සමවූවාහු

වෙත්. මොවුන්ගේ මෙහි කිසි වෙනසක් නොදක්නෙමියි කීයේය". "මහරජ, බ්‍රාහ්මණයාම උතුම් ජාති ඇත්තේය. සෙසු ජාති ඇත්තේ පහත්ය. බ්‍රාහ්මණයාම පිරිසිදු ජාති ඇත්තේය. සෙසු ජාති ඇත්තේ අපිරිසිදුය. බ්‍රාහ්මණයෝම පිරිසිදුවෙත්. බ්‍රාහ්මණ නොවූවාහු පිරිසිදු නොවෙත්. බ්‍රාහ්මණයෝම බ්‍රහ්මයාගේ පුත්‍රයෝය. ලෙහි හටගත්තාහු මුඛයෙන් උපන්නාහු බ්‍රහ්මයාගෙන් උපන්නාහු බ්‍රහ්මයා විසින් මවන ලද්දාහු බ්‍රහ්මයා දායාද කොට ඇත්තාහුය. යනු මේ ලොකයෙහි ව්‍යවහාර මාත්‍රයක්ම බව මේ කාරණයෙන්ද දතයුතු"

27. මෙසේ කීකල්හි අවන්තී පුත්‍රවූ මාධුර නම් රජතෙම ආයුෂ්මත් මහා කාත්‍යායණස්ථවිරයන් වහන්සේට මෙසේ කීයේය. "භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, ඉතා යහපත භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, ඉතා යහපත. භවත් කාත්‍යායණස්ථවිරයන් වහන්ස, යම්සේ යටිකුරුකොට තබන ලද්දක් හෝ උඩුකුරු කරන්නේද, වසා තබන ලද්දක් හෝ වැසුම් අරින්නේද, මංමුලා වූවෙකුට හෝ මග කියන්නේද, අන්ධකාරයෙහි හෝ ඇත්තෝ රූප දකිත්වායි තෙල් පහනක් දරන්නේද, එපරිද්දෙන්ම භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්සේ විසින් නොයෙක් ආකාරයෙන් ධර්මය ප්‍රකාශ කරණ ලදී. ඒ මම භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්සේ සරණ කොට යමි. ධර්මයද භික්ෂු සංඝයාද (සරණකොට යමි) භවත් කාත්‍යායණ ස්ථවිර තෙමේ අද පටන් දිවිහිමියෙන් සරණ ගියාවූ උපාසකයෝයි මා දරණ සේක්වායි", (කීයේය.)

28. "මහරජ නුඹ මා සරණ කොට නොයව මම යම් කෙනෙකු සරණ කොට ගියෙම්ද, නුඹද ඒ භාග්‍යවතුන් වහන්සේම සරණ කොට යවයි" කීය. "භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ දැන් කොහි වැඩ වසන සේක්දැයි" ඇසී. "මහරජ, ඒ භවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ මේ කාලයේ පිරිනිවන් පෑසේකැයි" කීය, "භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, ඉදින් වනාහි අපි ඒ භාග්‍යවතුන් වහන්සේ දස යොදුනක්

තන්හි යයි අසන්නෙමු නම් අපි දස යොදුනක් තැන්ද අර්හත් සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ දැකීමට යන්නෙමු. භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, ඉදින් අපි ඒ භාග්‍යවතුන් වහන්සේ විසි යොදුනක් තන්හි යයි අසන්නෙමුද අපි විසි යොදුනක් තැන්ද අර්හත් සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ දැකීමට යන්නෙමු. භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස ඉදින් අපි ඒ භාග්‍යවතුන් වහන්සේ තිස් යොදුනක් තන්හියයි අපි අසන්නෙමු නම් අපි තිස් යොදුනක් තැන්ද අර්හත් සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ දැකීමට යන්නෙමු. භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස. ඉදින් අපි ඒ භාග්‍යවතුන් වහන්සේ සතලිස් යොදුනක් තන්හියයි අසන්නෙමුද, අපි සතළිස් යොදුනක් තන්හිද අර්හත් සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ දැකීමට යන්නෙමු. භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, ඉදින් අපි ඒ භාග්‍යවතුන් වහන්සේ පණස් යොදුනක් තැන්හි යයි අසන්නෙමු නම්, අපි පණස් යොදුනක්ද අර්හත් සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ දැකීමට යන්නෙමු. භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, ඒ භාග්‍යවතුන් වහන්සේ සියක් යොදුන් තන්හි යයි අපි අසන්නෙමු නම්, අපි යොදුන් සියයක්ද අර්හත් සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ දැකීමට යන්නෙමු. භවත් කාත්‍යායණ ස්ථවිරයන් වහන්ස, යම් හෙයකිනුත් ඒ භාග්‍යවතුන් පිරිනිවී සේක්ද, අපි පිරිනිවියාවූද ඒ භාග්‍යවතුන් වහන්සේ සරණ කොට යමු. ධර්මයද භික්ෂු සංඝයාද (සරණ කොට යමු.) භවත් කාත්‍යායණ ස්ථවිර තෙමේ මා අද පටන් දිවිහිම් කොට සරණ ගියාවූ උපාසකයෙකු යයි දරණ සේක්වායි" (කීයේය.)

**සතරවන මාධුර සූත්‍රය නිමි. (4-4)**

---

## 35. බොධිරාජ කුමාර සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක් කාලයෙක භාග්‍යවතුන් වහන්සේ භග්ග නම් ජනපදයෙහි සුංසුමාර ගිර නම් නගරයට සමීප වූ මෘගදාය නම් භෙසකලා වනයෙහි වැඩ වෙසෙත්.

එකල්හි බොධිරාජ කුමාරයාගේ කොකනද නම් ප්‍රාසාදය කරවන ලද නොබෝ කල් ඇත්තේ වෙයි. එහි ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ මනුෂ්‍ය වූ කිසිවෙකු විසින් වාසය නොකරණ ලද්දේය. එකල්හි බොධිරාජ කුමාර තෙමේ සඤ්ජිකා පුත්ත නම් මානවකයා කැඳවී. කැඳවා "යහලු සඤ්ජිකා පුත්‍රය, මෙහි එව. නුඹ භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එහි යව. ගොස් මාගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේගේ සිරිපා මස්තකයෙන් වඳුව.

'ස්වාමීන් වහන්ස, බොධිරාජ කුමාර තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ පා සිරසින් විඳියි. ආබාධ නැතිකම රෝග නැතිකම - සිත කය දෙකේ සැහැල්ලු බව කාය බලය සැප විහරණය අසන්නේයයි' ආබාධ නැතිකම රෝග නැතිකම කය සිත්හි සැහැල්ලුකම කාය බලය විහරණ සැපය අසව.

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයා සමග බොධිරාජ කුමාරයාගේ සෙට දවස පිණිසවූ බත ඉවසන සේක්වායයි.' කියව. තරුණවූ සඤ්ජිකා පුත්‍ර තෙමේ "එසේය" කියා බොධිරාජ කුමාරයාට උත්තරදී, භාග්‍යවතුන් වහන්සේ යම් තෙනකද, එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වී සතුටු වියයුතු සිහි කටයුතු කතාව කොට අවසන්ව එක් පසෙක්හි හිඳගත්තේය.

2. එක් පසෙක හුන් තරුණවූ සඤ්ජිකා පුත්‍රතෙමේ භාග්‍යවතුන් වහන්සේට භවත් ගෞතමයන් වහන්ස, බොධිරාජ කුමාර තෙම භවත් ගෞතමයන් වහන්සේගේ පා මුදුනෙන් වඳියි. නිරෝගි බව කයේ සැහැල්ලු බව කාය බලය සැපසේ විසීම අසයි. තවද පින්වත් ගෞතමයන් වහන්සේ භික්ෂු සංඝයා සමග බෝධිරාජ කුමාරයාගේ සෙට දවස පිණිස වූ බත ඉවසන සේක්වායි කියායිද" කීය. භාග්‍යවතුන් වහන්සේ එය නිශ්ශබ්ද භාවයෙන් ඉවසූහ.

ඉක්බිති තරුණ සඤ්ජිකා පුත්‍රතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දැන ආසනයෙන් නැගිට බොධිරාජ කුමාර තෙම යම් තැනකද එහි පැමිණියේය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

3. පැමිණ බොධිරාජ කුමරුට මෙසේ කීය. "පින්වතුන්ගේ" වචනයෙන් ඒ පින්වත් ගෞතමයන් වහන්සේට 'භවත් ගෞතමයන් වහන්ස, බොධිරාජ කුමාර තෙම- භවත් ගෞතමයන් වහන්සේගේ පාදයන් සිරසින් වඳියි. නිරෝගිබව කයේ සැහැල්ලු බව කාය බලය සැපසේ විසීම අසයි. තවද පින්වත් ගෞතමයන් වහන්සේ භික්ෂු සංඝයා සමග බොධිරාජ කුමාරයාගේ හෙට දවස් පිණිස බත ඉවසන සේක්වායි කියා යයිද, අපි කීවෙමු. එය ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ විසින් ඉවසන ලද්දේ වෙයි."

ඉක්බිති බොධිරාජ කුමාරතෙමේ එය රැය ඉක්මවීමෙන් තම නිවසෙහි ප්‍රණීත ආහාර පාන වර්ග පිළියෙල කරවා කොකනද ප්‍රාසාදය අන්තිම තරප්පු පුවරුව (පඩිය) තෙක්ම සුදු වස්ත්‍ර අතුරවා, තරුණ සඤ්ජිකා පුත්‍රහට කථා කෙළේය. "යහළු සඤ්ජිකා පුත්‍රය, මෙහි එව. නුඹ භාග්‍යවතුන් වහන්සේ යම් තෙනක නම් එහි ගොස් භාග්‍යවතුන් වහන්සේට 'ස්වාමීන් වහන්ස, බත නිමවන ලදී. කාලය වේයයි, කාලය දන්වව".

"පින්වත, එසේය කියා තරුණ සඤ්ජිකා පුත්‍ර තෙමේ තරුණ බොධිරාජ කුමරුට උත්තර දී භාග්‍යවතුන් වහන්සේ යම් තෙනකද එහි පැමිණ, "ස්වාමීන් වහන්ස, බත නිමවනලදී. වැඩීමට කාලයයි," භාග්‍යවතුන් වහන්සේට කල් දැන්වීය.

4. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙණ බොධිරාජ කුමරුගේ ගෙදොර යම් තෙනකද එහි වැඩිසේක. එවේලෙහි බොධිරාජ කුමාරතෙමේ භාග්‍යවතුන් වහන්සේගේ පැමිණීම බලමින් පිට දොරටුවෙහි සිටියේ වෙයි. බොධිරාජ කුමාරතෙමේ වඩින්නාවූ භාග්‍යවතුන් වහන්සේ දුරදීම දැක ඉදිරියට ගොස් භාග්‍යවතුන් වහන්සේ වැඳ පෙරටුව කොකනද ප්‍රාසාදය යම් තෙනකද එහි පැමිණියේය.

එවිට භාග්‍යවතුන් වහන්සේ අන්තිම තරප්පු පුවරුව (පඩිය) ලඟ වැඩ සිටියහ. එකල්හි බොධිරාජ කුමාර තෙමේ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට බොහෝ කාලයක් හිත පිණිස වැඩ පිණිස, වස්ත්‍ර පාගා වඩින සුගතයන්

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

වහන්සේ වස්ත්‍ර පාගා වඩිනා සේක්වායි” කීය. මෙසේ කී විට භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්ද වී. දෙවනුවද, බොධිරාජ කුමාර තෙමේ භාග්‍යවතුන් වහන්සේට “ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට බොහෝ කාලයක් හිත පිණිස වැඩ පිණිස වස්ත්‍ර පාගා වඩින සේක්වා, සුගතයන් වහන්සේ වස්ත්‍ර පාගා වඩින සේක්වායි” කීය. දෙවනුවද භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දවූහ. තෙවනුවත් බොධිරාජ කුමාර තෙමේ භාග්‍යවතුන් වහන්සේට “ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ මට බොහෝ කාලයක් හිත පිණිස වැඩ පිණිස වස්ත්‍ර පාගා වඩින සේක්වා, සුගතයන් වහන්සේ වස්ත්‍ර පාගා වඩින සේක්වායි” කීය.

**5.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ ආයුෂ්මත් ආනන්දයන් දෙස බැලී. අනතුරුව ආයුෂ්මත් ආනන්ද තෙමේ බොධිරාජ කුමරුට මෙසේ කීය. “රාජ කුමාරයිනි, වස්ත්‍ර අස්කරවා භාග්‍යවතුන් වහන්සේ පාවාඩ උඩින් නොවඩිත්” කීය. තථාගතයන් වහන්සේ පසු ජනතාව බලන්නාහයි කීය.

ඉක්බිති බොධිරාජ කුමාර තෙමේ පාවාඩ හකුළුවා කොකනද ප්‍රාසාදයෙහි අසුන් පැනවී. එවිට භාග්‍යවතුන් වහන්සේ කොකනද පහයට නැග පැනවූ අස්නෙහි භික්ෂු සංඝයා සමග වැඩ උන්හ. එවිට බොධිරාජ කුමාරතෙමේ බුදුන් ප්‍රධාන භික්ෂු සංඝයා ප්‍රණීතවූ ආහාර පානයෙන් සියතින්ම හොඳින් වැළඳවිය. ඇතිතාක් වැළඳවිය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ වළඳා පාත්‍රයෙන් අත ඉවත් කළ කල්හි, බොධිරාජ කුමාරතෙම මිටි අස්නක් ගෙන එක් පසෙක ඉඳ ගත්තීය. එක් පසෙකහුන් බොධිරාජ කුමර තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. “ස්වාමීන් වහන්ස, මාගේ මේ අදහසෙක් වෙයි. සැපයෙන් සැපයට නොපැමිණිය හැක. දුකෙන් සැපයට පැමිණිය යුතුය යන මෙබඳු අදහසක් මට පහළවිය යනුයි.

**6.** “රාජ කුමාරයිනි, චතුස්සත්‍යාවබොධ කිරීමට පලමු බුදු නොවූ බෝධිසත්ව කාලයේදීම මා හටත් ‘සැපයෙන් සැපයට නොම පැමිණිය හැක. දුකෙන් සැපයට පැමිණිය යුතුයයන,

අදහස පහළවිය, ගිහිගෙයි වසන්නහු විසින් සියලු ආකාරයෙන් පිරිසිදුවූ, සියලු ආකාරයෙන් සම්පූර්ණවූ ලියවනලද සකක් බඳුවූ, මේ බ්‍රහ්ම චර්යාවෙහි හැසිරීම පහසු නොවෙයි. මම හිසකේ දැළිරැවුලු කපාහැර, කසාවත් හැඳ, ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වන්නෙම් නම් ඉතා යෙහෙකැයි, රාජකුමාරය, කියා, ඒ මම එයින් ටික කලකට පසු තරුණ වයස ඇත්තේම කළුවූ හිසකෙස් ඇත්තේම, පළමුවෙනි වයසෙහි යහපත් තරුණ භාවයෙන් යුක්තවූයේම නොකැමතිවූ මවුපියන් අඬද්දී, හිසකෙස් දැළි රැවුල් කපාහැර කසාවත් හැඳගෙන ගිහිගෙන් නික්ම අනගාරිකව පැවිදිවීමි.'

"මෙසේ පැවිදිවූ මම කුසල් කුමක්දැයි සොයන්නේ නිරුත්තර උතුම් නිර්වාණය සොයන්නේ ආළාරකාලාම නම් තවුස්තෙම යම් තැනෙක්හිද එතැනට ගියෙමි. ගොස්, ආළාරකාලාම තාපසයාට මෙසේ කීවෙමි.

"ඇවැත්නි කාලාමයෙනි, තොපගේ මේ ශාසනයෙහි බ්‍රහ්මචරියාවෙහි හැසිරෙන්ට මම කැමැත්තෙමි'යි (කීවෙමි) රාජකුමාරය, මම මෙසේ කී කල්හි ආළාරකාලාම තෙම මට මෙය කීවේය. 'යම් තැනක නුවණ ඇත්තාවූ පුරුෂයෙක් නොබෝ කලකින් තමන්ගේ ආචාර්යයන්ගේ ධර්මය තමාම නුවණින් දැන අවබොධ කොට ඊට පැමිණ වාසය කරන්නේද මේ ධර්මයද එබඳුය, එහෙයින් ආයුෂ්මත් තෙම වාසය කෙරේවා' (කියායි.)

7. "රාජකුමාරය, ඒ මම ටික කලකින් වහාම ඔවුන්ගේ ඒ ධර්මය අසාම ඉගෙන ගත්තෙමි. රාජකුමාරය, ඒ මම (කියන්ට) තොල පෙරලු පමණින්, (ඔහු) කියනදේ නැවත කී පමණින් මෙබඳු ස්වල්ප කාලයකින් ඥාණවාදයද, (දනිමියයි කීමද) කියමි. ථෙරවාදයද (එහි ස්ථිරයයි කීමද) දනිමියිද දකිමියිද පිළිගනිමි. මා පමණක් නොව අන්‍යයෝද (මා ගැන) එසේ කියති. රාජකුමාරය, ඒ මට මේ සිත විය. ආළාරකාලාම තෙම මේ ධර්මය ඇදහීම පමණකින් තමාම උසස් නුවණින් අවබොධ කොට ඊට පැමිණ වාසය කරමියි නොකියයි. ආළාර කාලාම

තෙම මේ ධර්මය දැන දැක වාසය කරයි. (කියායි.) රාජකුමාරය, ඉන්පසු මම ආළාරකාලාම යම් තැනකද එහි ගියෙමි. ගොස්, ආළාරකාලාම හට මෙසේ කීවෙමි. ඇවැත්නි, කාලාමයෙනි, කොපමණකින් මේ ධර්මය තමාම දැන අවබොධ කොට ඊට පැමිණ ප්‍රකාශ කෙරේදැ”යි (කියායි)

8. “රාජකුමාරය, මෙසේ කී කල්හි ආලාරකාලාම තෙම ආකිඤ්චඤ්ඤායතනය කෙළවර කොට ඇති සමාපත්තිය දැක්වූයේය. රාජකුමාරය, ඒ මට මේ සිත පහළවිය. ‘ආළාරකාළාමහට පමණක් ශ්‍රද්ධාව ඇත්තේ නොවෙයි. මටද ශ්‍රද්ධාව ඇත. ආළාරකාළාමහට පමණක් වීර්ය ඇත්තේ නොවෙයි, මටද වීර්යය ඇත. ආළාරකාළාමහට පමණක් සිහිය ඇත්තේ නොවෙයි. මටද සිහිය ඇත, ආළාරකාළාමහට පමණක් සමාධිය ඇත්තේ නොවෙයි, මටද සමාධිය ඇත. ආළාරකාළාමහට පමණක් ප්‍රඥාව ඇත්තේ නොවෙයි, මටද ප්‍රඥාව ඇත. යම් හේතුවකින් ආළාරකාම තෙම යම් ධර්මයක් තමාම නුවණින් දැන ඊට පැමිණ වාසය කරමියි, කියයි නම් ඒ ධර්මය අත්කර ගැණීම පිණිස මම උත්සාහ කරන්නෙම් නම් හොඳය’ (කියායි.)

“රාජකුමාරය, ඒ මම ටික කලකින් වහාම ඒ ධර්මය තමාම නුවණින් දැන අවබොධකොට ඊට පැමිණ වාසය කෙළෙමි. රාජකුමාරය, ඉන්පසු මම ආළාරකාලාම තෙම යම් තැනකද එතැනට ගියෙමි. ගොස් ‘ඇවැත්නි කාලාමයෙනි, මේ ධර්මය දැන අවබොධ කොට ඊට පැමිණ ප්‍රකාශ කරන්නේ මෙපමණෙකින්දැ’යි (ඇසීමි) ‘ඇවැත්නි, මේ ධර්මය දැන අවබොධ කොට ඊට පැමිණ ප්‍රකාශ කරන්නෙම් මෙපමණකින්ය’යි (ආළාරකාලාම තෙම) කීය. ‘ඇවැත්නි, මමද මෙපමණකින් මේ ධර්මය දැන අවබොධකොට ඊට පැමිණ වාසය කරමි’යි (කීවෙමි) ‘ඇවැත්නි, යම් බඳුවූ අපි ආයුෂ්මත්වූ ඔබ වැනිවූ සමාන බ්‍රහ්මචර්යා ඇත්තෙකු දකින්නෙමුද, ඒ අපට ලාභයකි. උතුම් ලාභයකි. මෙසේ මම යම් ධර්මයක් දැන අවබොධකොට ඊට පැමිණ ප්‍රකාශ කරම්ද, ඔබ ඒ ධර්මය දැන

අවබොධකොට ඊට පැමිණ වාසය කරන්නෙහිය. ඔබ යම් ධර්මයක් දැන අවබොධ කොට ඊට පැමිණ වාසය කරන්නෙහිද, මමද ඒ ධර්මය දැන අවබොධකොට ඊට පැමිණ ප්‍රකාශ කරන්නෙමි. මෙසේ මම යම් ධර්මයක් දන්නෙම්ද ඔබද ඒ ධර්මය දන්නෙහිය. යම් හේතුවකින් ඔබ යම් ධර්මයක් දන්නෙම්ද, මමද ඒ ධර්මය දන්නෙමි. මෙසේ මම යම් බඳුද ඔබත් එබඳුය. ඔබ යම් බඳුද මාත් එබඳුය. ඇවැත්නි, එනු මැනව. දෙදෙනම එක්ව මේ පිරිස පාලනය කරවු'යි (කීවේය) රාජ කුමාරය, මෙසේ මාගේ ආචාර්යවූම ආළාරකාලාම තෙම අතවැසි (ශිෂ්‍ය) වූ ඔහු හා සම සම ස්ථානයෙහි තැබීය. උත්තමවූ පූජාවෙන් මා පිදුවේය.

**9.** "රාජකුමාරය, ඒ මට මෙසේ සිතුනේය. 'මේ (තාපස) ධර්මය සසර කලකිරීම පිණිස නොපවතියි. සසර නොඇල්ම පිණිස නොපවතියි. කෙලෙස් නැති කිරීම පිණිස නොපවතියි (දතයුතු ධර්මයන්) දැනීම පිණිස නොපවතියි. (චතුරාර්ය සත්‍ය) අවබොධය පිණිස නොපවතියි. නිර්වානය පිණිස නොපවතියි. ආකිඤ්චඤ්ඤායතන බ්‍රහ්ම ලොකයෙහි ඉපදීම පිණිස පමණක් පවතියි. රාජකුමාරය, ඒ මම ඒ ධර්මය ප්‍රමාණ නොවේයයි සිතා, ඒ ධර්මයෙහි කලකිරී ඉවත්ව ගියෙමි.

"රාජකුමාරය, ඒ මම කුසල් කුමක්දැයි සොයන්නේ නිරුත්තරවූ උතුම් නිර්වාණය සොයන්නේ උද්දකරාම පුත්තතෙම යම් තැනකද එතැනට පැමිණියෙමි. පැමිණ උද්දකරාම පුත්තහට මෙසේ කීවෙමි. 'ඇවැත්නි, රාමයෙනි, මේ ධර්ම විනයෙහි බ්‍රහ්මචර්යාව රකින්ට මම කැමැත්තෙමි' (කීවෙමි) "රාජකුමාරය, මෙසේ කී කල්හි උද්දකරාම පුත්තතෙම මට මෙසේ කීවේය. 'යම් තැනක නුවණ ඇත්තාවූ පුරුෂයෙක් නොබෝ කලකින් තමන්ගේ ආචාර්යයන්ගේ ධර්මය තමාම නුවණින් දැන අවබොධකොට ඊට පැමිණ වාසය කරන්නේද, මේ ධර්මයද එබඳුය. එහෙයින් ආයුෂ්මත්තෙම වාසය කෙරේවා' (කියායි.)

**10.** "රාජකුමාරය, ඒ මම ටික කලකින් වහාම ඔවුන්ගේ ඒ ධර්මය ඉගෙනගත්තෙමි, රාජකුමාරය, ඒ මම කීමට තොල

සෙලවූ පමණින්, වචනයක් කී පමණින් දනිමි යන වචනයද, දැනීම ස්ථිරය යන වචනයද ප්‍රකාශ කරමි. මම දනිමි, දකිමියි කියමි. මා පමණක් නොව අන්‍යයෝද (මා ගැන) එසේ කියති. රාජකුමාරය, ඒ මට මේ සිත විය. 'උද්දකරාම පුත්ත තෙම මේ ධර්මය ඇදහීම් පමණකින් තමාම උසස් නුවණින් දැන අවබොධකොට ඊට පැමිණ වාසය කරමියි, නොකියයි. උද්දකරාම පුත්ත තෙම මේ ධර්මය දැන, දැක වාසය කළේයි'. (මට කල්පනාවිය.) රාජකුමාරය, ඉන්පසු මම උද්දකරාම පුත්ත යම් තැනකද එතැනට ගියෙමි. උද්දකරාම පුත්තහට මෙසේ කීවෙමි 'ඇවැත්නි, රාමයෙනි, කොපමණකින් මේ ධර්මය තමාම දැන අවබොධ කොට ඊට පැමිණ ප්‍රකාශ කෙරේදැයි' (කියායි)

"රාජකුමාරය, මෙසේ කී කල්හි උද්දකරාම පුත්ත නෙවසඤ්ඤානාසඤ්ඤායතනය, කෙළවර කොට ඇති සමාපත්තිය දැන්වූයේය. රාජකුමාරය, ඒ මට මේ සිත විය. 'රාමහට පමණක් ශ්‍රද්ධාව ඇත්තේ නොවෙයි. මටද ශ්‍රද්ධාව ඇත. රාමහට පමණක් වීර්යය ඇත්තේ නොවෙයි. මටද වීර්යය ඇත. රාමහට පමණක් සිහිය ඇත්තේ නොවෙයි. මටද සිහිය ඇත. රාමහට පමණක් සමාධිය ඇත්තේ නොවෙයි මටද සමාධිය ඇත. රාමහට පමණක් ප්‍රඥාව ඇත්තේ නොවෙයි. මටද ප්‍රඥාව ඇත. යම් හේතුවකින් රාමපුත්තතෙම යම් ධර්මයක් තමාම නුවණින් දැන ඊට පැමිණ වාසයකරමියි කියයි නම් ඒ ධර්මය තමන්ම ප්‍රත්‍යක්ෂ කර ගැණීම පිණිස වීර්ය කරන්නෙම් නම් යහපත්ය.' (කියායි.)

11. "රාජකුමාරය, ඒ මම ටික කලකින් වහාම ඒ ධර්මය තමාම නුවණින් දැන අවබොධ කොට ඊට පැමිණ වාසය කෙළෙමි. රාජකුමාරය, ඉන්පසු මම උද්දකරාම පුත්ත යම් තැනකද එතැනට ගියෙමි. ගොස්, උද්දකරාම පුත්තහට මෙසේ කීවෙමි.

'ඇවැත්නි, රාමයෙනි, මේ ධර්මය දැන අවබොධකොට ඊට පැමිණ ප්‍රකාශ කරන්නේ මෙපමණකින්දැ"යි ඇසීමි. 'ඇවැත්නි, මේ ධර්මය දැන අවබොධ කොට ඊට පැමිණ ප්‍රකාශ

කරන්නෙම් මෙපමණකින්ය'යි (උද්දකරාමතෙම) කීය. 'ඇවැත්නි, මමද මෙපමණකින් මේ ධර්මය දැන අවබොධකොට ඊට පැමිණ වාසය කරම්'යි කීවෙමි.

"ඇවැත්නි, යම්බඳුවූ අපි ආයුෂ්මත්වූ ඔබ වැනිවූ සමාන බ්‍රහ්මචරියා ඇත්තෙකු දකින්නෙමුද ඒ අපට ලාභයකි. මහත් ලාභයකි. මෙසේ මම යම් ධර්මයක් දැන අවබොධ කොට ඊට පැමිණ ප්‍රකාශ කරම්ද, ඔබ ඒ ධර්මය නුවණින් දැන අවබොධකොට ඊට පැමිණ වාසය කරන්නෙහිය. ඔබ යම් ධර්මයක් දැන අවබොධ කොට ඊට පැමිණ වාසය කරන්නෙහිද, මමද ඒ ධර්මය දැන අවබොධකොට ඊට පැමිණ ප්‍රකාශ කරන්නෙමි. මෙසේ මම යම් ධර්මයක් දන්නේද, ඔබ ඒ ධර්මය දන්නෙහිය. ඔබ යම් ධර්මයක් දන්නේද, මමද ඒ ධර්මය දන්නෙමි. මෙසේ මම යම් බඳුද ඔබත් එබඳුය. ඔබ යම් බඳුද මමත් එබඳුය. ඇවැත්නි, එව, දෙදෙනම එක්ව මේ පිරිසපාලනය කරමුයි' (කීවේය) රාජ කුමාරය, මෙසේ මාගේ ආචාර්යවූම උද්දකරාමපුත්ත තෙම අතවැසි (ශිෂ්‍ය) වූ මා ඔහු හා සම සම ස්ථානයෙහි තැබීය. උතුම්වූ පූජාවෙන් මට පිදුවේය.

**12.** "රාජ කුමාරය, ඒ මට මෙසේ සිතුනේය. 'මේ (තාපස) ධර්මය සසර කලකිරීම පිණිස නොපවතී. සසර නොඇල්ම පිණිසනොපවී. කෙලෙස් නැති කිරීම පිණිස නොපවතී. (දතයුතු ධර්මයන්) දැනීම පිණිස නොපවතී. (චතුරාර්යසත්‍යය) අවබොධය පිණිස නොපවතී. නිර්වාණය පිණිස නොපවතී. යම්තාක් නෙවසඤ්ඤානාසඤ්ඤායතන බ්‍රහ්ම ලොකයෙහි ඉපදීම පිණිස පමණක් පවතියි'. රාජ කුමාරය, ඒ මම ඒ ධර්මය ප්‍රමාණ නොකොට කලකිරී ඒ ධර්මයෙන් ඉවත්ව ගියෙමි.

"රාජකුමාරය ඒ මම කුසල් කුමක්දැයි සොයමින්, නිරුත්තරවූ නිර්වාණය සොයමින්, මගධ ජනපදයෙහි පිළිවෙලින් ගමන් කරන්නේ උරුවෙල් දනව්වෙහි සේනානි නම් නියම්ගම යම් තැනකද එහි පැමිණියෙමි. එහි සුදුවැලි තලා ඇත්තාවූ, යහපත් තොටවල් ඇත්තාවූද, ගලායන ගඟ ඇත්තාවූද, අවට ගොදුරු ගම් ඇත්තාවූද, ප්‍රසාදය ඇති කරන්නාවූද, සිත් සතුටු

කරන්නාවූද වනලැහැබක් ඇති බිම් පෙදෙසක් දුටිමි. රාජකුමාරය, ඒ මට මේ සිත පහළ විය. ඒකාන්තයෙන් භූමි ප්‍රදෙශය සිත් අලවන්නේය. වනලැහැබ සතුට උපදවන්නේය. සුදු වැලිතලා ඇති හොඳ තොටුපලවල් ඇති ගංගාවද සිත් අලවන්නීය. හාත්පස ගොදුරු ගම්ද වෙයි. වීර්යය කරන කුලපුත්‍රයෙකුට වීර්ය කිරීමට මෙය ඒකාන්තයෙන් සුදුසුයි. රාජකුමාරය, ඒ මම මේ ස්ථානය වීර්ය කිරීමට සුදුසුයයි සිතා වීර්යය වැඩීම පිණිස එහිම උන්නෙමි.

13. "රාජකුමාරය, මට ආශ්චර්යවූ, පෙර නොඇසූ විරූ උපමා තුනක් වැටහුනාහුය. රාජකුමාරය, යම්සේ කිරි සහිතවූ අමු දියේ දමනලද තෙත්වූ (දිඹුල්) ලී කැබැල්ලක් වේද, ඉක්බිති පුරුෂයෙක් තෙම ගිනිගානා දණ්ඩක් ගෙන ගිනි නිපදවන්නෙමියි, ගින්දර ඇතිකරන්නෙමියි, කියා එන්නේය. රාජකුමාරය, ඒ පුරුෂ තෙම ජලයෙහි බහාලන ලද ඒ කිරි සහිත අමු (දිඹුල්) ලී කැබෙල්ල ගිනි ගානා දණ්ඩන් මැදීමෙන් ගිනි නිපදවන්නේද? ගිනි පහළ කරන්නේද?" "භවත් ගෞතමයෙනි, එය සිදු නොවන්නේය. ඊට හේතු කවරේද යත්:- භවත් ගෞතමයෙනි, (දිඹුල්) ලී කඩ වනාහි අමුය, කිරි සහිතය, එපමණක් නොව ජලයෙහිද බහාලන ලද්දේය. (එහෙයිනි) (ඒ ලීයෙන් ගිනි උපදවනු කැමැති) ඒ පුරුෂ තෙම ක්ලාන්තයටද, වෙහෙසටද පැමිණීම පමණක් සිදුවන්නේය." "රාජකුමාරය, එපරිද්දෙන්ම යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ කයින් වස්තු කාමයන්ගෙන් වෙන්ව වාසය නොකරත්ද, කාම වස්තු කෙරෙහි ඔවුන්ගේ යම්කිසි ඇල්මක් වේද, කාම ආසාවක් වේද, කාම මූර්ජාවක් වේද කාම පිපාසයක් වේද, කාම දැවිල්ලක් වේද, ඒ ක්ලේශ කාමය තමා තුල මනාව නැති නොවූයේ වේද, මනාව මැඩපවත්වන ලද්දේ නොවේද, ඒ පින්වත් මහණ බමුණෝ උපක්‍රමයෙන් හටගත්තාවූ, දුක්වූ, තියුණුවූ, කටුකවූ, වේදනාවන් විඳිත්. ඔවුහු ආර්ය මාර්ග ඥාන දර්ශනයටද, නිරුත්තරවූ අවබොධයටද නුසුදුස්සෝමය රාජකුමාරය, ආශ්චර්යවූ පෙර නොඇසුවිරූ මේ පළමු වන උපමාව මට වැටහුණි.

14. "රාජ කුමාරය, ආශ්චර්යවූ පෙර නොඇසූවිරූ අන්‍යවූ දෙවෙනි උපමාවක්ද මට වැටහිණි. රාජකුමාරය යම්සේ කිරි සහිතවූ අමු (දිඹුල්) ලීයක් දියෙන් ඈත්කොට ගොඩවීමෙහි බහා තබන ලද්දේ වේද, ඉක්බිති පුරුෂයෙක් තම ගිනිගානා දණ්ඩ ගෙන ගිනි නිපදවන්නෙමි. ගින්න පහළ කරන්නෙමියි කියා එන්නේය. රාජකුමාරය, ඒ පුරුෂ තෙම කිරි සහිතවූ දියෙන් ගෙන ගොඩ තබන ලද්දාවූ, ඒ අමු ලීය ගිනිගානා දණේඩන් මැදීමෙන් ගිනි උපදවන්නේද? ගින්දර පහළ කරන්නේද?" "භවත් ගෞතමයෙනි, එය සිදු නොවන්නේය. ඊට හේතු කවරේද යත්. භවත් ගෞතමයෙනි, ඒ ලී කඩ ජලයෙන් බැහැර කර ගොඩ බිමෙහි දමා තිබුණත් කිරි සහිතය (අමුය) එහෙයිනි. ඒ පුරුෂයා ක්ලාන්තයටද, වෙහෙසටද පත්වීම පමණක් නම් සිදුවන්නේය" "රාජකුමාරය, "එපරිද්දෙන්ම යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ කයින් කාමයන්ගෙන් වෙන්ව වාසය කරත්ද, (එහෙත්) කාම වස්තු කෙරෙහි ඔවුන්ගේ ඇල්මක් වේද, කාම ආශාවක් වේද, කාම මූර්ජාවක් වේද, කාම පිපාසයක් වේද, කාම දැවිල්ලක් වේද, එය අභ්‍යන්තරයෙහි මනාව නැති නොවූයේ වේද නොව මැඩ නොපවත්වන ලද්දේ වේද, ඒ පින්වත් මහණ බමුණෝ උපක්‍රමයෙන් හටගත්තාවූ දුක්වූ, තියුණුවූ, කටුකවූ වේදනාවන් විඳිත්. ඔවුහු ආර්ය ඥාන දර්ශනයටද, නිරුත්තර අවබොධයටද නුසුදුස්සෝමය.

"ඒ පින්වත් මහණ බමුණෝ උපක්‍රමයෙන් හටගත්තාවූ, දුක්වූ, තියුණුවූ, කටුකවූ, වේදනාවන් ඉදින් නොවිඳින්නාහුද, ඥාන දර්ශනය ලැබීමටද, නිරුත්තරවූ අවබොධයටද නුසුදුස්සෝමය. රාජකුමාරය, මේ වනාහි මට වැටහුනු පුදුමවූ, පෙර නොඇසුවාවූ දෙවෙනි උපමාවය.

15. "රාජකුමාරය, පුදුමවූ පෙර නොඇසුවාවූ තුන්වෙනිවූ අන්‍ය උපමාවක්ද මට වැටහුනේය. රාජකුමාරය, වියලුනාවූ, කිරි සිඳුනාවූ, දියෙන් ඈත්කොට ගොඩබිමෙහි තබන ලද වියලි දරලීයක් වේද, එකල්හි පුරුෂයෙක් ගිනිගානා දණ්ඩ ගෙන ගිනි උපදවන්නෙමි. ගින්න ඇති කරන්නෙමියි එන්නේය.

රාජකුමාරය, ඒ පුරුෂතෙම වියලුනාවූ, කිරි සිඳුනාවූ, දියෙන් ඈත්කොට ගොඩ තබන ලද ඒ ලීය ඒ ගිනි ගානා දණ්ඩ ගෙන මැදීමෙන් ගිනි උපදවන්නේද, ගින්න ඇති කරන්නේද?" "භවත් ගෞතමයෙනි, එසේය. ඊට හේතු කවරේද? භවත් ගෞතමයෙනි, ඒ ලීය වියලුනේ වෙයි, කිරි සිඳුනේ වෙයි, දියෙන් ගෙන ගොඩ තබන ලද්දේත් වෙයි." "රාජකුමාරය, එපරිද්දෙන්ම යම් ඒ ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ කයින් කාමයන්ගෙන් වෙන්ව වාසය කරත්ද, ඔවුන්ගේ කාමවස්තූන් කෙරෙහි යම් ඇල්මක් වේද, කාම ආසාවක් වේද, කාම මූර්ජාවක් වේද, කාම දැවිල්ලක් වේද, ඒ කාම ආශාව අධ්‍යාත්මයෙහි (ඇතුලත) හොඳින් ප්‍රහීනවූයේ වේද, හොඳින් මැඩපැවතියේද, ඒ පින්වත් මහණ බමුණෝ උපක්‍රමයෙන් හටගත්තාවූ, තියුණුවූ, කටුකවූ, වේදනාවන් නොවිඳිත්. ඔවුහු මාර්ග ඥාන දර්ශනය පිණිස, නිරුත්තරවූ අවබොධය පිණිස සුදුස්සෝමැයි රාජකුමාරය, ආශ්චර්යවූ පෙර නොඇසූ විරූ මේ උපමා තුන මට වැටහුනාහුය.

**16.** "රාජකුමාරය, ඒ මට මේ සිත පහළවිය. 'යම්හෙයකින් මම යටි දත් පෙළෙහි උඩු දත් පෙළ තදකරගෙන (දත්මිටි කාගෙන.) දිව උඩුතල්ලෙහි තද කරගෙන, කුසල් සිතින් අකුසල් සිත යටපත් කරන්නෙම් නම්, පෙළන්නෙම් නම් යෙහෙක' (කියායි.) රාජ කුමාරය, ඒ මම දත්මිටිකාගෙන දිව උඩුතල්ලෙහි තදකරගෙන, කුසල් සිතින් අකුසල් සිත යටපත් කරමි. පෙළමි, තවමි. රාජකුමාරය, දත්මිටි කාගෙන දිව උඩුතල්ලෙහි තද කරගෙන කුසල් සිතින් අකුසල් සිත යටපත් කරන්නාවූ, පෙළන්නාවූ, තවන්නාවූ ඒ මාගේ කිහිලිවලින් ඩාදිය වැගිරෙන්නේය.

"රාජ කුමාරය, යම්සේ බලවත් පුරුෂයෙක් තෙම වඩා දුර්වල පුරුෂයෙකු හිසින් හෝ අල්වාගෙන, බෙල්ලෙන් හෝ අල්වාගෙන තදකරන්නේද, පෙළන්නේද, තවන්නේද, රාජකුමාරය, එපරිද්දෙන්ම දත්මිටිකාගෙන, දිව උඩුතල්ලෙහි

තදකරගෙන කුසල් සිතින් අකුසල් සිත යටපත් කරන්නාවූ, පෙළන්නාවූ, තවන්නාවූ ඒ මාගේ කිහිලිවලින් ඩාදිය වැගිරෙයි.

17. "රාජ කුමාරය, මා විසින් නොහැකුළුණු වීර්යය පටන්ගන්නා ලද්දේය. සිහිය එළඹ සිටියාය. එහෙයින්ම නුමුළාවිය. ප්‍රධාන වීර්යයෙන් මඩනා, ලද්දාවූම මාගේ ශරීරය දාහ සහිත විය. නොසන්සිඳුනේ විය. රාජකුමාරය, මට උපන්නාවූද මෙබඳුවූද, දුක්වේදනාව කුසල් සිත විනාශ නොකරයි.

"රාජ කුමාරය, ඒ මට මේ සිත පහළ විය. 'යම් හෙයකින් මම ආශ්වාස කිරීම රහිත ධ්‍යානය වඩන්නෙම් නම් යෙහෙක' (කියාය) රාජකුමාරය, ඒ මම කටින්ද නාසයෙන්ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූයෙමි. රාජකුමාරය, කටින්ද, නාසයෙන්ද ආශ්වාස ප්‍රශ්වාස වැළක්වූ කල්හි කන් සිදුරුවලින් පිටවන වාතයෙහි අධික ශබ්දය ඇතිවෙයි. මයින හමක් පිඹින කල්හි යම්සේ අධික ශබ්දයක් ඇතිවේද, එපරිද්දෙන්ම රාජකුමාරය, මාගේ මුඛයෙන්ද නාසයෙන්ද ආශ්වාස ප්‍රශ්වාස වැළක්වූ කල්හි කන් සිදුරුවලින් පිටවන වාතයෙහි අධික ශබ්දය ඇතිවෙයි.

18. "රාජ කුමාරය, මා විසින් නොහැකුළුණු වීර්ය පටන්ගන්නා ලදී. සිහිය එළඹ සිටියාය (එහෙයින්ම) මුළා නොවීය. ප්‍රධාන වීර්යයෙන් වීර්යය වඩන්නාවූ මාගේ ශරීරය දාහ සහිත වෙයි. නොසන්සිඳුනේ වෙයි. රාජකුමාරය, මට උපන්නාවූද, මෙබඳුවූද, දුක්වේදනාව කුසල් සිත විනාශ නොකරයි.

"රාජ කුමාරය, ඒ මට මෙසේ කල්පනා විය. 'යම් හෙයකින් මම ආශ්වාස රහිත ධ්‍යානයම වඩන්නෙම් නම් යෙහෙක' (කියායි) රාජකුමාරය, ඒ මම මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද, ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූයෙමි. රාජ කුමාරය, මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද ආශ්වාස ප්‍රශ්වාස වැළක්වූ කල්හි අධික වාතය හිස්මුදුන පලන්නාක් මෙන් වෙයි. රාජකුමාරය, යම්සේ බලවත් පුරුෂයෙක් තියුණු කටුවකින් හිස්මුදුන විදින්නේද

එපරිද්දෙන්ම රාජකුමාරය, මගේ මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූ, කල්හි අධික වාතය හිස්මුදුන පලන්නාසේ වෙයි.

**19.** "රාජ කුමාරය, මා විසින් නොහැකුළුණු වීර්යය පටන්ගන්නා ලද්දේමය. සිහිය එළඹ සිටියාය. (එහෙයින්ම) මුළාව නොවීය. ප්‍රධාන වීර්යයෙන් වීර්යය වඩන්නාවූ මාගේ ශරීරය දාහ සහිතවිය. නොසංසිඳුනේ වෙයි. රාජකුමාරය, මට උපන්නාවූ මෙබඳුවූද, දුක් වේදනාව කුසල් සිත විනාශ නොකරයි.

"රාජ කුමාරය, ඒ මට මෙසේ කල්පනා විය. 'යම් හෙයකින් මම ආශ්වාස රහිත ධ්‍යානයම වඩන්නේ නම් යෙහෙක' (කියාය). රාජකුමාරය, ඒ මම මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූයෙමි. රාජ කුමාරය, මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූ කල්හි හිසෙහි අධික වේදනාව ඇතිවෙයි. රාජ කුමාරය, යම්සේ බලවත් පුරුෂයෙක් දැඩි වරපට බැම්මකින් හිස වෙළයිද, එපරිද්දෙන්ම රාජකුමාරය, මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූ කල්හි මගේ හිසෙහි වේදනාව ඇති වෙයි.

**20.** "රාජ කුමාරය, මා විසින් නොහැකුළුණු වීර්යය පටන්ගන්නා ලද්දේමය, සිහිය එළඹ සිටියාය. (එහෙයින්ම) මුළාව නොවීය. ප්‍රධාන වීර්යයෙන් වීර්යය වඩන්නාවූ මාගේ ශරීරය දාහ සහිත විය. නොසංසිඳුනේ වෙයි. රාජකුමාරය, මට උපන්නාවූ මෙබඳුවූද, දුක් වේදනාව කුසල් සිත විනාශ නොකරයි.

"රාජ කුමාරය, ඒ මට මෙසේ කල්පනා විය. 'යම් හෙයකින් මම ආශ්වාස රහිත ධ්‍යානයම වඩන්නේ නම් යෙහෙක' (කියාය). රාජකුමාරය, ඒ මම මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූයෙමි. රාජකුමාරය, මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූ කල්හි අධිකවූ වාතයෝ කුස සිඳිත්.

"රාජකුමාරය, දක්ෂවූ ගවයන් මරන්නෙක් හෝ ගවයන් මරන්නෙකුගේ අතවැසියෙක් හෝ ගෙරින් කපන තියුණු

ආයුධයකින් බඩ කපන්නේ යම්සේද, එපරිද්දෙන්ම මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූ කල්හි අධික වාතය උදරය කපන්නාසේ වෙයි.

**21.** "රාජකුමාරය, මා විසින් නොහැකුළුණු වීර්යය පටන් ගන්නා ලද්දේමය, සිහිය එළඹ සිටියාය. (එහෙයින්ම) මුළාව නොවීය. ප්‍රධාන වීර්යයෙන් වීර්යය කරන්නාවූ මාගේ ශරීරය දාහ සහිත විය. නොසංසිඳුනේ වෙයි. රාජකුමාරය, මට උපන්නාවූ මෙබඳුවූද, දුක් වේදනාව කුසල් සිත විනාශ නොකරයි.

"රාජකුමාරය, ඒ මට මෙසේ කල්පනා විය. 'ආශ්වාස රහිත ධ්‍යානය වඩන්නේ නම් යෙහෙක' (කියාය). රාජකුමාරය, ඒ මම මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක් වූයෙමි. රාජකුමාරය, මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූ කල්හි ශරීරයෙහි අධික දැවිල්ලක් වෙයි. රාජකුමාරය, යම්සේ බලවත් පුරුෂයෝ දෙදෙනෙක් දුර්වල පුරුෂයෙකු අත් දෙකෙන් අල්ලා ගෙන අඟුරු වළකට අල්ලා තවන්නාහුද, අතිශයින් තවන්නාහුද, රාජකුමාරය, එපරිද්දෙන්ම මුඛයෙන්ද, නාසයෙන්ද, කණින්ද ආශ්වාස ප්‍රශ්වාස වැළැක්වූ කල්හි මගේ ශරීරයේ අධික දැවිල්ලක් වෙයි.

**22.** "රාජකුමාරය, මා විසින් වීර්යය පටන්ගන්නා ලද්දේමය සිහිය එළඹ සිටියාය. (එහෙයින්) මුළාව නොවීය. ප්‍රධාන වීර්යයෙන් වීර්ය කරන්නාවූ මාගේ ශරීරය දාහ සහිත වීර්යයෙන්ම විඩා සහිත වෙයි. නොසංසිඳුනේ වෙයි. රාජ කුමාරය, මට උපන්නාවූ මෙබඳුවූද දුක් වෙදනාව කුසල් සිත විනාශ නොකරයි.

"එකල්හි දේවතාවෝ මා දැක මෙසේ කීහ. 'ශ්‍රමණ ගෞතම තෙම කළුරිය කළේය' (කියායි) ඇතැම් දේවතා කෙනෙක් මෙසේ කීහ. 'ශ්‍රමණ ගෞතමතෙම කළුරිය නොකෙළේය. එහෙත් කළුරිය කරන්නේය' (කියායි.) ඇතැම් දෙවතා කෙනෙක් 'ශ්‍රමණ ගෞතම තෙම කලුරිය කළේත් නොවේ. කලුරිය කරන්නේත් නොවෙයි.

ශ්‍රමණ ගෞතම තෙම රහත්ය. රහතුන්ගේ වාසය කිරීමකැ'යි (කීහ.)

23. "රාජකුමාරය, ඒ මට මෙසේ කල්පනාවිය. යම් හෙයකින් මම මුළුමනින් ආහාර නොවැළදීම පිණිස පිළිපදින්නෙම් නම් ඉතා යෙහෙක' (කියායි). රාජකුමාරය, එවිට දේවතාවෝ මාවෙත පැමිණ මෙසේ කීහ. 'නිදුකාණෙනි, ඔබ මුළුමනින් ආහාර නොගෙන සිටින්නට නොසිතුව මැනවි, යම් හෙයකින් ඔබ මුළුමනින් ආහාර නොගෙන සිටිය හොත් අපි ඔබගේ ලෝම සිදුරුවලින් දිව්‍ය ඕජස් ශරීරගත කරන්නෙමු ඔබ එයින් යැපෙන්නෙහිය.' රාජකුමාරය, ඒ මට මෙසේ කල්පනා විය. මම වනාහි මුළුමනින් නිරාහාරව සිටීමට සිතින් එකඟ වුනෙමි. එහෙත් මේ දේවතාවෝ මාගේ ලොම සිදුරුවලින් දිව්‍ය ඕජස ගිල්වන්නාහු නම් එයින් මම යැපෙන්නෙමි. එය මාගේ මුසාවක් වන්නේය. (කියායි.) රාජකුමාරය, ඒ මම ඒ දෙවියන් වැළැක්වූයෙමි. වුවමනා නැතැයි කීයෙමි.

24. "රාජකුමාරය, ඒ මට මේ සිත පහළ විය. 'යම් හෙයකින් මම පතක්, පතක් පමණවූ මුංතැම්බු දිය හෝ කොල්ලු තැම්බූ දිය හෝ කඩල තැම්බූ දිය හෝ කලතණ තැම්බූ දිය හෝ ඉතා ස්වල්පවූ ආහාරයක් වළඳන්නෙම් නම් යෙහෙකි, (කියායි.)

"රාජකුමාරය, ඒ මම පතක්, පතක් පමණවූ, මුංතැම්බූ දිය හෝ කොල්ලු තැම්බූ දිය හෝ කඩල තැම්බූ දිය හෝ කලතණ තැම්බූ දිය හෝ ඉතා ස්වල්ප වශයෙන් ආහාරය වැළඳුවෙමි. රාජකුමාරය, ඒ මම පතක් පතක් පමණවූ මුං තැම්බූ දිය හෝ කොල්ලු තැම්බූ දිය හෝ කඩල තැම්බූ දිය හෝ කලතණ තැම්බූ දිය හෝ ඉත් ස්වල්ප වශයෙන් ආහාර ගන්නාවූ ඒ මාගේ ශරීරය ඉතා කෙට්ටු බවට පැමිණියේ වෙයි, අසූ වසක් ගිය වැලක පුරුක් හෝ කලුවැල් නම් වැලක පුරුක් හෝ යම්සේද මාගේ ඇඟපසඟ ඒ නිරාහාරභාවය නිසාම එබඳුවිය. ඔටුපියවර යම්සේ මැද ගැඹුරුවේද, එපරිද්දෙන්ම ඒ නිරාහාර භාවයෙන් මාගේ නිසීදනමාංසය (තට්ටම) මැදින් ගැඹුරු විය. රැහැණක ඇවුණු දැව වැටිය යම්සේ අතරතුර උස්මිටි වේද, එපරිද්දෙන්

ඒ නිරාහාර භාවයෙන් මාගේ කොඳු ඇටය උස් මිටිවෙයි. යම්සේ දිරූ ශාලාවක පරාල උඩු යටි වශයෙන් නැමුනාහු වෙද්ද, එපරිද්දෙන් මාගේ ඉළඇට උඩුයටි වශයෙන් නැමුනාහු වෙත් ගැඹුරුවූ ළිඳෙක දියයට පෙණෙන තරු ගැඹුරට ගියාහු, යට බැස්සාහු දක්නා ලැබෙත්ද, එපරිද්දෙන්ම ඒ ස්වල්ප ආහාරය නිසා මාගේ ඇස්වල නෙත්තරු වල ගැඹුරට ගියාහු යට බැස්සාහු දක්නා ලැබෙත්. යම්සේ නම් තිත්ත ලබු ගෙඩියක් අමුවෙන් කපන ලද්දේ අව්සුළඟින් හැකුලුණේද මැලවුනේද එපරිද්දෙන්ම ඒ ස්වල්ප ආහාරය නිසා මගේ හිසේ සම හැකුලුණේ මැලවුනේ වෙයි.

"රාජකුමාරය, ඒ මම බඩේ සම අතගාන්නෙමියි පිට කටුවම අතගාන්නෙමි. පිට කටුව අල්වමියි බඩේ සම අල්ලමි රාජකුමාරය, ඒ ස්වල්ප ආහාරය නිසා එපමණට මාගේ බඩේ සම කොඳු ඇටයෙහි ඇලුනේ වෙයි. ඒ මම වර්චස් හෝ මුත්‍ර හෝ කරන්නෙමියි හුන්නේ ඒ ස්වල්ප ආහාරය නිසාම එහිම යටිකුරුව වැටෙමි. මම මේ ශරීරය අස්වසමියි අතින් ශරීරාවයව පිරිමදිමි. රාජකුමාරය, එසේ ශරීරයේ අවයව අතගානවිට, ඒ ස්වල්ප ආහාරය නිසාම මුල්කුණුවූ ලොම් ශරීරයෙන් වැටෙත්.

"රාජ කුමාරය, සමහර මිනිස්සු මා දැක මෙසේ කීවාහුය. ශ්‍රමණ ගෞතමතෙම කලුය.' ඇතැම් මිනිස්සු මෙසේ කීවාහුය, ශ්‍රමණ ගෞතමතෙම කලු නොවෙයි පලාවන් පාටය' ඇතැම් මනුෂ්‍යයෝ මෙසේ කීවාහුය. 'ශ්‍රමණ ගෞතමතෙම කලුත් නොවෙයි, පලාවන් පාටත් නොවෙයි, ශ්‍රමණ ගෞතමතෙම රන්වන් සිවි ඇත්තේයි.' රාජකුමාරය, මෙසේ කීමට තරමටම මාගේ පිරිසිදුවූ හාත්පසින් බබලන්නාවූ ශරීරවර්ණය ඒ නිරාහාර භාවය නිසාම නැසුනේ වෙයි.

**25.** "රාජකුමාරය, ඒ මට මෙසේ සිතුනේය. අතීත කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ උපක්‍රමයෙන් උපන්නාවූ, දුක්වූ, තියුණුවූ, කටුකවූ වේදනා වින්දාහු නම් ඒ මේ තරම්ම වෙයි. මට වඩා වැඩි නොවෙයි අනාගත කාලයෙහි යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ උපක්‍රමයෙන්

උපන්නාවූ දුක්වූ, තියුණුවූ, කටුකවූ වේදනා විඳින්නාහු නම් ඒ මේ තරම්ම වෙයි. මීට වඩා වැඩි නොවෙයි. මේ වර්තමාන කාලයෙහි යම් කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ උපක්‍රමයෙන් උපන්නාවූ දුක්වූ, තියුණුවූ වෙදනාවන් විඳිත් නම් ඒ මේ තරම්ම වෙයි. මීට වඩා වැඩි නොවෙයි. මම වනාහි මේ කටුකවූ දුෂ්කරක්‍රියාවෙන් මනුෂ්‍ය ධර්මයට වැඩිවූ ආර්ය භාවය ඇති කිරීමට සමර්ථවූ ඥානදර්ශන විශෙෂයක් නොලබමි. මාර්ගාවබොධය පිණිස අන්‍ය මාර්ගයෙක් ඇත්තේදැයි (කල්පනා විය.)

**26.** "රාජකුමාරය, ඒ මට මේ අදහස විය. මම, පියවූ ශුද්ධොදන ශාක්‍ය රාජයාගේ වප්මගුල් දිනයෙහි සිහිල්වූ දඹරුක් සෙවනෙහි හුන්නේ කාමයන් ගෙන් වෙන්වම අකුසල ධර්මයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කළ බව දනිමි. ඒ මාර්ගය මාර්ගඥාන අවබොධය පිණිස වන්නේයි (අදහස් විය.) රාජකුමාරය, ඒ මට අවබොධය පිණිස මේ මාර්ගයමයැයි සිහිය අනුව පැවති විඥ්ඥාණය පහළවිය, රාජකුමාරය, ඒ මට මේ අදහස විය. කාමයන්ගෙන් වෙන්වූ, අකුශල ධර්මයන්ගෙන් වෙන්වූ, යම් ඒ සැපයක්වේද, මම ඒ සැපයට භය වෙමිද (කියාය.) රාජකුමාරය, ඒ මට මේ කල්පනාව ඇතිවිය. කාමයන්ගෙන් වෙන්වූ අකුසල ධර්මයන්ගෙන් වෙන්වූ යම් ඒ සැපයක්වේද, මම ඒ සැපයට භය නොවෙමියි (කියාය.) රාජකුමාරය, ඒ මට මේ කල්පනාව ඇතිවිය. මෙ තරම් දුර්වලවූ ශරීරයකින් යුක්තව ඒ (ප්‍රථමධ්‍යාන) සැපය ලබන්නට බැරිය. යම්හෙයකින් මම බත් හා කොමුපිඩු ආදී ඖදාරික ආහාරයක් ගන්නෙම් නම් හොඳය (කියාය.)

**27.** "රාජකුමාරය, ඒ මම බත්, කොමපිඩුයැයි කියන ඖලාරික ආහාරයක් ගත්තෙමි. රාජකුමාරය, ඒ කාලයෙහි 'ශ්‍රමණ ගෞතමතෙම යම් ලොවුතුරා දහමක් ලැබුයේ නම් එය අපට කියන්නේය' යන අදහසින් භික්ෂූන් පස්දෙනෙක් මට උපස්ථාන කරමින් සිටියහ. රාජකුමාරය, මේ කලක පටන් මම බත් හා

කොමුපිඩු ආහාර ගන්නට වූයෙම්ද, එකල්හි ඒ භික්ෂුහු ශ්‍රමණ ගෞතමතෙම ප්‍රත්‍යය බහුලකොට ඇත්තේය. රසයෙහි ගිජුව ප්‍රණීත පිණ්ඩපාතාදිය වැළඳීමට හැරුණේය. වීර්යය කිරීමෙන් පිරිහුණේයැ'යි කියා කලකිරී බැහැර ගියාහුය.

"රාජකුමාරය, ඒ මම ඕලාරික ආහාරගෙන ශරීර ශක්තිය ලැබ, කාමයන්ගෙන් වෙන්වම, අකුසල ධර්මයන්ගෙන් වෙන්වම, විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීති සැපය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කෙළෙමි. රාජකුමාරය, උපන්නාවූ මෙබඳුවූද සැප වේදනාව මගේ කුසල් සිත විනාශ නොකරයි.

**28.** "විතර්කවිචාර සංසිඳීමෙන් අභ්‍යන්තර පැහැදීම ඇති හිතේ එකඟ බව ඇති, විතර්ක රහිතවූ, විචාර රහිතව, සමාධියෙන් හටගත් ප්‍රීති සැපය ඇති, ද්විතිය ධ්‍යානයට පැමිණ වාසය කෙළෙමි. රාජකුමාරය, උපන්නාවූ මෙබඳුවූද සැප වෙදනාවද මගේ කුසල් සිත විනාශ නොකරයි, මැඩගෙන නොසිටියි. ප්‍රීතිය ඉක්මවීමෙන් උපෙක්ෂා ඇත්තේ වාසය කෙළෙමි. සිහියෙන් හා මනා නුවණින් යුක්තවූයේ කයින්ද සැපය වින්දෙමි. යමක් උපෙක්ෂා ඇත්තේ සිහියෙන් යුක්තවූයේ, සැප විහරණ ඇත්තේ යැයි ආර්යයෝ කියත්ද එ තුන්වැනි ධ්‍යානයට පැමිණ වාසය කෙළෙමි. රාජකුමාරය උපන්නාවූ මෙබඳුවූ සැප වේදනාවද මගේ කුසල් හිත විනාශ නොකරයි. සැපය නැති කිරීමෙන්, දුක නැති කිරීමෙන්, කල් ඇතිවීම සොම්නස් දොම්නස් දෙක අතුරුදන් කිරීමෙන්, දුක් නැත්තාවූ, සැප නැත්තාවූ, උපෙක්ෂාවෙන් හටගත් සිහිය පිළිබඳ පිරිසිදු බව ඇති සතර වැනි ධ්‍යානයට පැමිණ වාසය කෙළෙමි. රාජකුමාරය, උපන්නාවූ මෙබඳුවූ සැප වේදනාවද මගේ කුසල් හිත විනාශ නොකරයි.

**29.** "ඒ මම මෙසේ හිත සමාධියෙන් එකඟවූ කල්හි, පිරිසිදුවූකල්හි (පිරිසිදු හෙයින්ම) දීප්තිමත්වූ කල්හි අංගන (රාගාදී කෙළෙස්) රහිතවූ කල්හි, පහවූ උවදුරු ඇති කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුව සිටි කල්හි සිත ස්ථිරවූ කල්හි, පෙර ජාති දැනීමේ ඥාණය පිණිස සිත නැමූයෙමි. ඒ මම නොයෙක්

ආකාරවූ පූර්වෙනිවාසය (පෙර උපන් ජාති,) සිහිකරමි. එනම් එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති සතරක්ද, ජාති පහක්ද, ජාති දහයක්ද, ජාති විස්සක්ද, ජාති තිසක්ද, ජාති සතළිසක්ද, ජාති පණසක්ද, ජාති සියයක්ද, ජාති දහසක්ද, ජාති ලක්ෂයක්ද, නොයෙක් සංවර්ත (විනාශ වන.) කල්පයන්ද, නොයෙක් විවර්ති (හැදෙන) කල්පයන්ද, නොයෙක් සංවර්ති විවර්ති කල්පයන්ද, අසුවල් තැන උපන්නෙමි, එහිදී මේ නම් ඇත්තෙවීමි, මෙබඳු ගෝත්‍ර ඇත්තේ වීමි. මෙබඳු වර්ණ ඇත්තේ වීමි. මෙබඳු ආහාර ඇත්තේ වීමි. මෙබඳු දුක් සැප වින්දෙමි. ඒ මම එයින් චුතව අසුවල් තැන උපන්නෙමි. එතැන්හිද මෙසේ නම් ඇත්තේ වීමි. මෙබඳු ගෝත්‍ර ඇත්තේ වීමි. මෙබඳු ශරීර වර්ණ ඇත්තේ වීමි. මෙබඳු ආහාර ඇත්තේ වීමි. මෙබඳු සැප දුක් වින්දේ වීමි. මෙබඳු ආයුෂ ඇත්තේ වීමි. ඒ මම එතැනින් චුතව මෙහි උපන්නෙමි'යි මෙසේ ආකාර සහිතවූ, දැක්වීම් සහිතවූ, නොයෙක් ආකාරවූ, පෙර විසූ කඳ පිළිවෙළ සිහි කරමි.

"රාජකුමාරය, මා විසින් රාත්‍රියේ පළමුවෙනි යාමයෙහි මේ පළමුවන විද්‍යාව (පෙර විසූ තැන් දන්නා නුවණ) ලබන ලදී. (එය වසන) අවිද්‍යාව නසන ලදී. විද්‍යාව උපන්නීය. අඳුර (මොහය) නසන ලද්දේය. අලෝකය උපන්නේය. අප්‍රමාදව කෙලෙස් තවන වීර්යයෙන් යුක්තව වාසය කරන්නෙකුට යම්සේ සිදුවිය යුතු නම් එසේ විය. රාජකුමාරය, උපන්නාවූ මෙබඳුවූ සැප වෙදනාවද මගේ කුසල් හිත විනාශ නොකරයි.

**30.** "ඒ මම මෙසේ (හිත සමාධියෙන්) එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, (පිරිසිදු හෙයින) දීප්තිමත්වූ කල්හි, අංගණ (රාගාදි කෙලෙස් ) රහිතවූ කල්හි, කෙලෙස් පහව ගිය කල්හි, සිත මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුව සිටි කල්හි, සිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි සත්ත්වයන්ගේ චුති උත්පත්ති දෙක දැකීම පිණිස සිත නැමීමි. ඒ මම පිරිසිදුවූ, මිනිස් බව ඉක්මවා සිටි දිව ඇසින්, චුත වන්නාවූද, උපදින්නාවූද, ලාමකවූද, ප්‍රණීතවූද, මනා වර්ණ ඇත්තාවූද, මනා වර්ණ නැත්තාවූද, යහපත් ගති ඇත්තාවූද, අයහපත් ගති ඇත්තාවූද, කර්මය පරිදි මිය ගියාවූ සත්ත්වයන් දකිමි.

"ඒකාන්තයෙන් මේ පින්වත් සත්ත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්ත වූවාහු, වාක් දුශ්චරිතයෙන් යුක්ත වූවාහු මනෝදුශ්චරිතයෙන් යුක්ත වූවාහු, ආර්යයන්ට දොස් කීවාහු, මිථ්‍යාදෘෂ්ටි ගත්තාහු, මිථ්‍යාදෘෂ්ටි ක්‍රියා අනුමත කළාහුය. (එහෙයින්) ඔවුහු කය බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ, නපුරු ගති ඇති, යටිකුරුව වැටෙන, නරකයෙහි උපන්නාහුයයිද, මේ පින්වත් සත්වයෝ වනාහි කාය සුචරිතනේ යුක්ත වූවාහු, වාක් සුචරිතයෙන් යුක්ත වූවාහු, මනො සුචරිතයෙන් යුක්ත වූවාහු, ආර්යන්ට දොස් නොකීවාහු, සම්‍යක්දෘෂ්ටි ඇත්තාහු, සම්‍යක්දෘෂ්ටි කර්ම සමාදන් වූවාහුය. (එහෙයින්) ඔවුහු කය බිඳීමෙන් මරණින් මතු ස්වර්ග ලොකයෙහි උපන්නාහුයයි මෙසේ පිරිසිදුවූ, මිනිස් ඇස ඉක්මවා සිටි දිවැසින් චුත වන්නාවූද, උපදින්නාවූද, ලාමක වූද, ප්‍රණීතවූද, මනා වර්ණ ඇත්තාවූද, මනා වර්ණ නැත්තාවූද යහපත් ගති ඇත්තාවූද, අයහපත් ගති ඇත්තාවූද, කර්මය පරිදි මියගියාවූ සත්ත්වයන් දනිමි.

31. "රාජකුමාරය, මා විසින් රාත්‍රියෙහි මැද යාමෙහි මේ දෙවන විද්‍යාව (චුතවීම්, ඉපිදීම් දක්නා නුවණ) ලබනලදී. (එය වසන) අවිද්‍යාව නසන ලදී. විද්‍යාව උපන්නීය. අඳුර (මොහය) නසන ලද්දේය. ආලොකය උපන්නේය. අප්‍රමාදව කෙලෙස් තවන වීර්යයෙන් යුක්තව වාසය කරන්නෙකුට යම්සේ සිදුවිය යුතු නම් එසේ විය. රාජකුමාරය, උපන්නාවූ මෙබඳුවූද සැප වේදනාව මගේ කුසල් සිත විනාශ නොකරයි.

"ඒ මම මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි දීප්තිමත්වූ කල්හි, කෙලෙස් රහිතවූ කල්හි, කෙලෙස් පහව ගිය කල්හි, සිත මෘදුවූ කල්හි, කටයුත්තට සුදුසුව සිටි කල්හි, සිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, ආශ්‍රව ක්ෂයකර ඥානය (කෙලෙස් නැති කරන නුවණ) පිණිස සිත නැමුයෙමි. ඒ මම, මෙය දුකය'යි තතුසේ දත්තෙමි. මේ දුක් ඉපදීමට හේතුවය'යි තතුසේ දත්තෙමි. මේ 'දුක් නැති කිරීමය'යි තතුසේ දත්තෙමි. 'මේ දුක නැති කිරීමේ මාර්ග' යයි තතුසේ දත්තෙමි. 'මොහු ආශ්‍රවයෝය'යි තතුසේ දැනගතිමි. මේ

ආශ්‍රවයන්ගේ හටගැන්මය'යි තතුසේ දැනගතිමි. 'මේ ආශ්‍රවයන්ගේ නැතිකිරීමය'යි තතුසේ දැනගතිමි. 'මේ ආශ්‍රවයන් නැති කිරීමේ මාර්ගය'යි තතුසේ දැනගතිමි. මෙසේ දන්නාවූ මෙසේ දක්නාවූ ඒ මාගේ සිත කාමාශ්‍රවයන්ගෙන් මිදුනේය. භවාශ්‍රවයන්ගෙන්ද මිදුනේය. අවිද්‍යාශ්‍රවයන්ගෙන්ද මිදුනේය. මිදුන කල්හි මිදුනේයයි, දැනීම පහළවිය. උත්පත්තිය කෙළවර විය. මාර්ග බ්‍රහ්මචර්යාව වැස නිමවන ලදී. කළයුත්ත කරන ලදී. කළයුතු අනිකක් නැත්තේයි දැනගතිමි.

32. "රාජකුමාරය, රාත්‍රියෙහි අන්තිම යාමයෙහි මේ තුන්වෙනි විද්‍යාව (ආශ්‍රව ක්ෂය කර ඥානය නම්වූ අර්හත් මාර්ගය) මා විසින් ලබන ලදී. (එය වසන) අවිද්‍යාව නසන ලදී. විද්‍යාව උපන්නීය. අඳුර (මොහය) නසන ලද්දේය. ආලෝකය උපන්නේය. අප්‍රමාදව, කෙලෙස් තවන වීර්යයෙන් යුක්තව වාසය කරන්නෙකුට යම්සේ සිදුවිය යුතු නම් එසේ විය.

"රාජකුමාරය, භික්ෂූන් තෙනමකට අවවාද කරමි. භික්ෂූන් දෙනමක් පිඩු පිණිස හැසිරෙති. දෙනමක් පිඩු පිණිස හැසිර යම් ආහාරයක් ගෙණෙත්ද, එයින් සදෙනම යැපෙමු. එකල්හි රාජකුමාරය, මා විසින් මෙසේ අවවාද කරණ ලද අනුශාසනා කරණ ලද පස්වග මහණහු යම් අර්ථයක් පිණිස කුලපුත්‍රයෝ ගිහිගෙන් නික්ම යහපත්ව ශාසනයෙහි පැවිදි වෙත්ද, මාර්ග බ්‍රහ්මචර්යාව අවසන්කොට ඇති, ඒ උත්තම අර්හත්ඵලය ඉහතාත්මයෙහිම තෙමේ විශේෂ නුවණින් දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වාසය කළාහුයි" වදාළේය.

33. "මෙසේ වදාළ කල්හි බොධිරාජ කුමාරතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීහ. "ස්වාමීනි කොපමණ කලකින් තථාගතයන් වහන්සේ වැනි හික්මවන්නෙකු ලබන්නාවූ භික්ෂුතෙම යම් අර්ථයක් පිණිස කුලපුත්‍රයෝ ගිහිගෙන් නික්ම යහපත්වම ශාසනයෙහි පැවිදි වෙද්ද, මාර්ගබ්‍රහ්මචර්යාව කෙළවරකොට ඇති ඒ උත්තම සැපත මේ ආත්මයෙහි තෙමේ විශෙෂ නුවණින් දැන ඊට පැමිණ වාසය කරද්දැයි' ඇසී. "එසේ නම්, රාජකුමාරය, මේ කාරණය තොපගෙන්ම අසමි.

තොපට යම්සේ වැටහේ නම් එසේ කියව. රාජකුමාරය, ඔබ ඒ කුමකැයි සිතන්නෙහිද? ඔබ ඇතුන්පිට නගින හෙණ්ඩු ගන්න ශිල්පයෙහි දක්ෂවෙහිදැයි" (ඇසී). "ස්වාමීන් වහන්ස, එසේය. ඇතුන්පිට නැගෙණ හෙණ්ඩු ගන්න ශිල්පයෙහි මම දක්ෂයෙක් වෙමි." "ඔබ කුමක් සිතන්නෙහිද? බොධිරාජ කුමාරතෙම ඇතුන්පිට නගින හෙණ්ඩු ගන්න ශිල්පය දනියි. මම ඔහු වෙත ඇතුන්පිට නැගෙණ හෙණ්ඩු ගන්න ශිල්පය පුහුණු කරන්නෙමැයි මෙහි (කිසියම්) පුරුෂයෙක් පැමිණෙන්නේය.

34. "ඒ පුද්ගලතෙමේ ඇදහීම් නැත්තෙක් හෙවත් කියන දේ නොපිළිගන්නෙක් වෙයිද, ඇදහීමෙන් යමකට පැමිණිය යුතු නම් ඊට නොපැමිණෙන්නේද, හෙතෙම බොහෝ ආබාධ ඇත්තෙක් වෙයිද, නිරොගි වූවෙකු විසින් යමකට පැමිණිය යුතු නම් ඊට නොපැමිණෙන්නේද, හෙතෙම කෛරාටික ඵවටිලිකාරයෙක් වෙයිද, යමෙක් කෛරාටික නොවන ඵවටිලිකාරයෙක් නොවන්නෙකු විසින් යමකට පැමිණිය යුතු නම් ඊට නොපැමිණෙන්නේද හෙතෙම කුසීතයෙක් වෙයිද, බලවත් වීර්ය ඇත්තෙකු විසින් යමකට පැමිණිය යුතු නම් ඊට නොපැමිණෙන්නේද, හෙතෙම නුවණැත්තෙක් වෙයිද, නුවණැත්තෙකු විසින් යමකට පැමිණිය යුතු නම් ඊට නොපැමිණෙන්නේද, රාජකුමාරය, ඒ කුමක් සිතන්නෙහිද? ඒ පුරුෂතෙම ඔබගෙන් ඇතුපිට නැගෙන හෙණ්ඩුව ගන්න ශිල්පය කිම ඉගෙනගන්නේද?"

"ස්වාමීන් වහන්ස, ඒ එක් කරුණකින්ද යුක්තවූ පුරුෂ තෙම මා වෙතින් ඇතුපිට නැගෙන හෙණ්ඩුව ගන්නා ශිල්පය නොඋගනියි. කරුණු පසින්ම යුක්ත නම් කියනුම කිම?"

35. "රාජකුමාරය, ඒ කුමකැයි සිතන්නෙහිද? බොධිරාජ කුමාරතෙම ඇතුපිට නැගෙනා හෙණ්ඩු ගන්නා ශිල්පය දනියි. 'මම ඔහු සමීපයෙහි ඇතුපිට නැගෙන හෙණ්ඩු ගන්නා ශිල්පය හික්මෙන්නෙමියි' සිතා පුරුෂයෙක් එන්නේය. හෙතෙම ඇදහීම ඇත්තෙක් වෙයිද, යමක් අදහන්නෙකු විසින් යමකට පැමිණිය යුතු නම් ඊට පැමිණෙන්නේද, හෙතෙම ආබාධ නැත්තෙක්

වෙයිද, ආබාධ නැත්තෙකු විසින් යමකට පැමිණිය යුතු නම් ඊට පැමිණෙන්නෙක්වෙයිද, හෙතෙම කෛරාටිකයෙක් රැවටිලිකාරයෙක් නොවන්නේද, කෛරාටිකයෙක් නොවන අවංක පුද්ගලයෙකු විසින් යමකට පැමිණිය යුතු නම් ඊට පැමිණෙන්නේද හෙතෙම බලවත් වීර්ය ඇත්තෙක් වෙයිද, බලවත් වීර්ය ඇත්තෙකු විසින් යමකට පැමිණිය යුතුනම් ඊට පැමිණෙන්නේද, හෙතෙම නුවණ ඇත්තේ වෙයිද, නුවණැතියෙකු විසින් යමකට පැමිණිය යුතු නම් ඊට පැමිණෙන්නේද රාජකුමාරය, ඒ කුමකැයි සිතන්නෙහිද? ඒ පුරුෂතෙම ඇතුපිට නැගෙන හෙණ්ඩු ගන්නා ශිල්පය ඔබ වෙතින් කිම උගන්නේදැයි" ඇසී. "ස්වාමීනි, මේ එක් කරුණකින් යුක්ත වූද පුරුෂතෙම ඇතුපිට නැගෙන හෙණ්ඩු ගන්නා ශිල්පය ඉගෙනගන්නේය. කරුණු පසින් යුත් කල කියනුම කවරේද?

**36.** "රාජකුමාරය, එපරිද්දෙන්ම වීර්ය කිරීම පිණිස පවත්නා අංග පසක් වෙති. රාජකුමාරය මේ සස්නෙහි මහණතෙම ශ්‍රද්ධාවෙන් යුක්තවූයේ වෙයිද, ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කාරණයෙන්ද අරහත්ය. සම්‍යක් සම්බුද්ධය, විජ්ජාචරණසම්පන්නය, සුගතය, ලොකවිදූය, අනුත්තර පුරිස දම්මසාරථිය දෙව්මිනිසුන්ගේ ශාස්තෘය, චතුස්සත්‍ය අවබොධ කෙළේය. භාග්‍යවත්යයි තථාගතයන් වහන්සේගේ බුදුබව අදහන්නේද?"

"වැඩිද නොවූ, අඩුද නොවූ, වීර්ය කිරීමට සුදුසු සමවූ ආහාර පැසවන ගින්නෙන් යුක්තවූ නිරොගි ආබාධ නැති පුද්ගලයෙක් වෙයිද, ශාස්තෘන් වහන්සේ ඉදිරියෙහිද නුවණැතියෙක්ව මහණදම් පුරණ භික්ෂූන් ඉදිරියෙහිද තමා පිළිබඳ ඇතිතතු ප්‍රකාශ කරණ කපටිනොවූ අවංක පුද්ගලයෙක් වෙයිද, අකුශල ධර්මයන් පහකිරීම සඳහාද කුශල ධර්මයන් ඉපදවීම සඳහාද පටන්ගත් වීර්ය ඇත්තෙක්දැයි වීර්ය ඇත්තෙක් කුශල ධර්මයන්හි බර බහා නොතැබූ පුද්ගලයෙක් වන්නේද, ආර්යවූ ධර්මයන් විනිවිද දක්නාවූ මනා කොට දුක් කෙළවර

කිරීමට පමුණුවන්නාවූ, ස්කන්ධයන්ගේ ඇතිවීම නැතිවීම දක්නාවූ, නුවණින් යුක්තවූ, ප්‍රඥාවෙන් යුක්තවූවෙක් වන්නේද,

**37.** "රාජකුමාරය, මේ වනාහි වීර්ය වැඩීම පිණිස පවත්නා අංගපස වෙති. රාජකුමාරය, මේ වීර්යය වැඩීම පවත්නා අංගපසින් යුත් භික්ෂුව තථාගතයන් වහන්සේ වැනි හික්ම වන්නේත් ලබන්නේ යම් අර්ථයක් පිණිස කුල පුත්‍රයෝ ගිහිගෙන් නික්ම ශාසනයෙහි යහපත්ව පැවිදි වෙද්ද, මාර්ග බ්‍රහ්මචර්යාව කෙළවරකොට ඇති ඒ උත්තම අර්හත්ඵලය මේ ආත්මයෙහිම තෙමේ විශෙෂ නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට සත්වසකින් එයට පැමිණ වාසය කරන්නේය.

**38.** "රාජකුමාරය, සත්වස තිබෙත්වා, මේ වීර්ය වැඩීම පිණිස පවත්නාවූ අංග පසෙන් යුත් මහණ තථාගතයන් වහන්සේ වැනි හික්මවන්නෙක් ලබන්නේ යම් අර්ථයක් පිණිස කුල පුත්‍රයෝ ගිහිගෙන් නික්ම ශාසනයෙහි යහපත්ව පැවිදිවෙද්ද, මාර්ග බ්‍රහ්මචර්යාව කෙළවරකොට ඇති ඒ උතුම් අර්හත් ඵලය මේ ආත්මයෙහිම තෙමේ උසස් නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට සය වසකින් එයට පැමිණ වාසය කරන්නේය.

**39.** "රාජකුමාරය, සයවසක් තිබේවා, මේ වීර්ය පිණිස පවත්නාවූ අංග පසෙන්යුත් භික්ෂුව, තථාගතයන් වහන්සේ වැනි හික්මවන්නෙක් ලබන්නේ යම් අර්ථයක් පිණිස කුලපුත්‍රයෝ ගිහිගෙන් නික්ම යහපත්ව ශාසනෙහි පැවිදි වෙද්ද, මාර්ග බ්‍රහ්මචර්යාව කෙළවර කොට ඇති ඒ උතුම් අර්හත් ඵලය, මේ ආත්මයෙහිම තෙමේ උසස් නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට පස්වසකින් එයට පැමිණ වාසය කරන්නේය.

**40.** "රාජකුමාරය, පස්වසක් තිබේවා, මේ වීර්ය පිණිස පවත්නාවූ අංග පසෙන් යුත් භික්ෂුව, තථාගතයන් වහන්සේ වැනි හික්මවන්නෙක් ලබන්නේ, යම් අර්ථයක් පිණිස කුලපුත්‍රයෝ ගිහිගෙන් නික්ම ශාසනයෙහි යහපත්ව පැවිදි වෙද්ද, මාර්ග බ්‍රහ්මචර්යාව කෙළවර කොට ඇති, ඒ උතුම් අර්හත් ඵලය මේ ආත්මයෙහිම තෙමේ උසස් නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට සිව් වසකින් ඊට පැමිණ වාසය කරන්නේය.

41. "රාජකුමාරය, සිව් වසක් තිබේවා, මේ වීර්ය පිණිස පවත්නාවූ අංග පසෙන් යුත් භික්ෂුව, තථාගතයන් වහන්සේ වැනි හික්මවන්නෙකු ලබන්නේ, යම් අර්ථයක් පිණිස කුලපුත්‍රයෝ ගිහිගෙන් නික්ම ශාසනයෙහි යහපත්ව පැවිදි වෙද්ද, මාර්ග බ්‍රහ්මචර්යාව කෙළවර කොට ඒ උතුම් අර්හත් ඵලය මේ ආත්මයෙහිම තෙමේ උසස් නුවණින් දැන ප්‍රත්‍යක්ෂකොට තුන්වසකින් ඊට පැමිණ වාසය කරන්නේය.

42. "රාජකුමාරය, තුන්වසක් තිබේවා මේ වීර්ය පිණිස පවත්නාවූ අංග පසෙන් යුත් භික්ෂුව, තථාගතයන් වහන්සේ වැනි හික්මවන්නෙකු ලබන්නේ යම් අර්ථයක් පිණිස කුල පුත්‍රයෝ ගිහිගෙන් නික්ම ශාසනයෙහි යහපත්ව පැවිදි වෙත්ද මාර්ග බ්‍රහ්මචර්යාවේ කෙළවර කොට ඒ උතුම් අර්හත් ඵලය මේ ආත්මයෙහිම තෙමේ උසස් නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට දෙවසකින් ඊට පැමිණ වාසය කරන්නේය.

43. "රාජකුමාරය, දෙවසක් තිබේවා. මේ වීර්ය පිණිස පවත්නාවූ අංග පසෙන් යුත් භික්ෂුව තථාගතයන් වහන්සේ වැනි හික්මවන්නෙකු ලබන්නේ යම් අර්ථයක් පිණිස කුල පුත්‍රයෝ ගිහිගෙන් නික්ම ශාසනයෙහි යහපත්ව පැවිදි වෙද්ද, බ්‍රහ්ම චර්යාව කෙළවර කොට ඒ උතුම් අර්හත් ඵලය මේ ආත්මයෙහිම තෙමේ උසස් නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට එක් වසකින් ඊට පැමිණ වාසය කරන්නේය.

44. "රාජකුමාරය, එක් වසක් තිබේවා. මේ වීර්ය පිණිස පවත්නාවූ අංග පසින් යුත් භික්ෂුව, තථාගතයන් වහන්සේ වැනි හික්මවන්නෙකු ලබන්නේ යම් අර්ථයක් පිණිස ගිහිගෙන් නික්ම ශාසනයෙහි යහපත්ව පැවිදි වෙත්ද, බ්‍රහ්මචර්යාව කෙළවර කොට ඒ උතුම් අර්හත් ඵලය මේ ආත්මයෙහිදීම තෙමේ උසස් නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට සත්මසකින් ඊට පැමිණ වාසය කරන්නේය.

45. "රාජකුමාරය, සත්මසක් තිබේවා. මේ වීර්යය පිණිස පවත්නාවූ අංග පසින් යුතු භික්ෂුව, තථාගතයන් වහන්සේ වැනි හික්ම වන්නෙකු ලබන්නේ, යම් අර්ථයක් පිණිස ගිහිගෙන්

නික්ම ශාසනයෙහි පැවිදි වෙද්ද, මාර්ග බ්‍රහ්මචර්යාව කෙළවර කොට ඇති ඒ උතුම් අර්හත් ඵලය මේ ආත්මයේදීම තෙමේ උසස් නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට සය මසකින් ඊට පැමිණ වාසය කරන්නේය.

**46.** "රාජකුමාරය, සයමසක් තිබේවා. මේ වීර්යය පිණිස පවත්නාවූ අංග පසින් යුතු භික්ෂුව, තථාගතයන් වහන්සේ වැනි හික්මවන්නෙකු ලබන්නේ, යම් අර්ථයක් පිණිස කුල පුත්‍රයෝ ගිහිගෙන් නික්ම ශාසනයෙහි යහපත්ව පැවිදි වෙද්ද, මාර්ග බ්‍රහ්මචර්යාව කෙළවර කොට ඒ උතුම් අර්හත් ඵලය මේ ආත්මයේදීම තෙමේ උසස් නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට පස්මසකින් ඊට පැමිණ වාසය කරන්නේය.

**47.** "රාජකුමාරය, පස්මසක් තිබේවා. මේ වීර්යය පිණිස පවත්නාවූ අංග පසින් යුතු භික්ෂුව, තථාගතයන් වහන්සේ වැනි හික්ම වන්නෙකු ලබන්නේ, යම් අර්ථයක් පිණිස කුලපුත්‍රයෝ ගිහිගෙන් නික්ම ශාසනයෙහි යහපත්ව පැවිදි වෙත්ද, මාර්ග බ්‍රහ්මචර්යාව කෙළවර කොට ඇති ඒ උතුම් අර්හත් ඵලය මේ ආත්මයේදීම තෙමේ උසස් නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට සාරමසකින් ඊට පැමිණ වාසය කරන්නේය.

**48.** "රාජකුමාරය, සාරමසක් තිබේවා. මේ වීර්යය පිණිස පවත්නාවූ අංග පසින් යුතු භික්ෂුව, තථාගතයන් වහන්සේ වැනි හික්මවන්නෙකු ලබන්නේ, යම් අර්ථයක් පිණිස කුල පුත්‍රයෝ ගිහිගෙන් නික්ම ශාසනයෙහි හොඳින් පැවිදි වෙද්ද, මාර්ග බ්‍රහ්මචර්යාව කෙළවර කොට ඇති ඒ උතුම් අර්හත් ඵලය මේ ආත්මයේදීම තෙමේ උසස් නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට තුන් මසකින් ඊට පැමිණ වාසය කරන්නේය.

**49.** "රාජකුමාරය, තුන්මසක් තිබේවා. මේ වීර්යය පිණිස පවත්නාවූ අංග පසින් යුතු භික්ෂුව, තථාගතයන් වහන්සේ වැනි හික්මවන්නෙක් ලබන්නේ, යම් අර්ථයක් පිණිස කුල පුත්‍රයෝ ගිහිගෙන් නික්ම ශාසනයෙහි යහපත්ව පැවිදි වෙද්ද, මාර්ග බ්‍රහ්මචර්යාව කෙළවර කොට ඒ උතුම් අර්හත් ඵලය මේ

ආත්මයේදීම තෙමේ උසස් නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට දෙමසකින් ඊට පැමිණ වාසය කරන්නේය.

50. "රාජකුමාරය, දෙමසක් තිබේවා. මේ වීර්‍යය පිණිසවූ අංග පසින් යුතු භික්ෂුව, තථාගතයන් වහන්සේ වැනි හික්මවන්නෙකු ලබන්නේ, යම් අර්ථයක් පිණිස කුල පුත්‍රයෝ ගිහිගෙන් නික්ම ශාසනයෙහි යහපත්ව පැවිදි වෙද්ද, මාර්ග බ්‍රහ්මචර්‍යාව කෙළවර කොට ඒ උතුම් අර්හත් ඵලය මේ ආත්මයේදීම තෙමේ උසස් නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට එක්මසකින් ඊට පැමිණ වාසය කරන්නේය.

51. "රාජකුමාරය, එක්මසක් තිබේවා. මේ වීර්‍යය පිණිසවූ අංග පසින් යුතු භික්ෂුව, තථාගතයන් වහන්සේ වැනි හික්මවන්නෙක් ලබන්නේ, යම් අර්ථයක් සඳහා කුල පුත්‍රයෝ ගිහිගෙන් නික්ම ශාසනයෙහි යහපත්ව පැවිදි වෙද්ද, මාර්ග බ්‍රහ්මචර්‍යාව කෙළවර කොට ඒ උතුම් අර්හත් ඵලය මේ ආත්මයේදීම තෙමේ උසස් නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට අඩ මසකින් ඊට පැමිණ වාසය කරන්නේය.

52. "රාජකුමාරය, අඩ මසක් තිබේවා. මේ වීර්‍යය පිණිස පවත්නාවූ අංග පසින් යුතු භික්ෂුව, තථාගතයන් වහන්සේ වැනි හික්මවන්නෙක් ලබන්නේ, යම් අර්ථයක් පිණිස කුල පුත්‍රයෝ ගිහිගෙන් නික්ම ශාසනයෙහි යහපත්ව පැවිදි වෙද්ද, මාර්ග බ්‍රහ්මචර්‍යාව කෙළවර කොට ඒ උතුම් අර්හත් ඵලය මේ ආත්මයේදීම තෙමේ උසස් නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට රෑ දාවල් සතකින් ඊට පැමිණ වාසය කරන්නේය.

53. "රාජකුමාරය, රෑ දාවල් සතක් තිබේවා. මේ වීර්‍යය පිණිස පවත්නාවූ අංග පසින් යුතු භික්ෂුව, තථාගතයන් වහන්සේ වැනි හික්ම වන්නෙක් ලබන්නේ, යම් අර්ථයක් පිණිස ගිහිගෙන් නික්ම ශාසනයෙහි යහපත්ව පැවිදි වෙත්ද, බ්‍රහ්මචර්‍යාව කෙළවර කොට ඇති ඒ උතුම් අර්හත් ඵලය මේ ආත්මයේදීම තෙමේ උසස් නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට රෑ දාවල් සයකින් ඊට පැමිණ වාසය කරන්නේය.

පටුන



**54.** "රාජකුමාරය, රෑ දාවල් සයක් තිබේවා. මේ වීර්යය පිණිසවූ අංග පසෙන් යුතු භික්ෂුව, තථාගතයන් වහන්සේ වැනි හික්මවන්නෙක් ලබන්නේ, යම් අර්ථයක් පිණිස කුල පුත්‍රයෝ ගිහිගෙන් නික්ම ශාසනයෙහි යහපත්ව පැවිදි වෙත්ද, බ්‍රහ්මචර්යාව කෙළවර කොට ඇති ඒ උතුම් අර්හත් ඵලය මේ ආත්මයේදීම තෙමේ උසස් නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට රෑ දාවල් පසකින් ඊට පැමිණ වාසය කරන්නේය.

**55.** "රාජකුමාරය, රෑ දාවල් පසක් තිබේවා. මේ වීර්යය පිණිසවූ අංග පසෙන් යුත් භික්ෂුව, තථාගතයන් වහන්සේ වැනි හික්මවන්නෙකු ලබන්නේ, යම් අර්ථයක් පිණිස කුල පුත්‍රයෝ ගිහිගෙන් නික්ම ශාසනයෙහි යහපත්ව පැවිදි වෙත්ද, මාර්ග බ්‍රහ්මචර්යාව කෙළවර කොට ඇති ඒ උතුම් අර්හත් ඵලය මේ ආත්මයේදීම තෙමේ උසස් නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට රෑ දාවල් සතරකින් ඊට පැමිණ වාසය කරන්නේය.

**56.** "රාජකුමාරය, රෑ දාවල් සතරක් තිබේවා. මේ වීර්යය පිණිසවූ අංග පසෙන් යුත් භික්ෂුව, තථාගතයන් වහන්සේ වැනි හික්මවන්නෙක් ලබන්නේ, යම් අර්ථයක් පිණිස ගිහිගෙන් නික්ම ශාසනයෙහි යහපත්ව පැවිදි වෙත්ද, බ්‍රහ්මචර්යාව කෙළවර කොට ඇති ඒ උතුම් අර්හත් ඵලය මේ ආත්මයේදීම තෙමේ උසස් නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට රෑ දාවල් තුනකින් ඊට පැමිණ වාසය කරන්නේය.

**57.** "රාජකුමාරය, රෑ දාවල් තුනක් තිබේවා. මේ වීර්යය පිණිස අංග පසෙන් යුත් භික්ෂුව, තථාගතයන් වහන්සේ වැනි හික්මවන්නෙකු ලබන්නේ, යම් අර්ථයක් පිණිස කුල පුත්‍රයෝ ගිහිගෙන් නික්ම ශාසනයෙහි යහපත්ව පැවිදි වෙත්ද, මාර්ග බ්‍රහ්ම චර්යාව කෙළවර කොට ඇති ඒ උතුම් අර්හත් ඵලය මේ ආත්මයේදීම තෙමේ උසස් නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට රෑ දාවල් දෙකකින් ඊට පැමිණ වාසය කරන්නේය.

**58.** "රාජකුමාරය, රෑ දාවල් දෙකක් තිබේවා. මේ වීර්යය පිණිසවූ අංග පසෙන් යුත් භික්ෂුව, තථාගතයන් වහන්සේ වැනි

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

හික්මවන්නෙකු ලබන්නේ, යම් අර්ථයක් පිණිස කුල පුත්‍රයෝ ගිහිගෙන් නික්ම ශාසනයෙහි යහපත්ව පැවිදි වෙත්ද, මාර්ග බ්‍රහ්ම චර්යාව කෙළවර කොට ඇති ඒ උතුම් අර්හත් ඵලය මේ ආත්මයේදීම තෙමේ උසස් නුවණින් දැන ප්‍රත්‍යක්ෂ කොට රෑ දාවලකින් ඊට පැමිණ වාසය කරන්නේය.

**59.** "රාජකුමාරය, එක් රෑ දාවලක් තිබේවා. මේ වීර්යය පිණිස පවත්නාවූ අංග පසින් යුක්ත මහණ තෙමේ තථාගතයන් වැනිවූ හික්ම වන්නෙක් ලබන්නේ සවස අනුශාසනා කරණ ලද්දේ උදෑසන මාර්ගඵල අවබොධ කරයි. උදෑසන අනුශාසනා කරණ ලද්දේ සවස මාර්ගඵල අවබොධ කරන්නේයයි" (වදාළසේක)

**60.** "මෙසේ වදාළ කල්හි බොධිරාජ කුමාර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "බුදුරජාණන් වහන්සේගේ ආශ්චර්ය ධර්මය ආශ්චර්යයි. යම් ධර්මයකින් සවස අනුශාසනා කරණ ලද්දේ උදය මාර්ගඵල අවබොධ කෙරේද, උදය අනුශාසනා කරණ ලද්දේ සවස මාර්ගඵල අවබොධ කෙරේද, ඒ ධර්මයාගේ යහපත් කොට දෙශනා කරන ලද බව ආශ්චර්යයි. මෙසේ කී කල්හි තරුණ සඤ්ජිකා පුත්‍රතෙම බොධි රාජ කුමාරයට මෙසේ කීය. "ඒ කාරණය එසේමය. පින්වත් බොධිරාජ කුමාර තෙම, සර්වඥයන් වහන්සේ ආශ්චර්යයිද ධර්මය ආශ්චර්යයිද ධර්මයාගේ මනාකොට දෙසනලද බව ආශ්චර්යයිද, කියන්නෙහිය. එසේනම් ඒ භවත් ගෞතමයන් වහන්සේද ධර්මයද භික්ෂු සංඝයාද සරණකොට යවයි" (කීහ)

**61.** "යහළු සඤ්ජිකා පුත්‍රය, එසේ නොකියව, යහළු සඤ්ජිකා පුත්‍රය, එසේ නොකියව. යහළු සඤ්ජිකා පුත්‍රය එසේ නොකියව, යහලු සඤ්ජිකා පුත්‍රය, මෑනියන් හමුවෙන් මෙය අසනලදී. මෑනියන් හමුවෙන් මෙය අසා පිළිගන්නාලදී. යහලු සඤ්ජිකා පුත්‍රය. එක්සමයෙක භාග්‍යවතුන් වහන්සේ කොසඹෑනුවරෙහිවූ ඝොසිතාරාමයෙහි වැඩ වෙසෙත්. එකල්හි මාගේ මව් තොමෝ දරුගැබ් ඇත්තී, භාග්‍යවතුන් වහන්සේ

යම් තෙනකද එහි පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පසෙක උන්නාය. එක් පසෙක හුන් මාගේ මවු භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවාය.

"ස්වාමීන් වහන්ස, මාගේ කුසෙහිවූ යම් මේ කුමාරයෙක් හෝ කුමාරිකාවක් හෝ වේද? හෙතෙම භාග්‍යවතුන් වහන්සේද ධර්මයද භික්ෂු සංඝයාද සරණයයි' කියායි.

"භාග්‍යවතුන් වහන්සේ ඔහු අද පටන් දිවිහිමි කොට භාග්‍යවතුන් වහන්සේ සරණගිය උපාසකයෙකුසේ දරණ සේක්වා' යනුයි.

'යහලු සඤ්ජිකා පුත්‍රය, එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ මේ භග්ගනින පදයෙහිම සුංසුමාරගිර නගරය සමීපයෙහිවූ මිගදාය නම් භෙසකලා වනයෙහි වැඩ වෙසෙත්. එකල්හි මාගේ කිරිමව් තොමෝ මා ඇකයෙන් උසුලාගෙණ (වඩාගෙණ) භාග්‍යවතුන් වහන්සේ යම් තෙනකද එහි ගොස් භාග්‍යවතුන් වහන්සේ වැඳ එක්පසෙක සිටියාහ.

එක්පසෙක සිටියාවූ මාගේ කිරිමව් තොමෝ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවාය. 'ස්වාමීන් වහන්ස, මේ බොධිරාජ කුමාර තෙමේ භාග්‍යවතුන් වහන්සේ සරණයයි. ධර්මයද භික්ෂු සංඝයාද සරණයයි.

භාග්‍යවතුන් වහන්සේ ඔහු අද පටන් දිවි හිමි කොට සරණගිය උපාසකයෙක් කොට දරණ සේක්වා' (කියාය.)

"යහලු සඤ්ජිකා පුත්‍රය, ඒ මම තෙවනුවත් භාග්‍යවතුන් වහන්සේ සරණයෙමි. ධර්මයද භික්ෂු සංඝයාද සරණයමි. භාග්‍යවතුන් වහන්සේ අද පටන් දිවි හිමි කොට මා සරණ ගිය උපාසකයෙක් කොට දරණ සේක්වායි කීය"

**බොධිරාජ කුමාර සූත්‍රය නිමි (4-35)**

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

## 36. අංගුලිමාල සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි ජෙතවන නම්වූ අනේපිඩු මහ සිටුහුගේ ආරාමයෙහි වැඩ වසන සේක.

එකල්හි වනාහි පසේනදි කොසොල් රජහුගේ ජනපදයෙහි රෞද්‍රවූ ලේ තැවරුණු අත් ඇත්තාවූ නැසීමෙහි වැනසීමෙහි යෙදුනාවූ ප්‍රාණීන් කෙරෙහි කරුණාව නැති බවට පැමිණියාවූ අඞ්ගුලිමාල නම් සොරෙක් වේ. ඔහු විසින් ගම් නොගම් කරණ ලද්දාහුය. නියම් ගම් අනියම් ගම් කරණ ලද්දාහුය. ජනපද අජනපද කරණ ලද්දාහුය. හෙතෙම මිනිසුන් මර මරා අඞ්ගුලීන් සම්බන්ධ මාලාවක් (ඇඟිලි මාලාවක්) දරයි.

2. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පෙරවරු කාලයෙහි හැඳ පොරවා පා සිවුරු ගෙණ සැවැත් නුවරට පිඬු පිණිස වැඩියහ. සැවැත්නුවර පිඬු පිණිස හැසිර සවස් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැළකුණේ සෙනාසනය තැන්පත්කොට තබා පාත්‍රා සිවුරු ගෙණ අඞ්ගුලිමාල සොරා යම් තැනෙක්හිද, එතැනට වැඩීම පිණිස දීර්ඝ මාර්ගයෙහි වැඩියහ. ගව පාලයෝද, සිව්පා සතුන් පාලයෝද, ගොවියෝද, මාර්ගයෙහි ගමන් කරන්නෝද, අඞ්ගුලිමාල සොරා යම් තැනෙක්හිද එතැනට පැමිණෙන දීර්ග මාර්ගයෙහි වඩින්නාවූ භාග්‍යවතුන් වහන්සේ දුටුවාහුය. දැක භාග්‍යවතුන් වහන්සේට "ශ්‍රමණයන් වහන්ස, මේ මාර්ගයෙහි නොගිය මැනව. ශ්‍රමණයන් වහන්ස, මේ මාර්ගයෙහි රෞද්‍රවූ ලේ තැවරුණු අත් ඇති නැසීමෙහි වැනසීමෙහි යෙදුනාවූ ප්‍රාණීන් කෙරෙහි කරුණාව නැති බවට පැමිණියාවූ අඞ්ගුලිමාල නම් සොරෙක් වේ. ඔහු විසින් ගම්ද නොගම් කරණ ලද්දාහ. නියම් ගම්ද අනියම් ගම් කරණ ලද්දාහ. ජනපදද අජනපද කරණ ලද්දාහ. හෙතෙම මිනිසුන් මර මරා ඇඟිලිවලින් මාලාවක් කොට දරයි. ශ්‍රමණයන් වහන්ස, මේ මගෙහි වනාහි පුරුෂයෝ දස දෙනෙක්ද, පුරුෂයෝ විසි දෙනෙක්ද, පුරුෂයෝ තිස් දෙනෙක්ද, පුරුෂයෝ හතලිස්, දෙනෙක්ද, පුරුෂයෝ පනස් දෙනෙක්ද, රන්චූ රන්චූ ගැසී ගමන් කරත්. ඔව්හුද අඞ්ගුලිමාල

සොරුගේ අතට පැමිණ විනාශයට යෙත්යයි,' කීවාහුය. මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දව වැඩියහ.

3. දෙවනුවද ගෝපාලයෝද, සිව්පා පාලයෝද, ගොවියෝද, මග යන්නෝද, භාග්‍යවතුන් වහන්සේට 'ශ්‍රමණයන් වහන්ස මේ මග නොයනු මැනව, ශ්‍රමණයන් වහන්ස, මේ මාර්ගයෙහි රෞද්‍ර, ලෙයින් තෙමුණු අත් ඇති, සත්ව ඝාතනයෙහි ඇලුනු, සත්වයන් කෙරෙහි දයා නැති, අඞ්ගුලිමාල නම් සොරෙක් වෙයි. ඔහු විසින් ගම් අගම් කළහ. නියම් ගම් අනියම් ගම් කළහ. ජනපද අජනපද කළහ. ඔහු මිනිසුන් මර මරා ඇඟිලිවලින් මාලයක් දරයි. ශ්‍රමණය, පුරුෂයෝ දස දෙනා, විසි දෙනා, තිස් දෙනා, හතළිස් දෙනා පණස් දෙනා, සමූහ සමූහව මේ මගෙහි යති. ඔවුහුද අඞ්ගුලිමාල සොරුගෙන් අතට පැමිණ විනාශයට යෙත්යයි,' කිවාහුය. දෙවනුවද භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දව වැඩියහ.

4. තුන්වෙනුවද ගව පාලයෝද, සිව්පා පාලයෝද, ගොවියෝද, මඟීහුද, භාග්‍යවතුන් වහන්සේට 'ශ්‍රමණයන් වහන්ස, මේ මගෙහි නොයනු මැනවි. ශ්‍රමණයන් වහන්ස, මේ මාර්ගයෙහි රෞද්‍රවූ ලේ තැවරුණු අත් ඇති, නැසීමෙහි වැනසීමෙහි නියුක්තවූ ප්‍රාණීන් කෙරෙහි කරුණාව නැති බවට පැමිණියාවූ අඞ්ගුලිමාල නම් සොරෙක් ඇත. ඔහු විසින් ගම්ද නොගම් කරණ ලද්දාහ. නියම් ගම්ද අනියම් ගම් කරණ ලද්දාහ. ජනපදද අජනපද කරණ. ලද්දාහ. හෙතෙම මිනිසුන් මර මරා ඇඟිලි මාලාවක් කොට දරයි. ශ්‍රමණයන් වහන්ස, මේ මගෙහි වනාහි පුරුෂයෝ දස දෙනෙක්ද, පුරුෂයෝ විසි දෙනෙක්ද, පුරුෂයෝ තිස් දෙනෙක්ද, පුරුෂයෝ හතළිස් දෙනෙක්ද, පුරුෂයෝ පණස් දෙනෙක්ද, එකතු එකතු වීයත්. ඔවුහුද අඞ්ගුලිමාල සොරුගේ අතට පැමිණ විනාශයට පැමිණෙත්යයි' කීවාහුය. තුන්වෙනුවද භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දව වැඩියහ.

5. අඞ්ගුලිමාල නම් සොරතෙම දුරදීම වඩින්නාවූ භාග්‍යවතුන් වහන්සේ දුටුයේය. දැක 'පින්වත ඒකාන්තයෙන්

ආශ්චර්යයකි. පින්වත ඒකාන්තයෙන් පුදුමයකි. මේ මගෙහි වනාහි පුරුෂයෝ දස දෙනෙක්ද, පුරුෂයෝ විසි දෙනෙක්ද, පුරුෂයෝ තිස් දෙනෙක්ද, පුරුෂයෝ හතළිස් දෙනෙක්ද, පුරුෂයෝ පනස් දෙනෙක්ද, එකතු එකතුවී ගමන් කරත්. ඔව්හුද මාගේ අතට පැමිණ විනාශයට යෙත්. එතකුදු වුවත් මේ ශ්‍රමණ තෙම තනිවම දෙවැන්නෙක් නැතිව බලහත්කාරයෙන් එන්නේයයි සිතමි. මම මේ ශ්‍රමණයා මරන්නෙම් නම් යෙහෙකැයි', ඔහුට සිත්විය.

**6.** ඉක්බිත්තෙන් අඞ්ගුලිමාල නම් සොරතෙම කඩු පළිහ ගෙණ දුන්න ඇදගෙන භාග්‍යවතුන් වහන්සේ පසු පස්සෙන්ලුහු බැන්දේය. එකල්හි ප්‍රකෘති ගමනින් වඩින්නාවූ භාග්‍යවතුන් වහන්සේ කරා සියලු ශක්තියෙන් යන්නාවූ අඞ්ගුලිමාල නම් සොරාට පැමිණෙන්නට යම්සේ නොහැකි වේද, භාග්‍යවතුන් වහන්සේ එබඳුවූ ඍද්ධියක් දැක්වූහ. එකල්හි අඞ්ගුලිමාල නම් සොරා 'පින්වත, ඒකාන්තයෙන් ආශ්චර්යක. පින්වත, ඒකාන්තයෙන් පුදුමයකි. මම වනාහි පෙර දුවන්නාවූ ඇතෙකුදු එළවා අල්වා ගොස් ගණිමි. දුවන්නාවූ අශ්වයෙකුදු එළවා ගොස් අල්වා ගණිමි. දුවන්නාවූ රථයකුදු එළවා ගොස් අල්වා ගණිමි. දුවන්නාවූ මුවෙකුදු එළවා ගොස් අල්වා ගණිමි. එතකුදු වුවත් ප්‍රකෘති ගමනින් යන්නාවූ මේ ශ්‍රමණයාකරා සියලු ශක්තියෙන් දුවන්නාවූ මම පැමිණෙන්ට නොහැකි වෙමියි', සිතුණේය. එහෙයින් නැවතී සිටගෙන භාග්‍යවතුන් වහන්සේට "ශ්‍රමණය සිටුව, ශ්‍රමණය සිටුවයි" කීයේය. "අඞ්ගුලිමාලය, මම සිටියෙමි. තෝද සිටුවයි" වදාළේය.

**7.** ඉක්බිත්තෙන් අඞ්ගුලිමාල නම් සොරාට මෙබඳු අදහසක් විය. 'ශාක්‍ය පුත්‍රවූ මේ ශ්‍රමණයෝ වනාහි සත්‍ය වචන ඇත්තාහ. සත්‍යවූ ප්‍රතිඥා ඇත්තාහ. එතකුදු වුවත් මේ ශ්‍රමණ තෙම යමින්ම "අඞ්ගුලිමාලය මම සිටියෙමි. තෝ සිටුවයි" කියන්නේය. මම මේ ශ්‍රමණයාගෙන් අසන්නෙම් නම් යෙහෙක, කියායි. ඉක්බිති අඞ්ගුලිමාල නම් සොර තෙම භාග්‍යවතුන් වහන්සේට ගාථාවෙන් මෙසේ කීයේය.

1. "ශ්‍රමණයන් වහන්ස, යමින් සිටියෙමියි කියන්නෙහිය, සිටියාවූ මටද නොසිටියේයයි කියන්නෙහිය. ශ්‍රමණයන් වහන්ස, මේ කාරණය ඔබවහන්සේගෙන් අසමි. 'කෙසේනම් ඔබ සිටියෙහිද, කෙසේ නම් මම නොසිටියේදැයි' ඇසීය.

2. "අඞ්ගුලිමාලය, මම හැම කල්හි සියලු ප්‍රාණීන් කෙරෙහි දඬු බහා තබා සිටියේ වෙමි. තෝ වනාහි සතුන් කෙරෙහි සංවරයක් නැත්තෙක් වෙහිය. එහෙයින් මම සිටියේ වෙමි. තෝ නොසිටියේ වෙහියයි" (වදාළේය.)

3. "(දෙව් මිනිසුන් විසින්) පුදන ලද්දාවූ මහාඉර්ෂිවූ මේ ශ්‍රමණයන් වහන්සේ බොහෝ කලකින් ඒකාන්තයෙන් මට කරුණාවෙන් මේ මහාවනයට පැමිණියහ. ඒ මම බොහෝ කලකිනුත් නුඹ වහන්සේගේ ධර්මයෙන් යුක්තවූ ගාථාවක් අසා අකුසලය දුරු කරන්නෙමි."

4. මෙසේ අඞ්ගුලිමාල සොර තෙම කඩුවද, ආයුධද, ප්‍රපාතයක ගැඹුරුව සෑරී ගිය මහ වළෙක්හි දැමූයේය. අඞ්ගුලිමාල සොර තෙම සුගතයන් වහන්සේගේ ශ්‍රීපාදයන් මනාකොට වැන්දේය. එහිදීම උන්වහන්සේගෙන් ප්‍රවුජ්‍යාවද ඉල්වූයේය.

5. දෙවියන් සහිත ලෝකයාහට ශාස්තෘවූ කරුණා ඇත්තාවූ මහා ඉර්ෂිවූ ඒ සර්වඥයන් වහන්සේ ඔහුට " මහණ මෙහි එවයි" එකල්හි වදාළේය. ඔහුට මේ වචනයට භික්ෂු භාවය වූයේය.

8. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ පසු පසින් යන ආයුෂ්මත් අඞ්ගුලිමාල ස්ථවිරයන් සමග සැවැත් නුවර යම් තැනෙක්හිද එතැනට සැරිසරමින් වැඩියහ. පිළිවෙළින් සැරිසරා වඩිනුයේ සැවැත් නුවර යම් තැනෙක්හිද, එතැනට පැමිණියහ. එහි වනාහි භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහිවූ ජේතවන නම් අනේපිඬු මහසිටුහුගේ ආරාමයෙහි වැඩවසන සේක. එකල්හි වනාහි පසේනදී කොසොල් රජහුගේ මාලිගා දොරටුයෙහි මහජන සමූහයා රැස්ව "දෙවයන් වහන්ස,

නුඹවහන්සේගේ රටෙහි රෞද්‍රවූ ලේ තැවරුණු අත් ඇත්තාවූ සතුන් නැසීමෙහි වැනසීමෙහි නියුක්තවූ, ප්‍රාණීන් කෙරෙහි කරුණාවක් නැති බවට පැමිණියාවූ, අඞ්ගුලිමාල නම් සොරෙක් වෙයි. ඔහු විසින් ගම්ද නොගම් කරණ ලද්දාහ. නියම් ගම්ද අනියම් ගම් කරණ ලද්දාහ. ජනපදද අජනපද කරණ ලද්දාහ. හෙතෙම මිනිසුන් මර මරා ඇඟිලිමාලාවක් දරයි. දෙවයන් වහන්සේ ඔහු වලක්වන සේක්වායි.” උස්වූ මහත්වූ ඝොෂා ඇතිව වෙසෙයි. එකල්හි පසේනදී කොසොල් රජතෙම පන්සියයක් පමණ අසුන් හා දවල් කාලයෙහි සැවැත් නුවරින් නික්ම ජේතවනාරාමය යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. යානාවෙන් යාමට සුදුසු තැන් දක්වා යානාවෙන් ගොස් යානාවෙන් බැස පා ගමනින්ම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක්පසක හුන්නේය. එක්පසක හුන්නාවූ පසේනදී කොසොල් රජුගෙන් භාග්‍යවතුන් වහන්සේ“කිමෙක්ද මහරජ? තොපට සේනා ඇත්තාවූ මගධ රටට අධිපතිවූ බිම්බිසාර මහරජතෙම හෝ කිපුනේද? නොහොත් විසාලා මහනුවර වැසිවූ ලිච්ඡවි රජ දරුවෝ හෝ කිපුනාහුද? නොහොත් අන් සතුරු රජ කෙනෙක් හෝ කිපුනාහුදැයි ඇසූහ.”

**9.** “ස්වාමීන් වහන්ස, මට මහත් සේනා ඇත්තාවූ මගධ රටට අධිපතිවූ බිම්බිසාර රජතෙමේද නොකිපියේ වෙයි. විසාලාමහනුවර වැසිවූ ලිච්ඡවි රජදරුවෝද නොකිපියාහුමය. අන් සතුරු රජ කෙනෙක්ද නොකිපියාහුමය. ස්වාමීන්වහන්ස, මාගේ ජනපදයෙහි රෞද්‍රවූ ලේ තැවරුණු අත් ඇති සතුන් නැසීමෙහි වැනසීමෙහි නියුක්තවූ ප්‍රාණීන් කෙරෙහි කරුණාවක් නැති බවට පැමිණියාවූ අඞ්ගුලිමාල නම් සොරෙක් ඇත. ඔහු විසින් ගම්ද නොගම් කරණ ලද්දාහ. නියම් ගම්ද අනියම් ගම් කරණ ලද්දාහ. ජනපද අජනපද කරණ ලද්දාහ. හෙතෙම මිනිසුන් මර මරා ඇඟිලි මාලාවක් දරයි. ස්වාමීන් වහන්ස, මම ඔහු වැළක්වීමට යන්නෙමියි” කීය. “මහරජ, හිසකේ රැවුල් කපා කසාවත් හැඳ ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවූ, සතුන් මැරීමෙන් වැලකුනාවූ සොරකම් කිරීමෙන් වැලකුනාවූ, බොරු

කීමෙන් වැලකුනාවූ, එක්වේල අනුභව කරන්නාවූ, බ්‍රහ්මචාර්යාවෙහි හැසිරෙන සිල්වත්වූ යහපත් ස්වභාව ඇත්තාවූ අඞ්ගුලිමාලයා ඉදින් නුඹ දකින්නෙහි නම් ඔහුට කුමක් කරන්නෙහිදැයි" ඇසූහ. "ස්වාමීන් වහන්ස, වැඳීම හෝ කරම්හ. දැක හුනස්නෙන් නැගිටීම හෝ කරම්හ ආසන දීම හෝ කරම්හ. තවද උන්වහන්සේට චීවරය, පිණ්ඩපාතය, සයනාසනය, ගිලන්පස, බෙහෙත් පිරිකර යන මෙයින් පැවරීම හෝ කරම්හ. උන්වහන්සේට ධාර්මිකවූ ආරක්ෂාව හෝ පිළියෙල කරම්හ. ස්වාමීන් වහන්ස, දුස්සීලවූ ලාමක ස්වභාව ඇත්තාවූ මොහුට වනාහි මෙබඳුවූ සීලසංවරයක් කොයින් වන්නේදැයි?" ඇසීය.

**10.** "එසමයෙහි වනාහි ආයුෂ්මත්වූ අඞ්ගුලිමාල ස්ථවිර තෙම භාග්‍යවතුන් වහන්සේට සමීප තැනෙක්හි හුන්නේ වේ. ඉක්බිත්තෙන් භාග්‍යවතුන් වහන්සේ දකුණුඅත දිගුකොට කොසොල් රජහට 'මහරජ, මේ තෙමේ අඞ්ගුලිමාලයයි" වදාළේය. ඉක්බිති පසේනදී කොසොල් රජහට බියක් වූයේය. තැති ගැන්මක් වූයේය. ලොමුඩැහැගැන්මද වූයේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බියපත්වූ, තැතිගත්තාවූ, ලොමුඩැහැගත්තාවූ පසේනදී කොසොල් රජහු දැක පසේනදී කොසොල් රජහට "මහරජ, බිය නොවෙව, මහරජ බිය නොවෙව. තොපට මොහුගෙන් භයක් නැතැයි" වදාළේය. ඉක්බිති පසේනදී කොසොල් රජහට යම් බියක් හෝ තැතිගැන්මක් හෝ ලොමුඩැහැගැන්වීමක් හෝ වීද, එය සංසිඳුනේය. ඉක්බිත්තෙන් පසේනදී කොසොල් රජතෙම ආයුෂ්මත් අඞ්ගුලිමාල ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් අඞ්ගුලිමාල ස්ථවිරයන් වහන්සේට "ස්වාමීනි, ආර්යයන් වහන්සේ අඞ්ගුලිමාල ස්ථවිරදැයි" ඇසීය. 'මහරජ, එසේයයි," ප්‍රකාශ කෙළේය. "ස්වාමීනි ආර්යයන් වහන්සේගේ පියතෙම කෙබඳු ගොත්‍ර ඇත්තීදැයි මව් තොමෝ කෙබඳු ගොත්‍ර ඇත්තීදැයි" ඇසීය. මහරජ මාගේ පියතෙම ගර්ග නම් ගොත්‍ර ඇත්තේද? මව්තොමෝ මන්තානී නම් බැමිණියයි" ප්‍රකාශ කෙළේය. 'ස්වාමීනි, ගර්ග

නම් ගොත්‍ර ඇත්තාවූ මන්තානී නම් බැමිණියගේ පුත්‍රවූ ආර්යයන් වහන්සේ ශාසනයෙහි සිත් අලවා වාසය කෙරෙත්වා. මම ගර්ග නම් ගොත්‍ර ඇත්තාවූ මන්තානී පුත්‍රවූ ආර්යයන් වහන්සේට චීවරය පිණ්ඩපාතය, සයනාසනය, ගිලන්පස, බෙහෙත් පිරිකර යන මෙයින් (පිදීමට) උත්සාහ වත් බව ඇතිකරන්නෙමියි" කීයේය.

11. "එසමයෙහි වනාහි ආයුෂ්මත් අංගුලිමාල ස්ථවිරයන් වහන්සේ ආරණ්‍යකාංගයද, පිණ්ඩපාතිකාංගයද, පංශුකූලිකාංගයද, තෙචීචරිකාංගයද රකින්නාහ. ඉක්බිත්තෙන් ආයුෂ්මත් අංගුලිමාල ස්ථවිරතෙමේ පසේනදී කොසොල් රජහට "මහරජ, කම්නැත. මා හට තුන්සිවුර සම්පූර්ණයයි" කීයේය. ඉක්බිත්තෙන් පසේනදී කොසොල් රජතෙම භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එකත්පසක හුන්නේය. එකත්පසක හුන්නාවූ පසේනදි කොසොල් රජතෙම භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීනි, ආශ්චර්ය, පුදුමය, භාග්‍යවතුන් වහන්සේ දමනය කළ නොහැක්කවුන් දමනය කරන්නෙක, නොසංසුන් සත්වයන් සංසිඳුවන්නෙක, කෙලෙස් නිවීම නොකළාවූ සත්වයන් නිවන්නෙක, ස්වාමීන් වහන්ස, අපි වනාහි යමෙක් දඬුවලින්ද, ආයුධවලින්ද දමනය කරන්ට නොහැකි වෙමුද, ඒ පුද්ගලතෙම භාග්‍යවතුන් වහන්සේ විසින් දණ්ඩෙන් තොරව, ආයුධයෙන් තොරව, දමනය කරණ ලද්දේය. ස්වාමීන් වහන්ස, අපි බොහෝ කටයුතු ඇත්තම්හ. බොහෝ වැඩපල ඇත්තම්හ. එබැවින් දැන් අපි යම්හයි කීයේය." "මහරජ, නුඹ ඊට සුදුසු කාලය දැනගනුවයි" වදාළේය. ඉක්බිත්තෙන් පසෙනදී කොසොල් රජතෙම හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ පැදකුණුකොට ගියේය.

12. "ඉක්බිත්තෙන් ආයුෂ්මත් අංගුලිමාල ස්ථවිරයන්වහන්සේ පෙරවරු වේලෙහි හැඳපොරවා පාත්‍ර සිවුරුගෙණ සැවැත්නුවරට පිඩුපිණිස ගියහ. ආයුෂ්මත්වූ අංගුලිමාල ස්ථවිරයන් වහන්සේ සැවැත් නුවර ගෙපිළිවෙලින්

පිඬු පිණිස යන්නේ සරසට සිටි ගැබයක් උවදුරු සහිත දරු ගැබක් ඇති එක්තරා ස්ත්‍රියක් දුටුයේය. දැක උන්වහන්සේට "පින්වත්නි, ඒකාන්තයෙන් සත්වයෝ කෙලෙසන්නාහුය. පින්වත්නි, ඒකාන්තයෙන් සත්වයෝ කෙලෙසෙන්නාහුයයි" සිතුනේය. ඉක්බිත්තෙන් ආයුෂ්මත්වූ අංගුලිමාල ස්ථවිරයන් වහන්සේ සැවැත් නුවර පිඬු පිණිස හැසිර පසුබත් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැළකුනේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පසක හුන්නේය. එක් පසක හුන්නාවූ ආයුෂ්මත්වූ අංගුලිමාල ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට "ස්වාමීන් වහන්ස, මම පෙරවරු වේලෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරුගෙණ සැවැත්නුවරට පිඬු පිණිස ගියෙමි. සැවැත්නුවර ගෙපිළිවෙළින් පිඬු පිණිස යන්නෙම් සරසට සිටි දරු ගැබක් ඇති උවදුරු සහිත දරු ගැබක් ඇති එක්තරා ස්ත්‍රියක් දුටුවෙමි. දැක 'පින්වත්නි, ඒකාන්තයෙන් සත්වයෝ කෙලෙසෙන්නාහුය. පින්වත්නි, ඒකාන්තයෙන් සත්වයෝ කෙලෙසෙන්නාහුය,' යන සිතක් පහළවූයේයයි" කීය. "අංගුලිමාලය, එසේ වීනම් නුඹ සැවැත් නුවර යම් තැනෙක්හිද, එතැනට පැමිණෙව, පැමිණ ඒ ස්ත්‍රියට "නැගණිය, මම යම්තැනක පටන් මේ ජාතියෙහි උපන්නෙම්ද, එතැන් පටන් දැන දැන සතෙකු ජීවිතයෙන් තොර කළ බව නොදනිමි. ඒ සත්‍ය වචනය කරණ කොටගෙණ තිට සැපක් වේවා. දරු ගැබටද සැපක්වේවායි' කියවයි" වදාළේය. "ස්වාමීන් වහන්ස, මා විසින් වනාහි දැන දැන බොහෝ ප්‍රාණීහු ජීවිතයෙන් තොර කරණ ලද්දාහ. ස්වාමීන් වහන්ස, එහෙයින් මාගේ ඒ කීම ඒකාන්ත බොරු කීමක් වන්නේයයි, කීයේය" "අංගුලිමාලය, එසේ වීනම් නුඹ සැවැත්නුවර යම් තැනෙක්හිද එතැනට යව, ගොස් නැගණිය, මම යම් තැනක පටන් ආර්යවූ ජාතියෙහි උපන්නේවෙම්ද, (එතැන් පටන්) දැන දැන සතෙකු ජීවිතයෙන් තොර කළ බව නොදනිමි. ඒ සත්‍ය වචනය හෙතු කොට ගෙණ තිට සැපවේවා, දරු ගැබටද සැපවේවායි, ඒ ස්ත්‍රියට කියවයි" වදාළසේක. "එසේය, පින්වතුන් වහන්සැයි" කීය. ආයුෂ්මත්වූ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

අංගුලිමාල ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට උත්තරදී සැවැත් නුවර යම් තැනෙක්හිද එතැනට ගියේය. ගොස් ඒ ස්ත්‍රියට "නැගණිය, මම යම් තැනක පටන් ආර්යවූ ජාතියෙහි උපන්නේ වෙම්ද, (එතැන් පටන්) දැන දැන සතෙකු ජීවිතයෙන් තොර කළ බව නොදනිමි. ඒ සත්‍ය වචනය හෙතු කොට ගෙණ තිට සැපවේවා. දරු ගැබටද සැපවේවායි", කීයේය. ඉක්බිත්තෙන් ඒ ස්ත්‍රියට සැපවූයේය. දරු ගැබටද සැපවූයේය.

13. "ඉක්බිත්තෙන් ආයුෂ්මත්වූ අංගුලිමාල ස්ථවිරයන් වහන්සේ තනිව විවේකව අප්‍රමාද කෙලෙස් තවන වීර්ය ඇතිව හරණලද ආත්මාලය ඇතිව වාසය කරන්නේ නොබෝ කලකින්ම කුලපුත්‍රයෝ යමක් සඳහා මනාකොට ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවෙත්ද, මාර්ග බ්‍රහ්මචර්යා කෙළවර කොට ඒ උතුම් රහත් බව මේ ආත්මයෙහිම තෙමේ විශෙෂ ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂ කොට ඊට පැමිණ වාසය කෙළේය. ජාතිය විනාශ කරණ ලද්දීය. මාර්ග බ්‍රහ්මචර්යාව වැස නිම වන ලද්දේය. සතර මාර්ගයෙන් කටයුත්ත කරණ ලද්දේය. මෙයින් පසු කළ යුත්තක් නැත්තේයයි දැනගත්තේය. ආයුෂ්මත්හු අංගුලිමාල ස්ථවිරයන් වහන්සේ රහතන්ගෙන් එක්තරා කෙනෙක් වූහ.

14. "ඉක්බිති ආයුෂ්මත්වූ අංගුලිමාල ස්ථවිරයන් වහන්සේ පෙරවරු වේලෙහි හැඳ පොරවා පාසිවුරුගෙණ සැවැත්නුවරට පිඩු පිණිස පැමිණියේ. එකල්හි වනාහි, අන් දිසාවකට ගසනලද ගලක්ද ආයුෂ්මත්වූ අංගුලිමාල ස්ථවිරයන්ගේ ශරීරයෙහි වැටෙන්නේය. අන් දිසාවකට ගසනලද්දාවූ දණ්ඩක්ද ආයුෂ්මත්වූ අංගුලිමාල ස්ථවිරයන්ගේ ශරීරයෙහි වැටෙන්නේය. අන්දිසාවකට ගසන ලද්දාවූ කැට කැබලිතිද ආයුෂ්මත්වූ අංගුලිමාල ස්ථවිරයන්ගේ ශරීරයෙහි වැටෙන්නේය. ඉක්බිත්තෙන් ආයුෂ්මත්වූ අංගුලිමාල ස්ථවිරයන් වහන්සේ බිඳුනාවූ හිසින් යුක්ත ගලන්නාවූ ලේ ඇතිව බිඳුනාවූ පාත්‍රයෙන් යුක්තව විසර ගියාවූ සඟල සිවුරෙන් යුක්තව භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිඳ එන්නාවූ ආයුෂ්මත් අංගුලිමාල ස්ථවිරයන් දුටහ. දැක ආයුෂ්මත් අංගුලිමාල ස්ථවිරයන්ට

"බ්‍රාහ්මණය, තෝ ඉවසව, බ්‍රාහ්මණය, තෝ ඉවසව, යම් කර්මයක්හුගේ විපාකයෙන් බොහෝ අවුරුදු බොහෝ සිය ගණන් අවුරුදු සිය දහස් ගණන් අවුරුදු සිය දහස් ගණන් අවුරුදු නරකයෙහි පැසෙන්නෙහිද, බ්‍රාහ්මණය, තෝ ඒ කර්මයාගේ විපාකය මේ ආත්මයෙහිම විඳින්නෙහියයි" වදාළහ. ඉක්බිත්තෙන් ආයුෂ්මත්වූ අංගුලිමාල ස්ථවිරයන් වහන්සේ රහසිගතවූයේ සිත එකඟ කිරීමට පැමිණියේ නිවන් සුව විඳින්නේ ඒ වෙලාවෙහි මේ ප්‍රීති වාක්‍යය ප්‍රකාශ කෙළේය.

1. "යමෙක් වනාහි පළමුව ප්‍රමාද වී හෙතෙම පසුව ප්‍රමාද නොවේද, ඒ පුද්ගලතෙම වළාකුලෙන් මිදුනාවූ සඳමෙන් මේ ලොකය බබුළුවයි.

2. යමකු විසින් කරණ ලද්දාවූ අකුසල කර්මය කුසල කර්මයෙන් වැසෙන ලැබේද, ඒ පුද්ගලතෙම වළාකුළෙන් මිදුනාවූ චන්ද්‍රයා මෙන් මේ ලොකය බබලයි.

3. යම් තරුණ මහණෙක් වනාහි සර්වඥ ශාසනයෙහි වීර්යයෙන් යුක්තව වාසය කෙරේද, හෙතෙම වලාකුලින් මිදුනාවූ චන්ද්‍රයා මෙන් මේ ලොකය බබලයි.

4. මාගේ සතුරෝ වනාහි ධර්මයෙන් යුක්තව කථාව අසත්වා. මාගේ සතුරෝ වනාහි සර්වඥ ශාසනයෙහි වීර්යයෙන් යුක්ත වෙත්වා. සත්පුරුෂවූ යම් මිනිස් කෙනෙක් ධර්මය හැර ගණිත්ද, මාගේ සතුරෝ වනාහි එබඳු සත්වයන් භජනය කෙරෙත්වා.

5. මාගේ සතුරෝ වනාහි ඉවසීම ප්‍රකාශ කරන්නාවූ මෛත්‍රියට ප්‍රශංසා කරන්නවුන්ගේ ධර්මය සුදුසු කාලයෙහි අසත්වා ඒ ධර්මයටද අනුව කටයුතු කෙරෙත්වා.

6. හෙතෙම ඒකාන්තයෙන් මට හිංසා නොකරන්නෙක් වේවා. අන්කිසිවෙකුටත් (හිංසා නොකෙරේවා) උතුම්වූ නිවණට පැමිණ කෙලෙස් සහිත සත්වයන් හා කෙලෙස් රහිතවූ සත්වයන්ද රක්නේය.

7. දිය ගෙනයන්නෝ වනාහි ජලය පමුණුවත්. හී වඩුවෝ ඊ දඬු නමා ඇදහරිත්. වඩුවෝ දැව දඬු සැස ඇදහරිත්, නුවණැත්තෝ තමා දමනය කරත්.

8. සමහර කෙනෙක් දණ්ඩෙන්ද, හෙන්ඩුවෙන්ද, කස සැමිටියෙන්ද දමනය කරත්. තාදී (අෂ්ටලොක ධර්මයෙන් කම්පානොවන) ගුණයෙන් යුක්තවූ සර්වඥයන් වහන්සේ විසින් දණ්ඩක් නැතිව ආයුධයක් නැතිව මම දමනය කරණ ලද්දේවෙමි.

9. පෙර සත්ව හිංසා කරන්නාවූ මට අහිංසකයයි නමක්වූයේය. අද මම (අහිංසකය යන) සත්‍යවූ නම ඇත්තේ වෙමි. කිසිවකුටත් හිංසාවක් නොකරමි. පෙර මම අංගුලිමාලයයි ප්‍රසිද්ධවූ සොරෙක් වූයෙමි. කාමාදී මහ වතුරෙන් ගසාගෙණ යනු ලබන්නේ බුදුන් සරණ කොට ගියෙමි.

10. පෙර අංගුලිමාලයයි ප්‍රසිද්ධවූ ලේ තැවරුණු අත් ඇත්තෙක් වීමි. (ඔහුගේ) සරණයාම බලව (ඔහු විසින්) භව ආශාව නැති කරනලදී.

11. දුර්ගතිවලට පමුණුවන්නාවූ බොහෝ එබඳු අකුසල කර්ම කොට මාර්ග කුසල විපාකයට පැමිණෙන ලද්දේ නය නැත්තෙක්ව ආහාර වළඳමි.

12. අඥානවූ බාලජනයෝ ප්‍රමාදයෙහි යෙදී වාසය කරත්. නුවණැත්තේ උතුම් ධනයක් මෙන් අප්‍රමාද රක්ෂා කරයි.

13. ප්‍රමාදයෙහි නොයෙදෙව්. පස්කම් සැපයෙහි ඇල්මට නොපැමිණෙව්. අප්‍රමාදව නුවණින් බලන තැනැත්තේ වනාහි මහත්වූ සැපයට පැමිණේ.

14. 'මාගේ යම් පැමිණීමක් ඇද්ද එය ලාමක පැමිණීමක් මම පැවිදි වන්නෙමි යන නොවන්නේය'. යම් වචනයක් කියන ලදද එය අයහපත් කීමක් නොවන්නේය. බුදුවරයන්

වහන්සේලා විසින් බෙදා වදාළ ධර්මයන් අතුරෙහි ඒ ධර්මයට පැමිණියෙමි. යම් ධර්මයක් උත්තමද

15. මාගේ යම් පැමිණීමක් ඇද්ද, එය ලාමකවූ පැමිණීමක් මා විසින් යම් වචනයක් කියනලදද එය නොවේ. ත්‍රිවිද්‍යාවන්ට පිළිවෙළින් පැමිණියෙමි. අයහපත් වචනයක් නොවේ. බුදුරජාණන් වහන්සේගේ අනුශාසනය කරණලදියි". ප්‍රකාශ කෙළේය.

**අංගුලිමාල සූත්‍රය නිමි. (4-36)**

---

## 37. පිය ජාතික සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කාලයක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි අනේපිඬු සිටුහු විසින් කරවන ලද ජේතවනාරාමයෙහි වැඩවාසය කරති. එකල එක් ගෘහපතියෙකුගේ ප්‍රියවූ මනාපවූ එකම පුත්‍රතෙම කළුරිය කෙළේ වෙයි.

පුත්‍රයාගේ මරණයෙන් ඒ ගෘහපතියාහට කර්මාන්ත රුචි නොවෙත්. ආහාරයද රුචි නොවෙයි. හෙතෙම සොහොණට ගොස් 'එකම පුත්‍රය, ඔබ කොහිද, එකම පුත්‍රය ඔබ කොහිදැයි' කියමින් විලාප කියති.

2. ඉක්බිති ඒ ගෘහපති තෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පසෙක උන්නේය. එසේ උන් ඒ ගෘහපතියාට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළේය.

"ගෘහපතිය, නුඹගේ ඉන්ද්‍රියයන්ගේ ප්‍රකෘති ස්වභාවය නුඹගේ ඉන්ද්‍රියයන්ගේ වෙනස්බවක් ඇතැයි" වදාළේය.

"ස්වාමීන් වහන්ස, මාගේ ඉන්ද්‍රියන්ගේ වෙනස් බවෙක් කෙසේ නම් නොවන්නේද? ස්වාමීන් වහන්ස, මාගේ ප්‍රියවූ, මනාපවූ, එකම පුත්‍රයා මළේය. ඔහුගේ මරණයෙන් පසු මේ

කර්මාන්තයද රුචි නොවෙති. ආහාරයද රුචි නැත. ඒ මම සොහොනට ගොස් 'එකම පුත්‍රය, ඔබ කොහිද? එකම පුත්‍රය, ඔබ කොහිද? කියමින් අඬමියි" කීය.

"ගෘහපතිය, ඒ එසේමය. ගෘහපතිය, ශොකය වැළපීම දුකය, දොම්නසය, බලවත් වෙහෙසය, යන මොහු පිය දෙයින් හටගන්නාහුය. ප්‍රිය දෙයින් උපදින්නාහුය."

"ස්වාමීනි, ශොකය, වැළපීම, දුක, දොම්නස, දැඩි වෙහෙස යන මොහු ප්‍රිය දෙයින් හටගන්නාහුය, ප්‍රිය දෙයින් උපන්නේය, යන මේ කාරණය කෙසේ නම් වන්නේද? ස්වාමීනි, ප්‍රිය දෙයින් සතුට සොම්නස හටගන්නේය. උපදනාහුයයි" කියා ඒ ගෘහපති තෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනයට නොසතුටුව ප්‍රතික්ෂෙප කොට ආසනයෙන් නැගිට ගියේය.

3. එකල්හි බොහෝ දාදු කෙළින්නෝ භාග්‍යවතුන් වහන්සේට සමීප තැනක දාදු කෙළිති. එවිට ඒ ගෘහපතිතෙම ඒ දාදු කෙළින්නෝ යම් තෙනකද එහි පැමිණ දාදු කෙළින්නන්ට මෙසේ කීය.

"පින්වතුනි, මෙහි මම ශ්‍රමණ ගෞතම තෙම යම් තෙනකද එහි ගියෙමි. ගොස් ශ්‍රමණ ගෞතමයන් වැඳ එකත් පසෙක හුනිමි. පින්වතුනි, ඒ පසෙක උන් මට ශ්‍රමණ ගෞතම තෙමේ මෙසේ කීය.

"ගෘහපතිය, නුඹගේ ඉන්ද්‍රියයෝ පැහැදිලි නැත. නුඹගේ ඉන්ද්‍රියයන්ගේ වෙනස් බවක් ඇතැයි" කීය. "පින්වතුනි, මෙසේ කීකල්හි මම ශ්‍රමණ ගෞතමයන්ට, මෙසේ "ස්වාමීනි, මාගේ ඉන්ද්‍රියවෙනස් බවෙක් කෙසේ නම් නොවන්නේද? ස්වාමීනි මාගේය මනාප එකම පුත්‍රයා මළේය. ඔහුගේ මරණයෙන් මට කර්මාන්තද රුචි නොවෙති. ආහාරද රුචි නැත. ඒ මම සොහොනට ගොස් 'එකම පුත්‍රය ඔබ කොහිද? එකම පුත්‍රය ඔබ කොහිද, කියමින් හඬමි'යි කීයෙමි.

එසේ කී කල්හි, 'ගෘහපතිය, ඒ එසේමය. ගෘහපතිය ඒ එසේමය' ගෘහපතිය, සොකය, හැඬීමය, දුකය, දොම්නසය දැඩි

වෙහෙසය යන මොහු ප්‍රිය දෙයින් උපදනාහු වෙති. ප්‍රිය දෙයින් හටගන්නාහු වෙති" කීය. "ස්වාමීනි, සොකය, හැඬීම දුකය, දොම්නසය යන මොහු ප්‍රිය දෙයින් උපදනාහුය. ප්‍රිය දෙයින් හටගන්නාහුය. යන මේ කාරණය වනාහි කෙසේ වන්නේද?

"ස්වාමීනි, ප්‍රිය දෙයින් සතුට හා සොම්නස හටගන්නාහුය, උපදනාහුයයි' කියා මම ශ්‍රමණ ගෞතමයන්ගේ කීමට සතුටු නොවී ප්‍රතික්ෂෙපකොට හුන් ආසනයෙන් නැගිට ගියෙමියි" කීය.

"ගෘහපතිය, ඒ කාරණය එසේමය. ගෘහපතිය, ඒ කාරණය එසේමය. ගෘහපතිය, සතුට හා සොම්නස යන මොහු ප්‍රිය දෙයින් උපදනාහුය. ප්‍රිය දෙයින් උපදනාහුයයි" (ඔව්හු කීහ.)

4. ඉක්බිති ඒ ගෘහපති තෙමේ මාගේ අදහස දාදු කෙළින්නන් හා සමවෙයි කියා ගියේය.

ඉක්බිති මේ කථාව පිළිවෙළින් රජුගේ මාලිගාවට පැමිණියාය. ඉක්බිති පසෙනදි කොසොල් රජතෙමේ මල්ලිකා දේවිය කැඳවී. "මල්ලිකාවෙනි, සොකය, හැඬීමය, දුකය, දොම්නසය යන මොහු ප්‍රියදේ නිසා උපදනාහුය. ප්‍රියදේ නිසා හටගන්නාහුයයි තොපගේ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ විසින් කියනලදී."

"ඉදින් මහරජතුමනි, ඒ කාරණය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද නම් එය එසේයයි" (කීවාය.)

"මේ මල්ලිකාව ශ්‍රමණ ගෞතමයන් වහන්සේ යමක් යමක් කියයි නම් 'මහරජතුමනි, ඉදින් ඒ කාරණය භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දක්නම් ඒ එසේම වෙයි' කියමින් ඒ එසේම පිළිගනියි.

"යම්සේ ගුරුවරයෙක් ගොලයාට යමක් කියයි නම් 'ආචාර්යයන් වහන්ස, එය එසේයයි' ගොලයා පිළිගනියි.

"එමෙන් මල්ලිකාවෙනි, නුඹද එලෙසම ශ්‍රමණ ගෞතම තෙමේ යමක් කියයි නම් 'ඉදින් මහරජ' ඒ කාරණය භාග්‍යවතුන්

වහන්සේ වදාළේ නම් ඒ එසේම වන්නේය'. කියා පිළිගන්නෙහිය. මල්ලිකාවෙනි, මෙතනින් ඉවත්ව යවයි කීය.

**5.** ඉක්බිති මල්ලිකා දේවිය, නාලිජංඝනම් බමුණා කැඳවී. "බ්‍රාහ්මණය, මෙහි එව. නුඹ භාග්‍යවතුන් වහන්සේ යම් තෙනකද එහි පැමිණ මාගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේගේ පා මුදුනෙන් වඳුව. ආබාධ නැතිබව, රෝග නැතිබව සැහැල්ලු පැවැත්ම කායබලය, සුඛ විහරණය විචාරව. 'ස්වාමීන් වහන්ස, මල්ලිකා දේවී තොමෝ භාග්‍යවතුන් වහන්සේගේ පා මුදුනෙන් වඳියි. පීඩා නැතිබව ලෙඩ නැති බව කය පිළිබඳ සැහැල්ලුකම, කය පිළිබඳ ශක්තිය, සැප විහරණය අසායයි' කියව.

"මෙසේද කියව 'ස්වාමීන් වහන්ස, සොකපරිදෙව දුක් දොම්නස් උපායාස යන මේවා ප්‍රියදේ නිසා උපදනාහුය. ප්‍රියදේ නිසා හටගන්නාහුයයි, භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේද, කියාය. භාග්‍යවතුන් වහන්සේ නුඹට යම්සේ ප්‍රකාශ කෙරේද? ඒ එසේම යහපත්ව උගෙණ මට කියව. තථාගතයන් වහන්සේලා බොරු නොකියත් යයි" කීහ.

"එසේය", කියා නාලිජංඝ බ්‍රාහ්මණතෙම මල්ලිකාදේවියට උත්තරදී භාග්‍යවතුන් වහන්සේ යම් තෙනකද එහි පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු වියයුතු සිහි කටයුතු කථාවකොට අවසන්ව, එක් පසෙක උන්නේය. එක් පසෙක හුන් නාලිජංඝ බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කී.

"භවත් ගෞතමයන් වහන්ස, මල්ලිකා දෙවිතොමෝ පින්වත් ගෞතමයන් වහන්සේ පා මුදුනෙන් වඳියි. ආබාධ නැතිකම, රෝග නැතිකම, කයේ සැහැල්ලු බව කාය බලය, පහසු විහරණය අසයි. මෙසේද කියයි. ස්වාමීනි, සොක, පරිදෙව, දුක් දොම්නස්, උපායාස යන මොහු ප්‍රිය දෙයින් උපදනාහුය. ප්‍රිය දෙයින් හටගන්නාහුයයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේ දැයි' ඇසී.

**6.** "බ්‍රාහ්මණය, ඒ එසේමය. බ්‍රාහ්මණය, එසේමය. බ්‍රාහ්මණය ශොක පරිදෙව දුක් දොම්නස් උපායාස යන මොහු

ප්‍රිය දෙයින් උපදනාහුය. ප්‍රිය දෙයින් හටගන්නාහු වෙති. බ්‍රාහ්මණය සොක පරිදෙව දුක් දොම්නස්, උපායාස යන මොහු ප්‍රිය දෙයින් හටගන්නාහුය. ප්‍රිය දෙයින් උපදනාහුය. යන මේ කාරණය මේ ක්‍රමයෙන් ද දතයුතුය. කෙසේද? පෙරදවස බ්‍රාහ්මණය, මේ සැවැත් නුවරම එක්තරා ස්ත්‍රියකගේ මව් කළුරිය කළාය. මවගේ මරණයෙන් උමතුවූ සිත පෙරළුණු ඒ ස්ත්‍රී තොමෝ වීථියෙන් වීථියට මංසන්ධියෙන් මංසන්ධියට පැමිණ මෙසේ කියයි. 'මාගේ මව් දුටුවාහුද? මාගේ මව් දුටුවොහුද? යනුයි.

"බ්‍රාහ්මණය, සොක, පරිදෙව, දුක්ඛ, දොම්නස්ස, උපායාස යන මොහු ප්‍රිය දෙයින් හට ගන්නාහුය, දෙයින් උපදනාහුය, ප්‍රිය යන මේ කාරණය මේ ආකාරයෙන්ද දතයුතු කෙසේද? බ්‍රාමණය, පෙර දවස මේ සැවැත් නුවරම එක්තරා ස්ත්‍රියකගේ පියතෙම මැරිණි. ඒ පියාගේ මරණින් උමතුවූ සිත පෙරළුනු ඒ ස්ත්‍රිය වීථියෙන් විථියට මංසන්ධියෙන් මංසන්ධියට පැමිණ, මාගේ පියා දුටුවාහුද? මාගේ පියා දුටුවාහුදැ'යි කියයි.

"බ්‍රාහ්මණය, සොක, පරිදෙව, දුක්, දොම්නස්, උපායාස යන මොවුහු ප්‍රියදෙයින් හටගන්නාහුය, ප්‍රියදෙයින් උපදනාහුය යන මේ කාරණය මේ ආකාරයෙන්ද දත යුතුය. බ්‍රාහ්මණය පෙර දවස මේ සැවැත් නුවරම එක්තරා ස්ත්‍රියකගේ සොහොයුරා මළේය. ඒ සොහොයුරාගේ මරණින් උමතුවූ සිත පෙරළුණු ඒ ස්ත්‍රිය වීථියෙන් වීථියට, මංසන්ධියෙන් මංසන්ධියට පැමිණ, 'මගේ සොහොයුරා දුටුවාහුද? මගේ සොහොයුරා දුටුවාහුදැයි' කියයි.

"බ්‍රාහ්මණය, සොක, පරිදෙව, දුක්, දොම්නස්, උපායාස යන මොවුහු ප්‍රිය දෙයින් හටගන්නාහුය. ප්‍රිය දෙයින් උපදනාහුය, යන මේ කාරණය මේ ආකාරයෙන්ද දත යුතුය. බ්‍රාහ්මණය පෙර දවස මේ සැවැත් නුවරම එක්තරා ස්ත්‍රියකගේ සොහොයුරිය මළහ. ඒ සොහොයුරියගේ මරණින් උමතුවූ සිත පෙරළුණු ඒ ස්ත්‍රිය වීථියෙන් වීථියට, මංසන්ධියෙන් මංසන්ධියට

පැමිණ, 'මගේ සොහොයුරිය දුටුවාහුද? මගේ සොහොයුරිය දුටුවාහුදැ'යි කියයි.

"බ්‍රාහ්මණය, සොක, පරිදෙව, දුක්, දොම්නස්, උපායාස යන මොවුහු ප්‍රිය දෙයින් හටගන්නාහුය, ප්‍රිය දෙයින් උපදනාහුය. මේ කාරණය මේ ආකාරයෙන්ද දත යුතුයි. බ්‍රාහ්මණය පෙර දවස මේ සැවැත් නුවරම එක්තරා ස්ත්‍රියකගේ පුත්‍රයා මළේය. ඒ පුත්‍රයාගේ මරණින් උමතුවූ සිත පෙරළුණු ඒ ස්ත්‍රිය වීථියෙන් වීථියට, මංසන්ධියෙන් මංසන්ධියට පැමිණ, 'මගේ පුත්‍රයා දුටුවාහුද? මගේ පුත්‍රයා දුටුවාහුදැයි' කියයි.

"බ්‍රාහ්මණය, සොක, පරිදෙව, දුක්, දොම්නස්, උපායාස යන මොවුහු ප්‍රිය දෙයින් හටගන්නාහුය. ප්‍රිය දෙයින් උපදනාහුය. යන මේ කාරණය මේ ආකාරයෙන්ද දතයුතුය. බ්‍රාහ්මණය, පෙර දවස මේ සැවැත් නුවරම එක්තරා ස්ත්‍රියකගේ දුවක් මළහ. ඒ දුවගේ මරණින් උමතුවූ සිත පෙරළුණු ඒ ස්ත්‍රිය වීථියෙන් වීථියට, මංසන්ධියෙන් මංසන්ධියට පැමිණ, 'මගේ දුව දුටුවාහුද? මගේ දුව දුටුවාහුදැයි' කියයි.

"බ්‍රාහ්මණය, සොක, පරිදෙව, දුක්, දොම්නස්, උපායාස යන මොවුහු ප්‍රිය දෙයින් හටගන්නාහුය. ප්‍රිය දෙයින් උපදින්නාහුය, යන මේ කාරණය මේ ආකාරයෙන්ද දතයුතුයි. බ්‍රාහ්මණය පෙර දවස මේ සැවැත් නුවරම එක්තරා ස්ත්‍රියකගේ හිමියා මළේය. ඔහුගේ මරණයෙන් උමතුව සිත පෙරළුණ ඕ තොමෝ වීථියෙන් වීථිය, හන්දියෙන් හන්දිය වෙත පැමිණ, මෙසේ කියයි. 'මාගේ හිමියා දුටුවාහුද? මාගේ හිමියා දුටුවොහුද?' කියයි.

7. "බ්‍රාහ්මණය, සොකය, පරිදෙවය, දුක්ඛය දොමනස්සය උපායාසය යන මොහු ප්‍රිය දෙයින් හටගන්නාහුය. ප්‍රිය දෙයින් උපදින්නාහුය. යන මේ කාරණය මේ ක්‍රමයෙන්ද දත යුතුවෙයි. කෙසේද?

"බ්‍රාහ්මණය, පෙරකලෙක මේ සැවැත් නුවරෙහිම එක්තරා පුරුෂයෙකුගේ මවු මිය ගියාය. ඇගේ මරණයෙන් උමතුව සිත

පෙරලුණ ඒ පුරුෂතෙම වීථියෙන් වීථිය හන්දියෙන් හන්දිය වෙත පැමිණ මෙසේ කීය. මාගේ මැණියන් දුටුවාහුද? මාගේ මැණියන් දුටුවාහුද?" (කියාය.)

"බ්‍රාහ්මණය, සොකය, පරිදෙවය, දුකය, දොම්නසය, උපායාසය යන මේවා ප්‍රිය දෙයින් හටගන්නාහුය. ප්‍රිය දෙයින් උපදනාහුය යනු මේ ක්‍රමයෙන්ද දත යුතුය.

"බ්‍රාහ්මණය, පෙරදවස මේ සැවැත් නුවරම එක්තරා පුරුෂයෙකුගේ පියා මළේය. ඒ පියාගේ මරණින් උමතුවූ සිත පෙරළුණු ඒ පුරුෂයා වීථියෙන් වීථියට මංසන්ධියෙන් මංසන්ධියට පැමිණ 'මගේ පියා දුටුවාහුද? මගේ පියා දුටුවාහුදැ'යි කියයි.

"බ්‍රාහ්මණය, සොකය, පරිදෙවය, දුකය, දොම්නසය, උපායාසය යන මොවුහු ප්‍රිය දෙයින් හටගන්නාහුය. ප්‍රිය දෙයින් උපදනාහුය. යන මේ කාරණය මේ ආකාරයෙන්ද දත යුතුය. බ්‍රාහ්මණය පෙර දවස මේ සැවැත්නුවරම එක්තරා පුරුෂයෙකුගේ සහෝදරයා මළේය. ඒ සහෝදරයාගේ මරණින් උමතුවූ සිත පෙරළුනු ඒ පුරුෂයා වීථියෙන් වීථියට මංසන්ධියෙන් මංසන්ධියට පැමිණ 'මගේ සහෝදරයා දුටුවාහුද? මගේ සහෝදරයා දුටුවාහුදැයි?' කියයි,

"බ්‍රාහ්මණය, සොකය, පරිදෙවය, දුකය, දොම්නසය, උපායාසය, මොවුහු ප්‍රිය දෙයින් හටගන්නාහුය. ප්‍රිය දෙයින් උපදනාහුය. යන මේ කාරණය මේ ආකාරයෙන්ද දතයුතුය. බ්‍රාහ්මණය, පෙර දවස මේ සැවැත් නුවරම එක්තරා පුරුෂයෙකුගේ සහෝදරිය මළාය. ඒ සහෝදරියගේ මරණයෙන් උමතුවූ, සිත පෙරළුණ ඒ පුරුෂයා වීථියෙන් වීථියට මංසන්ධියෙන් මංසන්ධියට පැමිණ, මගේ සහෝදරිය දුටුවාහුද? මගේ සහෝදරිය දුටුවාහුදැයි?' කියයි,

"බ්‍රාහ්මණය, සොකය, පරිදෙවය, දුකය, දොම්නසය, උපායාසය යන මොවුහු ප්‍රිය දෙයින් හටගන්නාහුය. ප්‍රිය දෙයින් උපදනාහුය. යන මේ කාරණය මේ ආකාරයෙන්ද දතයුතුය.

බ්‍රාහ්මණය, පෙර දවස මේ සැවැත්නුවරම එක්තරා පුරුෂයෙකුගේ පුතා මළේය. ඒ පුතාගේ මරණයෙන් උමතුවූ සිත පෙරළුනු ඒ පුරුෂයා වීථියෙන් වීථියට මංසන්ධියෙන් මංසන්ධියට පැමිණ 'මගේ පුතා දුටුවාහුද? මගේ පුතා දුටුවාහුදැයි?' කියයි,

"බ්‍රාහ්මණය, සොකය, පරිදෙවය, දුකය, දොම්නසය, උපායාසය යන මොවුහු ප්‍රිය දෙයින් හටගන්නාහුය. ප්‍රිය දෙයින් උපදනාහුය. යන මේ කාරණය මේ ආකාරයෙන්ද දත යුතුය. බ්‍රාහ්මණය පෙර දවස මේ සැවැත්නුවරම එක්තරා පුරුෂයෙකුගේ දුව මළාය. ඒ දුවගේ මරණයෙන් උමතුවූ සිත පෙරළුනු ඒ පුරුෂයා වීථියෙන් වීථියට මංසන්ධියෙන් මංසන්ධියට පැමිණ 'මගේ දුව දුටුවාහුද? මගේ දුව දුටුවාහුදැයි?' කියයි,

"බ්‍රාහ්මණය, සොකය, පරිදෙවය, දුකය, දොම්නසය, උපායාසය යන මොවුහු ප්‍රිය දෙයින් හටගන්නාහුය. ප්‍රිය දෙයින් උපදනාහුය. යන මේ කාරණය මේ ආකාරයෙන්ද දත යුතුය. බ්‍රාහ්මණය පෙර දවස මේ සැවැත්නුවරම එක්තරා පුරුෂයෙකුගේ භාර්යාව මළාය. ඇගේ මරණයෙන් උමතුවූ පෙරළුනු සිත් ඇති ඒ පුරුෂතෙම වීථියෙන් වීථියට මංසන්ධියෙන් මංසන්ධිය කරා ගොස් මෙසේ කියයි. 'මගේ භාර්යාව දුටුවාහුද? මගේ භාර්යාව දුටුවාහුද?' කියාය,

"බ්‍රාහ්මණය, සොකය, පරිදෙවය, දුකය, දොම්නසය, උපායාසය යන මොහු ප්‍රිය දෙයින් හටගන්නාහුය, ප්‍රිය දෙයින් උපදනාහුය යන මේ ආකාරයෙන්ද දතයුතුය. කෙසේද?

8. "බ්‍රාහ්මණය, පෙර දවස මේ සැවැත් නුවරම එක්තරා ස්ත්‍රියාවක් නෑගෙට ගියාය. ඇගේ නෑයෝ ඇය හිමියාගෙන් වෙන්කොට අනිකෙක්හට දෙනු කැමැත්තේය. ඇයද ඒ පුරුෂයාට කැමති නොවීය. ඉක්බිති ඕතොමෝ (සිය) හිමියාට 'ස්වාමිපුත්‍රය, මේ නෑයෝ මා ඔබගෙන් වෙන්කොට අනිකෙක්හට දෙනු කැමැත්තෝය. මමද ඔබට කැමති නොවෙමියි,' කීවාය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

ඉක්බිති ඒ පුරුෂතෙම ඒ ස්ත්‍රිය දෙපලු කොට තමාගේද බඩ පලාගෙන දෙදෙන පරලොවදී එක්වෙමු යයි මළේය. බ්‍රාහ්මණය, මේ කාරණයෙන්ද සොකය පරිදෙවය, දුකය, දොම්නසය යන මොහු ප්‍රිය දෙයින් හටගන්නාහුය. ප්‍රිය දෙයින් උපදනාහුය යන බව දත යුතුයයි," වදාළේය.

**9.** "ඉක්බිති නාලිජංඝ බ්‍රාහ්මණතෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටුව අනුමෝදන්ව ආසනයෙන් නැගිට මල්ලිකාදේවී යම්තැනකද, එහි පැමිණ, භාග්‍යවතුන් වහන්සේ සමග යම් පමණ කථාවක් වීද, ඒ සියල්ල මල්ලිකා දේවියට දැන්වී.

ඉක්බිති මල්ලිකාදේවී, පසෙනදී කොසොල් රජතෙම යම් තැනකද, එහි පැමිණ පසෙනදී කොසොල් රජහට මෙසේ කීය. "මහරජ, ඔබ කුමකැයි සිතන්නෙහිද? ඔබට වජිරී කුමාරිකාව ප්‍රියදැයි" ඇසී.

"මල්ලිකාවෙනි, එසේය. වජිරී කුමාරිකාව මට ප්‍රියයයි" කීය. "මහරජ තුමනි, ඒ ඔබ කුමකැයි සිතන්නෙහිද? වජිරී කුමරියගේ මරණයෙන් හෝ පලායාමෙන් හෝ ඔබට ශොකය, පරිදෙවය, දුකය, දොම්නස්ස යන මේවා උපදින්නාහුදැයි" ඇසී.

"මල්ලිකාවෙනි, වජිරී කුමරියගෙ මරණයෙන් හෝ පලායාමෙන් මාගේ ජීවිතය පවා වෙනස්වන්නේය. කෙසේ නම් සොක, පරිදෙව, දුක්ඛ, දොමනස්ස, යන මොහු නූපදින්නාහුදැයි" (ඇසී).

"මහරජතුමනි, සියල්ල දන්නාවූ, සියල්ල දක්නාවූ, ඒ අර්හත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ විසින් සොකපරිදෙව දුක්ඛ දොමනස්ස උපායාස යන මොහු ප්‍රිය දෙයින් හටගන්නාහුය. ප්‍රිය දෙයින් උපදනාහුයයි මේ සඳහා වදාරණ ලදී.

"මහරජාණෙනි, කුමක් සිතන්නෙහිද? ඔබට වාසභඛත්තියාව ප්‍රියදැයි" (ඇසී). මල්ලිකාවෙනි, එසේය වාසභඛත්තියා මට ප්‍රියයි කීය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**10.** "මහරජුනි, ඒ කුමක් සිතන්නෙහිද? වාසභඛත්තියාවගේ මරණයෙන් හෝ පලායාමෙන් හෝ ඔබට සොක පරිදෙව දුක්ඛ දොමනස්ස යන මොහු උපදින්නාහුදැයි" (ඇසී)

"මල්ලිකාවෙනි, වාසභඛත්තියාවගේ මරණයෙන් හෝ පලායාමෙන් හෝ මාගේ ජීවිතය පවා වෙනස්වෙයි. සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාස යන මොහු කෙසේ නම් නූපදින්නාහුද?"

"මහරජතුමනි, සියල්ල දන්නාවූ සියල්ල දක්නාවූ අර්හත් වූ ඒ සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ විසින් සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාස යන මොහු ප්‍රිය දෙයින් හටගන්නාහුය, ප්‍රිය දෙයින් උපදනාහුයයි, මේ සඳහා වදාරණ ලදී.

**11.** "මහරජතුමනි! ඔබ කුමක් සිතන්නෙහිද? විඩූඩභ සේනාපතිතෙම ඔබට ප්‍රියවේද?" "මල්ලිකාවෙනි, එසේය විඩූඩභ සෙනාපති මට ප්‍රියයි" කීය. "මහරජතුමනි, ඒ කුමකැයි සිතන්නෙහිද? විඩූඩභ සෙන්පතිගේ මරණයෙන් හෝ පලා යාමෙන් හෝ ශොක පරිදෙව දුක්ඛ දොමනස්ස යන මේවා ඔබට උපදින්නාහුද?"

"මල්ලිකාවෙනි, විඩූඩභ සේනාපතිගේ මරණයෙන් හෝ පලායාමෙන් හෝ මාගේ ජීවිතය පවා වෙනස් වෙයි. ශොක පරිදෙව, දුක්ඛ, දොමනස්ස යන මොව්හු කෙසේ නම් නූපදින්නාහුද?

"සියල්ල දන්නාවූ සියල්ල දක්නාවූ අර්හත්වූ ඒ සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ විසින් සොක, පරිදෙව, දුක්ඛ දොමනස්ස යන මොව්හු ප්‍රිය දෙයින් හටගන්නාහුය, ප්‍රිය දෙයින් උපදිනාහුයයි මේ සඳහා වදරණ ලදී.

**12.** "මහරජතුමනි, ඒ කුමක් සිතන්නෙහිද? ඔබට මා ප්‍රියද?" "මල්ලිකාවෙනි, එසේය. මට නුඹ ප්‍රියවෙහිය." "මහරජතුමනි, ඒ කුමකැයි සිතන්නෙහිද? මාගේ මරණයෙන් පලායාමෙන් හෝ ඔබට ශොකය, පරිදෙවය, දුක්ඛය දොමනස්සය යන මොව්හු

උපදින්නාහුද?" "මල්ලිකාවෙනි, නුඹගේ මරණයෙන් පලායාමෙන් හෝ මාගේ ජීවිතය පවා වෙනස් වෙයි. සොක පරිදෙව, දුක්ඛ, දොමනස්ස යන මොව්හු මට කිමනූපදින්නාහුද?"

"මහරජතුමනි, සියල්ල දන්නාවූ, සියල්ල දක්නාවූ, ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ විසින් සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාස, යන මොව්හු ප්‍රිය දෙයින් හටගන්නාහුය, ප්‍රිය දෙයින් උපදනාහුයයි මේ සඳහා වදාරණ ලදී."

13. "මහරජතුමනි, ඒ කුමකැයි, සිතන්නෙහිද? කසී, කොසොල් දෙරට ඔබට ප්‍රියවේද?" "මල්ලිකාවෙනි, එසේය කසී කොසොල් දෙරට මට ප්‍රියයයි" කීය.

"මල්ලිකාවෙනි! කසී කොසොල් දෙරටෙහි ආනුභාවයෙන් කසී කොසොල් දෙරටෙහිවූ කාසික චන්දනා නම්වූ සඳුන් භාවිතා කරමු. මල්ගඳ විලවුන් දරමුයි" කීය.

"මහරජතුමනි, ඒ කුමක් සිතන්නෙහිද? කසී, කොසොල් දෙරට අත්හැරීමෙන් හෝ සතුරන්ට අත්වීමෙන් ඔබට ශොක, පරිදෙව, දුක්ඛ දොමනස්ස යන මොව්හු උපදින්නාහුද?"

"මල්ලිකාවෙනි, කසී, කොසොල් දෙරට අත්හැරීමෙන් හෝ සතුරන්ට අත්වීමෙන් හෝ මාගේ ජීවිතය පවා වෙනස් වෙයි. ශොක, පරිදෙව, දුක්ඛ, දොමනස්ස යන මොව්හු කිම නූපදින්නාහුද?"

"මහරජතුමනි, සියල්ල දන්නාවූ සියල්ල දක්නාවූ ඒ අර්හත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ විසින් ශොක පරිදෙව, දුක්ඛ දොමනස්ස යන මොව්හු ප්‍රිය දෙයින් හට ගන්නාහුය, ප්‍රිය දෙයින් උපන්නාහුයයි මේ සඳහා වදාරණ ලදැයි" කීය.

14. "මල්ලිකාවෙනි, ආශ්චර්යයයි! මල්ලිකාවෙනි පුදුමයි. ඒ භාග්‍යවතුන් වහන්සේ ප්‍රඥාවෙන් (දතයුතු) යම් පමණද (ඒ සියල්ල) අතිශයින් අවබෝධ කොට දක්නාහුයයි සිතමි. මල්ලිකාවෙනි, මෙහි එව අත්පාසෝදන ජලය ගෙනෙවයි' කීය."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

ඉක්බිති පසෙනදි කොසොල් රජතෙම උන් ආසනයෙන් නැගිට උතුරු සළුව එක් අංශයෙක්හි කොට භාග්‍යවතුන් වහන්සේ යම් දිශාවෙක්හිද ඒ දිශාවට දොහොත් මුදුන් දී නමස්කාර කොට 'ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේට නමස්කාර වේවා. ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේට නමස්කාර වේවා, ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේට නමස්කාර වේවායි' තුන්වරක් ප්‍රීති වාක්‍ය ප්‍රකාශ කෙළේය.

සත්වැනිවූ පියජාතික සූත්‍රය නිමි. (4-7)

---

## 38. බාහිතික සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කාලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි, අනේ පිඩු සිටුහුගේ ජේතවනාරාමයෙහි වැඩ වෙසෙති. ඒ කාලයෙහි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ පෙර වරුයෙහි හැඳ පොරවා පාත්‍රා සිවුරුගෙණ පිඩු පිණිස සැවැත්නුවරට පැමිණියේය. සැවැත් නුවර පිඩු පිණිස හැසිර පිණ්ඩපාතයෙන් වැලක සවස් කාලයෙහි මිගාරමාතු ප්‍රාසාදනම්වූ පූර්වාරාමය යම් තෙනකද, එහි දවල් විසීම පිණිස පැමිණියේය.

2. ඒ කාලයෙහි පසෙනදි කොසොල් රජ තෙමේ එක පුණ්ඩරීක නම් ඇතුපිට නැග මැදිදවල් සැවැත් නුවරින් පිටත් විය. පසෙනදි කොසොල් රජ තෙමේ වඩින්නාවූ ආයුෂ්මත් ආනන්ද තෙරුන් දුරදීම දිටී. දැක සිරිවඩ්ඪනම් මහ ඇමතියාට කථාකොට "යහලු සිරිවඩ්ඪයිනි, මේ ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝද්‍දැයි" (ඇසී) "මහරජ, එසේය, මේ ආයුෂ්මත් ආනන්ද තෙරණුවෝයයි" කීය.

ඉක්බිති පසෙනදි කොසොල් රජතෙමේ අනික් පුරුෂයෙකු කැඳවී. "එම්බා පුරුෂය, මෙහි එව, නුඹ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම් තෙනකද, එහි පැමිණ මාගේ

වචනයෙන් 'ස්වාමීනි, පසෙනදි කොසොල් රජතෙමේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ගේ පාදයන් සිරසින් වඳියි'. කියා ආයුෂ්මත් ආනන්ද තෙරුන්ගේ පාදයන් සිරසින් වඳුව මෙසේද කියව්.

"ස්වාමීන් වහන්ස, ඉදින් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට කිසි ඉක්මන් කටයුත්තෙක් නොවේනම්, ස්වාමීනි, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ අනුකම්පා කොට මොහොතක් බලාපොරොත්තු වනසේක්වායිද කියන්නේය' යනුයි.

"දෙවයෙනි, එසේය" කියා ඒ පුරුෂතෙම පසෙනදි කොසොල් රජහට උත්තරදී ආයුෂ්මත් ආනන්ද ස්ථවිරතෙම යම් තෙනෙක්හිද, එහි පැමිණ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වැඳ එක් පසෙක්හි සිටියේය. එක් පසෙක සිටි ඒ පුරුෂතෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට "ස්වාමීනි වහන්ස, පසෙනදි කොසොල් රජතෙමේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් පාදයන් සිරසින් වඳියි.

"මෙසේද කියයි. 'ස්වාමීන් වහන්ස, ඉදින් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට කිසිත් ඉක්මන් කටයුත්තක් නොවෙයි නම්, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ අනුකම්පාකොට මොහොතක් බලාපොරොත්තු වෙන සේක්වා, යනුයි" ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ තුෂ්ණීම් භාවයෙන් ඉවසූහ.

3. ඉක්බිති පසෙනදි කොසොල් රජතෙමේ ඇතුපිටින් යාමට සුදුසු තැන් දක්වා ඇතුපිටින් ගොස් ඇතුපිටින් බැස පයින්ම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම් තෙනකද එහි පැමිණියේය. පැමිණ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වැඳ එක් පසෙක සිටියේය. එක් පසෙක සිටි පසෙනදි කොසොල් රජතෙමේ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට "ස්වාමීන් වහන්ස, ඉදින් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට කිසි ඉක්මන් කටයුත්තෙක් නොවේ නම් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ අනුකම්පා කොට අචිරවතී ගංතෙර යම් තෙනකද එහි වඩිනු මැනවයි' කීය. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ තුෂ්ණීම් භාවයෙන් ඉවසී.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. 

**4.** අනතුරුව ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ අචිරවතී ගංතෙර යම් තෙනකද එහි පැමිණ ගසක් මුල පැනවූ අස්නෙහි හිඳගත්හ. එවිට පසෙනදි කොසොල් රජතෙම ඇතුපිටින් යාමට සුදුසු තැන් දක්වා ඇතු පිටින් ගොස් ඇතු පිටින් බැස පයින්ම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ යම් තෙනකද එහි පැමිණියේය. පැමිණ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වැඳ එක් පසෙක සිටියේය. එක් පසෙක සිටියාවූ පසෙනදි කොසොල්රජ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට 'ස්වාමීනි, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ ඇතුපිට එලන පලසෙහි හිඳිනා සේක්වායි" (කීයේය) මහරජ, කම්නැත ඔබ හිඳිනු මැනවි, මාගේ අස්නෙහි හුන්නේ වෙමියි" (කීහ) පසේනදී කොසොල් රජ පණවනලද අස්නෙහි හුන්නේය. හිඳගත් පසෙනදි කොසොල් රජ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට මෙසේ කීය.

**5.** "ස්වාමීනි, ආනන්ද ස්ථවිරයන් වහන්ස, නුවණ ඇති මහණ බමුණන් විසින් දොස් කීමට සුදුසුවූ යම් කාය සමාචාරයක් (කයේ පැවැත්මක්) වේද, එබඳු කාය සමාචාරය ඒ භාග්‍යවතුන් වහන්සේ පවත්වන්නේදැයි" ඇසී. "මහරජ, නුවණ ඇති මහණ බමුණන් විසින් දොස්කීමට සුදුසුවූ යම් කාය සමාචාරයෙක් වේද, එබඳු කාය සමාචාරයක් ඒ භාග්‍යවතුන් වහන්සේ නොපවත්නාහයි" කීය.

"ස්වාමීනි, ආනන්ද ස්ථවිරයන් වහන්ස, නුවණ ඇති, මහණ බමුණන් විසින් යම් වාක්සමාචාරයක් දොෂාරොපණයට සුදුසු වේද, එබඳුවූ, වාග්සමාචාරය ඒ භාග්‍යවතුන් වහන්සේ කීම කරන්නේදැයි" (ඇසීය.)"මහරජ, යම් වාක්සමාචාරයක් නුවණ ඇති, මහණ බමුණන් විසින් දොෂාරොපණය කළ යුත්තේද, එබඳුවූ, වාක්සමාචාරයෙක්හි ඒ භාග්‍යවතුන් වහන්සේ නොම හැසිරෙයි."

"ස්වාමීනි, ආනන්ද ස්ථවිරයන් වහන්ස, නුවණ ඇති මහණ බමුණන් විසින් යම් මනොසමාචාරයක් දොෂාරොපණයට සුදුසු වේද, එබඳුවූ මනොසමාචාරය ඒ භාග්‍යවතුන් වහන්සේ කිම

කරන්නේදැයි?" (ඇසීය.) "මහරජ, යම් මනොසමාචාරයක් නුවණ ඇති මහණ බමුණන් විසින් දොෂාරොපණය කරන ලද්දේද, එබඳුවූ, මනොසමාචාරයෙක්හි ඒ භාග්‍යවතුන් වහන්සේ නොම හැසිරෙයි."

"ස්වාමීනි, ආශ්චර්යයය, ස්වාමීනි පුදුමයි. ස්වාමීනි යම්වචනයක් ශ්‍රමණයන් යන වචනය හා යොදා සම්පූර්ණ කිරීමට අපට නොහැකිවීද? ස්වාමීනි, නුවණැති යන ඒ වචනය ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් විසින් ප්‍රශ්න විසඳීමේදී සම්පූර්ණ කරණ ලදී.

**6.** ස්වාමීනි, යම් අදක්ෂ නුවණැති කෙනෙක් නුවණින් නොවිමසා තීරණයකට නොබැස අනුන්ගේ ගුණ හෝ අගුණ කියද්ද? අපි ඒ කීම් සාරවසයෙන් නොපිළිගණිමු. ස්වාමීනි, පණ්ඩිතවූ දක්ෂවූ නුවණැති යම් ඒ කෙනෙක් නුවණින් විමසා තීරණයට බැස අනුන්ගේ ගුණ හෝ අගුණ හෝ කියද්ද? ඒ කීම අපි සාර වසයෙන් පිළිගණිමු.

"ස්වාමීනි, ආනන්ද ස්ථවිරයෙනි, නුවණ ඇති මහණ බමුණන් විසින් දොස් නැගිය යුතු කාය සමාචාරය (කය පිළිබඳ පැවැත්ම) කවරේද?" "මහරජ, යම් කායික පැවැත්මක් අකුසල් නම් එයයි." "ස්වාමීනි කිනම්, කායික පැවැත්මක් අකුසල්ද?" "මහරජ, යම් කායික පැවැත්මක් වරද සහිත නම් එයයි." "ස්වාමීනි, වරද සහිත කායික පවැත්ම නම් කවරේද?" "මහරජ, යම් ඒ කායික පැවැත්මක් දුක් සහිත නම් එයයි" "ස්වාමීනි, දුක් සහිත කායික පැවැත්මනම් කවරේද?" "මහරජ යම් කායික පැවැත්මක් දුක්වූ විපාක ඇත්නම් එයයි." "ස්වාමීනි, දුක් විපාක ඇති කායික පැවැත්ම නම් කවරේද?"

"මහරජ, යම් කයේ පැවැත්මක් වනාහි තමා පෙළීම පිණිසත් පවතීද, අනුන් පෙළීම පිණිසත් පවතීද, තමා අනුන් යන දෙදෙනම පෙළීම පිණිසත් පවතීද, ඔහුගේ අකුශල ධර්මයෝ වැඩෙති. කුශල ධර්ම පිරිහෙති. මහරජ මෙබඳු කායික පැවැත්ම වනාහි නුවණැති මහණ බමුණන් විසින් දොස් නැගිය යුත්තේ වෙයි."

7. "ස්වාමීනි, ආනන්ද ස්ථවිරයෙනි, නුවණැති මහණ බමුණන් විසින් දොස් කිය යුතු වාග්සමාචාරය (වචනයේ පැවැත්ම) කවරේද?" "මහරජ, යම් වාග්සමාචාරයක් අකුසල් ද එයයි." "ස්වාමීනි, අකුසල වාග්සමාචාරය කවරේද?" "මහරජ, යම් වාග්සමාචාරයක් වරද සහිත නම් එයයි." "ස්වාමීනි, වරද සහිත වාග්සමාචාරය කවරේද?" "මහරජ, යම් වාග්සමාචාරයක් දුක් සහිතද එයයි." "ස්වාමීනි, දුක් සහිත වාග්සමාචාරය කවරේද?" "මහරජ, යම් වාග්සමාචාරයක් දුක් විපාක ඇත්තේද එයයි." "ස්වාමීනි, දුක් විපාක ඇති වාග්සමාචාරය කවරේද?" "මහරජ, යම් වාග්සමාචාරයක් වනාහි තමා පෙළීම පිණිසත් පවතීද, අනුන් පෙළීම පිණිසත් පවතීද, තමා හා අනුන් යන දෙපසම පෙළීම පිණිසත් පවතීද, ඒ දුක් විපාක ඇති වාග්සමාචාරය ඇත්තාහට අකුශල ධර්ම වැඩෙති. කුශල ධර්ම පිරිහෙති. මහරජ, මෙබඳු වාග්සමාචාරය වනාහි නුවණැති මහණ බමුණන් විසින් දොස් නගන ලද්දේ වෙයි."

8. "ස්වාමීනි, ආනන්ද ස්ථවිරයන් වහන්ස, නුවණ ඇති මහණ බමුණන් විසින් දොස් නැගිය යුතු." මනොසමාචාරය (සිතේ පැවැත්ම) කවරේද? "මහරජ, යම් ඒ මානසික පැවැත්මක් අකුසල් නම්, එයයි. "ස්වාමීනි, අකුසල මනොසමාචාරය කවරේද?" "මහරජ, යම් ඒ මානසික පැවැත්මක් වරද සහිත නම් එයයි".

"ස්වාමීනි, වරද සහිත මනොසමාචාරය (සිතේ පැවැත්ම) කවරේද?" "මහරජ, යම් මනොසමාචාරයක් දුක් සහිත නම් එයයි." "ස්වාමීනි, දුක් සහිතවූ මනොසමාචාරය කවරේද?" "මහරජ, යම් මනොසමාචාරයක් දුක්වූ විපාක ඇත්තේ නම් එයයි." "ස්වාමීනි, දුක් විපාක ඇති මනොසමාචාරය කවරේද?

"මහරජ, යම් මනොසමාචාරයෙක් තමා පෙළීම පිණිස පවතීද, අනුන් පෙළීම පිණිස පවතීද, තමාත් අනුනුත් පෙළීම පිණිස පවතීද, ඒ මනොසමාචාරයෙන් යුක්තවූවහුට අකුශල ධර්මයෝ වැඩෙති. කුශල ධර්මයෝ පිරිහෙති. මහරජ, මෙබඳු

කායසමාචාරය, නුවණැති මහණ බමුණන් විසින් දොස් කීමට සුදුසු වෙයි."

**9.** "ස්වාමීනි, ආනන්ද ස්ථවිරයෙනි, කිමෙක්ද? ඒ භාග්‍යවතුන් වහන්සේ, සියලුම අකුශල ධර්මයන්ගේ පහකිරීම වර්ණනා කෙරේදැයි" (ඇසී). "මහරජ, තථාගතයන් වහන්සේ සියලු අකුශල ධර්මයන් පහකළ කෙනෙක. සියලු කුශල ධර්මයන්ගේ යුක්තවූ කෙනෙක.

"ස්වාමීනි, ආනන්ද ස්ථවිරයෙනි, නුවණැති මහණ බමුණන් විසින් දොස් නොකියයුතු කායසමාචාරය කවරේද?" "මහරජ යම් කායසමාචාරයෙක් කුශල් නම් එයයි.' "ස්වාමීනි, කුශල්වූ කායසමාචාරය කවරේද?" "මහරජ, යම් කායසමාචාරයෙක් වරද නොවේනම් එයයි." "ස්වාමීනි, වරද නැති කායසමාචාරය කවරේද?" "මහරජ, යම් කායසමාචාරයෙක් දුක් රහිත නම් එයයි." "ස්වාමීනි, දුක් නැති කායසමාචාරය කවරේද?" "මහරජ, යම් කායසමාචාරයෙක් සැප විපාක ඇත්තේ නම් එයයි." "ස්වාමීනි, සැප විපාක ඇති කායසමාචාරය කවරේද?"

"මහරජ, යම් ඒ කායසමාචාරයෙක් තමාපෙළීම පිණිසත් නොපවතීද, අනුන් පෙළීම පිණිසත් නොපවතීද තමාත් අනුනුත් පෙළීම පිණිසත් නොපවතීද, ඔහුගේ අකුශල ධර්ම පිරිහෙති. කුශල ධර්ම වැඩෙති. මහරජ, මෙබඳු කායසමාචාරය වනාහි නැණවත් මහණ බමුණන් විසින් දොස් නොකිය යුත්තේ වෙයි."

**10.** "ස්වාමීනි, ආනන්ද ස්ථවිරයෙනි, නුවණැති මහණ බමුණන් විසින් දොස් නොකියයුතු වාග්සමාචාරය කවරේද?" "මහරජ, යම් වාග්සමාචාරයක් කුසල්ද එයයි". "ස්වාමීනි, කුශල වාග්සමාචාරය කවරේද?" "මහරජ, යම් වාග්සමාචාරයක් වරද රහිත නම් එයයි". "ස්වාමීනි, වරද රහිත වාග්සමාචාරය කවරේද?" "මහරජ, යම් වාග්සමාචාරයක් දුක් රහිතද එයයි." "ස්වාමීනි, දුක් රහිත වාග්සමාචාරය කවරේද?" "මහරජ, යම් වාග්සමාචාරයක් සැප විපාක ඇත්තේද එයයි." "ස්වාමීනි, සැප විපාක ඇති වාග්සමාචාරය කවරේද?" "මහරජ, යම්

වාග්සමාචාරයක් තමා පෙළීම පිණිස නොපවතීද, අනුන් පෙළීම පිණිසත් නොවතීද, තමා හා අනුන් යන දෙපසම පෙළීම පිණිසත් නොපවතීද, ඒ සැප විපාක ඇති වාග්සමාචාරය ඇත්තාහට කුශල ධර්මයෝ වැඩෙති. අකුශල ධර්මයෝ පිරිහෙති. මහරජ, මෙබඳු වාග්සමාචාරය වනාහි නුවණ ඇති මහණ බමුණන් විසින් දොස් නොකිය යුත්තේ වෙයි."

11. "ස්වාමීනි, ආනන්ද ස්ථවිරයන් වහන්ස, නුවණ ඇති මහණබමුණන් විසින් දොස් නොකිය යුතු මනොසමාචාරය කවරේදැයි" (ඇසී)

"මහරජ, යම් මනොසමාචාරයක් කුශල් නම් එයයි." "ස්වාමීනි, කුශල මනොසමාචාරය කවරේද?" "මහරජ යම් මනොසමාචාරයෙක් නිවරද නම් එයයි." "ස්වාමීනි, නිවරද මනොසමාචාරය කවරේද?" "මහරජ, යම් මනොසමාචාරයෙක් දුක් රහිත නම් එයයි." "ස්වාමීනි, දුක් රහිත මනොසමාචාරය කවරේද?" "මහරජ, යම් මනොසමාචාරයෙක් සැප විපාක ඇත්තේ නම් එයයි." "ස්වාමීනි, සැප විපාක ඇති මනොසමාචාරය කවරේද?"

මහරජ! යම් ඒ මනොසමාචාරයෙන් තමා පෙළීම පිණිසද නොපවතී නම්, අනුන් පෙළීම පිණිසද නොපවතී නම්, තමාත් අනුනුත් පෙළීම පිණිසද නොපවතී නම්,ඒ පුද්ගලයාගේ අකුශල ධර්මයෝ පිරිහෙති. කුශල ධර්මයෝ වැඩෙති. මහරජ, මෙබඳු මනොසමාචාරය වනාහි නුවණැති මහණබමුණන් විසින් දොෂාරෝපණය නොකළ යුත්තේ වෙයි.

12. කිමෙක්ද ස්වාමීනි, ආනන්ද ස්ථවිරයෙනි, ඒ භාග්‍යවතුන් වහන්සේ සියලුම කුශලධර්මයන්ගේ වැඩීම වර්ණනා කෙරේද?" "මහරජ! තථාගතයන් වහන්සේ සියලු අකුශල ධර්ම ප්‍රහීණ කෙළේ කුශල ධර්මයන්ගෙන් යුක්තවූයයි" කීය.

"ස්වාමීනි, ආශ්චර්යයි, ස්වාමීනි පුදුමයි. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් විසින් මේ කාරණය කොතරම් යහපත්ව කියන

ලද්දේදයත්, ස්වාමීනි, ආනන්ද ස්ථවිරයන්ගේ මේ යහපත් කීමෙන් අපි සතුට ප්‍රකාශකරන්නෝ වෙමු. ස්වාමීනි ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ගේ යහපත් කීමෙන් අපි මෙසේ සතුට ප්‍රකාශකරන්නෝ වෙමු.

13. "ඉදින් වහන්ස, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ හට හස්ති රත්නයක් කැපවන්නේ නම්, අපි හස්ති රත්නය කුදු ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ හට දෙන්නෙමු. ඉදින් ස්වාමීනි, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේහට අශ්ව රත්නයක් කැපවන්නේනම්, අපි අශ්ව රත්නයකුදු ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට දෙන්නෙමු. ඉදින් ස්වාමීනි, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේහට ගම්වරක් කැප වන්නේ නම් අපි ගම්වරයකුදු ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේහට දෙන්නෙමු.

"ස්වාමීනි, එසේ නමුදු ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේහට මේ අකැපය කියා අපිම ඒ කාරණය දනිමු.

"ස්වාමීනි, දිගින් සොළොස් රියනක්ද, පළලින් අටරියනක්ද, වූ බාහිත රටෙහි උපන් මේ වස්ත්‍රය වෙදෙහි පුත් මගධරට අජාසත් රජ විසින් මට දෙන ලද්දකි.

"ඒ වස්ත්‍රය ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ අනුකම්පා කොට පිළිගන්නා සේක්වායි" කීය. "මහරජ කම්නැත. මාගේ තුන්සිවුර සම්පූර්ණයයි" කීය.

"ස්වාමීනි, මේ අචිරවතී ගංගාව ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ විසින්ද දක්නා ලද්දීය. යම් දවසක පර්වත මුදුනෙහි මහා වැස්ස මොනවට වසීද, එවිට මේ අචිරවතී නදිය දෙපස ඉවුරුමනාව උතුරවන්නී ගලා බසියි.

"ස්වාමීනි, එමෙන්ම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ මේ බාහිත රටෙහි උපන් වස්ත්‍රයෙන් තමාට තුන් සිවුරක් කරන්නේය. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ගේ යම් පලමු තුන් සිවුරක්වේද, එය සබ්‍රම්සරුන් අතර බෙදන්නෝය. එසේකල

අපගේ මේ දානය උතුරා ගලායන්නේයයි සිතමි. ස්වාමීනි, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් බාහිත රටෙහිවූ වස්ත්‍රය පිළිගන්නා සේක්වායි" කීය.

14. ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ බාහිතරට උපන් වස්ත්‍රය පිළිගත්හ. ඉක්බිති පසෙනදි කොසොල් රජ තෙම ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට මෙසේ කීය.

"ස්වාමීනි ආනන්ද ස්ථවිරයෙනි, දැන් අපි යන්නෙමු. අපි බොහෝ කටයුතු ඇති කටයුතු බහුලවූවෝ වෙමුයි" කීය. 'මහරජ, ඔබ දැන් යමක් සිතයි නම් ඊට කාලයයි" (කීහ.)

ඉක්බිති පසෙනදි කොසොල් රජ ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේගේ වචනයට සතුටුව අනුමෝදන්ව ආසනයෙන් නැගිට ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වැඳ පැදකුණු කොට පිටත්ව ගියේය.

15. ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ පසෙනදි කොසොල් රජ පිටත්ව ගිය නොබෝ කල් ඇත්තේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එහි පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පසෙක හිඳගත්හ. එක් පසෙක හුන් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ පසෙනදි කොසොල් රජු සමග යම් පමණ කථාවක් වීද, ඒ සියල්ල භාග්‍යවතුන් වහන්සේහට දැන්වී. ඒ බාහිත රට වස්ත්‍රයද භාග්‍යවතුන් වහන්සේහට පිදීය.

ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට කථාකොට මහණෙනි, මේ පසෙනදි කොසොල් රජ විසින් ආනන්දයන්ගේ දැකීම ආනන්දයන්ගේ අගය පසෙනදි කොසොල් රජහට ලාභයෙක. පසෙනදි කොසොල් රජහට මහත් ලාභයෙකැයි භාග්‍යවතුන් වහන්සේ වදාළහ. සතුටුවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටුවූහ.

බාහිතික සූත්‍රය නිමි (4-8)

---

## 39. ධම්මචෙතිය සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ ශාක්‍යජනපදයෙහි මෙකලුපනම් නියම් ගම වැඩ වෙසෙති. එකල්හි පසෙනදි කොසොල්රජ කිසියම් කටයුත්තක් සඳහා නගරක් නම් නියම් ගමට පැමිණියේ වෙයි. ඉක්බිති කොසොල් රජ දීඝකාරායණ නම් සේනාපතියාට කථාකළේය. "මිත්‍ර කාරායණ, යහපත් යහපත් යානාවන් පිළියෙල කරව්. උයන් සිරි දකිනු පිණිස උයනට යමුයි කීය.

"දෙවයන් වහන්ස, එසේයයි" දීඝකාරායණතෙම පසෙනදි කොසොල් රජහට උත්තරදී, යහපත් යහපත් යානාවන් පිළියෙලකොට පසෙනදි කොසොල් රජහට "දෙවයන් වහන්ස, යහපත් යහපත් යානා පිළියෙල කරන ලදහ. ඔබ වහන්සේ යමක් අදහස් කෙරේනම් දැන් ඊට කාලයයි දැන්වීය. එවිට පසෙනදි කොසොල් රජ යහපත් යානාවකට නැග යහපත් යහපත් යානාවන්ගෙන් යුක්තව මහත් රාජානුභාවයෙන් නගරයෙන් පිටත්ව (උයන) යම් තෙනෙක්හිද එහි ගියේය. යානාවෙන් යා හැකි තැන දක්වා යානාවෙන් ගොස් යානාවෙන් බැස පයින්ම උයනට ඇතුල්විය.

2. උයනෙහි පයින්ම ඇවිද යන්නාවූ ගමන් කරන්නාවූ පසෙනදි කොසොල් රජ දැකීමට ප්‍රිය සිත සතුටු කරන නිශ්ශබ්දවූ ඝොෂා නැති ජනවාතයෙන් (මිනිසුන් කෙරෙන් නටන වාතයෙන්) පහව ගිය රහස්කුමන්ත්‍රණ වලට සුදුසු විවේකයට යොග්‍ය ගස්මුල් දිටීය. දැක භාග්‍යවතුන් වහන්සේ අරභයාම සිහි උපන. දැකීමට ප්‍රිය පැහැදීම ඇති කරණ නිශ්ශබ්දවූ ඝොෂා රහිත ජනවාතයෙන් පහවගිය රහස් කුමන්ත්‍රණවල සුදුසු විවේකයට සුදුසු මේ ගස්මුල් වෙති, මෙවැනි තන්හිදී අපි අර්හත් සම්‍යක් සම්බුද්ධවූ ඒ භාග්‍යවතුන් වහන්සේ ඇසුරු කරමුයි සිතී. ඉක්බිති පසේනදී කොසොල් රජ දීඝකාරායණට කථා කෙළේය. "යහළු කාරායණය දැකීමට ප්‍රිය සිත් පහදවන ශබ්ද රහිත ඝොෂානැති මිනිස් වාතයෙන් පහවූ මිනිසුගේ රහස් කීමට සුදුසු විවේකයට යොග්‍යවූ ඒ මේ රුක්මුල් වෙති. මෙවැනි

තන්හිදී අපි ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ ඇසුරු කරමුයි" (කීහ)

3. "යහලු කාරායණය, දැන් ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදුන් කොහි වැඩ වෙසෙත්දැයි" ඇසී, "මහරජ, මෙකලුප නම් ශාක්‍යයන්ගේ නියම් ගමෙක් වෙයි.

"ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ දැන් එහි වැඩ වෙසෙතියි, කීය. "යහලු කාරායණය, මෙකලුප නම් ශාක්‍යයන්ගේ නියම්ගම මෙහි සිට කෙතෙක් දුරෙහි දැයි" ඇසී. "මහරජ, දුරෙහි නොවෙයි. තුන්යොදුනකි. ඉතිරි දවල්කාලයෙන් පැමිණීමට හැකියයි" කීය. "යහළු කාරායණය, එසේනම් යහපත් යහපත් යානාවන් පිළියෙල කරව. ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ දකිණ පිණිස අපි යමුයිකීය." "දෙවයන් වහන්ස, එසේයයි දීඝකාරායණ තෙම පසෙනදි කොසොල් රජුට උත්තරදී, යහපත් යහපත් යානාවන් පිළියෙල කොට පසෙනදී කොසොල්රජුට "දෙවයන් වහන්ස, ඔබට යහපත් යහපත් යානාවෝ පිළියෙල කරණලදහ. යමක් පිණිස අදහස් කෙරෙහිනම් දැන් කාලය සුදුසුය" කියා දැන්වී.

4. ඉක්බිති පසෙනදි කොසොල් රජ යහපත් යානාවකට නැග යහපත් යහපත් යානාවන් විසින් පිරිවරණ ලදුව නගරම නම් නියම් ගමින් පිටත්ව ගොස් ශාක්‍යයන්ගේ මෙකලුපනම් නියම් ගම් යම් තෙනකද, දවල් කාලයේම ඒ ශාක්‍යයන්ගේ මෙකලුපනම් නියම්ගමට පැමිණ ආරාමය යම් තෙනෙක්හිද, එහි ගොස් යානාවෙන් යාහැකි තැන්දක්වා යානාවෙන් ගොස් යානාවෙන් බැස පයින්ම ආරාමයට පැමිණියේය.

එකල්හි බොහෝ භික්ෂූහු එළිමහනෙහි සක්මන් කෙරෙති. එවිට පසෙනදී කොසොල් රජ ඒ භික්ෂූහු යම් තෙනකද, එහි පැමිණ ඒ භික්ෂූන්ට "ස්වාමීනි, ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ දැන් කොහි වෙසෙත්ද, අපි ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ දකිනු කැමැත්තෙමුයි" කීය.

"මහරජ, ඒ දොර වසා තිබෙන්නේ විහාරයයි. නිශ්ශබ්දව එහි පැමිණ සෙමින් ආලින්දයට (පිලට) ඇතුල්ව කාරා දොර අගුල සමීපයට තට්ටු කරව. භාග්‍යවතුන් වහන්සේ ඔබට දොර අරිතියි" කීහ. ඉක්බිති පසෙනදි කොසොල් රජ කඩුවද, නලල් පටද, එහිදීම දීඝකාරායණහට දුන්නේය.

**5.** ඉක්බිති දීඝකාරායනහට මෙසේ සිත්විය. 'මහරජතෙම දැන් ශ්‍රමණ ගෞතමයන් සමග රහස් කියයි. එහෙයින් දැන් මා විසින් මෙහිම සිටිය යුතු වෙයි, කියායි. ඉක්බිති පසෙනදි රජ වසනලද දොර ඇති ඒ විහාරය යම් තෙනකද, එහි නිශ්ශබ්දව ගොස් සෙමින් පිලට ඇතුල්ව කාරා අගුල සමීපයට තට්ටු කෙළේය. භාග්‍යවතුන් වහන්සේ දොර ඇරිසේක. එවිට පසෙනදි කොසොල් රජ විහාරයට ඇතුල්ව භාග්‍යවතුන් වහන්සේගේ පා ලඟ හිස තබා මුඛයෙන් පා සිඹීමද කරයි. දෙඅතින් පිරිමැදීමද කරයි. 'ස්වාමීනි, මම පසෙනදි කොසොල් රජ වෙමි." කියා නමද කියයි.

"මහරජ, නුඹ කෙබඳුවූ අර්ථයක් දක්නේ නම් ශරීරයට මෙතරම් බලවත් ගෞරවයක් කෙරෙහිද, බුහුමන් කිරීමක් දක්වන්නෙහිදැයි" ඇසූහ. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධය, භාග්‍යවතුන් වහන්සේ විසින් වදාළ ධර්මය ස්වාක්ඛ්‍යාය (මනාකොට දෙශනා කරන ලද්දකි.) භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක සංඝතෙමේ සුප්‍රතිපන්නය (මනා කොට පිළිපදින ලද්දේය.) කියා භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පවත්නා අනුබුද්ධියෙක් ඇත්තේ (කාරණයන්ට අනුව දැනීමක්) යයි" කීය.

**6.** "ස්වාමීනි, මම මෙහි ඇතැම් මහණ බමුණන් දකිමි. ඔවුහු දසවසක් හෝ විසිවසක් හෝ තිස්වසක් හෝ හතළිස් වසක් හෝ සීමාකොට බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙති. පසුකලෙක ඔවුහු මොනවට නෑවාහු, මොනවට සුවඳ විලවුන් ඇඟ ගැල්වූවාහු, අන්දම් තබා සැරසූ කෙස් රැවුල් ඇත්තෝව, පස්කම් ගුණ වලින් යුක්තව ඉඳුරන් පිනවන්නාහ. ස්වාමීනි, මම මේ ශාසනයෙහි දිවිතෙක් මරණය දක්වා සම්පූර්ණ පිරිසිදු බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙන ශ්‍රාවකයන් දකියි. ස්වාමීනි, මම මේ

ශාසනයෙන් පිට මෙසේ සම්පූර්ණවූද පිරිසිදු, අනික් බ්‍රහ්මචරියාවක් නොම දකිමි. ස්වාමීනි, මේද භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධය, ධර්මය භාග්‍යවතුන් වහන්සේ විසින් මොනවට දෙශිතය. සංඝ තෙමේ සුප්‍රතිපන්නිය කියා භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මාගේ කාරණානුකූල වශයෙන් දැනීමක් වෙයි.

7. "ස්වාමීනි, නැවත අන් කරුණක් (කියමි) රජහුද රජුන් සමග කලහ කෙරෙති. ක්ෂත්‍රියෝද, ක්ෂත්‍රියන් සමග කලහ කෙරෙති. බමුණෝද, බමුණන් සමග කළහ කෙරෙති. ගෘහපතියෝද, ගෘහපතියන් සමග කලහ කෙරෙති. මව්ද පුතා සමග කලහ කෙරෙති. පුතාද මව් සමග කලහ කෙරෙයි. පියාද පුතු සමග කලහ කෙරෙයි. පුතාද, පියා සමග කලහ කෙරෙයි. සොහොයුරාද සොහොයුරා සමග කලහ කෙරෙයි. සොහොයුරාද සොහොයුරිය සමග කලහ කෙරෙයි. සොහොයුරීද සොහොයුරා සමග කලහ කෙරෙයි. මිත්‍රතෙමේද මිත්‍රයා සමග කලහකෙරෙයි. ස්වාමීනි, මම මේ සස්නෙහි භික්ෂූන් දකියි. සමගිව සතුටුව කලහ රහිතව කිරිත් වතුරත් මෙන් එක්වුවාහු ඔවුනොවුන් ප්‍රිය මුහුණින් බලන්නෝව වෙසෙති. ස්වාමීනි, මම මේ ශාසනයෙන් පිටත මෙලෙස සමගිවූ අන් පිරිසක් නොම දකිමි. ස්වාමීනි, මේද භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධය, භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාව දෙශිතය, සංඝතෙමේ සුප්‍රතිපන්නය කියා භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මාගේ කාරණානු කූල වශයෙන් දැනීමක්වේ.

8. "ස්වාමීනි, නැවතද අනිකක් කියමි. මම ආරාමයෙන් ආරාමයට උයනෙන් උයනට පිළිවෙළින් යෙමි. ගමන් කරන්නෙමි. එහිදී මම වැහැරුණ රළුවූ ඉතා අවලක්ෂණ හටගත් පඬු පැහැති නහර ඉල්පුන ශරීර ඇති, දැකීමට මිනිසුන්ගේ ඇස් බැඳ නොගන්නාක් වැනිවූ සමහර මහණ බමුණන් දකිමි.

"ස්වාමීනි, එසේ දක්නා මට ඒකාන්තයෙන් මේ ආයුෂ්මත්හු ඇලීමක් නැතිව හෝ බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙති. ඔවුන් විසින් රහසිගතව කරණලද කිසි පාප කර්මයක් හෝ ඇත. එහෙයින්

මේ ආයුෂ්මත්හු වැහැරුණාවූ රළු වූවාහු අවලක්ෂණ වෙති. හටගත් පඬු පැහැ ඇති නහර ඉල්පුනා ශරීර ඇත්තෝව දැකීමට මිනිසුන්ගේ ඇස් නොබැඳ ගන්නාක් වැනි වෙති. මම ඔවුන් වෙත පැමිණ මෙසේ කියමි. කිමෙක්ද? ආයුෂ්මත්නි, නුඹ වහන්සේලා කාශවූවාහු රළුශරීර ඇත්තාහු, අවලක්ෂණ වූවාහු හටගත් පඬුපැහැ ඇති නහර ඉල්පුන ශරීර ඇතිව දැකීමට මිනිසුන්ගේ ඇස් නොබැඳ ගත්තාක් වැනි වත්ද? කියායි" "මහරජ, අපහට කුලරෝගයක් (පරම්පරාගත රෝගයක්) ඇත්තේයයි කීහ". "ස්වාමීනි, මම මේ ශාසනයෙහි ශ්‍රාවකයෝ සතුටුව ඔද වැඩි වැඩී සිත් ඇතිව, මනාව ඇලුන ස්වභාව ඇති, පිනාගිය ඉඳුරන් ඇතිව, කටයුතු බහුල නැතිව, අහංකාර නැතිව, අනුන්දෙන දෙයින් යැපෙමින් මුවන්ට සමාන සිත් ඇතිව වාසය කරති.

"ස්වාමීනි, මට මේ කරුණෙහි මෙබඳු සිතක් වෙයි. ඒකාන්තයෙන් මේ ආයුෂ්මත්හු ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශාසනයෙහි පළමුවද, පසුවද දතයුතුවූ විශෙෂයන් දනිත්. එහෙයින් මේ ආයුෂ්මත්හු සතුටුව ඔද වැඩි සිත් ඇතිව, මානව ඇලුන ස්වභාව ඇතිව, පිනාගිය ඉඳුරන් ඇතිව, වැඩ කටයුතු නැතිව, අහංකාර නොව අනුන් අයත් පැවතුම් ඇතිව, මුවන්ට බඳු සිතින් යුක්තව වෙසෙතිය කියාය.

"ස්වාමීනි, මේද භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධය, භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාව ප්‍රකාශ කරණ ලද්දේ සංඝතෙමේ සුප්‍රතිපන්නය කියා භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මාගේ කාරණානු කූල දැකීමක් වෙයි.

**9.** "ස්වාමීනි, නැවත අනිකක්ද කියමි. ඔටුණු පැළඳි ක්ෂත්‍රිය රජෙක්වූ මම මේ නැසිය යුත්තෙක. නැසීමට හෝ නිලධරාදියෙන් පහකළ යුත්තෙකු පහකිරීම හෝ රටින් නෙරපිය යුත්තෙකු නෙරපීමට හෝ හැකිවෙමි.

"ස්වාමීනි, විනිශ්චයාසනයෙහි හුන්නාවූ ඒ මටද අතරතුර කතා හෙලති, හෙවත් අතරෙන් කතා කරත. පින්වත්හු

විනිශ්චයෙහි හුන් මට අතරතුර කතා නොකරව්. ‘පින්වත්හු කතාවේ අවසානය බලාපොරොත්තු වව’ කියාද ඔවුන් නැවැත්වීමට නොහැකි වෙමි. ස්වාමීනි, ඒ මට අතරින් අතර කතා කෙරෙති.

“ස්වාමීනි. මම මේ සාසනයෙහි භික්ෂූන් දකිමි. යම්කලෙක භාග්‍යවතුන් වහන්සේ නොයෙක් සියගණන් පිරිසෙහි දහම් දෙසත්ද, එකල්හි භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවකයන් කිඹිසින ශබ්දයක් හෝ කාරන ශබ්දයක් හෝ නොවෙයි. ස්වාමීනි, පෙර දවසක වූ දෙයක් නම් භාග්‍යවතුන් වහන්සේ නොයෙක් සියගණන් පිරිස් මැද දහම් දෙසූහ. එහිදී භාග්‍යවතුන් වහන්සේගේ එක්තරා ශ්‍රාවකයෙක් කෑරීය. ඔහුට අන් භික්ෂුවක් ආයුෂ්මත් තෙමේ නිශ්ශබ්ද වේවා. ආයුෂ්මත් තෙමේ ශබ්ද නොකෙරේවා. භාග්‍යවත් ශාස්තෘන් වහන්සේ අපහට ධර්මය දෙශනා කරන්නාහුයයි, දනෙක් ගැටීය.

“ස්වාමීනි, එහිදී මට මේ සිතවිය. ‘පින්වත්නි, ඒකාන්තයෙන් ආශ්චර්ය පින්වත්නි, ඒකාන්තයෙන් පුදුමය පින්වත්නි, ඒකාන්තයෙන් දණ්ඩෙන් ආයුධයෙන් තොරව මෙතරම් හික්මුණු පිරිසක් වන්නේය, කියාය. ස්වාමීනි, මේ ශාසනයෙන් පිට මෙසේ හික්මුණු අන් පිරිසක් නොම දකිමි.

“භාග්‍යවතුන් වහන්ස, මේද භාග්‍යවත් තෙමේ සම්‍යක් සම්බුද්ධය, භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්මය මනාව දෙශිතය, සංඝතෙමේ සුප්‍රතිපන්නය, කියා භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මාගේ කාරණානුකූල දැනීමක් වෙයි.

10. “ස්වාමීනි, නැවත අනිකක්ද කියමි.මෙහි සියුම් නුවණ ඇති පුරුදු කළ අන්‍යවාද ඇති අස්ලොම් විදින්නාක් වැනි ස්වභාව ඇති තමන්ගේ නුවණින් අන්‍ය දෘෂ්ටීන් බිඳින්නෝ යයි සිතා සිටින ඇතැම් ක්ෂත්‍රිය පණ්ඩිතයෝ සිටිත්. ඔවුහු ශ්‍රමණ භවත් ගෞතම තෙමේ අසවල් ගමට හෝ නියම් ගමට හෝ පැමිණෙන්නේයයි අසත්. ඔවුහු අපි ශ්‍රමණ ගෞතමයන් කරා පැමිණ මේ ප්‍රශ්නය අසමු. මෙසේ අසනලද ශ්‍රමණ ගෞතම

තෙමේ මෙසේ විසඳන්නේය. මෙසේද අපි ඔහුට වාදය නගන්නෙමියි. ප්‍රශ්න පිළියෙල කරත්. ශ්‍රමණ භවත් ගෞතම තෙමේ අසවල් ගමට හෝ නියම් ගමට හෝ පැමිණියේයයි ඔවුහු අසත්. ඔව්හු භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එහි යත්. භාග්‍යවතුන් වහන්සේ ඔවුන් ධර්ම කථාවෙන් අවබොධ කරවත්. සමාදන් කරවයි. සිත් තියුණු කරවත්. පහදවත්. ධර්ම කථාවෙන් කරුණු දක්වනලද සමාදන් කරවනලද සිත් තියුණු කරනලද පහදවනලද ඔව්හු භාග්‍යවතුන් වහන්සේගෙන් ප්‍රශ්න නො අසත්. වාද නැගීමක් කෙසේ කරත්ද? ඒකාන්තයෙන් භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රාවක බවට පැමිණෙත්. ස්වාමීනි, මේද භාග්‍යවතුන් වහන්සේ සම්‍යක් සම්බුද්ධය, ධර්මය මනාව දෙශනා කරන ලදී. සංඝයා මනාව පිළිපදිනලදැයි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පවත්නා කාරණානුකූල දැනීමක් වෙයි.

11. "ස්වාමීනි, නැවතද අනිකක් කියමි. මෙහි සියුම් නුවණ ඇති පුරුදු කරනලද අන්‍යවාද ඇති තමන්ගේ නුවණින් වැරදි ලබ්ධීන් බිඳින්නේ යයි සිතා සිටින ඇතැම් බ්‍රාහ්මණ පණ්ඩිතයන්ද දකිමි. පින්වත් ශ්‍රමණ ගෞතමයෝ අසුවල් නම් ගමට හෝ නියම් ගමට හෝ පැමිණියෝයයි ඔවුහු අසති. ඔවුහු ප්‍රශ්න සකස් කෙරෙති. අපි ශ්‍රමණගෞතමයන් වෙත පැමිණ මේ ප්‍රශ්නය අසමු. අප විසින් මෙසේ විචාරණලද්දේ මෙසේ ප්‍රකාශ කරන්නේය. එසේ කල්හි අපි ඔහුට මෙසේ වාදය ආරොපනය කරමු. අප විසින් මෙසේද විචාරණ ලද්දේ මෙසේ ප්‍රකාශ කරන්නේය. එසේ කල්හිත් අපි ඔහුට වාදාරොපනය කරමු" (කියායි)

"පින්වත් ශ්‍රමණ ගෞතම තෙමේ අසුවල් ගමට හෝ නියම්ගමට හෝ පැමිණියෝයයි ඔවුහු අසති. ඔවුහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එහි පැමිණෙති. භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට ධර්මකථාවෙන් කරුණු දක්වති, කරුණු ගන්වති, උනන්දු කරවති, සිත පහදවති. භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්ම කථාවෙන් කරුණු දක්වන ලද, සමාදන් කරවන ලද, උනන්දු කරවන ලද, සිත පහදවන ලද, ඔවුහු භාග්‍යවතුන්

වහන්සේගෙන් ප්‍රශ්නද නොම අසති. කොයින් වාදාරොපනය කරත්ද, හුදෙක් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවීම පිණිස භාග්‍යවතුන් වහන්සේගේ වෙතින් අවසර ඉල්ලති. භාග්‍යවතුන් වහන්සේ ඔවුන් පැවිදි කරවති. ඔවුහු එසේ පැවිදිවූවෝම තනිව වෙන්ව අප්‍රමාදව කෙලෙස් නසන වීර්ය ඇතිව අත්හරින ලද ආත්ම ආශාව ඇතිව වාසය කරන්නාහු නොබෝ දවසකින්ම, යම් අර්ථයක් පිණිස කුලපුත්‍රයෝ ගිහිගෙන් නික්ම ශාසනයෙහි මනාකොට පැවිදි වෙත්ද, මාර්ග බ්‍රහ්මචර්යාව අවසන්කොට ඇති ඒ උත්තම අර්හත් ඵලය මේ අත්බැව්හිම තෙමේ විශෙෂ ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වෙසෙති.

"ඔවුහු මෙසේ කීහ. 'පින්වත්නි, ඒකාන්තයෙන් අපි නැසුනෝ වෙමු. පින්වත්නි, අපි ඒකාන්තයෙන් වැනසුනෝ වෙමු. පෙර අපි වනාහි අශ්‍රමණ වූවෝම ශ්‍රමණ වෙමුයි ප්‍රකාශ කෙළෙමු. අබ්‍රාහ්මණ වූවෝම බ්‍රාහ්මණ වෙමුයි ප්‍රකාශ කෙළෙමු. රහත් නුවූවෝම රහත් වෙමුයි ප්‍රකාශ කෙළෙමු. දැන් වනාහි ශ්‍රමණ වෙමු, බ්‍රාහ්මණ වෙමු, රහතන් වෙමු, (කියායි). ස්වාමීනි මේද භාග්‍යවත් තෙම සම්‍යක්සම්බුද්ධය. භාග්‍යවතුන් විසින් ධර්මය මනාව දෙශනා කරන ලදී. සංඝ තෙමේ සුප්‍රතිපන්නයයි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මාගේ කාරණානුකූල දැනීමක් වෙයි.

12. "ස්වාමීනි, නැවතද අනිකක් කියමි. මෙහි සියුම් නුවණ ඇති පුරුදු කරණ ලද අන්‍ය වාද ඇති, තමන්ගේ නුවණින් වැරදි ලබ්ධින් බිඳින්නෝයයි සිතා සිටින ඇතැම් ගෘහපති පණ්ඩිතයන්ද දකිමි. පින්වත් ශ්‍රමණ ගෞතමයෝ අසුවල් නම් ගමට හෝ නියම්ගමට හෝ පැමිණෙන්නෝයයි ඔවුහු අසති. ඔවුහු ප්‍රශ්න සකස් කරති. අපි ශ්‍රමණ ගෞතමයන් වෙත පැමිණ මේ ප්‍රශ්නය අසමු. අපි විසින් මෙසේ විචාරන ලද්දේ මෙසේ ප්‍රකාශ කරන්නේය. එසේ කල්හි අපි ඔහුට මෙසේ වාදය නගමු. අප විසින් මෙසේද අසන ලද්දේ මෙසේ ප්‍රකාශ කරන්නේය. එසේ කල්හිත් අපි ඔහුට වාදය නගමු? (කියායි).

"පින්වත් ශ්‍රමණ ගෞතම තෙමේ අසුවල් ගමට හෝ නියම්ගමට පැමිණියේයයි ඔවුහු අසති. ඔවුහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද, එහි පැමිණෙති. භාග්‍යවතුන් වහන්සේ ඔවුන් ධර්ම කථාවෙන් කරුණු දක්වති. කරුණු ගන්වති. උනන්දු කරවති, සිත පහදවති, භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්ම කථාවෙන් කරුණු දක්වන ලද සමාදන් කරවන ලද උනන්දු කරවන ලද සිත පහදවන ලද ඔවුහු භාග්‍යවතුන් වහන්සේගෙන් ප්‍රශ්නද නොම අසති. කොයින් වාද නගත්ද? හුදෙක් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවීම පිණිස භාග්‍යවතුන් වහන්සේ වෙතින් අවසර ඉල්ලති. ඔවුහු එසේ පැවිදිවූවෝම තනිව අප්‍රමාදව කෙලෙස් නසන වීර්ය ඇතිව ආත්ම ආශාව දුරුකොට වාසය කරන්නාහු නොබෝ දවසකින්ම යම් අර්ථයක් පිණිස කුලපුත්‍රයෝ ගිහිගෙන් නික්ම ශාසනයෙහි මනාකොට පැවිදි වෙත්ද, මාර්ග බ්‍රහ්මචර්යාව අවසන්කොට ඇති ඒ උත්තම අර්හත්ඵලය මේ අත්බැව්හිම තෙමේ විශෙෂ ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වෙසෙති.

"ඔවුහු මෙසේ කීහ, "පින්වත්නි. එකාන්තයෙන් අපි නැසුනෝ වෙමු. පින්වත්නි, අපි ඒකාන්තයෙන් වැනසුනෝ වෙමු. පෙර අපි වනාහි අශ්‍රමණ වූවෝම ශ්‍රමණ වෙමුයි ප්‍රකාශ කෙළෙමු. අබ්‍රාහ්මණ වූවෝම බ්‍රාහ්මණ වෙමුයි ප්‍රකාශ කෙළෙමු. රහත් නුවූවෝම රහත් වෙමුයි ප්‍රකාශ කෙළෙමු. දැන් වනාහි ශ්‍රමණ වෙමු. බ්‍රාහ්මණ වෙමු, රහත් වෙමු. (කියායි) ස්වාමීනි, මේද භාග්‍යවත්තෙම සම්‍යක්සම්බුද්ධය, භාග්‍යවතුන් විසින් ධර්මය මනාව දෙශිතය සංඝතෙම සුප්‍රතිපන්නයයි භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මාගේ කාරණානුකූල දැනීමක් වෙයි.

13. "ස්වාමීනි, නැවතද අනිකක් කියමි. මෙහි සියුම්වූ නුවණ ඇති, පුරුදුකළ අන්‍ය වාද ඇති, තමන්ගේ නුවණින් වැරදි ලබ්ධීන් බිඳින්නෝයයි සිතා සිටින ඇතැම් ශ්‍රමණ පණ්ඩිතයන්ද දකිමි.

"පින්වත් ශ්‍රමණ ගෞතම තෙමේ අසුවල් නම් ගමට හෝ නියම්ගමට හෝ පැමිණේය කියා ඔව්හු අසති. ඔව්හු අපි ශ්‍රමණ

ගෞතමයන් වෙත පැමිණ මේ ප්‍රශ්නය අසමු. අප විසින් මෙසේ විචාරණ ලද්දේ නම් මෙසේ ප්‍රකාශ කරන්නේය. එසේ කල්හි අපි ඔහුට මෙසේ වාදය නගමු. අප විසින් මෙසේද විචාරණ ලද්දේ මෙසේ ප්‍රකාශ කරන්නේය. එසේ කල්හිත් අපි ඔහුට වාදාරෝපණය කරන්නෙමුයි ප්‍රශ්න පිළියෙල කරති.

"පින්වත් ශ්‍රමණ ගෞතම තෙමේ අසුවල් ගමට හෝ නිගමයට පැමිණියේද, කියා ඔව්හු අසති. ඔව්හු භාග්‍යවතුන් වහන්සේ යම්තෙනෙක්හිද, එහි පැමිණෙති. භාග්‍යවතුන් වහන්සේ ඔවුන්ට ධර්ම කතාවෙන් කරුණු දක්වයි, කරුණු ගන්වයි, සිත් තියුණු කරවයි, පහදවයි, භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්ම කතාවෙන් කරුණු දක්වන ලද සමාදන් කරවන ලද සිත් තියුණු කරණ ලද, සිත පහදවන ලද, ඔව්හු භාග්‍යවතුන් වහන්සේ අතින් ප්‍රශ්න නොම අසති. කොයින් වාදරෝපණය කෙරෙත්ද? හුදෙක් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවීම පිණිස භාග්‍යවතුන් වහන්සේ අතින්ම අවසර ඉල්ලති. භාග්‍යවතුන් වහන්සේ ඔවුන් පැවිදි කරවත්. ඔව්හු එසේ පැවිදිවූවෝම ගණාවාසයෙන් වෙන්ව අප්‍රමාදව කෙලෙස් නසන වීර්ය ඇතිව ආත්මපරිත්‍යාගයෙන් වාසය කරන්නාහු නොබෝ දවසකින්ම යම් අර්ථයක් පිණිස කුලපුත්‍රයෝ ගිහිගෙන් නික්ම ශාසනයෙහි මනාකොට පැවිදි වෙත්ද, මාර්ග බ්‍රහ්මචර්යාව අවසන්කොට ඇති ඒ උත්තම අර්හත්ඵලය මේ අත්බැව්හිම තෙමේ විශෙෂ ඥාණයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ඊට පැමිණ වෙසෙති.

"ඔව්හු මෙසේ කියන්නාහුය. 'පින්වත්නි, ඒකාන්තයෙන් අපි නැසුනෝ වෙමු. පින්වත්නි, ඒකාන්තයෙන් අපි වැනසුනෝ වෙමු.

"පෙර අපි වනාහි අශ්‍රමණ වූවෝම ශ්‍රමණයෝ වෙමුයි ප්‍රකාශ කෙළෙමු. අබ්‍රාහ්මණ වූවෝම බ්‍රාහ්මණයෝ වෙමුයි ප්‍රකාශ කෙළෙමු. රහත් නොවූවෝම රහතන් වෙමුයි ප්‍රකාශ කෙළෙමු. දැන් වනාහි ශ්‍රමණ වෙමු. බ්‍රාහ්මණ වෙමු. රහතුන් වෙමුය, කියායි.

"ස්වාමීනි, මේද භාග්‍යවත් තෙම සම්‍යක් සම්බුද්ධය, භාග්‍යවතුන් විසින් ධර්මය මනාව වදාරනලදී. සංඝ තෙමේ සුප්‍රතිපන්නය කියා භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මාගේ කාරණානුකූල දැනීමක් විය.

14. "ස්වාමීනි, අන් කරුණක්ද කියමි. මේ ඉසිදත්තය පුරාණය යන දෙදෙන මාගේ බතින් යැපෙන මාගේ යානාවෙන් ගමන් කරන්නෝ වෙති. ඔවුන්ගේ ජීවිකාවෘත්තිය දුන්නේද, යසසට පැමිණවූයේද, මම (වෙමි.) එනමුදු භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි යම්බඳු ගෞරව ආදර භක්තියෙක් වේද මා කෙරෙහි එබඳු ගෞරව ආදර භක්තියෙක් නැත.

"ස්වාමීනි, මම පෙර දවසක් සෙනා සන්නද්ධ වූයේම මේ ඉසිදත්තය, පුරාණය - යන මොවුන් විමසමින් එක්තරා කුඩා ගෙයක විසීමට පැමිණියෙමි. ස්වාමීනි, ඉක්බිති මේ ඉසිදත්ත පුරාණය දෙදෙනා රාත්‍රි බොහෝ වේලාවක් දහම් කතාවෙන් කල්ගෙවා යම් දිශාවෙක භාග්‍යවතුන් වහන්සේ වී නම්' ඒ දිශාවෙහි හිසකොට මා දෙසට පා දමා නිදාගත්හ. ස්වාමීනි, ඒ කාරණය පිළිබඳව මට මේ අදහස විය. 'පින්වත්නි, ආශ්චර්යයි. පුදුමයි."

"මේ ඉසිදත්ත පුරාණ යන දෙදෙන මාගේ බතින් යැපෙන මාගේ යානාවෙන් ගමන් කරන්නෝය. ඔවුන්ගේ ජීවිකා වෘත්තිය දුන්නේද, යසසට පැමිණවූයේද, මම (වෙමි.) එතකුදු වුවත් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි මෙන් ගෞරව ආදර භක්තියෙක් මා කෙරෙහි නැත. ඒකාන්තයෙන් මේ ආයුෂ්මත්හු ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශාසනයෙහි පෙරවිසූ විශෙෂය දනිතියි (කියාය.)

"ස්වාමීනි, නැවතද අනිකක් (කියමි) භාග්‍යවතුන් වහන්සේද ක්ෂත්‍රිය වෙති. මමද ක්ෂත්‍රිය වෙමි. භාග්‍යවතුන් වහන්සේද කොසොල් රට උපන්නෙකි. මමද කොසොල් රට උපන්නෙක් වෙමි. භාග්‍යවතුන් වහන්සේ අසූවයස් ඇත්තේ වෙත්. මමද අසූවයස් ඇත්තේවෙමි.

ස්වාමීනි යම් හෙයකින් භාග්‍යවතුන් වහන්සේත් ක්ෂත්‍රිය වෙත්ද, මමත් ක්ෂත්‍රිය වෙම්ද, භාග්‍යවතුන් වහන්සේත් කොසොල්

රට උපනෙක් වෙත්ද, මමත් කොසොල් රට උපන්නෙක් වෙම්ද, භාග්‍යවතුන් වහන්සේත් අසූවස් ඇත්තේ වෙත්ද මමත් අසූවයස් ඇත්තේ වෙම්ද- ස්වාමීනි මේ කරුණෙන්ද මම භාග්‍යවතුන් වහන්සේට උසස්ම ගෞරවය කිරීමට සිතින් බුහුමන් දක්වන්ට සුදුසු වෙමි.

"ස්වාමීනි, එසේනම් දැන් අපි යමු. අපි කටයුතුවූ බොහෝ ඇත්තෙමු. කෘත්‍ය බහුල කොට ඇත්තෝ වෙමුයි කීය. මහරජ, ඔබ දැන් යමකට කැමති වෙහිනම්, ඊට කාලයවෙයි" වදාළහ.

**15.** ඉක්බිති පසෙනදී කොසොල් රජ ආසනයෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට ගියේය.

ඉක්බිති පසේනදී කොසොල් රජ ගිය නොබෝ වේලාවකින් භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට කථා කළහ.

"මහණෙනි, මේ පසෙනදි කොසොල් රජ ධර්මයට බොහෝ ගෞරව වචන කියා ආසනයෙන් නැගිට ගියේය. මහණෙනි ධර්මගරුක වචනයන් උගනිව්. මහණෙනි, ධර්මගරුක වචනයන් පුරුදු කරව්. මහණෙනි, ධර්මගරුක වචනයන් සිත්හිලා දරව් මහණෙනි, පූර්වභාග ප්‍රතිපත්තියවූ ධර්මගරුක වචන අර්ථයෙන් යුක්ත වෙති."

භාග්‍යවතුන් වහන්සේ මේ කාරණය වදාළහ. සතුටුසිත් ඇති භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාවට සතුටුවූහ.

**ධම්මචෙතිය සූත්‍රය නිමි. (4-9)**

---

## 40. කණ්ණකත්ථල සූත්‍රය.

**1.** මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ උජුකා නගරාසන්නයෙහිවූ මිගදාය නම්වූ කණ්ණකත්ථලයෙහි වැඩ වෙසෙති.

එකල්හි පසෙනදි කොසොල් රජ කිසියම් කටයුත්තක් පිණිස උජුකා නගරයට පැමිණියේ වෙයි. එහිදී පසෙනදි කොසොල්රජ

එක්තරා පුරුෂයෙක් කැඳවා, "එම්බා පුරුෂය, මෙහි එව, නුඹ භාග්‍යවතුන් වහන්සේ යම් තෙනකද, එහි යව. ගොස් මාගේවචනයෙන් භාග්‍යවතුන් වහන්සේගේ සිරිපා මුදුනෙන් වඳුව. ආබාධ රහිත බව, නිරෝග බව, සැහැල්ලුකම කායබලය, සැපවිහරණය අසව 'ස්වාමීනි, පසෙනදි කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් මුදුනෙන් වඳියි. ආබාධ රහිත බව, නිරෝග බව, සැහැල්ලුකම, කායබලය, සැප විහරණය විචාරයි' කියාය. මෙසේද කියව.

ස්වාමීනි, අද පසෙනදි කොසොල්රජ දවල් ආහාර අනුභව කොට සවස් කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ දකින පිණිස පැමිණෙන්නේය. (කියාය.) "දෙවයන් වහන්ස, එසේය" කියා ඒ පුරුෂතෙම පසෙනදි කොසොල් රජහට උත්තර දී, භාග්‍යවතුන් වහන්සේ යම්තෙනකද, එහි පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක්පසෙක හුන්නේය. එක්පසෙක හුන් ඒ පුරුෂතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "ස්වාමීනි, පසෙනදි කොසොල් රජ භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් මුදුනෙන් වඳියි. ආබාධ රහිත බව, නිරෝග බව, කය පිළිබඳ සැහැල්ලුකම, කායශක්තිය, සැපවිහරණය විචාරයි. මෙසේද කියයි. "ස්වාමීනි, අද පසෙනදි කොසොල්රජ දවල් ආහාර ගෙන සවස් කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ දකිනු පිණිස පැමිණෙන්නේය" කියාය.

**2.** සොමා, සකුලා යන සොහොයුරියෝ දෙදෙන 'අද පසෙනදි කොසොල්රජ දහවල් ආහාරගෙන සවස් කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ දකිනු පිණිස පැමිණෙන්නේය' කියා ඇසුවාහුය. එකල්හි සොමා සකුලා යන සොහොයුරියෝ දෙදෙන බත් එලවන තෙනෙහි (හුන්) පසෙනදි කොසොල් රජු වෙත පැමිණ මෙසේ කීහු. "එසේ නම් මහරජ, අපගේ වචනයෙන්ද, භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් මුදුනෙන් වැන්ද මැනව."

'ආබාධ නැති බව, නිරෝග බව, කාය සැහැල්ලුව, කාය බලය, සැපවිහරණය, විචාළ මැනව. ස්වාමීනි, සොමා, සකුලා යන සොහොයුරියෝ භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් සිරසින්

වඳිති. ආබාධ රහිත බව, නිරෝග බව, කයේ සැහැල්ලු බව, කාය බලය, සැපවිහරණය විචාරත්ය කියාය.”

3. ඉක්බිති පසෙනදි කොසොල්රජ අනුභව කළ දවල් බත ඇත්තේ සවස් කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ යම්තෙනකද එහි පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වැඳ, එක්පසෙක හිඳගත්තේය. එක්පසෙක හුන් පසෙනදි කොසොල්රජ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. “ස්වාමීනි, සොමා, සකුලා යන සොහොයුරියෝ භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් සිරසින් වඳිති. ආබාධ රහිත බව, නිරෝග බව, කයේ සැහැල්ලු බව, කාය බලය, සැපවිහරණය අසත්යි” කීය. “කිමෙක්ද? මහරජ, සොමා, සකුලා යන සොහොයුරියෝ අනික් දූතයෙකු නොලැබුවාහුදැයි” වදාළහ.

“ස්වාමීනි, සොමා, සකුලා යන සොහොයුරියෝ අද පසෙනදි කොසොල්රජ අනුභව කළ දවල්බත ඇත්තේ, සවස් කාලයෙහි භාග්‍යවතුන් වහන්සේ දකිනු පිණිස යන්නේද, කියා ඇසුවාහුය. ඉක්බිති ස්වාමීනි, සොමා, සකුලා යන සොහොයුරියෝ බත් එලවන තෙනෙහිදී මා කරා පැමිණ මෙසේ කීවාහුය. ‘එසේ නම් මහරජ, අපගේ වචනයෙන්ද භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් සිරසින් වඳිනු මැනවි. ආබාධ රහිත බව, නිරෝග බව, කයේ සැහැල්ලු බව, කාය බලය, සැපවිහරණය විචාළ මැනව. ස්වාමීනි, සොමා, සකුලා යන සොහොයුරියෝ භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් සිරසින් වඳිති. ආබාධ රහිත බව, නිරෝග බව, කයේ සැහැල්ලු බව, කායබලය, සැපවිහරණය අසතියි’ කියාය. “මහරජ, සොමා, සකුලා යන සොහොයුරියෝ සුව ඇත්තියෝ වෙත්වායි” වදාළහ.

4. ඉක්බිති පසෙනදි කොසොල්රජ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීහ. “ස්වාමීනි, ‘යම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ සියල්ල දන්නේය, සියල්ල දක්නේයයි ඉතිරි නොවූ සියල්ල නුවණින් දැකීම ප්‍රතිඥා කරන්නේද, එබඳු ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ නැත. ඊට හේතු නැතැයි ශ්‍රමණ ගෞතමතෙම මෙසේ කියන්නේය, කියා මා විසින් අසනලදී.

"ස්වාමීනි, 'යම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ සියල්ල දන්නේය, සියල්ල දක්නේයයි ඉතිරි නොකොට සියල්ල නුවණින් දැකීම ප්‍රතිඥා කරන්නේද? එබඳු ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ නැත. ඊට හෙතු නැතැයි ශ්‍රමණ ගෞතම තෙම කියන්නේයයි යම් ඒ කෙනෙක් කීවාහුද, ස්වාමීනි, ඔව්හු භාග්‍යවතුන් වහන්සේ විසින් කියන ලද්දක් කියන්නාහුද? භාග්‍යවතුන් වහන්සේට බොරුවෙන් චොදනා නොකරන්නාහුද? කරුණු අනුවම කියන්නාහුද, කරුණු සහිතවූ කිසියම් වාදයක් නින්දාවට සුදුසු බවට නොපැමිණේද?

**5.** "මහරජ, යම් ඒ කෙනෙක් මෙසේකීහුද, ශ්‍රමණ ගෞතම තෙම මෙසේ කියන්නේය. යම් ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ සියල්ල දන්නේය. සියල්ල දක්නේයයි ඉතිරි නොකොට සියල්ල නුවණින් දැකීම ප්‍රතිඥා කරන්නේද, එබඳු ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ නැත. ඊට හෙතු නැත යනුවෙනි. එසේ කියන්නාවූ ඔව්හු මා විසින් කියන ලද්දක් කියන්නෝ නොවෙති. ඔව්හු අසත්‍යයෙන් මට චොදනා කරන්නාහුයයි" වදාළහ.

එවිට පසෙනදි කොසොල්රජ විඩූඩභ සෙනාපතියාට කථාකොට "කවරෙක් අද රජුගේ අන්තඃපුරයෙහිදී මේ කථාව කීවේදැයි" ඇසී. "මහරජ, ආකාශ ගොත්‍රයෙහිවූ සඤ්ජය නම් බ්‍රාහ්මණයායයි" කීය.

ඉක්බිති පසෙනදි කොසොල්රජ එක්තරා පුරුෂයෙක් කැඳවී. "එම්බා පුරුෂය, මෙහි එව, නුඹ මාගේ වචනයෙන් ආකාශ ගොත්‍රයෙහි සඤ්ජය බ්‍රාහ්මණයා කැඳවව. 'පින්වත, පසෙනදි කොසොල් රජ ඔබ කැඳවයි" කියාය. "දෙවයන් වහන්ස, එසේය" කියා ඒ පුරුෂයා පසෙනදි කොසොල් රජහට උත්තර දී ආකාශ ගොත්‍රයෙහිවූ සඤ්ජය බ්‍රාහ්මණයා යම් තෙනකද, එහි පැමිණ ආකාශ ගොත්‍ර ඇති සඤ්ජය බ්‍රාහ්මණයාහට මෙසේ කීය. 'පින්වත, පසෙනදි කොසොල් රජ ඔබ කැඳවයි' කියාය.

**6.** ඉක්බිති පසෙනදි කොසොල්රජ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ විසින් අන් කිසිවක්

සඳහාම කියන ලද වචනයක් ඇත්තේද එයද මිනිස්සු වෙනස්ව වරදවා ගන්නාහුයයි" කීය. "මහරජ, එසේ කියන ලද වචනයක් දනිමියි" කීහ. "ස්වාමීනි, (ඒ) කියන ලද වචනය භාග්‍යවතුන් වහන්සේ විසින් කෙසේ කියන ලද්දක් දැයි" ඇසී "මහරජ, (ඒ) කියන ලද වචනය මෙසේය. 'යමෙක් එකවරම සියල්ල දැනගණීද, දැකගණීද, එබඳු ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ නැත. ඊට කරුණු නැත යනුයි. යමෙක් එකවරම සියල්ල දන්නේද, දක්නේද, එබඳු ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ නැත. ඊට කරුණු නැතැයි" (කියාය)". "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ හේතුසහගත වූවක්ම වදාළේය. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කරුණු සහිත වූවක්ම වදාළේය.

7. "ස්වාමීනි, ක්ෂත්‍රියයෝය, බ්‍රාහ්මණයෝය, වෛශ්‍යයෝය, ශුද්‍රයෝය, කියා ජාති සතරක් වෙති. ස්වාමීනි, මේ සතර ජාතීන්ගේ වෙනසක් වන්නේද, වෙනස් බවට කරුණක් වන්නේද කියා" ඇසී.

"මහරජ, ක්ෂත්‍රියය, බ්‍රාහ්මණය, වෛශ්‍යය, ශුද්‍රය කියා මේ ජාති සතරක් වෙති. මහරජ, මේ සතර ජාතිය ක්ෂත්‍රියය, බ්‍රාහ්මණය යන දෙජාතිය වැඳීම, හුනස්නෙන් නැගිටීම, දොහොත් මුදුන්දීම, ගරුකිරීම යන මොවුන් පිළිබඳ උතුම්යයි කියන්නේය.'

"ස්වාමීනි, මම භාග්‍යවතුන් වහන්සේගෙන් මේ ආත්මය පිළිබඳ වූවක් නොඅසමි. ස්වාමීනි, පරලොව පිළිබද වූවක් භාග්‍යවතුන් වහන්සේගෙන් මම අසමි. ස්වාමීනි, ක්ෂත්‍රියය බ්‍රාහ්මණය, වෛශ්‍යය, ශුද්‍රය කියා මේ ජාති සතරෙක් වෙති. ස්වාමීනි, මේ ජාති සතර පිළිබඳව විශෙෂයක් වෙනස් බවක් ඇත්තේදැයි" (ඇසී).

8. "මහරජ, වීර්ය කිරීම පිළිබඳව මේ අංග පසක් වෙති. කවර පසක්ද යත්. මහරජ, මේ ශාසනයෙහි භික්ෂුව ශ්‍රද්ධා ඇත්තේ වෙයි.

"ඒ භාග්‍යවතුන් වහන්සේ මේ මේ කරුණු නිසා අර්හත්හ, සම්‍යක්සම්බුද්ධයහ, විජ්ජාචරණසම්පන්නයහ, සුගතයහ,

ලොකවිදූහ, අනුත්තරයහ, පුරුෂදම්‍යසාරථීහ, දිව්‍යමනුෂ්‍යයන්ට ශාස්තෲහ, බුද්ධයහ, භාග්‍යවත්හ කියා තථාගතයන් වහන්සේගේ බොධිය (බුද්ධඥානය) අදහන්නේය.

"අඩු වැඩි නොවූ වීර්‍යයට යොග්‍ය මධ්‍යම සමව ආහාර පැසවන ගින්නෙන් යුක්තව ආබාධ රහිතවූ නිරොගවූයෙක් වෙයි. කපටි නොවූ මායා විරහිත ශාස්තෲන් වහන්සේටද, නැණවත් භික්ෂූන්ටද ඇති සැටියෙන් තමා හෙලිකරන්නෙක් වෙයි.

"අකුසල් පහකිරීම පිණිසද, කුසල් වැඩීම පිණිසද, උත්සාහවත්ම දැඩි වීර්‍ය ඇතිව කුශලධර්මයන්හි බිම නොතැබූ බර ඇත්තේ ආර්‍ය භාවය පිණිසවූ නිර්වෙදය පිණිසවූ මනාව දුක නැතිකිරීමට පමුණුවන්නාවූ,

"විදර්ශනා ප්‍රඥාවෙන් යුක්තවූයේ ප්‍රඥාවත් කෙනෙක් වෙයි. මහරජ, මේ වීර්‍ය පිණිස වූ අංග පස වෙති. මහරජ, ක්ෂත්‍රිය බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශුද්‍රයයි ජාති හතරකි, ජාති සතරෙහි වූවෝද වීර්‍යය පිණිස පවත්නා මේ අංගපසින් යුක්ත වූවාහු වෙත්නම් ඒ කාරණය ඔවුන්ට බොහෝ කලක් හිත පිණිස සුව පිණිස වන්නේයයි" වදාළහ.

**9.** "ස්වාමීනි, ක්ෂත්‍රිය, බ්‍රාහ්මණය වෛශ්‍යය, ශුද්‍රය, යන සතර ජාතියට අයත් වූවෝ වීර්‍ය පිණිසවූ මේ අංග පසින් යුක්ත වූවාහුද, ස්වාමීනි, මේ කරුණෙහිදී ඔවුන්ගේ වෙනසෙක් ඇත්තේ දැයි" (ඇසී). "මහරජ, මෙහිදී ඔවුන්ගේ වීර්‍යය පිළිබඳ වෙනස කියමි.

"මහරජ, යම්සේ මොනවට දැමුණු මොනවට හික්මුණු නාඹු ඇතුන් දෙදෙනෙක් හෝ අසුන් දෙදෙනෙක් හෝ නාඹු ගවයන් දෙදෙනෙක් හෝ වෙත්ද, නොදැමුණු නොහික්මුණු නාඹු ඇතුන් දෙදෙනෙක් හෝ නාඹු අසුන් දෙදෙනෙක් හෝ නාඹු ගවයන් දෙදෙනෙක් හෝ වෙත්ද, මහරජ, ඒ කිමැයි සිතන්නෙහිද? ඔවුන් අතුරෙන් යහපත්වූ දැමුණු යහපත්ව හික්මුණු ඒ නාඹු ඇතුන් දෙදෙනම හෝ නාඹු අසුන් දෙදෙනම හෝ නාඹු ගවයන් දෙදෙනම හෝ දැමුණවුන් බවට දැමුණවුන් තැනට කිම පැමිණෙන්නාහුද?"

"එසේය ස්වාමීනි",

යම් ඒ දමනය නොවූ නොහික්මුණු නාඹූ ඇතුන් දෙදෙනෙක් හෝ නාඹූ අසුන් දෙදෙනෙක් හෝ නාඹූ ගවයන් දෙදෙනෙක් හෝ වෙත්ද, ඔවුහු හොඳින් දමනය වූ හොඳින් හික්මුණු නාඹූ ඇතුන් දෙදෙනා හෝ නාඹූ අසුන් දෙදෙනා හෝ නාඹූ ගවයන් දෙදෙනා හෝ මෙන් දැමුනවුන් බවට හික්මුන වුන්ගේ තැනට පත්වන්නාහුද?" "ස්වාමීනි, එයනොවන්නේය."

"මහරජ, එපරිද්දෙන්ම, යම් තැනකට ශ්‍රද්ධා ඇත්තහු විසින් නිරොගි වූවාවූ විසින් කපටි නොවූවකු විසින් මායා නැත්තෙකු විසින් පටන්ගත් වීර්ය ඇත්තෙකු විසින් නුවණ ඇත්තෙකු විසින් පැමිණිය යුතුද, එයට අශ්‍රද්ධාවත් රෝගීවූ කපටිවූ මායාකාරවූ කම්මැලිවූ අඥාන පුද්ගලයා පැමිණෙන්නේය. යන මේ කාරණ නොසිද්ධවන්නේය."

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ හේතු සහිත වූවක්ම කියන්නාහ. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කරුණු සහිත වූවක්ම කියන්නාහ. ස්වාමීනි, ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍යය, ශුද්‍රයයයි මේ ජාතිසතරට අයත්වූවෝ වීර්යය පිණිස පවත්නා මේ අංග පසෙන් යුක්තවූවාහු වෙත්ද, සම්‍යක් ප්‍රධාන වීර්යයෙන් යුක්ත වූවාවූ වෙත්ද, ස්වාමීනි, මෙහි ඔවුන්ගේ වෙනසක් වන්නේද?" "මහරජ, නිවණට පැමිණියාවූ ඔවුන්ගේ මෙහි කිසි වෙනසක් ඇතැයි මම නොකියමි. මහරජ, යම්සේ පුරුෂයෙක් වියලුන සාක ලීයක් ගෙන ගිනි උපදවන්නේය. ගිනි පහල කරන්නේය. නැවත අන් පුරුෂයෙක් වියලුන සල් ලීයක් ගෙන ගිනි උපදවන්නේය. ගිනි පහල කරන්නේය. නැවත අන් පුරුෂයෙක් වියලුන අඹලීයක් ගෙන ගිනි උපදවන්නේද, ගිනි පහල කරන්නේය. නැවත අන් පුරුෂයෙක් වියලුන ඉඹුල් ලීයක් ගෙන ගිනි උපද වන්නේය. ගිනි පහල කරන්නේය. මහරජ, ඒ කුමකැයි හඟින්නේද? වෙන වෙන ලී වලින් උපදවන ලද ඒ ගිනි, ගින්නෙන් ගින්න හෝ වර්ණයෙන් වර්ණය හෝ ආලොකයෙන් ආලොකය හෝ කිම කිසියම් වෙනසක් වන්නේද?" "නැත ස්වාමීනි," 'මහරජ යම් ඒ පසුව උපන් ගින්නද

උත්සාහයෙන් පැතිරේද එපරිද්දෙන්ම යම් මේ නිවණට පැමිණියාහු වෙත්ද (ඔවුන්ගේ) වෙනසක් ඇතැයි මම නොකියමි.

**10.** "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ හේතු සහිතවූවක්ම කියන්නාහ. ස්වාමීනි, භාග්‍යවතුන් වහන්සේ කරුණු සහිත වූවක්ම කියන්නාහ. ස්වාමීනි, කිමෙක්ද දෙවියෝ ඇත්තාහුද?" "මහරජ, තොප කුමක් හෙයින් 'ස්වාමීනි, කිමෙක්ද දෙවියෝ ඇත්තාහුදැයි, කියන්නෙහිද?" "ස්වාමීනි, දෙවියෝ මෙලොවට පැමිණෙන්නාහු හෝ වෙත්ද, නොපැමිණෙන්නාහු හෝ වෙත්ද?"

"මහරජ, ව්‍යාපාද (ද්වෙෂය) සහිතවූ යම් ඒ දෙවිකෙනෙක් වෙද්ද, ඔවුහු මේ ලොකයට පැමිණෙති, ව්‍යාපාද රහිතවූ යම් ඒ දෙවිකෙනෙක් වෙත්ද, ඔවුහු මේ ලොකයට නොපැමිණෙති".

මෙසේ වදාළ කල්හි විඩූඩභ නම් සේනාපති තෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "ස්වාමීනි, ව්‍යාපාද රහිතවූ මේ ලොකයට නොපැමිණෙන යම් ඒ දෙවිකෙනෙක් වෙත්ද, ඔවුන් එතනින් චුතකරන්නාහු හෝ වෙත්ද නෙරපන්නාහු හෝ වෙත්ද?" කියායි.

**11.** එවිට ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන්ට මේ අදහස විය. මේ විඩූඩභ සෙනාපති තෙම වනාහි පසේනදි කොසොල් රජුගේ පුත්‍රයාය. මම භාග්‍යවතුන් වහන්සේගේ පුත්‍රයාය. පුත්‍රයා විසින් පුත්‍රයා කැඳවීමට දැන් සුදුසු කාලය,' (කියායි) ඉක්බිති ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ විඩූඩභ සේනාපතියාට කථා කෙළේය. "සෙනාපතිය, එසේනම් මේ කාරණය නුඹගෙන්ම අසන්නෙමි. තොප යමක් කැමති වේද, එසේ එය ප්‍රකාශ කරව. සේනාපතිය, ඒ කුමකැයි හඟින්නේද? පසේනදි කොසොල් රජුගේ රාජ්‍යය යම් පමණ වේද, පසේනදි කොසොල් රජ යම් ප්‍රදෙශයක අධිපතිකම් කරවයිද, එහි ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ පින් ඇත්තෙකු හෝ පින් නැත්තෙකු හෝ බ්‍රහ්මචාරී වූවෙකු බ්‍රහ්මචාරී නොවූවෙකු හෝ ඉන් පහකිරීමට හෝ රටින් නෙරපීමට හෝ පසේනදි කොසොල් රජ සමර්ථවේද?" "පින්වතුන් වහන්ස, පසේනදි කොසොල් රජ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

යම් ප්‍රදෙශයක අධිපතිකම් කරවයිද, එහි ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ පින් ඇත්තෙකු හෝ පින් නැත්තෙකු හෝ බ්‍රහ්මචාරීවූවෙකු හෝ බ්‍රහ්මචාරී නොවූවෙකු හෝ ඉන් පහකිරීමට හෝ රටින් නෙරපීමට හෝ පසේනදි කොසොල් රජ සමර්ථ වෙයි.” සේනාපතිය,ඒ කුමකැයි හඟින්නෙහිද?

“යම් පමණ පසේනදි කොසොල් රජුගේ රාජ්‍යය නොවේද, යම් ප්‍රදෙශයක පසේනදි කොසොල් රජතෙම අධිපතිකම් නොකරයිද, එහි ශ්‍රමණයෙකුහෝ බ්‍රාහ්මණයෙකු හෝ පින් ඇත්තෙකු හෝ පින් නැත්තෙකු හෝ බ්‍රහ්මචරීවූවෙකු හෝ බ්‍රහ්මචාරී නොවූවෙකු හෝ, ඉන් පහකිරීමට හෝ රටින් නෙරපීමට හෝ සමර්ථ වේද?” “පින්වතුන් වහන්ස, යම් පමණ පසේනදි කොසොල් රජුගේ රාජ්‍ය නොවේද, යම් ප්‍රදෙශයක පසේනදි කොසොල් රජතෙම අධිපතිකම් නොකරයිද එහි යම් ශ්‍රමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු හෝ පින් ඇත්තෙකු හෝ පින් නැත්තෙකු හෝ බ්‍රහ්මචාරීවූවෙකු හෝ බ්‍රහ්මචාරී නොවූවෙකු හෝ ඉන් පහ කිරීමට හෝ රටින් නෙරපීමට හෝ පසේනදී කොසොල් රජතෙම සමර්ථ නොවෙයි.”

“සේනාපතිය, ඒ කුමකැයි හඟින්නෙහිද? තොප තව්තිසා දෙවියන් ගැන ඇසුවෙහිද,” “එසේය, පින්වත. තව්තිසා දෙවියන් ගැන මා අසා තිබේ. පින්වත, මෙහිදී පසේනදි කොසොල් රජුගෙන්ද තව්තිසා දෙවියන් ගැන අසනලදී?” “සේනාපතිය, ඒ කුමකැයි හඟින්නෙහිද, තව්තිසා දෙවියන් ඉන් පහ කිරීමට හෝ නෙරපීමට හෝ පසේනදි කොසොල් රජතෙම සමර්ථවේද?” “පින්වත තව්තිසා දෙවියන් දැකීමටවත් පසේනදි කොසොල් රජතෙම අසමර්ථය, කෙසේනම් තව්තිසා දෙවියන් ඉන් පහකිරීමට හෝ නෙරපීමට හෝ සමර්ථ වෙයිද?” “සෙනාපතිය, එපරිද්දෙන්ම මේ ලොකයට පැමිණෙන්නාවූ යම් ඒ ව්‍යාපාද සහිත දෙවිකෙනෙක් වෙත්ද, මේ ලොකයට නොපැමිණෙන්නාවූ යම් ඒ ව්‍යාපාද රහිත දෙවිකෙනෙක් වෙත්ද, ඒකාන්තයෙන් ඒ දෙවියන් දැකීමටද නොහැකි වෙත් කෙසේ නම් ඉන් පහකරන්නේ හෝ නෙරපන්නේ හෝ වේද?”

12. "එකල්හි පසෙනදි කොසොල් රජතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "ස්වාමීනි, මේ භික්ෂුව කවරෙක්ද" "මහරජ, ඒ ආනන්දය," "පින්වත්නි, එකාන්තයෙන් සතුටකි, පින්වත්නි, එකාන්තයෙන් සතුටුවීමට කරුණකි. ස්වාමීනි, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ හේතු සහිත වූවක්ම කියන්නාහ. ස්වාමීනි, ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේ කරුණු සහිත වූවක්ම කියන්නාහ. කිමෙක්ද ස්වාමීනි, බ්‍රහ්මයෝ ඇද්ද?" "මහරජ කිමෙක්ද? තොප කුමක් හෙයින් ස්වාමීනි බ්‍රහ්මයෝ ඇද්දැයි, කියන්නහුද?"

"ස්වාමීනි, බ්‍රහ්මයෝ මේ ලොකයට එන්නාහු වෙත්ද, නොඑන්නාහු හෝ වෙත්ද?" "මහරජ, යම් ඒ බ්‍රහ්මයෙක් ව්‍යාපාද සහිත වේද, හෙතෙම මේ ලොකයට පැමිණෙයි. යම් ඒ බ්‍රහ්මයෙක් ව්‍යාපාද රහිත වේද, හෙතෙම මේ ලොකයට නොපැමිණෙයි."

13. "එකල්හි එක්තරා පුරුෂයෙක් පසේනදි කොසොල් රජුට මෙසේ කීයේය. "මහරජ ආකාශ ගොත්‍ර ඇති සඤ්ජය බ්‍රාහ්මණතෙම ආයේය" (කියායි) ඉක්බිති පසේනදි කොසොල් රජතෙම ආකාශගොත්‍ර ඇති සංජය බ්‍රාහ්මණයාට මෙසේ කීය. "බ්‍රාහ්මණය, රජුගේ අන්තඃපුරයේදී මේ කථාව උපදවා කථා කළේ කවරෙක්ද," "මහරජ, විඩූඩභ සෙනාපති තෙමේය." විඩූඩභ සේනාපති තෙම මෙසේ කීය. "මහරජ, ආකාශගොත්‍ර ඇති සංජය බ්‍රාහ්මණයාය."

14. ඉක්බිති එක්තරා පුරුෂයෙක් පසෙනදි කොසොල් රජුට මෙසේ කීය. "මහරජතුමනි, දැන් ගමනට සුදුසු කාලයයි." එකල්හි පසේනදි කොසොල් රජතෙම භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "ස්වාමීනි, අපි භාග්‍යවතුන් වහන්සේගෙන් සර්වඥභාවය ගැන ඇසුවෙමු. භාග්‍යවතුන් වහන්සේ සර්වඥභාවය විස්තර කළහ. එයද අපට රුචිවිය. කැමැත්ත පිණිස විය. එයින් අපි සතුටු සිත් ඇත්තෝවීමු. ස්වාමීනි, සතර ජාතීන්ගේ සුද්ධිය ගැන අපි භාග්‍යවතුන් වහන්සේගෙන් ඇසුවෙමු. භාග්‍යවතුන් වහන්සේ සතර ජාතීන්ගේ සුද්ධිය විස්තර කළහ. එයද අපට

රුචිවිය. කැමැත්ත පිණිස විය. එයින් අපි සතුටු සිත් ඇත්තෝවීමු. ස්වාමීනි, උසස් දෙවියන් ගැන අපි භාග්‍යවතුන් වහන්සේගෙන් ඇසුවෙමු. භාග්‍යවතුන් වහන්සේ උසස් දෙවියන් ගැන විස්තර කළහ. එයද අපට රුචි විය. කැමැත්ත පිණිස විය. එයින් අපි සතුටු සිත් ඇත්තෝවීමු ස්වාමීනි, අපි භාග්‍යවතුන් වහන්සේගෙන් උසස් බ්‍රහ්මයන් ගැන ඇසුවෙමු. භාග්‍යවතුන් වහන්සේ උසස් බ්‍රහ්මයන් ගැන විස්තර කළහ. එයද අපට රුචිවිය. කැමැත්ත පිණිස විය. එයින් අපි සතුටු සිත් ඇත්තෝවීමු ස්වාමීනි, දැන් අපි යන්නෙමු. අපි බොහෝ වැඩ කටයුතු ඇත්තෝ වෙමු"යි කීය. "මහරජ, තොප යමක් කැමැත්තෙහි නම් ඊට කල් දනුව"යි වදාළහ.

ඉක්බිති පසේනදි කොසොල් රජතෙම භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සතුටුව අනුමෝදන්ව උන් ආසනයෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේට වැඳ පැදකුණු කොට ගියේය.

**දහවෙනිවූ කණ්ණකත්ථල සූත්‍රය නිමි. (4-10)**

---

(ඝටීකාර සූත්‍රය, රට්ඨපාල සූත්‍රය, මඛාදෙව සූත්‍රය, මාධුර සූත්‍රය, බොධිරාජ කුමාර සූත්‍රය, අංගුලිමාල සූත්‍රය, පිය ජාතික සූත්‍රය, බාහිතික සූත්‍රය, ධම්මචෙතිය සූත්‍රය, කණ්ණකත්ථල සූත්‍රය යන සූත්‍ර දසයවූ)

---

**සතරවෙනි රාජ වර්ගයයි.**

## 41. බ්‍රහ්මායු සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක භාග්‍යවතුන් වහන්සේ වෙදෙහ ජනපදයන්හි පන්සියයක් පමණ භික්ෂූන් සමග චාරිකාවෙහි හැසිරෙති. එකල්හි වනාහි ජරාවට ගියාවූ, මහලුවූ කාලය ගෙවීගියාවූ, වයසට පැමිණි උත්පත්තියෙන් එක්සිය විසි අවුරුදුවූ, නාමනිඝණ්ඩු ක්‍රියා කල්ප විකල්ප ශික්ෂා

නිරුක්ති යන ප්‍රභෙදයන් ඇති ඉතිහාස පස්වැනි කොට ඇති තුන්වෙදයේ කෙළවරට ගියාවූ, පද හා ව්‍යාකරණ හදාරන්නාවූ ලොකායත ශාස්ත්‍රයේත් මහා පුරුෂ ලක්ෂන ශාස්ත්‍රයේත් දක්ෂවූ බ්‍රහ්මායුනම් බ්‍රාහ්මණයෙක් මියුලු නුවර වාසය කෙරෙයි. ශාක්‍ය පුත්‍රවූ ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ ශාක්‍ය කුලයෙන් නික්ම පැවිදිව පන්සියයක් පමණ මහත් භික්ෂු සංඝයා සමග වෙදෙහ ජනපදයන්හි චාරිකාවෙහි හැසිරෙන්නාහුයි, බ්‍රහ්මායු බ්‍රාහ්මණයා ඇසීය. 'ඒ භාග්‍යවත් ගෞතමයන් වහන්සේගේ වනාහි මෙසේ යහපත්වූ උස්ව පැන නැගි කීර්ති ශබ්ද ඇත්තේය. ඒ භාග්‍යවතුන් වහන්සේ මේ මේ කාරණයෙන්ද අර්හත්හ, සම්‍යක් සම්බුද්ධයහ, විදර්ශනා ඥානය ආදී ඥාන අටෙන්ද' සීල සංවරය ආදී (චරණ) හසුරුවන ධර්ම පහළොවෙන්ද යුක්තයහ. යහපත් ගති ඇත්තාහ, සියලු ලොකයන් දන්නාහ, ශ්‍රෙෂ්ඨයහ, හික්මවිය යුතු පුරුෂයන් දමනය කිරීමෙහි රියැදුරෙකු වැනි වූහ. දිව්‍ය මනුෂ්‍යයන්ට ගුරුවරයෙක්වූහ, බුද්ධයහ, භාග්‍යවත්හ, ඒ භාග්‍යවතුන් වහන්සේ දෙවියන් සහිතවූ මරුන් සහිතවූ බඹුන් සහිතවූ මහණ බමුණන් සහිතවූ රජුන් හා මිනිසුන් සහිතවූ සත්ව වර්ගයා ඇතුළු සියලු ලොකය තමන් වහන්සේම මනාව පැහැදිලිකොට දැන ප්‍රකාශ කරණසේක්. උන්වහන්සේ මුල මැද අග යන තුන් තන්හි යහපත්වූ, අර්ථ සහිතවූ, දස ආකාරයෙන් නියම විදියට මවන ශබ්දකිරීම ඇත්තාවූ, සම්පූර්ණවූ පිරිසිදුවූ ධර්මය ප්‍රකාශ කරණසේක. එබඳුවූ රහතුන්ගේ දැකීමක් වේනම් ඒ යහපත්මැයි' කියායි.

2. "එකල්හි වනාහි බ්‍රහ්මායු බ්‍රාහ්මණයා හට නාමනිඝණ්ඩු ක්‍රියාකල්ප විකල්ප ශික්ෂා නිරුක්ති යන ප්‍රභෙදයන් ඇති, ඉතිහාසය පස්වැනිකොට ඇති තුන්වේදයේ කෙළවරට ගියාවූ පද හා ව්‍යාකරණ හදාරන්නාවූ විතණ්ඩ ශාස්ත්‍රයේත් මහා පුරුෂ ලක්ෂණ ශාස්ත්‍රයේත් දක්ෂවූ උත්තරනම් තරුණ ශිෂ්‍යයෙක්විය. ඉක්බිති බ්‍රහ්මායු බ්‍රාහ්මණ තෙමේ උත්තර තරුණයා ඇමතීය. (මෙසේ කීය) "දරුව උත්තරය, මේ ශාක්‍යපුත්‍රවූ ශාක්‍ය කුලයෙන් නික්ම පැවිදිවූ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ පන්සියයක් පමණවූ මහා භික්ෂු සමූහයක් සමග වේදෙහ ජනපදයන්හි චාරිකාවෙහි

හැසිරෙති. ඒ භාග්‍යවතුන් වහන්සේගේ මෙබඳුවූ යහපත් කීර්තිරාවයක් උස්ව නැංගේය. (කෙබඳුවූද යත්) 'මේ මේ කාරණයෙනුදු ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත්හ, සම්‍යක්සම්බුද්ධයහ, විදර්ශනා ඥානය ආදී ඥාන අටෙන්ද සීලසංවරය ආදී (චරණ) හසුරුවන ධර්ම පහළොවෙන්ද යුක්තයහ. යහපත් ගති ඇත්තෝ වූහ. සියලු ලොකයන් දන්නාහ. ශ්‍රෙෂ්ඨවූවාහු, හික්මවිය යුතු පුරුෂයන් දමනය කිරීමෙහි රියැදුරෙකු වැනි වූහ. දිව්‍ය මනුෂ්‍යයන්ට ගුරුවරයෙක් වූහ, බුද්ධයහ, භාග්‍යවත්හ. ඒ භාග්‍යවතුන් වහන්සේ දෙවියන් සහිතවූ, මරුන් සහිතවූ, බඹුන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ, රජුන් හා මිනිසුන් සහිතවූ, සත්වවර්ගයා ඇතුලු සියලු ලොකය තමන් වහන්සේම මනාව පැහැදිලිකොට දැන ප්‍රකාශ කරන සේක. උන්වහන්සේ මුල මැද අග යන තුන් තන්හි යහපත්වූ අර්ථ සහිතවූ දස ආකාරයෙන් නියම විදියට වචන ශබ්ද කිරීම ඇත්තාවූ, සම්පූර්ණවූ පිරිසිදුවූ, ධර්මය ප්‍රකාශ කරණ සේක."

"එබඳුවූ රහතුන්ගේ දැකීමක් වේ නම් යහපත්මැයි කියායි. දරුව, උත්තරය එව, නුඹ ශ්‍රමණ ගෞතමයන් යම් තැනෙක් හිද එහි යව. ගොස් ඉදින් ඒ භවත් ගෞතමයන්ගේ ඇති සැටියක් නිසාම කීර්ති ශබ්දයක් පැතිර ගියේද, නොවේ නම් එසේ නුවූවක් පිළිබඳවද, ඒ භවත් ගෞතමයන් වහන්සේ එබඳුද, නැත්නම් එබඳු නොවේදැයි, එපරිද්දෙන් මහණ ගොයුම්හු (සොයා) දනුව. නුඹගේ තීරණය අනුව අපි ඒ භවත් ගෞතමයන් වහන්සේ දැනගණුම්හ." "පින්වත, ඉදින් ඒ භවත් ගෞතමයන් වහන්සේගේ ඇත්තාවූ ගුණයන් නිසාම මේ කීර්ති ශබ්දය පැතිරගියේද, ඉදින් එසේ නොවේද? ඉදින් ඒ භවත් ගෞතමයෝ එබඳුද? ඉදින් එසේ නොවේදැයි මම කෙසේ නම් දැන ගන්නෙම්ද?"

3. "දරුව, උත්තරය, අපගේ වේදමන්ත්‍රයන්හි දෙතිස් මහා පුරුෂ ලක්ෂණ ආවේමය. ඒ ලක්ෂණයන්ගෙන් යුක්තවූ මහා පුරුෂයාහට ගති දෙකෙක්ම වෙති. අනිකෙක් නැත. ඉදින් (හෙතෙම) ගිහිගෙයි වසයි නම් දැහැමිවූ දැහැමි රජෙක්වූ සතර දිවයිනට අධිපතිවූ දිනන සුලුවූ ජනපදයන්හි (කිසිවෙකු විසිනුදු

නොසෙල්විය හැකිසේ) ස්ථිරවූ රත්න සතකින් යුක්තවූ සක්විති රජවෙයි. මොවුහු ඔහුගේ රත්න සත වෙත්. කවරහුදයත්? චක්‍ර රත්නය, හස්ති රත්නය, අශ්ව රත්නය, මාණික්‍ය රත්නය, ස්ත්‍රිරත්නය ගෘහපති රත්නය සත්වැනිවූ පුත්‍ර රත්නයද යනරත්න හතයි. ශූරවූ දිව්‍ය පුත්‍රයන්ට සමානවූ, නොහොත් වීර්ය සම්පන්නවූ ශරීර ඇත්තාවූ පරසතුරු සේනාවන් මර්දනය කරන්නාවූ දහසකටත් අධික වූ පුත්‍රයෝ ඒ සක්විති රජුට වෙත්. හෙතෙම සයුර කෙළවර කොට ඇති මේ පෘථිවිය දඬුවම් කිරීම් නැතිව, යුද්ධ කිරීම් නැතිව, ධර්මයෙන් හැමදෙන දිනා අධිපතිව වෙසෙයි. ඉදින් හෙතෙම ගිහිගෙන් නික්ම පැවිදි වෙයිනම් ලෝකයේ කෙලෙස් වැස්ම දුරුකළාවූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධවෙයි. දරුව, උත්තරය, මම වනාහි වේදමන්ත්‍ර උගන්වන්නා වෙමි. නුඹ වේද මන්ත්‍රයන් ඉගෙන ගන්නා වෙයි."

4. "එසේය ස්වාමීනි"යි උත්තර මානවකයා බ්‍රහ්මායු බ්‍රාහ්මණයාහට උත්තරදී හුනස්නෙන් නැගී, බ්‍රහ්මායු බ්‍රාහ්මයාහට පැදකුණු කොට වේදෙහ ජනපදයෙහි භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට ගියේය. පිළිවෙලින් චාරිකාවෙහි යමින් භාග්‍යවතුන් වහන්සේ යම්තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග (සුවදුක් විචාරීම ආදියෙන් සතුටු විය.) සතුටු විය යුතුවූත්, සිහි කටයුතු වූත්, කථාව කොට නිමවා එක් පසෙක උන්නේය. එකත් පසෙක උන්නාවූ උත්තර තරුණයා භාග්‍යවතුන් වහන්සේගේ ශරීරයෙහි දෙතිස් මහා පුරුෂ ලක්ෂණ සෙවීය. උත්තර මානවකයා වනාහි භාග්‍යවතුන්ගේ ශරීරයෙහි ලකුණු දෙකක් හැර බොහෝ සෙයින් දෙතිස් මහා පුරුෂ ලක්ෂණ දුටුවේය. කොසොහිත වත්ථගුය්හ ලක්ෂණය, හා පහුතජිව්හතා ලක්ෂණය යන මහාපුරුෂ ලක්ෂණ දෙකෙහි සැකකරයි. විමති උපදවයි. ඒ සැකයෙන් නොමිදෙයි. නොපැහැදෙයි. එකල්හි භාග්‍යවතුන් වහන්සේට මෙබඳු සිතක් පහලවිය. 'මේ උත්තර තරුණයා මාගේ ලක්ෂණ දෙකක් හැර බොහෝ සෙයින් මහා පුරුෂ ලක්ෂණ දකීද, කොසොහිතවත්ථගුයහ ලක්ෂණය හා පහුතජිව්හතා ලක්ෂණය යන මහාපුරුෂ ලක්ෂණ දෙකෙහි සැක උපදවයි. විචිකිච්ඡා

කෙරෙයි. ඒ සැකයෙන් නොමිදෙයි. නොපැහැදෙයි'. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ උත්තර මානවකයා භාග්‍යවත්හුගේ කොසොහිත වත්ථගුය්හ ලක්ෂණය යම්සේ දකීද, එබඳු ඍද්ධියක් පෑහ. අනතුරුව භාග්‍යවතුන් වහන්සේ දිව බැහැරකොට කන්සිදුරු දෙක පිරිමැද්දහ. නාස් සිදුරු දෙක පිරිමැද්දහ, මුළු නලල්තලයම දිවෙන් වැසූහ.

**5.** එකල්හි උත්තර මානවකයාට මෙබඳු සිතක් පහලවිය. 'ශ්‍රමණ ගෞතමයන් වහන්සේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ වලින් සමන්විතවූ සේක. මම ශ්‍රමණ ගෞතමයන් වහන්සේ පස්සෙන් යන්නෙම් නම්, උන්වහන්සේගේ යාම ඊම ආදී ඉරියව් දකින්නෙම් නම්, මැනවි. කියායි. ඉක්බිති උත්තර තරුණයා සත්මසක් නොහැර ගමන් කරන සෙවනැල්ලක් මෙන්, භාග්‍යවතුන් වහන්සේ පසුපස ඇවිද්දේය. එකල්හි උත්තර මානවකයා වේදේහ ජනපදයන්හි සත්මසක් ගතකිරීමෙන් පසු මියුලු නුවර යම් තැනෙකද, එතනට ගියේය. පිළිවෙලින් ගොස් මියුලු නුවර යම් තැනෙකද, බ්‍රහ්මායු බ්‍රාහ්මණ තෙමේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ බ්‍රහ්මායු බ්‍රාහ්මණයා වැඳ එක් පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ උත්තර මානවකයාට බ්‍රහ්මායු බ්‍රාහ්මණ තෙමේ මෙසේ කීය. 'කිමෙක්ද? දරුව, උත්තරය, ඒ භවත් ගෞතමන් වහන්සේගේ ඇති ගුණයන් නිසාම මේ කීර්ති ශබ්දය පැතිර ගියේද, අන් අයුරකින් නොවේද, කිමෙක්ද? ඒ භවත් ගෞතමයෝ එබඳුද, එසේ නොවේද?"

**6.** "ස්වාමීනි, ඒ භවත් ගෞතමයන් වහන්සේගේ ඇති ගුණයන් නිසාම කීර්ති ශබ්දය පැතිර ගියේය. අන් අයුරකින් නොවේ. ස්වාමීනි, ඒ භවත් ගෞතමයන් වහන්සේ එබඳුමය. වෙනස් ආකාරයක් නැත. ස්වාමීනි, ඒ භවත් ගෞතමයන් වහන්සේ දෙතිස්මහාපුරුෂ ලක්ෂණයන්ගෙන් යුක්තවූ සේක. ඒ භවත් ගෞතමයන් වහන්සේ වනාහි මනාව පිහිටි පා ඇත්තේ වෙයි. මෙයද ඒ භවත් ගෞතමවූ මහාපුරුෂයන් වහන්සේගේ මහාපුරුෂ ලක්ෂණයක් වෙයි. ඒ භවත් ගෞතමයන් වහන්සේගේ යටපාතලයන්හි දහසක් දැති ඇති නිම්වලලු සහිතවූ නැබ

සහිතවූ සියලු අයුරින් සම්පූර්ණවූ චක්‍රයෝ වූහ. මෙයද ඒ භවත් ගෞතමවූ, මහා පුරුෂයන් වහන්සේගේ මහාපුරුෂ ලක්ෂණයෙකි. ඒ භවත් ගෞතමයන් වහන්සේ වනාහි දික්වූ විළුම් ඇත්තේ වෙයි. මෙයද ඒ භවත් ගෞතමවූ, මහා පුරුෂයන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණයෙකි. ඒ භවත් ගෞතමයන් වහන්සේ වනාහි දික්වූ ඇඟිලි ඇත්තේ වෙත්. මෙයද ඒ භවත් ගෞතමවූ, මහාපුරුෂයන් වහන්සේගේ මහාපුරුෂ ලක්ෂණයෙකි. ඒ භවත් ගෞතමයන් වහන්සේ වනාහි මෘදුවූ ලපටිවූ අතුල් පතුල් ඇත්තේ වෙත්. මෙයද ඒ භවත් ගෞතමවූ, මහාපුරුෂයන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණයෙකි. ඒ භවත් ගෞතමයන් වහන්සේ දැල්කවුළුවකට බඳු අතුල් පතුල් ඇත්තේ වෙයි. මෙයද ඒ භවත් ගෞතමවූ, මහා පුරුෂයන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණයෙකි. ඒ භවත් ගෞතමයන් වහන්සේ වනාහි පිරුණු ගොප් මසැති පා ඇත්තේ වෙයි. මෙයද ඒ භවත් ගෞතමවූ, මහා පුරුෂයන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණයෙකි. ඒ භවත් ගෞතමයන් වහන්සේ වනාහි (ඕලු) එනම් මුවන්ගේ බඳු කෙන්ඩා ඇත්තේ වෙයි. මෙයද ඒ භවත් ගෞතමවූ, මහා පුරුෂයන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණයෙකි. ඒ භවත් ගෞතමයන් වහන්සේ වනාහි සිටියේම නොනැමී දෙඅත්තලවලින් දනහිස් පිරිමදින සේක. මෙයද ඒ භවත් ගෞතමවූ මහා පුරුෂයන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණයෙකි. ඒ භවත් ගෞතමයන් වහන්සේ වනාහි කොෂය තුළ සැඟවුණු පුරුෂව්‍යඤ්ජනය ඇත්තේ වෙයි. මෙයද ඒ භවත් ගෞතමවූ, මහා පුරුෂයන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණයෙකි. ඒ භවත් ගෞතමයන් වහන්සේ වනාහි රන්වන් වූයේ වෙත්. මෙයද ඒ භවත් ගෞතමවූ, මහාපුරුෂයන් වහන්සේගේ මහාපුරුෂ ලක්ෂණයකි. ඒ භවත් ගෞතමයන් වහන්සේ වනාහි රන්වන්වූ සිවි ඇත්තේ වෙයි. මෙයද ඒ භවත් ගෞතමයන්වූ මහාපුරුෂයන් වහන්සේගේ මහාපුරුෂ ලක්ෂණයෙකි. සියුම්වූ සිවි ඇත්තේ වෙයි. සියුම්වූ සිවි ඇති බැවින් ශරීරයෙහි දූලි කුණු නොතැවරෙන්නේ වෙත්. මෙයද ඒ භවත් ගෞතම වූ, මහා පුරුෂයන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණයෙකි. ඒ භවත් ගෞතමයන් වහන්සේ වනාහි

එක එකලොම් ඇත්තේවෙයි. රෝම කූපයන්හි එක් එක් ලොම් හටගන්නේ වෙයි. මෙයද ඒ භවත්ගෞතම වූ මහා පුරුෂයන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණයෙකි. ඒ භවත් ගෞතමයන් වහන්සේ වනාහි උඩුකුරු අක් ඇති රෝම ඇත්තේ වෙයි. හටගත් ලොම් උඩුකුරුයි, නිල්වන්ය, අඳුන්වන්ය, කුණ්ඩලයක් මෙන් කරකැවුනේ වෙයි. දකුණට කැරකැවුනේ වෙයි. මෙයද ඒ භවත් ගෞතමවූ මහා පුරුෂයන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණයකි. ඒ භවත් ගෞතමයන් වහන්සේ වනාහි කෙලින් පිහිටි සිරුර ඇත්තේවෙයි. මෙයද ඒ භවත් ගෞතමවූ මහා පුරුෂයන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණයෙකි. ඒ භවත් ගෞතමයන් වහන්සේ වනාහි සත්තැන උස්වූයේ වෙයි. මෙයද ඒ භවත් ගෞතම වූ මහා පුරුෂයන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණයෙකි. ඒ භවත් ගෞතමයන් වහන්සේ වනාහි සිංහයෙකුගේ පෙරකය මෙන් සම්පූර්ණ සිරුර ඇත්තේ වෙයි. මෙයද ඒ භවත් ගෞතම වූ මහා පුරුෂයන් වහන්සේගේ මහාපුරුෂ ලක්ෂණයකි. ඒ භවත් ගෞතමයන් වහන්සේ වනාහි පිට දැලවර මැද පිරුනේ වෙයි. මෙයද ඒ භවත් ගෞතමවූ, මහා පුරුෂයන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණයෙකි. ඒ භවත් ගෞතමයන් වහන්සේ වනාහි නුගරුකක් සේ පිරිමඬුලු ඇත්තේ වෙයි. උන්වහන්සේගේ ශරීරය යම් පමණවේද, බඹයත් එපමණය. උන්වහන්සේගේ බඹය යම්පමණවේද, ශරීරයත් එපමණය. මෙයද ඒ භවත් ගෞතම වූ මහා පුරුෂයන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණයෙකි. ඒ භවත් ගෞතමයන් වහන්සේ වනාහි සමවූ වටවූ ග්‍රීවය ඇත්තේ වෙයි. මෙයද ඒ භවත් ගෞතම වූ මහා පුරුෂයන් වහන්සේගේ, මහා පුරුෂ ලක්ෂණයෙකි. ඒ භවත් ගෞතමයන් වහන්සේ වනාහි සමසතලිසක් දත් ඇත්තේ වෙයි. මෙයද ඒ භවත් ගෞතම වූ මහා පුරුෂයන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණයෙකි. ඒ භවත් ගෞතමයන් වහන්සේ වනාහි සමවූදත් ඇත්තේ වෙයි. මෙයද ඒ භවත් ගෞතම වූ, මහා පුරුෂයන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණයෙකි. ඒ භවත් ගෞතමයන් වහන්සේ වනාහි විවර නැතිවූ දත් ඇත්තේ වෙයි. මෙයද ඒ භවත් ගෞතමවූ මහා

පුරුෂයන් වහන්සේගේ මහාපුරුෂ ලක්ෂණයෙකි. ඒ භවත් ගෞතමයන් වහන්සේ වනාහි දිලිසෙන ඉතා සුදුදත් ඇත්තේ වෙයි. මෙයද ඒ භවත් ගෞතම වූ මහා පුරුෂයන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණයෙකි. ඒ භවත් ගෞතමයන් වහන්සේ වනාහි මෘදු දික් පුළුල් දිව ඇත්තේ වෙයි. මෙයද ඒ භවත් ගෞතම වූ මහා පුරුෂයන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණයෙකි. ඒ භවත් ගෞතමයන් වහන්සේ වනාහි බ්‍රහ්මස්වර ඇත්තේ වෙයි. කුරවි රාවය බඳු රාවය ඇත්තේ වෙයි. මෙයද ඒ භවත් ගෞතම වූ මහා පුරුෂයන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණයෙකි. ඒ භවත් ගෞතමයන් වහන්සේ වනාහි පිරිසිදු නිල්වන් පෑ ඇස් ඇත්තේවෙයි. මෙයද ඒ භවත් ගෞතම වූ මහා පුරුෂයන් වහන්සේගේ මහාපුරුෂ ලක්ෂණයෙකි. ඒ භවත් ගෞතමයන් වහන්සේ වනාහි උපන් කෙණෙහි වස්සෙකුගේ බඳු ප්‍රසන්න ඇස් ගුලි ඇත්තේ වෙයි. මෙයද ඒ භවත් ගෞතම වූ මහා පුරුෂයන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණයෙකි. ඒ භවත් ගෞතමයන් වහන්සේගේ දෙබැම අතර සුදුවූ මෘදුවූ පුලුන් පෙදක්වැනි දකුණට කරකැවී නළල් මැදපිහිටි රෝමයක්වූයේ වෙයි. මෙයද ඒ භවත් ගෞතමවූ මහාපුරුෂයන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණයකි. ඒ භවත් ගෞතමයන් වහන්සේ වනාහි පිරුණු නළල සහිත සම්පූර්ණ හිස ඇත්තේ වෙයි. මෙයද ඒ භවත් ගෞතමවූ මහා පුරුෂයන් වහන්සේගේ මහා පුරුෂ ලක්ෂණය වෙයි. ඒ භවත් ගෞතමයන් වහන්සේ මේ දෙතිස් මහා පුරිස් ලකුණින් සමන්විතවූසේක."

7. "ඒ භවත් ගෞතමයන් වහන්සේ යන සේක් දකුණු පසින් පළමුව යන සේක. උන්වහන්සේ ඉතා දුර පාදය නොඔසවනසේක. ඉතා ළඟ පාදය නොතබන සේක. උන්වහන්සේ ඉතා ඉක්මණින් නොවඩිනසේක. ඉතා සෙමින් නොවඩිනසේක. දණහිසින් දණහිස ගටමින් නොවඩින්නාහ. ගොප් ඇටයෙන් ගොප් ඇටය ගටමින් නොවඩින්නාහ. උන්වහන්සේ වඩිනසේක් කලවය උඩට නොනැමෙයි. කලවය පහළට නොනැමෙයි. කලවය දැඩිකොට පය නොතබයි. කලවය

එහා මෙහා නොසලවයි. වඩින්නාවූ ඒ භවත් ගෞතමයන් වහන්සේගේ යට කයම සෙලවෙයි, කයින් වෙර ගමනින් නොවඩිත්. ඒ භවත් ගෞතමයන්වහන්සේ වනාහි හැරී බලනසේක් සියලු කයම හරවා බලයි. උන්වහන්සේ උඩ නොලබනසේක. යට නොලබනසේක, වට පිට බලමින් නොවඩිත්. වියදඬු පමණම බලත්. ඉන් එහා උන්වහන්සේගේ කිසිම ආවරණයක් නැති ඥාණයෙන් බැලීම වෙයි. උන්වහන්සේ ගෙයක් තුළට ඇතුල්වන්නේ කය උඩට නොඔසවන සේක, කය පහළට නොනමත්, කය දැඩිකොට නොතබයි. කය එහා මෙහා නොසොළොවයි. උන්වහන්සේ ඉතාදුර ඉතා ළංවද ආසනයට නොයත්.

"අතින් තදකොට ආසනයෙහි නොඉඳිත්. ආසනයෙහි කය නොහෙළත්, උන්වහන්සේ ඇතුළුගෙහි හුන්නේ හස්ත විකාර නොකරත්. පාද විකාර නොකරත්. පයක් පිට පයක් දමා නොහිඳිත්. ගොප් මස්පිට ගොප්මස (බත්කෙන්ඩ) නගා නොඉඳිත්, නිකට අත තබා නොහිඳිත්. උන්වහන්සේ ඇතුළුගෙහි බියවූ ස්වභාවයෙන් නොඉඳිත්. උන්වහන්සේ භය නොවූ කම්පා නොවූ නොසෙල්වෙන තැති නොගෙන පහවූ ලොමුදැහැ ගැනීම් ඇතිව නිවන් ඇසුරු කරන සිත් ඇතිව ඒ භවත් ගෞතමයන් වහන්සේ ඇතුළු ගමෙහි වැඩ හිඳිත්.

8. "උන්වහන්සේ පාත්‍රයට වතුර පිළිගන්නේ පාත්‍රය උඩට නොඔසවත්. පාත්‍රය පහලට නොනමත්, පාත්‍රය දැඩිකොට නොතබත්. පාත්‍රය එහාමෙහා නොසොළොවයි. උන්වහන්සේ පාත්‍රයට වතුර වැඩියත් නොව අඩුවත් නොව පිළිගන්නා සේක. උන්වහන්සේ "බුලු බුලු" යන ශබ්ද නගිනසේ පාත්‍රය නොසෝදනසේක. පෙරල පෙරලා පාත්‍රය නොසෝදන්නාහ. පාත්‍රය බිම තබා අත් නොසෝදන්නාහ. අත් සේදූ කල්හි පාත්‍රය සෝදන ලද්දේවෙයි. පාත්‍රය සේදූකල්හි අත් සෝදනලද්දේ වෙයි. උන්වහන්සේ පාත්‍ර ජලය ඉතා දුරත් නොව ඉතා ළඟත් නොව දමනසේක. උන්වහන්සේ බත් පිළිගන්නා සේක් පාත්‍රය උඩට නොනමත්. පාත්‍රය පහලට නොනමත්. පාත්‍ර තදකොට

නොතබත්. පාත්‍රය එහා මෙහා නොසොලොවත්. උන්වහන්සේ බත් වැඩිත් නොව අඩුත් නොව පිළිගන්නා සේක.

**9.** "ඒ භවත් ගෞතමයන් වහන්සේ බතින් හතරෙන් කොටසක් පමණ ව්‍යඤ්ජන පිළිගන්නා සේක. බත් ආලොපය ව්‍යඤ්ජනයෙන්ම වැඩිමනත් නොකරන්නාහ. ඒ භවත් ගෞතමයන් වහන්සේ මුඛයෙහි බත් පිඩු දෙතුන් වරක් පෙරළා වළඳනසේක. උන්වහන්සේගේ කිසි බත් උලක් නොබිඳී කයට නොපැමිණෙයි. උන්වහන්සේගේ මුඛයෙහි කිසි බත් උලක් ඉතුරු නොවෙයි. ඉක්බිති නැවතද බත් පිඩක් මුඛයට පමුණුවයි. ඒ භවත් ගෞතමයන් වහන්සේ රසය දැන ගනිත්. ආහාර වළදනසේක. රස තෘෂ්ණාවෙන් රස විඳිමින් නොවළඳනසේක, ඒ භවත් ගෞතමයන් වහන්සේ වනාහි අංගඅටකින් යුක්තවූ ආහාරය වළඳනසේක. මල්ලවපොර බැඳීම පිණිස, මද වැඩීම පිණිස, ශරීරයේ අඩු තැන් පිරවීම පිණිස, අලංකාරය පිණිස නොවළඳනසේක. යම්තාක් මේ ශරීරයාගේ පැවැත්ම පිණිස යැපීම පිණිස දුක් නැතිකරගැනීම පිණිස බ්‍රහ්මචර්යාවට අනුග්‍රහ පිණිස වළඳන සේක. මෙසේ පුරාණ වෙදනා නසමි. අලුත් වේදනා නූපදවන්නෙමි මාගේ ජීවිත යාත්‍රාවද වන්නේය. වරද නැති බවද, පහසු විහරණයද, වන්නේය' යන අදහසින් වළඳන සේක. උන්වහන්සේ වළඳා අවසන්ව පාත්‍රයට වතුර පිළිගන්නා සේක් පාත්‍රය උඩට නොනමනසේක. පාත්‍රය පහලට නොනමනසේක. පාත්‍රය නොඔබන සේක. පාත්‍රය එහා මෙහා නොසොලොවත්. උන්වහන්සේ පාත්‍රජලය ඉතා වැඩිත් නොව අඩුත් නොව පිළිගන්නාසේක. උන්වහන්සේ "බුලු බුලු" යන ශබ්ද නගනසේ පාත්‍රය නොසෝදන සේක. පෙරළ පෙරළා පාත්‍රය නොසෝදන සේක.

**10.** "පාත්‍රය බිම දමා අත නොසෝදන්නාහ. අත සේදූ කල්හි පාත්‍රය සෝදනලද්දේ වෙයි. පාත්‍රය සේදූ කල්හි අත සෝදන ලද්දේ වෙයි. උන්වහන්සේ පාත්‍ර ජලය ඉතා දුරද ඉතා ළඟද නොදමන්නාහ. උන්වහන්සේ වළඳා අවසන්ව පාත්‍රය ඉතා දුරද, ඉතා ළඟද, බිම නොතබනසේක. පාත්‍රයෙහි

බලාපොරොත්තුව අත්හරින්නේද නොවෙත්. සීමාව ඉක්මවා රක්නේද නොවෙත්. උන්වහන්සේ වළඳා අවසන්වී මොහොතක් නිශ්ශබ්දව හිඳිනසේක. අනුමෝදනාවට කාලය නොඉක්මවනසේක. උන්වහන්සේ වළඳා අවසානව අනුමෝදනා කරන සේක. ඒ බතට නින්දා නොකරනසේක, අන් බතක් බලාපොරොත්තු නොවනසේක. ධර්ම කථාවෙන්ම ඒ පිරිසට දක්වයි. කුශල ධර්මයෙහි සමාදන් කරවයි. උත්සාහවත් කරවයි, සතුටු කරවයි. උන්වහන්සේ ඒ පිරිසට ධර්ම කථාවක් දක්වා, කුසල ධර්මයන්හි සමාදන් කරවා උත්සාහවත් කරවා සතුටු කරවා, හුනස්නෙන් නැගිට වඩින සේක.

11. "උන්වහන්සේ ඉතා ඉක්මනින්ද නොවඩිනසේක. ඉතා සෙමින්ද නොවඩිත්. පිරිසෙන් වෙන්ව නොවඩිත්. ඒ භවත් ගෞතමයන් වහන්සේගේ කයෙහි සිවුර හනුඇටයෙන් උඩට පොරවා උදරය පෙනෙනසේ නොවඩියි. එක් උරයක් පොරවා තනය පෙනෙනසේ නොවඩියි. කයෙහි සිවුර දහඩියෙන් ඇලෙනසේ තදකොටද නොවඩිනසේක. සිවුර කයින් වූයේද නොවේ. ඒ භවත් ගෞතමයන්ගේ කයින් සිවුර වාතයෙන් ඉවතට නොයවයි. ඒ භවත් ගෞතමයන්ගේ කයෙහි රජස්දැලි නොගැල්වෙයි. උන්වහන්සේ ආරාමයට වැඩියේ පැනවූ අස්නෙහි වැඩ හිඳිනසේක. හිඳ පාදයන් සෝදන්නාහ. ඒ භවත් ගෞතමයන් වහන්සේ පාදයන් සැරසීමෙහි නොයෙදෙන සේක. උන්වහන්සේ පාදයන් සෝදා පර්යංක බැඳ කය කෙලින් තබා සිහිය එළවාගෙන වැඩ හිඳිනසේක. උන්වහන්සේ තමාහට විනාශය පිණිස අනුන්පෙළන්නේ විනාශය පිණිස නොසිතන සේක. දෙදෙනාගේම විනාශය පිණිස නොසිතන සේක. තමාට හිතවූවක් අනුන්ට හිතවූවක් දෙදෙනාටම හිතවූවක් සියලු ලෝකයටම හිතවූවක් ඒ භවත් ගෞතමයන් වහන්සේ සිතමින් වැඩහිඳින සේක. උන්වහන්සේ ආරාමයට වැඩියේ පිරිසට ධර්මය දෙශනා කරනසේක. ඒ පිරිස උසස් තන්හිලා කථා නොකරන සේක. ඒ පිරිස පහත් තන්හිලා කථා නොකරනසේක. ධර්ම කථාවෙන්ම ඒ පිරිස දක්වත්. කුසල් දහම් සමාදන් කරවත්. උත්සාහවත් කරවත්. සතුටුකරවත් පැහැදිලිවද, දැනීමෙහි

පොහොසත් බවද, මිහිරි බවද, කනට සුව බවද, විහිදී නොයනබවද, නොවිසිරෙන බවද, ගැඹුරු බවද, බොහෝ නාද ඇති බවද යන අංග අටන් යුක්තවූ ඝොෂයක් ඒ භවත් ගෞතමයන් වහන්සේගේ මුවින් පිටවෙයි. පිරිසේ පමණට ශබ්ද නගන ස්වරයන්වූ සේක. උන්වහන්සේගේ ඝොෂය පිරිසෙන් පිටතටද නොයයි. ඒ භවත් ගෞතමයන් විසින් ධර්මකථාවෙන් දක්වන ලද්දාවූ කුසල් දහම්හි සමාදන් කරවන ලද්දාවූ, උත්සාහවත් කරවන ලද්දාවූ සතුටු කරවන ලද්දාවූ, ඔව්හු උන්වහන්සේ හැරයාමට නොකැමැත්තෙන් හුනස්නෙන් නැගිට 'පින්වත්නි, වඩින්නාවූ ඒ භවත් ගෞතමයන් වහන්සේ අපි බලන්නෙමු. සිටියාවූ උන්වහන්සේ බලන්නෙමු. ඇතුළුගමට වඩින්නාවූ උන්වහන්සේ දුටුවෙමු. ඇතුළුගෙහි තුෂ්ණිම්භූතව වැඩ උන්නාවූ උන්වහන්සේ දුටුවෙමු. වළඳා අවසන්වී අනුමෝදන් කරන්නාවූ උන්වහන්සේ දුටුවෙමු. ආරාමයට වඩින්නාවූ, උන්වහන්සේ දුටුවෙමු. ආරාමයට ඇතුල්ව නිශ්ශබ්දව වැඩඋන්නාවූ, උන්වහන්සේ දුටුවෙමු. ආරාමයට පැමිණි පිරිසට දම්දෙසන්නාවූ උන්වහන්සේ දුටුවෙමු. ඒ භවත් ගෞතමයන් වහන්සේ මෙබඳුය. මෙබඳුය, මෙයටත් වඩා අධික ගුණ ඇතිසේකැයි ගුණ කියමින් යන්නාහ."

12. "මෙසේ කී කල්හි බ්‍රහ්මායු බ්‍රාහ්මණතෙමේ හුනස්නෙන් නැගිට උතුරුසළුව එක් අංශයෙක්හි කොට භාග්‍යවතුන් වහන්සේ යම් දිශාවකද, ඒ දිශාවට ඇඳිලි බැඳ වැඳ "ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා. ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේට නමස්කාර වේවා. ඒ භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා." තුන් වරක් ප්‍රීතිවාක්‍ය ප්‍රකාශ කෙළේය. අපි ඒ භවත් ගෞතමයන් වහන්සේ සමග කිසිකලෙක එක්වන්නෙමු නම්, ඉතා යෙහෙක. කිසියම් කථා සල්ලාපයක් වන්නේ නම්, ඉතා යෙහෙක" කියායි.

13. එකල්හි භාග්‍යවතුන් වහන්සේ වේදෙහ ජනපදයන්හි පිළිවෙලින් වඩනා සේක් මියුලු නුවර යම් තැනකද, එහි

පැමිණියහ. එකල භාග්‍යවතුන් වහන්සේ මියුලු නුවර මඛාදෙව නම් අඹ උයනෙහි වාසය කරණ සේක.

14. "ශාක්‍ය කුලයෙන් නික්ම පැවිදිවූ ශාක්‍යපුත්‍රවූ ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ වෙදෙහ ජනපදයෙහි චාරිකාවෙහි වඩින්නේ පන්සියයක් මහත් භික්ෂු සංඝයා සමග මියුලු නුවරට පැමිණ, මියුලු නුවරෙහි මඛාදෙව නම් අඹ උයනෙහි වාසය කරන සේකැයි" මියුලු නුවරෙහි මඛාදෙව නම් අඹ උයනෙහි වාසය කරන සේකැයි" මියුලු නුවරවාසී බ්‍රාහ්මණ ගෘහපතියෝ ඒ භවත් ගෞතමයන් වහන්සේ පිළිබඳ වනාහි "ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කාරණයෙනුදු අර්හත්හ, සම්‍යක් සම්බුද්ධයහ, විජ්ජාචරණ සම්පන්නයහ, සුගතයහ, ලොකවිදූහ, අනුත්තරයහ, පුරිසදම්ම සාරථියහ, දෙවි මිනිසුන්ට ශාස්තෘහ, බුද්ධයහ, භාග්‍යවත්හ, උන්වහන්සේ දෙවියන් සහිතවූ මරුන් සහිතවූ, බඹුන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ, රජුන් හා මිනිසුන් සහිතවූ, සත්ව වර්ගයා ඇතුළු සියලු ලොකය තමන් වහන්සේම මනාව පැහැදිලිකොට දැන ප්‍රකාශ කරණ සේක. උන්වහන්සේ මුල මැද අග යන තුන් තන්හි යහපත්වූ, අර්ථ සහිතවූ, ව්‍යඤ්ජන සහිතවූ, සම්පූර්ණවූ, පිරිසිදුවූ, බ්‍රහ්මචර්යාව ප්‍රකාශ කරණ සේක. එබඳුවූ රහතුන්ගේ දැකීමක් වේ නම් එය යහපත්මැයි කියායි". ඉක්බිති මියුලු නුවර වැසි බ්‍රාහ්මණ ගෘහපතියෝ භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද, එතැනට ගියහ. ගොස් සමහරු භාග්‍යවතුන් වහන්සේ වැඳ එක්පසෙක හුන්හ. සමහරු භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවූහ. සතුටුවිය යුතුවූ, සිහිකටයුතුවූ කථාව කොට නිමවා එක් පසෙක හුන්හ. සමහරු භාග්‍යවතුන් වහන්සේ යම් දෙසකද එදෙසට ඇඳිලි බැඳ වැඳ එකත්පසෙක හුන්හ. සමහරු භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි තමන්ගේ නාම ගොත්‍ර කියා එක් පසෙක උන්හ. සමහරු නිශ්ශබ්දවම එක් පසෙක උන්හ. ශාක්‍යකුලයෙන් නික්ම පැවිදිව ශාක්‍යපුත්‍රවූ ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ මියුලු නුවරට පැමිණ මියුලු නුවර මඛාදෙව අඹ උයනෙහි වැඩවාසය කරතියි' බ්‍රහ්මායු බ්‍රාහ්මණ තෙමේ ඇසීය. එකල්හි බ්‍රහ්මායු

බ්‍රාහ්මණ තෙමේ බොහෝ තරුණයන් සමග මඛාදෙව අඹ වනය යම් තැනකද, එතැනට පැමිණියේය. ඉක්බිති අඹ උයනට සමීපයේදී බ්‍රහ්මායු බ්‍රාහ්මණයාට මෙබඳු සිතක් විය.

**15.** "ඒ මම පළමුකොට නොදන්වා ශ්‍රමණ ගෞතමයන් වහන්සේ දැකීමට යන්නෙම් නම් මෙය මට නුසුදුසුයයි, සිතීය. අනතුරුව බ්‍රහ්මායු බ්‍රාහ්මණ තෙමේ එක් තරුණයෙකුට කථාකෙළේය. "තරුණය, නුඹ එව. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ යම් තැනෙකද, එහි යව. ගොස් මගේ වචනයෙන් ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ ආබාධ නැති බව, සැහැල්ලු නැති බව, ශරීර බලය, පහසු විහරණ ඇති බව විමසව්". භවත් ගෞතමයන් වහන්ස, බ්‍රහ්මායු බ්‍රාහ්මණ තෙමේ භවත්ගෞතමයන් වහන්සේට ආබාධ නැති බව, ශරීරයේ සැහැල්ලු බව, ශරීර බලය, සැපවිහරණ ඇති බව අසයි, කියාය. තවද බ්‍රහ්මායු බ්‍රාහ්මණ තෙමේ ජරාවට පැමිණියෙක, මහලුය වයසට පැමිණියෙක, එක්සියවිසි වයස් ඇත්තෙක, හෙතෙම භවත් ගෞතමයන් වහන්සේ දැකීමට කැමැත්තේයයිද කියව".

**16.** "එසේය ස්වාමීනියි" ඒ තරුණයා බ්‍රහ්මායු බ්‍රාහ්මණයාට උත්තර දී භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද, එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටුවිය යුතුවූ සිහිකටයුතුවූ කථාව කොට නිමවා එක් පසෙක සිටියේය. එකත්පසෙක සිටි ඒ තරුණයා භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "භවත් ගෞතමයන් වහන්ස, බ්‍රහ්මායු බ්‍රාහ්මණ තෙමේ භවත් ගෞතමයන් වහන්සේගේ ආබාධ නැති බව, ශරීරයේ සැහැල්ලු බව, ශරීර බලය, සැපවිහරණය අසයි". "භවත් ගෞතමයන් වහන්ස, බ්‍රහ්මායු බ්‍රාහ්මණ තෙමේ ජරාවට පැමිණියෙක, වෘද්ධය, මහලුය, අර්ධගතය, වයසට පැමිණියේය, උත්පත්තියෙන් අවුරුදු එක්සියවිස්සක් ආයුෂ විය. නාම නිඝණ්ඩු ක්‍රියාකල්ප විකල්ප ශික්ෂානිරුක්ති යන ප්‍රභෙදයන් ඇති, ඉතිහාසය පස්වෙනි කොට වෙදත්‍රයයේ කෙළවරට ගියේය. පද හා ව්‍යාකරණ හදාරන ලද්දේය. ලොකායත ශාස්ත්‍රයෙහිද මහාපුරිස ලක්ෂණයන්හිද සම්පූර්ණය.

"ස්වාමීනි, මිථිලාවෙහි යම් පමණ බ්‍රාහ්මණ ගෘහපතියෝ වාසය කරත්ද, ඔවුනතුරෙන් බ්‍රහ්මායු බ්‍රාහ්මණ තෙමේ වස්තුවෙන්ද අග්‍රය, ඔවුනතුරෙන් බ්‍රහ්මායු බ්‍රාහ්මණ තෙමේ මන්ත්‍රයෙන්ද අග්‍රය, ඔවුනතුරෙන් බ්‍රහ්මායු බ්‍රාහ්මණ තෙමේ වයසින් හා යසසින් ද අග්‍රය, හෙතෙම භවත් ගෞතමයන් වහන්සේ දැකීම කැමැත්තෙන් සිටීයයි" කීය. "මානවකය, දැන් බ්‍රහ්මායු බ්‍රාහ්මණ තෙමේ ඊට කාලය දන්නේයයි" වදාළේය. එකල්හි ඒ මානවකයා බ්‍රහ්මායු බ්‍රාහ්මණයා යම් තැනෙකද, එතැනට ගියේය. ගොස් බ්‍රහ්මායු බ්‍රාහ්මණයාට 'භවත් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ විසින් කරණ ලද අවකාශ ඇත්තේය. දැන් පින්වතුන් වහන්සේ කල් දන්නේයයි" කීය.

17. ඉක්බිති බ්‍රහ්මායු බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට ගියේය. ඒ මියුලු නුවරවාසී ශ්‍රමණ ගෘහපති පිරිස එන්නාවූ බ්‍රහ්මායු බ්‍රාහ්මණයා දුරදීම දුටුවාහුය. දුටු කෙණෙහි ප්‍රසිද්ධවූ කීර්ති ඇති ඔහුට අවකාශ දුන්නේය. අනතුරුව බ්‍රහ්මායු බ්‍රාහ්මණයා ඒ පිරිසට මෙසේ කීය. "පින්වත කම් නැත. තොපි සිය අසුන්හි හිඳිව්. මම මෙහි ශ්‍රමණ ගෞතමයන් වහන්සේ සමීපයෙහි හිඳගන්නෙමියි" කීය. ඉක්බිති බ්‍රහ්මායු බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටුවිය යුතුවූ සිහිකටයුතුවූ කථාව කොට නිමවා එක් පසෙක හුන්නේය. එක් පසෙක හුන්නාවූ බ්‍රහ්මායු බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේගේ කායයෙහි දෙතිස්මහාපුරිස් ලකුණු පරීක්ෂා කෙළේය. බ්‍රහ්මායු බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේගේ ශරීරයෙහි ලකුණු දෙකක් හැර බොහෝසෙයින් දෙතිස්මහා පුරුෂ ලක්ෂණ දුටුවේය. කොසොහිත වත්ථගුය්හතා ලක්ෂණය හා පහූතජිව්හතා ලක්ෂණය යන ලක්ෂණ දෙකෙහි සැක කරයි. සැකයෙන් නොමිදෙයි. නොපැහැදෙයි. එකල්හි බ්‍රහ්මායු බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේට ගාථාවන්ගෙන් මෙසේ කීය.

"1. ගෞතමයන් වහන්ස, මා විසින් පින්වතුන් වහන්සේගේ ශරීරයෙහි යම්බඳු දෙතිස්මහාපුරිස් ලකුණු අසන ලද්දේද ඔවුන් අතුරෙන් දෙකක් නොදකිමි.

"2. නරොත්තමයන් වහන්ස, පින්වතුන් වහන්සේගේ වස්ත්‍රයෙන් වැසිය යුතුවූ කොසොහිත ලක්ෂණය කිමෙක්ද? ස්ත්‍රීලිංග නාමයකින් කියවෙන පහූතජිව්හතා ලක්ෂණය කිමෙක්ද?

"3. කිමෙක්ද? පහූතජිව්හතා ලක්ෂණය ඇත්තෙහිද? එය යම් ආකාරයකින් දැනගනිමුද? ඒ ආකාරයෙන් නිකුත් කොට දක්වනු මැනවි". ඍෂීන් වහන්ස, අපගේ මේ සැකය දුරුකළ මැනව.

18. "යමක් දැනගැනීමට කැමතිවන ලද්දේද, එය කරන ලද අවකාශ ඇතිව මෙලොව යහපත පිණිසද, පරලොව යහපත පිණිසද අසමු." ඉක්බිති භාග්‍යවතුන් වහන්සේට 'මේ බ්‍රහ්මායු බ්‍රාහ්මණ තෙමේ මාගේ ලක්ෂණය දෙකක් හැර බොහෝසෙයින් දෙතිස්මහාපුරිස් ලකුණු දකියි. කොසොහිත වත්ථගුය්හ ලක්ෂණය හා පහූතජිව්හතා ලක්ෂණය යන දෙකෙහි සැකකරයි. සැකයෙන් නොමිදෙයි. නොපැහැදෙයි' යන අදහස පහළවිය. අනතුරුව භාග්‍යවතුන් වහන්සේ බ්‍රහ්මායු බ්‍රාහ්මණ තෙමේ භාග්‍යවතුන් වහන්සේගේ කොසොහිතවත්ථගුය්හ ලක්ෂණ යම්සේ දකීද, එබඳුවූ ඍද්ධියක් පෑහ. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ දිව බැහැර කොට දෙකන් සිදුරු පිරිමැදිසේක. දෙ නාසා සිදුරු මැදි සේක. මුළු නලල්තලය වැසූසේක. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බ්‍රහ්මායු බමුණාට ගාථාවන් දෙශනා කළ සේක.

"1. බ්‍රාහ්මණය, (තා විසින්) යම් ඒ දෙතිස්මහාපුරුෂ ලකුණු අසන ලද්දේද, ඒ සියලු ලක්ෂණ මාගේ ශරීරයෙහි ඇත්තේය. තොපි සැක නොකරව්.

"2. දතයුතු සියල්ල දැනගන්නා ලදී. වැඩිය යුතු සියල්ලද වඩන ලදී. මා විසින් පහකළ යුත්ත පහකරනලදී. බ්‍රාහ්මණය, එහෙයින් මම බුද්ධ නම් වෙමි.

"3. යමක් දැනගැනීමට කැමැත්තේ නම් එය මෙලොව යහපත පිණිසද පරලොව යහපත පිණිසද, කරනලද අවකාශ ඇත්තේ අසව.

**19.** ඉක්බිති බ්‍රහ්මායු බ්‍රාහ්මණයාට ශ්‍රමණ ගෞතමයන් වහන්සේ විසින් කරනලද අවකාශ ඇත්තේ වෙමි. 'මම මෙලොව අර්ථය පිණිස හෝ පරලොව අර්ථය පිණිස හෝ කුමක් ශ්‍රමණ ගෞතමයන් වහන්සේගෙන් විචාරන්නෙම්දැයි, සිතක් පහළ විය. ඉක්බිති බ්‍රහ්මායු බමුණාට මෙබඳු සිතක් පහළ විය. 'මම වනාහි මෙලොව අර්ථයන්හි දක්ෂයෙක්මි. අන්‍යයෝද, මා අතින් මෙලොව අර්ථයන් අසත්. මම ශ්‍රමණ ගෞතමයන් වහන්සේ අතින් පරලොව අර්ථයම අසන්නෙම් නම් යෙහෙකි'. කියායි අනතුරුව බ්‍රහ්මායු බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේට ගාථාවන්ගෙන් මෙසේ කීයේය.

"1. ස්වාමීනි, කෙසේ නම් බ්‍රාහ්මණයෙක් වන්නේද, කෙසේ නම් වෙදයෙහි පරතෙරට ගියෙක් වන්නේද, ස්වාමීනි, කෙසේ නම් ත්‍රිවිද්‍යා ඇත්තෙක් වන්නේද, පිරිසිදුවීම කුමක්යයි කියනු ලැබේද?

"2. ස්වාමීනි, කෙසේ නම් රහත් වූවෙක් වන්නේද, කෙසේ නම් සම්පූර්ණවූ බ්‍රහ්මචර්යාව ඇත්තෙක් වන්නේද, ස්වාමීනි, කෙසේ නම් මුනි නම් වූවෙක් වන්නේද, කවරෙක් බුද්ධයයි කියනු ලැබේද?"

**20.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බ්‍රහ්මායු බමුණාට ගාථාවන් කීය.

"1. යමෙක් පෙර විසූ භව පිළිබඳ දනීද, ස්වර්ගය හා අපාය දනීද, ඉක්බිති ඉපදීම කෙළවර කිරීමට පැමිණියේද, අවබොධ කොට කෙළවරට පැමිණියේද, අර්හත් මාර්ග ඥාන මුනි භාවයෙන් යුක්තවේද,

"2. සියලු ආකාරයෙන් රාගයෙන් මිදුනු පිරිසිදු සිත දනීද, ප්‍රහීනකළ ජාති ජරා මරණ ඇති, සම්පූර්ණ සතරමාර්ග බ්‍රහ්මචර්යා ඇති, සියලු ධර්මයන්ගේ කෙළවරට පැමිණි එබඳුවූ පුද්ගල තෙමේ බුද්ධයයි කියනු ලැබේ.

**21.** මෙසේ වදාළ කල්හි බ්‍රහ්මායු බ්‍රාහ්මණයා හුනස්නෙන් නැගිට උතුරුසළුව ඒකාංශකොට භාග්‍යවතුන් වහන්සේගේ

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

පාදයන්හි සිරසින් වැටී වැඳ භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් මුවින් සිඹියි. අතින්ද පිරිමදියි. "ස්වාමීනි, ගෞතමයන් වහන්ස, මම බ්‍රහ්මායු බ්‍රාහ්මණයා වෙමි. ස්වාමීනි, ගෞතමයන් වහන්ස, මම බ්‍රහ්මායු බ්‍රාහ්මණයා වෙමියි. නමද අස්වයි". ඉක්බිති ඒ පිරිස 'ශ්‍රමණයන් වහන්සේගේ මහත් ඍද්ධිභාවය, මහානුභාවය පින්වත, ඒකාන්තයෙන් ආශ්චර්යයි පින්වත, ඒකාන්තයෙන් පුදුමයි. යම්හෙයකින් නම් මේ ප්‍රසිද්ධ කීර්ති ඇති බ්‍රාහ්මායු බ්‍රාහ්මණයා මෙබඳුවූ ඉතා මහත් ගෞරවයක් කරන්නේයයි" ආශ්චර්යවූ සිත් ඇත්තේ විය. අනතුරුව භාග්‍යවතුන් වහන්සේ බ්‍රහ්මායු බ්‍රාහ්මණයාට මෙසේ වදාළහ. "බ්‍රාහ්මණය, කම් නැත. නැගිටුව. නුඹ තම ආසනයෙහි හිඳගනුව. යම් කරුණකින් තාගේ සිත මා කෙරෙහි පැහැදුනේය". එකල්හි බ්‍රහ්මායු බ්‍රාහ්මණ තෙම තම ආසනයෙහි හුන්නේය.

**22.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ බ්‍රහ්මායු බමුණාට පිළිවෙල කථාව දෙසූ සේක. කවරේද යත්? දාන කථාවය, සීලකථාවය, ස්වර්ගකථාවය, කාමයන්ගේ ආදීනවය, ලාමක බවය, කිලුටුබවය, නෛෂ්ක්‍රම්‍යයෙහි ආනිසංසය ප්‍රකාශ කළ සේක. භාග්‍යවතුන් වහන්සේ යම් කලෙක බ්‍රහ්මායු බ්‍රාහ්මණයාහට නිරොගිවූ, මෘදුවූ, නීවරණ රහිතවූ, සතුටුවූ ප්‍රසන්නවූ සිත ඇතිවීයයි දත් සේක් නම්, එකල දුක්ඛය සමුදය, නිරොධය මාර්ගය යන බුදුවරයින් තමන් විසින්ම අවබොධ කළ චතුරාර්ය සත්‍ය ධර්මය ප්‍රකාශ කළ සේක. යම් සේ පහවූ කාලවර්ණ ඇති පිරිසිදු වස්ත්‍රයක් මනාකොට රජන් (සායම්) පිළිගන්නේද, එපරිද්දෙන්ම බ්‍රහ්මායු බ්‍රාහ්මණයාහට ඒ හුන් ආසනයෙහිම යම්කිසිවක් උපදනා ස්වභාව ඇත්තේද, ඒ සියල්ල වැනසීම ස්වභාවකොට ඇත්තේය, යන පහවූ කෙලෙස් රජස් ඇති පහවූ කෙලෙස් මල ඇති ධර්ම චක්ෂුස (සොතාපත්තිමාර්ග ඥානය) උපන්නේය. ඉක්බිති බ්‍රහ්මායු බ්‍රාහ්මණයා දක්නාලද ධර්ම ඇත්තේ, පැමිණි ධර්ම ඇතියේ, අවබොධ කළ ධර්ම ඇතියේ, දැඩිව ගත් ධර්ම ඇතියේ, එතර කළ විචිකිච්ඡා ඇතියේ, විසාරද වූයේ, ශාසනයෙහි අන් ධර්මයක් නොඅදහන බවට පැමිණියේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "භවත්

ගෞතමයන් වහන්ස, ඉතා යහපති භවත් ගෞතමයන් වහන්ස, ඉතායහපති, "භවත් ගෞතමයන් වහන්ස, යම්සේ යටිකුරු කරනලද්දක් උඩුකුරු කරන්නේද, වැසුනු දෙයක් විවෘත කරන්නේද, මුලාවූවකුට මාර්ගය කියන්නේද, ඇස් ඇත්තෝ වස්තූන් දකිත්වායි අන්ධකාරයෙහි තෙල් පහනක් දල්වන්නේද, එපරිද්දෙන් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් ලෙසින් ධර්මය දෙශනා කරණ ලදී. භවත් ගෞතමයන් වහන්ස, මේ මම භවත් ගෞතමයන් වහන්සේද ධර්මය හා භික්ෂු සංඝයාද සරණකොට යමි. භවත් ගෞතමයන් වහන්සේ මා අද පටන් දිවිතෙක් සරණගිය උපාසකයකු කොට පිළිගන්නා සේක්වා. භවත් ගෞතමයන් වහන්සේ භික්ෂුසංඝයා සමග මාගේ (ගෙදර) සෙට දින බත් පිණිස ඉවසන සේක්වා". භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්ද වීමෙන් ඉවසූ සේක. එකල්හි බ්‍රහ්මායු බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේගේ ඉවසීම දැන හුනස්නෙන් නැගිට භාග්‍යවතුන් වහන්සේ වැඳ පැදකුණු කොට ගියේය.

ඉක්බිති බ්‍රහ්මායු බ්‍රාහ්මණ තෙමේ ඒ රාත්‍රිය ඉක්මීමෙන් සිය නිවසෙහි ප්‍රනීතවූ කෑ යුතුවූ අනුභව කළ යුතුවූ දේ පිළියෙල කොට භාග්‍යවතුන් වහන්සේට කාලය දැන්වීය. භවත් ගෞතමයන් වහන්ස, සුදුසු කාලයයි, බත් පිළියෙල කරනලදී" (කියායි) එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙන බ්‍රහ්මායු බ්‍රාහ්මණයාගේ ගෙදර යම් තැනෙකද, එතැනට පැමිණි සේක. පැමිණ පැනවූ අස්නෙහි භික්ෂුසංඝයා සමග වැඩහුන් සේක. ඉක්බිති බ්‍රහ්මායු බ්‍රාහ්මණයා බුදුන් ප්‍රධාන භික්ෂුසංඝයා සත්දවසක් ප්‍රණීතවූ කෑ යුතුවූ බුදිය යුතුවූ ආහාරපාන වර්ගවලින් සියතින් වැළඳවීය. කැමතිසේ වැළඳවීය. අනතුරුව භාග්‍යවතුන් වහන්සේ ඒ සත්දවස ඇවෑමෙන් වේදෙහ ජනපදයෙහි චාරිකාවෙහි වැඩි සේක. ඉක්බිති බ්‍රහ්මායු බ්‍රාහ්මණ තෙම භාග්‍යවතුන් වහන්සේ වැඩිය නොබෝ කලකින් කළුරිය කෙළේය. ඉක්බිති බොහෝ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියහ. පැමිණ භාග්‍යවතුන් වහන්සේ වැඳ එක්පසෙක හුන්හ. එක්

පසෙක උන්නාවූ ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීහ. "ස්වාමීනි, බ්‍රහ්මායු බ්‍රාහ්මණයා කළුරිය කෙළේය. ඔහුගේ ගතිය කුමක්ද? ඔහුගේ පරලොව කුමක්ද?" "මහණෙනි, බ්‍රහ්මායු බ්‍රාහ්මණයා පණ්ඩිතයෙකි. ධර්මයට අනුව පිළිපැද්දේය. ධර්මය කරණකොටම නොවෙහෙසීය. මහණෙනි, බ්‍රහ්මායු බ්‍රාහ්මණ තෙමේ කාමලොකය පිළිබඳව සංයෝජන පස නැතිකිරීමෙන් ඒ බඹලොවින් නැවත නොඑන එහිදී පිරිනිවෙන ඕපපාතික පුද්ගලයෙක්වීයයි" වදාළ සේක, සතුටුවූ සිත් ඇති ඒ භික්ෂූහු භාග්‍යවතුන් වහන්සේගේ දෙශනාව සතුටින් පිළිගත්හ.

බ්‍රහ්මායු සූත්‍රය නිමි (4-1)

---

## 42. සේල සූත්‍රය.

1. මා විසින් මෙසේ අසන ලදී. එක්සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ එක් දහස් දෙසිය පනහක් පමණ මහත් භික්ෂු සංඝයා සමග අඞ්ගුත්තර ජනපදයෙහි චාරිකාවෙහි හැසිරෙනසේක් ආපණ නම්වූ අඞ්ගුත්තර නියම් ගම යම් තැනකද, එහි කල් යැවූ සේක. කේණිය ජටිල තෙමේ ශාක්‍යපුත්‍රවූ ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ ශාක්‍ය කුලයෙන් නික්ම පැවිදිව එක්දහස් දෙසියපනහක් පමණ මහත් භික්ෂු සංඝයා සමග අඞ්ගුත්තර ජනපදයෙහි චාරිකා කරන සේක් ආපණ නම් නියම් ගමට පැමිණි සේකැයි' ඇසීය. ඒ භාග්‍යවත් ගෞතමයන් වහන්සේගේ මෙසේ යහපත්වූ කීර්ති ශබ්දයක් පැන නැංගේය. ඒ භාග්‍යවතුන් වහන්සේ මෙකරුණිනුදු අර්හත්හ. සම්‍යක් සම්බුද්ධයහ, විද්‍යාචරණ සම්පන්නයහ, සුගතයහ, ලොකවිදූහ, නිරුත්තරවූ පුරිෂ දම්මසාරථිහ, දෙවි මිනිසුන්ට ශාස්තෘහ, බුද්ධයහ, භාග්‍යවත්හ, යනුයි. උන්වහන්සේ දෙවියන් සහිතවූ, මරුන් සහිතවූ, බ්‍රහ්මයන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ, මිනිසුන් සහිතවූ, සත්ව වර්ගයා ඇතුළු මේ ලොකය තමන් වහන්සේම මනාව දැන අවබොධ කොට ප්‍රකාශ කරණසේක. උන්වහන්සේ මුල මැද අග යන තුන් තන්හි යහපත්වූ අර්ථ සහිතවූ, (ව්‍යඤ්ජන

සහිතවූ) දස වැදෑරුම් අක්ෂර සම්පත්තියෙන් යුක්තවූ සියලු ආකාරයෙන් සම්පූර්ණවූ ධර්මය දෙශනා කරණ සේක. පිරිසිදුවූ ශාසන බ්‍රහ්මචර්යය ප්‍රකාශ කරණසේක. එබඳුවූ රහතුන්ගේ දැකීමක්වේ නම් ඒ යහපත්මැයි කියායි.

**2.** ඉක්බිති කේණිය ජටිලයා භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද, එතැනට එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු විය යුතු වූත් සිහිකටයුතු වූත් කථාකොට නිමවා එක් පැත්තක හුන්නේය.

එක් පැත්තක උන්නාවූ කේණිය ජටිලයාට භාග්‍යවතුන් වහන්සේ දැහැමි කථාවෙන් කුසල් දහම් විස්තර කළසේක. කුසල් දහම්හි සමාදන් කරවූසේක. නැවත නැවත උත්සාහවත් කරවූසේක. සතුටු කරවූසේක. ඉක්බිති කේණිය ජටිලයා භාග්‍යවතුන් වහන්සේ විසින් ධර්ම කථාවෙන් කුසල් දහම් විස්තර කරන ලද්දේ, කුසල ධර්මයන්හි සමාදන් කරවන ලද්දේ, නැවත නැවත උත්සාහවත් කරවන ලද්දේ, සතුටු කරවන ලද්දේ, භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "භවත් ගෞතමයන් වහන්සේ භික්ෂු සංඝයා සමග හෙට මාගේ දානය (ඉවසා වදාරණ) පිළිගන්නා සේක්වා". මෙසේ කී කල්හි භාග්‍යවතුන් වහන්සේ කේණිය ජටිලයාට මෙසේ කීහ. "කේණියය, භික්ෂු සංඝයා මහත්ය. භික්ෂූහු එක් දහස් දෙසිය පනහක් වෙත්. නුඹ වනාහි බමුණන් කෙරෙහි (අතිශයින් ප්‍රසන්නය.) බොහෝ පැහැදුනේය." කේණිය ජටිලයා දෙවනුවත් භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීයේය. "භවත් ගෞතමයන් වහන්ස, භික්ෂුසංඝයා කොපමණ වෙත්ද?" භික්ෂූහු එක්දහස් දෙසිය පනහක් වෙති. මමත් බමුණන් කෙරෙහි බොහෝ පැහැදුනේ වෙමි. "භවත් ගෞතමයන් වහන්සේ භික්ෂු සංඝයා සමග හෙට මාගේ දානය පිළිගන්නා (ඉවසා වදාරණ) සේක්වා" දෙවෙනුවත් භාග්‍යවතුන් වහන්සේ කේණිය ජටිලයාට මෙසේ වදාළහ. "කේණියය, භික්ෂු සංඝයා මහත්ය. භික්ෂූහු එක්දහස් දෙසිය පනහක් වෙති. නුඹ වනාහි බමුණන් කෙරෙහි (අතිශයින් ප්‍රසන්නය.) බොහෝ පැහැදුනේය." තෙවනුවත් කේණිය ජටිලයා

භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "භවත් ගෞතමයන් වහන්ස, භික්ෂු සංඝයා කොපමණ වෙත්ද?" "භික්ෂූහු එක්දහස්දෙසිය පනහක්වෙති." "මම වනාහි බමුණන් කෙරෙහි බොහෝ පැහැදුනේ වෙමි. භවත් ගෞතමයන් වහන්සේ භික්ෂු සංඝයා සමග හෙට මාගේ දානය (ඉවසා වදාරන) පිළිගන්නා සේක්වා" භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්ද වීමෙන් ඉවසා වදාළසේක.

3. ඉක්බිති කේණිය ජටිලයා භාග්‍යවතුන් වහන්සේ ඉවසා වදාළ බව දැන හුනස්නෙන් නැගිට තමාගේ අසපුව යම් තැනෙකද, එතැනට එළඹියේය. එළඹ (මිත්‍රාමාත්‍යන්ද) මිතුරු ඇමතියන්ටද සහලේ නෑයන්ටද, කථාකළේය.

"පින්වත් (මිත්‍රාමාත්‍යයයෝ) මිත්‍ර ඇමතියෝ සහලේ නෑයෝ මා කියන්නක් අසත්වා. මා විසින් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ භික්ෂු සංඝයා සමග සෙට දවස බත් පිණිස ආරාධනා කරන ලද්දේය. යම්කිසිවකින් මට කාය වතාවතක් කරන්නහුද?" "එසේය. ස්වාමීනි"යි කේණිය ජටිලයාගේ (මිත්‍රාමාත්‍යයෝ) මිත්‍ර අමාත්‍යයෝ සහලේ නෑයෝ කේණිය ජටිලයාට පිළිතුරුදී සමහරු උදුන් සාරත්, සමහරු දර පලත්. සමහරු භාජන සෝදති. සමහරු දියමැණික් පිහිටුවත්. සමහරු අසුන් පනවත්. කේණිය ජටිලයා වනාහි තෙමේම මණ්ඩල මාලය (වස්ත්‍ර මණ්ඩපය) පිළියෙළ කරයි.

4. එසමයෙහි වනාහි නාමනිඝණ්ඩු-ක්‍රියා කල්ප විකල්ප ශික්ෂා නිරුක්ති යන ප්‍රභේදයන් ඇති, ඉතිහාසය පස්වැනි කොට ඇති වෙදත්‍රයයේ කෙළවරට ගියාවූ, පද හා ව්‍යාකරණ හදාරන්නාවූ, විතණ්ඩ ශාස්ත්‍රයේත්, මහාපුරුෂ ලක්ෂණ ශාස්ත්‍රයේත්, අති දක්ෂවූ "සෙලබ්‍රාහ්මණතෙමේ ආපණ ගමේ වාසය කරයි. තුන් සියයක් මානවකයන්ට මන්ත්‍ර හදාරවයි. එසමයෙහි වනාහි කේණිය ජටිලයා සේලබමුණු කෙරෙහි අතිශයින් ප්‍රසන්නවූයේ වෙයි. එකල්හි සේලබමුණා තුන්සියයක් මානවකයන් පිරිවරණ ලදුව පා ගමනින් සක්මන් කරනුයේ හැසිරෙනුයේ කේණිය ජටිලයාගේ ආශ්‍රමය යම් තැනෙකද,

එතැනට එළඹියේය. යම්කිසි කාරණයක් නිසා කේණිය ජටිලයාගේ සමහර ජටිලයන් උඳුන් හාරනුද, සමහර ජටිලයන් දර පලනුද, සමහර ජටිලයන් බඳුන් සෝදනුද, සමහර ජටිලයන් උදකමනි පිහිටුවනුද, සමහර ජටිලයන් අසුන් පනවනුද, තමාම මණ්ඩලමාලය පිළියෙළ කරන්නාවූ කේණිය ජටිලයාද "සේල" බමුණා දුටුවේය. දැක කේණිය ජටිලයාට මෙසේ කීය. "කිමෙක්ද? පින්වත් කේණියට ආවාහයක් හෝ වන්නේද, විවාහයක් හෝ වන්නේද, මහායාගයක් පිළියෙල කරන ලද්දේද, බලසේනාවන් සමග සේනිය බිම්බිසාර රජ සෙට දවස බත් පිණිස පවරණ ලද්දේද?" "භවත් සේලය, මට ආවාහයක් හෝ නොවන්නේය. විවාහයකුදු නොවන්නේය. බල සේනාවන් සමග සෙට දවස බත් පිණිස මාගධ සේනිය බිම්බිසාර රජද නොපවරණ ලද්දේය. යලිදු මහායාගයක් (දානයක්) පිළියෙල කරන ලද්දේය. ශාක්‍යපුත්‍ර වූ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ශාක්‍යකුලයෙන් නික්ම පැවිදිව අඞ්ගුත්තර ජනපදයෙහි චාරිකා කරනසේක් එක්දහස් දෙසිය පනහක් භික්ෂූහු සංඝයා සමග ආපණ ගමට පැමිණිසේක. ඒ භවත් ගෞතමයන් වහන්සේගේ වනාහි මෙසේ යහපත්වූ කීර්ති ශබ්දයක් පැනනැංගේය. මෙකරුණිනුදු ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත්හ, සම්‍යක් සම්බුද්ධයහ, විද්‍යාචරණ සම්පන්යහ, සුගතයහ, ලොකවිදූහ, නිරුත්තරවූ පුරුෂදම්මසාරථිහ, දෙව්මිනිසුන්ට අනුශාසකයහ, බුද්ධයහ, භාග්‍යවත්හ, උන්වහන්සේට භික්ෂුසංඝයා සමග සෙට දානය සඳහා මා විසින් ආරාධනා කරන ලදී." "භවත් කේණිය, බුද්ධයයි කීවෙහිද?" "භවත් සේලය බුද්ධයයි කියමි". "භවත් කේණිය, බුද්ධයයි කීයෙහිද?" භවත් සේලය, බුද්ධයයි කියමි", "භවත් කේණිය බුද්ධයයි කීවෙහිද?" "භවත් සේලය බුද්ධයයි කියමි."

**5.** ඉක්බිති සේලබමුණාට මෙබඳු සිතක්විය. 'ලොකයෙහි යම් මේ බුද්ධ යන ශබ්දයද දුර්ලභය. අපගේ මන්ත්‍රයන්හි දෙතිස් මහාපුරිස් ලකුණු ආවේමය. ඒ ලක්ෂණයන්ගෙන් යුක්තවූ මහාපුරුෂයාහට ගති දෙකෙක්ම වෙති. අනිකෙක් නැත. ඉදින් හෙතෙම ගිහිගෙයි වසයිනම් ධාර්මිකවූ ධර්මරාජන්වූ

චාතුර්දීපයට අධිපතිවූ දිනන සුලුවූ ජනපදයන්හි ස්ථිතිප්‍රාන්තවූ සත්රුවනින් සමන්විතවූ සක්විති රජවෙයි. මොවුහු ඔවුන්ගේ සත්රුවන්හුවෙත්. කවරහුයත්? චක්‍රරත්නය හස්තිරත්නය, අශ්වරත්නය, මාණික්‍යරත්නය, ස්ත්‍රිරත්නය, ගෘහපතිරත්නය, සත්වැනි වූ පරිනායක රත්නයද යන (මොවුහුයි) ශූරවූ දිව්‍යපුත්‍රයන්ට සමානවූ ශරීර ඇත්තාවූ පරසතුරු සේනාවන් මඩින්නාවූ දහසකටත් අධිකවූ පුත්‍රයෝ ඒ සක්විතිරජුට වෙත්. හෙතෙම සයුර කෙළවර කොට ඇති මේ පොළොව දඬුවම් කිරීම නැතිව යුධකිරීම් නැතිව ධර්මයෙන් දිනා අධිපතිව වෙසෙයි. ඉදින් හෙතෙම ගිහිගෙන් නික්ම අනගාරිය ශාසනයෙහි පැවිදිවෙයිනම් ලෝකයෙහි දුරුකළ රාගාදිය ඇත්තාවූ, අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධ වෙයි. පින්වත් කේණිය, දැන් ඒ අර්හත්වූ, සම්‍යක් සම්බුද්ධවූ භවත් ගෞතමයන් වහන්සේ කොතැන්හි වාසය කෙරෙත්ද?" මෙසේ කී කල්හි කේණිය ජටිලයා දකුණු අතගෙන සේල බමුණාට මෙසේ කීය. "භවත් සේලය, මේ නිල්වන් රොද යම් තැනෙක්හිද එතැන්හිය". එකල්හි සේල බමුණා තුන් සියයක් මානවකයන් සමග භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද, එතැනට එළඹියේය. ඉක්බිති සේල බමුණා ඒ මානවකයන් ඇමතීය. "භවත්හු පයින් පය තබන්නාහු නිශ්ශබ්දව එත්වා. ලංවීමට පහසුනොවූ ඒ භාග්‍යවතුන් වහන්සේලා තනිව හැසිරෙන සිංහයන් වෙති. යම් කලෙක මම ශ්‍රමණ ගෞතමයන් වහන්සේ සමග කථා කරන්නේනම් පින්වත්හු මාගේ කථාව අතරින් කථා නොහෙලත්වා. භවත්හු මාගේ කථාවේ කෙළවර බලාපොරොත්තු වෙත්වා".

**6.** ඉක්බිති, සේල බමුණා භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට එළඹියේය. එළඹ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවිය. සතුටුවිය යුතුවූත්, සිහිකටයුතුවූත්, කථාව කොට නිමවා එකත් පසෙක උන්නේය. එකත් පසෙක උන්නාවූ සේල බ්‍රාහ්මණයා, භාග්‍යවතුන් වහන්සේගේ කයෙහි දෙතිස් මහා (පුරුෂ ලක්ෂණ) සෙවීය. සේල බ්‍රාහ්මණ තෙමේ පුරුෂ ලකුණු දෙකක් හැර භාග්‍යවතුන් වහන්සේගේ කයෙහි සියලු දෙතිස්

මහා (පුරුෂ ලක්ෂණ) දුටුවේය. කොපුවකින් වැසුනු ලිංගය ඇති බව (කොසොහිත වත්ථගුයහතා) හා පළල් දිවක් ඇති බව (පහුත ජිවහතා) යන ලක්ෂණ දෙකෙහි සැක කරයි, තීරණයකට නොබසී, (ඔහුගේ සිත) නොපහදී. එකල භාග්‍යවතුන් වහන්සේට මෙබඳු සිතක් පහළවිය. 'මේ සේල බ්‍රාහ්මණයා කොපුවකින් වැසුනු ලිංගය ඇතිබව (කොසොහිත වත්ථගුයහතාව) හා පළල් දිවක් ඇතිබව (පහුතජිවහතා) යන ලක්ෂණ ද්වය හැර සෙසු මහා (පුරුෂ ලක්ෂණ) දැක ඒ දෙක්හි සැක කරයි. තීරණයකට නොබසී. නොපහදී". එවිට භාග්‍යවතුන් වහන්සේ යම්සේ (කොපුවකින් වැසුනු) (කොසොහිත ලිංගය වත්ථගුයහය) දකීද, එබඳු ඍද්ධි විශෙෂයක් කළසේක. අනතුරුව භාග්‍යවතුන් වහන්සේ දිව බැහැර කොට දෙකන් සිදුරු ස්පර්ශ කළසේක. නැවත නැවත ස්පර්ශ කළසේක. දෙනාසා සිදුරු ස්පර්ශ කළසේක. නැවත නැවත ස්පර්ශ කළසේක. නළල් තලය සම්පූර්ණයෙන් දිවෙන් වැසූසේක. එකල සේල බ්‍රාහ්මණයාට මෙබඳු සිතක්විය. 'ශ්‍රමණ ගෞතමයන් වහන්සේ පරිපූර්ණ දෙතිස් මහ පුරිස් ලකුණින් යුක්තයහ. අසම්පූර්ණයෙන් නොවේ. ඔහු බුදුවූයෙක්ද නොවූයෙක් දැයි මම නොදනිමි. මෙය කියනු ලබන්නාවූ වෘද්ධවූ මහලුවූ ආචාර්ය ප්‍රාචාර්ය බ්‍රාහ්මණන්ගෙන් අසන ලදී. යම් ඒ අර්හත්වූ සම්මා සම්බුදුවරයෝ වෙත්ද, ඔවුහු ස්වකීය වූ ගුණ කියනු ලබනකල්හි තමන්ගේ (ඥාණ) ප්‍රකාශ කරත්. මම ශ්‍රමණ ගෞතමයන් වහන්සේගේ ඉදිරියෙහි සුදුසු වූ ගාථාවලින් ස්තුති කරන්නේ නම් යෙහෙකි.' ඉක්බිති සේල බමුණා භාග්‍යවතුන් වහන්සේගේ ඉදිරියෙහි සුදුසු ගාථාවලින් ස්තුති කළේය.

"1. ඉතා රුචි වූ (ලක්ෂණයන්ගෙන්) පිරුණු කයක් ඇත්තාවූ, (ශරීරය ඇති) මනාව ඉපදුනාවූ, දැකුමට ප්‍රියවූ, වීර්යය ඇත්තාවූ, භාග්‍යවතුන් වහන්සේ රන්වන් වූසේක. සුදුවූ දත් ඇති සේක.

"2. මනාව ඉපදුනාවූ, මනුෂ්‍යයෙකුට පිහිටිය වියයුතු යම් (පුරුෂ) ලක්ෂණයෝ වෙත්ද, ඒ සියලු ලක්ෂණයෝ නුඹ වහන්සේගේ ශරීරයෙහිදී මහා පුරුෂ ලක්ෂණයෝ වෙත්.

"3. ප්‍රසන්නවූ නේත්‍ර ඇති උසට ගැලපෙන මහතින් (ආරොහ පරිනාහ සම්පත්තියෙන්) යුක්තවූ බ්‍රහ්මකයකට බඳු ඍජුවූ බබලන ප්‍රතාපවත් ශරීරයක් ඇති නුඹ වහන්සේ ශ්‍රමණ සංඝයා මැද සූර්යයා මෙන් බබලන සේක.

"4. "යහපත් දැකුම් ඇති, රන්වන් සිවියක් ඇති, උතුම්වූ වර්ණයෙන් සම්පූර්ණවූ, ශ්‍රමණයන් වහන්ස, නුඹ වහන්සේට මේ ශ්‍රමණ භාවයෙන් කවර ප්‍රයෝජනද?

"5. උතුම් වූ රථ ඇති සිව්දිගට අධිපතිවූ රටවල් දිනන සුලුවූ දඹදිවට ඊශ්වරවූ සක්විති රජවීමට සුදුසු වූයේය.

"6. නුඹවහන්සේ ක්ෂත්‍රිය වංශිකයන්ගේ රාජ්‍යයෙහි යෙදුනාහු වෙත්වා. ගෞතමයන් වහන්ස රජුනට පූජ්‍යවූ සක්විති රජෙක්ව මිනිසුන්ට අධිපතිව රාජ්‍යය කරනු මැනව."

"7. (භාග්‍යවතුන් වහන්සේ) "සෙලය, මම ධර්මරාජන්වූ නිරුත්තරවූ රජවෙමි. අණමැඩ පැවැත්විය නොහැකිවූ ධර්ම (ආඥා) චක්‍ර පවත්වමි."

"8. (සේලය බ්‍රාහ්මණ තෙම), "ගෞතමයන් වහන්ස, ධර්මරාජවූ නිරුත්තරවූ සම්‍යක් සම්බුද්ධ තෙමේ දැනගත්තෙහිය. ධර්මයෙන් (ආඥා) චක්‍රය පවත්වමියි වදාළෙහිය.

"9. පින්වතුන් වහන්සේගේ ශ්‍රාවක වූ අවවාදය අනුව හික්මුනාවූ සෙනෙවියා කවරෙක්ද? නුඹ වහන්සේ විසින් පවත්වන ලද මේ ධර්මචක්‍රය කවරෙක් අනුව පවත්වයිද?"

"10. (භාගවතුන් වහන්සේ) "සේලය, මා විසින් පවත්වන ලද නිරුත්තරවූ ධර්මචක්‍රය තථාගතයනට අනුව උපන්නාවූ (අනුජාතවූ) සැරියුත් තෙමේ අනුව පවත්වයි.

"11. දතයුතු සියල්ල දැනගන්නා ලදී. වැඩිය යුතු සියල්ල වඩනලදී. මා විසින් අත්හැරිය යුත්ත අත්හරින ලදී. බමුණ, එහෙයින් මම බුද්ධවෙමි."

"12. බ්‍රාහ්මණය, මා කෙරෙහි සැක දුරුකරව. ශ්‍රද්ධාවෙහි ස්ථිරව පිහිටුව. (ශ්‍රද්ධාවෙන් බැස යනුව.) නිතර සම්බුදුවරයන්ගේ දැක්ම දුර්ලභ වෙයි.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

"13. ඒකාන්තයෙන් ලොකයෙහි යම් කෙනෙකුන්ගේ නිරතුරු පහලවීම දුර්ලභ වේද? බ්‍රාහ්මණය, ඒ මම රාගාදි උල් ඉදුරු නිරුත්තරවූ සම්‍යක් සම්බුද්ධ වෙමි.

"14. කාමාදී මරසෙනග විසින් නොමැඩියහැකිවූ, අසමවූ ශ්‍රෙෂ්ඨවූ, නිර්භයවූ, මම සියලු ස්කන්ධ මාරාදි පස්මරුන් වසග කොට සතුටු වෙමි.

"15. පින්වත්නි, බුදුරජාණන් වහන්සේ යම් දෙයක් දෙශනා කරන සේක්ද, මෙය අසව්. රාගාදී කෙලෙස් උල් උදුරා දැමූ මහා වීරයන් වහන්සේ වනයෙහි සිංහයෙකු මෙන් නාදකරන සේක".

"16. (සේල බ්‍රාහ්මණ තෙම) කාමාදි මරසෙනග විසින් නොමැඩිය හැකිවූ අසමවූ ශ්‍රෙෂ්ඨවූ බුදුපියානන් වහන්සේ දැක පහත් ජාති ඇත්තාවූද කවරෙක් නොපැහැදෙන්නේද?

"17. "යමෙක් මා අනුව යාමට කැමතිනම් ඒවා, යමෙක් අකැමැති නම් යේවා'. මම මෙහි බුදුරජාණන් වහන්සේ සමීපයෙහි පැවිදිවන්නෙමි.

"18. ඉදින් පින්වතුන් වහන්සේට මේ සම්මාසම්බුද්ධ ශාසනය රුචි කෙරේද? අපිත් බුදුරජාණන් වහන්සේ ලඟ පැවිදි වන්නෙමු.

"19. මේ තෙසියක් බමුණෝ ඇඳිලි බැඳගත්තාහු යාච්ඥා කරත් (ඉල්ලත්) 'භාග්‍යවතුන් වහන්ස, නුඹවහන්සේ ළඟ බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙන්නෙමු".

7. (භාග්‍යවතුන් වහන්සේ) "සේලය, තමා විසින්ම දත යුතුවූ, මාර්ගය අනතුරුව විපාක දෙන හෙයින් අකාලිකවූ, බ්‍රහ්මචර්යාව මනාකොට දෙශනා කරණ ලදී. යම් ශාසනයෙක්හි අප්‍රමාදව හික්මෙන්නහුට පැවිදි බව නොසිස්ය යනුයි. පිරිවර සහිතවූ, සේල බමුණා භාග්‍යවතුන් වහන්සේගේ සමීපයෙහි පැවිද්ද ලැබීය. උපසම්පදාව ලැබීය. ඉක්බිති කේණිය ජටිලයා ඒ රැය ඉක්මුනු පසු සිය ආශ්‍රමයෙහි ප්‍රණීතවූ ඛාදනීයවූ භොජනීයවූ සියල්ල පිළියෙල කරවා භාග්‍යවතුන් වහන්සේට කාලය දැන්වීය.

"භවත් ගෞතමයන් වහන්ස, සුදුසු කාලයයි. දානය පිළියෙල කොට නිමවන ලදී."

8. එකල්හි භාග්‍යවතුන් වහන්සේ පෙරවරුයෙහි හැඳ පෙරවා පාත්‍ර සිවුරු ගෙන කේණිය ජලටිලයාගේ ආශ්‍රමය යම් තෙනැකද, එතනට පැමිණියේය. පැමිණ පැනවූ අස්නෙහි භික්ෂු සංඝා සමග වැඩඋන්සේක. අනතුරුව කේණිය ජටිලයා බුද්ධ ප්‍රමුඛ භික්ෂු සංඝයා ප්‍රණීතවූ, කෑ යුතුවූ, අනුභව කළ යුතුවූ, ආහාර පාන වර්ගවලින් සියතින් සැතපවීය, පැවරීය, ඉක්බිති කේණිය ජටිලයා වැළඳුවාවූ, පාත්‍රයෙන් බැහැර කරන ලද අත ඇත්තාවූ, භාග්‍යවතුන් වහන්සේ කරා පැමිණ එක්තරා මිටි අස්නක් ගෙන, එක් පැත්තෙක හුන්නේය. එක් පැත්තෙක උන්නාවූ, කේණිය ජටිලයාට භාග්‍යවතුන් වහන්සේ මේ ගාථාවලින් අනුමෝදනාව කළ සේක.

"1. යාගයට ගින්න ප්‍රධානය, ඡන්දයට 'සාවිත්ති' ඡන්දය ප්‍රධානය, මිනිසුන්ට රජතුමා ප්‍රධානය, නදීන්ට සාගරය ප්‍රධානය.

"2. තාරකාවනට චන්ද්‍රයා ප්‍රධානය, තවන්නවුනට සූර්යයා ප්‍රධානය, පින්කිරීමට කැමැතිවන්නවුනට හා දන්දෙන්නවුනට ඒකාන්තයෙන් සංඝයා ප්‍රධානය" යනුයි.

**9.** ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ සේණිය ජටිලයාට මේ ගාථාවලින් අනුමෝදනාව කොට (ආසනයෙන්) නැගිට වැඩි සේක. එකල ආයුෂ්මත් සේල භික්ෂූන් වහන්සේ පිරිවර සහිතව වෙන්වූයේ අප්‍රමාදව කෙලෙස් තවන වීර්ය ඇතිව වාසය කරන සේක් නොබෝ කලකින්ම යමක් සඳහා කුල පුත්‍රයෝ මනාකොටම ගිහිගෙන් නික්ම පැවිදි වෙත්ද, ඒ නිරුත්තරවූ බ්‍රහ්මචර්යාව කෙළවර කොට ඇති මේ ආත්මයෙහිම තෙමේ අභිඥාවන් ප්‍රත්‍යක්ෂකොට දැන ඊට පැමිණ වාසය කළ සේක. ඉපදීම නැති කෙළේය. බ්‍රහ්මචරියාවෙහි හැසිර නිමවන ලදී. කළ යුතු සියල්ල කරන ලදී. මේ ආත්මයෙහි කළ යුතු අනිකක් නැතැයි දැනගත්තේය. ආයුෂ්මත් සේල භික්ෂූන් වහන්සේ පිරිස සහිතව රහතුන් අතුරෙන් කෙණෙක් වූහ. ඉන්පසු ආයුෂ්මත්

සේල භික්ෂූන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියහ. පැමිණ, සිවුර එකාංසකොට භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැන ඇඳිලි බැඳ වැඳ භාග්‍යවතුන් වහන්සේට ගාථාවලින් (මෙසේ) කීහ.

"1. භාග්‍යවත්වූ බුදුරජාණන් වහන්ස, (අපි) මෙයින් අටවැනි දවසෙහි යම් ඒ සරණගෙන සත්රැයකින් නුඹවහන්සේගේ ශාසනයෙහි දැමුනෝ වෙමු.

"2. නුඹවහන්සේ බුද්ධය, නුඹවහන්සේ ශාස්තෘහ, පස්මරුන් මැඩපැවැත්වූ මුනිහ, නුඹවහන්සේ රාගාදි අනුශය ධර්මයන් නසා එතරවූසේක් මේ සත්වප්‍රජාව එතරකරවන සේක.

"3. නුඹවහන්සේ නැවත ඉපදීමට හෙතුව ඉක්මවන ලදහ. කාමාදි ආශ්‍රවයෝ බිඳදමන ලදහ. (කාමාදී) උපාදානයන් නැතිව භිය සහ භයංකර අරමුණු (භයභෙරවයන්) නැති කළේ සිංහයෙකු මෙන් වාසය කරන සේක.

"4. මේ තුන්සියයක් භික්ෂූහු ඇඳිලි බැඳගෙන සිටිත්. වීරයන් වහන්ස, පාදයන් දිගුකරනු මැනව. භික්ෂූහු (නාගයෝ) ශාස්තෘන් වහන්සේට වඳිත්වා."

දෙවැනිවූසේල සූත්‍රය නිමි. (4-2)

---

## 43. අස්සලායන සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනේපිඩු සිටුහු විසින් කරවන ලද, දෙව්රම් වෙහෙර වැඩවාසය කරණ සේක. එසමයෙහි නොයෙක් රටවල බමුණන් අතුරෙන් පන්සියයක් පමණ බමුණෝ කිසියම් කටයුත්තක් සඳහා සැවැත් නුවර වාසය කරති. එකල ඒ බමුණන්ට මෙබඳු සිතක් පහල විය. මේ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ චාතුර්වර්ණ ශුද්ධියක් පනවයි. ශ්‍රමණ ගෞතමයන් සමග මේ වචන ගැන විරුද්ධව සාකච්ඡා කිරීම සඳහා කවරෙක් සමර්ථද?

2. එසමයෙහි වනාහි අස්සලායණ නම් තරුණයෙක් සැවැත් නුවර වාසය කරයි. (හෙතෙම) දහරයෙකි, වැවුනුකෙස් ඇත්තෙක, උත්පත්තියෙන් සොළොස් හැවිරිදි වයස් ඇත්තෙක, නාම නිඝණ්ඩු යාග ආදී කටයුතු පිළිවෙල හා ශික්ෂානිරුක්ති යන ප්‍රභෙදන් ඇති, ඉතිහාසය පස්වැනි කොට ඇති වෙදත්‍රයයෙහි කෙළවරට ගිය කෙනෙක. පද හා ව්‍යාකරණ කටපාඩමේ කියන්නෙක, ලොකායත ශාස්ත්‍රයේත් මහාපුරුෂ ලක්ෂණ ශාස්ත්‍රයෙත් දක්ෂයෙක. ඉක්බිති ඒ බමුණන්ට මෙබඳු සිතක් ඇති විය. 'මේ අස්සලායණ තරුණයා සැවැත් නුවර වෙසෙයි. (හෙතෙම) දහරයෙකි, වැඩුනු කෙස් ඇත්තෙක, උත්පත්තියෙන් සොළොස් හැවිරිදි වයස් ඇත්තෙක, නාම නිඝණ්ඩු යාග ආදී කටයුතු පිළිවෙල හා ශික්ෂා නිරුත්ති යන ප්‍රභෙදයන් ඇති, ඉතිහාසය පස්වැනි කොට ඇති වෙදත්‍රයයෙහි කෙළවරට පැමිණියෙක. පද හා ව්‍යාකරණ කටපාඩමේ කියන්නෙක, ලොකායත ශාස්ත්‍රයේත් මහාපුරුෂ ලක්ෂණ ශාස්ත්‍රයේත් දක්ෂයෙක. හෙතෙම ශ්‍රමණ ගෞතමයන් සමග මේ වචන ගැන (යෙහි) විරුද්ධව සාකච්ඡා කිරීමට සමර්ථ වෙයි, කියායි.

3. අනතුරුව ඒ බමුණෝ අස්සලායණ තරුණයා යම් තැනෙකද එතැනට එළඹියහ. එළඹ අස්සලායණ මානවකයාට මෙසේ කීහ. "පින්වත් අස්සලායණය, මේ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ චාතුර්වර්ණ ශුද්ධියක් පනවන සේක. පින්වත් අස්සලායණ තෙමේ ශ්‍රමණ ගෞතමයන් සමග මේ වචන (යෙහි) ගැන විරුද්ධව සාකච්ඡා කිරීමට පැමිණේවා" මෙසේ කී කල්හි අස්සලායණ තරුණයා ඒ බමුණන්ට මෙසේ කීය. "ශ්‍රමණ භවත් ගෞතමයෝ වනාහි ධර්මවාදීහ, ධර්මවාදීහු සමග දුකසේ විරුද්ධව සාකච්ඡා කළ යුත්තාහු වෙති. මම ශ්‍රමණ ගෞතමයන් සමග මේ වචන (යෙහි) ගැන විරුද්ධව සාකච්ඡා කිරීමට නොහැක්කෙක් වෙමි" දෙවනුත් ඒ බමුණෝ අස්සලායණ තරුණයාට, මෙසේ කීහ. "පින්වත් අස්සලායණය, මේ ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ චාතුර්වර්ණ ශුද්ධියක් පනවන

සේක. පින්වත් අස්සලායණ තෙමේ ශ්‍රමණ ගෞතමයන් සමග මේ වචන (යෙහි) ගැන විරුද්ධව සාකච්ඡා කිරීමට ඒවා පින්වත් අස්සලායණයන් වේදයට අනුව තවුස් පිළිවෙලට හැසුරුණු කෙනෙක" දෙවනුවත් අස්සලායණ තෙමේ ඒ බමුණන්ට මෙසේ කීය." ශ්‍රමණ භවත් ගෞතමයෝ ධර්මවාදීහ, ධර්මවාදීහු සමග දුකසේ වාද කළ යුත්තාහු වෙත්. මම ශ්‍රමණ ගෞතමයන් සමග මේ වචනයෙහි වාදකිරීමට නොහැක්කෙක් වෙමි. තුන්වෙනුවත් ඒ බමුණෝ අස්සලායණ තරුණයාට මෙසේ කීහ. පින්වත් අස්සලායණය, මේ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ චාතුර්වර්ණ ශුද්ධියක් පනවන සේක. පින්වත් අස්සලායණ තෙම ශ්‍රමණ ගෞතමයන් සමග වාද කිරීමට ඒවා. පින්වත් අස්සලායණයන් වෙදය අනුව තවුස් පිළිවෙලට හැසුරුණු කෙණෙක".

"භවත් අස්සලායණය, යුද්ධ නොකොට නොපැරදෙව" මෙසේ කී කල අස්සලායණ තරුණයා ඒ බමුණන්ට මෙසේ කීය. "පින්වතුනි, එකාන්තයෙන් මම වනාහි ජය නොලබමි. ශ්‍රමණ භවත් ගෞතමයෝ ධර්මවාදීහ, ධර්මවාදීහු සමග දුකසේ වාදකළ යුත්තාහු වෙති. ශ්‍රමණ ගෞතමයන් සමග මේ වචනයෙහි වාදකිරීමට මම අසමර්ථයෙමි. යලිදු මම භවතුන්ගේ වචනය නිසා යන්නෙමියි" කියායි.

4. ඉක්බිති අස්සලායණ තරුණයා මහත්වූ බමුණු සමූහය සමග භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය. සතුටු විය යුතුවූත් සිහිකටයුතුවූත් කථාව කොට නිමවා එකත්පසෙක උන්නේය. එකත්පසෙක උන්නාවූ අස්සලායණ තරුණයා භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "භවත් ගෞතමයන් වහන්ස, බමුණෝ මෙසේ කීහ. "බමුණෝම උතුම් ජාති ඇත්තෝය. අන්‍යයෝ හීන ජාති ඇත්තෝය. බමුණෝම ශුද්ධ වංශ ඇත්තෝය, අන්‍යයෝ අශුද්ධ වංශ ඇත්තෝය. බමුණෝම සුදුපාට ඇත්තාහ. අන්‍යයෝ කළුපාට ඇත්තාහ, බමුණෝම පිරිසිදු වෙති. අන්‍යයෝ එසේ නොවෙති. බමුණෝම මහාබ්‍රහ්මයාගේ ඖරස පුත්‍රයෝව මුඛයෙන් උපන්නාහු

බ්‍රහ්මජයහ, බ්‍රහ්මයා නිමැවූ හෙයින් බ්‍රහ්මනිර්මිතයහ, බ්‍රහ්මදායාදයහ, යනුයි. භවත් ගෞතමයන් වහන්සේ මෙ කරුණෙහිද කුමක් කියන සේක්ද?"

"අස්සලායණය, බමුණන්ගේ බැමිණියෝ ඍතුවන්නියෝද, ගැබිනියෝද, වදන්නියෝද, කිරිපොවන්නියෝද දක්නා ලැබෙත්. ඒ බමුණෝද යෝනියෙන් උපන්නාහුම මෙසේ කීවාහුය. 'බමුණෝම උතුම් වර්ණයහ, අන්‍යයෝ හීනවර්ණයහ, බමුණෝම සුදුපාට ඇත්තාහ, අන්‍යයෝ කළුපාට ඇත්තාහ, බමුණෝම පිරිසිදු වෙත්, අන්‍යයෝ (බමුණු නොවන්නෝ) අපිරිසිදු වෙත්. බමුණෝම බ්‍රහ්මයාගේ ඖරස පුත්‍රව මුවින් උපන්නාහු බ්‍රහ්මජයහ, මහබඹා මැවූ හෙයින් බ්‍රහ්මනිර්මිතයහ, බ්‍රහ්මදායාදයහ, කියායි."

**5.** "කිසියම් කරුණක් නිසා භවත් ගෞතමයන් වහන්සේ මෙසේ කීසේක්ද?" එකල බමුණෝ මෙය මෙසේ සිතත්. බමුණෝම ශ්‍රෙෂ්ඨ වර්ණයහ, අන්‍යයෝ හීනවර්ණයහ, බමුණෝම සුදුපාට ඇත්තාහ, අන්‍යයෝ කළුපාට ඇත්තාහ, බමුණෝම පිරිසිදු වෙත්, අන්‍යයෝ අපිරිසිදුවෙත්, බමුණෝම බ්‍රහ්මයාගේ ඖරස පුත්‍රව මුවින් උපන්නාහුය, බ්‍රහ්මජය, මහබඹා මැවූහෙයින් බ්‍රහ්ම නිර්මිතයහ. බ්‍රහ්ම දායාදය, කියායි. "අස්සලායණය, ඔබ ඒ කිමැයි හඟනෙහිද? යොනකම්බුජ නම් අන්‍යවූ පසල් දනව්වෙක ආර්යයයිද, දාසයයිද, වර්ණ දෙකෙකි. ආර්යයෙක්ව දාසයෙක් වෙයි. දාසයෙක්වී ස්වාමියෙක් (ආර්යයෙක්) වේයයි තා විසින් අසන ලද්දේද?" "එසේය ස්වාමීනි, මා විසින් අසන ලදී. යොනකම්බුජ නම් අන් පසල්දනව්වෙක ආර්යයයිද දාසයයිද වර්ණ දෙකකි, ආර්යයෙක්ව දාසයෙක් වෙයි, දාසයෙක්ව ස්වාමියෙක්වේයයි (මා විසින් අසනලදී)". "අස්සලායණය, මෙහිදී බමුණන්ගේ කුමන බලයක්ද, කවර අස්වැසිල්ලක්ද?" මෙකරුණෙහිලා බමුණෝ මෙසෙ කීහ. "බමුණෝම ශ්‍රෙෂ්ඨවර්ණයහ, අන්‍යයෝ හීනවර්ණයහ, බමුණෝම සුදුපාට ඇත්තාහ. අන්‍යයෝ කළුපාට ඇත්තාහ, බමුණෝම පිරිසිදු වෙත්. අන්‍යයෝ අපිරිසිදු වෙත්. බමුණෝම බ්‍රහ්මයාගේ ඖරස පුත්‍රව මුවින් උපන්නාහු බ්‍රහ්මජය. මහ බඹා මැවූ හෙයින් බ්‍රහ්ම නිර්මිතයහ. බ්‍රහ්මදායාදයහ' කියායි.

"කිසියම් කරුණක් නිසා භවත් ගෞතමයන් වහන්සේ මෙසේ කීසේක්ද?" එකල්හි බමුණෝ මෙහිදී මෙය මෙසේ සිතති. 'බමුණෝම ශ්‍රෙෂ්ඨ වර්ණයහ. අන්‍යයෝ හීන වර්ණයහ, බමුණෝම පිරිසිදු වෙත්. අන්‍යයෝ අපිරිසිදු වෙත්. බමුණෝම බ්‍රහ්මයාගේ ඖරස පුත්‍රව මුවින් උපන්නාහු බ්‍රහ්මජය. මහ බඹා මැවූ හෙයින් බ්‍රහ්ම නිර්මිතයහ. බ්‍රහ්මදායාදයහ,' කියායි.

**6.** "අස්සලායණය, ඒ කුමැයි හඟනෙහිද? ක්ෂත්‍රිය තෙමේත් සතුන් මරන්නේ, සොරකම් කරන්නේ, කාමයන්හි වරදවා හැසිරෙන්නේ බොරුකියන්නේ, කේලාම් කියන්නේ, රළු වචන කියන්නේ, හිස් වචන කියන්නේ, හිස් වචන කථාකරන්නේ, දැඩි ලොභ ඇත්තේ, බද්ධවෛරයෙන් (ව්‍යාපාදයෙන්) යුත් සිත් ඇත්තේ, වැරදි දැකීම් ඇත්තේ, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නරක ගති ඇති විනිපාතනම්වූ නිරයෙහි උපදින්නේය. නොවන්නේද? බමුණෙක් වුවත් සතුන් මරන්නේ, සොරකම් කරන්නේ, කාමයන්හි වරදවා හැසිරෙන්නේ, බොරු කියන්නේ කේලාම් කියන්නේ රළු වචන කියන්නේ, හිස් වචන කථා කරන්නේ, දැඩි ලොභ ඇත්තේ, ව්‍යාපාදයෙන් යුත් සිත් ඇත්තේ, වැරදි දැකීම් ඇත්තේ ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නරක ගති ඇති, විනිපාත නම්වූ නිරයෙහි උපදින්නේය නොවන්නේද? වෛශ්‍යයෙක් සතුන් මරන්නේ, සොරකම් කරන්නේ, කාමයන්හි වරදවා හැසිරෙන්නේ, බොරු කියන්නේ, කේලාම් කියන්නේ රළු වචන කියන්නේ හිස් වචන කියන්නේ දැඩි ලොභ ඇත්තේ, ව්‍යාපාදයෙන් යුත් සිත් ඇත්තේ, වැරදි දැකීම් ඇත්තේ ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ විනිපාත නම්වූ නිරයෙහි උපදින්නේය නොවන්නේද? වෛශ්‍යයෙක් වුවත් සතුන් මරන්නේ, සොරකම් කරන්නේ, කාමයන්හි වරදවා හැසිරෙන්නේ, බොරු කියන්නේ, කේලාම් කියන්නේ, රළු වචන කියන්නේ, හිස් වචන කථා කරන්නේ, දැඩි ලොභ ඇත්තේ, ව්‍යාපාදයෙන් යුත් සිත් ඇත්තේ, වැරදි දැකීම් ඇත්තේ ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ, නරක ගති ඇති, විනිපාත නම්වූ නිරයෙහි උපදින්නේය නොවන්නේද? වෛශ්‍යයාත් සතුන් මරන්නේ,

සොරකම් කරන්නේ, කාමයන්හි වරදවා හැසිරෙන්නේ, බොරු කියන්නේ, කේලාම් කියන්නේ රළු වචන කියන්නේ හිස් වචන කියන්නේ, දැඩි ලොභ ඇත්තේ, ව්‍යාපාදයෙන් යුත් සිත් ඇත්තේ, වැරදි දැකීම් ඇත්තේ ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ විනිපාත නම්වූ නිරයෙහි උපදින්නේය. නොවන්නේද? ශුද්‍රයෙක් වුවත් සතුන් මරන්නේ, සොරකම් කරන්නේ, කාමයන්හි වරදවා හැසිරෙන්නේ, බොරු කියන්නේ, කේලාම් කියන්නේ (කේලම් කියන්නේ) රළු වචන කියන්නේ, හිස් වචන කියන්නේ, දැඩි ලොභ ඇත්තේ, ව්‍යාපාදයෙන් යුත් සිත් ඇත්තේ, වැරදි දැකීම් ඇත්තේ, ශරීරයාගේ බිඳීමෙන් මරණින්, මතු සැපයෙන් පහවූ, නරක ගති ඇති, විනිපාත නම් වූ නිරයෙහි උපදින්නේය. නොවන්නේද? වෛශ්‍යයාත් සතුන් මරන්නේ, සොරකම් කරන්නේ, කාමයන්හි වරදවා හැසිරෙන්නේ, බොරු කියන්නේ, කේලාම් කියන්නේ, රළු වචන කියන්නේ, හිස් වචන කියන්නේ, දැඩි ලොභ ඇත්තේ, ව්‍යාපාදයෙන් යුත් සිත් ඇත්තේ, වැරදි දැකීම් ඇත්තේ, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ විනිපාතනම්වූ නිරයෙහි උපදින්නේය. නොවන්නේද? ශුද්‍රයෙක් වුවත් සතුන් මරන්නේ සොරකම් කරන්නේ, කාමයෙහි වරදවා හැසිරෙන්නේ, බොරු කියන්නේ, කේලාම් කියන්නේ, රළු වචන කියන්නේ, හිස් වචන කථා කරන්නේ, දැඩි ලොභ ඇත්තේ, බද්ධවෛරයෙන් යුත් සිත් ඇත්තේ, වැරදි දැකීම් ඇත්තේ, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැප නැති, නපුරු ගති ඇති විනිපාත නම්වූ නිරයෙහි උපදින්නේය නොවේද?"

**7.** "භවත් ගෞතමයන් වහන්ස, මෙයවන්නේද (වන්නේමය) භවත් ගෞතමයන් වහන්ස, ක්ෂත්‍රියයාත් පරපන නසන්නේ, සොරකම් කරන්නේ, කාමයන්හි වරදවා හැසිරෙන්නේ, බොරු කියන්නේ, කේලාම් කියන්නේ, රළුවචන කියන්නේ, හිස්වචන කථාකරන්නේ, දැඩි ලොභ ඇත්තේ, බද්ධවෛරයෙන් (ව්‍යාපාදයෙන්) යුත් සිත් ඇත්තේ, වැරදි දැකීම් ඇත්තේ, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැප නැති නපුරු ගති ඇති විනිපාත නම්වූ නිරයෙහි උපදින්නේය. භවත් ගෞතමයන්

වහන්ස, බමුණාත් සතුන් මරන්නේ සොරකම් කරන්නේ, කාමයන්හි වරදවා හැසිරෙන්නේ, බොරු කියන්නේ, කේලාම් කියන්නේ, (කේලම් කියන්නේ,) රළු වචන කියන්නේ, හිස් වචන කියන්නේ, දැඩි ලොභ ඇත්තේ, ව්‍යාපාද සිත් ඇත්තේ, වැරදි දැකීම් ඇත්තේ, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නරක ගති ඇති, විනිපාත නම් වූ නිරයෙහි උපදින්නේය. වෛශ්‍යයාත් සතුන් මරන්නේ, සොරකම් කරන්නේ, කාමයන්හි වරදවා හැසිරෙන්නේ, බොරු කියන්නේ, කේලාම් කියන්නේ රළු වචන කියන්නේ හිස් වචන කියන්නේ දැඩි ලොභ ඇත්තේ, ව්‍යාපාදසිත් ඇත්තේ, වැරදි දැකීම් ඇත්තේ ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නරක ගති ඇති, විනිපාත නම්වූ නිරයෙහි උපදින්නේය. ශුද්‍රයාත් සතුන් මරන්නේ, සොරකම් කරන්නේ, කාමයන්හි වරදවා හැසිරෙන්නේ, බොරු කියන්නේ, කේලාම් කියන්නේ, රළු වචන කියන්නේ, හිස්වචන කියන්නේ, දැඩිලොභ ඇත්තේ, ව්‍යාපාද සිත් ඇත්තේ, වැරදි දැකීම් ඇත්තේ ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ, නරක ගති ඇති, විනිපාත නම්වූ නිරයෙහි උපදින්නේය. සියලු චාතුර්වර්ණයෝම සතුන් මරන්නේ, සොරකම් කරන්නේ, කාමයන්හි වරදවා හැසිරෙන්නේ, බොරු කියන්නේ කේලාම් කියන්නේ, රළු වචන කියන්නේ හිස් වචන කියන්නේ, දැඩි ලොභ ඇත්තේ, බද්ධවෛරයෙන් (ව්‍යාපාදයෙන්) යුත් සිත් ඇත්තේ, වැරදි දැකීම් ඇත්තේ ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැප නැති නපුරු ගති ඇති විනිපාත නම්වූ නිරයෙහි උපදින්නාහුය.”

8. “අස්සලායණය, මේ කරුණෙහිලා බමුණන්ගේ කුමන බලයක්ද? කවර අස්වැසිල්ලක්ද? මෙකරුණෙහිලා බමුණෝ මෙසේ කීහ. ‘බමුණෝම ශ්‍රෙෂ්ඨ වර්ණයහ. බමුණෝම සුදුපාට ඇත්තාහ. අන්‍යයෝ කළුපාට ඇත්තාහ. බමුණෝම පිරිසිදු වෙත්, අන්‍යයෝ අපිරිසිදු වෙත්. බමුණෝම බ්‍රහ්මයාගේ ඖරස පුත්‍රව මුවින් උපන්නාහු. බ්‍රහ්මජය, මහබඹා මැවූ හෙයින් බ්‍රහ්ම නිර්මිතයහ. බ්‍රහ්මදායාදය’ කියායි. යම්කිසි කරුණක් නිසා භවත් ගෞතමයන් වහන්සේ මෙසේ කී සේක්ද? එකල්හි

මෙකරුණෙහිදී බමුණෝ, මෙය මෙසේ හඟිත්. 'බමුණෝම ශ්‍රේෂ්ඨ වර්ණයහ. අන්‍යයෝ හීනවර්ණයහ. බමුණෝම සුදුපාට ඇත්තාහ. අන්‍යයෝ කළුපාට ඇත්තාහ. බමුණෝම පිරිසිදු වෙත්. අන්‍යයෝ අපිරිසිදු වෙත්. බමුණෝම බ්‍රහ්මයාගේ ඖරස පුත්‍රව මුවින් උපන්නාහු, බ්‍රහ්මජය. මහබඹා මැවූ හෙයින් බ්‍රහ්ම නිර්මිතයහ. බ්‍රහ්මදායාදායහ' කියායි.

**9.** "අස්සලායණය, ඒ කිමැයි සිතන්නෙහිද? බමුණෙක් වූයේම පර පණ නැසීමෙන් වැළකුණේ, සොරකමින් වැළකුණේ, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුණේ, මුසාවාදයෙන් වැළකුණේ, කේලාම් කීමෙන් වැළකුණේ, රළු වචන කීමෙන් වෙන්වුණේ, හිස් වචන කීමෙන් වැළකුණේ, දැඩි ලෝභ නැත්තේ, (අව්‍යාපාද සිත් ඇත්තේ) බද්ධ වෛර නැත්තේ, හරි දැකීම් ඇත්තේ, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ගලොකයෙහි උපදින්නේ නොවේද?" "භවත් ගෞතමයන් වහන්ස, සතුන් මරන්නේ, සොරකම් කරන්නේ, කාමයන්හි වරදවා හැසිරෙන්නේ, බොරු කියන්නේ, කේලාම් කියන්නේ, රළු වචන කියන්නේ, හිස් වචන කියන්නේ, දැඩි ලෝභ ඇත්තේ, ව්‍යාපාදයෙන් යුත් සිත් ඇත්තේ, වැරදි දැකීම් ඇත්තේ, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු සැපයෙන් පහවූ නරක ගති ඇති විනිපාත නම්වූ නිරයෙහි උපදින්නේය. ක්ෂත්‍රියයාත්, වෛශ්‍යයත්, ශුද්‍රයාත්, නොඋපදින්නේදැයි" "භවත් ගෞතමයන් වහන්ස මෙය නොවන්නේද?" (වන්නේමය.)

"භවත් ගෞතමයන් වහන්ස, ක්ෂත්‍රියෙක් ප්‍රාණඝාතයෙන් වැලකුණේ, අදින්නාදානයෙන් වැළකුණේ, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුණේ, මුසාවාදයෙන් වැළකුණේ, කේලාම් කීමෙන් වැළකුණේ, ඵරුෂ වචනයෙන් වෙන්වුනේ, හිස් වචන දෙඩීමෙන් වෙන්වූනේ, දැඩි ලෝභ නැත්තේ, (ව්‍යාපාද සිත්) බද්ධ වෛර නැත්තේ, හරි දැකීම් ඇත්තේ, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපදින්නේය.

"භවත් ගෞතමයන් වහන්ස, බමුණෙක්ද, ප්‍රාණඝාතයෙන් වැළකුණේ සොරකම් කිරීමෙන් වැළකුණේ, කාමයන්හි වරදවා

හැසිරීමෙන් වැළකුණේ, බොරුකීමෙන් වැළකුණේ, රළු වචන කීමෙන් වැළකුණේ, හිස් වචන කීමෙන් වැළකුණේ දැඩි ලොභ නැත්තේ, අව්‍යාපාද සිත් නැත්තේ, සම්‍යක් දෘෂ්ටිවූයේ, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපදින්නේය. භවත් ගෞතමයන්වහන්ස, වෛශ්‍යයෙක්ද, සතුන් මැරීමෙන් වැළකුණේ, සොරකම් කිරීමෙන් වැළකුණේ, කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුණේ, බොරුකීමෙන් වැළකුණේ, කේලාම් කීමෙන් වැළකුණේ, රළු වචන කීමෙන් වැළකුණේ, හිස් වචන කීමෙන් වැළකුණේ, දැඩි ලොභ නැත්තේ, අව්‍යාපාද සිත් ඇත්තේ, සම්‍යක් දෘෂ්ටි වූයේ, ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහත් ගති ඇති, ස්වර්ග ලොකයෙහි උපදින්නේය. භවත් ගෞතමයන් වහන්ස, ශූද්‍රයෙක්ද සතුන් මැරීමෙන් වැළකුණේ සොරකම් කිරීමෙන් වැළකුණේ කාමයන්හි වරදවා හැසිරීමෙන් වැළකුණේ, බොරුකීමෙන් වැළකුණේ, කේලාම් කීමෙන් වැළකුණේ, රළු වචන කීමෙන් වැළකුණේ, හිස් වචන කීමෙන් වැළකුණේ, දැඩි ලෝභ නැත්තේ, අව්‍යාපාද සිත් ඇත්තේ, සම්‍යක් දෘෂ්ටි වූයේ ශරීරයාගේ බිඳීමෙන් මරණින් මතු යහපත් ගති ඇති ස්වර්ග ලොකයෙහි උපදින්නේය.

"සියලුම චාතුර් වර්ණයෝද ප්‍රාණඝාතයෙන් වෙන්වූවාහු අදින්නාදානයෙන් වෙන්වූවාහු, කාමන්හි වරදවා, හැසිරීමෙන් වැළකුණාහු, මුසාවාදයෙන්, කේලාම් කීමෙන්, රළු වචනයෙන්, හිස් වචන කථා කිරීමෙන් වෙන්වුනාහු දැඩිලෝභ නැත්තේ, (ව්‍යාපාද සිත්) බද්ධවෛර සිත් නැත්තාහු, හරි දැකීම ඇත්තාහු, ශරීරයාගේ බිඳීමෙන්, මරණින් මතු යහපත්, ගති ඇති ස්වර්ග ලොකයෙහි උපදින්නාහුය'යි

**10.** "අස්සලායණය, බමුණෝ ශ්‍රෙෂ්ඨ වර්ණයහ, අන්‍යයෝ හීන වර්ණයහ. බමුණෝම පිරිසිදු වෙත්, අන්‍යයෝ අපිරිසිදු වෙත්. බමුණෝම බ්‍රහ්මයාගේ ඖරස පුත්‍රව මුවින් උපන්නාහු බ්‍රහ්මජය, මහබඹා මැවූ හෙයින් බ්‍රහ්ම නිර්මිතයහ, බ්‍රහ්මදායාදයහ, යන යමක් බමුණෝ මෙහිදී කීවාහුද?

මෙකරුණෙහිලා බමුණන්ගේ කුමන බලයක්ද? කවර අස්වැසිල්ලක්ද? යම්හෙයකින් භවත් ගෞතමයන් වහන්සේ මෙසේ කී සේක්ද? එකල බමුණෝ මෙකරුණෙහිදී මෙපරිද්දෙන් සිතත්. බමුණෝම ශ්‍රෙෂ්ඨ වර්ණයහ. අන්‍යයෝ හීන වර්ණයහ, ‘බමුණෝම පිරිසිදු වෙත්. අන්‍යයෝ අපිරිසිදු වෙත්. බමුණෝම බ්‍රහ්මයාගේ ඖරස පුත්‍රව මුවින් උපන්නාහුය. බ්‍රහ්මජය, මහබඹා මැවූ හෙයින් බ්‍රහ්ම නිර්මිතයහ, බ්‍රහ්මදායාදයහ’ යනුයි.

11. “අස්සලායණය, ඒ කිමකැයි හඟිනෙහිද? බමුණෙක්ව මේ ප්‍රදෙශයෙහි වෛර නොකොට ව්‍යාපාද නොකොට මෙත් සිත් වැඩීමට සමර්ථවේද? ක්ෂත්‍රියෙක්ව, වෛශ්‍යයෙක්ව, ශුද්‍රයෙක්ව සමර්ථ නොවේද?” “භවත් ගෞතමයන් වහන්ස, මෙය නොවන්නේද? වන්නේමය. භවත් ගෞතමයන් වහන්ස, ක්ෂත්‍රියාත් මේ ප්‍රදේශයෙහි අවෛරව අව්‍යාපාදව මෙත් සිත් වැඩීමට සමර්ථ වෙයි. භවත් ගෞතමයන් වහන්ස, බ්‍රාහ්මණයාත්, මේ ප්‍රදෙශයෙහි අවෛරව, අව්‍යාපාදව, මෙත් සිත් වැඩීමට සමර්ථ වෙයි. භවත් ගෞතමයන් වහන්ස, වෛශ්‍යයාත් මේ ප්‍රදෙශයෙහි අවෛරව, අව්‍යාපාදව, මෙත් සිත් වැඩීමට සමර්ථ වෙයි. භවත් ගෞතමයන් වහන්ස, ශුද්‍රයාත් අව්‍යාපාදව මෙත් සිත් වැඩීමට සමර්ථ වෙයි. භවත් ගෞතමයන් වහන්ස, සියලු චතුර් වර්ණයෝම මේ ප්‍රදෙශයෙහි අවෛරව අව්‍යාපාදව මෙත්සිත් වැඩීමට සමර්ථ වෙති” “අස්සලායණය, බමුණෝ ශ්‍රෙෂ්ඨ වර්ණයහ, අන්‍යයෝ හීනයහ. බමුණෝම පිරිසිදු වෙත්. අන්‍යයෝ අපිරිසිදු වෙත්. බමුණෝම බ්‍රහ්මයාගේ ඖරස පුත්‍රව මුවින් උපන්නාහු බ්‍රහ්මජය. මහබඹා මැවූ හෙයින් බ්‍රහ්ම නිර්මිතයහ. බ්‍රහ්මදායාදහයි බමුණෝ මෙසේ කීහ. මෙකරුණෙහිදී බමුණන්ගේ කුමන බලයක්ද? කවර අස්වැසිල්ලක්ද? කවර හෙයින් භවත් ගෞතමයන් වහන්සේ මෙසේ කීසේක්ද?” එකල්හි ‘බමුණෝම ශ්‍රෙෂ්ඨ වර්ණයහ. අන්‍යයෝ හීනයහ, බමුණෝම පිරිසිදු වෙත්. අන්‍යයෝ අපිරිසිදු වෙත්. බමුණෝම බ්‍රහ්මයාගේ ඖරස පුත්‍රව මුවින් උපන්නාහුය. බ්‍රහ්මජය, මහබඹා මැවූ හෙයින් බ්‍රහ්ම නිර්මිතයහ. බ්‍රහ්මදායාදයහයි’ බමුණෝ මෙය මෙසේ සිතත්.

12. "අස්සලායණය, ඔබ ඒ කුමැයි හඟනෙහිද? බමුණෙක් වූයේම ඇඟ උලන ගල් හා කල්ක ගෙන ගඟට ගොස් බැඳුන කුණු තට්ටුව සෝදා හරින්ට සමර්ථ වේද? ක්ෂත්‍රියෙක්ව වෛශ්‍යයෙක්ව ශුද්‍රයෙක්ව සමර්ථ නොවේද?" භවත් ගෞතමයන් වහන්ස, මෙය නොවන්නේද? වන්නේමය. භවත් ගෞතමයන් වහන්ස, ක්ෂත්‍රියාත් ඇඟ උලන ගල් හා කල්ක ගෙන ගඟට ගොස් බැඳුනු කුණු තට්ටුව සෝදා හරින්නට සමර්ථ වෙයි. භවත් ගෞතමයන් වහන්ස, (භවත් ගෞතමයන් වහන්ස, බ්‍රාහ්මණයාත්) ඇඟ උලන ගල් හා කල්ක ගෙන ගඟට ගොස් රජස් දැලි සෝදා හරින්ට සමර්ථ වෙයි. (භවත් ගෞතමයන් වහන්ස, වෛශ්‍යයාත්) ඇඟ උලන ගල් හා කල්ක ගෙන ගඟට ගොස් රජස් දැලි සෝදා හරින්ට සමර්ථ වෙයි. භවත් (ගෞතමයන් වහන්ස, ශුද්‍රයාත්) ඇඟ උලන ගල් හා කල්ක ගෙන ගඟට ගොස් රජස් දැලි සෝදා හරින්ට සමර්ථ වෙයි. භවත් ගෞතමයන් වහන්ස, සියලු චාතුර් වර්ණයෝම ඇඟ උලන ගල් හා කල්ක ගෙන ගඟට ගොස් බැඳුන කුණු තට්ටුව සෝදා හරින්ට සමර්ථ වෙති."

13. "අස්සලායණය, 'බමුණෝ ශ්‍රේෂ්ඨ වර්ණයහ, අන්‍යයෝ හීනයහ. බමුණෝම පිරිසිදු වෙත්, අන්‍යයෝ අපිරිසිදු වෙත්. 'බමුණෝම බ්‍රහ්මයාගේ ඖරස පුත්‍රව මුවින් උපන්නාහු බ්‍රහ්මජය, මහබඹා මැවූ හෙයින් බ්‍රහ්ම නිර්මිතයහ. බ්‍රහ්මදායාදයහයි, බමුණෝ මෙසේ කීහ, මේ කරුණෙහිදී බමුණන්ගේ කුමණ බලයක්ද? කවර අස්වැසිල්ලක්ද? කවර හෙයින් භවත් ගෞතමයන් වහන්සේ මෙසේ කීසේක්ද?" එකල්හි "බමුණෝ ශ්‍රේෂ්ඨ වර්ණයහ. අන්‍යයෝ හීනයහ. 'බමුණෝම පිරිසිදු වෙත්. අන්‍යයෝ අපිරිසිදු වෙත්. බමුණෝම බ්‍රහ්මයාගේ ඖරස පුත්‍රව මුවින් උපන්නාහුය. බ්‍රහ්මජය, මහබඹා මැවූ හෙයින් බ්‍රහ්ම නිර්මිතයහ, බ්‍රහ්මදායාදයහ' බමුණෝ මෙය මෙසේ සිතත්.

14. "අස්සලායණය, ඒ කිමැයි හඟනෙහිද? මෙහි අභිෂෙක ලැබූ ක්ෂත්‍රිය රජෙක් නොයෙක් ජාති ඇති පුරිසයන් අතුරෙන් පුරිසයන් සියයක් රැස් කරන්නේය. පින්වත්හු එත්වා, ක්ෂත්‍රිය

කුලයෙන්, බ්‍රාහ්මණ කුලයෙන්, ප්‍රදෙශරාජ කුලයෙන්, උපන්නාවූ යමෙක් සල් රුකක හෝ හොර රුකක හෝ සඳුන් රුකක හෝ පදුම රුකක හෝ උඩගාන දණ්ඩක් ගෙන ගිනි නිපදවත්වා, තෙජස පතුරුවත්වා, නැවතද පින්වත්හු එත්වා සැඩොල් කුලයෙන්, වැදිකුලයෙන්, වෙණ කුලයෙන්, රථකාර කුලයෙන්, පුක්කුස කුලයෙන්, උපන්නාවූ යමෙක් බල්ලන් බොන ඔරුවක හෝ ඌරන් බොන ඔරුවක හෝ රෙදි සෝදන ඔරුවක හෝ එරඬුලීයක හෝ උඩගාන දණ්ඩක් ගෙන ගිනි උපදවත්වා, තෙජස පතුරුවත්වා.

"අස්සලායණය, යම් ඒ ගින්නක් වේද, (තෙජසක් පතුරුවාද) ඒ ගින්න ක්ෂත්‍රිය කුලයෙන්, බ්‍රාහ්මණ කුලයෙන්, ප්‍රදෙශ රාජ කුලයෙන්, උපන්නහු විසින් සල් රුකක හෝ සඳුන් රුකක හෝ පදුම රුකක හෝ උඩගානා දණ්ඩක් ගෙන ගිනි නිපදවන ලද්දේ, තෙජස පතුරුවන ලද්දේ, ඒ ගින්න ගිනිදැල් ඇත්තේද, වර්ණවත්ද, ප්‍රභාශ්වරද වන්නේද, ඒ කරනකොට ගෙන ගින්නෙන් කළහැකිවූ දෙය කරන්නට හැක්කේද, යම් ඒ ගින්න වනාහි සැඩොල් කුලයෙන්, වැදි කුලයෙන්, උපන්නහු විසින් බල්ලන් බොන ඔරුවක හෝ ඌරන් බොන ඔරුවක හෝ රෙදි සෝදන ඔරුවක හෝ එරඬු ලීයක හෝ උඩගාන දණ්ඩක් ගෙන ගිනි නිපදවන ලද්දේ රශ්මිය පතුරුවන ලද්දේ එය ගිනි නොවන්නේද, වර්ණවත් නොවන්නේද, ප්‍රභාශ්වර නොවන්නේද ඒ ගින්නෙන්ද ගින්නෙන් කළ හැකිදේ කරන්නට නොහැක්කේද?"

15. "භවත් ගෞතමයන් වහන්ස, මෙය වන්නේද, වන්නේය භවත් ගෞතමයන් වහන්සේ යම් ඒ ගින්නක් ක්ෂත්‍රිය කුලයෙන්, බමුණු කුලයෙන්, ප්‍රදේශරාජ කුලයෙන්, උපන්නාහු විසින් සල් රුකක හෝ හොරරුකක හෝ සඳුන් රුකක හෝ පදුම රුකක හෝ උඩගාන දණ්ඩක් ගෙන (ගිනි) නිපදවන ලද්දේ, රශ්මිය පතුරුවන ලද්දේ එය ගිනි දැල් ඇත්තේ වන්නේය, වර්ණවත් වන්නේය. ප්‍රභාශ්වරද වන්නේය. ඒ ගින්න කරනකොට ගෙනද ගින්නෙන් කළ හැකිදේ කරන්නට හැක්කේය. යම් ඒ ගින්නක් සැඩොල් කුලයෙන්, වැදි කුලයෙන්, වෙණ කුලයෙන්. රථකාර

කුලයෙන්, පුක්කුස කුලයෙන්, උපන්නවුන් විසින බල්ලන් බොන ඔරුවක හෝ ඌරන් බොන ඔරුවක හෝ රෙදි සෝදන ඔරුවක හෝ එරඬු ලීයක හෝ උඩගාන දණ්ඩක්ගෙන ගිනි නිපදවන ලද්දේ රශ්මිය පතුරුවන ලද්දේ, ඒ ගින්නද ගිනිදැල් ඇත්තේ වන්නේය. වර්ණවත් වන්නේය. ප්‍රභාශ්වර වන්නේය. ඒ ගින්න කරනකොටගෙන ගින්නෙන් කළහැකිදේ කරන්නට හැක්කේය. භවත් ගෞතමයන් වහන්ස, සියලුම ගිනි ගිනිදැලින් යුක්තය, වර්ණවත්ය, ප්‍රභාශ්වරය, සියලුම ගින්නෙන් කළහැකි වැඩ සියල්ලක් කරන්නට හැකිය."

**16.** "අස්සලායණය, 'බමුණෝ ශ්‍රෙෂ්ඨයහ. අන්‍යයෝ හීනයහ. බමුණෝ (ශ්වෙත) පරිශුද්ධයහ. අන්‍යයෝ (ක්ෂෂ්ණයහ) අපරිශුද්ධයහ, බමුණෝම උතුම් වෙත්, අන්‍යයෝ එසේ නොවෙත්, බමුණෝම බ්‍රහ්මයාගේ ඖරස පුත්‍රයෝව මුවින් උපන්නාහු බ්‍රහ්මජයහ. බ්‍රහ්මනිර්මිතයහ. බ්‍රහ්මදායාදයහයි යමක් බමුණෝ මෙසේ කීවාහුද මෙකරුණෙහිදී බමුණන්ගේ කුමන බලයක්ද, කවර අස්වැසිල්ලක්ද? කවර හෙයින් භවත් ගෞතමයන් වහන්සේ මෙසේ කීසේක්ද?" එකල්හි බමුණෝ මෙය මෙසේ සිතත්, 'බමුණෝ ශ්‍රෙෂ්ඨයහ, අන්‍යයෝ හීනයහ. බමුණෝම පිරිසිදු වෙත්, අන්‍යයෝ අපිරිසිදු වෙත්. බමුණෝම බ්‍රහ්මයාගේ ඖරස පුත්‍රව මුවින් උපන්නාහු බ්‍රහ්මජය, මහබඹා මැවූ හෙයින් බ්‍රහ්ම නිර්මිතයහ. බ්‍රහ්මදායාදයහ' කියයි.

**17.** අස්සලායණය, ඒ කුමැයි හඟනෙහිද? මෙහි ක්ෂත්‍රිය කුමරෙක් බමුණු කන්‍යාවක් සමග වෙසෙන්නේය. ඔවුන් දෙදෙන සහ වාසයට පැමිණ පුත්‍රයෙක් උපදින්නේය. ක්ෂත්‍රිය කුමාරයා නිසා බමුණු කන්‍යාවට යම් ඒ පුතෙක් උපන්නේ වේද, හෙතෙම මවටද සමානය, පියාටද සමානය, ක්ෂත්‍රියයායි කිය යුතුද, බ්‍රාහ්මණයායයි කිය යුතුද?"

"භවත් ගෞතමයන් වහන්ස, ක්ෂත්‍රිය කුමරා නිසා බමුණු කන්‍යාවගේ (කුස) යම් ඒ පුතෙක් උපන්නේ වේද, හෙතෙම මවටද සමානය, පියාටද සමානය. ක්ෂත්‍රියයායිද කිය යුතුයි. බ්‍රාහ්මණයායිද කිය යුතුයි."

"අස්සලායණය, ඒ කුමැයි හඟිනෙහිද? මෙහි බ්‍රාහ්මණ කුමාරයෙක් ක්ෂත්‍රිය කන්‍යාවක් සමග වෙසෙන්නේය. ඔවුන් දෙදෙනාගේ සහ වාසයට පැමිණීමෙන් පුත්‍රයෙක් උපදින්නේය. බමුණු කුමරුවා නිසා ක්ෂත්‍රිය කන්‍යාවට යම් ඒ පුත්‍රයෙක් උපන්නේවේද, හෙතෙම මවටද සමානය, පියාටද සමානය ක්ෂත්‍රියයයි කියයුතුද, බ්‍රාහ්මණයයි කිය යුතුද?"

"භවත් ගෞතමයන් වහන්ස, බමුණු කුමරා නිසා ක්ෂත්‍රියා කන්‍යාවගේ (කුස) යම් ඒ පුත්‍රයෙක් උපන්නේවේද, හෙතෙම මවටද සමානය, පියාටද සමානය, ක්ෂත්‍රියයයිද කිය යුතුයි. බ්‍රාහ්මණයයිද කිය යුතුයි."

18. "අස්සලායණය, ඒ කුමැයි හඟිනෙහිද, මෙහි වෙළඹක් කොටලුවෙකු සමග එක්වීමෙහි යොදවත්නම් ඔවුන් දෙදෙනාගේ එක්වීමෙන් පැටියෙක් උපදින්නේය. යම් ඒ පැටියා කොටළුවා නිසා වෙළඹට යම් ඒ පැටියෙක් උපන්නේවේද, ඌ මවටද සමානය, පියාටද සමානය, අශ්වයයි කියයුතුද, කොටලුවා යයි කියයුතුද?"

"භවත් ගෞතමයන් වහන්ස, වෙකු රඤ්ජනම් ප්‍රදෙශයෙහි මේ අතරශ්වයා වෙයි. භවත් ගෞතමයන් වහන්ස, අසුවල් තන්හි වනාහි මොවුන් දෙදෙනාගේ කිසි වෙනස් ආකාරයක් නොදකිමි." යන මේ වෙනස් ආකාරය ඔහුගේ දකිමි."

19. "අස්සලායණය, ඒ කුමැයි හඟනෙහිද? මෙහි සමාන උදර ඇති සහෝදර තරුණයෝ දෙදෙනෙක් වෙත්. එකෙක් මන්ත්‍ර හදාරන්නෙකු වෙත පමුණුවන ලද්දේය. අනෙකා මන්ත්‍ර හදාරන්නෙකු වෙත නොපමුණුවන ලද්දේය. මෙහිදී බමුණෝ මතක බතෙහිදී හෝ, ආරාධනාකොට දෙන අළුත් බතෙහි හෝ යාග බතෙහි හෝ ආගන්තුක බතෙහි හෝ පළමුව කවරෙක් අනුභව කරවන්නාහුද?" "භවත් ගෞතමයන් වහන්ස, යම් ඒ මානවකයෙක් වේද, මන්ත්‍ර හදාරන්නෙකු වෙත පමුණුවන ලද්දේද, මෙහිදී බමුණෝ මතක බතෙහිදී හෝ අළුත් බතෙහිදී හෝ යාග බතෙහි හෝ ආගන්තුක බතෙහි හෝ පළමුව ඔහුම

අනුභව කරවන්නාහුය. කිමෙක්ද? භවත් ගෞතමයන් වහන්ස, මන්ත්‍ර හදාරන්නෙකු වෙත නොපැමිණියහුට දෙන ලද්ද මහත්ඵල වන්නේද?"

20. "අස්සලායණය, ඒ කිමැයි හඟිනෙහිද? මෙහි සම උදර ඇති සහෝදර තරුණයෝ දෙදෙනෙක් වෙත්. එකෙක්වේද මන්ත්‍ර හදාරන්නන් වෙත පමුණුවන ලද්දේ දුස්සීලය. ලාමක ධර්ම ඇත්තේය. එකෙක් වේද මන්ත්‍ර හදාරන්නෝ වෙත නොපමුණුවන ලද්දේ, සිල්වත්ය. යහපත් ගුණදහම් ඇත්තේය. මෙහිදී බමුණෝ මතක බතෙහි හෝ අලුත් බතෙහි හෝ යාග බතෙහි හෝ ආගන්තුක බතෙහි හෝ කවරෙක් පළමුව අනුභව කරවන්නහුද?" "භවත් ගෞතමයන් වහන්ස, යම් ඒ මානවකයෙක් මන්ත්‍රහදාරන්නන් වෙත නොපැමිණියේ, සිල්වත්ද, යහපත් ධර්ම ඇත්තේද, බමුණෝ මෙහිදී ඔහුම මතක බතෙහි හෝ අලුත් බතෙහි හෝ යාග බතෙහි හෝ ආගන්තුක බතෙහි හෝ පළමුව අනුභවකරවන්නාහුය. කිමෙක්ද? භවත් ගෞතමයන් වහන්ස, දුස්සීලයන් කෙරෙහි පාප ධර්ම ඇත්තවුන් කෙරෙහි දෙන ලද්ද මහත්ඵල වන්නේද?

21. "අස්සලායණය, නුඹ වනාහි පෙර ජාතියට ගියේය. ජාතිවාදයට ගොස් මන්ත්‍රයනට ගියේය. මන්ත්‍රයනට ගොස් මම යම් චාතුර් වර්ණ ශුද්ධියක් පනවම්ද, නුඹ ඒ අනුව (විරුද්ධව) ආවේහිය"

මෙසේ කී කල අස්සලායණ තරුණයා නිශ්ශබ්දවූයේ ලජ්ජාවූයේ, නමාගත් කඳ ඇත්තේ යටි කුරුකරගත් මුහුණ ඇත්තේ, සුසුම්ලමින්, සිහි මුලාව හුන්නේය. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ නිශ්ශබ්දවූ, ලජ්ජාවූ, නමාගත් කඳ ඇත්තාවූ, බිම බලාගත් මුහුණ ඇත්තාවූ, සුසුම්ලන්නාවූ, සිහිමුලාවූ, අස්සලායණ තරුණයා දැන ඔහුට මෙසේ වදාළ සේක.

22. "අස්සලායණය, පෙරවූ දෙයක් (කියම්) අරණ්‍යයෙහි පර්ණකුටින්හි වාසය කළාවූ බමුණ ඉසිවරුන් සත්දෙනෙකුට මෙබඳු ලාමක දෘෂ්ටියක් උපන්නේ වේ. 'බමුණෝම උසස්ය,

අන්‍යයෝ හීනයහ, බමුණෝම සුදුපාට ඇත්තාහ. අන්‍යයෝ කළුපාට ඇත්තාහ. බමුණෝම පිරිසිදු වෙත්, අන්‍යයෝ අපිරිසිදු වෙත්, බමුණෝම බ්‍රහ්මයාගේ ඖරස පුත්‍රව මුවින් උපන්නාහු බ්‍රහ්මජය, මහබඹා මැවූ හෙයින් බ්‍රහ්මනිර්මිතයහ. බ්‍රහ්මදායාදයහයි'. අස්සලායණය, අරණ්‍යයෙහි පර්ණකුටින්හි වසන සත් ඉසිවරුන්ට, බමුණෝ ශ්‍රෙෂ්ඨයහ, අන්‍යයෝ හීනයහ, බමුණෝම සුදුපාට ඇත්තාහ, අන්‍යයෝ කළුපාට ඇත්තාහ, බමුණෝම පිරිසිදු වෙත්, අන්‍යයෝ අපිරිසිදු වෙත්, බමුණෝම බ්‍රහ්මයාගේ ඖරස පුත්‍රව මුවින් උපන්නාහු බ්‍රහ්මජය, මහබඹා මැවූ හෙයින් බ්‍රහ්ම නිර්මිතයහ, බ්‍රහ්මදායාදයහ, යන මේබඳුවූ ලාමක දෘෂ්ටියක් උපන්නේයයි අසිත දේවල ඍෂි තෙම ඇසීය."

"අස්සලායණය, ඉන්පසු අසිත දේවල ඍෂි තෙමේ කෙස් රැවුල් කපා මදටිය පාට ඇති වස්ත්‍ර ඇඳ පොරවා පොටවල් බොහෝ ඇති වහන් පයලා රන්මුවා දණ්ඩක් ගෙන සත්බමුණු ඉසිවරුන්ගේ පන්සල් මිදුලෙහි පහල විය. එකල අස්සලායණය, අසිත දේවල ඍෂියා සත්බමුණු ඉසිවරුන්ගේ පන්සල් මිදුලෙහි සක්මන් කරමින් මෙසේ කීය. 'මේ භවත් බමුණු ඍෂිහු කොහි ගියාහුද? මේ භවත් බමුණු ඍෂිහු කොහි ගියාහුද?"

23. "අස්සලායණය, එකල්හි සත්බමුණු ඍෂීන්ට මෙබඳු සිතක් විය. 'කුමක් හෙයින් මොහු ගම්දරුවෙකු මෙන් සත්බමුණු ඍෂිවරුන්ගේ පන්සල් මිදුලෙහි සක්මන් කරමින් මෙසේ කියයිද? 'මේ භවත් බමුණු ඍෂීහු කොහි ගියාහුද, මේ භවත් බමුණු ඍෂීහු කොහි ගියාහුදැයි? එබැවින් ඔහුට සාප කරමු.' අස්සලායණය, එකල්හි සත්බමුණු ඍෂීහු අසිත දේවල ඍෂියාට සාපකළහ. 'වසළය, අලුවෙවයි. 'අස්සලායණය, යම් යම් ආකාරයකින් සත්බමුණු ඍෂීහු අසිත දේවල ඍෂියාට සාපකළාහුද? ඒ ඒ අයුරින්ම අසිත දේවල ඍෂියා විශිෂ්ඨ රූප ඇත්තේ වෙයි, දැකීමට ප්‍රිය වෙයි, ප්‍රසාදයද උපදවයි.

24. "අස්සලායණය, එකල සත්බමුණු ඍෂීන්ට මෙබඳු සිතෙක්විය. 'ඒකාන්තයෙන් අපගේ තපස හිස්ය. බ්‍රහ්මචර්ය නිෂ්ඵලය, පෙර අපි යමෙකුට 'වසළය අලුවේවයි' ශාප

කෙළෙම්ද? ඇතැම් කෙනෙක් හලු වෙයි. මොහුට වනාහි අපි යම් යම් පරිද්දෙකින් ශාප කෙළෙමුද, ඒ ඒ පරිද්දෙන්ම විශිෂ්ඨ රූප ඇත්තේ වෙයි දැකීමට ප්‍රිය වෙයි. ප්‍රසාදය උපදවයි.

"භවතුන්ගේ තපස හිස් නොවේ. බ්‍රහ්මචර්යාය නිෂ්ඵල නොවේ. එබැවින් පින්වත්හු යමෙක් මා කෙරෙහි දූෂ්‍යවූ සිතැත්තේ වේද, එය දුරුකරව්. දූෂ්‍යවූ සිත් ඇති යමක් වෙයිද, එය දුරුකරමු.' 'පින්වත් තෙමේ කවරෙක් වෙහිද?, අපි විසින් පින්වතා අසිත දේවල ඍෂියායි අසන ලදී. 'පින්වත, එසේය. පින්වත, ඒ මම වෙමියි' අස්සලායණය එකල්හි සප්ත බ්‍රාහ්මණ ඍෂීහු අසිත දේවල ඍෂියාට වඳින්නට පැමිණියහ.

25. "එකල අස්සලායණය, අසිත දේවල ඍෂිතෙමේ සත්බමුණ ඉසිවරුන්ට මෙසේ කීයේය. 'පින්වත, මෙය අසන ලදී. අරණ්‍යයෙහි පර්ණකුටින්හි වසන්නාවූ සත්බමුණු ඍෂීන්ට මෙබඳු ලාමක දෘෂ්ටියක් උපන්නේයයි 'බමුණෝම උතුම්හ, අන්‍යයෝ හීනයහ, බමුණෝ සුදුපාට ඇත්තාහ, අන්‍යයෝම කළුපාට ඇත්තාහ, බමුණෝම පිරිසිදු වෙති, අන්‍යයෝ අපිරිසිදු වෙති, බමුණෝම බඹුගේ ඖරස පුත්‍රයෝව මුවින් උපන් බැවින් බ්‍රහ්මජයහ, බ්‍රහ්මයා විසින් මවන ලදහ, බ්‍රහ්මදායාදයහයි. එසේය පින්වත, පින්වත්හු වනාහි යම් මවක් බමුණෙකු වෙතම ගියේද, බමුණු නොවූවෙකු වෙතම ගියේදැ?යි දනිත්ද? පින්වත, මෙය නොදනිත්. පින්වත්හු වනාහි යම් මවකගේ මවුගේ පටන් සත්වැනි මී ආතාගේ පරපුර දක්වා බමුණෙකු කරාම ගියේද, බමුණු නොවූවෙකු කරා ගියේදැයි දනිත්ද? පින්වත, මෙය නොදනිත්. පින්වත්හු වනාහි යම් පියෙක් බැමිණියෙකු වෙතම ගියේද, නොබැමිණියෙකු වෙත ගියේදැයි දනිත්ද? පින්වත, මෙය නොදනිත්. පින්වත්හු වනාහි යම් පියෙකුගේ පියාගේ පටන් සත්වැනි මී මුත්තාගේ පරපුර දක්වා බැමිණියෙකු වෙතම ගියේද, නොබැමිණියෙකු වෙත ගියේදැයි දනිත්ද? පින්වත, මෙය නොදනිත්. පින්වත්හු යම්සේ කුසෙහි පිළිසිඳගැනීම වේයයි දනිත්ද, පින්වත, යම්සේ කුසෙහි පිළිසිඳගැනීම වේද, (එය) අපි දනිමු.

"මෙහි මව්පියෝද එක්වූවාහු වෙති. මවද ඍතුවූවාවෙයි. සත්වයෙක්ද එළඹියේ වෙයි. මෙසේ (මේ) තිදෙනාගේ එක් වීමෙන් කුසෙහි පිළිසිඳගැනීම වෙයි. පින්වත්හු වනාහි ඒ සත්වයා ක්ෂත්‍රියාය කියා හෝ බමුණාය කියා හෝ වෛශ්‍යයාය කියා හෝ ශුද්‍රයාය කියා හෝ දනිත්ද?" "පින්වත, ඒ සත්වයා ක්ෂත්‍රියාය කියා හෝ බමුණාය කියා හෝ වෛශ්‍යයාය කියා හෝ ශුද්‍රයාය කියා හෝ අපි නොදනිමු." "පින්වත, මෙසේ ඇති කල්හි (තෙපි) කවුදැයි තොපි දනිව්ද?" "පින්වත, මෙසේ ඇති කල්හි (අප) කවුදැයි අපි නොදනිමු."

**26.** "අස්සලායණය, ඒ සත්බමුණු ඍෂීහු අසිත දේවල ඍෂියා විසින් ස්වකීය ජාතිවාදයෙහි යොදවනු ලබන්නාහු, කියනු ලබන්නාහු, දැඩිව ගන්වනු ලබන්නාහු නොගැලපෙත්. නුඹ කිමෙක්ද? දැන් මා විසින් ස්වකීය ජාතිවාදයෙහි යොදවනු ලබන්නාහු, කියනු ලබන්නාහු, දැඩිව ගන්වනු ලබන්නාහු ගැලපෙන්නෙහිද? නුඹ යම් කෙනෙකුන්ට ආචාර්යයන් සහිතවූ පුණ්ණදබ්බිගාහ යාමෙන් නොගැලපෙන්නෙහිය."

**27.** මෙසේ කීකල අස්සලායණ තරුණයා භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත. භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත, භවත් ගෞතමයන් වහන්ස, යම්සේ යටිකුරුකොට තබන ලද්ද උඩුකුරු කරන්නේ හෝ වේද, වසා තබන ලද්දක් වැසුම් හරින්නේ හෝ වේද, මංමුළාවූවෙකුට මග කියන්නේ හෝ වේද, අන්ධකාරයෙහි ඇස් ඇත්තෝ රූප දකිත්වායි තෙල් පහනක් දරන්නේ හෝ වේද, එපරිද්දෙන්ම භවත් ගෞතමයන් වහන්සේ නොයෙක් ආකාරයෙන් ධර්මය දෙශනා කරන ලද්දේය. ඒ මම භවත් ගෞතමයන් වහන්සේද, ධර්මයද, සංඝයාද සරණ කොට යමි. භවත් ගෞතමයන් වහන්සේ මා අද පටන් දිවිහිමියෙන් සරණගිය උපාසකයෙකු කොට සලකන සේක්වා."

**තෙවෙනි වූ අස්සලායණ සූත්‍රය නිමි (5-3)**

---

# 44. ඝොටමුඛ සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් උදේන ස්ථවිරයන් වහන්සේ බරණැස් නුවර ඛේමිය අඹවනයෙහි වාසයකරන සේක. එසමයෙහි කිසියම් කටයුත්තක් සඳහා ඝොටමුඛ බ්‍රාහ්මණයා බරණැසට පැමිණියේය. ඉක්බිති ඝොටමුඛ බ්‍රාහ්මණයා පයින් ගමන් කරන්නේ ඇවිදින්නේ ඛෙමිය අඹවනය යම් තැනකද එතැනට පැමිණියේය. එකල වනාහි ආයුෂ්මත් උදේන ස්ථවිර තෙමේ එළිමහනෙහි සක්මන් කරයි. ඉක්බිති ඒ ඝොටමුඛ බ්‍රාහ්මණයා ආයුෂ්මත් උදේන ස්ථවිරයන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ, ආයුෂ්මත් උදේන ස්ථවිරයන් සමග සතුටුවිය. සතුටුවිය යුතුවූත් සිහිකටයුතුවූත් කථාව කොට නිමවා සක්මන් කරන්නාවූ ආයුෂ්මත් උදේන ස්ථවිරයන් වහන්සේට සක්මන් කරමින් මෙසේ කීය. "එම්බා, ශ්‍රමණය, දැහැමි පැවිද්දක් නැත. මෙසේ මාගේ අදහසක් වෙයි. එය වනාහි එබඳු පින්වතුන් වහන්සේලාගේ නොදැකීමෙන් හෝ මේ පැවිද්දෙහි යම් ධර්මයක් නොදැකීමෙන් හෝ මේ පැවිද්දෙහි මාගේ මේ අදහස වෙයි."

2. මෙසේ කී කල්හි ආයුෂ්මත් උදේන ස්ථවිරයන් වහන්සේ සක්මනින් බැස වෙහෙරට ඇතුල්වී පැනවූ අස්නෙහි හුන්නේය. ඝොටමුඛ බමුණාද සක්මනින් බැස වෙහෙරට ඇතුල්වී එක් පැත්තෙක සිටියේය. එක් පැත්තෙක සිටියාවූ ඝොටමුඛ බ්‍රාහ්මණයාට ආයුෂ්මත් උදේන ස්ථවිරයන් වහන්සේ මෙසේ කීසේක. "බමුණ, අසුන් තිබෙත්. ඉදින් කැමතිනම් හිඳගනුව. මේ කරුණුම වනාහි අපි භවත් උදේනගෙන් බලාපොරොත්තු වන්නෙම් නොහිඳිමු. කෙසේනම් මාවැන්නෙක් මුලින් නොපැවැරවූ අස්නෙක හිඳිය යුතුයයි සිතන්නේද? එකල්හි ඝොටමුඛ බ්‍රාහ්මණයා එක්තරා පහත් අස්නක් ගෙන එක් පැත්තෙක උන්නේය. එක් පැත්තක හුන්නාවූ ඝොටමුඛ බ්‍රහ්මණයා ආයුෂ්මත් උදේන ස්ථවිරයන්ට මෙසේ කීය. "එම්බා ශ්‍රමණය, දැහැමි පැවිද්දක් නැත. මෙසේ මාගේ අදහසක් වෙයි. එය වනාහි එබඳු පින්වතුන් වහන්සේලාගේ නොදැකීමෙන් හෝ

මේ පැවිද්දෙහි යම් ධර්මයක් නොදැකීමෙන් හෝ මේ පැවිද්දෙහි මාගේ මේ අදහස වෙයි."

"බමුණ, ඉදින් නුඹ මට ගුණ කියන්නෙහි නම් ගුණ කියව. අගුණ කියන්නෙහි නම් අගුණ කියව, මවිසින් කියන ලද්දෙහි අර්ථය නොදන්නෙහි නම් 'භවත් උදේනය, මෙය කෙසේද? මොහුගේ අර්ථය කවරේදැයි" එහිදී මතු මගෙන්ම ප්‍රශ්න කරව. මෙසේ කිරීමෙන් මෙහිදී අපගේ කථා සල්ලාපය වන්නේය". "මම වනාහි භවත් උදේනයන්ගේ ගුණ කියයුත්තට කියන්නෙමි. දොස් කිය යුත්තට දොස් කියන්නෙමි. මම වනාහි භවත් උදේනයන් කියනලද යමක අර්ථය නොදන්නෙම් නම්, එහිදී භවත් උදේනයන්ම මතු විමසන්නෙමි. 'භවත් උදේනය, මෙය කෙසේද? මොහුගේ අර්ථය කවරේද?' මෙසේ විමසීමෙන් මෙහිදී අපගේ කථා සල්ලාපය වේවා!

3. "බමුණ, පුද්ගලයෝ සතර දෙනෙක් ලොකයෙහි ඇත්තාහු විද්‍යමාන වෙත්. (ඒ) හතර දෙනා කවරහුද? බමුණ, මෙහි එක් පුද්ගලයෙක් තමා තැවීමේ යොගයෙහි යෙදුණේ තමා තවන්නේ වෙයි. බමුණ, මෙහි වනාහි එක් පුද්ගලයෙක් අනුන් තැවීමේ යොගයෙහි යෙදුනේ අනුන් තවන්නේ වෙයි, බමුණ, මෙහි ඇතැම් පුද්ගලයෙක් තමා තැවීමේ යොගයෙහි යෙදුනේ තමා තවන්නේද වෙයි. අනුන් තැවීමේ යොගයෙහි යෙදුනේ අනුන් තවන්නේද වෙයි. බමුණ, මෙහි වනාහි ඇතැම් පුද්ගලයෙක් තමා තැවීමේ යොගයෙහි නොයෙදුනේ තමා නොතවන්නේ වේ. අනුන් තවන යොගයෙහි නොයෙදුනේ අනුන් නොතවන්නේ වෙයි. හෙතෙම තමා නොතවන්නේ, අනුන් නොතවන්නේ, මේ ආත්මභවයෙහි නොඇළුනේ, නිවුනේ, සිහිල්වූයේ, සුව විඳින සුළුවූයේ, උතුම් ආත්මයක් ඇතිව වාසය කරයි. බමුණ, මේ සිව් පුද්ගලයන් අතුරෙන් පුද්ගලයෙක් තාගේ සිත සතුටු කෙරේද?"

4. "භවත් උදේනය, යම් ඒ පුද්ගලයෙක් තමා තැවීමේ යොගයෙහි යෙදුනේ තමා තවනේ වේද, මේ පුද්ගල තෙමේ මාගේ සිත සතුටු නොකරයි. භවත් උදේනය, යම් ඒ පුද්ගලයෙක්

අනුන් තැවීමේ යොගයෙහි යෙදුනේ අනුන් තවන්නේ වේද? මේ පුද්ගලයාද මාගේ සිත් නොගනියි. භවත් උදේනය, යම් ඒ පුද්ගලයෙක් තමා තැවීමේ යොගයෙහි යෙදුනේ වේද, තමාද තවන්නේ වේද, අනුන් තැවීමේ යොගයෙහි යෙදුනේ අනුන්ද තවන්නේ වේද, මේ පුද්ගලයාද මාගේ සිත් නොගනියි. උදේනය, යම් මේ පුද්ගලයෙක් තමා තැවීමේ යෝගයෙහි නොයෙදුනේ, තමා නොතවන්නේ වේද, අනුන් තැවීමෙහි යොගයෙහි නොයෙදුනේ අනුන් නොතවන්නේ වේද, හෙතෙම තමා නොතවන්නේ අනුන් නොතවන්නේ මේ ආත්මභවයෙහි නොඇළුනේ, නිවුනේ, සිහිල් වූයේ සුව විඳින සුළු වූයේ උතුම්වූ ආත්මයක් ඇතිව වාසය කරයි. මේ පුද්ගලයා මාගේ සිත සතුටු කරයි."

**5.** "බමුණ, කුමක් හෙයින් මේ තුන් පුද්ගලයෝ තාගේ සිත සතුටු නොකෙරෙත්ද?" භවත් උදේනය, යම් ඒ පුද්ගලයෙක් තමා තැවීමේ යොගයෙහි යෙදුනේ තමා තවන්නේවේද, හෙතෙම තමාට සුව කැමැත්තේ, දුක් පිළිකුල් කරන්නේ, තවයි. වැඩියෙන් තවයි. මේ හේතුකොටගෙන මේ පුද්ගලයා මාගේ සිත නොගනියි. භවත් උදේනය, යම් ඒ පුද්ගලයෙක් අනුන් තැවීමේ යොගයෙහි යෙදුනේ අනුන් තවන්නේ වේද හෙතෙම අන්‍යයාට සුව කැමැත්තේ දුක් පිළිකුල් කරන්නේ තවයි. වැඩියෙන් තවයි. කැමැත්තේ දුක් පිළිකුල් කරන්නේ තවයි. වැඩියෙන් තවයි. මේ නිසා මේ පුද්ගලයා මාගේ සිත නොගනියි. භවත් උදේනය, යම් ඒ පුද්ගලයෙක් තමා තැවීමේ යොගයෙහි යෙදුනේ තමාද තවන්නේ වේද, අනුන් තැවීමේ යොගයෙහි යෙදුනේ අනුන්ද තවන්නේ වේද, හෙතෙම තමාටද, අනුන්ටද සුව කැමැත්තෙන් දුක් පිළිකුල් කරන්නේ, තවයි. වැඩියෙන් තවයි. මේ නිසා මේ පුද්ගලයා මාගේ සිත නොගනියි. භවත් උදේනය, යම් ඒ පුද්ගලයෙක් තෙමේම නොතවන්නේ, තමා තැවීමේ යොගයෙහි නොයෙදුනේ තමා නොතවන්නේ වේද, අනුන් තැවීමේ යොගයෙහි නොයෙදුනේ අනුන් නොතවන්නේ වේද, හෙතෙම තමා නොතවන්නේ අනුන් නොතවන්නේ මේ ආත්මයෙහි නොඇලුනේ, නිවුනේ, සිහිල්වූයේ, සුව විඳින සුළු

වූයේ, උතුම් වූ ආත්මයක් ඇතිව වාසය කරයි. හෙතෙම තමාටද, අන්‍යයාටද, සුව කැමැත්තෙන්, දුක් පිළිකුල් කරනු කැමැත්තෙන් නොතවයි. වැඩියෙන් නොතවයි. මේ නිසා මේ පුද්ගලයා මාගේ සිත සතුටු කරයි.”

6. “බමුණ, මේ පිරිස් දෙකකි. ඒ පිරිස් දෙක කවරේද? බමුණ, මේ ලොකයෙහි එක් පිරිසක්, අධික රාගයෙන් රත්වූවාහු මිණි කොඬොල් සහිත අඹුදරුවන් සොයයි. දැසි දස්සන් සොයයි. කෙත් වත් සොයයි. රන්, රිදී සොයයි. බමුණ මේලොව වනාහි එක් පිරිසක් අධික රාගයෙන් රත් නොවූවාහු මිණි කොඬොල් සහිත අඹු දරුවන් හැර, දැසි දස්සන් හැර කෙත් වත් හැර, රන් රිදී හැර ගිහිගෙන් නික්ම අනගාරිය නම් ලත් ශාසනයෙහි පැවිදිවූහ. බමුණ, ඒ මේ පුද්ගලයා, ආත්මය නොතවන්නේ, ආත්මය තැවීමේ යොගයෙහි නොයෙදුනේ, අනුන් නොතවන්නේ, අනුන් තැවීමේ යොගයෙහි නොයෙදුනේ හෙතෙම තෙමේ නොතවන්නේ, අනුන් නොතවන්නේ, මේ ආත්මයෙහි නොඇලුනේ, නිවුනේ සිහිල් වූයේ සුව විඳින්නේ, උතුම්වූ ආත්මයකින් යුක්තව වාසය කරයි. බමුණ, නුඹ මේ පුද්ගලයා කවර පිරිසක බහුලව දක්නෙහිද? යම් මේ පිරිසක් අධික රාගයෙන් රත්වූවාහු මිණි කොඬොල් සහිත අඹුදරුවන් සොයයි. දැසි දස්සන් සොයයි. කෙත්වත් සොයයි. රන් රිදී සොයයි යම් මේ පිරිසක් අධික රාගයෙන් රත් නොවූවාහු මිණි කොඬොල් සහිත අඹු දරුවන් හැර දැසි දස්සන් හැර කෙත් වත් හැර රන් රිදී හැර ගිහිගෙන් නික්ම අනගාරිය නම්ලත් ශාසනයෙහි පැවිදි වූහ.

7. “භවත් උදේනය, යම් මේ පුද්ගලයෙක් ආත්මය නොතවන්නේ ආත්මය තැවීමේ යොගයෙහි නොයෙදුනේ, අන්‍යයා නොතවන්නේ, අන්‍යයා තැවීමේ යොගයෙහි නොයෙදුනේ හෙතෙම ආත්මය නොතවන්නේ, අනුන් නොතවන්නේ, මේ ආත්ම භවයෙහි නොඇළුනේ නිවුනේ, සිහිල් වූයේ, සුව විඳින සුළු වූයේ, උතුම්වූ ආත්මයකින් යුක්තව වාසය කරයි. මම යම් මේ පිරිසක් රාගයෙන් රත් නොවූවා මිණි

කොඩොල් සහිත අඹු දරුවන් හැර දැසි දස්සන්හැර කෙත් වත් හැර රන් රිදී හැර ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වූවාහුද, මේ පුද්ගලයා මේ පිරිසෙහි බහුලව දකිමි.”

8. “බමුණ, තාවිසින් වනාහි දැන්ම කියනලදී. අපි මෙසේ දනිමු. ‘එම්බා ශ්‍රමණය, දැහැමි පැවිද්දක් නැතැයි මෙසේ මාගේ අදහසක් වෙයි. එබඳුවූ පින්වතුන් වහන්සේලාගේ නොදැකීමෙන් හෝ මේ පැවිද්දෙහි වනාහි යම් ධර්මයක් නොදැකීමෙන් හෝ මේ පැවිද්දෙන් ‘මාගේ මේ අදහස වෙයි.”

“භවත් උදේනය, ඒකාන්තයෙන් මා විසින් මේ අනුකම්පාව ලැබියයුතු වචනකියන ලද්දේය. දැහැමි පැවිද්දක් ඇත්තේය. මෙසේ මේ පැවිද්දෙහි මාගේ මේ අදහස වෙයි. භවත් උදේන තෙමේ මා මෙසේද දරාවා. භවත් උදේනයන් විසින් යම් මේ පුද්ගලයෝ සතර දෙනෙක් සුළු වශයෙන් කියන ලද්දාහුද, විස්තර වශයෙන් නොබෙදන ලද්දාහුද භවත් උදේනයන් වහන්සේ මේ සිවු පුද්ගලයන් මට මනාකොට විස්තර වශයෙන් අනුකම්පා උපදවා බෙදා දෙන සේක්වා.” “බමුණ එසේනම් අසව, මනාකොට සිත්හි තබාගනුව, කියන්නෙමි.” “එසේය භාග්‍යවතුන් වහන්සැ”යි ඝෝටමුඛ බමුණා ආයුෂ්මත් උදේනස්ථවිරයන්ට පිළිතුරු දුන්නේය. ආයුෂ්මත් උදේන ස්ථවිර තෙමේ මෙසේ කීය.

9. “බ්‍රාහ්මණය, තමන් තවන්නාවූද තමන් තවන පිළිවෙතෙහි යෙදුනාවූද, පුද්ගල තෙම කවරේද? බ්‍රාහ්මණය මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් තෙම වස්ත්‍ර නොහඳින්නේ වෙයි. හොඳ පැවතුම් නැත්තේ වෙයි. මල පහකොට අතින් පිස දමන්නේ වෙයි. ‘එව ස්වාමීනියි’ කීවිට නොඑන්නේ වෙයි. සිටිනු ස්වාමීනියි කීවිට නොසිටින්නේ වෙයි, පළමු කොට ගෙනෙනලද ආහාරය නොපිළිගණියි. උදෙසා කරණ ලද්ද නොපිළිගණියි. ආරාධනාකොට දුන් බත නොඉවසයි හෙතෙම කළගෙඩි කටින් ගෙණ දුන් දෙය නොපිළිගණියි. සැළි කටින් ගෙණ දුන් දෙය නොපිළිගනියි. එළිපත අතර කොට දුන් දෙය නොපිළිගණියි. දණ්ඩක් අතර කොට දුන් දෙය නොපිළිගණියි.

මෙහොලක් අතර කොට දුන් දෙය නොපිළිගණියි. වළඳන්නාවූ දෙදෙනෙකු අතුරෙන් කෙනෙක් දුන් දෙය නොපිළිගණියි. ගැබිණියකගෙන් නොපිළිගණියි කිරිපොවන්නියකගෙන් නොපිළිගණියි. පුරුෂයන් අතරට ගිය ස්ත්‍රියකගෙන් නොපිළිගණියි. සමාදන් කොට දුන් කල්හි නොපිළිගණියි. යම් තැනක සුනඛයෙක් සිටියේ වේද එතන්හි නොපිළිගණියි. යම් තැනක මැස්සෝ රන්වූ රන්වූ ගැවසෙත්ද, එතන්හි නොපිළිගණියි. දියමස් ආහාරය නොපිළිගණියි. ගොඩ මස් නොපිළිගණියි. සුරාව නොපිළිගණියි. මෙරය (මල් යුෂින් කළ මත් පැන්) නොපිළිගණියි. කාඩිදිය නොබොයි. හෙතෙම එක ගෙයකින් ලැබූ ආහාර ඇත්තේ හෝ වෙයි. එක පිඩකින් යැපෙන්නෝ හෝ වෙයි. ගෙවල් දෙකකින් ලැබූ ආහාර ඇත්තේ හෝ වෙයි. පිඩු දෙකකින් යැපෙන්නේ හෝ වෙයි. ගෙවල් තුනක වසන්නේ හෝ වෙයි. පිඩු තුනකින් යැපෙන්නෝ වෙයි. ගෙවල් හතරක වසන්නේ හෝ වෙයි. පිඩු හතරකින් යැපෙන්නන් හෝ වෙයි. ගෙවල් පහක වසන්නේ හෝ වෙයි. පිඩු පහකින් යැපෙන්නෝ හෝ වෙයි. ගෙවල් හයක වසන්නෝ හෝ වෙයි. පිඩු හයකින් යැපෙන්නෝ වෙයි. ගෙවල් සතකින් ලැබූ ආහාර ඇත්තේ හෝ වෙයි. පිඩු සතකින් යැපෙන්නෝ හෝ වෙයි. එකම කුඩාවූ ආහාර භාජනයකින් යැපෙයි. කුඩා ආහාර බඳුන් දෙකකින්ද යැපෙයි. කුඩා ආහාර බඳුන් තුනකින්ද යැපෙයි. කුඩා ආහාර බඳුන් හතරකින්ද යැපෙයි. කුඩා ආහාර බඳුන් පහකින්ද යැපෙයි. කුඩා ආහාර බඳුන් හයකින්ද යැපෙයි. කුඩා ආහාර බඳුන් හතකින්ද යැපෙයි. එක් දවසක් හැර දවසක්ද ආහාර ගනියි. දෙදවසක් හැර දවසක්ද ආහාර ගනියි. තුන් දවසක් හැර දවසක්ද ආහාර ගනියි. හතර දවසක් හැර දවසක්ද ආහාර ගනියි. පස් දවසක් හැර දවසක්ද ආහාර ගනියි. හය දවසක් හැර දවසක්ද ආහාර ගනියි. සත් දවසක් හැර දවසක්ද ආහාර ගනියි. මෙසේ මෙබඳු අඩමසකට වරක් ආහාර ගනිමින්ද, වාර භොජනයෙහි යෙදී වාසය කරයි. හෙතෙම අමු පලා කන්නේ හෝ වෙයි. බඩ හමු අනුභව කරන්නේ හෝ වෙයි. හුරුහැල් අනුභව කරන්නේ හෝ වෙයි. සම්කසට අනුභව

කරන්නේ හෝ වෙයි. මැලියම් අනුභව කරන්නේ හෝ වෙයි. කුඩු අනුභව කරන්නේ හෝ වෙයි. දඹු බත් අනුභව කරන්නේ වෙයි. තල මුරුවට අනුභව කරන්නේ හෝ වෙයි. තණකොල අනුභව කරන්නේ හෝ වෙයි. ගොම අනුභව කරන්නේ හෝ වෙයි. වනමුල් ඵල ආහාර කොට ඇතිව වැටුණු ගෙඩි අනුභව කරමින් එයින් යැපෙයි. හෙතෙම හන වැහැරිද දරයි. මිශ්‍රකළ වැහැරිද දරයි. මල සිරුරෙන් දැමූ වස්ත්‍රද දරයි පංසුකූල වස්ත්‍රද දරයි. ගස් සුඹුලෙන් කළ වස්ත්‍රද දරයි. අඳුන් දිවි සම්ද දරයි. කුර සහිත අඳුන් දිවිසම්ද දරයි. කුසතණ වැහැරිද දරයි. කෙඳිවලින් කළ වැහැරිද දරයි. පතුරුවලින් කළ වැහැරිද දරයි. මිනිස් කෙසින් කළ කම්බිලිද දරයි. අස්ලොම් ආදියෙන් කළ කම්බිලිද දරයි. බකමුහුණු පිහාටු ගොතා කළ වස්ත්‍ර දරයි. හිසකේ රැවුල් උදුරන්නේ, ඉසකේ රැවුල් උදුරන පිළිවෙතෙහි යෙදුනේ වෙයි. ආසන ප්‍රතික්ෂෙප කරන ලද්දේ උඩ බලා සිටින්නේ වෙයි. උක්කුටිකව වීර්ය කිරීමෙහි යෙදුනේ උක්කුටික වූයේද වෙයි. කටු යහනෙහි සයනය කරයි. කටු ඇතිරියෙහි සයනය කරයි. සවස තෙවැනි කොට (දවසට තුන්වරක්) දියට බසින පිළිවෙතෙහි යෙදුනේ වාසය කරයි. මෙසේ මෙබඳු නොයෙක් ආකාරයෙන් ශරීරය තවන පෙලන තපස් කම්වල යෙදී වාසය කරයි. මහණෙනි, මේ පුද්ගලතෙම තමන් තවන්නේ තමන් තවන පිළිවෙතෙහි යෙදුනේයයි කියනු ලැබේ.

10. "බ්‍රාහ්මණය, අනුන් තවන්නාවූ අනුන් තවන පිළිවෙතෙහි යෙදුනාවූ පුද්ගල තෙම කවරේද? බ්‍රාහ්මණය, මේ ලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් එළුවන් මරන්නේ වෙයි. ඌරන් මරන්නේ වෙයි. ලිහිණින් මරන්නේ වෙයි. මුවන් මරන්නේ වෙයි. රෞද්‍රවූයේ වෙයි. මසුන් මරන්නේ වෙයි. සොරකම් කරන්නේ වෙයි. සොරුන් මරන්නේ වෙයි. සිරගෙවල් පාලනය කරන්නේ වෙයි. අන්‍යවූද කිසියම් දරුණුකම් කරන්නාහු මේ පුද්ගලතෙම අනුන් තවන්නේ අනුන් තවන පිළිවෙතෙහි යෙදුනේයයි කියනු ලැබේ.

11. "බ්‍රාහ්මණය, තමන් තවන්නාවූ තමන් තවන පිළිවෙතෙහි යෙදුනාවූද, අනුන් තවන්නාවූ අනුන්තවන පිළිවෙතෙහි

යෙදුනාවූද, පුද්ගලතෙමේ කවරේද? බ්‍රාහ්මණය, මේලොකයෙහි ඇතැම් පුද්ගලයෙක් ඔටුණු පළඳිනලද ක්ෂත්‍රිය රජෙක් හෝ වෙයි. මහා සාර වංශ ඇත්තාවූ මහත් වස්තුව ඇති බ්‍රාහ්මණයෙක් හෝ වෙයි. හෙතෙම නුවරට නැගෙනහිර දිශාවෙහි අළුත්වූ යාග ශාලාවක් කරවා, හිසකේ රැවුල් බහවා කුර සහිත අඳුන් දිවිසමක් හැඳ ගිතෙලින් හා තලෙතෙලින් ශරීරය තවරා මුවඅගින් පිට කසමින් මෙහෙසියද පොරෝහිත බමුණාද සමග යාග ශාලාවට පිවිසෙයි. හෙතෙම එහි අතුරුණලද පැදුරු ආදියක් නැති ගොම පිරිබඩකළාවූ භූමියෙහි සයනය කරයි. සමාන වස්සන් ඇති එක දෙනකගේ එක තනයෙක්හි යම් කිරක්වේද, එයින් රජතෙම යැපෙයි. දෙවෙනි තනයෙහි යම් කිරක් වේද, එයින් මෙහෙසිය යැපෙයි. තුන්වන තනයෙහි යම් කිරක් වේද, එයින් පුරෝහිත බමුණා යැපෙයි. සිවුවන තනයෙහි යම් කිරක් වේද එයින් ගිනි පුදත්. ඉතිරිවූවකින් වසුතෙම යැපෙයි. හෙතෙම මෙසේ කියයි. 'යාගය පිණිස මෙපමණ වෘෂභයන් නසත්වා, යාගය පිණිස මෙපමණ නාඹු වස්සන් නසත්වා, යාගය පිණිස මෙපමණ නැඹි වැස්සියන් නසත්වා, යාගය පිණිස මෙපමණ එළුවන් නසත්වා, යාගය පිණිස මෙපමණ තිරෙළුවන් නසත්වා, යාග කණු පිණිස මෙතෙක් ගස් කපත්වා, යාග භූමිය වටකිරීම හා ඇතිරීම පිණිස මෙතෙක් කුසතණ සිඳිත්වායි'. ඔහුගේ යම් ඒ දාසයෝය කියා හෝ පණිවුඩකාරයෝය කියා හෝ කම්කරුවෝය කියා හෝ කෙනෙක් වෙත්ද, ඔව්හුද දණ්ඩයෙන් තැති ගත්තාහු, භයින් තැති ගත්තාහු කඳුළු පිරුණු මුහුණු ඇතිව හඬමින් වැඩකරත්. මහණෙනි, මේ පුද්ගල තෙම තමන් තවන්නේ තමන් තවන පිළිවෙතෙහි යෙදුනේද, අනුන් තවන්නේ අනුන් තවන පිළිවෙතෙහි යෙදුනේද වේයයි කියනු ලැබේ.

12. "බ්‍රාහ්මණය, තමන් නොමතවන්නාවූ තමන් තවන පිළිවෙතහි නොයෙදුනාවූද, අනුන් නොතවන්නාවූ අනුන් තවන පිළිවෙතෙහි නොයෙදුනාවූද, පුද්ගලතෙමේ කවරේද? තමන්ද නොතවන්නාවූ අනුන්ද නොතවන්නාවූ ඒ පුද්ගල තෙම මේ ආත්මයෙහිම තෘෂ්ණා රහිතවූයේ කෙලෙසුන්ගෙන් නිවියේ සිහිල්වූයේ ධ්‍යානාදි සුව විඳිමින් ශ්‍රෙෂ්ඨවූ පුද්ගලයෙක්ව වාසය

කරයි. බ්‍රාහ්මණය, මේ ලොකයෙහි අර්හත්වූ සම්‍යක්සම්බුද්ධවූ අෂ්ඨවිද්‍යා පසළොස් චරණ ධර්මයන්ගෙන් යුක්තවූ, ශොභන ගමන් ඇත්තාවූ, ලෝකය දන්නාවූ, නිරුත්තර වූ, දමනය කළ නොහැකි පුරුෂයන් දමනය කිරීමෙහි සාරථියෙකු බඳුවූ, දෙව් මිනිසුන්ට අනුශාසනා කරන්නාවූ, චතුරාර්ය සත්‍යයන් අවබෝධ කළාවූ, සියලු ක්ලේශයන් නැති කළාවූ තථාගතයන් වහන්සේ පහලවෙති. උන්වහන්සේ දෙවියන් සහිතවූ මාරයන් සහිතවූ බ්‍රහ්මයන් සහිතවූ මේ ලොකයද මහණ බමුණන් සහිතවූ දෙව් මිනිසුන් සහිතවූ ප්‍රජාවද තමන් වහන්සේ විශිෂ්ට ඥානයෙන් දැන ප්‍රත්‍යක්ෂකොට ප්‍රකාශ කරනසේක. උන්වහන්සේ මුල යහපත්වූ, මැදයහපත්වූ කෙළවර යහපත්වූ, අර්ථ සහිතවූ ව්‍යඤ්ජන සහිතවූ, ධර්මය දෙශනා කරනසේක. සියල්ලෙන් සම්පූර්ණවූ පිරිසිදුවූ මාර්ග බ්‍රහ්මචර්යාව ප්‍රකාශ කරන්නාහ.

13. ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ අන් එක්තරා කුලයෙක උපන්නෙක් හෝ ඒ ධර්මය අසයි. හෙතෙම ඒ ධර්මය අසා තථාගතයන් වහන්සේ කෙරෙහි පහදියි. එසේ පැහැදුණාවූ හෙතෙම මෙසේ සලකයි. "ගිහිගෙයි විසීම අවහිර සහිතය. කෙලෙස් දූවිලි උපදින තැනකි. මහණකම අවකාශය මෙන් නිදහස්ය. ගිහිගෙයි වසන්නහු විසින් එකාන්තයෙන් සම්පූර්ණ කොට ඒකාන්තයෙන් පිරිසිදු කොට ලියවනලද සකක් වැනි මේ ශාසන බ්‍රහ්මචර්යාවෙහි හැසිරෙන්ට පහසු නොවෙයි. 'මම හිසකෙස් දැළි රැවුල් කපාදමා සිවුරු හැඳ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වන්නෙම් නම් ඉතා යෙහෙක' කියායි. හෙතෙම පසු කාලයෙක්හි ස්වල්පවූ හෝ සම්පත් හැර, මහත්වූ හෝ සම්පත් හැර ස්වල්පවූ හෝ නෑදෑ පිරිස් හැර, මහත්වූ හෝ නෑදෑ පිරිස් හැර හිසකේ දැළි රැවුල් කපාදමා සිවුරු හැඳ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වෙයි. හෙතෙම මෙසේ පැවිදිවූයේම භික්ෂු සීලයෙන් යුක්ත වූයේ ප්‍රාණඝාතය හැර ප්‍රාණඝාතයෙන් වැලකුනේ වෙයි. බහා තබන ලද දඬු ඇත්තේ පව් කිරීමට ලජ්ජා ඇත්තේ, කරුණාවෙන් යුක්ත වූයේ, සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇතිව වාසය කරයි. නුදුන් දෙය ගැණීම හැර නුදුන් දෙය ගැණීමෙන් වැලකුනේ වෙයි. දුන්

දෙය ගන්නේ දුන් දෙයෙහි බලාපොරොත්තු ඇත්තේ සොරනොවූ පිරිසිදුවූ සිතින් යුක්තව වාසය කරයි. අබ්‍රහ්මචර්යාව හැර උතුම් පැවතුම් ඇත්තේ ස්ත්‍රී පුරුෂ සංසර්ගය නම් ග්‍රාම ධර්මයෙන් වෙන්ව බ්‍රහ්මචාරීවේ. මුසාවාදය හැර මුසාවාදයෙන් වැලකුනේ, සත්‍යවචන ඇත්තේ, සත්‍යයෙන් සත්‍යය ගැළපීම් ඇත්තේ ස්ථිර වචන ඇත්තේ, ඇදහිය යුතු වචන ඇත්තේ, ලොව මුළා නොකරන්නෙක් වෙයි. කේලාම් කීම් හැර කේලාම් කීමෙන් වැලකුනේ වෙයි. බොහෝ දෙනාට ප්‍රියද, බොහෝ දෙනාගේ හිත් ප්‍රිය කරන්නේද, එබඳු වචනම කියන්නේවේ. හිස්වූ ප්‍රලාප කථා හැර ඉන් සම්පූර්ණයෙන් වැළකුණේ, කාලයට සුදුසු කථා කරන්නේ, සිදුවූ වචනම කියන්නේ, අර්ථයෙන් යුක්තවූ, ධර්මයෙන් යුක්තවූ, විනයයෙන් යුක්තවූ, වචන කියන්නේ, සුදුසු කල්හි උපමා හා කරුණු සහිතවූ, සීමා ඇති අර්ථයෙන් යුත්, නිධානයක් මෙන් සිතෙහි තැබිය යුතු වචන කියන්නේ වේ.

14. "හෙතෙම තණ, ගස්, වැල් සිඳීම් බිඳීම් ආදියෙන් වැළකුණේ වෙයි. එක් වේලක් වළඳන්නේ රාත්‍රි භොජනයෙන් හා විකාල භොජනයෙන් වැළකුණේ වෙයි. නැටීම්, ගී කීම්, බෙර ආදිය වැයීම්, විසුලු දැකීම් යන මෙයින් වැළකුණේ වෙයි. මල්, ගඳ විලවුන් පැළඳීම, ඉන් සැරසීම, අඩු තැන් පිරවීමෙන් අලංකාර කිරීම යන මෙයින් වැළකුණේ වෙයි. උස් අසුන් මහ අසුන් යන මෙයින් වැළකුණේ වෙයි. රන්, රිදී, මසු කහවණු පිළිගැන්මෙන් වැළකුණේ වෙයි. අමු ධාන්‍ය වර්ග පිළිගැන්මෙන් තොරවූයේ වෙයි. අමු මස් පිළිගැන්මෙන් තොරවූයේ වෙයි. ස්ත්‍රීන් තරුණියන් පිළිගැන්මෙන් තොර වූයේ වෙයි. වැඩකරුවන් වැඩකාරියන් පිළිගැන්මෙන් තොර වූයේ වෙයි. එළුවන් බැටළුවන් පිළිගැනීමෙන් වැළකුනේ වෙයි. ඌරන්, කුකුළන් පිළිගැනීමෙන් වැළකුණේ වෙයි. ඇතුන්, ගවයින්, අසුන්, වෙළඹුන්, පිළිගැන්මෙන් වැළකුණේ වෙයි. කෙත්, වත්, පිළිගැනීමෙන් වැළකුණේ වෙයි. ගිහීන්ගේ දූත මෙහෙවරය, ගෙන් ගෙට යන මහත් මෙහෙවරය යන මෙයින් වැළකුණේ වෙයි. විකිණීම මිළට ගැනීම යන මෙයින් වැළකුණේ වෙයි.

තරාදියෙන් හොරට කිරීම, රන් නොරන් කිරීමාදියෙන්, හොරකිරීම, මැනීමෙන් හොර කිරීමාදියෙන් වැළකුණේ වෙයි. හිමියන් අහිමි කිරීමාදිය සඳහා අල්ලස් ගැන්මය, උපායෙන් අනුන් රැවටීමය, යකඩ ආදී ලොහ රන් රිදීයයි අඟවා වඤ්චා කිරීමය, නොයෙක් ආකාරවූ කුටිල ප්‍රයොගය යන මෙයින් වැළකුණේ වෙයි. කැපීමය, බැඳීමය සැඟවී සිට වස්තු පැහැරගැන්මය, ගම් නියම්ගම් ආදිය පැහැරීමය, බලාත්කාරකමින් වස්තු පැහැර ගැන්මය යන මෙයින් වැළකුණේ වෙයි.

"හෙතෙමේ යන්තම් කය වැසීමට තරම්වූ සිවුරෙන්ද, යැපීමට ප්‍රමාණවූ ආහාරයෙන්ද, සතුටුවන්නේ වේ. ඔහු යම් යම් තැනකට යේ නම් ඒ ඒ තැනට එය ගෙනයන්නේ වෙයි. යම්සේ පක්ෂියෙක් යම් තැනකට පියාඹා යේ නම් ඒ සියලු තැන පියාපත් බර පමණකින් යුක්තව පියාඹා යේද, එපරිද්දෙන්ම භික්ෂු තෙමේද ශරීරය වැසීමට ප්‍රමාණවූ සිවුරෙන්ද යැපීමට ප්‍රමාණවූ ආහාරයෙන්ද සතුටුවන්නේ වේ. ඔහු යම් තැනකට යා නම් ඒ ඒ තැන එය රැගෙනම යයි. හෙතෙමේ මේ උතුම් සීලයෙන් යුක්තවූයේ තම සන්තානයෙහි නිරවද්‍යවූ සැපය විඳින්නේය.

15. "හෙතෙමේ, ඇසින් රූපයක් දැක එහි මහත් සටහන් සිතට ගන්නේ නැත. කුඩා සටහන් සිතට ගන්නේ නැත. චක්ෂු ඉන්ද්‍රියයෙහි අසංවරව වසන්නහුට යමක් හේතු කොට ගෙන ලොභ ද්වේෂ අකුශල ධර්මයෝ හිතට ඇතුල් වන්නාහුද, එහි සංවරය පිණිස ඔහු පිළිපදී. ඔහු තමාගේ චක්ෂු ඉන්ද්‍රියය රකී, චක්ෂු ඉන්ද්‍රියයෙහි සංවරයට පැමිණේ.

"කණින් ශබ්දයක් අසා එය නිමිති වශයෙන් ගන්නේ නොවේ. නැවත නැවත මතක් වනසේ අල්ලා ගන්නේ නොවේ. යමක් හේතු කොට ගෙන ශ්‍රොතෙන්ද්‍රිය (කන්) අසංවරව වසන්නහුට ලොභ ද්වේෂ අකුශල ධර්මයෝ උපදිත්ද, ඒ ශ්‍රොතෙන්ද්‍රියයෙහි සංවරය පිණිස පිළිපදියි. ශ්‍රොතඉන්ද්‍රියය රකී. ශ්‍රොතෙන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි.

"නාසයෙන් ගඳක් ආඝ්‍රාණය කොට එය නිමිති වශයෙන් නොගනී. නැවත නැවත මතක් වන සේ සිතට නොගනී. යමක් හේතු කොට ගෙන ඝානෙන්ද්‍රිය (නාසය) අසංවරව වාසය කරන්නහුට ලොභ ද්වේෂ අකුසල ධර්මයෝ උපදිත්ද, එහි සංවරය පිණිස පිළිපදියි. ඝානෙන්ද්‍රිය රකියි. ඝානෙන්ද්‍රියයාගේ සංවරයට පැමිණෙයි. දිවෙන් රසක් විඳ එය අරමුණු වශයෙන් නොගනී. නැවත නැවත මතක් වන සේ නොගනී. යමක් හේතු කොට ගෙන, ජිව්හේන්ද්‍රිය සංවර නොකොට වාසය කරන්නාහට ලොභ ද්වේෂ අකුශල ධර්මයෝ උපදිත්ද, එහි සංවරය පිළිපදියි. ජිව්හෙන්ද්‍රිය (දිව) ආරක්ෂා කරයි. ජිව්හේන්ද්‍රියයෙහි සංවරයට පැමිණෙයි.

"කයින් පහසක් ස්පර්ශකොට නිමිති වශයෙන් නොගනියි. නැවත නැවත මතක්වන සේ සිතට නොගනියි. යමක් හේතු කොට කායෙන්ද්‍රිය අසංවරව වාසය කරන්නහුට ලොභ ද්වේෂ අකුසල ධර්මයෝ උපදිත්ද, ඒ කායෙන්ද්‍රිය සංවරය පිණිස පිළිපදියි. කායෙන්ද්‍රිය ආරක්ෂා කරයි. කායෙන්ද්‍රියේ සංවරයට පැමිණෙයි. සිතින් ධර්මාරම්මණයක් දැන නිමිති වශයෙන් නොගනී. නැවත නැවතත් මතක් වන සේ සිතට නොගනී. යම් හෙයකින් සිත අසංවරව වාසය කරන්නහුට ලොභ ද්වේෂ අකුශල ධර්මයෝ උපදිත්ද, ඒ මනින්ද්‍රිය (සිත්) සංවරය පිණිස පිළිපදියි. මනින්ද්‍රිය රකී. මනින්ද්‍රිය සංවරයට පැමිණෙයි. හෙතෙමේ මේ උතුම් ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූයේ තම සන්තානයෙහි කෙලෙසුන්ගෙන් තෙත් නොවූ සැපය විඳින්නේය.

**16.** "හෙතෙමේ ඉදිරියට යාමෙහිද, ආපසු යාමෙහිද නුවණින් යුක්තවූයේ වෙයි. ඉදිරිපස බැලීමෙහිද හැරී බැලීමෙහිද, නුවණින් යුක්තවූයේ වෙයි. අත් පා හැකිලීමෙහිද, දිගුකිරීමෙහිද, නුවණින් යුක්තවූයේ වෙයි. සඟළ සිවුර සහ පාත්‍රා සිවුරු දැරීමෙහි නුවණින් යුක්තවූයේ වෙයි.

"අනුභව කිරීමය, පානය කිරීමය, රස විඳීමය යන මෙහිද නුවණින් යුක්තවූයේ වෙයි. මල මුත්‍ර පහකිරීමෙහිද නුවණින්

යුක්තවූයේ වෙයි. යෑම්, සිටීම්, හිඳීම්, සැතපීම්, නිදි තොර කිරීම්, කථාකිරීම්, නිශ්ශබ්ද වීම් යන මෙහිද නුවණින් යුක්තවූයේ වෙයි.

"උතුම්වූ මේ සීලසමූහයෙන් යුක්තවූද උතුම්වූ මේ ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තවූද, මේ උතුම්වූ සතිසම්පජඤ්ඤයෙන් යුක්තවූද, ඒ භික්ෂු තෙමේ කැලයද, ගහක් මුලද, පර්වතද, කඳුරැලිද, ගල්ගුහාද, සොහොන්ද, ඉතා දුරවූ කැලෑද, හිස්තැන්ද, පිදුරු ගොඩවල්ද යන මේ විවේක සෙනාසන භජනය කෙරෙයි. ඔහු පසුබත් කාලයෙහි පිණ්ඩපාත ආහාරයෙන් වැළකුණේ, පර්යංක බැඳ, ශරීරය කෙළින් තබා සිත අරමුණෙහි පිහිටුවා හිඳගනියි.

"ඔහු ස්කන්ධ ලොකයෙහි ලොභය පහකොට ලොභ රහිත සිතින් යුක්තව වාසය කෙරේ. ලොභයෙන් සිත පිරිසිදු කෙරේ. සිත කෙලෙසන්නාවූ ක්‍රොධය පහකොට, ක්‍රොධයෙන් දුරුවූ සිත් ඇතිව වාසය කරයි. සියලු සතුන් කෙරෙහි හිතානුකම්පා ඇතිව වාසය කරයි. ක්‍රොධයෙන් සිත පිරිසිදු කෙරේ. කාය චිත්ත දෙදෙනාගේ අලස බව දුරු කොට කය-සිත පිළිබඳ පහවූ අලස බව ඇත්තේ ආලොක සංඥා ඇත්තේ, සිහි ඇත්තේ, යහපත් ප්‍රඥා ඇත්තෙක්ව ථීනමිද්ධයෙන් සිත පිරිසිදු කෙරේ. නොසන්සුන්කම හා පසුතැවීම දුරු කොට, සංසිඳුනු සිත් ඇතිව වාසය කෙරේ. ඇතුළත සංසිඳුනු සිත් ඇත්තේ, උද්ධච්චකුක්කුච්චයෙන් සිත පිරිසිදු කෙරේ. සැකය දුරු කොට, පහකළ සැක ඇත්තේ කුශල ධර්ම විෂයෙහි එසේද මෙසේ දැයි සැක නැතිව විචිකිච්ඡාවෙන් සිත පිරිසිදු කෙරේ.

17. "හෙතෙම සිත කිලුටු කරන්නාවූ, ප්‍රඥාව දුර්වල කරන්නාවූ මේ පංච නීවරණයන් දුරුකොට, කාමයන්ගෙන් වෙන්වම අකුශල ධර්මයන්ගෙන් වෙන්වම විතර්ක සහිතවූ විචාර සහිතවූ විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කරයිද, බ්‍රාහ්මණය, යමක් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස භික්ෂූහු මාගේ ශාසනයෙහි උතුම් හැසිරීමෙහි හැසිරෙත්ද අතිශයින් උතුම්වූ, අතිශයින් ප්‍රණීතවූද මේ ධර්මයද වේ. බ්‍රාහ්මණය මහණතෙම විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන්

ඇතුලත පැහැදීම ඇති, හිතේ එකඟ බව ඇති, විතර්ක රහිතවූ විචාර රහිත සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සැප ඇති ද්විතිය ධ්‍යානයට පැමිණ වාසය කරයිද, බ්‍රාහ්මණය යමක් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස භික්ෂූහු මාගේ ශාසනයෙහි උතුම් හැසිරීමෙහි හැසිරෙත්ද, අතිශයින් උතුම්වූද, අතිශයින් ප්‍රණීතවූද මේ ධර්මයද වේ.

18. "බ්‍රාහ්මණය, නැවත අනිකක්ද කියමි. මහණතෙම ප්‍රීතියෙහිද නොඇලීමෙන් උපේක්ෂා ඇත්තේ වාසය කරයිද, සිහියෙන් යුක්ත වූයේ, නුවණින් යුක්තවූයේ ශරීරයෙන් සුවය විඳින්නේද, ආර්යයෝ යම් ඒ ධ්‍යානයක් උපෙක්ෂා ඇති, සිහි ඇති සැප විහරණ ඇත්තේයයි කියද්ද, ඒ තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කරයිද, උදායීය, යමක් ප්‍රත්‍යක්ෂ කිරීම සඳහා භික්ෂූහු මාගේ ශාසනයෙහි උතුම් හැසිරීමෙහි හැසිරෙත්ද, අතිශයින් උතුම්වූද අතිශයින් ප්‍රණීතවූද මේ ධර්මයද වේ.

19. "බ්‍රාහ්මණය, නැවත අනිකක්ද, කියමි. මහණ තෙම සැපය දුරු කිරීමෙන්ද, දුක දුරු කිරීමෙන්ද, (ධ්‍යානය ලැබීමට) පළමුවම සොම්නස් දොම්නස් දෙදෙනාගේ නැසීමෙන් දුක්ද නොවූ, සැපද නොවූ උපෙක්ෂා සිහියෙන් පිරිසිදු බව ඇති සතරවන ධ්‍යානයට පැමිණ වාසය කරයිද,

"හෙතෙමේ මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාම සිත් රහිතවූ කල්හි, ක්ලේශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පානොවන බවට පැමිණි කල්හි, පෙර ජාති සිහි කිරීමේ ඥානය පිණිස සිත නමයි. හේ තෙමේ නොයෙක් විදියේ පෙර විසීම් සිහි කෙරෙයි. කෙසේදයත්, 'එක් ජාතියක්ද, ජාති දෙකක්ද, ජාති තුනක්ද, ජාති හතරක්ද, ජාති පසක්ද, ජාති දසයක්ද, ජාති විස්සක්ද, ජාති තිහක්ද, ජාති හතළිසක්ද, ජාති පණසක්ද, ජාති සියයක්ද, දහස් ජාතියක්ද, සියක් දහස් ජාතියක්ද, නොයෙක් විනාශ වෙමින් පවතින කල්පයන්ද, නොයෙක් හැදෙමින් පවතින කල්පයන්ද, නොයෙක් විනාශවන හෝ හැදෙන කල්පයන්ද, 'අසුවල් තැන වීමි, මෙනම් ඇත්තෙම් මේ

ගොත්‍ර ඇත්තෙමි, මේ පාට ඇත්තෙමි, මේ කෑම ඇත්තෙමි, මේ සැප දුක් වින්දෙමි, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙමි, වීමි. ඒ මම එයින් චුතවූයෙමි. අසුවල් තැන උපන්නෙමි, එහිදු මෙනම් ඇත්තෙමි, මේ ගොත්‍ර ඇත්තෙමි, මේ පාට ඇත්තෙමි, මේ කෑම ඇත්තෙමි, මේ සැප දුක් වින්දෙමි, මේ ආයුෂ කෙළවර කොට ඇත්තෙම් වීමි. ඒ මම එයින් චුත වූයෙමි, මෙහි උපන්නෙමි'යි මෙසේ ආකාර සහිතව, දැක්වීම් සහිතව, නොයෙක් විදියේ පෙර ජීවිත සිහිකෙරෙයි. බ්‍රාහ්මණය, යමක් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස භික්ෂූහු මාගේ ශාසනයෙහි උතුම් හැසිරීමෙහි හැසිරෙත්ද, අතිශයින් උතුම්වූද, අතිශයින් ප්‍රණීතවූද, මේ ධර්මයද වේ.

**20.** "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි, දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිතවූ කල්හි, කෙලෙස් පහවගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි, හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි, චුති උත්පත්ති දැනගන්නා නුවණ පිණිස සිත නමයි. හේ පිරිසිදුවූ මිනිස් ඇස ඉක්මවූ, දිව ඇසින් චුතවන උපදින සත්ත්වයන් දකී පහත්වූද, උසස්වූද, ලක්ෂණවූද, අවලක්ෂණවූද, හොඳ ලොව උපදින්නාවූද නරක ලොව උපදින්නාවූද, කර්මයට අනුව උපදින්නාවූ සත්ත්වයන් දකී. 'මේ පින්වත් සත්ත්වයෝ කාය දුශ්චරිතයෙන් යුක්ත වූහ, වාග් දුශ්චරිතයෙන් යුක්තවූහ. මනො දුශ්චරිතයෙන් යුක්තවූහ, ආර්යයන්ට ගරහන්නෝ වූහ. මිථ්‍යාදෘෂ්ටිකයෝ වූහ. මිථ්‍යාදෘෂ්ටි කර්ම සමාදන් වූවෝ වූහ. ඔව්හු මරණින් මතු සැපයෙන් පහවූ නපුරුවූ දුක්වූ, නිරයට පැමිණෙත්. නැතහොත්, මේ පින්වත් සත්ත්වයෝ කාය සුචරිතයෙන් යුක්තවූහ. වාක් සුචරිතයෙන් යුක්ත වූහ, මනො සුචරිතයෙන් යුක්ත වූහ, ආර්යයන්ට නොගරහන්නෝ වූහ, සත්‍යය අදහන්නෝ වූහ, සත්‍ය ඇදහීම් සමාදන් වූහ. ඔව්හු මරණින් මතු යහපත් ස්වර්ග ලොකයට පැමිණියෝ"යි මෙසේ පිරිසිදුවූ මිනිස් ඇස ඉක්මවූ දිව ඇසින් චුතවන උපදින සත්ත්වයන් දකී. මෙසේ පිරිසිදුවූ මනුෂ්‍යත්වය ඉක්ම සිටියාවූ දිවැසින් චුතවන්නාවූද, උපදින්නාවූද, පහත්වූද, උසස්වූද, ලක්ෂණවූද, අවලක්ෂණවූද, හොඳ ලොවට

ගියාවූද, නරක ලොවට ගියාවූද, කර්මය ලෙස පැමිණි සත්ත්වයන් දනී.

**21.** "ඔහු මෙසේ සිත එකඟවූ කල්හි, පිරිසිදුවූ කල්හි දීප්තිමත්වූ කල්හි, කාමහිත් රහිත කල්හි, ක්ලේශයන් පහව ගිය කල්හි, මෘදුවූ කල්හි, කටයුත්තට යොග්‍යවූ කල්හි හිත ස්ථිරවූ කල්හි, කම්පා නොවන බවට පැමිණි කල්හි සිතේ පැසවන කෙලෙස් පහකිරීමේ ඥානය පිණිස සිත නමයි. ඔහු මේ දුකයයි තතු ලෙස දැනගණී, මේ දුක් ඉපදීමේ හේතුවයයි තතු ලෙස දැනගණී, මේ දුක් නැති කිරීමයයි තතු ලෙස දැනගණී. මේ දුක් නැතිකිරීමේ මාර්ගයයි තතු ලෙස දැනගණී. මේ පැසවන කෙලෙස්යයි තතු ලෙස දැනගණී, මේ පැසවන ක්ලේශයන්ගේ හේතුවයයි තතු ලෙස දැනගණී. මේ ඒ කෙලෙස් නැතිකිරීමයයි තතු ලෙස දැනගනී. මේ ඒ කෙලෙස් නැති කිරීමේ මාර්ගයයි තතු ලෙස දැනගනී.

"මෙසේ දන්නා දක්නා ඔහුගේ සිත කාම ආශ්‍රවය කෙරෙන්ද මිදේ, භව ආශ්‍රවය කෙරෙන්ද සිත මිදේ අවිද්‍යාශ්‍රවය කෙරෙන්ද සිත මිදේ, මිදුනු කල්හි මිදුනේය යන ඥානය පහළවෙයි. ඉපදීම නැති විය. උතුම් හැසිරීමෙහි වසනලදී, කටයුත්ත කරණ ලදී. මින් පසු මේ සඳහා කළ යුත්තක් නැතැයි'ද දැනගණී.

**22.** "බ්‍රාහ්මණය, යමක් ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස භික්ෂූහු මාගේ ශාසනයෙහි උතුම් හැසිරීමෙහි හැසිරෙත්ද මේ වනාහි ඒ ඉතා උතුම්වූද, ඉතා ප්‍රණීතවූද ධර්මයවේ. බ්‍රාහ්මණය, යම් ධර්මයන් ප්‍රත්‍යක්ෂ කිරීම සඳහා භික්ෂූහු මාගේ ශාසනයෙහි උතුම් හැසිරීමෙහි හැසිරෙත්ද මේ වනාහි ඉතා උතුම්වූද, ඉතා ප්‍රණීතවූද ධර්මයෝ වෙතියි" වදාළේය.

බ්‍රාහ්මණය, මේ පුද්ගලතෙම තමන් නොතවන්නේ තමන් නොතවන්නාවූ පිළිවෙතෙහි යෙදුනේද, අනුන් නොතවන්නේ අනුන් නොතවන්නාවූ පිළිවෙතෙහි යෙදුනේද වේයයි කියනු ලැබේ." හෙතෙම තමන් නොතවන්නාවූද, අනුන් නොතවන්නාවූද මේ ආත්මයෙහිම තෘෂ්ණාරහිතවූයේ

කෙලෙසුන්ගෙන් නිවියේ සිහිල්වූයේ ධ්‍යානාදී සැප විඳින සුළුවූයේ ශ්‍රෙෂ්ඨවූ පුද්ගලයෙක්ව වාසය කෙරේ”යයි වදාළහ.

23. මෙසේ කීකල ඝෝටමුඛ බමුණා ආයුෂ්මත් උදේන ස්ථවිරයන් වහන්සේට මෙසේ කීය. භවත් උදේනය, ඉතා යහපත භවත් උදේනය, ඉතා යහපත. භවත් උදේනය, යටිකුරුකළ දෙයක් උඩුකුරු කරන්නේ යම්සේද, වැසුනු දෙයක් වැසුම් හරින්නේ යම්සේද, මංමුලාවූවකුට මාර්ගය කියන්නේ යම්සේද, ඇස් ඇත්තෝ රූපයන් දකිත්වායි අන්ධකාරයෙහි තෙල් පහනක් දරන්නේ යම්සේද, මෙපරිද්දෙන් භවත් උදේන ස්ථවිරයන් විසින් නොයෙක් ක්‍රමයෙන් ධර්මය ප්‍රකාශ කරන ලද්දේය. මම මේ භවත් උදේනයන්ද ධර්මයද භික්ෂු සංඝයාද සරණ යමි. භවත් උදේනයන් වහන්සේ අද පටන් දිවිහිම්ව සරණගිය උපාසකයකුසේ මා දරන සේක්වා.

24. “බමුණ, නුඹ මා සරණ නොයව. මම යම් සරණක් ගියෙම්ද, ඒ භාග්‍යවතුන් වහන්සේම නුඹද සරණයව. භවත් උදේනයන් වහන්ස, ඒ භවත් ගෞතමවූ අර්හත්වූ සම්‍යක් සම්බුදුන් වහන්සේ දැන් කොතැන්හි වසන සේක්ද? බමුණ, දැන් ඒ භාග්‍යවත්වූ අර්හත්වූ සම්මාසම්බුදුන් වහන්සේ පිරිනිවි සේක. භවත් උදේනයන් වහන්ස, ඒ භවත් ගෞතමයන් වහන්සේ දස යොදුනක් තන්හි වෙසෙත්යයි ඉදින් අපි අසන්නෙමු නම් අපි ඒ භවත් ගෞතමවූ අරහත්වූ සම්මාසම්බුදුන් වහන්සේ දැකීමට දසයොදුන් තන්හිද යන්නෙමු භවත් උදේනයන් වහන්ස, ඉදින් ඒ භවත් ගෞතමයන් වහන්සේ විසියොදුනක් තන්හියයි අසන්නෙමු නම්, අර්හත්වූ සම්‍යක් සම්බුද්ධවූ ඒ භවත් ගෞතමයන් වහන්සේ දැකීමට විසියොදුනක්ද යන්නෙමු. පින්වත් උදේනයන් වහන්ස. ඒ භවත් ගෞතමයන් වහන්සේ ඉදින් තිස්යොදුනක් තන්හියයි අපි අසන්නෙමු නම්, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ ඒ භවත් ගෞතමයන් වහන්සේ දැකීමට අපි තිස්යොදුනක්ද යන්නෙමු. පින්වත් උදේනයන් වහන්ස, ඒ භවත් ගෞතමයන් වහන්සේ ඉදින් සතළිස් යොදුනක් තන්හියයි අපි අසන්නෙමු නම්, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ ඒ භවත් ගෞතමයන්

වහන්සේ දැකීමට අපි පණස් යොදුනක්ද යන්නෙමු. පින්වත් උදේනයන් වහන්ස, ඉදින් ඒ භවත් ගෞතමයන් වහන්සේ යොදුන් සියයක් තන්හියයි අසන්නෙමු නම්, අර්හත් සම්‍යක් සම්බුද්ධවූ ඒ භවත් ගෞතමයන් වහන්සේ දැකීමට අපි සියක් යොදුනක්ද යන්නෙමු.

**25.** "භවත් උදේනය, යම්හෙයකින් භවත් ගෞතමයන් වහන්සේ පිරිනිවි සේක්ද, පිරිනිවියාවූ ඒ භවත් ගෞතමයන් වහන්සේද ධර්මයද භික්ෂුසංඝයාද, අපි සරණ යමු. භවත් උදේනයන් වහන්සේ අද පටන් දිවිහිම්ව සරණගිය උපාසකයකු කොට මා දරණ සේක්වා. භවත් උදේනයන් වහන්ස, මට භික්ෂාවන් ඇත්තේය. අඟුරජ දවස්පතා නිත්‍ය භික්ෂාවක් (මට) දෙයි. එයින් භවත් උදේනයන් වහන්සේට එක නිත්‍ය භික්ෂාවක් දෙමි" "බමුණ, නුඹට අඟුරජ දිනපතා නිත්‍ය භික්ෂාවට කුමක් දෙන්නේදැයි. භවත් උදේනයන් වහන්ස, පන්සියයක් කහවණුය. බමුණ, අපට රන් රිදී පිළිගැන්ම නුසුදුසුයි" (අකැපයි.)

**26.** "ඉදින් එය භවත් උදේනයන් වහන්සේට අකැප වෙයි. නම් විහාරයක් කරවන්නෙමි" "බමුණ, නුඹ මට විහාරයක් කරවනු කැමැත්තෙහිනම් පැලලුප් නුවර සංඝයාට උපස්ථාන සාලාවක් කරව". "භවත් උදේනයන්ට මේ නිසා මම බොහෝ කොට පැහැදුනෙමි. ඉතා ඇලුනෙමි. භවත් උදේන තෙමේ මහා සංඝයා විෂයෙහි දන් දෙවයි. භවත් උදේනය, ඒ මම මේ නිත්‍ය භික්ෂාවෙන්ද, අන්‍ය නිත්‍ය භික්ෂාවෙන්ද පැලලුප් නුවර සංඝයාට උපස්ථාන ශාලාවක් කරවන්නෙමි". ඉක්බිති ඝෝටමුඛ බමුණා මේ නිත්‍ය භික්ෂාවෙන්ද අන්‍ය නිත්‍ය භික්ෂාවෙන්ද පැලලුප් නුවර සඟනට උපස්ථාන ශාලාවක් කරවිය. ඒ ශාලාව දැන් වනාහි ඝොටමුඛීයයි කියනු ලැබේ.

**සතරවෙනි ඝොටමුඛ සූත්‍රය නිමි. (5-4)**

---

# 45. චංකී සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක්සමයෙක භාග්‍යවතුන් වහන්සේ කොසොල්රට චාරිකාවේ හැසිරෙන්නේ, මහත්වූ භික්ෂු සංඝයා සමග ඕපසාද නම් කෝසලයන්ගේ බමුණුගම යම් තැනෙකද එතැන හැසුරුණු සේක. එහිදී භාග්‍යවතුන් වහන්සේ ඕපසාද ගමට උතුරෙන් ඕපසාද ගමෙහි දේව වන නම්වූ සාල වනයෙහි වාසය කරණසේක. එසමයෙහි වනාහි චංකී බ්‍රාහ්මණයා මිනිසුන්ගෙන් හා සතුන්ගෙන් ගහනවූ, තණ දර හා දිය සහිතවූ, ධාන්‍ය සහිතවූ, රජුන්ගෙන් ලැබුණු පරිභොගයක්වූ පසේනදි කොසොල් රජු විසින් දෙන ලද්දක්වූ උතුම් කොට දෙන ලද්දක්වූ ඔපසාද නුවර වෙසෙයි. (එකල්හි) ඔපසාද ගමෙහි වාසය කරන්නාවූ බමුණු ගෘහපතියෝ (මෙපුවත) ඇසූහ. ශාක්‍ය පුත්‍රවූ ශාක්‍ය කුලයෙන් නික්ම පැවිදිවූ ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ මහත් භික්ෂු සංඝයා සමග චාරිකාවෙහි හැසිරෙනසේක් ඕපසාද ගමට පැමිණ, ඕපසාදි ගිමට උතුරෙන් පිහිටි ඕපසාද ගමෙහි දේව වන නම්වූ සාලවනයෙහි වාසය කරණසේක.

2. ඒ භවත් ගෞතමයන් වහන්සේගේ මෙබඳුවූ, යහපත්වූ කීර්ති ශබ්දයක් උස්ව පැන නැංගේය. 'ඒ භාග්‍යවතුන් වහන්සේ, මේ කාරණයෙන්ද අර්හත්හ, සම්මා සම්බුද්ධයහ, විජ්ජාචරණ සම්පන්නයහ. සුගතයහ, ලොකවිදූහ, මිනිසුන් දමනය කිරීමෙහි තමන්ට වඩා වැඩි කෙනෙක් නැතියහ. දෙවි මිනිස්හුගේ අනුශාසකයහ. බුද්ධයහ, භාග්‍යවත්හ. ඒ භාග්‍යවතුන් වහන්සේ දෙවියන් සහිතවූ, මරුන් සහිතවූ, බඹුන් සහිතවූ, මහණ බමුණන් සහිතවූ, රජුන් හා මිනිසුන් සහිතවූ, සත්ව සමූහයා ඇතුළු සකල ලෝකය තමන් වහන්සේම මනාව දැන, අවබෝධකොට ප්‍රකාශ කරණ සේක.

උන්වහන්සේ මුල යහපත්වූ, මැද යහපත්වූ, අග යහපත්වූ, අර්ථ සහිතවූ (දස වැදෑරුම්) අක්ෂර සම්පත්තියෙන් යුක්තවූ, සර්ව සම්පූර්ණවූ, ධර්මය පිරිසිදුවූ බ්‍රහ්මචරියාව දෙශනා

කරණසේක. එබඳුවූ රහතුන්ගේ දැකීමක් වේනම් ඒ යහපත්මය” (කියායි)

3. ඉක්බිති සමූහ වශයෙන් එක්වුනාවූ, ඕපසාදක ගම්වැසි බමුණු ගෘහපති සමූහයා ඕපසාද ගමින් නික්ම උතුරු දිසාවට මුහුණ ලා දේව වන නම් සාලවනය යම් තැනකද එහි යයි. එසමයෙහි වනාහි චංකී බමුණතෙම ප්‍රාසාදයේ මතුමහලෙහි දවල් ඕපසාදක ගෘහපති සමූහයන් ඕපසාද ගමින් නික්ම දේවවන නම් සල්වනය යම් තැනෙකද, එහි උතුරු දෙසට මුහුණලා යන්නවුන් දැක්කේය. දැක, ‘බත්ත’ නම් මහ ඇමතියාට කථා කළේය. “භවත් බත්තයෙනි, කුමක් හෙයින් සමූහ වශයෙන් එක්වුනාවූ, ඕපසාදක ගම ගෘහපති සමූහයා ඕපසාද ගමින් නික්ම උතුරු දෙසට මුහුණලා දේවවන නම් සල්වනයට යයිද?”

4. “භවත් චංකී බ්‍රාහ්මණය, ශාක්‍ය පුත්‍රවූ, ශාක්‍යකුලයෙන් නික්මපැවිදිවූ, ශ්‍රමණභවත් ගෞතමයන් වහන්සේ මහත් භික්ෂු සංඝයා සමග කොසොල්රට ඕපසාද ගමට ඇවිදිනසේක් පැමිණියේ, ඕපසාද ගමට උතුරෙන් පිහිටි, ඕපසාද ගමෙහි දේවවන නම් සල්වෙනෙහි වාසය කරණසේක. ඒ භවත් ගෞතමයන් වහන්සේගේ මෙබඳුවූ යහපත්වූ කීර්ති ශබ්දයක් උස්ව පැනනැංගේය. ඒ භාග්‍යවතුන් වහන්සේ මේ කරුණෙනුදු අරහත්හ, සම්මා සම්බුද්ධයහ, විජ්ජාචරණ සම්පන්නයහ, සුගතයහ, ලෝකවිදූහ, මිනිසුන් දමනය කිරීමෙහි තමන්ට වඩා වැඩි කෙනෙක් නැතියහ. දෙව් මිනිසුන්ට අනුශාසකයහ, බුද්ධයහ, භාග්‍යවත්හ.

“ඒ භවත් ගෞතමයන් වහන්සේ දැකීමට මොවුහු යති. භවත් බත්තයෙනි, එසේනම් ඕපසාදක බ්‍රාහ්මණ ගෘහපතියන් යම්තැනකද එතැනට යව. ගොස් ඕපසාදක බ්‍රාහ්මණ ගෘහපතියන්ට මෙසේ කියව. ‘භවත් චංකී බ්‍රාහ්මණතෙමේ මෙසේ කීය. “පින්වත්හු නවතිත්වා, චංකී බ්‍රාහ්මණතෙමේ ශ්‍රමණ ගෞතමයන් දැකීමට එන්නේයයි, “පින්වතුන් වහන්ස, එසේයැයි” එ බත්ත ඇමතියා චංකී බමුණාට පිළිතුරු දී ඕපසාදක බමුණු

ගෘහපතියන් යම් තැනකද එතැනට ගියේය. ගොස් ඕපසාදක බමුණු ගෘහපතියන්ට මෙසේ කීය. පින්වත් චංකී බ්‍රාහ්මණ තෙමේ මෙසේ කීය. පින්වත්හු නවතිත්වා. චංකී බ්‍රාහ්මණ තෙමේ ශ්‍රමණ ගෞතමයන් දැකීමට එන්නේයයි”.

5. එසමයෙහි වනාහි නොයෙක් රටවලට අයත් පන්සියයක් පමණ බමුණෝ කිසියම් කටයුත්තක් නිසා ඔපසාද ගමේ වසත්. ඒ බමුණෝ චංකී බමුණා ශ්‍රමණ ගෞතමයන් දැකීමට යන්නේයයි ඇසූහ. ඉක්බිති ඒ බමුණෝ යම් තැනෙක චංකී බමුණා වෙයිද, එතැනට පැමිණියහ. පැමිණ චංකී බමුණාට මෙසේ කීහ. “භවත් චංකීතෙමේ ශ්‍රමණ ගෞතමයන් දැකීමට යන්නේය, යනු ඇත්තක්ද?”

“පින්වත, එසේ මට සිතෙයි. මමත් ශ්‍රමණ ගෞතමයන් දැකීමට යන්නෙමියි” (කියායි). “භවත් චංකී බමුණු තෙමේ ශ්‍රමණ ගෞතමයන් දැකීමට නොයව. භවත් චංකී තෙමේ ශ්‍රමණ ගෞතමයන් දැකීමට යාම නුසුදුසුය. ශ්‍රමණ ගෞතමයන්ම භවත් චංකී දැකීමට ඒම සුදුසුය. භවත් චංකී තෙමේ මව්පිය දෙපසින් මනාව උපන් කෙනෙක. යම් හෙයකින් භවත් චංකී තෙම මව්පිය දෙපසින් මනාව උපන්නේ සත්වන මීමුත්තාගේ පරපුර දක්වා අවමන් නොකරන ලද්දේ, ජාතිවාදයෙන් අපහාස නොකරන ලද්දේ, නින්දා නොකරන ලද්දේ වේද, සත්වන මීමුත්තාගේ පරපුර දක්වා ඉතා පිරිසිදුව මව්කුස පිළිසිඳගත්තෙක, ජාතිවාදයෙන් අපහාස නොකරණ ලද්දේක, නින්දා නොකරණ ලද්දෙක. මෙකරුණෙනුදු භවත් චංකී ශ්‍රමණ ගෞතමයන් දැකුමට යනු නුසුදුසුය. ශ්‍රමණ ගෞතමයන්ම පින්වත් චංකී දැකීමට එනු සුදුසුය. භවත් චංකී තෙමේ සියලු දෙයින් සම්පූර්ණය. මහත් ධන ඇත්තේය. මහත් සම්පත් ඇත්තේය. යම් හෙයකින් භවත් චංකී තෙමේ සියලු දෙයින් සම්පූර්ණ වේද, මහත් ධන ඇත්තේ වේද, මහත් සම්පත් ඇත්තේ වේද, මේ කරුණෙනුදු භවත් චංකී ශ්‍රමණ ගෞතමයන් දැකුමට යනු නුසුදුසුය. ශ්‍රමණ ගෞතමයන්ම පින්වත් චංකී දැකුමට එනු සුදුසුය.

**6.** "භවත් චංකීතෙම නිඝණ්ඩු ශාස්ත්‍රය හා කෙටුභ ශාස්ත්‍රයද සහිත ශික්ෂා නිරුක්ති සහිත ඉතිහාසය පස්වැනි කොට ඇති ත්‍රිවෙදයෙහි පරතෙරට ගියේය, පද දන්නේය, ව්‍යාකරණ දන්නේය, ලෝකායත ශාස්ත්‍රය හා මහා පුරුෂ ලක්ෂණ ශාස්ත්‍රයන්හි සම්පූර්ණවූ දැනුම් ඇත්තේය. යම් හෙයකින් භවත් චංකී තෙමේ නිඝණ්ඩු ශාස්ත්‍රය හා කෙටුභ ශාස්ත්‍රයද, සහිත ශික්ෂා නිරුක්ති සහිත ඉතිහාසය පස්වැනි කොට ඇති ත්‍රිවේදයෙහි පරතෙර පැමිණියේ වේද, මේ කරුණෙනුදු භවත් චංකී ශ්‍රමණ ගෞතමයන් දැකුමට යනු නුසුදුසුය. ශ්‍රමණ ගෞතමයන්ම පින්වත් චංකී දැකුමට එනු සුදුසුය.

**7.** "භවත් චංකීතෙමේ මනා රූ ඇත්තේය, මනා පෙනුමක් ඇත්තේය, උතුම්වූ ශරීර ශොභාවෙන් යුක්තය, දුටුවන් පහදවන්නේය. බ්‍රහ්මයාගේ වර්ණයට බඳු වර්ණයෙන් යුක්තය. බ්‍රහ්ම ශරීරය වැනි ශරීරයකින් යුක්තය. ශරීරයෙහි දැකුමට ඇති දේ බොහෝය. යම් හෙයකින් භවත් චංකී තෙමේ මනා රූ ඇත්තේ වේද, මනා පෙනුමක් ඇත්තේ වේද, දුටුවන් පහදවන්නේ වේද, උතුම්වූ ශරීර ශොභාවක් ඇත්තේ වේද, බ්‍රහ්මයට බඳු වර්ණයෙන් යුක්ත වේද, බඹහුගේ ශරීරය වැනි ශරීරයකින් යුක්ත වූයේ වේද, ශරීරයෙහි දැකුමට ඇති දේ බොහෝ වේද, මේ කරුණෙනුදු භවත් චංකී ශ්‍රමණ ගෞතමයන් දැකුමට යනු නුසුදුසුය. ශ්‍රමණ ගෞතමයන්ම පින්වත් චංකී දැකුමට එනු සුදුසුය.

**8.** "භවත් චංකී තෙමේ වඩන ලද සිල් ඇති, සම්පූර්ණ සීලයෙන් යුත් සිල්වතෙක. යම් හෙයකින් භවත් චංකී තෙමේ වඩන ලද සිල් ඇති, සම්පූර්ණ සීලයෙන් යුත් සිල්වතෙක් වූයේ වේද, මේ කරුණෙනුදු භවත් චංකී ශ්‍රමණ ගෞතමයන් දැකුමට යනු නුසුදුසුය. ශ්‍රමණ ගෞතමයන්ම පින්වත් චංකී දැකුමට එනු සුදුසුය.

**9.** "භවත් චංකීතෙමේ යහපත් වචන ඇති. යහපත් තෙපුල් ඇති, නිදොස්වූ, කෙලතොලු නොවූ, අර්ථ හැඟවීමෙහි සමත් යහපත් වචන ඇති තැනැත්තෙක. යම් හෙයකින් භවත් චංකී

තෙමේ යහපත් වචන ඇති, යහපත් තෙපුල් ඇති නිර්දෝෂවූ, කෙලතොලු නොවූ, අර්ථ හැඟවීමෙහි සමත් යහපත් වචන ඇති තැනැත්තෙක් වේද, මේ කරුණෙනුදු භවත් චංකී ශ්‍රමණ ගෞතමයන් දැකුමට යනු නුසුදුසුය ශ්‍රමණ ගෞතමයන්ම පින්වත් චංකී දැකුමට එනු සුදුසුය.

**10.** "භවත් චංකී තෙමේ බොහෝදෙනාගේ ගුරුවරයාද, ගුරුවරයන්ගේ ගුරුවරයාද වූයේ, තුන්සියයක් මානවකයන්ට වේදමන්ත්‍ර කියවයි. යම් හෙයකින් භවත් චංකී තෙමේ බොහෝදෙනාගේ ආචාර්යද, ආචාර්යන්ගේ ආචාර්යද වූයේ, තුන්සියයක් මානවකයන්ට වේදමන්ත්‍ර කියවයිද, මේ කරුණෙනුදු භවත් චංකී ශ්‍රමණ ගෞතමයන් දැකුමට යනු නුසුදුසුය. ශ්‍රමණ ගෞතමයන්ම පින්වත් චංකී දැකුමට එනු සුදුසුය.

**11.** "භවත් චංකී තෙමේ පසේනදී කොසොල්රජ විසිනුදු සත්කාර කරන ලද්දේය, ගරුකරන ලද්දේය, බුහුමන් කරන ලද්දේය, පුදන ලද්දේය, නැමදුම් කරන ලද්දේය යම් හෙයකින් භවත් චංකී තෙමේ පසේනදි කොසොල් රජ විසිනුදු සත්කාර කරන ලද්දේ වේද, බුහුමන් කරන ලද්දේ වේද, ගරු කරන ලද්දේ වේද, පුදන ලද්දේ වේද, නැමැදුම් කරන ලද්දේ වේද, මේ කරුණෙනුදු භවත් චංකී ශ්‍රමණ ගෞතමයන් දැකුමට යනු නුසුදුසුය. ශ්‍රමණ ගෞතමයන්ම පින්වත් චංකී දැකුමට එනු සුදුසුය.

**12.** "භවත් චංකීතෙමේ "පොක්ඛරසාති" බමුණා විසිනුදු සත්කාර කරනලද්දේය, ගරු කරන ලද්දේය, බුහුමන් කරන ලද්දේය, පුදන ලද්දේය, නැමදුම කරන ලද්දේය. යම් හෙයකින් භවත් චංකී තෙමේ "පොක්ඛරසාති" බමුණා විසිනුදු සත්කාර කරන ලද්දේ වේද, ගරුකරනලද්දේ වේද, බුහුමන් කරන ලද්දේ වේද, පුදන ලද්දේ වේද, නැමැදුම් කරන ලද්දේ වේද, මේ කරුණෙනුදු භවත් චංකී ශ්‍රමණ ගෞතමයන් දැකුමට යනු නුසුදුසුය. ශ්‍රමණ ගෞතමයන්ම පින්වත් චංකී දැකුමට එනු සුදුසුය.

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

13. "භවත් චංකීතෙමේ බොහෝ මිනිසුන්ගෙන් හා සතුන්ගෙන් ගැවසුනු, තණ දර හා දිය සහිතවූ, ධාන්‍ය සම්පත්තියෙන් යුක්තවූ රජුන් විසින් දෙනලද පරිභෝගයක්වූ පසේ නදි කොසොල් රජු විසින් දුන් හෙයින් රාජදායවූ, උතුම් කොට දෙන ලද්දක්වූ, ඕපසාද නගරයෙහි වාසය කරයි. යම් හෙයකින් භවත් චංකී තෙමේ මිනිසුන්ගෙන් හා සතුන්ගෙන් ගහනවූ, තණ දර හා දිය සහිතවූ ධාන්‍ය ඇත්තාවූ, රජුන් විසින් දෙනලද පරිභෝගයක්වූ පසේනදි කොසොල් රජු විසින් දුන් හෙයින් රාජදායවූ උතුම් කොට දෙන ලද්දක්වූ ඕපසාද නුවර වෙසෙයිද? මේ කරුණු නිසාද භවත් චංකී තෙමේ භවත් ගෞතමයන් දැකීමට යනු නුසුදුසුය. ශ්‍රමණ ගෞතමයන්ම භවත් චංකී දැකීමට එනු සුදුසුය."

14. මෙසේ කීකල්හි චංකී බමුණා ඒ බමුණන්ට මෙසේ කීය. "පින්වත්නි, යම්සේ භවත් ගෞතමයන් දකින්න යාමට අපිම සුදුස්සෝ වෙමුද? ඒ පින්වත් ගෞතමයන් වහන්සේ අප දකිනු පිණිස පැමිණීමට නුසුදුසු සේක්ද? ඒ පිළිබඳ මාගේ කථාවද අසව්. භවත් ශ්‍රමණ ගෞතම තෙමේ මව් පිය දෙපසින් මැනවින් උපන්නේය. සත් වන මී මුත්තාගේ පරපුර දක්වා ඉතා පිරිසිදුව මවු කුස පිළිසිඳ ගත්තේය. ජාති වාදයෙන් අපහාස නොකරණ ලද්දේය. නින්දා නොකරණ ලද්දේය. පින්වත්නි, යම් හෙයින් ශ්‍රමණ ගෞතමයන් මව් පිය දෙපසින් මනාව උපන්නේද, සත්වන මී මුත්තාගේ පරපුර දක්වා ඉතා පිරිසිදුව මව් කුස පිළිසිඳ ගත්තේය. ජාති වාදයෙන් අපහාස නොකරණ ලද්දේද, ජාති වාදයෙන් නින්දා නොකරණ ලද්දේද, මේ කරුණෙනුදු ඒ භවත් ගෞතමයන් අප දැකීමට එනු නුසුදුසුය එසේ කල අපිම ඒ භවත් ගෞතමයන් වහන්සේ දක්නට යාමට සුදුස්සෝ වෙමු.

15. "පින්වත්නි, ශ්‍රමණ භවත් ගෞතම තෙමේ වූකලි භූමියෙහිවූද, ආකාශයෙහිවූද, බොහෝ රන් රුවන් හැර පැවිදි වූවෙක. යම් හෙයකින් ශ්‍රමණ භවත් ගෞතම තෙම වූකලී භූමි යෙහිවූද, ආකාශ යෙහිවූද, බොහෝ රන් රුවන් හැර පැවිදිවූයේ

වේද, මේ කරුණෙනුදු ඒ භවත් ගෞතමයන් අප දැකුමට එනු නුසුදුසුය. එසේ කල අපිම ඒ භවත් ගෞතමයන් වහන්සේ දකින්න යන්නට සුදුසු වෙමු. පින්වත්නි, ශ්‍රමණ භවත් ගෞතම තෙමේ තරුණවූයේ, මනා යෞවනභාවයෙන් හා පළමුවන වයසින් යුතු වූයේ, කලුකෙස් ඇත්තේ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවූවෙක. යම් හෙයකින් ශ්‍රමණ භවත් ගෞතම තෙම තරුණ වූයේ, මනායෞවන භාවයෙන් හා පළමුවන වයසින් යුක්තවූයේ, කලුකෙස් ඇත්තේ ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදිවූයේ වේද, මේ කරුණෙනුදු ඒ භවත් ගෞතමයන් අප දැකුමට එනු නුසුදුසුය. එසේ කල අපිම ඒ භවත් ගෞතමයන් වහන්සේ දකින්ට යන්නට සුදුසුවෙමු. පින්වත්නි, ශ්‍රමණ භවත් ගෞතම තෙමේ මව්පියන් නොකැමතිව කඳුලු පිරි මුහුණින් යුතුව හඬද්දී කෙස් දැලිරැවුල් කපාහැර කසාවත් හැඳ ගිහිගෙන් නික්ම පැවිදිවූ කෙනෙක. යම් හෙයකින් ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ මව්පියන් නොකැමැතිව කඳුලු පිරි මුහුණින් යුතුව, හඬද්දී, කෙස් දැලි රැවුල් කපාහැර කසාවත් හැඳ ගිහිගෙන් නික්ම පැවිදි වූ සේක්ද, මේ කරුණෙනුදු ඒ භවත් ගෞතමයන් අප දැකුමට එනු නුසුදුසුය. එසේ කල අපිම ඒ භවත් ගෞතමයන් වහන්සේ දකින්න යන්නට සුදුසු වෙමු. පින්වත්නි, ශ්‍රමණ භවත් ගෞතම තෙමේ මනා රූ ඇත්තේය. මනා පෙනුමක් ඇත්තේය. දුටුවන් පහදවන්නේය. උතුම් වූ ශරීර ශෝභාවෙන් යුක්තය. බ්‍රහ්මයාට බඳු වර්ණයෙන් යුක්තය. බ්‍රහ්ම ශරීරය වැනි ශරීරයෙන් යුක්තය. ශරීරයෙහි දැකුමට ඇති දේ බොහෝය. යම් හෙයකින් ශ්‍රමණ භවත් ගෞතම තෙම මනා රූ ඇත්තේ වේද, දුටුවන් පහද වන්නේ වේද, උතුම් වූ ශරීර ශෝභාවෙන් යුක්ත වූයේ වේද, බ්‍රහ්මයාට බඳු වර්ණයෙන් යුක්ත වූයේ වේද, බඹහුගේ ශරීරය වැනි ශරීරයෙන් යුක්තවූයේ වේද, ශරීරයෙහි දැකුමට අති දේ බොහෝ වේද, මේ කරුණෙනුදු ඒ භවත් ගෞතමයන් අප දැකුමට එනු නුසුදුසුය. එසේ කල අපිම ඒ භවත් ගෞතමයන් වහන්සේ දක්නට එළඹෙන්නට සුදුසු වෙමු.

16. "පින්වත්නි, ශ්‍රමණ ගෞතම තෙමේ කර්ම විපාක ඇත කුසල් දහම් කිරීම යහපත යන කථා ඇත්තේ වේද, උතුම් ධර්මය පෙරටු කොට හැසිරෙන උතුම් සත්වයන් විසින් පිරිවරන ලද්දෙකි.

17. "පින්වත්නි, ඒ ශ්‍රමණ භවත් ගෞතම තෙම සිල්වත්ය උතුම් සිල් ඇත්තේය, නිදොස් සිල් ඇත්තේය, සම්පූර්ණ සිල් ඇති සිල්වත් කෙනෙක, යම් හෙයකින් ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ උතුම් සිල් ඇති, සම්පූර්ණ සිල් ඇති සිල්වතෙක් වේද, මේ කරුණෙනුදු ඒ භවත් ගෞතමයන් අප දැකුමට එනු නුසුදුසුය. එසේ කල අපිම ඒ භවත් ගෞතමයන් වහන්සේ දක්නට පැමිණෙන්නට සුදුසු වෙමු.

18. පින්වත්නි, ශ්‍රමණ භවත් ගෞතම තෙම යහපත් වචන ඇති යහපත් තෙපුල් ඇති මනහර නිදොස් වූ කෙලතොලු නොවූ අර්ථ හැඟවීමෙහි සමත් යහපත් වචන ඇත්තේය. යම් හෙයකින් ශ්‍රමණ භවත් ගෞතමයන් යහපත් වචන ඇති, යහපත් තෙපුල් ඇති, නිදොස් වූ කෙලතොලු නොවූ, අර්ථ හැඟවීමෙහි සමත් යහපත් වචන ඇත්තේ ද, මේ කරුණෙනුදු ඒ භවත් ගෞතමයන් අප දැකුමට එනු නුසුදුසුය. එසේ කල අපිම ඒ භවත් ගෞතමයන්වහන්සේ දක්නට පැමිණෙන්නට සුදුසු වෙමු.

19. "පින්වත්නි, ශ්‍රමණ භවත් ගෞතමතෙම බොහෝ දෙනාගේ ගුරුවරයාද, ගුරුවරයන්ගේ ගුරුවරයාද වේ. යම් හෙයකින් ශ්‍රමණ භවත් ගෞතම තෙම වනාහි බොහෝ දෙනාගේ ආචාර්යවේද, ආචාර්යයන්ගේ ආචාර්යවේද, මේ කරුණෙනුදු ඒ භවත් ගෞතමයන් අප දැකුමට එනු නුසුදුසුය. එසේ කල, අපිම ඒ භවත් ගෞතමයන් වහන්සේ දක්නට පැමිණෙන්නට සුදුසු වෙමි.

20. "පින්වත්නි, ශ්‍රමණ භවත් ගෞතම තෙම පහකළ කාමරාග ඇත්තේය. පහකළ ප්‍රමාදයට හේතුවූ කෙලෙස් ඇත්තේය, යම් හෙයකින් ශ්‍රමණ භවත් ගෞතම තෙම පහකළ කාමරාග ඇත්තේවේද, පහකළ ප්‍රමාදයට හේතුවූ කෙලෙස් ඇත්තේ වේද, මේ කරුණෙනුදු ඒ භවත් ගෞතමයන් අප

දැකුමට එනු සුදුසුය. අපිම ශ්‍රමණ භවත් ගෞතමයන් දැකීමට යාම සුදුසුය. යම් හෙයකින් ශ්‍රමණ භවත් ගෞතම තෙම වූකලී කර්ම විපාක ඇත, කුසල් දහම් කිරීම යහපත යන කථා ඇත්තෝ උතුම් ධර්මය පෙරටු කොට හැසිරීම් ඇති, උතුම් සත්ව සමූහයා විසින් පිරිවරන ලද්දේවේද, මේ කරුණෙනුදු ඒ භවත් ගෞතමයන් අප දැකුමට එනු නුසුදුසුය. එසේ කල අපි ම ඒ භවත් ගෞතමයන් වහන්සේ දක්නට යාමට සුදුසු වෙමු. පින්වත්නි, ශ්‍රමණ භවත් ගෞතම තෙමේ පහත් නොවූ උසස් ක්ෂත්‍රිය කුලයෙන් නික්ම පැවිදිවූවෙකි. යම් හෙයකින් ශ්‍රමණ ගෞතම තෙමේ පහත් නොවූ උසස් ක්ෂත්‍රිය කුලයෙන් නික්ම පැවිදිවූයේද, ඒ කරුණෙනුදු ශ්‍රමණ ගෞතමයන් අපි දැකුමට එනු නුසුදුසුය. අපිම ශ්‍රමණ ගෞතමයන් දැකුමට යාම සුදුසුය. පින්වත්නි, ශ්‍රමණ භවත් ගෞතමතෙම මහත් ධන ඇති, මහත් භෝග ඇති සියලු දෙයින් සමෘද්ධ වූ කුලයෙන් නික්ම පැවිදිවූ කෙනෙක, යම් හෙයකින් ශ්‍රමණ භවත් ගෞතම තෙම මහත් ධන ඇති මහත් භෝග ඇති සියලු දෙයින් සම්පූර්ණවූ කුලයෙන් නික්ම පැවිදිවූයේද මේ කරුණෙනුදු ඒ භවත් ගෞතමයන් අප දැකුමට එනු නුසුදුසුය. එසේ කල අපි ම ඒ භවත් ගෞතමයන් වහන්සේ දක්නට යාම සුදුසු වෙමු. පින්වත්නි, ශ්‍රමණ භවත් ගෞතමයන් ගෙන් අසන්නට අන් රටවලින් ද අන් ජනපද වලින් ද, (ජනයෝ) එති. යම් හෙයකින් ශ්‍රමණ භවත් ගෞතමයන්ගෙන් ඇසීමට අන් රට වලින්ද අන් ජනපදවලින්ද ජනයෝ පැමිණෙද්ද මේ කරුණෙනුදු, ඒ භවත් ගෞතමයන් අප දැකුමට එනු නුසුදුසුය. එසේ කල, අපි ම ඒ භවත් ගෞතමයන් වහන්සේ දක්නට පැමිණෙන්නට සුදුසු වෙමු. පින්වත්නි, බොහෝ දහස් ගණන් දෙව්වරු ශ්‍රමණ භවත් ගෞතමයන් දිවිහිමියෙන් සරණ කොට ගියහ. යම් හෙයකින් ශ්‍රමණ භවත් ගෞතමයන් බොහෝ දහස්ගණන් දෙව්වරු ශ්‍රමණ භවත් ගෞතමයන් දිවිහිමියෙන් සරණ ගියාහුද මේ කරුණෙනුදු, ඒ භවත් ගෞතමයන් අප දැකුමට එනු නුසුදුසුය. එසේ කල, අපි ම ඒ භවත් ගෞතමයන් වහන්සේ දක්නට පැමිණෙන්ට සුදුසු වෙමු. පින්වත්නි, ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේගේ

මෙබඳු මහත් වූ කීර්ති ශබ්දයක් උස්ව පැනනැංගේය. මෙසේ ඒ භාග්‍යවතුන් වහන්සේ අරහත්හ, අෂ්ටවිද්‍යා හා පසළොස්චරණ ධර්මයෙන් යුත්තයහ, හොබනා ගමන් ඇතියහ. ලොව මැනවින් දත්හ. පුරුෂයන් දමනයෙහි අති උතුම් රියැදුරෙකු වැනි වූහ. දෙව් මිනිසුන්ට අනුශාසකයහ. චතුස්සත්‍ය දත්හ. සියලු කෙලෙස් බිඳ දැමූහ කියායි.

**21.** "යම් හෙයකින් ශ්‍රමණ භවත් ගෞතම තෙමේ අර්හත්ය සම්‍යක් සම්බුද්ධය, විජ්ජාචරණ සම්පන්නය, සුගතය, ලොකවිදූය, අනුත්තර පුරිසදම්මසාරථිය, දෙව් මිනිසුන්ට ශාස්තෘය, බුද්ධය, භගවත්යයි උස්ව පැන නැගුණු කීර්ති ශබ්දයක් ඇත්තේද, මේ කරුණෙනුදු ඒ භවත් ගෞතමයන් අප දැකුමට එනු නුදුසුසුය. එසේ කල, අපිම, ඒ භවත් ගෞතමයන් වහන්සේ දක්නට යාමට සුදුසු වෙමු.

**22.** "පින්වත්නි, ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ දෙතිස් මහ පුරිස් ලකුණින් යුත්වූසේක. යම් හෙයකින් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් යුක්ත වූයේද, මේ කරුණෙනුදු ඒ භවත් ගෞතමයන් අප දැකුමට එනු නුසුදුසුය. එසේ කල, අපිම, ඒ භවත් ගෞතමයන් වහන්සේ දක්නට යාමට සුදුසු වෙමු. පින්වත්නි, ශ්‍රමණ භවත් ගෞතමයන් සේනා සහිතවූ, මගධ දෙශයට අධිපතිවූ බිම්බිසාර රජ තෙමේ අඹු දරුවන් සහිතව දිවිහිම්ව සරණ ගියේය. යම් හෙයකින් ශ්‍රමණ භවත් ගෞතමයන්, සේනා සහිත වූ මගධදේශාධිපතිවූ, "බිම්බිසාර" රජ අඹුදරුවන් සහිත ව දිවිහිම් සරණ ගියේ වේද, මේ කරුණෙනුදු ඒ භවත් ගෞතමයන් අප දැකුමට එනු නුසුදුසුය. එසේ කල, අපිම, ඒ භවත් ගෞතමයන් වහන්සේ දක්නට යාමට සුදුසු වෙමු. ශ්‍රමණ භවත් ගෞතමයන් පසේනදි කොසොල් රජ පුත්‍රදාරාවන් සහිතව දිවිහිම්ව සරණ ගියේය. යම් හෙයකින් ශ්‍රමණ භවත් ගෞතමයන් පසේනදී කොසොල් රජ පුත්‍රදාරාවන් සහිතව දිවිහිම්ව සරණ ගියේ වේද, මේ කරුණෙනුදු ඒ භවත් ගෞතමයන් අප දැකුමට එනු නුසුදුසුය. එසේ කල, අපි ම, ඒ භවත් ගෞතමයන් වහන්සේ දක්නට

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

යාමට සුදුසු වෙමු. පින්වත්නි, ශ්‍රමණ භවත් ගෞතමයන් පොක්ඛරසාති බ්‍රාහ්මණයා පුත්‍රදාරාවන් සහිතව දිවිහිම්ව සරණ ගියේය. යම් හෙයකින් ශ්‍රමණ භවත් ගෞතමයන් පොක්ඛරසාති බමුණා පුත්‍රදාරාවන් සහිතව, දිවිහිම් ව සරණ ගියේ වේ ද, මේ කරුණෙනුදු ඒ භවත් ගෞතමයන් අප දැකුමට එනු නුසුදුසුය. එසේ කල, අපි ම, ඒ භවත් ගෞතමයන් වහන්සේ දක්නට යාමට සුදුසු වෙමු. පින්වත් ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ ඕපසාද නගරයට පැමිණිසේක් ඕපසාද නුවරට උතුරෙන් ඕපසාද නගරයෙහි දේවවන නම් සල් වෙනෙහි වාසය කරන සේක. යම්කිසි ශ්‍රමණයෝ හෝ බ්‍රාහ්මණයෝ හෝ අපගේ ගමට එත්ද, ඔවුහු ආගන්තුකයෝ වෙති. ආගන්තුකයෝ වනාහි අප විසින් සත්කාර කළ යුත්තෝ වෙති. පින්වත්නි, යම් හෙයකින් ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ ඕපසාදයට පැමිණ උතුරෙන් පිහිටි ඕපසාද නුවරෙහි දේවවන නම් සල්වෙනෙහි වෙසෙත් ද, ඒ ශ්‍රමණ භවත් ගෞතමයෝ අපට ආගන්තුක වෙති. ආගන්තුකයාට අප විසින් සත්කාර කළ යුත්තේය. ගරු කළ යුත්තේය. බුහුමන් කළයුත්තෝය. පිදියයුත්තේය. මේ කරුණෙන් ද ඒ භවත් ගෞතමයන් අප දැකුමට එනු නුසුදුසුය. අපිම උන්වහන්සේ කරා යන්නට සුදුසු වෙමු.

23. "පින්වත්නි, මම ඒ භවත් ගෞතමයන්ගේ ගුණ මෙපමණක්ම දනිමි. ඒ භවත් ගෞතම තෙම මෙපමණ ගුණ ඇත්තෙක්ම නොවේ. ඒ භවත් ගෞතමතෙම අප්‍රමාණ ගුණ ඇති කෙනෙකු පින්වත්නි, මේ එක එක කරුණෙනුදු යුක්තවූ ඒ ශ්‍රමණ භවත් ගෞතමයන් වහන්සේ අප දැකීමට පැමිණීම නුසුදුසුවෙති. ඉක්බිති අපිම ඒ භවත් ගෞතමයන් දැකීම යාමට සුදුස්සෝවෙමු. එසේනම් පින්වත්නි, අපි සියල්ලෝම ශ්‍රමණ ගෞතමයන් දැකීම සඳහා යමුයි කීහ.

23. ඉක්බිති චංකී බ්‍රහ්මණතෙමේ මහත් බමුණු සමූහයා සමග භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද එතැනට ගියේය. ගොස් භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවියයුතුවූත් සිහිකටයුතුවූත් කථාව කොට නිමවා එක් පැත්තෙක උන්නේය.

එකල වනාහි භාග්‍යවතුන් වහන්සේ වැඩිමහලු වැඩිමහලු බමුණන් සමග යම් කිසි සිහිකටයුතු කථාවක් කරමින් හුන්සේක.

**24.** එසමයෙහි වනාහි තරුණවූ වැවුනු කෙස් ඇත්තාවූ උපතින් අවුරුදු දහසයක් ඇත්තාවූ නිඝණ්ඩුශාස්ත්‍රය කෙටුභ ශාස්ත්‍රය ශික්ෂා නිරුක්ති යුක්ත ඉතිහාසය පස්වැනි කොට ත්‍රිවේදයෙහි තෙරපත්වූ, පද හා වියරණ දන්නාවූ, ලොකායතන ශාස්ත්‍රය හා මහා පුරිස් ලකුණු සම්පූර්ණයෙන් දන්නාවූ, කාපඨික, නම් තරුණයෙක් ඒ පිරිසෙහි හුන්නේ වෙයි. හෙතෙම වැඩිහිටි වෘද්ධවූ වැඩිහිටි බමුණන් භාග්‍යවතුන් වහන්සේ සමග කරන සාකච්ඡාවන්ට අතරතුරින් කථා හෙලයි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කාපඨික තරුණයාට නින්දා කෙළේය. "ආයුෂ්මත් භාරද්වාජ තෙමේ වැඩිහිටි වෘද්ධවූ වැඩිහිටි බමුණන්ගේ කථාවලට අතරින් අතර නොහෙලාවා. කථා කෙළවර ආයුෂ්මත් භාරද්වාජ තෙමේ බලාපොරොත්තු වේවා". මෙසේ කී කල චංකී බමුණා භාග්‍යවතුන් වහන්සේට මෙය කීය. "භවත් ගෞතමයන් වහන්සේ කාපඨික තරුණයාට නින්දා නොකරණ සේක්වා. කාපඨික තරුණයා කුල පුත්‍රයෙක්ද, කාපඨික තරුණයා උගතෙක්ද, කාපඨික තරුණයා යහපත් වචන ඇත්තෙක්ද, කාපඨික තරුණයා පණ්ඩිතයෙක්ද, කාපඨික තරුණයා භාග්‍යවතුන් වහන්සේ සමග මේ වචනයෙහි කථාකරන්නට සමර්ථයෙක්ද වෙයි'. ඉක්බිති බුදුන්ට මේ සිතක් ඇතිවිය. 'ඒකාන්තයෙන් වනාහි ත්‍රිවෙදය පිළිබඳ දෙශනාවෙහි කාපඨික තරුණයාගේ කථාවත් වන්නේද, එහිදී බමුණෝ ඔහු පෙරටු කෙරෙත්ය' (කියායි) එකල්හි කාපඨික තරුණයාට මේ සිත ඇති විය. 'යම් කලෙක ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ඇසින් මගේ ඇස බලන්නේද, එකල මම ශ්‍රමණ ගෞතමයන්ගෙන් ප්‍රශ්න විචාරන්නෙමි, ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ කාපඨික තරුණයාගේ සිතිවිල්ල (තමන් වහන්සේගේ) සිතින් දැන කාපඨික තරුණයා යම් තැනෙකද එතැන්හි ඇසින් බැලූසේක. අනතුරුව කාපඨික තරුණයාට මේ සිත ඇතිවිය. 'ශ්‍රමණ ගෞතමයන් වහන්සේ මා කැඳවයි. මම ශ්‍රමණ ගෞතමයන් ගෙන් ප්‍රශ්න අසන්නෙම් නම් හොඳය' කියායි, ඉක්බිති කාපඨික

තරුණයා භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "භවත් ගෞතමයන් වහන්ස, "මේ මෙසේය මෙය මෙසේයයි', පරම්පරාවෙන් කොටස් වශයෙන් ආවාවූ බමුණන්ගේ පුරාණවූ යම් මේ මන්ත්‍ර පදයක් වේද, එහිද බමුණෝ මෙයම ඇත්තය. අනික බොරුයයි' ඒකාන්තයෙන් නිගමනයට බසිති. භවත් ගෞතමයන් වහන්සේ මේ කරුණෙහිදී කුමක් කියනසේක්ද"?

**25.** "භාරද්වාජය, කිමෙක්ද? බමුණන් අතුරෙන් 'මෙය මම දනිමි. මම මෙය දකිමි" මෙයම ඇත්තය අනික හිස්යයි මෙසේ කියූ යම්කිසි එක් බමුණෙකුදු ඇත්තේද"? "භවත් ගෞතමයන් වහන්ස, මෙසේ කියූ යම්කිසි එක් බමුණෙකුදු නැත්තේමය". "භාරද්වාජය, කිමෙක්ද? බමුණන් අතුරෙහි සත්වැනි මීමුතු ආචාර්යයාගේ පරම්පරාව දක්වා 'මම මෙය දනිමි. මෙය මම දකිමි. මෙයම සත්‍යයයි. අන්‍යය හිස්ය'. මෙසේ කියූ යම්කිසි එක් ආචාර්යයෙකුදු යම්කිසි එක් ආචාර්යවරයකුගේ ආචාර්යයෙකුදු නැත්තේමය".

**26.** "භාරද්වාජය, කිමෙක්ද, ගායනා කරණලද, කියනලද, යහපත්සේ එක්කොට තැබූ යම් ඉසිවරුන්ගේ පුරාණවූ පුරාණවූ (වේද) මන්ත්‍රපදයක් වේද, දැන් වනාහි බමුණෝ 'මෙය ඒ අනුව ගායනා කරත්ද, ඒ අනුව කියත්ද, කියූ දෙය අනුව කියත්ද, කියවනලද්ද අනුව කියවත්ද, (වේද) මන්ත්‍ර කර්තෘ (වේද) මන්ත්‍ර පවත්වන්නාවූ බමුණන්ගේ යම් ඒ පෙර ඉසිවරු (වූවාහුද), ඔවුහුනම් අට්ටකය, වාමකය, වාමදේවය, වෙස්සාමිත්තය යමතග්ගීය, අංගීරසය, භාරද්වාජය, වාසෙට්ඨය, කස්සපය, භගුය, (යන මොවුහුය) 'අපි මෙය දනිමු. අපි මෙය දකිමු. සත්‍යය මෙයයි. අන්‍යය හිස්යයි' ඔවුහු හෝ මෙසේ කීවාහුද? 'භවත් ගෞතමයන් වහන්ස, ඔව්හු හෝ මෙසේ නොකීවාහුමය."

**27.** "භාරද්වාජය, මෙසේ වනාහි බමුණන් අතුරෙන්, 'මම මෙය දනිමි. මම මෙය දකිමි. මෙයම සත්‍යය අන්‍යය හිස්යයි' මෙසේ කියූ යම්කිසි එක් බමුණෙකු නැත්තේය. බමුණන් අතුරෙන් සත්වැනි මී මුතු ආචාර්යයාගේ පරම්පරාව දක්වා මම මෙය දනිමි මම මෙය දකිමි. මෙයම සත්‍යය අන්‍යය හිස්යයි'.

මෙසේ කියූ යම්කිසි එක් ආචාර්යයෙකුදු යම්කිසි එක් ආචාර්යවරයකුගේ ආචාර්යෙකුදු නැත්තේය'යි බමුණන් අතුරෙන් යම් ඒ පූර්වකවූ ඍෂිහු මන්ත්‍ර කරන්නෝ, කියන්නෝ වෙත්ද, මෙය දැන් බමුණෝ ගායනා කරනලද, කියනලද, යහපත්සේ එක්කොට තැබූ යම් ඉසිවරුන්ගේ පුරාණවූ (වේද) මන්ත්‍ර පදයක් වේද, දැන් වනාහි බමුණෝ මෙය ඒ අනුව ගයත්ද ඒ අනුව කියත්ද, කියූ දෙය අනුව කියත්ද, කියවන ලද්ද අනුව කියවත්ද, (වේද) මන්ත්‍ර කර්තෘවූ (වේද) මන්ත්‍ර පවත්වන්නාවූ බමුණන්ගේයම් ඒ පෙර ඉසිවරු (වූවාහුද), ඔවුහු නම් අට්ටකය, වාමකය, වාමදේවය, වෙස්සාමිත්තය, යමතග්ගීය, අංගීරසය, භාරද්වාජය, වාසෙට්ඨය, කස්සපය, භගුය (යන මොවුහුය) 'අපි මෙය දනිමු, අපි මෙය දකිමු. මෙයම ඇත්තය. අන්‍යය හිස්යයි' ඔවුහු හෝ මෙසේ නොකීවාහුය".

**28.** "භාරද්වාජය, යම්සේ උණගස්වලින් කළ අත්වැල අල්ලාගෙන ගමන් ගත්තාවූ කන්නු මුළින් යන්නා නොදකියිද, මැදින්යන්නා නොදකියිද අගින් යන්නා නොදකියිද, භාරද්වාජය, මෙපරිද්දෙන් ආදිමයාද නොදක්නාවූ මධ්‍යමයාද නොදක්නාවූ අන්තිමයාද, නොදකින්නාවූ බමුණන් කියන ලද්ද 'අන්ධ වේණු' උපමාවඇතිකෙරේයයි හඟිමි. භාරද්වාජය, ඒ කිමැයි හඟිනෙහිද? මෙසේ ඇතිකල්හි බමුණන්ගේ අමූලිකවූ ශ්‍රද්ධා ඇතිවෙන්නේ නොවේද?" "භවත් ගෞතමයන් වහන්ස, මෙහි බමුණෝ ශ්‍රද්ධාවම ඇසුරු නොකෙරෙති. බමුණෝ මෙහි පරම්පරාගත කථාද ඇසුරු කෙරෙත්"

**29.** "භාරද්වාජය, නුඹ පෙරම වනාහි ශ්‍රද්ධාව පැමිණියෙහිය. දැන් පරම්පරාගත කථාව කියහි. භාරද්වාජය, මේ ධර්මයෝ පස්දෙන මේ ආත්මයෙහි දෙවැදෑරුම් විපාක ඇත්තාහු වෙති. ඒ පස්දෙන කවරහුද? ශ්‍රද්ධාව, රුචිය, පරම්පරාගත කථාව, යහපත් කල්පනාව හරි අදහස ඇතිකර ගැනීමේ කැමැත්ත, යන මොවුහුයි. භාරද්වාජය, මේ පඤ්ච ධර්මයෝ මේ ආත්ම භාවයෙහි දෙවැදෑරුම් විපාක ඇත්තාහු වෙත්. භාරද්වාජය, යලිදු මනාව අදහන ලද්දක්වේද, එයද හිස්වූ මුසාවක් වෙයි. ඉදින්

මනාව නොඅදහන ලද්දේවේද, එය ඇත්තාවූ සත්‍යය වෙනස් නොවන්නක් වෙයි. යලිදු භාරද්වාජය, මනාව කැමතිවන ලද්දක් වේද එයද හිස්වූ බොරුවක් වෙයි. ඉදින් මනාව කැමති නොවන ලද්දක් වේද, එයද ඇත්තාවූ සත්‍යවූ වෙනස් නොවන්නක් වෙයි.

"යලිදු භාරද්වාජය, මනාව අසන ලද්දක් වේද, එයද හිස්වූ, බොරුවක් වෙයි. ඉදින් මනාව නාසන ලද්දක් වේද, එයද ඇත්තාවූ සත්‍යවූ වෙනස නොවන්නක් වෙයි.

"මනාව කල්පනා කරන ලද්දක් වේද, එයද හිස්වූ, බොරුවකි. ඉදින් මනාව කල්පනා නොකරන ලද්දක් වේද, එයද ඇත්නාවූ සත්‍යවූ වෙනස් නොවන්නක් වෙයි.

'යලිදු භාරද්වාජය, මනාව ඉගෙනගන්නා ලද්දක් වේද, එයද හිස්වූ මුසාවක් වෙයි. ඉදින් මනාව ඉගෙනගන්නා ලද්දක් නොවේද, එයද ඇත්තාවූ සත්‍යවූ වෙනස් නොවන්නක් වෙයි. භාරද්වාජය, සත්‍යය රකින්නාවූ නුවණැති පුරුෂයා විසින් මේ කරුණුවලින් සත්‍යය මෙයය, අන්‍යය සිස්යයි ඒකාන්තයෙන් නිගමනයට බසින්නට අසමර්ථ වෙයි."

**30.** "භවත් ගෞතමයන් වහන්ස, කොපමණකින් සත්‍යය රකින්නේ වේද? කොපමණකින් සත්‍යය රකියිද? සත්‍යය රැකුම අපි භවත් ගෞතමයන්ගෙන් විචාරමු." "භාරද්වාජය, ඉදින් පුරුෂයාහට ඇදහීම වේද, 'මාගේ ඇදහීම මෙසේයයි' කියන්නාද සත්‍ය ඇදහීම රකියි. එහෙත් එපමණකින් මෙයම සත්‍යය අන්‍යය හිස්යයි නිගමනයට ඒකාන්තයෙන් නොපැමිණේමය.

'භාරද්වාජය, ඉදින් පුරුෂයාගේ කැමැත්ත වේද, 'මාගේ රුචිය මෙසේයයි කියන්නාද, සත්‍යය රකියි. එහෙත් එපමණකින් මෙයම සත්‍යය, අන්‍යය හිස්යයි නිගමනයට ඒකාන්තයෙන් නොපැමිණේය.

"ඉදින් භාරද්වාජය, පුරුෂයාගේ ඇසීම වේද, 'මාගේ ඇසීම මෙසේයයි' කියන්නාද සත්‍යය රකියි. එහෙත් එපමණකින් 'මෙයම සත්‍යය, අන්‍යය හිස්යයි' නිගමනයට ඒකාන්තයෙන් නොපැමිණේමය.

"ඉදින් භාරද්වාජය, පුරුෂයාගේ කරුණා කල්පනාව වේද, 'මාගේ ආකාර කල්පනාව මෙසේයයි' කියන්නාද සත්‍යය රකියි. එහෙත් එපමණකින් මෙයම සත්‍යය, අන්‍යය හිස්යයි' නිගමනයට ඒකාන්තයෙන් නොපැමිණේමය.

"ඉදින් භාරද්වාජය, පුරුෂයාගේ ඉගෙනීම වේද, 'මාගේ ඉගෙනීම මෙසේයයි' කියන්නාද සත්‍යය රකියි. එහෙත් එපමණකින් 'මෙයම සත්‍යය අන්‍යය හිස්යයි' ඒකාන්තයෙන් නිගමනයට නොපැමිණේමය.

"භාරද්වාජය, මෙපමණකින් සත්‍යය රැක්ම වෙයි, මෙපමණෙකින් සත්‍යය රකියි, මෙපමණෙකින් අපි සත්‍යය රැකුම පණවමු. එහෙත් එපමණකින් සත්‍යාවබොධය නොවේමය."

"භවත් ගෞතමයන් වහන්ස, මෙපමණෙකින් සත්‍යය රැක්ම වෙයි. මෙපමණෙකින් සත්‍යය රකියි. මෙපමණෙකින් අපි සත්‍යය රැකුම දකිමු.

31. "භවත් ගෞතමයන් වහන්ස, කොපමණෙකින් සත්‍යය අවබෝධ වේද? කොපමණෙකින් සත්‍යය අවබෝධ කෙරේද? අපි භවත් ගෞතමයන්ගෙන් සත්‍යාවබොධය විචාරමු." "භාරද්වාජය, මෙහි භික්ෂුවක් එක්තරා ගමක් හෝ නියම්ගමක් හෝ ඇසුරුකොට වාසය කෙරෙයි. ඔහු වෙත ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ පැමිණ ඇලියයුතු ධර්මයන්හි කිපියයුතු ධර්මයන්හි, මුළාවිය යුතු ධර්මයන්හි යන තුන් ධර්මයන්හි සෝදිසියට පැමිණෙයි. මේ ආයුෂ්මත්හට යම්බඳුවූ ඇලියයුතු ධර්මයන් විසින් විනාශ කරනලද සිත් ඇත්තේ නොදන්නේ හෝ දනිමියි කියන්නේද, නොදක්නේ හෝ දකිමියි කියන්නේද, යම් ධර්මයක් අනුන්ට දිගුකලක් අහිත පිණිස, දුක් පිණිස වන්නේද, එබඳුවූ ධර්මයන්හි අන්‍යයා සමාදන් කරවන්නේද එබඳුවූ ඇලියයුතු ධර්මයෝ මොහුට ඇත්තාහුද කියායි. මෙසේ ඔහු පරීක්ෂා කරන්නේ මේ ආයුෂ්මත්හට යම්බඳුවූ ලොභනීය ධර්මයන් විසින් විනාශ කරන ලද සිත් ඇත්තේ නොදන්නේ දනිමියි කියන්නේද, නොදකිමින් දකිමියි

කියන්නේද, එබඳුවූ ධර්මයන් නැත. යම් ධර්මයක් අන්‍යයනට දිගුකලක් අහිත පිණිස, දුක්පිණිස වන්නේද, එබඳු ධර්මයන්හි අන්‍යයාද සමාදන් නොකරවන්නේය. මේ ආයුෂ්මත්හුගේ එබඳුවූ කයේ පැවැත්මද, එබඳුවූ වචනයේ පැවැත්මද ලෝභය නැත්තකුගේ මෙනි. (ඒ) ආයුෂ්මත් තෙමේ යම් මේ ධර්මයක් දෙසයිද, ඒ ධර්මය ගැඹුරුය, දුකසේ දැක්ක යුතුය, අමාරුවෙන් අවබෝධ කටයුතුය. ශාන්තය, ප්‍රණීතය, අතක්කාවචරය, නිපුනය, පණ්ඩිතයන් විසින් දතයුතුය, ලොභය ඇත්තෙකු විසින් ඒ ධර්මය මනාව දෙසනු නොලබන්නේ වෙයි කියා දක්නේද, යම් හෙයකින් ඔහු පරීක්ෂා කරනු ලබන්නේ ඇලියයුතු ධර්මයන්ගෙන් පිරිසිදුවූවකු බව දකින්නේය.

32. "එයින් මතු ඔහු කිපියයුතු ධර්මයන් පරීක්ෂාකර බලයි. යම්බඳුවූ දොෂනීය ධර්මයන් විසින් විනාශ කරන ලද සිත් ඇත්තේ නොදැන දනිමියි කියන්නේද, නොදැක දකිමියි කියන්නේද, යමක් අනුනට බොහෝ කලක් අහිත පිණිස දුක් පිණිස වන්නේද, එබඳු දෙයෙහි යොදවන්නේද එබඳුවූ දොෂනීය ධර්මයන් මේ ආයුෂ්මත්හට ඇත්තේද (කියායි) ඒ ඔහු පරීක්ෂා කරන්නේ මෙසේ දනියි. යම්බඳුවූ දොසනීය ධර්මයන් විසින් නසන ලද සිත් ඇත්තේ නොදැන දනිමියි කියන්නේද, නොදැක දකිමියි කියන්නේද, යම් ධර්මයක් අනුනට බොහෝ කලක් අහිත පිණිස, දුක් පිණිස වන්නේද, එබඳුවූ ධර්මයන්හි අන්‍යයාද සමාදන් කරවන්නේ වේද, එබඳුවූ දොසනීය ධර්මයන් මේ ආයුෂ්මත්හට නැත්තේය. මේ ආයුෂ්මත්හුගේ එබඳුවූ කාය සමාචාරයද එබඳුවූ වාග් සමාචාරයද, ද්වෙෂයන් දූෂිත නොවූවකුගේ මෙනි. මේ ආයුෂ්මත් තෙමේ යම් ධර්මයක් දෙසයිද ඒ ධර්මය ගැඹුරුය, දුකසේ දත යුතුය, අමාරුවෙන් අවබොධ කළ යුතුය, ශාන්තය, ප්‍රණීතය, අතර්කාවචරය, නිපුනය, පණ්ඩිතයන් විසින් දතයුතුය. ද්වෙෂයෙන් දූෂිතයා විසින් ඒ ධර්මය මනාව දෙසනු නොලබන්නේ වෙයි.

33. "යම්හෙයකින් පරීක්ෂාකරනු ලබන්නේ ලෝභනීය ධර්මයන්ගෙන් පිරිසිදුවූද දෝසනීය ධර්මයන් දකීද එයින්මතු

ඔහු මුළාවියයුතු ධර්මයන් පරීක්ෂාකර බලයි. යම්බඳුවූ මොහනීය ධර්මයන් විසින් නසනලද සිත් ඇත්තේ නොදැන දනිමියි කියන්නේද, නොදැක දකිමියි කියන්නේද යමක් අනායයනට දිගු කලක් අහිත පිණිස දුක් පිණිස වන්නේද, එබඳු ධර්මයන්හි අනායයා යොදවන්නේද එබඳුවූ මොහනීය ධර්මයන් මේ ආයුෂ්මත්හට ඇත්තේද (කියායි) එසේ පරීක්ෂා කරනු ලබන්නේ මෙසේ දනියි. යම්බඳුවූ මොහනීය ධර්මයන්හි බැසගන්නාලද සිතැත්තේ නොදැන දනිමියි කියන්නේද, නොදැක දකිමියි කියන්නේද, යම් ධර්මයක් අනායයනට දිගුකලක් අහිත පිණිස දුක් පිණිස වන්නේද එබඳුවූ ධර්මයන්හි අනායයාද සමාදන් කරවන්නේ වේද එබඳුවූ මොහනීය ධර්මයන් මේ ආයුෂ්මතුන්ට නැත්තේය. මේ ආයුෂ්මත්හුගේ කාය සමාචාරයද වාග් සමාචාරයද, මොහයෙන් මුළානුවූවකුගේ මෙනි. මේ ආයුෂ්මත්තෙමේ යම් ධර්මයක් දෙසයිද, ඒ ධර්මය ගැඹුරුය. දුකසේ දතයුතු. අමාරුවෙන් අවබොධ කළයුතුය. ශාන්තය, ප්‍රනීතය, අතර්කාවචරය, නිපුනය, පණ්ඩිතයන් විසින් දතයුතුය. මොහයෙන් මුළාවූවහු විසින් ඒ ධර්මය මනාව දෙසනු නොලබයි. යම්හෙයකින් පරීක්ෂා කරනු ලබන්නේ. ලොභනීය ධර්මයන්ගෙන් පිරිසිදුවූද දෝසනීය ධර්මයන්ගෙන් පිරිසිදුවූද මෝහනීය ධර්මයන්ගෙන් පිරිසිදු වූද ඔහු දකීද, ඉක්බිති ශ්‍රද්ධාව පිහිටුවයි.

උපන්නහු ශ්‍රද්ධා ඇත්තේ ඔහු වෙත එළඹෙයි. එළඹෙන්නේ සෙවනය කෙරෙයි. සේවනය කරන්නේ කන්යොමුකරයි. යොමුකළ කන් ඇත්තේ ධර්මය අසයි. ධර්මය අසා දරයි. දරණලද ධර්මයන්ගේ අර්ථය සොයයි. අර්ථය සෙවීමෙන් ධර්මයෝ වැටහෙත්. ධර්මය වැටහුනු පසු කැමැත්ත උපදයි. හටගත් කැමැත්ත ඇත්තේ උත්සාහ කෙරෙයි. උත්සාහ කොට අනිත්‍යා වශයෙන් පරීක්ෂාකර බලයි. පරීක්ෂාකොට බලන්නේ මාර්ගය පිණිස උත්සාහ කරයි. උත්සාහ කරන්නේ කයින්ද පරමසත්‍යය අවබොධ කරයි. නුවණින් ඔහු විනිවිද දකියි. භාරද්වාජය, මෙපමණකින් සත්‍යාව බොධය වෙයි මෙපමණකින් සත්‍යය අවබොධ කරයි. මෙතෙකින්ම අපි සත්‍යාවබොධය

පණවමු. එපමණකිනුදු සත්‍යයට පැමිණියේ නොවේමය.” “භවත් ගෞතමයන් වහන්ස, මෙපමණකින් සත්‍යාවබොධය වෙයි. මෙතෙකින් සත්‍යය අවබොධ කරයි. මෙතෙකින් අපි සත්‍ය දකිමු. භවත් ගෞතමයන් වහන්ස, සත්‍යයට පැමිණීම කොතෙකින් වේද, කොතෙකින් සත්‍යයට පැමිණේද, අපි භවත් ගෞතමයන්ගෙන් සත්‍යයට පැමිණීම විමසමු.”

**34.** “භාරද්වාජය, ඒ ධර්මයන්ම නැවත නැවත සේවනය කිරීමෙන් භාවනාකිරීමෙන් බහුලව කිරීමෙන් සත්‍යයට පැමිණීම වෙයි. භාරද්වාජය, මෙපමණකින් සත්‍යයට පැමිණීමවෙයි. මෙපමණකින් සත්‍යයට පැමිණෙයි. මෙපමණකින් අපි සත්‍යයට පැමිණීම පණවමු.” “භවත් ගෞතමයන් වහන්ස, මෙපමණකින් සත්‍යයට පැමිණීම වෙයි. මෙපමණකින් සත්‍යයට පැමිණෙයි. මෙපමණකින්ම අපි සත්‍ය දකිමු. භවත් ගෞතමයන් වහන්ස, සත්‍යයට පැමිණීම පිණිස කවර ධර්මයක් බොහෝ උපකාර ඇත්තේ වේද? සත්‍යයට පැමිණීම පිණිස බොහෝ උපකාරවන ධර්මය අපි භවත් ගෞතමයන්ගෙන් විචාරමු.” “භාරද්වාජය සත්‍යයට පැමිණීම සඳහා වීර්යය බොහෝ උපකාර ඇත්තේය. ඉදින් (වීර්ය) නොකරන්නේ වේද, මේ සත්‍යයට නොපැමිණෙන්නේය. යම් හෙයකින් වීර්ය කෙරේද, එහෙයින් සත්‍යයට පැමිණෙයි. එහෙයින් සත්‍යයට පැමිණීම සඳහා වීර්ය බොහෝ උපකාර ඇත්තේ වෙයි.”

**35.** “භවත් ගෞතමයන් වහන්ස, වීර්ය කිරීමට කවර ධර්මයක් බොහෝ උපකාර ඇත්තේ වේද? වීර්ය කිරීමට බොහෝ උපකාරවූ ධර්මය අපි භවත්ගෞතමයන්ගෙන් අසමු” “භාරද්වාජය, වීරියකිරීමට නුවණින් විමසීම බොහෝ උපකාර ඇත්තේ වෙයි. ඉදින් නුවණින් නො විමසන්නේ නම් වීර්ය නොකරන්නේය. යම් හෙයින් නුවණින් විමසන්නේද එහෙයින් වීර්ය කරයි. එහෙයින් වීර්ය කිරීමට නුවණින් විමසීම බොහෝ උපකාර ඇත්තේ වෙයි.”

**36.** “භවත් ගෞතමයන් වහන්ස, නුවණින් විමසීම සඳහා කවර ධර්මයක් බොහෝ උපකාර ඇත්තේ වේද? නුවණින්

විමසීම සඳහා බොහෝ උපකාරවූ ධර්මයන් අපි භවත් ගෞතමයන්ගෙන් අසමු". "භාරද්වාජය, නුවණින් විමසීම සඳහා උත්සාහය බොහෝ උපකාර ඇත්තේ වෙයි. ඉදින් උත්සාහ නොකරන්නේ නම් නුවණින් විමසීම නො කරන්නේය. යම් හෙයින් උත්සාහ කෙරේද, එහෙයින් නුවණින් විමසයි. එහෙයින් නුවණින් විමසීම සඳහා උත්සාහය බොහෝ උපකාර ඇත්තේ වෙයි."

37. "භවත් භෞතමයන් වහන්ස, උත්සාහය සඳහා කවර ධර්මයක් බොහෝ උපකාර ඇත්තේ වේද? උත්සාහයට බොහෝ උපකාරවූ ධර්මය අපි භවත් ගෞතමයන්ගෙන් විචාරමු. "භාරද්වාජය, උත්සාහයට කැමැත්ත බොහෝ උපකාර ඇත්තේ වෙයි. ඉදින් කැමැත්ත නොඋපදින්නේ නම්, මේ උත්සාහ නොකරන්නේය. යම් හෙයින් කැමැත්ත උපදීද, එහෙයින් උත්සාහ කරයි. එහෙයින් උත්සාහයට කැමැත්ත බොහෝ උපකාර ඇත්තේ වෙයි".

38. "භවත් ගෞතමයන් වහන්ස, කැමැත්තට කවර ධර්මයක් බොහෝ උපකාර ඇත්තේ වේද? කැමැත්තට බොහෝ උපකාරවන ධර්මය අපි භවත් ගෞතමයන්ගෙන් විචාරමු" "භාරද්වාජය, කැමැත්තට ධර්මය වැටහීම බොහෝ උපකාර වෙයි. නොවැටහෙන්නේ නම් කැමැත්ත නූපදින්නේය. යම් හෙයකින් ධර්මයෝ වැටහෙත්ද එහෙයින් කැමැත්ත උපදියි. එහෙයින් කැමැත්තට ධර්මය වැටහීම බොහෝ උපකාර වෙයි." භවත් ගෞතමයන් වහන්ස, ධර්මය වැටහීමට කවර ධර්මයක් බොහෝ උපකාර වේද? ධර්මය වැටහීමට බොහෝ බහුකාරවූ ධර්මය අපි භවත් ගෞතමයන්ගෙන් විචාරමු' "භාරද්වාජය ධර්මය වැටහීමට අර්ථය පරීක්ෂා කිරීම බොහෝ උපකාර වේ. අර්ථය පරීක්ෂා නොකරන්නේ නම් ධර්මය වැටහීමට නොපැමිණෙන්නේය. යම් හෙයකින් අර්ථය පරීක්ෂා කෙරේද එහෙයින් ධර්මයෝ වැටහෙත්. එහෙයින් ධර්මය වැටහීම සඳහා අර්ථය පරීක්ෂා කිරීම බොහෝ උපකාර ඇත්තේ වෙයි."

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

**39.** "භවත් ගෞතමයන් වහන්ස, අර්ථ පරීක්ෂාවට කවර ධර්මයක් බොහෝ උපකාර ඇත්තේ වේද? අර්ථ පරීක්ෂාවට බොහෝ උපකාරවූ ධර්මය අපි භවත් ගෞතමයන්ගෙන් විචාරමු. භාරද්වාජය, අර්ථය පරීක්ෂාවට ධර්මය දැරීම බොහෝ උපකාර ඇත්තේ වෙයි. ඉදින් ධර්මය නොදරන්නේ වේ නම් අර්ථය පරීක්ෂා නොකරන්නේය. යම්හෙයින් ධර්මය දරයිද, එහෙයින් අර්ථය සොයයි. එහෙයින් අර්ථය සෙවීමට ධර්මය දැරීම බොහෝ උපකාර ඇත්තේය."

**40.** "භවත් ගෞතමයන් වහන්ස, ධර්මය දැරීමට කවර ධර්මයක් බොහෝ උපකාරවේද? ධර්මය දැරීමට බොහෝ උපකාරවූ ධර්මය අපි භවත් ගෞතමයන්ගෙන් විචාරමු." "භාරද්වාජය, ධර්මය දැරීමට බණ ඇසීම බොහෝ උපකාරවේ. ඉදින් ධර්මය නොඅසන්නේ නම් ධර්මය නොදරන්නේය. යම් හෙයකින් ධර්මය අසාද, එහෙයින් ධර්මය දරයි. එහෙයින් ධර්මය දැරීමට බණ ඇසීම බොහෝ උපකාර ඇත්තේ වේ.

**41.** "භවත් ගෞතමයන් වහන්ස, බණ ඇසීමට කවර ධර්මයක් බොහෝ උපකාරවේද? බණ ඇසීමට බොහෝ උපකාරවූ ධර්මය භවත් ගෞතමයන්ගෙන් අපි විචාරමු." "භාරද්වාජය, බණ ඇසීමට කන්යොමුකිරීම බොහෝ උපකාර වේ. ඉදින් කණයොමු නොකරන්නේ නම් ධර්මය නොඅසන්නේය' යම් හෙයකින් කන් යොමු කෙරේද, එහෙයින් ධර්මය අසයි එබැවින් බණ ඇසීමට කන් යොමුකිරීම බොහෝ උපකාර ඇත්තේ වෙයි."

**42.** "භවත් ගෞතමයන් වහන්ස, කන් යොමුකිරීමට කවර ධර්මයක් බොහෝ උපකාර වේද, කන් යොමුකිරීමට බොහෝ උපකාර ධර්මය අපි භවත් ගෞතමයන්ගෙන් විචාරමු". "භාරද්වාජය, කන් යොමු කිරීමට සේවනය කිරීම බොහෝ උපකාරයි. ඉදින් සේවනය නොකරන්නේ නම් මේ කන් යොමු නොකරන්නේය. යම් හෙයකින් සේවනය කෙරේද, එහෙයින් කන් යොමුකරයි. එහෙයින් කන් යොමු කිරීමට සේවනය කිරීම බොහෝ උපකාර ඇත්තේ වේ."

**43.** "භවත් ගෞතමයන් වහන්ස, සේවනය කිරීමට වනාහි කවර ධර්මයක් බොහෝ උපකාරවේද? සේවනයට බොහෝ උපකාරවූ ධර්මයක් අපි භවත් ගෞතමයන්ගෙන් විචාරමු". "භාරද්වාජය, සේවනය කිරීමට වෙතට පැමිණීමට බොහෝ උපකාරයි. ඉදින් වෙතට නොපැමිණෙන්නේනම් සේවනය නොකරන්නේය. යම් හෙයකින් වෙතට පැමිණේද එහෙයින් සේවනය කෙරෙයි. එහෙයින් සේවනය කිරීමට වෙතට පැමිණීම බොහෝ උපකාර ඇත්තේ වේ."

**44.** "භවත් ගෞතමයන් වහන්ස, වෙතට පැමිණීමට කවර ධර්මයක් බොහෝ උපකාර වේද? වෙතට පැමිණීමට බොහෝ උපකාරවූ ධර්මය අපි භවත් ගෞතමයන්ගෙන් විචාරමු" "භාරද්වාජය, වෙතට පැමිණීමට ශ්‍රද්ධාව බොහෝ උපකාර ඇත්තේය. ඉදින් ශ්‍රද්ධාව නොඋපදින්නේ වේ නම් වෙතට නොපැමිණෙන්නේය. යම් හෙයකින් ශ්‍රද්ධාව උපදීද, එහෙයින් වෙතට පැමිණෙයි. එහෙයින් වෙතට පැමිණීමට ශ්‍රද්ධාව බොහෝ උපකාර ඇත්තේ වෙයි".

**45.** "සත්‍ය රැකීම අපි භවත් ගෞතමයන්ගෙන් විචාලෙමු. භවත් ගෞතමයන් වහන්සේ සත්‍ය රැකීම ප්‍රකාශ කළහ. එයද අපට රුචි වන්නේද සෑහෙන්නේද වෙයි. එයින් සතුටුවූ අපි සත්‍යානුබොධය භවත් ගෞතමයන් අතින් විචාළෙමු. භවත් ගෞතමයන් වහන්සේ සත්‍යානුබොධය ප්‍රකාශ කළහ. එයද අපට රුචි වන්නේද, සෑහෙන්නේද, වෙයි. එයින් සතුටුවූ අපි සත්‍යයට පැමිණීම භවත් ගෞතමයන්ගෙන් විචාළෙමු. භවත් ගෞතමයන් වහන්සේ සත්‍යයට පැමිණීම ප්‍රකාශ කළහ. එයද අපට රුචිවන්නේද සෑහෙන්නේද වෙයි. එයින් සතුටුවූ අපි සත්‍යයට පැමිණීම සඳහා බොහෝ උපකාර වන ධර්මය භවත් ගෞතමයන්ගෙන් විචාළෙමු. භවත්ගෞතමයන් වහන්සේ සත්‍යයට පැමිණීම සඳහා බොහෝ උපකාරවූ ධර්මය එයද අපට රුචි වන්නේද, සෑහෙන්නේද, වෙයි. එයින්ද සතුටුවූ අපි යම් යම් කරුණක් භවත් ගෞතමයන්ගෙන් විචාළෙමුද, ඒ ඒ කාරණයන්ම භවත් ගෞතමයන් වහන්සේ ප්‍රකාශ කළහ. එයද

අපට රුචි වන්නේද, සෑහෙන්නේද, වෙයි. එයින් අපි සතුටු සිත් ඇත්තෝ වෙමු. භවත් ගෞතමයන් වහන්ස, අපි වනාහි පෙර මෙසේ දනිමු. "මුඩු ශ්‍රමණයෝය, නින්දා කටයුතු ශ්‍රමණයෝය, ගෘහපතියෝය, පහත් ජාති ඇත්තෝය, බ්‍රහ්මයාගේ පයින් උපන්නෝය, කිනම් ධර්මයක් ධර්මයක් දන්නේද, (කියායි).

**46.** "භවත් ගෞතමයන් වහන්සේ ඒකාන්තයෙන් ශ්‍රමණයන් කෙරෙහි මාගේ ප්‍රේමය, ශ්‍රමණයන් කෙරෙහි (මාගේ) ශ්‍රමණ ප්‍රසාදය, ශ්‍රමණයන් කෙරෙහි (මාගේ) ශ්‍රමණ ගෞරවය ඉපදැවූ සේක. භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත. භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත, භවත් ගෞතමයන් වහන්ස, යම්සේ යටිකුරුකොට තබන ලද්ද උඩුකුරු කරන්නේ හෝ වේද, වසා තබන ලද්දක් වැසුම් හරින්නේ හෝ වේද, මංමුළාවූවෙකුට මග කියන්නේ හෝ වේද, අන්ධකාරයෙහි ඇස් ඇත්තෝ රූප දකිත්වායි තෙල් පහනක් දරන්නේ හෝ වේද, එපරිද්දෙන්ම භවත් ගෞතමයන් වහන්සේ නොයෙක් ආකාරයෙන් ධර්මය දෙශනා කරන ලද්දේය. ඒ මම භවත් ගෞතමයන් වහන්සේද, ධර්මයද, සංඝයාද සරණ කොට යමි. භවත් ගෞතමයන් වහන්සේ මා අද පටන් දිවිහිමියෙන් සරණගිය උපාසකයෙකු කොට දරන සේක්වා."

**පස්වැනිවූ චංකී සූත්‍රය නිමි. (5-5)**

## 46. එසුකාරී සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර අනේපිඬු සිටුහු කරවූ ජේතවන නම් ආරාමයෙහි වාසය කරණ සේක. එකල්හි එසුකාරී නම් බ්‍රාහ්මණයෙක් භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවිය. සතුටු වියයුතුවූද සිහි කටයුතුවූද කථාව කොට නිමවා පැත්තෙක හුන්නේය. පැත්තෙක උන්නාවූ එසුකාරී බ්‍රාහ්මණතෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය.

2. "භවත් ගෞතමයන් වහන්ස, බමුණෝ සේවය කිරීම් හතරක් නියම කෙරෙති. බමුණාට සේවය කිරීම පණවත්, ක්ෂත්‍රියයාට සේවය කිරීම නියම කෙරෙති, වෛශ්‍යයාට සේවය කිරීම නියම කෙරෙති, ශුද්‍රයාට සේවය කිරීම නියම කෙරෙති. භවත් ගෞතමයන් වහන්ස, එහි මේ සේවය කිරීම බමුණෝ බමුණාට නියම කරති. බමුණෙක් හෝ බමුණාට සේවය කරන්නේය. ක්ෂත්‍රියයෙක් හෝ බමුණාට සේවය කරන්නේය. වෛශ්‍යයෙක් හෝ බමුණාට සේවය කරන්නේය යනුය. භවත් ගෞතමයන් වහන්ස, බමුණෝ බමුණාට මේ වතාවත් කිරීමට නියම කරති.

3. "භවත් ගෞතමයන් වහන්ස, එහි මේ සේවය කිරීම බමුණෝ ක්ෂත්‍රියයාට නියමකරති. ක්ෂත්‍රියයෙක් හෝ ක්ෂත්‍රියයාට වතාවත් කරන්නේය. වෛශ්‍යයෙක් හෝ ක්ෂත්‍රියයාට වතාවත් කරන්නේය. ශුද්‍රයෙක් හෝ ක්ෂත්‍රියයාට වතාවත් කරන්නේය. භවත් ගෞතමයන් වහන්ස, මේ සේවය කිරීම් වනාහි බමුණෝ ක්ෂත්‍රියයාට නියම කරති. භවත් ගෞතමයන් වහන්ස, එහි මේ සේවය කිරීම බමුණෝ වෛශ්‍යයාට නියම කරති. වෛශ්‍යයෙක් හෝ වෛශ්‍යයාට වතාවත් කරන්නේය. ශුද්‍රයෙක් හෝ වෛශ්‍යයාට වතාවත් කරන්නේයයනුයි. භවත් ගෞතමයන් වහන්ස, බමුණෝ මේ සේවය කිරීම වනාහි ශුද්‍රයාට නියම කරති. ශුද්‍රයෙක් හෝ ශුද්‍රයාට වතාවත් කරන්නේය. අන් කවරෙක් හෝ ශුද්‍රයාට වතාවත් කරන්නේදැයි' භවත් ගෞතමයන් වහන්ස, මේ සේවය කිරීම වනාහි බමුණෝ ශුද්‍රයාට නියම කරති. භවත් ගෞතමයන් වහන්ස, බමුණෝ මේ සේවය කිරීම් හතරක් නියම කරති. මෙහිදී භවත් ගෞතමයන් වහන්සේ කුමක් කියන සේක්ද?" "බමුණ කිමෙක්ද? බමුණෝ සිව් වැදෑරුම් සේවය නියම කරතියි සියලු ලෝකයා එයට අනුදුසුද?" "භවත් ගෞතමයන් වහන්ස, මෙයට සියලු ලෝකයා කැමැති නොවේ". "බමුණ, යම්සේ දිළිඳුවූ, ධන නැත්තාවූ සහල් නැළියක්වත් නැත්තාවූ පුරුෂයෙක් වේද, නොකැමතිවූ ඔහුට කොටස් නියම කරන්නාහුය. (එල්ලූහ) 'එම්බා පුරුෂය, මෙහි තා විසින් මස්

කෑ යුතුයි. මිලදී දිය යුතුයි.' (කියායි) මෙපරිද්දෙන් බමුණ, යම් ඒ මහණ බමුණන්ගේ කැමැත්තක් නැතිව බමුණෝ මේ සේවය කිරීම් සතර පණවත්.

4. "බමුණ, මම සියල්ල සේවය කළ යුතුයයි නොකියමි බමුණ, මම සියල්ල සේවය නොකළ යුතුයයි නොකියමි. බමුණ, යමක් සේවය කරන්නාහුට සේවය කිරීමේ හේතුවෙන් පවක් වන්නේද, වැඩක් නොවන්නේද, බමුණ, මම එය සේවය කළ යුතුයයි නොකියමි. බමුණ, යම් හෙයකින් වනාහි සේවය කරන්නහුට සේවය කිරීමේ හේතුවෙන් යහපතක් වන්නේද, පාපයක් නොවන්නේද, එය මම සේවය කළ යුතුයයි කියමි.

5. "බමුණ, ක්ෂත්‍රියයාගෙන්ද, මෙසේ විචාරන්නාහු යමක් සේවය කරන්නාවූ ඔබට (එය) සේවය කිරීමේ හේතුවෙන් පාපයක් වන්නේද, යහපතක් නොවන්නේද, යමක් සේවය කරන්නාවූ ඔබට (එය) සේවය කිරීමේ හේතුවෙන් යහපතක් වන්නේද, පාපයක් නොවන්නේද, මෙහිද කුමක් සේවය කරන්නට කැමැතිවෙහිදැයි' බමුණ, ක්ෂත්‍රියයාද මනාව ප්‍රකාශ කරමින් මෙසේ ප්‍රකාශ කරන්නේය. 'යමක් සේවය කරන්නාවූ මට (එය) සේවය කිරීමේ හේතුවෙන් පාපයක් වන්නේද, යහපතක් නොවන්නේද, මම එය සේවය නොකරමි. යමක් සේවනය කරන්නාවූ මට (එය) සේවය කිරීමේ හේතුවෙන් යහපතක් වන්නේද පවක් වන්නේද, එය මම සේවය කරමි. බමුණ, බමුණාගෙන් මෙසේ විචාරන්නාහුය. යමක් සේවය කරන්නාවූ ඔබට (එය) සේවය කිරීමේ හේතුවෙන්, පාපයක් වන්නේද, යහපත් නොවන්නේද, යමක් සේවය කරන්නාවූ ඔබට (එය) සේවය කිරීමේ හේතුවෙන් යහපතක් වන්නේද, පාපයක් නොවන්නේද, මෙහිදී කුමක් සේවය කරන්නාට කැමැත්තෙහිදැයි බමුණ, බමුණාද මනාව ප්‍රකාශ කරමින් මෙසේ ප්‍රකාශ කරන්නේය. 'යමක් සේවය කරන්නාවූ මට (එම) සේවය කිරීමේ හේතුවෙන් පාපයක් වන්නේද යහපත් නොවන්නේද, මම එය සේවය නොකරමි. යමක් සේවය කරන්නාවූ මට (එය) සේවය කිරීමේ හේතුවෙන් යහපතක් වන්නේද, පාපයක් නොවන්නේද,

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මම එය සේවය කරමි. ‘බමුණ, වෛශ්‍යයාගෙන්ද මෙසේ විචාරන්නාහුය. ‘යමක් සේවය කරන්නාවූ ඔබට (එය) සේවය කිරීමේ හේතුවෙන් පාපයක් වන්නේද, යහපතක් වන්නේද යමක් සේවය කරන්නාවූ ඔබට (එය) සේවය කිරීමේ හේතුවෙන් යහපතක් වන්නේද, පාපයක් නොවන්නේද, මෙහිදී කුමක් සේවය කරන්ට කැමැත්තේහිදැයි’ ‘බමුණ, වෛශ්‍යයාද මනාව ප්‍රකාශ කරමින් මෙසේ ප්‍රකාශ කරන්නේය. ‘යමක් සේවය කරන්නාවූ මට (එය) සේවය කිරීමේ හේතුවෙන් පාපයක් වන්නේද, යහපතක් නොවන්නේද මම එය සේවය නොකරමි. යමක් සේවය කරන්නාවූ මට (එය) සේවය කිරීමේ හේතුවෙන් යහපතක් වන්නේද, යහපතක් නොවන්නේද එය මම සේවය කරමි’.

**6.** “බමුණ, ශුද්‍රයාගෙන්ද මෙසේ විචාරන්නාහුය. ‘යමක් සේවය කරන්නාවූ ඔබට (එය) සේවය කිරීමේ හේතුවෙන් පාපයක් වන්නේද, යමක් සේවය කරන්නාවූ ඔබට (එය) සේවය කිරීමේ හේතුවෙන් යහපතක් වන්නේද, පවක් නොවන්නේද මෙහිදී කුමක් සේවය කරන්නට කැමැති වෙහුදැයි’. ශුද්‍රයාද මනාව පවසමින් මෙසේ පවසන්නේය. ‘යමක් සේවය කරන්නාවූ මට (එය) සේවය කිරීමේ හේතුවෙන් පාපයක් වන්නේද, යහපතක් වන්නේද, මම එය සේවය නොකරමි. සේවනය කරන්නාවූ මට (එය) සේවය කිරීමේ හේතුවෙන් යහපතක් වන්නේද, පාපයක් නොවන්නේද, එය මම සේවය කරමි’.

**7.** “බමුණ, මම උසස් කුල ඇති බව උසස්යයි නොකියමි. බමුණ, මම වනාහි උසස් කුල ඇති බව පහත්යයි නොකියමි. බමුණ, මම පහත් වර්ණ ඇතිබව උසස්යයි නොකියමි. බමුණ, මම වනාහි පහත් වර්ණ ඇති බව පහත්යයි නොකියමි. බමුණ, මම මහත් භෝග ඇති බව උසස්යයි නොකියමි බමුණ, මම වනාහි මහත් භෝග ඇතිබව පහත්යයි නොකියමි. බමුණ, මේ ලොකයෙහි උසස් කුල ඇත්තාවූ ඇතැමෙක් පරපණ නසන්නේ වෙයිද, නොදුන් දෙය ගන්නේවෙයි. කාමයන්හි වරදවා හැසිරෙන්නේ වෙයි, බොරු කියන්නේ වෙයි, කේලම් කියන්නේ

වෙයි, රළු වචන කියන්නේද වෙයි, හිස් වචන කියන්නේද වෙයි, දැඩි ලෝභය ඇත්තේ වෙයි, බද්ධවෛරයෙන් යුක්ත සිත් ඇත්තේ වෙයි, වැරදි දැකීම් ඇත්තේ වෙයි, එහෙත් උසස් කුල ඇති බව උසස් යයි" නොකියමි.

8. "බමුණ, පහත් වර්ණ ඇත්තේ වනාහි මේ ලොකයෙහි සමහරෙක් පරපණ නැසීමෙන් වැළකුණේ වේ, නුදුන් දෙය ගැන්මෙන් වැලකුණේ වේ, කාමයන්හි වරදවා නොහැසිරෙන්නේ වේ, බොරු කීමෙන් වෙන්වූයේ වේ, කේලාම් කීමෙන් වැලකුණේ වේ, රළුවචනයෙන් වැලකුණේ වේ, හිස්වචන කීමෙන් වැලකුණේ වේ, දැඩි ලොභය නැත්තේ වේ, බද්ධවෛරය නැත්තේ වේ. හරිදැකීම ඇත්තේ වේ, එහෙයින් උසස් වර්ණ ඇති බව පහත්යයි නොකියමි.

9. "බමුණ, මහත් භෝග ඇත්තාවූ මේ ලෝකයෙහි සමහරෙක් පරපණ නසන්නේ වේද, නොදුන් දෙය ගන්නේ වේද, කාමයන්හි වරදවා හැසිරෙන්නේ වේ, බොරු කියන්නේ වේ, කේළාම් කියන්නේ වේ, රළු වචන කියන්නේ වේ, හිස් වචන කියන්නේ වේ, දැඩි ලෝභය ඇත්තේ වේ, බද්ධවයිරයෙන් යුක්ත සිත් ඇත්තේ වේ. මිසදිටු ඇත්තේ වේ, එහෙයින් මහත් භෝග ඇති බව උසස්යයිද නොකියමි.

"බමුණ, මහත් භෝග ඇත්තාවුද මේ ලොකයෙහි සමහරෙක් පරපණ නැසීමෙන් වෙන්වූයේ වේ, නුදුන් දෙය ගැන්මෙන් වැලකුණේ වේ, කාමයන්හි වරදවා නොහැසිරෙන්නේවේ, බොරු කීමෙන් වෙන් වූයේ වේ, කේළාම් කීමෙන් වැලකුණේ වේ, රළු වචනයෙන් වැලකුණේ වේ, හිස් වචන දෙඩීමෙන් වැලකුණේ වේ, දැඩි ලෝභය නැත්තේ වේ බැඳගත් වයිර නැත්තේ වේ, හරිදැකීම් ඇත්තේ වේද, එහෙයින් උසස් භෝග ඇති බව ලාමකයයිද නොකියමි.

10. "බමුණ, මම සියල්ලන් සේවය කළ යුතුයයිද නො කියමි. බමුණ, මම වනාහි සියල්ලන් සේවය නොකළයුතුයයිද නොකියමි. යමකු සේවය කරන්නාවූ ඔහුට ඒ සේවය කිරීමේ

හෙතුවෙන් ඇදහීම වැඩෙයිද, සීලය වැඩෙයිද, ඇසූ තැන් ඇති බව වැඩෙයිද, දීම වැඩෙයිද, නුවණ වැඩෙයිද මම ඔහු සේවය කළ යුතුයයි කියමි.” මෙසේ කී කල්හි එසුකාරී බමුණා භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. “භවත් ගෞතමයන් වහන්ස, බමුණෝ සතර ධනයක් නියම කරති. බමුණාට සිය ධනය නියම කරති. ක්ෂත්‍රියයාට සිය ධනය නියම කරති. වෛශ්‍යයාට සිය ධනය නියම කරති. ශුද්‍රයාට සිය ධනය නියම කරති. භවත් ගෞතමයන් වහන්ස, ඔවුන් බමුණෝ බමුණාට මේ පිණ්ඩපාතයේ හැසිරීම සිය ධනයකොට නියම කරත්. පිණ්ඩපාතයේ හැසිරීම සිය ධනයකොට ඇත්තාවූ බමුණු තෙම ආරක්ෂකයා විසින් තමන් රක්කයුතු දෙය සොරා ගන්නාක් මෙන් නොකටයුතු දේ කරන්නේ වේ. භවත් ගෞතමයන් වහන්ස, බමුණෝ වනාහි බමුණාට මේ ස්වකීය ධනය නියම කරත්”

11. “භවත් ගෞතමයන් වහන්ස, ඔවුන් බමුණෝ ක්ෂත්‍රියාට දුන්න සහ හී කොපුව සිය ධනය සේ නියම කරත්. දුන්න සහ හී කොපුව සිය ධනය කොට ඇත්තාවූ ක්ෂත්‍රියතෙම ආරක්ෂකයා විසින් රැකියයුතුදේ සොරාගන්නාමෙන් නොකටයුතු දේ කරන්නේ වේ. භවත් ගෞතමයන් වහන්ස, බමුණෝ වනාහි ක්ෂත්‍රියයාට මේ සිය ධනය නියම කරත්.

“භවත් ගෞතමයන් වහන්ස, ඔවුන් අතුරෙන් බමුණෝ වෛශ්‍යයාට සී සෑම සහ ගවයන් රැකීම සිය ධනයසේ නියම කරති. සී සෑම සහ ගවයන් රැකීම සිය ධනය කොට ඇත්තාවූ වෛශ්‍යයා විසින් රැකිය යුතු දේ සොරාගන්නා මෙන් නොකටයුතු දේ කරන්නේ වේ. නොකටයුතු දේ කරන්නේ වෙයි. භවත් ගෞතමයන් වහන්ස, බමුණෝ වනාහි වෛශ්‍යයාට මේ සිය ධනය නියමකරත්.

“භවත් ගෞතමයන් වහන්ස, බමුණෝ ශුද්‍රයාට මේ තණ කපන දෑකැත්ත හා කදද සිය ධනය කොට නියමකරති. තණ කපන දෑකැත්ත හා කද සිය ධනය කොට ඇත්තාවූ ශුද්‍රයා වනාහි රැකිය යුතු දේ සොරා ගන්නාක් මෙන් නොකටයුතු දේ කරන්නේ වේ. භවත් ගෞතමයන් වහන්ස, බමුණෝ ශුද්‍රයාට

මුද්‍රණය කර බෙදාහැරීම තහනම්. http://pitaka.lk

මෙය සිය ධනය නියම කරති. භවත් ගෞතමයන් වහන්ස, බමුණෝ මේ සතර ධනයන් නියම කරත්.

"භවත් ගෞතමයන් වහන්සේ මේ කරුණෙහිදී කුමක් කියන සේක්ද?" "බමුණ, කිමෙක්ද? බමුණෝ මේ සතර ධනය නියම කෙරෙත්ද? සියලු ලෝකයා එය අනුදනීද?"

12. "භවත් ගෞතමයන් වහන්ස, එයට සියලු ලෝකයා කැමති නොවේ." "බමුණ, දිළිඳුවූ අසරණවූ නිර්ධනවූ පුරුෂයෙක් ඔහුගේ අකැමැත්තෙන්, 'එම්බා පුරිසය, මෙය තාගේය. මස් කෑයුතුයි. මිළද දිය යුතුයයි,' කොටස නියම කරන්නේ යම්සේද, බමුණ, එපරිද්දෙන්ම මහණ බමුණන්ගේ අනුදැකීමක් පිළිගැනීමක් නැතිව මේ සතර ධනයන් වනාහි (ඒ බමුණෝ) නියමකරත්."

13. "බමුණ, මම ආර්යවූ ලොකොත්තර ධර්මය පුරුෂයාට සිය ධනය කොට නියම කරමි. පුරාණ මව්පිය කුලවංසය වනාහි සිහිකරන්නාවූ ඔහුගේ යම් යම් තැනෙක්හි ආත්ම භාවයාගේ ඉපදීම වේද, ඒ ඒ ආත්මභාවයෙන්ම වංසය ව්‍යවහාරයට යයි. ඉදින් ක්ෂත්‍රිය කුලයෙහි ආත්ම භාවයාගේ ඉපදීම වේද (ඔහු) ක්ෂත්‍රිය යන ව්‍යවහාරයට යයි. ඉදින් බමුණු කුලයෙහි ආත්ම භාවයාගේ ඉපදීම වේද, (ඔහු) බ්‍රාහ්මණ යන ව්‍යවහාරයටයයි. ඉදින් වෛශ්‍ය කුලයෙහි ආත්මභාවයාගේ ඉපදීමවේද, (ඔහු) වෛශ්‍යය යන ව්‍යවහාරයටයයි ශුද්‍ර කුලයෙහි ආත්ම භාවයාගේ ඉපදීම වේද, (ඔහු) ශුද්‍ර යන ව්‍යවහාරයටයයි.

"බමුණ, යම්සේ යම් යම් උපකරණයක් නිසා ගිනි දල්වයිද, ඒ ඒ උපකරණයෙන්ම වර්ග ව්‍යවහාරයටයි. දර නිසා ගිනි දල්වයිද, (එය) දර ගින්නය යන ව්‍යවහාරයටයයි. පතුරු නිසා ගිනි දල්වයිද (එය) පතුරු ගින්න යන ව්‍යවහාරයටයයි. තණ නිසා ගිනි දල්වයිද (එය) තෘණාග්නි යන ව්‍යවහාරයටයයි. ගොම වැරටි නිසා ගිනි දල්වයිද (එය) ගෝමයාග්නි යන ව්‍යවහාරයටයයි.

14. "බමුණ මෙපරිද්දෙන් මම වනාහි ආර්යවූ ලොකොත්තර ධර්මයන් පුරුෂයාගේ සිය ධනයසේ නියමකරමි. පුරාණවූ මව්පිය

සතු වූ කුලවංස සිහිකරන්නාවූ යම් යම් තන්හිම ආත්ම භාවයාගේ ඉපදීම වේද, ඒ ඒ ආත්ම භාවයෙන්ම වංශ ව්‍යවහාරයටයයි. ඉදින් ක්ෂත්‍රියකුලයෙහි ආත්මභාවයාගේ ඉපදීම වේද (ඔහු) ක්ෂත්‍රියයා ව්‍යවහාරයටයි. ඉදින් බමුණු කුලයෙහි ආත්ම භාවයාගේ ඉපදීම වේද, (ඔහු) බ්‍රාහ්මණයාය යන ව්‍යවහාරයටයයි. වෛශ්‍ය කුලයෙහි ආත්ම භාවයාගේ ඉපදීම වේද, (ඔහු) වෛශ්‍යයාය යන ව්‍යවහාරයටයයි. ඉදින් ශුද්‍ර කුලයෙහි ආත්ම භාවයාගේ ඉපදීම වේද, (ඔහු) ශුද්‍රයාය ව්‍යවහාරයට යයි.

15. බමුණ, ඉදින් "ක්ෂත්‍රිය කුලිකයෙක් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වේද, හෙතෙමේද තථාගතයන් විසින් ප්‍රකාශ කළ ධර්ම විනයට පැමිණ සතුන් මැරීමෙන් වැලකුණේ වෙයි, හොරකමින් වෙන්වූයේ වෙයි, ස්ත්‍රී සේවනයෙන් වෙන්වූයේ වෙයි, බොරු කීමෙන් වෙන්වූයේ වෙයි, කේළාම් කීමෙන් වෙන්වූයේ වෙයි. රළු වචනයෙන් වෙන්වූයේ වෙයි, හිස් වචනයෙන් වෙන්වූයේ වෙයි, දැඩි ලොභ නැත්තේ වෙයි, බැඳගත් වයිර නැත්තේ වෙයි, හරිදැකීම් ඇත්තේ වෙයි, මාර්ග කුසලය සම්පූර්ණ කරන්නේ වෙයි. බමුණ, ඉදින් බමුණු කුලිකයෙක් ගිහිගෙන් නික්ම ශාසනයෙහි පැවිදි වේද, හෙතෙමේද තථාගතයන් වහන්සේ පැවසූ ධර්මවිනයට පැමිණ සතුන් මැරීමෙන් වෙන්වූයේ වේ, හොරකමින් වෙන්වූයේද, අබ්‍රහ්මචර්යාවෙන් වෙන්වූයේද, බොරුකීමෙන් වෙන්වූයේද, කේළාම් කීමෙන් වෙන් වූයේද, රළු වචනයෙන් වෙන්වූයේද වේ, හිස් වචනයෙන් වෙන්වූයේ වේ, දැඩි ලෝභ නැත්තේවේ, බැඳගත් වයිර නැත්තේ වේ, හරිදැකීම් ඇත්තේ වේ, මාර්ග කුලය සම්පූර්ණ කරන්නේ වෙයි. බමුණ, වෛශ්‍ය කුලිකයෙක්ද, ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වේද, හෙතෙමේද තථාගතයන් විසින් පැවසූ ධර්ම විනයට පැමිණ සතුන් මැරීමෙන් වැලකුණේ වෙයි. හොරකමින් වෙන්වූයේද, අබ්‍රහ්මචර්යාවෙන් වෙන් වූයේද, බොරු කීමෙන් වෙන්වූයේද, කේළාම් කීමෙන් වෙන් වූයේද, රළු වචනයෙන් වෙන් වූයේවේ, හිස් වචනයෙන් වෙන් වූයේද වේ, දැඩි ලෝභ නැත්තේවේ, හරිදැකීම් ඇත්තේ වෙයි. මාර්ග

කුසලය සම්පූර්ණ කරන්නේ වෙයි. බමුණ, ශුද්‍රකුලිකයෙක් ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වේද, හෙතෙමේද තථාගතයන් විසින් පැවසූ ධර්ම විනයට පැමිණ සතුන් මැරීමෙන් වැළකුණේ වෙයි. හොරකමින් වෙන්වූයේ වෙයි. ස්ත්‍රී සේවනයෙන් වෙන් වූයේ වෙයි. බොරු කීමෙන් වෙන්වූයේ වෙයි. කේළාම් කීමෙන් වෙන්වූයේ වෙයි. රළු වදනින් වෙන් වූයේවෙයි. හිස් වචනයෙන් වෙන් වූයේවෙයි. දැඩි ලෝභය නැත්තේ වෙයි. බැඳගත් වයිර නැත්තේ වෙයි. හරි දැකීම ඇත්තෙක් වෙයි. මාර්ග කුසලය සම්පූර්ණ කරන්නේ වෙයි.

"බමුණ, මේ ප්‍රදේශයෙහි වෛර නැත්තාවූ ක්‍රොධ මෛත්‍රි සිත වඩන්නට බමුණාම පොහොසත් වේද, ක්ෂත්‍රියයෙක්, වෛශ්‍යයෙක්, ශුද්‍රයෙක් පොහොසත් නොවේද"? "භවත් ගෞතමයන් වහන්ස, එය එසේ නොවේ. භවත් ගෞතමයන් වහන්ස, ක්ෂත්‍රියයාද මේ ප්‍රදේශයෙහි වෛර නැත්තාවූ ක්‍රොධ නැත්තාවූ මෛත්‍රි සිත වඩන්නට පොහොසත්ය.

භවත් ගෞතමයන් වහන්ස, බ්‍රාහ්මණයාද, මේ ප්‍රදේශයෙහි වෛර නැති ක්‍රොධනැති මෛත්‍රි සිත වඩන්ට පොහොසත්ය. භවත් ගෞතමයන් වහන්ස, වෛශ්‍යයාද මේ ප්‍රදේශයෙහි වෛරනැති ක්‍රොධනැති මෛත්‍රී සිත වඩන්නට පොහොසත්ය. භවත් ගෞතමයන් වහන්ස, ශුද්‍රයාද මේ ප්‍රදේශයෙහි වෛර නැති ක්‍රොධනැති මෛත්‍රි සිත වඩන්නට පොහොසත්ය. භවත් ගෞතමයන් වහන්ස, සියලු සතර ජාතීද මේ ප්‍රදේශයෙහි වෛරනැති ක්‍රොධනැති මෙත් සිත වැඩීමට පොහොසත් වෙති."

**16.** "ඉදින් බමුණ, මෙපරිද්දෙන් වනාහි ක්ෂත්‍රිය කුලිකයෙක්ද ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වේද, හෙතෙමේද තථාගතයන් පැවසූ ධර්ම විනයට පැමිණ සතුන් මැරීමෙන් වෙන්වූයේ වේ, හොරකමින් වෙන්වූයේ වේ, ස්ත්‍රී සේවනයෙන් වෙන්වූයේවේ, බොරුකීමෙන් වෙන්වූයේවේ, කේළාම් කීමෙන් වෙන්වූයේවේ, රළු වචනයෙන් වෙන්වූයේවේ, හිස් වචනයෙන් වෙන්වූයේවේ, දැඩි ලෝභ නැත්තේවේ, බැඳගත් වයිර සිත් නැත්තේවේ, හරිදැකීම් ඇත්තෙක්වේ, මාර්ග කුශලය සම්පූර්ණ කරන්නේවෙයි. බමුණ, බ්‍රාහ්මණ කුලිකයෙක්ද ගිහිගෙන් නික්ම

සස්නෙහි පැවිදිවේද, හෙතෙමේද තථාගතයන් පැවසූ ධර්මවිනයට පැමිණ, සතුන් මැරීමෙන් වෙන්වූයේ වේ, හොරකමින් වෙන්වූයේ වේ, ස්ත්‍රී සේවනයෙන් වෙන්වූයේ වේ, බොරුකීමෙන් වෙන්වූයේ වේ, කේලාම් කීමෙන් වෙන් වූයේවේ, රළු වචනයෙන් වෙන්වූයේ වේ හිස් වචනයෙන් වෙන්වූයේ වේ, දැඩි ලෝභ නැත්තේ වේ, බැඳගත් වයිර නැත්තේ වේ, හරිදැකීම් ඇත්තෙක් වේ, මාර්ග කුශලය සම්පූර්ණ කරන්නේ වෙයි. වෛශ්‍යකුලිකයෙක්ද, ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවේද, හෙතෙමේද තථාගතයන් පැවසූ ධර්මවිනයට පැමිණ, සතුන් මැරීමෙන් වෙන්වූයේ වේ, හොරකමින් වෙන්වූයේ වේ, ස්ත්‍රී සේවනයෙන් වෙන්වූයේ වේ, බොරුකීමෙන් වෙන්වූයේ වේ, කේලාම් කීමෙන් වෙන්වූයේ වේ, රළු වචනයෙන් වෙන්වූයේ වේ, හිස් වචනයෙන් වෙන්වූයේ වේ, දැඩිලෝභ නැත්තේ වේ, බැඳගත් වයිර සිත් නැත්තේ වේ, හරි දැකීම් ඇත්තෙක් වේ, මාර්ග කුශලය සම්පූර්ණ කරන්නේ වෙයි. ශුද්‍රකුලිකයෙක්ද, ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූයේද, හෙතෙමේද තථාගතයන් පැවසූ ධර්මවිනයට පැමිණ, සතුන් මැරීමෙන් වැළකුණේවේ. නුදුන් දෙය ගැන්මෙන් වැළකුණේවේ මුසාවාදයෙන් වැළකුණේවේ, කේලාම් කීමෙන් වැළකුණේවේ, ඵරුෂවචනයෙන් වැළකුණේවේ. හිස්වචන කථාවෙන් වැළකුණේවේ, දැඩිලෝභයෙන් නොමැඩුනේවේ, බැඳගත් වෛර නැත්තේවේ, හරිදැකීම් ඇත්තෙක්වේ, මාර්ග කුශලය සම්පූර්ණ කරන්නේ වෙයි. බමුණ, කුමක් සිතන්නෙහිද? බමුණාම ඇඟ උලන ගල් හා කල්ක ගෙන ගඟට ගොස් ගඟට කුණු දූවිලි සෝදා හරින්ට පොහොසත් වේද? ක්ෂත්‍රියයා අපොහොසත් වේද? වෛශ්‍යයා අපොහොසත් වේද? ශුද්‍රයා අපොහොසත් වේද"? "භවත් ගෞතමයන් වහන්ස, එය එසේ නොවේ. භවත් ගෞතමයන් වහන්ස. ක්ෂත්‍රියයාද ඇඟ උලන ගල් හා කල්ක ගෙන ගඟට ගොස් කුණු දූවිලි සෝදා හරින්නට පොහොසත්ය. භවත් ගෞතමයන් වහන්ස, බ්‍රාහ්මණයාද, ඇඟ උලන ගල් හා කල්ක ගෙන නදියට ගොස් කුණු දූවිලි සෝදා හරින්නට පොහොසත්ය. වෛශ්‍යයාද, ඇඟ උලන ගල් හා කල්ක ගෙන ගඟට ගොස් බැඳුනු කුණු දූවිලි සෝදා හරින්නට පොහොසත්ය.

ශුද්‍රයාද, ඇඟ උලන ගල් හා කල්ක ගෙන ගඟට ගොස් කුණු දූවිලි සෝදා හරින්නට පොහොසත්ය. භවත් ගෞතමයන් වහන්ස, සියලුම සතර ජාතීහුම ඇඟ උලන ගල් හා කල්ක ගෙන ගඟට ගොස් කුණු දූවිලි සෝදා හරින්නට පොහොසත් වෙති. බමුණ, මෙපරිද්දෙන් ක්ෂත්‍රියෙක්ද, ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වේද, හෙතෙමේද තථාගතයන් වදාළ ධර්ම විනයට පැමිණ සතුන් මැරීමෙන් වෙන් වූයේ වෙයි. හොරකමින් වෙන්වූයේ වෙයි. ස්ත්‍රීසේවනයෙන් වෙන්වූයේ වෙයි. බොරු කීමෙන් වෙන්වූයේ වෙයි. ඵරුෂ වචනයෙන් වෙන් වූයේ වෙයි, කේලාම් කීමෙන් වෙන්වූයේ වෙයි. හිස් වචනයෙන් වෙන්වූයේ වෙයි. දැඩි ලෝභ නැත්තේ වෙයි. හරි දැකීම් ඇත්තෙක් වෙයි. මාර්ග කුශලය සම්පූර්ණ කරන්නේ වෙයි. බමුණ, බ්‍රාහ්මණයෙක්ද ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවේද, හෙතෙමේද, තථාගතයන් පැවසූ ධර්ම විනයට පැමිණ, සතුන් මැරීමෙන් වෙන්වූයේ වෙයි. හොරකමින් වෙන් වූයේ වෙයි. බොරුකීමෙන් වෙන් වූයේ වෙයි. කේලාම් කීමෙන් වෙන් වූයේ වෙයි. ඵරුෂ වචනයෙන් වෙන් වූයේ වෙයි. හිස් වචනයෙන් වෙන්වූයේ වෙයි. දැඩි ලෝභ නැත්තේ වෙයි. හරිදැකීම් ඇත්තෙක් වෙයි. මාර්ග කුසලය සම්පූර්ණ කරන්නේ වෙයි. වෛශ්‍යයෙක්ද, ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවේද, හෙතෙමේද තථාගතයන් පැවසූ ධර්මවිනයට පැමිණ, සතුන් මැරීමෙන් වෙන් වූයේ වෙයි. හොරකමින් වෙන්වූයේ වෙයි. බොරුකීමෙන් වෙන්වූයේ වෙයි. කේලාම් කීමෙන් වෙන්වූයේ වෙයි. ඵරුෂ වචනයෙන් වෙන්වූයේ වෙයි. හිස් වචනයෙන් වෙන්වූයේ වෙයි. දැඩිලෝභ නැත්තේ වෙයි. හරි දැකීම් ඇත්තෙක් වෙයි. මාර්ග කුසලය සම්පූර්ණ කරන්නේ වෙයි. ශුද්‍රයෙක්ද, ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවේද, හෙතෙමේද තථාගතයන් පැවසූ ධර්මවිනයට පැමිණ සතුන් මැරීමෙන් වැලකුණේ වෙයි. හොරකමින් වෙන්වූයේ වෙයි. බොරු කීමෙන් වෙන්වූයේ වෙයි. කේලාම් කීමෙන් වෙන්වූයේ වෙයි. ඵරුෂ වචනයෙන් වෙන්වූයේ වෙයි. හිස්වචනයෙන් වෙන්වූයේ වෙයි. දැඩිලෝභ නැත්තේ වෙයි. හරිදැකීම් ඇත්තෙක් වෙයි. මාර්ග කුසලය සම්පූර්ණ කරන්නේ වෙයි. ශුද්‍රයෙක්ද, ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වේද,

හෙතෙමේද තථාගතයන් පැවසූ ධර්ම විනයට පැමිණ සතුන් මැරිමෙන් වැලකුණේ වේද, හොරකම් කිරීමෙන් වෙන් වූයේ වෙයි. බොරු කීමෙන් වෙන් වූයේ වෙයි. කේළාම් කීමෙන් වෙන් වූයේ වෙයි. එරුෂ වචනයෙන් වෙන් වූයේ වෙයි. හිස් වචනයෙන් වෙන් වූයේ වෙයි. දැඩි ලෝභ නැත්තේ වෙයි. හරි දැකීම් ඇත්තෙක් වෙයි. මාර්ග කුසලය සම්පූර්ණ කරන්නේ වෙයි.

17. "බමුණ, කුමක් සිතන්නෙහිද? මෙහි ඔටුනු පැළඳවූ ක්ෂත්‍රිය රජෙක් නොයෙක් ජාති ඇති පුරිසයන් අතුරෙන් පුරිසයයන් සියයක් හෝ රැස්කරන්නේය. (රැස් කොට) පින්වත්හු එත්වා, ක්ෂත්‍රිය කුලයේ හෝ, බ්‍රාහ්මණ කුලයේ, හෝ ප්‍රදේශ රජ කුලයේ හෝ, උපන්නාවූ යමෙක් සල්රුැකක හෝ, හොර රුැකක හෝ, සඳුන් රුැකක හෝ, පදුම රුැකක හෝ, උඩගාන දණ්ඩක් ගෙන ගිනි උපදවත්වා, ගිනි පහළ කරත්වා. නැවතද පින්වත්හු එත්වා, සැඩොල් කුලයේ, වැදි කුලයේ, වේණ කුලයේ, රථකාර කුලයේ, පුක්කුස කුලයේ, උපන්නාවූ යමෙක් බල්ලන් බොන ඔරුවක හෝ ඌරන් බොන ඔරුවක හෝ රෙදි සෝදන ඔරුවක හෝ එරඬු ලීයක හෝ උඩගාන දණ්ඩක් ගෙන ගිනි උපදවත්වා. ගිනි පහළ කරත්වා.

18. "බමුණ, කුමක් කරන්නෙහිද? යම් ඒ ගින්නක් වේද, ඒ ගින්න ක්ෂත්‍රිය කුලයේ, බමුණු කුලයේ, ප්‍රදේශ රජ කුලයේ උපන්නාහු විසින් සල් රුැකක හෝ, හොර රුැකක හෝ, සඳුන් රුැකක හෝ, පදුම රුැකක හෝ, උඩගාන දණ්ඩක් ගෙන ගිනි උපදවන ලද්දේ, ගිනි පහළ කරන ලද්දේ, ඒ ගින්නම ගිනිදලු ඇත්තේද? වර්ණවත්ද? පැහැ ඇත්තේ වේද? ඒ කරණකොට ගෙන ගින්නෙන් කළ හැකි වූ දෙය කරන්නට හැක්කේ වේද, යම් ඒ ගින්නක් වනාහි සැඩොල්, කුලයේ වැදි කුලයේ, වේණ කුලයේ, රථකාර කුලයේ, පුක්කුස කුලයේ, උපන්නාහු විසින් බල්ලන් බොන ඔරුවක හෝ ඌරන් බොන ඔරුවක හෝ රෙදි සෝදන ඔරුවක හෝ එරඬු ලීයක හෝ උඩගාන දණ්ඩක් ගෙන ගිනි උපදවන ලද්දේ, ගිනි පහළ කරන ලද්දේ, ඒ ගින්නම ගිනිදැල් ඇත්තේද? වර්ණවත්ද? පැහැ ඇත්තේද? ඒ කරණකොට

ගින්නෙන් කළ හැකි දේ කරන්නට හැක්කේ වේද, භවත් ගෞතමයන් වහන්ස, එය එසේ නොවේ. භවත් ගෞතමයන් වහන්සේ යම් ඒ ගින්නක් ක්ෂත්‍රිය කුලයේ, බමුණු කුලයේ, ප්‍රදේශ කුලයේ උපන්නාහු විසින් සල් රුකක හෝ, හොර රුකක හෝ. පදුම රුකක හෝ උඩගාන දණ්ඩක් ගෙන ගිනි නිපදවන ලද්දේද, ඒ ගින්න පහළ කරන ලද්දේද, ඒ ගින්නද, ගිනි දැල් ඇත්තේද, වර්ණවත්ද, පැහැ ඇත්තේද ඒ ගිනි කරණකොට ගෙන ගින්නෙන් කළ හැකි සියල්ල කරන්නට ද හැක්කේ වේ. යම් ඒ ගින්නක් සැඩොල් කුලයේ, වැදි කුලයේ, වේණ කුලයේ, රථකාර කුලයේ උපන්නවුන් විසින් බල්ලන් බොන ඔරුවක හෝ ඌරන් බොන ඔරුවක හෝ රෙදි සෝදන ඔරුවක හෝ එරඬු ලීයක හෝ උඩගාන දණ්ඩක් ගෙන ගිනි නිපදවන ලද්දේද ගිනි පහළකරන ලද්දේ, ඒ ගින්නද ගිනිදැල් ඇත්තේද, වර්ණවත්ද, පැහැ ඇත්තේද, ඒ ගින්න කරණ කොටගෙන ගින්නෙන් කළ හැකි සියල්ල කරන්නටද හැක්කේ වේ. භවත් ගෞතමයන් වහන්ස, සියලුම ගිනි ගිනිදැල් ඇත්තේ ද, වර්ණවත් ද, පැහැ ඇත්තේ ද වේ. සියලුම ගිනි කරණ කොට ගෙන ගින්නෙන් කළහැකි සියල්ලක් කරන්නට හැකිය". "බමුණ, එපරිද්දෙන් වනාහි ක්ෂත්‍රිය කුලිකයෙක්ද ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වූයේ වෙයිද, හෙතෙමේද තථාගතයන් පැවසූ ධර්මවිනයට පැමිණ සතුන් මැරීමෙන් වැළකුණේවේ. හොරකමින් වෙන් වූයේවේ, බොරු කීමෙන් වෙන් වූයේවේ, කේලාම් කීමෙන් වෙන් වූයේවේ, පරුෂ වචනයෙන් වෙන් වූයේ වේ, හිස් වචනයෙන් වෙන් වූයේවේ, දැඩි ලොබ නැත්තේවේ, හරි දැකීම් ඇත්තේවේ, මාර්ග කුශලය සම්පූර්ණ කරන්නේ වෙයි. බමුණ, ඉදින් බමුණු කුලිකයෙක්ද, ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වේද, හෙතෙමේ ද තථාගතයන් පැවසූ ධර්මවිනයට පැමිණ, සතුන් මැරීමෙන් වෙන් වූයේවේ, හොරකමින් වෙන් වූයේවේ, බොරු කීමෙන් වෙන් වූයේවේ, කේලාම් කීමෙන් වෙන් වූයේවේ, පරුෂ වචනයෙන් වෙන්වූයේ වේ, හිස් වචනයෙන් වෙන්වූයේවේ, දැඩි ලොභ නැත්තේ වේ. හරි දැකීම් ඇත්තෙක්වේ, මාර්ග කුශලය සම්පූර්ණ කරන්නේ වෙයි."

"ඉදින් බමුණ, වෛශ්‍ය කුලිකයෙක්ද, ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදිවේද, හෙතෙමේද තථාගතයන් පැවසූ ධර්මවිනයට පැමිණ සතුන් මැරීමෙන් වෙන්වූයේවේ, හොරකමින් වෙන් වූයේවේ, බොරුකීමෙන් වෙන්වූයේවේ, කේලාම් කීමෙන් වෙන්වූයේවේ, පරුෂ වචනයෙන් වෙන් වූයේවේ, හිස් වචනයෙන් වෙන් වූයේවේ, දැඩි ලෝභ නැත්තේවේ, හරි දැකීම් ඇත්තේ වේද, ශූද්‍රකුලිකයෙක්ද ගිහිගෙන් නික්ම සස්නෙහි පැවිදි වේද, හෙතෙමේද, තථාගතයන් පැවසූධර්ම විනයට පැමිණ, සතුන් මැරීමෙන් වෙන් වූයේ වේ, නුදුන් දෙය ගැන්මෙන් වැළකුණේ වේ, ස්ත්‍රී සේවනයෙන් වැළකුණේ වේ, බොරු කීමෙන් වැළකුණේද, කේලාම් කීමෙන් වැළකුණේවේ. රළු වචනයෙන් වැළකුණේ වේ, හිස් වචන දෙසීමෙන් වැළකුණේ වේ, දැඩි ලෝභයෙන් වෙන් වූයේ වෙයි. බැඳගත් වයිර නැත්තේ වේ. හරි දැකීම, ඇත්තේ වේ, මාර්ග කුසලය සම්පූර්ණ කරන්නේ වෙයි."

**19.** "මෙසේ කී කල්හි එසුකාරී බ්‍රාහ්මණයා භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත, භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත භවත් ගෞතමයන් වහන්ස, යම් සේ යටිකුරු කරන ලද්දක් හෝ උඩුකුරු කරන්නේද, වසා තබන ලද්දක් හෝ වැසුම් හරින්නේද, මං මුලාවූවෙකුට මග හෝ කියන්නේද, ඇස් ඇත්තෝ රූප දකිත්වායි අන්ධකාරයෙහි තෙල් පහනක් හෝ දරන්නේද, එපරිද්දෙන්ම භවත් ගෞතමයන් වහන්සේ නොයෙක් ආකාරයෙන් ධර්මය දේශනා කරන ලද්දේය. ඒ මම භවත් ගෞතමයන් වහන්සේද, ධර්මයද භික්ෂු සංඝයාද සරණ කොට යමි.

"අද පටන් දිවිහිම්ව සරණගිය උපාසකයකුසේ භවත් ගෞතමයන් වහන්සේ මා දරණසේක්වා."

**සවැනිවූ එසුකාරී සූත්‍රය නිමි (5-6)**

---

## 47. ධානඤ්ජානි සූත්‍රය.

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර කලන්දක නිවාපයෙහිවූ "වෙළුවන" නම් විහාරයෙහි වාසය කරන සේක. එසමයෙහි වනාහි ආයුෂ්මත් සාරිපුත්ත ස්ථවිරයන් වහන්සේ මහත් භික්ෂු සංඝයා සමග දක්ෂිණ ගිරි ජනපදයෙහි චාරිකාවේ හැසිරෙන සේක.

එකල්හි එක්තරා භික්ෂුවක් රජගහ නුවර වස් වැස නිමවූයේ, දක්ෂිණ ගිරිය යම් තැනෙකද, ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියේය. පැමිණ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් සමග සතුටුවිය. සතුටු වියයුතුවූත්, සිහි කටයුතුවූත්, කථාව කොට නිමවා එක් පැත්තක හුන්නේය. එක් පැත්තක උන්නාවූ ඒ භික්ෂුවට ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙසේ වදාළහ. ඇවැත්නි, කිමෙක්ද? භාග්‍යවතුන් වහන්සේ නිරෝගිද බලවත්ද?" "ඇවැත්නි, භාග්‍යවතුන් වහන්සේ නිරෝගිය. බලවත්ය." "ඇවැත්නි, කිමෙක්ද? භික්ෂු සංඝයා නිරෝගිද? බලවත්ද?" "ඇවැත්නි, භික්ෂු සංඝයා නිරෝගිය. බලවත්ය."

2. "ඇවැත්නි, මෙහි තණ්ඩුලපාල ද්වාර නම් ගම් දොර ධානඤ්ජානීනම් බමුණෙක් ඇත." "ඇවැත්නි, කිමෙක්ද? ධානඤ්ජානි බ්‍රාහ්මණයා නිරෝගිද? බලවත්ද?" "ඇවැත්නි, ධානඤ්ජානි බ්‍රාහ්මණ තෙමේද නිරෝගිය. බලවත්ය." "ඇවැත්නි, කිමෙක්ද ධානඤ්ජානි බ්‍රාහ්මණ තෙම අප්‍රමාද වූයේ වේද?" "ඇවැත්නි, කෙසේ නම් ධානඤ්ජානි බමුණා අප්‍රමාද වන්නේද? ඇවැත්නි, ධානඤ්ජානි බ්‍රාහ්මණයා රජුන් ඇසුරු කොට බ්‍රාහ්මණ ගෘහපතියන්ගේ වස්තුව පැහැරගනී. බ්‍රාහ්මණ ගෘහපතියන් ඇසුරුකොට රජුන් සතු වස්තුව පැහැර ගනී. ඔහුගේ ශ්‍රද්ධාවත් ශ්‍රද්ධා ඇති කුලයෙන් ගෙනා යම් භාර්යාවක් දෑ ඔහුගේ ඒ භාර්යාවද කළුරිය කළාය. ඔහුට ශ්‍රද්ධාව නැති අන්‍යවූ භාර්යාවක් අශ්‍රද්ධාවත් කුලයකින් ගෙනෙන ලද්දීය." "ඇවැත්නි, එකාන්තයෙන් නපුරු ඇසීමක් ඇසීමු. ඇවැත්නි, එකාන්තයෙන් නපුරු ඇසීමක් ඇසීමු. අපි ප්‍රමාදවූ ධානඤ්ජානි බමුණා ගැන යමක් ඇසීමුද, ඒ අපි කිසිවිටෙක ධානඤ්ජානි බමුණා සමග

එක් වන්නෙමු නම් හොඳය. කිසියම් කථා සල්ලාපයක් වන්නේ නම් හොඳය." ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ කීහ.

3. ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ දක්ෂිණාගිරි ජනපදයෙහි කැමැතිතාක් කල් වාසය කොට රජගහනුවර යම් තැනෙක්හිද, එතැන්හි චාරිකාවෙහි වැඩි සේක. පිළිවෙලින් චාරිකාවෙහි හැසිරෙන්නේ, රජගහනුවර යම් තැනෙක්හිද එහි පැමිණියේය. එහි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ රජගහ නුවර කලන්දක නිවාපයෙහි වෙළුවන නම්වූ විහාරයෙහි වාසය කරති. එකල්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ පෙරවරු හැඳ පොරවා පාත්‍ර සිවුරු ගෙන රජගහ නුවර පිඬු පිණිස වැඩියහ.

එසමයෙහි වනාහි ධානඤ්ජානි බ්‍රාහ්මණයා නගරයෙන් පිට ගවගාලෙහි දෙනුන්ගෙන් කිරි දොවයි.

4. ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ රජගහ නුවර පිඬු පිණිස හැසිර සවස් කාලයෙහි පිණ්ඩපාතයෙන් වැලකුණේ ධානඤ්ජානි බ්‍රාහ්මණයා යම් තැනෙකද එතැනට පැමිණියහ. ධානඤ්ජානි බමුණා එන්නාවූ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ දුරදීම දුටුවේය. දැක, ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම් තැනෙකද, එතැනට ගියේය. ගොස් ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මෙසේ කීය.

"භවත් ශාරිපුත්‍රයන් වහන්ස, බත් අනුභව කිරීමට කාලය එනතුරු මෙයින් කිරි බොනසේක්වා" 'බමුණ, කම් නැත. මා විසින් අද බත් අනුභව කරන ලදී. අසුවල් ගස මුල මාගේ දවල් වාසය කිරීම වන්නේය. එහි එන්නෙහියයි" කීහ. "එසේය. පින්වතුන් වහන්සැයි" ධානඤ්ජානි බමුණා ආයුෂ්මත් සාරිපුත්ත තෙරුන්ට උත්තර දුන්නේය.

5. ඉක්බිති ධානඤ්ජානි බ්‍රාහ්මණයා උදේ ආහාර ගැනීම නිමවා ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම් තැනෙකද එතැනට ගියේය. පැමිණ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සමග සතුටුවිය. සතුටුවිය යුතුවූත් සිහිකටයුතුවූත් කථාව කොට නිමවා එක් පැත්තක උන්නේය. එක් පැත්තක උන්නාවූ

ධානඤ්ජානි බ්‍රාහ්මණයාට ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ මෙසේ කීහ. "ධානඤ්ජානිය, කිමෙක්ද, අප්‍රමාද වූයේ වෙහිද?" "භවත් ශාරිපුත්‍රයන්වහන්ස, කෙසේ අපගේ අප්‍රමාදයක් වේද? අප විසින් අපගේ මවුපියන් පොෂ්‍ය කළයුතුය. අඹුදරුවන් පොෂ්‍ය කළයුතුය. දාසි දාස කම්කරුවන් පොෂ්‍ය කළයුතුය. අසල්වැසියන්ගේ අසල්වැසි කටයුතු කළයුතුය. නෑදෑයන්ගේ නෑදෑ කටයුතු කළයුතුය. ආගන්තුකයන්ගේ ආගන්තුක කටයුතු කළයුතුය. මියගියවුන්ගේ මියගියවුන් පිළිබඳ කටයුතු කළයුතුය. දෙවියන්ගේ දෙවියන් පිළිබඳ කටයුතු කළයුතුය. රජුන්ගේ රාජකාරි කළයුතුය. මේ කයද පිනවිය යුතුය. වර්ධනය කළ යුතුයයි" කීහ.

**6.** "ධානඤ්ජානිය, කුමක් සිතන්නෙහිද? මේ ලොකයෙහි එක් පුද්ගලයෙක් මව් පියන් නිසා විසම අධර්ම හැසිරීම් ඇත්තේ විසම හැසිරීම් ඇත්තේ වන්නේද, ඒ පුද්ගලයා අධර්ම හැසිරීම විසම හැසිරීම හේතුවෙන් නරකයට නිරයපාලයෝ අදින්නාහුය. 'මම වනාහි මව් පියන් නිසා අධර්මචාරී විසමචාරී වූයෙමි. මා නරකයට නිරයපාලයෝ නොඅදිත්වායයි වළක්වා ගැනීමට ඔහු හෝ සමර්ථ වේද, මව් පියෝ හෝ මොහු අප නිසා අධර්ම හැසිරීම විසම හැසිරීම ඇත්තෙක් වීයයි, නිරය පාලයෝ නිරයට නොඅදිත්වායි වළක්වා ගැනීමට සමර්ථ වෙත්ද?" "භවත් ශරිපුත්‍රය, මෙය නොවේ. එකල්හි ඔහු හඬද්දීම නිරය පාලයෝ නිරයෙහි ඇද දමන්නාහුය."

"ධානඤ්ජානිය, කුමක් සිතන්නෙහිද? මේ ලොකයෙහි එක් පුද්ගලයෙක් අඹු දරුවන් නිසා අධර්ම හැසිරීම ඇත්තේ විසම හැසිරීම ඇත්තේ වන්නේද, ඒ පුද්ගලයා අධර්ම චරියා විසමචරියා හෙතුවෙන් නිරයට නිරයපල්ලෝ අදින්නාහුය. 'මම වනාහි අඹු දරුවන් නිසා අධර්ම චර්යා විසම චර්යා ඇත්තේ වූයෙමි. මා නරකයට නිරයපල්ලෝ නො අදිත්වායයි වළක්වා ගැන්මට සමර්ථ වේද, මේ තෙමේ අප නිසා අධර්මචාරී විසමචාරී විය. ඔහු නිරයපල්ලෝ නිරයට නො අදිත්වායි' ඔහුගේ අඹුදරුවෝ හෝ වළක්වා ගැනීමට සමර්ථ වෙද්ද?" "භවත් ශරිපුත්‍රයන් වහන්ස, නොහැකිය. එකල්හිම ඔහු අඬද්දීම නිරය පල්ලෝ නිරයෙහි ඇද දමන්නාහුය."

7. "ධානඤ්ජානිය, කුමක් සිතන්නෙහිද? මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් දැසි කම්කරු පුරුෂයන් නිසා අධර්මචාරී විසමචාරී වන්නේය. ඒ පුද්ගලයා අධර්ම චරියා විසම චාරියා හේතුවෙන් නිරයපාලයෝ නිරයට අදින්නාහුය. 'මම වනාහි දැසි දස් කම්කරු පුරුෂයන් නිසා අධර්මචාරී විසමචාරී වූයෙමි. නිරයපල්ලෝ මා නිරයට නොඅදිත්වායි, වළක්වා ගැනීමට ඔහු හෝ සමර්ථ වේද?" මේ තෙමේ අප නිසා අධර්මචාරී විසමචාරී විය. ඔහු නිරයපල්ලෝ නිරයට නොඅදිත්වායි, වළක්වා ගැනීමට දැසි දස් කම්කරුවෝ හෝ සමර්ථ වෙත්ද?" "භවත් ශරිපුත්‍රයන් වහන්ස, එසේ නොහැකිය ඉක්බිති නිරය පල්ලෝ ඔහු අඬද්දීම නිරයෙහි ඇද දමන්නාහුය."

8. ධානඤ්ජානිය, කුමක් සිතන්නෙහිද? මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් අසල්වැසියන් නිසා අධර්ම හැසිරීම් ඒ සමහැසිරීම් ඇත්තේ වන්නේද, ඒ පුද්ගලයා අධර්මචාරී විසමචාරී හේතුවෙන් නිරයපල්ලෝ නිරයට අදින්නාහුය. මම වනාහි අසල්වැසියන් නිසා අධර්මචාරී විසමචාරී වූයෙමි. මා නිරයෙහි නිරයපල්ලෝ නිරයට නොඅදිත්වායි, ඔහු හෝ සමර්ථ වේද, 'මේ තෙමේ අප නිසා අධර්මචාරී විසමචාරී විය. ඔහු නිරය පල්ලෝ නිරයට නොඅදිත්වායි, වළක්වාගන්ට ඔහුගේ අසල් වැසියෝ හෝ සමර්ථ වෙද්ද?' "භවත් ශාරිපුත්‍රය, එසේ නොහැකිය. ඉක්බිති නිරයපල්ලෝ ඔහු අඬද්දීම නිරයෙහි ඇද දමන්නාහුය."

9. "ධානඤ්ජානිය, කුමක් සිතන්නෙහිද? මේ ලොකයෙහි එක් පුද්ගලයෙක් නෑසහලේ නෑයන් නිසා අධර්මචරී විසමචාරී වන්නේද? ඒ පුද්ගලයා අධර්මචාරී විසමචාරී හේතුවෙන් නිරයපල්ලෝ නිරයට අදින්නාහුය. 'මම වනාහි නෑසහලේ නෑයන් නිසා අධර්මචාරී විසමචාරී වූයෙමි. නිරය පාලයෝ මා නිරයට නොඅදිත්වායි' වළක්වා ගන්ට ඔහු හෝ සමර්ථ වේද?" මේ තෙමේ අප නිසා අධර්මචාරී විසමචාරී විය. ඔහු නිරයපල්ලෝ නිරයට නොඅදිත්වායි, වළක්වා ගන්ට ඔහුගේ නෑසහලේ නෑයෝ හෝ සමර්ථ වෙද්ද?" භවත් ශරිපුත්‍රය, එසේ නොහැකිය. ඉක්බිති නිරයපල්ලෝ ඔහු අඬද්දීම නිරයෙහි ඇද දමන්නාහුය."

10. "ධානඤ්ජානිය, කුමක් හිතන්නහුද? මේ ලොකයෙහි එක් පුද්ගලයෙක් ආගන්තුකයන් නිසා අධර්මචාරී විසමචාරී වන්නේද, ඒ පුද්ගලයා අධර්මචාරී විසමචාරී හේතුවෙන් නිරයපල්ලෝ නිරයට අදින්නාහුය. 'මම වනාහි ආගන්තුකයන් නිසා අධර්මචාරී විසමචාරී වූයෙමි. මා නිරයෙහි නිරයපල්ලෝ නොඅදිත්වායි වළක්වා ගන්ට ඔහු හෝ සමර්ථ වේද 'මේ තෙමේ අප නිසා අධර්මචාරී විසමචාරී විය. ඔහු නිරයපල්ලෝ, නිරයට නොඅදිත්වායි' ඔහුගේ ආගන්තුකයෝ හෝ සමර්ථ වෙද්ද භවත් ශරිපුත්‍රය, එසේ නොහැකිය. ඉක්බිති නිරයපල්ලෝ ඔහු අඬද්දීම නිරයෙහි ඇද දමන්නාහුය."

11. "ධානඤ්ජානිය, කුමක් සිතන්නෙහිද? මේ ලෝකයෙහි එක් පුද්ගලයෙක් මළගියවුන් නිසා අධර්මචාරී විසමචාරී වන්නේද, ඒ පුද්ගලයා අධර්මචාරී විෂමචාරී හේතුවෙන් නිරය පල්ලෝ නිරයට අදින්නාහුය. 'මම වනාහි මළගියවුන් නිසා අධර්මචාරී විෂමචාරී වූයෙමි. මා නිරයට නොඅදිත්වා' නිරය පල්ලෝ නොයයි වළක්වා ගැනීමට ඔහු හෝ සමර්ථ වේද? 'මේ තෙමේ අප නිසා අධර්මචාරී විෂමචාරී විය. ඔහු නිරයපල්ලෝ නිරයට නොඅදිත්වායි' වළක්වා ගැනීමට ඔහුගේ මළගිය අය හෝ සමර්ථ වෙත්ද?" "ශරිපුත්‍රයන් වහන්ස, එසේ නොහැකිය. ඉක්බිති නිරයපල්ලෝ ඔහු අඬද්දීම නිරයට ඇද දමන්නාහුය"

12. "ධානඤ්ජානිය, කුමක් (සිතන්නෙහිද?) මේ ලෝකයෙහි එක් පුද්ගලයෙක් දෙවියන් නිසා අධර්මචාරී, විෂමචාරී වන්නේද, ඒ පුද්ගලයා අධර්මචාරී විෂමචාරී හේතුවෙන් නිරයපල්ලෝ නිරයට අදින්නාහුය. 'මම වනාහි දෙවියන් නිසා අධර්මචාරී විෂමචාරි වීමි. මා නිරයපල්ලෝ නොඅදිත්වායි' වළක්වා ගැනීමට ඔහු හෝ සමර්ථවේද? 'මේ තෙමේ අප නිසා අධර්මචාරී විෂමචාරීවිය. ඔහු නිරයපල්ලෝ නිරයට නොඅදිත්වායි වළක්වාගැන්මට ඔහුගේ දෙවියන් හෝ සමර්ථවෙත්ද?" භවත් ශාරිපුත්‍රයන් වහන්ස, එසේ නොහැකිය. ඉක්බිති නිරයපල්ලෝ ඔහු අඬද්දීම නිරයට ඇද දමන්නාහුය".

13. "ධානඤ්ජානිය, (ඔබ) මේ ගැන කෙසේ සිතන්නෙහිද? රජු නිසා එක් පුද්ගලයෙක් අධර්මචාරී විෂමචාරී වන්නේද, ඒ පුද්ගලයා අධර්මචාරී විෂමචාරී හේතුවෙන් නිරයපල්ලෝ නිරයට අදින්නාහුය. 'මම වනාහි රජු නිසා අධර්මචාරී විෂමචාරී වීමි. මා නිරයෙහි නිරයපල්ලෝ නො අදින්නහු යයි' (කී කල්හි) ඒ පුද්ගලයා අදිනු ලබයිද?" 'මේ තෙමේ අප නිසා අධර්මචාරී විෂමචාරී විය. ඔහු නිරයපල්ලෝ නිරයට නොඅදින්නහු යයි' (කී කල්හි) වලක්වා ගැන්මට ඔහුගේ රජු හෝ සමර්ථ වෙත්ද"? "භවත් ශාරිපුත්‍රයන් වහන්ස, මෙය නොවේ. ඉක්බිති නිරයපල්ලෝ ඔහු අඬද්දීම නිරයට ඇද දමන්නාහුය.

14. "ධානඤ්ජානිය, (ඔබ) මේ ගැන කෙසේ සිතන්නෙහිද? මේ ලෝකයෙහි එක් පුද්ගලයෙක් ශරීරය පිනවීම් හා වැඩීම් හේතුවෙන් අධර්මචාරී විෂමචාරී වන්නේද, ඒ පුද්ගලයා අධර්ම චරියා විෂම චරියා හේතුවෙන් නිරය පල්ලෝ නිරයට අදින්නාහුය. 'මම වනාහි කය පිනවීම හා වැඩීමේ හේතුවෙන් අධර්මචාරී වීමි. මා නිරයෙහි නිරය පල්ලෝ නොඅදින්නාහුයයි' (කී කල්හි) ඒ පුද්ගලයා අදිනු ලබයිද? 'මේ තෙමේ කයපිණාවීම, වැඩීම නිසා අධර්මචාරී විෂමචාරී විය. ඔහු නිරයට නිරය පල්ලෝ නොඅදින්නාහුයයි (කී කල්හි) අන්‍යයෝ හෝ වළක්වා ගැනීමට සමත් වෙත්ද"? "භවත් ශාරිපුත්‍රය, මේ නොවේ. ඉක්බිති ඔහු අඬද්දීම නිරය පල්ලෝ නිරයෙහි ඇද දමන්නාහුය".

15. "ධානඤ්ජානිය, කුමක් සිතන්නෙහිද? මේ ලොකයෙහි එක් පුද්ගලයෙක් මව් පියන් නිසා විෂම හැසිරීම් ඇත්තේ විසම හැසිරීම් නැත්තේ වන්නේද, ඒ පුද්ගලයා අධර්ම විසම හැසිරීම හේතුවෙන් නරකයට නිරය පාලයෝ අදින්නාහුය. මම වනාහි මව් පියන් නිසා අධර්මචාරී විෂමචාරී වූයෙමි. මා නරකයට නිරයපාලයෝ නොඅදිත්වායයි' වළක්වා ගැනීමට ඔහු හෝ සමර්ථ වේද, මව් පියෝ හෝ මොහු අප නිසා අධර්ම හැසිරීම විසම හැසිරීම ඇත්තෙක් වීයයි නිරය පාලයෝ නිරයට නොඅදිත්වායි වළක්වා ගැනීමට සමර්ථ වෙත්?" භවත් ශාරිපුත්‍රය, මෙය නොවේ. එකල්හි නිරය පාලයෝ නිරයෙහි ඇද දමන්නාහුය."

16. "ධානඤ්ජානිය, කුමක් සිතන්නෙහිද? මේ ලොකයෙහි එක් පුද්ගලයෙක් අඹු දරුවන් නිසා අධර්ම හැසිරීම් ඇත්තේ විසම හැසිරීම් නැත්තේ වන්නේද? ඒ පුද්ගලයා අධර්ම චරියා විසමචරියා හේතුවෙන් නිරයට නිරයපල්ලෝ අදින්නාහුය. 'මම වනාහි අඹු දරුවන් නිසා අධර්මචර්යා විසම චර්යා ඇත්තේ වූයෙමි. මා නරකයට නිරය පල්ලෝ නොඅදිත්වායි' වළක්වාගන්ට සමර්ථවේද? මේ තෙමේ අප නිසා අධර්මචාරී විසමචාරී විය. ඔහු නිරය පල්ලෝ නිරයට නො අදිත්වායි ඔහුගේ අඹු දරුවෝ හෝ වළක්වා ගැනීමට සමර්ථ වෙද්ද?" 'භවත් ශාරිපුත්‍රයන් වහන්ස නොහැකිය. එකල්හිම ඔහු අඬද්දීම නිරයෙහි වළක්වා ගැනීමට සමර්ථ වෙද්ද? භවත් ශාරිපුත්‍රයන් වහන්ස, නොහැකිය. ඇද දමන්නාහුය".

17. "ධානඤ්ජානීය කුමක් සිතන්නෙහිද? මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් දැසි කම්කරු පුරුෂයන් නිසා අධර්මචාරී විෂමචාරී වන්නේය. ඒ පුද්ගලයා අධර්මචරියා විෂම චරියා හේතුවෙන් නිරයපාලයෝ නිරයට අදින්නාහුය. 'මම වනාහි දැසි දස් කම්කරු පුරුෂයන් නිසා අධර්මචාරී විසමචාරී වූයෙමි. නිරයපල්ලෝ මා නිරයට නොඅදිත්වායි' වලක්වා ගැනීමට ඔහු හෝ සමර්ථවේද? 'මේ තෙමේ අප නිසා අධර්මචාරී විෂමචාරී විය. ඔහු නිරයපල්ලෝ නිරයට නොඅදිත්වායි' වළක්වා ගැනීමට දැසිදස් කම්කරුවෝ හෝ සමර්ථවෙත්ද?" (මොවුනතුරෙන්) කවරෙක් උතුම්ද?" "භවත් ශාරිපුත්‍රයන් වහන්ස, දැසි දස් කම්කරුවන් නිසා යමෙක් අධර්මචාරී විෂමචාරී වන්නේද, ඔහු උතුම් නොවන්නේය. භවත් ශාරිපුත්‍රයන් වහන්ස, යමෙක් දැසිදස් කම්කරුවන් නිසා ධර්මචාරී සමචාරී වන්නේද, ඔහුම මෙහි උතුම්ය. භවත් ශාරිපුත්‍රයන් වහන්ස අධර්මචර්යා විෂමචර්යා දෙකින් ධර්මචරියා සමචරියාව දෙකම උතුම්ය."

18. "ධානඤ්ජානිය, යම් කර්මාන්තයකින් දැසි දස් කම්කරුවන් පොෂණය කිරීමටද, පව්කම් නොකිරීමටද, කුසල පිළිවෙතෙහි පිළිපැදීමටද හේතුවන අන්‍යවූ ධාර්මික කර්මාන්තයෝ ඇත්තාහ.

"ධානඤ්ජානිය කුමක් සිතන්නෙහිද? යමෙක් අසල්වැසියන් නිසා අධර්මචාරී විෂමචාරී වන්නේද යමෙක් අසල්වැසියන් නිසා ධර්මචාරී සමචාරී වන්නේද (මොවුන් අතුරෙන්) කවරෙක් උතුම්ද?" "භවත් ශාරිපුත්‍රයන් වහන්ස, අසල්වැසියන් නිසා යමෙක් අධර්මචාරී විසමචාරී වන්නේද ඔහු උතුම් නොවන්නේය. භවත් ශාරිපුත්‍රයන් වහන්ස, අසල්වැසියන් නිසා ධර්මචාරී සමචාරී වන්නේද, ඔහුම මෙහි උතුම්ය. භවත් ශාරිපුත්‍රයන් වහන්ස, අධර්මචර්යා විසමචර්යා දෙකින් ධර්මචර්යා සමචර්යා දෙකම උතුම්ය".

"ධානඤ්ජානිය, යම්කර්මාන්තයකින් අසල්වැසියන්ගේ කටයුතු කුසල පිළිවෙතෙහි පිළිපැදීම කරන්ටද, පව්කම් නොකරන්ටද, කුශල පිළිවෙතෙහි පිළිවිසීමටද හැක්කේ වේද හේතුසහිත අන්‍යවූ හේතු සහිත ධාර්මික කර්මාන්තයෝ, ඇත්තාහ.

**19.** "ධානඤ්ජානිය, කුමක් සිතන්නෙහිද? යමෙක් නෑ සහලේ නෑයන් නිසා අධර්මචාරී විෂමචාරී වන්නේද, යමෙක් නෑ සහලේ නෑයන් නිසා ධර්මචාරී සමචාරී වන්නේද, (මොවුන් අතුරෙන්) කවරෙක් උතුම්ද?" "භවත් ශාරිපුත්‍රයන් වහන්ස, නෑ සහලේ නෑයන් නිසා අධර්මචාරී විෂමචාරී වන්නේද, ඔහු උතුම් නොවේ. භවත් ශාරිපුත්‍රයන් වහන්ස, යමෙක් නෑ සහලේ නෑයන් නිසා ධර්මචාරී සමචාරී වන්නේද, ඔහුම මෙහි උතුම්ය, භවත් ශාරිපුත්‍රයන් වහන්ස, අධර්මචර්යා විෂමචර්යා දෙකින් ධර්මචර්යා සමචර්යා දෙකම උතුම්ය."

"ධානඤ්ජානිය, යම් කර්මාන්තයකින් නෑ සහලේ නෑයනට කළයුතු කටයුතු නෑ සහලේ නෑයන්ට කරන්නටද, පව්කම් නොකරන්නටද, කුසල් පිළිවෙතෙහි පිළිපදින්නටද, හැක්කේවේද (එබඳු) අන්‍යවූ සහෙතුකවූ ධාර්මික කර්මාන්තයෝ ඇත්තාහ.

**20.** "ධානඤ්ජානිය, කුමක් සිතන්නෙහිද? යමෙක් ආගන්තුකයන් නිසා අධර්මචාරී විෂමචාරී වන්නේද, යමෙක් ආගන්තුකයන් නිසා ධර්මචාරී සමචාරී වන්නේද (මොවුනතුරෙන්) කවරෙක් උතුම්ද?' "භවත් ශාරිපුත්‍රයන් වහන්ස,

යමෙක් ආගන්තුකයන් නිසා අධර්මචාරී විෂමචාරී වන්නේද, ඔහු උතුම් නොවේ. භවත් ශාරිපුත්‍රයන් වහන්ස, යමෙක් ආගන්තුකයන් නිසා ධර්මචාරී සමචාරී වන්නේද, ඔහුම මෙහි උතුම්ය, භවත් භාරිපුත්‍රයන් වහන්ස, අධර්මචර්යා, විෂමචර්යා දෙකින් ධර්මචර්යා සමචර්යා දෙකම උතුම්ය."

"ධානඤ්ජානිය, යම් කර්මාන්තයකින් ආගන්තුකයන්ට කළයුතු කටයුතු ආගන්තුකයන්ට කරන්නටද, පව්කම් නොකිරීමටද, කුසල් පිළිවෙතෙහි පිළිපදින්නටද, හැක්කේවේද (එබඳු) අන්‍යවූ සහේතුක ධාර්මික කර්මාන්තයෝ ඇත්තාහ."

**21.** "ධානඤ්ජානිය, කුමක් සිතන්නෙහිද? යමෙක් මළගියවුන් නිසා අධර්මචාරී විසමචාරී වන්නේද, යමෙක් මළගියවුන් නිසා ධර්මචාරී සමචාරී වන්නේද, මොවුනතුරෙන් කවරෙක් උතුම්ද?" "භවත් ශාරිපුත්‍රයන් වහන්ස, යමෙක් මළගියවුන් නිසා අධර්මචාරී විෂමචාරී වන්නේද, ඔහු උතුම් නොවන්නේය. භවත් ශාරිපුත්‍රයන් වහන්ස, යමෙක් මළගියවුන් නිසා ධර්මචාරී, සමචාරී වන්නේද, ඔහුම මෙහි උතුම් වන්නේය. භවත් ශාරිපුත්‍රයන් වහන්ස, අධර්මචරියා ධර්මචරියා දෙකින් ධර්මචරියා සමචරියා දෙකම උතුම්ය." "ධානඤ්ජානිය, යම් කර්මාන්තයකින් මළගියවුන්ට කළයුතු කටයුතු මළගියවුන්ට පව්කම් නොකරන්නටද කුසල් පිළිවෙතෙහි පිළිපන්නටද වේද (එබඳු) අන්‍යවූ සහේතුක ධාර්මික කර්මාන්තයෝ ඇත්තාහ.

**22.** "ධානඤ්ජානිය, කුමක් සිතන්නෙහිද? යමෙක් දෙවියන් හෙතුකොට ගෙන අධර්මචාරී විෂමචාරී වන්නේද? යමෙක් දෙවියන් නිසා ධර්මචාරී සමචාරී වන්නේද (මොවුනතුරෙන්) කවරෙක් උතුම්ද?" "භවත් ශාරිපුත්‍රයන් වහන්ස, යමෙක් දෙවියන් නිසා අධර්මචාරී විෂමචාරී වන්නේද, ඔහු උතුම් නොවන්නේය. යමෙක් දෙවියන් නිසා ධර්මචාරී විසමචාරී වන්නේද, ඔහු උතුම් වන්නේය. යමෙක් දෙවියන් නිසා ධර්මචාරී සමචාරී වන්නේද, ඔහුම මෙහි උතුම් වන්නේය. භවත් ශාරිපුත්‍රයන් වහන්ස, අධර්මචර්යා විෂමචර්යා දෙකින් ධර්මචර්යා සමචර්යා දෙකම උතුම්ය" "ධානඤ්ජානිය, යම් කර්මාන්තයකින් දෙවියන්ට කළයුතු කටයුතු දෙවියන්ට කරන්ටද, පව්කම් නොකරන්ටද,

කුසල් පිළිවෙතෙහි පිළිපදින්ටද, හැක්කේවේද (එබඳු) අන්‍යවූ සහෙතුක ධාර්මික කර්මාන්තයෝ ඇත්තාහ.

23. "ධානඤ්ජානිය, කුමක් සිතන්නෙහිද? යමෙක් රජු නිසා අධර්මචාරී විෂමචාරී වන්නේද, යමෙක් රජු නිසා ධර්මචාරී සමචාරී වන්නේද, (මොවුනතුරෙන්) කවරෙක් උතුම්ද?" "භවත් ශාරිපුත්‍රයන් වහන්ස, යමෙක් රජු නිසා අධර්මචාරී විසමචාරී වන්නේද, ඔහු උතුම් නොවන්නේය. භවත් ශාරිපුත්‍රයන් වහන්ස, යමෙක් රජු නිසා ධර්මචාරී සමචාරී වන්නේද, ඔහුම මෙහි උතුම් වන්නේය. භවත් ශාරිපුත්‍රයන් වහන්ස, අධර්මචර්යා විෂමචර්යා දෙකින් ධර්මචර්යා සමචර්යා දෙකම උතුම්ය". "ධානඤ්ජානිය, යම් කර්මාන්තයකින් රජුට කළ යුතු කටයුතු රජුට කරන්නටද, පව්කම් නොකරන්නටද කුසල් පිළිවෙතෙහි පිළිපදින්නටද හැක්කේ වේද, එබඳුවූ හෙතු සහිත ධාර්මික අන්‍ය කටයුතු ඇත්තාහ.

24. "ධානඤ්ජානිය, කුමක් සිතන්නෙහිද? යමෙක් තමාගේ කය පිනවීම සහ වැඩීම නිසා අධර්මචාරී විෂමචාරී වන්නේද, (මොවුනතුරෙන්) කවරෙක් උතුම්ද?"

"භවත් ශාරිපුත්‍රයන් වහන්ස, යමෙක් කය පිණවීම හා වැඩීම නිසා අධර්මචාරී විෂමචාරී වන්නේද, ඔහු උතුම් නොවන්නේය. භවත් ශාරිපුත්‍රයන් වහන්ස, යමෙක් කය පිණවීම හා වැඩීම නිසා ධර්මචාරී සමචාරීවන්නේද, ඔහුම මෙහි උතුම්ය". "භවත් ශාරිපුත්‍රයන් වහන්ස, යම් කර්මාන්තයකින් කය පිණවීම හා වැඩීමටද, පව්කම් නොකිරීමටද, කුසල් පිළිවෙතෙහි පිළිපැදීමටද, හැක්කේද (එබඳු) අන්‍යවූ සහෙතුක ධාර්මික කර්මාන්තයෝ ඇත්තාහ."

25. ඉක්බිති ධානඤ්ජානි බ්‍රාහ්මණයා ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන්ගේ කථාවට සතුටුව, අනුමෝදන්ව, හුනස්නෙන් නැගිට ගියේය. අනතුරුව පසු කාලයෙක්හි ධානඤ්ජානි බමුණා රොගීව දුකට පැමිණියේ දැඩි ගිලන් ඇත්තෙක් විය. එකල්හි ධානඤ්ජානි බමුණා එක් පුරුෂයෙකුට කථා කළේය. "එම්බා පුරුෂය නුඹ මෙහි එව. භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද,

එහි යව. ගොස් 'ස්වාමීනි, ධානඤ්ජානි බමුණා ආබාධ ඇතිව, දුකට පත්ව, දැඩි ගිලන්ව සිටී. හෙතෙම භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් සිරසින් වඳීයයි (කියා) මාගේ වචනයෙන් භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් සිරසින් වඳුව.

"ආයුෂ්මත් සැරියුත් තෙරුන් යම් තැනෙකද, එහි යව ගොස් 'ස්වාමීනි, ධානඤ්ජානි බමුණා රෝගීව දුකට පත්ව දැඩි ගිලන්ව සිටී. හෙතෙම ආයුෂ්මත් සැරියුත් තෙරුන් වහන්සේගේ පාදයන් සිරසින් වඳියයි' මාගේ වචනයෙන් වඳුව. වැඳ මෙසේද කියව 'ස්වාමීනි, ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ ධානඤ්ජානි බමුණන්ගේ ගෙදර යම් තැනෙකද, එතැනට අනුකම්පාකොට පැමිණෙන සේක්නම්, හොඳය (කියායි)"

"ඒ පුරුෂයා, එසේය ස්වාමීනි"යි ධානඤ්ජානි බමුණාට පිළිතුරුදී භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට ගියේය. ගොස් භාග්‍යවතුන් වහන්සේ වැඳ එක් පැත්තක උන්නේය. එක් පැත්තක හුන්නාවූ ඒ පුරුෂයා භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "ස්වාමීනි, ධානඤ්ජානි බමුණා රෝගීව දුකට පත්ව දැඩි ගිලන්ව සිටී. හෙතෙම භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් සිරසින් වැඳීයයි." (කියායි) ආයුෂ්මත් සැරියුත් තෙරුන් යම් තැනෙකද එහි ගියේය. ගොස් ආයුෂ්මත් සැරියුත් තෙරුන් වැඳ එක් පැත්තක හුන්නේය. එක් පැත්තක හුන් ඒ පුරුෂයා ආයුෂ්මත් සැරියුත් තෙරුනට මෙසේ කීය. 'ස්වාමීනි, ධානඤ්ජානි බමුණා රොගීව දුකට පත්ව දැඩි ගිලන්ව සිටී. හෙතෙම ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගේ පාදයන් සිරසින් වඳී (ඔහු) මෙසේද කියයි. 'ආයුෂ්මත් සැරියුත් තෙරුන් වහන්සේ ධානඤ්ජානි බමුණාගේ ගෙදර යම් තැනෙකද එහි අනුකම්පා කොට එළඹෙන සේක්නම් හොඳය" (කියායි)

**26.** ආයුෂ්මත් සැරියුත් තෙරුණුවෝ නිශ්ශබ්ද වීමෙන් ඉවසූහ. අනතුරුව ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ හැඳපොරවා පාත්‍ර සිවුරු ගෙන ධානඤ්ජානි බමුණාගේ ගෙදර යම් තැනෙකද, එතැනට වැඩිසේක. වැඩ පැනවූ ආසනයෙහි උන්හ. වැඩහිඳ ආයුෂ්මත් ශාරිපුත්‍රයන් වහන්සේ ධානඤ්ජානි බමුණාට මෙසේ කීහ. "ධානඤ්ජානිය, කිමෙක්ද? තොප විසින්

ඉවසිය හැකිද? කිමෙක්ද යැපිය හැකිද? දුක් වේදනාවෝ අඩු වෙත්ද, නොවැඩෙත්ද, අඩුවීමක් පෙනේද? නොවැඩීමක් පෙනේද?"

"භවත් ශාරිපුත්‍රයන් වහන්ස, මා විසින් ඉවසිය නොහැක. යැපිය නොහැක. මගේ දැඩි දුක් වෙදනාවෝ වැඩෙත්. අඩු නොවෙත්. වැඩීමක් මිස අඩුවීමක් නොපෙනේ. භවත් ශාරිපුත්‍රයන් වහන්ස, යම්සේ බලවත් පුරුෂයෙක් තියුණු හුලකින් මුදුනට ගසන්නේද, එපරිද්දෙන්ම භවත් ශාරිපුත්‍රයන්වහන්ස, මාගේ නපුරු වාතයෝ හිස් මුදුනට අනිත්. භවත් ශාරිපුත්‍රයන් වහන්ස, මට ඉවසිය හැකි නොවේ. යැපිය හැකි නොවේ. දැඩි දුක් වේදනාවෝ මට වැඩෙත්. පහව නොයත්. වැඩීමක් මිස අඩුවීමක් නොපෙනේ.

"භවත් ශාරිපුත්‍රයන් වහන්ස, බලවත් පුරිසයෙක් දැඩිවූ හම් පටකින් හිසෙහි හිස් වෙළුමක් බඳින්නේද, මෙපරිද්දෙන්ම ශාරිපුත්‍රයන්වහන්ස, හිසෙහි නපුරු හිස් වේදනාවක් වෙයි. භවත් ශාරිපුත්‍රයන් වහන්ස, ඉවසිය නොහැක යැපිය නොහැක. මගේ දැඩි දුක් වේදනාවෝ වැඩෙත්. අඩුනොවෙත් වැඩීම මිස අඩුවීමක් නොපෙනේ.

"භවත් ශාරිපුත්‍රයන්වහන්ස, යම්සේ දක්ෂ ගෝඝාතකයෙක් හෝ ඔහුගේ අතවැසියෙක් හෝ තියුණුවූ ගෙරිමස් කපන කැත්තෙන් බඩ කපන්නේද, එපරිද්දෙන්ම භවත් ශාරිපුත්‍රයන්වහන්ස, දරුණු වාතයෝ කුස කපත්. භවත් ශාරිපුත්‍රයන්වහන්ස, ඉවසිය නොහැක. යැපිය නොහැක. මගේ දැඩි දුක් වේදනාවෝ වැඩෙත්. වැඩීම මිස අඩු වීමක් නොපෙනේ.

"භවත් ශරිපුත්‍රයන්වහන්ස, යම්සේ බලවත් පුරුෂයෝ දෙදෙනෙක් දුර්වල පුරුෂයකු අත්වලින් අල්ලාගෙන අඟුරු වළෙහි තවන්නාහුද, නැවත තවන්නාහුද, එපරිද්දෙන්ම භවත් ශාරිපුත්‍රයන් වහන්ස, මාගේ ශරීරයෙහි දැවීම අධිකය. භවත් ශාරිපුත්‍රයන්වහන්ස, මට ඉවසිය නොහැක. යැපිය නොහැක. මගේ දැඩි දුක් වේදනාවෝ වැඩෙත්. අඩු නොවෙත්. වැඩීම මිස අඩුවීමක් නොපෙනේ."

27. "ධානඤ්ජානිය, කුමක් සිතන්නෙහිද? නිරය, තිරිසන් යොනිය (යන දෙකින්) කවරක් උතුම්ද? "භවත් ශාරිපුත්‍රයන් වහන්ස, නිරයට වඩා තිරිසන්යොනිය උතුම්ය." ධානඤ්ජානිය, කුමක් සිතන්නෙහිද? තිරිසන් යොනිය ප්‍රෙතවිෂය (යන දෙකින්) කවරක් උතුම්ද?" "භවත් ශාරිපුත්‍රයන් වහන්ස, තිරිසන්යොනියට වඩා ප්‍රෙතවිෂය උතුම්ය." "ධානඤ්ජානිය, කුමක් සිතන්නෙහිද? ප්‍රෙත විෂය, මනුෂ්‍යලොකය (යන දෙකින්) කවරක් උතුම්ද?" "භවත් ශාරිපුත්‍රයන්වහන්ස, ප්‍රෙත විෂයට වඩා මනුෂ්‍ය ලොකය උතුම්ය.

28. "ධානඤ්ජානිය, කුමක් සිතන්නෙහිද? මනුෂ්‍ය ලොකය හා චාතුර්මහාරාජික දෙවියන් (යන දෙකින්) කවරක් උතුම්ද?" "භවත් ශාරිපුත්‍රයන් වහන්ස, මනුෂ්‍යයන්ට වඩා චාතුර්මහාරාජික දෙවියෝ උතුම් වෙති." "ධානඤ්ජානිය, කුමක් සිතන්නෙහිද? චාතුර්මහාරාජික දෙවියන් තව්තිසා දෙවියන් (යන දෙකොටසින්) කවරක් උතුම්ද?" "භවත් ශාරිපුත්‍රයන් වහන්ස, චාතුර්මහාරාජික දෙවියන්ට වඩා තාවතිංස දෙවියෝ උතුම් වෙත්."

"ධානඤ්ජානිය, කුමක් සිතන්නෙහිද? තාවතිංස දෙවියන් යාමදෙවියන් (යන දෙකොටසින්) කවරක් උතුම්ද?" "භවත් ශාරිපුත්‍රයන් වහන්ස, තාවතිංස දෙවියන්ට වඩා යාමදෙවියෝ උතුම්වෙත්".

28. "ධානඤ්ජානිය, කුමක් සිතන්නෙහිද? යාමදෙවියන් තුසිත දෙවියන් (යන දෙකොටසින්) කවරක් උතුම්ද?" "භවත් ශාරිපුත්‍රයන් වහන්ස, යාමදෙවියන්ට වඩා තුසිත දෙවියෝ උතුම් වෙත්." "ධානඤ්ජානිය, කුමක් සිතන්නෙහිද? තුසිත දෙවියන් නිම්මාණරතී දෙවියන් (යන දෙකොටසින්) කවරක් උතුම්ද?" "භවත් ශාරිපුත්‍රයන් වහන්ස, තුසිත දෙවියන්ට වඩා නිම්මාණරතී, දෙවියෝ උතුම්හ". "ධානඤ්ජානිය, කුමක් සිතන්නෙහිද? නිම්මාණරති දෙවියන් පරනිම්මිතවසවර්ති දෙවියන් (යන දෙකොටසින්) කවරෙක් උතුම්ද?" "භවත් ශාරිපුත්‍රයන් වහන්ස, නිම්මාණරතී දෙවියන්ට වඩා පරනිම්මිතවසවර්ති දෙවියෝ උතුම්හ". "ධානඤ්ජානිය, කුමක් සිතන්නෙහිද?

පරනිම්මිතවසවර්තියද, බ්‍රහ්මලොකද (යන දෙකින්) කවරක් උතුම්ද?" "භවත් ශාරිපුත්‍රයන් වහන්සේ බ්‍රහ්මලොක යයිකියයිද, භවත් ශාරිපුත්‍රයන් වහන්සේ බ්‍රහ්මලොකයි කියයිදැයි" කීය.

**29.** ඉක්බිති ආයුෂ්මත් සැරියුත් තෙරුන්ට මෙබඳු සිතෙක් විය. 'මේ බමුණෝ බ්‍රහ්මලොකයෙහි ඇලුනෝය. ධානඤ්ජානි බමුණාට බ්‍රහ්මයන් හා එක්වීමට පැමිණෙන මාර්ගය මම දෙසන්නෙම් නම් හෙයෙකි. (කියාය), "ධානඤ්ජානිය, නුඹට බ්‍රහ්මයන් හා එක්වීමට පැමිණෙන මාර්ගය දෙසන්නෙමි, එය අසව මනාව සිත්හි කරව් කියන්නෙමි. ධානඤ්ජානි බමුණ, "එසේය පින්වතුන් වහන්සැයි" ආයුෂ්මත් සැරියුත්තෙරුන්ට උත්තර දුන්නේය.

ආයුෂ්මත් ශාරිපුත්‍රතෙමේ මෙසේ වදාළේය. "ධානඤ්ජානිය, බ්‍රහ්මයන් සහවාසයට මාර්ගය කවරේද? ධානඤ්ජානිය, මෙහි භික්ෂුතෙම මෛත්‍රීසහගත සිතින් එක් දිසාවක පතුරුවා වාසය කරයිද, එසේ දෙවැනි තෙවැනි, සතරවැනි දිසාවලට පතුරුවා වාසය කරයිද, මෙසේ උඩ යට සරස යන සියලු තන්හි පැතිර පවත්නා අයුරින් සියල්ල ඇතුළත් ලෝකය මහත්වූ මහග්ගතවූ අප්‍රමාණවූ අවෛරීවූ අව්‍යාපාදවූ මෛත්‍රීසහගත සිතින් පතුරුවා වාසය කරයිද, මේද ධානඤ්ජානිය බමුන්ගේ සහවාසයට මාර්ගයයි.

"නැවතද ධානඤ්ජානිය, භික්ෂුතෙම කරුණාසහගතසිතින් එක් දිසාවක පතුරුවා වාසය කරයිද, එසේ දෙවෙනි, තෙවෙනි, සතරවැනි දිසාවලට පතුරුවා වාසය කරයිද, මෙසේ උඩ, යට, සරස (යන) සියලු තන්හි, සියලු තන්හි පැතිර පවත්නා අයුරින් සියල්ල ඇතුළත් ලෝකය මහත්වූ, මහග්ගතවූ, අප්‍රමාණවූ, අවෛරීවූ, අව්‍යාපාදවූ, මෛත්‍රීසහගත සිතින් පතුරුවා වාසයකරයිද, මේද, ධානඤ්ජානිය, ඔවුන්ගේ සහවාසයට මාර්ගයයි.

"මුදිතා සහගත සිතින් එක් දිසාවක පතුරුවා වාසය කරයිද, එසේ දෙවෙනි, තෙවෙනි, සතරවැනි දිසාවලද පතුරුවා වාසය කරයිද, මෙසේ උඩ, යට, සරස (යන) සියලු තන්හි. සියලු

තන්හි පැතිර පවත්නා අයුරින් සියල්ල ඇතුළත් ලොකය මහත්වූ, මහග්ගතවූ, අප්‍රමාණවූ, අවෛරීවූ, අව්‍යාපාදවූ, මෛත්‍රීසහගත සිතින් පතුරුවා වාසය කරයිද, මේද ධානඤ්ජානිය, බඹුන්ගේ සහවාසයට මාර්ගයයි.

"උපෙක්ඛා සහගත සිතින් එක් දිසාවක පතුරුවා වාසය කරයිද, මෙසේ උඩ, යට, හරහ (යන) සියලු තන්හි, සියලු තන්හි පැතිර පවත්නා ලෙසින් සියල්ල ඇතුලත් ලොකය මහත්වූ මහග්ගතවූ, අප්‍රමාණවූ අවෛරීවූ, අව්‍යපාදවූ, උපෙක්ඛා සහගත සිතින් පතුරුවා වාසය කරයිද, මෙයද ධානඤ්ජානිය බඹුන්ගේ සහවාසයට මාර්ගයයි."

30. "භවත් ශාරිපුත්‍රයන් වහන්ස, එසේ නම් මාගේ වචනයෙන් භාග්‍යවතුන්ගේ පාදයන් සිරසින් වඳිනු මැනව. "ස්වාමීනි, ධානඤ්ජානි, බමුණා රොගීව, දුකට පත්ව දැඩි ගිලන්ව සිටී හෙතෙම භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් සිරසින් වඳියයි, (කියායි)"

ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍ර තෙමේ ධානඤ්ජානි බමුණා මත්තෙහි කළයුතු දේ තිබියදී හීනවූ බඹලොව පිහිටුවා හුනස්නෙන් නැගිට ගියේය. අනතුරුව ධානඤ්ජානි බමුණා ආයුෂ්මත් සැරියුත් තෙරුන් වැඩි නොබෝ වෙලාවකින් කලුරිය කෙළේය. බඹලොවද උපන්නේය.

31. "ඉක්බිති භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන්ට කථාකළසේක. "මහණෙනි, මේ සාරිපුත්‍රතෙමේ ධානඤ්ජානි බමුණා මත්තෙහි කළයුතු දේ තිබියදී හීනවූ බඹලොව පිහිටුවා හුනස්නෙන් නැගිට ගියේයයි" වදාළේය. ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍රතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනකද, එතැනට පැමිණියේය. පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ එක් පැත්තක උන්නේය. එක් පැත්තක හුන් ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිර තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීය. "ස්වාමීනි, ධානඤ්ජානි බමුණා, රොගීව දුකට පත්ව දැඩි ගිලන් වූයේ වෙයි. හෙතෙම භාග්‍යවතුන් වහන්සේගේ පාදයන් සිරසින් වඳීයයි" කීය.

"කිමෙක්ද? ශාරිපුත්‍රය, ධානඤ්ජානි බමුණා මත්තෙහි කළයුතු දේ තිබියදී හීනවූ බඹලොව පිහිටුවා හුනස්නෙන් නැගිට ගියේදැයි? ඇසූහ". "ස්වාමීනි. මට වනාහි මේ අදහසවිය. 'මේ බමුණෝ බඹ ලොව ඇලුනෝය. ධානඤ්ජානි බමුණාට බ්‍රහ්මයන්ගේ සහවාසයට පැමිණෙන මාර්ගය මම දෙසන්නෙම් නම් යෙහෙක" (කියායි). "ශාරිපුත්‍රය, ධානඤ්ජානි බමුණා කළුරිය කෙළේය. බඹලොව උපන්නේය.

**සත්වැනිවූ ධානඤ්ජානි සූත්‍රය නිමි. (5-7)**

---

## 48. වාසෙට්ඨ සූත්‍රය

1. මා විසින් මෙසේ අසනලදී. එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ ඉච්ඡානංගල නම් බමුණු ගමෙහි ඉච්ඡානංගල වනලැහැබෙහි වාසය කරන සේක. ඒ කාලයෙහි වනාහි ප්‍රසිද්ධ ප්‍රසිද්ධ බ්‍රාහ්මණ මහාසාර කුලයෙහි බ්‍රාහ්මණයෝ ඉච්ඡානංගල ජනපදයෙහි වාසය කරත්. ඔවුහු කවරේද? චංකීබ්‍රාහ්මණ තෙමේද, තාරක්ඛ බ්‍රාහ්මණතෙමේද, පොක්ඛරසාති බ්‍රාහ්මණ තෙමේද, ජානුස්සොණ බ්‍රාහ්මණ තෙමේද, තොදෙය්‍ය බ්‍රාහ්මණ තෙමේද, අන්‍යවූද ප්‍රසිද්ධ මහාසාර බ්‍රාහ්මණයෝ වෙති. එකල්හි පයින් ඔබමොබ සක්මන් කරන්නාවූ, ඇවිදින්නාවූ, වාසෙට්ඨ භාරද්වාජ යන තරුණයන් අතර මේ කථාව පහළවිය. "පින්වත, බ්‍රාහ්මණයෙක් වන්නේ කෙසේද කියායි" භාරද්වාජ තරුණයා මෙසේ කීය. "පින්වත, යම්හෙයින් මව්පිය දෙපසින් මැනවින් උපන්නේද, පිරිසිදු මව්කුසින් උපන්නේද, සත්වන පරපුර දක්වා ජාතිවාදයෙන් බැහැර නොකරණ ලද්දේද, නින්දානොකරණ ලද්දේද, පින්වත, මෙපමණකින්ම බමුණෙක් වෙයි" කියායි.

2. වාසෙට්ඨ තරුණයා මෙසේ කීය. "පින්වත, යම්හෙයකින් සිල්වත්ද මනාපැවතුම් ඇත්තේද, පින්වත, එපමණෙකින් බමුණෙක් වෙයි" යනුය. භාරද්වාජ තරුණ තෙමේ වාසෙට්ඨ තරුණයාට මෙය සැඟවීමට නොහැකි විය. වාසෙට්ඨ තරුණ තෙමේ භාරද්වාජ තරුණයාට මෙය හැඟවීමට නොහැකි විය.

ඉක්බිති වාසෙට්ඨ තරුණයා භාරද්වාජ මානවකයාට කථා කෙළේය. "පින්වත් භාරද්වාජය, ශාක්‍ය කුලයෙන් නික්ම පැවිදිව ශාක්‍යපුත්‍රවූ මේ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ඉච්ඡානංගල ගමෙහි ඉච්ඡානංගල වනලැහැබෙහි වාසය කරණ සේක. ඒ භවත් ගෞතමයන්ගේ මෙබඳු යහපත් කීර්තිශබ්දයක් උස්ව පැනනැංගේය. මේ කරුණෙනුදු ඒ භාග්‍යවතුන් වහන්සේ අර්හත්හ, සම්‍යක්සම්බුද්ධයහ, විද්‍යාචරණ සම්පන්නයහ, සුගතයහ, ලොකවිදූහ, අනුත්තරයහ පුරිසදම්ම සාරථීහ, දෙවිමිනිසුන්ට ශාස්තෘහ, බුද්ධයහ භාග්‍යවත්හ යනුවෙනි. භවත් භාරද්වාජය, යමු. ශ්‍රමණ ගෞතමයන් යම් තැනෙකද, එතැනට පැමිණෙන්නෙමි. පැමිණ ශ්‍රමණ ගෞතමයන් අතින් මෙකරුණ අසන්නෙමු. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ අපට යම්සේ ප්‍රකාශ කරත්ද, එසේ එය අපි පිළිගන්නෙමුයි" කීය. "එසේය පින්වතැයි" භාරද්වාජ තරුණයා වාසෙට්ඨ තරුණයාට උත්තර දුන්නේය.

3. ඉක්බිති වාසෙට්ඨ, භාරද්වාජය තරුණයෝ භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙකද, එතැනට පැමිණියහ. පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමග සතුටුවූහ. සතුටුවිය යුතුවූත් සිහිකටයුතුවූත් කථාව කොට නිමවා එක්පසෙක හුන්හ. එකත්පසෙක හුන්නාවූ වාසෙට්ඨ තරුණයා භාග්‍යවතුන් වහන්සේට ගාථාවන්ගෙන් මෙසේ කීයේය.

"1. පින්වතුන් වහන්ස, අපි ආචාර්යයන් විසින් ත්‍රිවේදයෙහි හික්මන ලද්දේ වෙමුයි ප්‍රකාශ කරන ලද්දෝද, ආචාරීන් වහන්ස, අපි ත්‍රිවේදය උගත්තෙමුයි පිළිගත්තෝද වෙමු. මම පොක්ඛරසාති බමුණාගේ අතවැසිවූ ප්‍රධාන ශිෂ්‍යයා වෙමි. මේ තරුණයා තාරුක්ඛ බ්‍රාහ්මණයන්ගේ අග්‍ර ශිෂ්‍යයා වෙයි.

"2. ත්‍රිවෙදය දන්නා බමුණන් විසින් අර්ථයක් හෝ ව්‍යඤ්ජනයක් හෝ කියන ලද්දේද, ඒ සියල්ල උගෙණ නිමාවට ගියෝ වෙමු. පද හා ව්‍යාකරණ කීමෙහිදීද අපි ආචාර්යයන් හා සමානයෝ වෙමු.

"3. ගෞතමයන් වහන්ස, ඒ අපගේ ජාතිවාදයෙහි වාදයක් වෙයි. උත්පත්තියෙන් (ජාතියෙන්) බමුණෙක් වේයයි, භාරද්වාජ

තෙමේ කියයි. මම ක්‍රියාවෙන් බමුණෙක් වේයයි කියමි. පසැස් ඇති භාග්‍යවතුන් වහන්ස, මෙසේ දැනගන්නා සේක්වා.

"4. ඒ අපි දෙදෙන ඔවුනොවුන්ට ඇඟවීමට නොහැකි වෙමු. එය ඇසීම සඳහා ඔවුනොවුන්ට හැඟවීමට හැක්කෙමු.

"5. පූර්ණචන්ද්‍රයා බඳු වූ මෙසේ ලොකයෙහි ප්‍රසිද්ධවූ සම්‍යක් සම්බුද්ධ භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ ඇදිලි බැඳ වඳිමින් නමස්කාර කරත්.

6. "ලොකයට පහළවූ ඇසක් වැනිවූ ගෞතමයන් වහන්සේගෙන් අපි අසමු. "ජාතියෙන් බමුණෙක් වේද, කර්මයෙන් බමුණෙක් වේද? නොදත් අපට යම්සේ බ්‍රාහ්මණයා කවරෙක්දැයි දැනගනිමුද? ඒ ආකාරයෙන් ප්‍රකාශ කළ මැනවි.

4. භාග්‍යවතුන් වහන්සේ, "වාසෙට්ඨය, ඒ තොපට මම පිළිවෙලින් නානාප්‍රකාර ජාති ඇති ප්‍රාණීන්ගේ ජාති විස්තරය ප්‍රකාශ කරන්නෙමි (කියන්නෙමි) ජාතීහු වෙන් වෙන් වූවාහුය.

"1. තෙපි තෘණ, වෘක්ෂයන් දන්නාහුය. එහෙත් (ඔවුහු) අපි තෘණය, වෘක්ෂයයි නොදනිති. ඔවුන්ට ජාතියෙන් හටගත් සටහන් ඇත්තේය. වෙන් වෙන්වූ ජාති ඇත්තාහුය.

"2. පණුවන්ද, පලඟැටියන්ද, කුරුකුහුඹුවන් දක්වා ජාතියෙන් හටගත් සටහන් ඇත්තේය. ඔවුහු වෙන් වෙන්වූ ජාති ඇත්තාහුය.

"3. කුඩාවූද, මහත්වූද, සිවුපා ජාතීන්ද තෙපි දන්නාහුය. ඔව්හුද ජාතියෙන් හටගත් සටහන් ඇත්තාහුය වෙන් වෙන්වූ ජාති ඇත්තාහුය.

"4. තෙපි දිගපිට ඇති උදරය පාද කොට ඇති සර්පයන්ද දන්නාහුය. ඔව්හුද ජාතියෙන් හටගත් සටහන් ඇත්තාහුය. වෙන් වෙන්වූ ජාති ඇත්තාහුය.

"5. ඉක්බිති ජලයෙහි ඉපිද දියම ගොදුරුකොට ඇත්තාවූ මසුන්ද දන්නහුය. ඔව්හුද ජාතියෙන් හටගත් සටහන් ඇත්තාහුය. වෙන් වෙන්වූ ජාති ඇත්තාහුය.

"6. පියාපත් වලින් අහසින් යන පක්ෂීන්ද දන්නාහුය ඔව්හුද ජාතියෙන් හටගත් සටහන් ඇත්තාහුය. වෙන් වෙන් වූ ජාති ඇත්තාහුය.

"7. යම්සේ මේ ජාතීන් කෙරෙහි ජාතියෙන් හටගත් සටහන් බොහෝ වේද, මනුෂ්‍යයන් කෙරෙහි එසේ බොහෝවූ ජාතියෙන් හටගත් සටහන් බොහෝ නොවෙත්.

"8. කෙස්වලින්ද, හිසින්ද, කන්වලින්ද, ඇස්වලින්ද, මුඛයෙන්ද, නාසයෙන්ද, දෙතොල්වලින්ද, බැම්වලින්ද වෙනසක් නැත.

"9. බෙල්ලෙන්ද, දෙඋරෙන්ද, බඩෙන්ද, පිටෙන්ද ඉඟටියෙන්ද, පපුවෙන්ද, මෛථුනසම්බාධ ස්ථානයන්ගෙන්ද වෙනසක් නැත.

"10. අත්වලින්ද, පාවලින්ද, ඇඟිලිවලින්ද, නියවලින්ද, කෙණ්ඩාවලින්ද, කලවාවලින්ද, වර්ණයෙන්ද, කටහඬින්ද වෙනසක් නැත. අන්‍ය ජාතීන්හි මෙන් ඔවුන්ට ජාතියෙන් හටගත් වෙනස් සටහනක් නැත.

"11. මනුෂ්‍යයන් කෙරෙහි වෙනස්වූ ශරීර සටහනක් නැත. එහෙත් මනුෂ්‍යයන් කෙරෙහි වෙන්වූ ජාති ව්‍යවහාර කරනු ලැබේ.

"12. මිනිසුන් අතර යම්කිසිවෙක් ගොවිතැනින් ජීවත් වේද, වාසෙට්ඨය, ඔහු ගොවියෙකි. හෙතෙම බමුණෙක් නොවේයයි මෙසේ දැනගනුව.

"13. මිනිසුන් අතර යම් කිසිවෙක් රෙදි විවීම් ආදී නොයෙක් ශිල්පයෙන් ජීවත්වේද, වාසෙට්ඨය, ඔහු ශිල්පියෙකි. බමුණෙක් නොවේයයි මෙසේ දැනගනුව.

"14. මිනිසුන් අතර යම් කිසිවෙක් වෙළඳාමෙන් ජීවත්වේද, වාසෙට්ඨය, ඔහු වෙළෙන්දෙකි. බමුණෙක් නොවේයයි මෙසේ දැනගනුව.

"15. මිනිසුන් අතර යම් කිසිවෙක් අනුන්ට සේවාකම් කිරීමෙන් ජීවත්වේද, වාසෙට්ඨය, ඔහු සේවකයෙකි, බමුණෙක් නොවේයයි මෙසේ දැනගනුව.

"16. මිනිසුන් අතර යම් කිසිවෙක් සොරකමින් ජීවත් වේද, වාසෙට්ඨය, ඔහු සොරෙකි. බමුණෙක් නොවේයයි මෙසේ දැනගනුව.

"17. මිනිසුන් අතර යම් කිසිවෙක් ආයුධවලින් ජීවත් වේද, වාසෙට්ඨය, ඔහු යොධාජීවයෙකි. බමුණෙක් නොවේයයි මෙසේ දැනගනුව.

"18. මිනිසුන් අතර යම් කිසිවෙක් පුරොහිතකමින් ජීවත්වේද, වාසෙට්ඨය, ඔහු පුරොහිතයෙකි. බමුණෙක් නොවේයයි මෙසේ දැනගනුව.

"19. මිනිසුන් අතර යම් කිසිවෙක් ගමද රටද අනුභව කෙරේද, වාසෙට්ඨය, ඔහු රජෙකි. බමුණෙක් නොවේයයි මෙසේ දැනගනුව.

"20. ඉදින් රාගාදි පලිබොධ සහිත නම් යොනියෙන් උපන් මවුගෙන් උපන් ඔහු, මම බ්‍රාහ්මණයෙකැයි නොකියමි. හෙතෙම භො භො කියන්නෙකි. රාගාදී පලිබොධ නැති මමයයි හැඟීමක් නැති පුද්ගලයා මම බ්‍රාහ්මණයායි කියමි.

"21. යමෙක් සියලු සංයෝජනයන් සිඳ නොඇලෙන්නේද, ඇලීම් දුරුකළාවූ, සියලු කෙලෙසුන් කෙරෙන් දුරුවූ, ඔහු මම බ්‍රාහ්මණයායි කියමි.

"22. බද්ධ වෛරය නමැති රැහැණද, තෘෂ්ණාව නමැති වරපටද, පරියුට්ඨාන දෘෂ්ටිය නමැති මලපුඩුවද, අනුසය දෘෂ්ටිය නමැති ගැටයද, අවිද්‍යාව නමැති වැස්මද නසා චතුස්සත්‍ය අවබොධ කළ පුද්ගලයා බමුණායයි මම කියමි.

"23. යමෙක් නොකිපී ආක්‍රොශයද, වධබන්ධනද ඉවසයිද ඉවසීම් බලය ඇති, බලවත් ඉවසීම ඇති ඔහු බමුණායයි මම කියමි.

"24. ක්‍රොධ නොකරණ ධුතාංගධාරී ගුණවත්වූ රාගාදිය උත්සන්න නොවූ දැමුණු අන්තිම ශරීර ඇති පුද්ගලයා බ්‍රාහ්මණයායි මම කියමි.

"25. නෙලුම් පතෙහි ජලය මෙන් ඉදිකටු අග අබ ඇටය මෙන් යමෙක් කාමයන්හි නොඇලේද, ඔහු මම බ්‍රාහ්මණයායි කියමි.

"26. යමෙක් දුක් කෙළවර කරන්නාවූ අර්හත් ඵලය අවබෝධ කිරීම් වශයෙන් දනීද, බහාතැබූ බරඇති රාගාදී ක්ලේශයන් කෙරෙන් වෙන්වූ ඒ පුද්ගලයා බ්‍රාහ්මණයයි මම කියමි.

"27. ගැඹුරු ප්‍රඥා ඇති, ප්‍රකෘති ප්‍රඥා ඇති, මාර්ග අමාර්ග දෙක්හි දක්ෂවූ උතුම් අර්ථයට පැමිණි ඒ පුද්ගලයා බ්‍රාහ්මණයයි මම කියමි.

"28. ගිහියන් සමගද, පැවිද්දන් සමගද, යන දෙයාකාරයෙන්ම මිශ්‍රනොවූ පස්කම් ගුණයෙන් නොඇලුණු අලෞකික පුද්ගලයා බ්‍රාහ්මණයයි මම කියමි.

"29. යමෙක් තෘෂ්ණාව නැති නොකළ සත්වයන් කෙරෙහිද, නැති කළ (රහත්) සත්වයන් කෙරෙහිද, දඬු මුගුරු බහා තබා සතුන් නොමරත්ද, නොමරවත්ද, මම, ඔහු බ්‍රාහ්මණයයි කියමි.

"30. විරුද්ධවූ සත්වයන් කෙරෙහි විරුද්ධ නොවන්නාවූ, දඬු මුගුරු ගත්තාවුන් කෙරෙහි නිවුනාවූද, තණ්හාවෙන් දැඩිකොට අල්වා ගන්වා සත්වයන් කෙරෙහි අල්වා ගැනීමක් නැත්තාවූද, පුද්ගලයා මම බ්‍රහ්මණයායයි කියමි.

"31. යමෙකු විසින් රාගයත්, ද්වෙෂයත්, මානයත් මකු බවත්, ඉදිකටු අගින් අබැටක් මෙන් හෙලන ලදද, ඔහු බ්‍රාහ්මණයයි මම කියමි.

"32. යමෙක් රළුනොවූ හිත වැඩ අඟවන ඇත්ත කියන්නේවේද, යම් වචනයකින් කිසිවකු කුපිත නොකරන්නේද, ඔහු බ්‍රාහ්මණයයි මම කියමි.

"33. යමෙක් මෙලොව දික්වූ හෝ, කොටවූ හෝ, මහත්වූ හෝ යහපත්වූ හෝ, අයහපත්වූ හෝ නොදුන් දෙයක් නොගනීද, ඔහු බ්‍රාහ්මණයයි මම කියමි.

"34. යමෙකුට මෙලෝහිද පරලෝහිද ආශාවක් නැත්තේද, ආශාව නැති කෙලෙසුන්ගෙන් මිදුණු ඔහු බ්‍රාහ්මණයයි මම කියමි.

"35. යමෙකුට තෘෂ්ණාවෝ නැත්ද, යමෙක් නුවණින්, දැන සැක රහිතවීද, ගැඹුරුවූ නිවනට පැමිණි ඔහු බ්‍රාහ්මණයයි මම කියමි.

"36. මේ ලොකයෙහි යමෙක් ස්වර්ගයෙහි හා අපායෙහි අලවන හෙයින් සංඝනම්වූ පින් පව් දෙක ඉක්මවූයේද, ශොක නැත්තාවූ, කෙලෙස් රජස් නැත්තාවූ, පිරිසිදුවූ ඔහු මම බ්‍රාහ්මණයයි කියමි.

"37. චන්ද්‍රයා සේ නිර්මලවූ ශුද්ධවූ විශෙෂයෙන් ප්‍රසන්නවූ, නොකැලඹුනාවූ තෘෂ්ණාව හා භවය දුරුකලාවූ ඔහු බ්‍රාහ්මණ යයි මම කියමි.

"38. යමෙක් මේ කෙලෙස් නැමැති මඩ සහිත මගත් ක්ලෙශ දුර්ගයත්, සසරත්, මොහයත්, පසුකොට ගියේද, පරතෙරට ගියේද, ධ්‍යානයෙහි ඇළුනේද, ස්ථිරද, සැක නැත්තේද, ආත්මාදී වශයෙන් කිසිත් අල්වා නොගෙන නිවුනේද ඔහු බ්‍රාහ්මණයායි මම කියමි.

"39. යමෙක් මේ ලෝකයෙහි කාමයන් හැර අනගාරිකවූ ගිහිගෙන් නික්මෙන්නේද, කාමයන් හා භවයන් දුරු කළ ඔහු බ්‍රාහ්මණයායි මම කියමි.

40. "යමෙක් මේ ලොකයෙහි තෘෂ්ණාව හැර අනගාරිකව ගිහිගෙන් වෙන්ව පැවිදි වන්නේද, තෘෂ්ණා හා භවයන් ක්ෂයකළ ඔහු බ්‍රාහ්මණයායි මම කියමි.

41. "යමෙක් මනුෂ්‍ය පඤ්චකාමයත් දිව්‍යපඤ්චකාමයත් දුරුකෙළේද, සියලු ක්ලේශ බැඳීම්වලින් මිදුණු ඔහු බ්‍රාහ්මණයයි මම කියමි.

42. "පස්කම්හි ඇල්මද, මහණදම්හි උකටලියද, හැර නිවී ගිය උප ක්ලේශ රහිත සියලු ස්කන්ධ ලොකය මැඩ සිටී, වීර්යවත්වූ ඔහු බ්‍රාහ්මණයයි මම කියමි.

"43. යමෙක් සත්වයන්ගේ ච්‍යුතියත් උත්පත්තියත්, සියලු ආකාරයෙන් දැනගත්තේද, පිළිවෙත් මග මනාව ගොස් නිමවූ චතුස්සත්‍ය අවබෝධකළාවූ ඔහු බ්‍රාහ්මණයයි මම කියමි.

"44. දෙවියෝත්, ගාන්ධර්වයෝත්, මනුෂ්‍යයෝත්, යමෙකුගේ උත්පත්තිය නොදනිත්ද, ආශ්‍රවයන් නැසූ අර්හත්වූ ඔහු මම බ්‍රාහ්මණයයි කියමි.

"45. අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, ස්කන්ධයන්හි තණ්හාවෙන් ගැනීමත් යමෙකුට නැත්ද, ඒ තණ්හාවෙන් නැති ආත්මාදීන් වශයෙන් කිසිවක් නොගන්නා ඔහු මම බමුණායයි කියමි.

"46. තැති නොගන්නා ශ්‍රෙෂ්ඨවූ, වීර්යවත්වූ, මහර්ෂිවූ දිනුවාවූ, අචලවූ, කෙලෙස් සෝදා හැරියාවූ, චතුස්සත්‍ය දැන ගත්තාවූ, ඔහු බ්‍රාහ්මණයයි මම කියමි.

"47. යමෙක් පෙරවිසූ කඳ පිළිවෙල දනීද, ස්වර්ග හා අපායයන් දකීද, ජාතිය කෙළවර කිරීමට පැමිණියේද, ඔහු බ්‍රාහ්මණයයි මම කියමි.

"48-49. ලොකයෙහි ඒ ඒ තැන උපන් කල්හි පනවන ලද නාමගොත්‍ර අනුපිළිවෙලින් ආ ව්‍යවහාර මාත්‍රයක්මය පැනවීමක් පමණය. මෙසේ බොහෝ කලක් ගත් දෘෂ්ටි ඇති නොදන්නා සත්වයෝ උත්පත්තියෙන් බමුණෙක් වේයයි ප්‍රකාශ කරත්. දන්නෝ නොකියති.

"50. උත්පත්තියෙන් බ්‍රාහ්මණයෙක්ද, නොවේ. උත්පත්තියෙන් බ්‍රාහ්මණ නොවන්නෙක්ද නොවේ. ක්‍රියාවෙන් බ්‍රාහ්මණයෙක් වෙයි. බ්‍රාහ්මණ නොවූවෙක්ද වෙයි.

"51. ක්‍රියාවෙන් ගොවියෙක්වෙයි. ක්‍රියාවෙන් ශිල්පයෙක් වෙයි. ක්‍රියාවෙන් වෙළෙන්දෙක් වෙයි. ක්‍රියාවෙන් සේවනයෙක් වෙයි.

"52. ක්‍රියාවෙන් සොරෙක් වෙයි. ක්‍රියාවෙන් ආයුධවලින් ජීවත්වන්නෙක් වෙයි. ක්‍රියාවෙන් පුරෝහිතයෙක් වෙයි. කර්මයෙන් රජෙක් වෙයි.

"53. මෙපරිද්දෙන් පටිච්චසමුප්පාදය දක්නාවූ කර්ම විපාකයෙහි දක්ෂවූ, ඇතිසැටියෙන් කර්මය පණ්ඩිතයෝ දකිති.

"54. ලොකය කර්මයෙන් පවතී. ප්‍රජාව කර්මයෙන් පවතී. යන්නාවූ රථයාගේ කඩඇනය මෙන් සත්වයෝ කර්මයෙන් බැඳී වාසය කරත්.

"55. තපසින්ද, බ්‍රහ්මචර්යයෙන්ද, සීලයෙන්ද, ඉන්ද්‍රිය දමනයෙන්ද, යන මේ හේතුකොට ගෙන බමුණෙක් වෙයි. ඔහු උතුම් බ්‍රාහ්මණයෙකැයි කියමි.

"56. ත්‍රිවිද්‍යාවෙන් සම්පූර්ණවූ, ශාන්තවූ, දෙවෙනි භවය කෙළවර කළාවූ, හෙතෙම නුවණැතියන්ට බ්‍රහ්මයෙක ශක්‍රයෙකැයි, වාසෙට්ඨය, මෙසේ දැනගනුව."

5. මෙසේ කී කල්හි වාසෙට්ඨ, භාරද්වාජ යන තරුණයෝ භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවාහුය. "භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත. භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත, භවත් ගෞතමයන් වහන්ස, යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන්නේ යම්සේද, වැසුනු දෙයක් විවෘත කරන්නේ යම්සේද, මං මුළාවූවෙකට මාර්ගය කියන්නේ යම්සේද, ඇස් ඇත්තෝ දකිත්වායි අඳුරෙහි තෙල්පහනක් දල්වන්නේ යම්සේද, එපරිද්දෙන් භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් ක්‍රමයෙන් ධර්මය ප්‍රකාශ කරන ලද්දේය. අපි භවත් ගෞතමයන් වහන්සේද, ධර්මයාද, සංඝයාද සරණයමු. භවත් භවත් ගෞතමයන් වහන්සේ අපි අදපටන් දිවිහිම්ව සරණ ගිය උපාසකයන්සේ දරණ සේක්වා කියායි."

අටවැනිවූ වාසෙට්ඨ සූත්‍රය නිමි. 5-8